

කාර්යසාධන වාර්තාව
2023

සෞඛ්‍ය අමාත්‍යාංශය

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2023

සෞඛ්‍ය අමාත්‍යාංශය

පටුන

පරිච්ඡේදය	විස්තරය	පිටු අංකය
1	**ආයතනික පැතිකඩ /විධායක සාරාංශය**	03
1.1	හැඳින්වීම	05
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	09
1.3	ප්‍රධාන කාර්යයන්	11
1.4	සංවිධාන සටහන	13
1.5	අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ	15
1.6	අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/ අරමුදල්	16
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	21
2	**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	23
2.0	විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක	25
2.1	රෝග නිවාරණ අංශයේ වැඩිදියුණු කිරීම්	25
2.2	සෞඛ්‍ය සේවාවන් ඩිජිටල්කරණය	31
2.3	විදේශාධාර ව්‍යාපෘති	32
2.4	සෞඛ්‍ය ප්‍රවර්ධනය	35
2.5	සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීම	37
2.6	සෞඛ්‍ය සත්කාර ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතාවය	40
2.7	මානව සම්පත් කළමනාකරණය සම්බන්ධීකරණය	41
2.8	වෛද්‍ය සැපයීම්	41
2.9	ජාතික රුධිර පාරවිලයන සේවාව	42
2.10	බෝ නොවන රෝග	43
2.11	ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවාවන්	47
2.12	මහජන සෞඛ්‍ය සේවාවන්	48
2.13	ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමනය	53
2.14	දේශීය වෛද්‍ය අංශය	54
3	**වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**	75
3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	77
3.3	මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය	78
3.4	මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශය	79
3.5	මූල්‍ය ප්‍රකාශ සටහන්	80
3.6	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	80
3.7	ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	81
3.8	මු.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවල / නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	81
3.9	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	82
3.10	විගණකාධිපතිවරයාගේ වාර්තාව	83

පරිච්ඡේදය	විස්තරය	පිටු අංකය
4	**කාර්ය සාධන දර්ශක**	389
4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	391
5	**තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**	425
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	427
5.2	තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	437
6	**මානව සම්පත් පැතිකඩ**	439
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	441
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය	441
6.3	මානව සම්පත් සංවර්ධනය	444
7	**අනුකූලතා වාර්තාව**	455
	අවසානය	464

1 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

1.1 හැදින්වීම

ආර්ථික, සමාජීය, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනයට දායක වන සෞඛ්‍ය සම්පන්න ජාතියක් සඳහා වන දැක්ම සමඟින් රෝග වැළැක්වීම, රෝග නිවාරණය, ප්‍රවර්ධනය, පරිපාලනය හා පුනරුත්ථාපනය යන අංශවල ගුණාත්මක සෞඛ්‍ය සේවා සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය කැපවී සිටී. එමෙන්ම, සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, ප්‍රමිතීන් සකස් කිරීම, රටේ සෞඛ්‍ය සේවා සැපයීම සඳහා උපාය-මාර්ගික මඟපෙන්වීම, සම්පත් වෙන් කිරීම, සියළුම සෞඛ්‍ය සේවා සැපයුම් ආයතනවල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ කළමනාකරණය සහ සියළුම පුරවැසියන්ට නොමිලේ සෞඛ්‍ය සේවා සැපයීම පුළුල් සෞඛ්‍ය සේවා ජාලයක් හරහා සිදු කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ වගකීම වේ.

කාර්යක්ෂම හා ඵලදායි දිවිතීයික හා තෘතීයික සත්කාර සේවාවන් පවත්වා ගනිමින් වර්තමානයේ ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවාවන් ශක්තිමත් කිරීම උදෙසා සෞඛ්‍ය අමාත්‍යාංශය වැඩි උත්සාහයක් හා අවධානයක් යොමු කර ඇත. මෙම උත්සාහයන් විශ්වීය සෞඛ්‍ය ආවරණය (Universal Health Coverage) සාක්ෂාත් කර ගැනීමේ පරමාර්ථයෙන් සිදු කරනු ලබන අතර, එමඟින් අවශ්‍යතා ඇති සියලු දෙනාටම, මෙම සේවාවන් භාවිතා කිරීම තුළින් මූල්‍ය දුෂ්කරතාවන්ට නිරාවරණය නොවන බවට සහතික වෙමින් ප්‍රවර්ධන, නිවාරණ, රෝග ප්‍රතිකාර, පුනරුත්ථාපන සහ රෝග සත්කාර සෞඛ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය සහතික කරනු ඇත.

"විවිධ කාණ්ඩ වලට අයත් වෛද්‍ය සත්කාර ආයතන මඟින් ලබාදෙන පහසුකම්" යන මැයෙන් අංක 01-18/2020 හා 2020.03.03 දිනැතිව නිකුත් කරන ලද පොදු චක්‍රලේඛය පදනම්ව 2023.12.31 දිනට සත්කාර සේවා මට්ටම් ත්‍රිත්වය යටතේ සෞඛ්‍ය සත්කාර ආයතන 1,164 ක් පහත සඳහන් පරිදි කාණ්ඩගත කර ඇත.

වගුව 01 – 2023.12.31 දිනට සෞඛ්‍ය සත්කාර ආයතනවල සාරාංශය

අංකය	සත්කාර සේවා මට්ටම	රෝහල් කාණ්ඩය	රෝහල් සංඛ්‍යාව		
			රේඛීය අමාත්‍යාංශය	පළාත් අමාත්‍යාංශය	එකතුව
01	**තෘතීයික සත්කාර සේවා**	ජාතික රෝහල්	02	00	02
02		ශික්ෂණ රෝහල්	12	00	12
03		විශේෂිත ශික්ෂණ රෝහල්	06	00	06
04		වෙනත් විශේෂිත රෝහල්	09	04	13
05		පළාත් මහ රෝහල්	00	00	00
06		දිස්ත්‍රික් මහ රෝහල්	13	07	20
		උප එකතුව	**42**	**11**	**53**
07	**ද්විතීයික සත්කාර සේවා**	මූලික රෝහල ඒ වර්ගය	06	29	35
08		මූලික රෝහල බී වර්ගය	01	44	45
		උප එකතුව	**07**	**73**	**80**

අංකය	සත්කාර සේවා මට්ටම	රෝහල් කාණ්ඩය	රෝහල් සංඛ්‍යාව		
			රේඛීය අමාත්‍යාංශය	පළාත් අමාත්‍යාංශය	එකතුව
			01	66	67
10		ප්‍රාදේශීය රෝහල බී වර්ගය	01	147	148
11		ප්‍රාදේශීය රෝහල සී වර්ගය	01	270	271
12		ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක	08	537	545
		උප එකතුව	**11**	**1,020**	**1,031**
		එකතුව	**60**	**1,104**	**1,164**

තවද, ප්‍රධාන වශයෙන් ආයුර්වේද ශික්ෂණ රෝහල් හතරක් (බොරැල්ල, ගම්පහ, කයිතඩි හා ත්‍රිකුණාමලය පිහිටි), පර්යේෂණ රෝහල් හතක් (නාවින්න, අම්පාර, මන්චන්තුඩාව, හම්බන්තොට, මැදවච්චිය, නින්දවුර් හා මිහින්තලේ පිහිටි) සහ හෝමියෝපති රෝහලක් (වැලිසර පිහිටි) දේශීය වෛද්‍ය අංශය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී.


2023 වර්ෂය සඳහා වූ මෙම කාර්ය සාධන වාර්තාව මඟින් සෞඛ්‍ය අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය මෙන්ම 2023 වර්ෂයට නියමිත ඉලක්කවලට සාපේක්ෂව, සෞඛ්‍ය අංශයේ සමස්ථ කාර්ය සාධනය පෙන්නුම් කරති. 2023 වර්ෂයේ වාර්තාවට ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමනය අංශයේ සහ දේශීය වෛද්‍ය අංශයේ කාර්ය සාධනයද ඇතුලත් කර ඇත.

ප්‍රාග්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් (විදේශීය හා දේශීයව අරමුදල් සපයන ලද) 79 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 64,503.11 ක ප්‍රතිපාදන සලසා දී තිබුණ අතර ඉන් 40.41 % ක් පමණක් වැය ශීර්ෂ අංක 111 යටතේ උපයෝජනය කර ඇත. එම විස්තර වගුව 02 හි සඳහන් කර ඇත.

වගුව - 02 මුල්‍ය ප්‍රගතියේ සාරාංශය

#	විස්තරය	ව්‍යාපෘති / වැඩසටහන් ගණන	2022 සඳහා ප්‍රතිපාදන (රු. මිලියන)	වියදම (රු. මිලියන)	උපයෝජනය %
1	ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන ප්‍රාග්ධන වැඩසටහන්	31	16,751.32	12,933.40	83.18
2	ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන ව්‍යාපෘති	21	6,230.35	2,652.39	42.57
3	විදේශ අරමුදල් සපයන ප්‍රාග්ධන වැඩසටහන්	07	3,858.23	549.12	14.23
4	විදේශ අරමුදල් සපයන දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන ව්‍යාපෘති	15	37,663.20	8,929.23	23.71
	එකතුව	**79**	**64,503.11**	**26,064.14**	**40.41**

සටහන 1 - මූල්‍ය ප්‍රගතියේ සාරාංශය (2023)



තවද, ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන ලද ප්‍රාග්ධන වැඩසටහන් (රුපියල් මිලියන 1,826.72) සහ ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන ප්‍රාග්ධන ව්‍යාපෘති (රුපියල් මිලියන 4.30) යටතේ 2023.12.31 දිනට අතැති බිල්පත් වල මුළු වටිනාකම රුපියල් මිලියන 1,831.02 ලෙස සටහන් වී ඇත.

වැය ශීර්ෂ අංක 111 ට අමතරව, වැය ශීර්ෂ අංක 220 යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන වෙන් කර දී තිබුණි. මුළු ප්‍රතිපාදනය රුපියල් මිලියන 2,020 කි (පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 1,960 සහ ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 60 ලෙස).

දේශයේ ආර්ථික, සමාජීය, මානසික සහ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායක වන සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහි කිරීම සඳහා වූ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දැක්ම යතාර්ථයක් කර ගැනීමෙහිලා දේශීය වෛද්‍ය අංශය විසින් සිය කැපවීම පෙන්නුම් කර ඇත.

පාරම්පරිකව පැවත එන දේශීය චිකිත්සා මෙන්ම ආයුර්වේද, සිද්ධ හා යූනානි වෛද්‍ය ක්‍රමයන් මෙරට ප්‍රාථමික සෞඛ්‍ය සංවර්ධනයට හා රෝග නිවාරණ කටයුතු සඳහා විශාල දායකත්වයක් ලබා දෙමින් සිටී. එසේම, විකල්ප වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමයද මේ වන විට ජනතාව අතර පිළිගැනීමට ලක්ව ඇත.

2023 වර්ෂය තුළ වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනයට අදාළ බොහෝ වැඩසටහන්, ව්‍යාපෘතීන් සහ ක්‍රියාකාරකම් ඉටු කිරීමට ඉඩ ප්‍රස්ථාව ලැබී ඇත. දේශීය වෛද්‍ය ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම, 1961 අංක 31 දරණ ආයුර්වේද පනතට අවශ්‍ය සංශෝධන ගෙන ඒම හා ආයුර්වේද නීති සංග්‍රහය කෙටුම්පත් කිරීම ඒ අතර සුවිශේෂී වේ. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සිදු කිරීම, ඖෂධ නිෂ්පාදය, නිෂ්පාදන හා සේවා සම්බන්ධ නියාමනය, වෘත්තිකයන් ලියාපදිංචි කිරීම, මානව සම්පත් සංවර්ධන කටයුතු මෙන්ම පාරම්පරික වෛද්‍ය ක්‍රම සංවර්ධනය, බල ගැන්වීම හා හෝමියෝපති වෛද්‍ය ක්‍රම ප්‍රවර්ධනය හා නියාමනය වැනි බොහෝ කාර්ය කොටස් 2023 වර්ෂය තුළ සිදු කරන ලදී. වසර කිහිපයක් අක්‍රීයව පැවති රජයේ හෝමියෝපති රෝහලෙහි නේවාසික අංශය ප්‍රතිසංස්කරණය කර රෝගීන් සඳහා විවෘත කිරීමටද හැකියාව ලැබුණි. එසේම සහයෝගී සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් ඒ සඳහා ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල සූදානම් කරන ලදී. බෝ නොවන රෝග පාලනය සහ වැළැක්වීම සඳහා ඖෂධ වෙනුවට ආහාර යන සංකල්පය ජනගත කිරීම, ශාරීරික හා මානසික නීරෝගීතාවය උදෙසා යෝග ප්‍රවර්ධනය හා මානසික සතිමත් බව වැඩිදියුණු කිරීම, ඩිජිටල් තාක්ෂණය ඔස්සේ නිරෝගීව සිටීමට අවශ්‍ය දේශීය වෛද්‍ය දැනුම ජනගත කිරීම වැනි බොහෝ ක්‍රියාකාරකම් 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

කෙසේ වෙතත්, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය මත ඇති වන ඉල්ලුමට සරිලන යටිතල පහසුකම් සංවර්ධනය තවදුරටත් සිදු කළයුතු අතර ඒ සඳහා තවදුරටත් ආයෝජනය කළයුතු වේ. විශේෂයෙන් ඩිජිටල් තාක්ෂණය ක්ෂේත්‍රයේ ප්‍රවර්ධන කටයුතුවලට මෙන්ම රෝහල් කළමනාකරණයට සහ ඖෂධ නිෂ්පාදන හා බෙදා හැරීමේ ජාලය සඳහා යොදා ගැනීම කාලීන අවශ්‍යතාවයක් වන අතර මේ වන විට ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් කටයුතු කරයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

දේශයේ ආර්ථික, සාමාජීය, මානසික සහ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායක වන සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීම

මෙහෙවර

ජනතා අවශ්‍යතාවයට ප්‍රතිචාර දක්වමින්, සාමුහිකව ක්‍රියා කරමින්, පරිපූර්ණ, ඉහලම මට්ටමේ, ගුණාත්මක, සමාන, ඵලදායී සහ තිරසාර සෞඛ්‍ය සේවාවක් ශ්‍රී ලංකාවාසී ජනතාවට ලබාදීම මගින් අත්කරගත හැකි ඉහළම සෞඛ්‍ය මට්ටමට ළඟාවීම

දේශීය වෛද්‍ය අංශය

දැක්ම

හෙළ වෙදකමින් සැමට සුව සෙත

මෙහෙවර

ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින් පර්යේෂණ සහ නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සමස්ත ප්‍රජාවට සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය කිරීම තුළින් ඔවුන් ජාතික ආර්ථික හා තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා දායක කරවීම

අරමුණු

- රෝග වලක්වා ගැනීමේ අරමුණු ලඟාකර ගැනීම සඳහා සේවා සැපයීම ශක්තිමත් කිරීම
- සියළුම ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා උචිත වන අයුරින් සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි උසස් ගුණාත්මක බවින් යුත් සත්කාරක සේවාවන් ඇති කිරීම
- ගුණාත්මක බවින් යුත් පුනරුත්ථාපන සත්කාර සේවාවක් ලබාගැනීම සඳහා අදාල රෝගීන්ට සමානාත්මක ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම
- දත්ත මත පදනම් වූ ක්‍රමවේද මඟින් සේවා සැපයුම් ශක්තිමත් කර අඛණ්ඩ සේවාවන් සියළුම රෝගීන්ට ලබාදීම
- ප්‍රතිකාර ලබාගැනීම සඳහා තමාට පුද්ගලිකව වියදම් කිරීමට සිදුවීම හා මූල්‍ය අවදානම අඩුකිරීමට නව උපාය මාර්ග වැඩි දියුණු කිරීම
- මානව සම්පත් කළමනාකරණය ඇතුළුව අනෙකුත් අංශ මනා ලෙස ප්‍රති-ව්‍යුහගත කිරීම තුලින් පුළුල් සෞඛ්‍ය සේවා පද්ධතියක් සුරක්ෂිත කිරීම
- සෞඛ්‍ය සේවාවන් සපයන සියළුම පාර්ශව සමඟ උපාය මාර්ගික සම්බන්ධතා වර්ධනය කරගැනීම

1.3 ප්‍රධාන කාර්යයන්:

i. ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය
ii. සෞඛ්‍ය හා පෝෂණ විෂයයන් සහ අංක 1.6 යටතේ සඳහන් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සංස්ථා යටතේ පවතින විෂයයන්, අධීක්ෂණය හා ඇගයීම් කටයුතු සිදුකිරීම
iii. මහජන සෞඛ්‍ය සේවාවන්ට අදාල ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් සම්පාදනය
iv. මහජන සෞඛ්‍යය හා පෝෂණය වැඩිදියුණු කිරීමට වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාවට නැංවීම
v. අන්තර් ජාතික නිරෝධායන හා සනීපාරක්ෂණයට අදාල නීතිරීති ක්‍රියාත්මක කිරීම
vi. පෞද්ගලික රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය, ප්‍රමිතීන් හා මිල ගණන් නියාමනය හා අධීක්ෂණය
vii. ලාභ නොලබන ප්‍රජා වෛද්‍ය සත්කාරක ආයතනවල වැඩකටයුතු නියාමනය හා අධීක්ෂණය
viii. වසංගත, බෝවන හා බෝ නොවන රෝග තත්ව පාලනය, වැළැක්වීම හා ප්‍රතිකාර සඳහා මෙහෙයුම් දියත් කිරීම
ix. පාසල් සෞඛ්‍ය වැඩසටහනට අදාල වෛද්‍ය සහ මුඛ සෞඛ්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීම
x. වතු අංශය සඳහා වන සෞඛ්‍ය සේවාවන් පිළිබඳ කටයුතු
xi. සාමාන්‍ය සනීපාරක්ෂණය
xii. ත්‍රිපෝෂ බෙදාදීමේ වැඩපිළිවල ක්‍රියාත්මක කිරීම
xiii. සියලුම රෝහල් හා රෝහල් සේවකයින් පරිපාලනය (පළාත් සභා යටතේ ඇති රෝහල් හැර)
xiv. පුහුණුවීම් කටයුතු මෙහෙයවන සියලු දෙපාර්තමේන්තු හා එම සේවාවන් පරිපාලනය හා සංවිධානය සහ අනෙකුත් උසස් වෛද්‍ය අධ්‍යාපන ආයතන හා සම්බන්ධීකරණය
xv. ජාතික රුධිර පාරවිලයන සේවාවන් පිළිබඳ කටයුතු
xvi. ඖෂධ නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම පිළිබඳ කටයුතු
xvii. ශ්‍රී ලංකා වෛද්‍ය සේවාවට අදාල පරිපාලනය හා පිරිස් කළමනාකරණය
xviii. වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සේවාවන්හී ගුණාත්මකභාවය සහ නිපුණතා වැඩිකිරීමට අවශ්‍ය පුහුණු අවස්ථා ඇතිකිරීම
xix. සෞඛ්‍ය අංශයට අදාල පර්යේෂණ කටයුතු ව්‍යාප්ත කිරීමට නව උපක්‍රම හඳුන්වා දීම
xx. ජාතික සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන් පිළිබඳ කටයුතු

දේශීය වෛද්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන්

- දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම

i. පාරම්පරික වෛද්‍ය ක්‍රම සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම
ii. ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය
iii. ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති වෛද්‍ය ක්‍රමවලට අවශ්‍ය අමු හා නිෂ්පාදිත ඖෂධ ආනයනය , විකිණීම හා බෙදාහැරීම
iv. ආයුර්වේද, සිද්ධ, යුනානි ආදී දේශීය වෛද්‍ය ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා අදාළ රෝහල්, පර්යේෂණ හා පුහුණු ආයතන සහ වෙළඳ සැල් පිහිටුවීම හා කළමනාකරණය
v. ඖෂධ පැලෑටි හා සකස් කළ ආයුර්වේද, සිද්ධ හා යුනානි ඖෂධ අපනයනය නියාමනය කිරීම

vi. ආයුර්වේද ඖෂධ නිෂ්පාදකයන් නියාමනය කිරීම

vii. ඖෂධ පැළෑටි වගාව ප්‍රවර්ධනය කිරීම හා දේශීය ඖෂධ වර්ග වැඩිදියුණු කිරීම ආශ්‍රිත ව්‍යාපෘති අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් ඉටු කිරීම

viii. ආයුර්වේද නිෂ්පාදකයන්, ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් හා ආයුර්වේද අතුරු වෛද්‍ය සේවක පිරිස් ලියාපදිංචි කිරීම


ix. ආයුර්වේද රෝහල්, ආයුර්වේද පර්යේෂණ ආයතන, පුහුණු ආයතන සහ ඔසුසැල් පිහිටුවීම, මෙහෙයවීම හා ප්‍රවර්ධනය

x. සංචාරකයින් සඳහා ප්‍රතිකාර කිරීමට දේශීය පාරම්පරික හා ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් සංචාරක මණ්ඩලයේ සම්බන්ධීකරණය හා නියාමනය තුළ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම


xi. දේශීය වෛද්‍ය විද්‍යාවට අදාළ ඖෂධ සහ ප්‍රතිකාර ක්‍රම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම දිරි ගැන්වීම

xii. දේශීය වෛද්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණ කටයුතු

1.4 සංවිධාන සටහන (කෙටුම්පත)



දේශීය වෛද්‍ය අංශයේ සංවිධාන සටහන



1.5 අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ

රෝග සත්කාර සේවා

- රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්
- මුඛ සෞඛ්‍ය සේවා
- වතු හා නාගරික සෞඛ්‍ය සේවා

රෝග නිවාරණ සේවා

- බෝවන රෝග පාලනය
- රෝග වාහකයන් මගින් බෝවන රෝග පාලනය
- බෝ නොවන රෝග පාලනය
- මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා
- පෝෂණය
- ආපදා පෙර සූදානම්වීම සහ ප්‍රතිචාර දැක්වීම
- පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය සහ ආහාර සුරක්ෂිතතාව
- සෞඛ්‍ය ප්‍රවර්ධනය
- තරුණ, වැඩිහිටි සහ ආබාධිත පුද්ගලයින් සඳහා වන සේවා
- මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා
- දුම්කොළ හා මධ්‍යසාර පාලනය

වෙනත් සේවා

- අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ
- රසායනාගාර සේවා
- රුධිර පාරවිලයන සේවා
- සෞඛ්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතාව
- වෛද්‍ය සැපයුම් සේවා
- ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා
- කළමනාකරණ සංවර්ධන හා සැලසුම් සේවා
- මානව සම්පත් සංවර්ධනය
- මූල්‍ය සේවා
- වෛද්‍ය සංඛ්‍යාන සේවා
- පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමනය
- ඖෂධ සහ රූපලාවණ්‍ය ද්‍රව්‍ය නියාමනය

දේශීය වෛද්‍ය අංශය

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන / අරමුදල්

ජාතික රෝහල්

ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ
ජාතික රෝහල, මහනුවර

ශික්ෂණ රෝහල්

ශික්ෂණ රෝහල, අනුරාධපුර
ශික්ෂණ රෝහල, බදුල්ල
ශික්ෂණ රෝහල, මඩකලපුව
ශික්ෂණ රෝහල, කොළඹ උතුර, රාගම
ශික්ෂණ රෝහල, කොළඹ දකුණ, කළුබෝවිල
ශික්ෂණ රෝහල, යාපනය
ශික්ෂණ රෝහල, කළුතර
ශික්ෂණ රෝහල, කරාපිටිය
ශික්ෂණ රෝහල, කුලියාපිටිය
ශික්ෂණ රෝහල, කුරුණෑගල
ශික්ෂණ රෝහල, පේරාදෙණිය
ශික්ෂණ රෝහල, රත්නපුර

විශේෂිත රෝහල්

අපේක්ෂා රෝහල, මහරගම
කාසල් වීදියේ කාන්තා රෝහල (ශික්ෂණ), කොළඹ
ද සොයිසා කාන්තා රෝහල (ශික්ෂණ), කොළඹ
රිජ්වේ ආර්යා ළමා රෝහල (ශික්ෂණ), කොළඹ
ලාදුරු රෝහල - හැඳල
ජාතික දන්ත රෝහල (ශික්ෂණ), කොළඹ
ජාතික අක්ෂි රෝහල, කොළඹ
බෝවන රෝග පිළිබඳ ජාතික ආයතනය - අංගොඩ
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - අංගොඩ
ජාතික වෘක්කවේද, රුධිර කාන්දු පෙරණ සහ බද්ධ කිරීමේ ආයතනය - මාලිගාවත්ත
ශ්වසන රෝග සඳහා වූ ජාතික රෝහල, වැලිසර
ජාතික වෘක්කවේද විශේෂිත රෝහල, පොළොන්නරුව
පුනරුත්ථාපන රෝහල, රාගම
සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහල (ශික්ෂණ) , පේරාදෙණිය
ශික්ෂණ රෝහල, මහමෝදර

දිස්ත්‍රික් මහ රෝහල්

දිස්ත්‍රික් මහ රෝහල, අම්පාර
දිස්ත්‍රික් මහ රෝහල, හලාවත
දිස්ත්‍රික් මහ රෝහල, ඇඹිලිපිටිය
දිස්ත්‍රික් මහ රෝහල, හම්බන්තොට
දිස්ත්‍රික් මහ රෝහල, කෑගල්ල
දිස්ත්‍රික් මහ රෝහල, මාතලේ

දිස්ත්‍රික් මහ රෝහල, මාතර සහ ගොඩගම
දිස්ත්‍රික් මහ රෝහල, මොණරාගල
දිස්ත්‍රික් මහ රෝහල, නාවලපිටිය
දිස්ත්‍රික් මහ රෝහල, මීගමුව
දිස්ත්‍රික් මහ රෝහල, නුවරඑළිය
දිස්ත්‍රික් මහ රෝහල, පොලොන්නරුව
දිස්ත්‍රික් මහ රෝහල, ත්‍රිකුණාමලය

මූලික රෝහල් - "ඒ" කාණ්ඩය

මූලික රෝහල, අක්කරෙයිපත්තු
මූලික රෝහල, ගම්පොල
මූලික රෝහල, කල්මුණේ උතුර
මූලික රෝහල, කල්මුණේ දකුණ (අෂ්රොෆ් අනුස්මරණ රෝහල)
මූලික රෝහල, කන්තලේ
මූලික රෝහල, මුල්ලේරියාව (නැගෙනහිර කොළඹ මූලික රෝහල)

මූලික රෝහල් - "බී" කාණ්ඩය

මූලික රෝහල, බෙරුවල

ප්‍රාදේශීය රෝහල්

ප්‍රාදේශීය රෝහල, අළුත්ගම ("සී" කාණ්ඩය)
ප්‍රාදේශීය රෝහල, දර්ගා නගරය ("බී" කාණ්ඩය)
ප්‍රාදේශීය රෝහල, කඳාන ("ඒ" කාණ්ඩය)

මණ්ඩලයක් මගින් පාලනය වන රෝහල්

වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු රෝහල, මාලඹේ
ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල, තලපත්පිටිය, නුගේගොඩ
විජය කුමාරණතුංග අනුස්මරණ රෝහල, සීදුව

මහජන සෞඛ්‍ය ආයතන

බරවා මර්දන ව්‍යාපාරය
ලාදුරු මර්දන ව්‍යාපාරය
මැලේරියා මර්දන ව්‍යාපාරය
වසංගත රෝග විද්‍යා ඒකකය
පවුල් සෞඛ්‍ය කාර්යාංශය
සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය
මුඛ සෞඛ්‍ය ආයතනය, මහරගම
ජාතික පිළිකා මර්දන වැඩසටහන
නිදන්ගත වකුගඩු රෝග පිළිබඳ ජාතික වැඩසටහන
ජාතික ඩෙංගු මර්දන ඒකකය
ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිලිබඳ ජාතික වැඩසටහන
ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහන
වකුගඩු රෝග නිවාරණ හා පර්යේෂණ ඒකකය (RDPRU)

වෙනත් ආයතන

ගුවන්තොටුපල සෞඛ්‍ය කාර්යාලය - කටුනායක
ගුවන්තොටුපල සෞඛ්‍ය කාර්යාලය - මත්තල
ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා
ආහාර රසායනාගාරය, අනුරාධපුර
අධිකරණ වෛද්‍ය හා විෂවේදය පිළිබඳ ආයතනය
වෛද්‍ය පර්යේෂණ ආයතනය
වෛද්‍ය සැපයුම් අංශය
වෛද්‍ය සංඛ්‍යා ලේඛන ඒකකය
ජාතික රුධිර පාරවිලයන සේවය
වරාය සෞඛ්‍ය කාර්යාලය - කොළඹ
වරාය සෞඛ්‍ය කාර්යාලය - ගාල්ල
වරාය සෞඛ්‍ය කාර්යාලය - හම්බන්තොට
වරාය සෞඛ්‍ය කාර්යාලය - කන්කසන්තුරෙයි
වරාය සෞඛ්‍ය කාර්යාලය - ඔලුවිල්
වරාය සෞඛ්‍ය කාර්යාලය - වෛද්‍ය පර්යේෂණ ආයතනය
වරාය සෞඛ්‍ය කාර්යාලය - ත්‍රිකුණාමලය
පාසල් සෞඛ්‍ය කාර්යාලය
ලිංගාශ්‍රිත රෝග සායනය, මහමෝදර
ශ්‍රී ලංකා පාර්ලිමේන්තු වෛද්‍ය මධ්‍යස්ථානය


පුහුණු ආයතන

ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, කළුතර
පශ්චාත් මූලික හෙද පාසල, කොළඹ
හෙද පුහුණු පාසල - අම්පාර
හෙද පුහුණු පාසල - අනුරාධපුර
හෙද පුහුණු පාසල - බදුල්ල
හෙද පුහුණු පාසල - මඩකලපුව
හෙද පුහුණු පාසල - කොළඹ
හෙද පුහුණු පාසල - ගාල්ල
හෙද පුහුණු පාසල - හම්බන්තොට
හෙද පුහුණු පාසල - යාපනය
හෙද පුහුණු පාසල - කඳාන
හෙද පුහුණු පාසල - මහනුවර
හෙද පුහුණු පාසල - කුරුණෑගල
හෙද පුහුණු පාසල - මාතර
හෙද පුහුණු පාසල - මුල්ලේරියාව
හෙද පුහුණු පාසල - රත්නපුර
හෙද පුහුණු පාසල - වවුනියාව
ජාතික හෙද පාසල, ශ්‍රී ජයවර්ධනපුර
ශ්‍රවණ විද්‍යා කාර්මික පුහුණු පාසල
බන්ධු රේඛණ ශිල්පී පුහුණු පාසල
විද්‍යුත් නිකර්ෂණ රේඛණ සටහන්කරුවන් පුහුණු පාසල
කීට විද්‍යා සහායකයන් පුහුණු පාසල

වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයන් පුහුණු පාසල - වෛද්‍ය පර්යේෂණ ආයතනය
වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයන් පුහුණු පාසල- පේරාදෙණිය
අක්ෂි තාක්ෂණවේදී පුහුණු පාසල
භෞත චිකිත්සක සහ වෘත්තීය චිකිත්සක පුහුණු පාසල, ශ්‍රී ලංකා ජාතික රෝහල
ඖෂධවේදී පුහුණු පාසල, ශ්‍රී ලංකා ජාතික රෝහල (UOC)
විකිරණ ශිල්පී පුහුණු පාසල
ශ්‍රී ලංකා අංග ආදේශක හා ඍජුකරණඥ පුහුණු පාසල

අරමුදල් - ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල

1990 සුවසැරිය පදනම


දේශීය වෛද්‍ය අංශය
ආයුර්වේද වෛද්‍ය සභාව
ආයුර්වේද දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය
බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය
ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය අනුරාධපුර
හෝමියෝපති වෛද්‍ය සභාව
හෝමියෝපති රෝහල
ශික්ෂණ රෝහල්
පර්යේෂණ රෝහල්
ඔසු උයන්
1. බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල
2. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල
3. සිද්ධ ශික්ෂණ රෝහල, කයිතඩි
4. සිද්ධ ශික්ෂණ රෝහල, ත්‍රිකුණාමලය
1. බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ රෝහල, නාවින්න
2. ආයුර්වේද පර්යේෂණ රෝහල, අම්පාර
3. ආයුර්වේද පර්යේෂණ රෝහල, මන්චන්තුඩාව
4. වමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල, හම්බන්තොට
5. වකුගඩු රෝග නිවාරණ ආයුර්වේද පර්යේෂණ රෝහල, මැදවච්චිය
6. බෝ නොවන රෝග පර්යේෂණ රෝහල, නින්දවූර්
7. මෛත්‍රීපාල සේනානායක පාරම්පරික පර්යේෂණ රෝහල, මිහින්තලේ
1. නාවින්න
2. හල්දුම්මුල්ල
3. පට්ටිපොල
4. ගිරාදුරුකෝට්ටේ
5. පල්ලේකැලේ
6. පින්නදූව
7. කන්නෙලිය

1.7 විදේශ අරමුදල් ලබන ව්‍යාපෘති පිළිබඳ විස්තර

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ආධාරක ආයතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන)	ව්‍යාපෘති කාල සීමාව
1	ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවි බල ගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP)	ලෝක බැංකුව	36,440.00	2019 -2024 ජූනි
2	ශ්‍රී ලංකා කොවිඩ්-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධතිය සූදානම් කිරීමේ ව්‍යාපෘතිය	ලෝක බැංකුව	23,791.00	2020-2023
3	සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (HSEP)	ආසියානු සංවර්ධන බැංකුව	~~10,500.00~~ 35,346.00	2018 -2025
4	සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා රජය – ජයිකා	18,594.00	2018 ඔක්තෝබර් – 2023 ඔක්තෝබර්
5	මාතර දිස්ත්‍රික්කයේ මාතෘ හා නව ජන්ම සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය	කොයිකා	1,275.00	2017 -2023 දෙසැම්බර් (සංශෝධිත)
6	ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියා රෝග සඳහා සටන් කිරීමේ ගෝලීය අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතිය (GFATM)	GFATM	~~1,548.00~~ 2,689.00	2022 – 2024 දෙසැම්බර්
7	තෝරාගත් රෝහල්වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම (චීනයේ EXIM බැංකුව)	චීනය	15,300.00	2019 – 2021 සැප්තැම්බර්
8	කළුතර දිස්ත්‍රික් මහා රෝහල විශේෂිත මාතෘ හා ළමා රෝහලක් ලෙස වැඩි දියුණු කිරීම (ශ්‍රී ලංකා රජය - නෙදර්ලන්ත රජය)	නෙදර්ලන්තය	5,400.00	2018 – 2024 අප්‍රේල්
9	ද සොයිසා මාතෘ රෝහල සඳහා නව උපත් හා ප්‍රසව විමර්ශන මධ්‍යස්ථානය (ප්‍රංශය-HNB)	ප්‍රංශය / HNB	4,950.00	2019 - 2022
10	මඩකලපුව ශික්ෂණ රෝහල සඳහා ශල්‍ය ඒකකයක් ඉදි කිරීම සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය (ශ්‍රී ලංකා රජය - ඉන්දියාව)	ඉන්දියාව	275.00	2019 – 2020 දෙසැම්බර්

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ආධාරක ආයතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන)	ව්‍යාපෘති කාල සීමාව
11	උතුරු පළාතේ රෝහල් සංවර්ධනය කිරීම (DRIVE) (ශ්‍රී ලංකා රජය - නෙදර්ලන්තය)	නෙදර්ලන්තය	12,120.00	2019 – 2023 දෙසැම්බර්
12	හෙල්මට් කෝල් මාතෘ රෝහල ඉදි කිරීම - කරාපිටිය ගාල්ල (ශ්‍රී ලංකා රජය - ජර්මන් රජය - kfw)	ජර්මනිය	4,480.00 6,733.94	2015 ඔක්තෝම්බර් – 2023 දෙසැම්බර්
13	සෞඛ්‍ය තොරතුරු සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (Debt to Health Swap in Sri Lanka)	ගෝලීය අරමුදල	4,646.00	2021-2024
14	ශ්‍රී ලංකාවේ ජීව වෛද්‍ය ඉංජිනේරු සේවාවන්ගේ ධාරිතා සංවර්ධනය	අන්තර්ජාතික සෞඛ්‍ය සත්කාර සඳහා වන කොරියානු පදනම (KOFIH)	1,656.00	2021-2024

2 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.0 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන සෞඛ්‍ය සේවාවන් මෙහෙයවනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ කැබිනට් අමාත්‍යවරයා යටතේය. 2015 සිට දේශීය වෛද්‍ය අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශයට ඇතුලත් කර ඇත. වර්තමානයේ, සෞඛ්‍ය විෂය පථයට හා දේශීය වෛද්‍ය අංශය සඳහා රාජ්‍ය අමාත්‍යවරු දෙදෙනෙක් පත් කර ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය, ප්‍රධාන රජයේ ආයතනය වශයෙන් අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු, දේශීය හා ජාත්‍යන්තර ආයතන, සිවිල් සමාජ කණ්ඩායම් සහ පොදු ජනතාව සමඟ එක්ව ශ්‍රී ලංකාවේ සියළු පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්වය සහ යහ පැවැත්ම සුරක්ෂිත කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තවද, ඉහළ ගුණාත්මකභාවයකින් යුත් සෞඛ්‍ය සත්කාර සේවාවන් ජනතාව වෙත සමාන ආකාරයෙන් බෙදා හැරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ වගකීම වේ. පුළුල් පරාසයක පවතින රෝග නිවාරණය, වැළැක්වීම, පුනරුත්ථාපනය හා ප්‍රවර්ධන සෞඛ්‍ය සේවාවන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා පළාත් සෞඛ්‍ය අංශ විසින් සෞඛ්‍ය සත්කාර ආයතන පුළුල් ජාලයක් ඔස්සේ සපයනු ලැබේ.

මහ පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2023 දී රටෙහි පැවති ආර්ථික අර්බුදකාරී තත්වය බොහෝ සේ බලපෑම් කරන ලදී. කෙසේ වුවද, විශ්වීය සෞඛ්‍ය ආවරණය සහ තිරසාර සංවර්ධන අරමුණ 3 හා සබැඳි ක්‍රියාකාරකම් සාක්ෂාත් කර ගැනීමට ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවා පද්ධතිය ශක්තිමත් කර ගැනීම සඳහා ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ගෝලීය අරමුදල සහ වෙනත් බොහොමයක් ප්‍රදානයන් මඟින් ප්‍රතිපාදන අරමුදල් සපයන ලදී. ඊට අමතරව ප්‍රයෝජනවත් ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව සිදුකර ඉතිරි වැඩ සම්පූර්ණ කරමින් ව්‍යාපෘති නිම කිරීම සඳහා ඒකාබද්ධ අරමුදල මඟින් දේශීය අරමුදල් ද වෙන්කර දී තිබුණි.

විශේෂ ලඟාකරගැනීම්:

2.1 රෝග නිවාරණ අංශයේ වැඩිදියුණු කිරීම්


- කාසල් වීදියේ කාන්තා රෝහල


ප්‍රදානයක් ලෙස ශ්‍රී ලංකා පූර්ව ප්‍රසව සමාජය (Perinatal Society of Sri Lanka) විසින් ලබා දුන් රුපියල් මිලියන 60 භාවිතා කරමින් මෙම රෝහලේ පැරණි නව ජන්ම දැඩි සත්කාර ඒකකය (NICU) ප්‍රතිසංස්කරණය කරන ලදී. මෙම ඒකකය වෛද්‍ය මොනිටර්ස් වාර්තා ලබා ගැනීමට අවශ්‍ය උපාංගද ඇතුලත්ව නවීන තාක්ෂණයෙන් යුත් උපකරණ වලින් ශක්තිමත් කරන ලදී. තවද, NICU එකට රෝහලේ ඇති ආසාදන ඇතුළුවීම වැළැක්වීමට නව යෙදවුමක්, එනම්, සුහුරු මෙවලමක් (Smart entry) හඳුන්වා දෙන ලදී. මෙහි ක්‍රියාකාරීත්වය අනුව, ඕනෑම කෙනෙක් NICU එකට ඇතුළුවීමට පෙර දැත් විෂබීජහරනය වී ඇත්දැයි හඳුනාගැනීමට යතුරු කාඩ්පතක් (keycard) පැළඳ සිටීම අනිවාර්ය වේ. දොරගුළුවලට අවශ්‍ය සංඥාව WI-FI මඟින් යතුරු කාඩ්පත කියවීම සහ දැත් විෂබීජහරනය කිරීමේ උපාංග ක්‍රියාත්මක වීම හරහා දොරවල් විවෘත වේ. බිළිඳුන්ගේ සුරක්ෂිතභාවය සඳහා හඳුන්වා දුන් අනෙක් වැදගත් ක්‍රියාකාරකම වන්නේ ඉන්කියුබේටරය ජීවානුහරණය සඳහා එයට පැත්තකින් සවිකර ඇති ජීවානුහරන බෝතලය විදුලි ස්විචයකට WI-FI හරහා සම්බන්ධකර තිබීමය. එමගින් ආසාදන පාලන නියමයන් උල්ලංඝනය කරන්නන් හඳුනා ගැනීම සඳහා

අනතුරු ඇඟවීමේ ශබ්දය නිකුත් වී එහි විදුලි බල්බ දැල්වී NICU එකේ ආයතනභාර නිලධාරි වෙත විස්තරාත්මක පණිවිඩය නිකුත් කෙරේ.










➢ **දකුණු කොළඹ ශික්ෂණ රෝහල, කළුබෝවිල**

- රෝගීන් රැඳී සිටීමේ කාලය අඩු කිරීමට හා බාහිර රෝගී අංශය ඩිජිටල්කරණය සඳහා රෝගීන් ලියාපදිංචි කිරීමට QR කේතය හඳුන්වා දෙන ලදී.
- රෝහල් පරිශ්‍රයේ වගා කරන නැවුම් එළවළු රෝගීන් සඳහා ලබා දීම.
- හදිසි අනතුරු වාට්ටුවේ කණ්ඩායම විසින් SIMWARDS 2023 තරඟයේ දෙවන ස්ථානය දිනා ගන්නා ලදී.
- හෘද රෝග සායනය අසල සනීපාරක්ෂක පහසුකම් සංකීර්ණය විවෘත කරන ලදී.
- ‘‘ඒ’’ ශල්‍යාගාරයේ වායු සමීකරණ පද්ධතිය අළුත් වැඩියා කරන ලදී.
- වාට්ටු අංක 17 අසල රැඳී සිටීමේ ප්‍රදේශය (Waiting area) විවෘත කරන ලදී.
- ඒකක අතර ඵලදායිතාවය, ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතාය පිළිබඳ තරඟය පවත්වන ලදී.
- 2023 සඳහා නවෝත්පාදන ව්‍යාපෘතිය ඇගයීම සිදු කරන ලදී.
- විකිරණවේදී දෙපාර්තමේන්තුව අළුත්වැඩියා කරන ලදී.



හදිසි අනතුරු වාට්ටුවේ කණ්ඩායම විසින් SIMWARDS 2023 තරඟයේ දෙවන ස්ථානය දිනා ගැනීම





"ඒ" ශල්‍යාගාරයේ වායු සමීකරණ පද්ධතිය අළුත් වැඩියා කිරීම







2023 සඳහා නවෝත්පාදන ව්‍යාපෘතිය ඇගයීම සිදු කිරීම

- **දිස්ත්‍රික් මහ රෝහල මාතර / කඹුරුගමුව**

- කඹුරුගමුව නව දිස්ත්‍රික් මහ රෝහලේ පිළිකා ඒකකය විවෘත කිරීම









➢ **මුඛ සෞඛ්‍ය ආයතනය (IOH) මහරගම**

- දන්ත චිකිත්සක පුහුණු පාසලේ කෑම කාමරය අළුත්වැඩියා කිරීම




පෙර



පසු

- මුඛ සෞඛ්‍ය ආයතනයේ ප්‍රවේශය සහ අනාරක්ෂිත මායිම් බිත්තිය ප්‍රතිසංස්කරණය කිරීම







පෙර

පසු

➢ **ජාතික රෝහල - මහනුවර**

- අණුක හඳුනාගැනීමේ රසායනාගාරය ස්ථාපිත කළ අතර එය 2024.01.06 දින සිට ක්‍රියාත්මක කරන ලදී. ධර්මරාජ විද්‍යාලයේ ආදි සිසුන් (80-83 කණ්ඩායම) ගේ සහයෝගයෙන් ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු කළ අතර කොවිඩ් ප්‍රතිකාර ඒකකය මඟින් උපකරණ ලබාදෙන ලදී. මෙම පහසුකම මඟින් පිළිකා සලකුණු සහිත රෝගීන්ගේ එම සෛල හඳුනා ගැනීම පහසුවෙන් සිදුකර ගත හැකි වේ.

- සුව කළ නොහැකි රෝගීන් (පිළිකා, වකුගඩු, ස්නායු ආබාධ, පිත සහිත ආබාධ ආදි) ඔවුන්ගේ මරණය සිදුවන තෙක් සුව පහසුව ඇතිව සිටීමට ඉඩ සැලසීම සඳහා වකුගඩු සමාජයේ ප්‍රදානයක් ලෙස ලැබුණ සහන සත්කාර සේවා ඒකකය 2023.10.29 දින ස්ථාපිත කරන ලදී.

- ජාත්‍යන්තර සිංහ පදනමේ මූල්‍යාධාර ඇතිව ළමා පිළිකා නිවහන ඉදිකිරීම ආරම්භ කර ඇති අතර එය සිදු වෙමින් පවතී.

➢ **ශ්වසන රෝග සඳහා වූ ජාතික රෝහල - වැලිසර**

- පවත්නා වාට්ටුවක්, කාන්තා ශල්‍ය වාට්ටුවක් බවට පත් කරන ලදී.
- බහු ඖෂධ ප්‍රතිරෝධී (MDR) වාට්ටුව අළුත්වැඩියාව
- බහු ඖෂධ ප්‍රතිරෝධී රෝගීන් සඳහා සංගීත චිකිත්සා ප්‍රතිකාර වැඩසටහන
- සහන සත්කාර සේවා වැඩිදියුණු කිරීමට පවුලේ සාමාජිකයින් සඳහා රැස්වීම් පැවැත්වීම
- වීදි බල්ලන් හා බළලුන් පාලනය සඳහා වැඩසටහන්
- කාර්ය මණ්ඩලය සඳහා රෝග හඳුනා ගැනීමේ වැඩසටහන්









➢ **සුව සැරිය ගිලන් රථ සේවය (1990)**

- ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙනුවෙන් පූර්ව රෝහල් හදිසි සත්කාර සේවය වර්ෂ 7ක කාලයක් තුළ සැපයීම වෙනුවෙන් 1990 සුවසැරිය මගින් 2023 ජූලි මස 28 දින සමරන ලදී. 1990 සුවසැරිය පදනම විසින් පූර්ව රෝහල් සත්කාර ගිලන් රථ සේවාව ලෝකය පුරා අතිවිශිෂ්ඨ කාර්යක්ෂම ප්‍රමිතීන් අනුව පවත්වා ගෙන යන අතර මේ වන විට දිවයින පුරා ගිලන් රථ 322 සේවයේ යොදවා ඇත.

- කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා හදිසි ප්‍රතිකාර වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ (SLCEP) හා 1990 සුවසැරිය පදනම එක්ව හදිසි ප්‍රතිකාර වෛද්‍ය තාක්ෂණඥයින් සඳහා අතුරු වෛද්‍ය සේවා ඩිප්ලෝමාව සකස් කරන ලදී. අළුතින් බඳවාගත් හදිසි වෛද්‍ය ප්‍රතිකාර තාක්ෂණඥයින්ගේ ප්‍රථම කණ්ඩායම එම වැඩසටහන අනුව පුහුණුව ආරම්භ කල අතර නියමු වැඩසටහනක්ද ආරම්භ කරන ලදී.




ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් සංවිධානය කරනු ලැබූ 1990 සුවසැරිය පදනම විසින් පැවැත්වූ ගිනි සරඹ වැඩසටහන

- **ශික්ෂණ රෝහල - කරාපිටිය**
  - මෙම රෝහල සඳහා පාරිසරික බලපත්‍රය ලැබුණි.
  - විකිරණ මඟින් රෝග හඳුනා ගැනීමේ පැක්ස් (PACS) පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
  - නව වකුගඩු, රුධිර කාන්දුපෙරණ හා බද්ධ කිරීමේ ඒකකය, ඔටිසම් මධ්‍යස්ථානය සහ රසායනික චිකිත්සක එක් දින මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී.
  - ප්‍රදානයක් ලෙස ලද 1000KV ජෙනරේටරය මඟින් සම්පූර්ණ රෝහලම ආවරණය වන පරිදි විදුලි සැපයුම ලබා දෙන ලදී.
  - ජාතික තුවාල නිරීක්ෂණ පද්ධතිය පිළිබඳ හොඳම කාර්ය සාධනය සහතිකය ලැබුණි.
  - පොලිතින්වලින් තොර රෝහලක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
  - පර්යේෂණ සහ සායනික විගණන ඒකකය ස්ථාපිත කළ අතර ආහාර පිරිවැය CABG සහ බාහිර රෝගී අංශය පිළිබඳ පර්යේෂණ සිදු කරන ලදී. දියවැඩියා රෝගීන් හඳුනා ගැනීම හා සායනික ලිපි ලේඛන සම්බන්ධයෙන් සායනික විගණනය පවත්වන ලදී.
  - වාට්ටු අංක 05 හි නව අධි සත්කාර ඒකකයක් ස්ථාපිත කරන ලදී.











2.2 සෞඛ්‍ය සේවාවන් ඩිජිටල්කරණය

ජාතික සෞඛ්‍ය ක්‍රමෝපායික ප්‍රධාන සැලැස්ම 2016-2025 හි ඩිජිටල් සෞඛ්‍ය ඉලක්ක පැහැදිලිව පෙන්වා දීමෙන් ජාතික සෞඛ්‍ය පද්ධතියට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීමේ වැදගත්කම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත. රාජ්‍ය ආයතනවල මෙන්ම පෞද්ගලික අංශයේ සෞඛ්‍ය ආයතනවල කාර්යක්ෂමතාවය, ඵලදායිතාවය සහ ගුණාත්මකතාවය වැඩිදියුණු කිරීමේ සැලකිය යුතු කාර්යභාර්යක් ඩිජිටල් සෞඛ්‍යයට කල හැකිය.

- 2023 දී, ශ්‍රී ලංකාව ඒකාබද්ධ ඩිජිටල් සෞඛ්‍ය යටිතල ව්‍යුහයක් ඉදිරියට ගෙන යමින් ජාතික ඩිජිටල් සෞඛ්‍ය සැලැස්ම අනුමත කරන ලදී. ගෝලීය අරමුදලේ සහය ඇතිව, රෝහල් 20 ක රෝහල් තොරතුරු කළමනාකරණ පද්ධතිය (HHIMS) යෙදවීම, ඩිජිටල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා Debt2Health ව්‍යාපෘතිය සහ ජාතික ඉලෙක්ට්‍රොනික සෞඛ්‍ය වාර්තා (NEHR) වේදිකාව සමඟ පද්ධති අන්තර් ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීම සඳහා කනෙක්ටතන් ඇතුළත් විය. මීට අමතරව, Debt2Health ව්‍යාපෘතිය මඟින් විස්තීරණ ඩිජිටල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රෝහල් 30ක් වෙන් කර ඇති අතර, අනුක්‍රමික අදියර දෙකකට බෙදා ඇත. ඊට සමගාමීව, ප්‍රාථමික සත්කාර සඳහා විවෘත MRS මත පදනම් වූ පොකුරු රෝහල් තොරතුරු පද්ධතියේ සංවර්ධන අදියර අවසන් කරන ලදී. සෞඛ්‍ය තොරතුරු ඒකකය අඛණ්ඩව සහාය ලබා දුන් අතර සෞඛ්‍ය ප්‍රමිතික සහ තොරතුරු ආරක්ෂණ මාර්ගෝපදේශ සඳහා උපකරණ පුවරු දියත් කරන ලදී. ඩිජිටල් සෞඛ්‍ය මෘදුකාංග බඳවා ගැනීම්, ඩිජිටල් සෞඛ්‍ය ඇටලස් සහ පාලන අභියෝග පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය තුළ ප්‍රගතියක් දක්නට ලැබුණි. අවසන් කරන ලද ජාතික සෞඛ්‍ය ශ්‍රම බලකායේ ධාරිතා ගොඩනැගීමේ සැලැස්ම විවිධ ධාරිතා ගොඩනැගීමේ ප්‍රයත්නයන් තුළින් ඩිජිටල් සෞඛ්‍ය ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම අරමුණු කර ගෙන ඇත.





- ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති දැනට භාවිතා කරන ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියට අදාළව කඩදාසි මත පදනම් වූ ක්‍රියාපටිපාටි අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම, අනුමත කිරීම, අයවැය ප්‍රතිපාදන ලබාදීම සහ ප්‍රගති වාර්තා ලබාදීම සඳහා ව්‍යාපෘති කළමණාකරණ තොරතුරු පද්ධතිය (PMIS) සකස් කරන ලදී. මෙම වැඩසටහන 2023.10.02 දින දියත් කල අතර අදාල නිලධාරීන් (වෛද්‍ය නිලධාරීන් / සංවර්ධන

නිලධාරින්) සඳහා පුහුණු සැසි 02 ක් 2023 දෙසැම්බර් මාසයේ 11 හා 12 වැනි දිනවල මෙට්‍රොපොලිටන් කැම්පස් හි දී පවත්වන ලදී.

2.3 විදේශාධාර ව්‍යාපෘති

- **මාතර දිස්ත්‍රික් මාතෘ හා නව ජන්ම සෞඛ්‍ය සත්කාර පහසුකම් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (කොයිකා අධාර)**

  කඹුරුගමුව නව දිස්ත්‍රික් මහ රෝහලේ මාතෘ වාට්ටු සහ නව ජන්ම සත්කාර ඒකක විවෘත කිරීම 2023.03.31 දින සිදු කරන ලදී. එම රෝහලේ රෝගීන් හා කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා බස් රථ 02 ක්ද ප්‍රදානය කරන ලදී.





- **උතුරු පළාතේ රෝහල් සංවර්ධනය** (DRIVE ව්‍යාපෘතිය)

  මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම් අංග 5 කින් සමන්විත වන අතර ඒවායේ ප්‍රගතිය 2023 වර්ෂය අග වන විට පහත පරිදි විය.

  - වව්නියාව දිස්ත්‍රික් මහ රෝහලේ හෘද රෝග සහ වකුගඩු රෝග මධ්‍යස්ථානය ඉදි කිරීම (95%)
  - කිලිනොච්චිය දිස්ත්‍රික් මහ රෝහලේ පළාත් කාන්තා සෞඛ්‍ය සත්කාර මධ්‍යස්ථානය ඉදි කිරීම (95%)
  - පේදුරුතුඩුව, මුලික රෝහලේ අංගසම්පූර්ණ උපකරණ සහිතව නවීන අනතුරු හා හදිසි ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදි කිරීම (100%)
  - මාන්කුලම් මූලික රෝහලේ මානසික ක්ෂතිය ඒකකය ඇතුලත්ව පළාත් පුනරුත්ථාපන මධ්‍යස්ථානය ඉදිකිරීම (95%)

- **හෙල්මුට් කෝල් මාතෘ රෝහල කරාපිටිය, ගාල්ල**

  2018 දී ආරම්භ වූ මෙම ව්‍යාපෘතිය 2023 දී අවසන් කෙරුණි. 2004 දී සුනාමියෙන් විනාශ වූ මහමෝදර ශික්ෂණ රෝහල ප්‍රතිස්ථාපනය සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කර තිබුණි. ගොඩනැඟිලි සංකීර්ණය, වියන් වහලය, මලාපවහන බලාගාරය සහ අනෙකුත් යටිතල පහසුකම් ආදිය සම්පූර්ණ කරන ලදී. ශල්‍යාගාර, හදිසි ප්‍රතිකාර ඒකකය (ICU), ළදරු හදිසි ප්‍රතිකාර ඒකකය (NICU), විකිරණවේද දෙපාර්තමේන්තුව, හා නොමේරූ ළදරු ඒකකය සඳහා අවශ්‍ය අනෙකුත් සාමාන්‍ය උපකරණ මිල දී ගෙන ඇත. මෙම රෝහල සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ මිල දී ගෙන ස්ථාපිත කර තිබුණි. මෙම රෝහල ජනතාව වෙත විවෘත කිරීම 2024 දී සිදු කිරීමට සැලසුම් කර ඇත.





- **කළුතර දිස්ත්‍රික් මහ රෝහල විශේෂිත මාතෘ හා ළමා රෝහලක් ලෙස වැඩිදියුණු කිරීම (නෙදර්ලන්ත අධාර)**

  මෙම ව්‍යාපෘතිය 2018 දී ආරම්භ වී 2023 දී සම්පූර්ණ කරන ලදී. සයමහල් සායනික ගොඩනැගිල්ල සහ විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍ය නිලධාරීන් සහ හෙද නිලධාරීන් සඳහා නිළ නිවාස ඉදිකිරීම සම්පූර්ණ කරන ලදී. නව ගොඩනැගිලි සංකීර්ණය සඳහා වෛද්‍ය හා වෛද්‍ය නොවන උපකරණද සපයන ලදී. 2024 වර්ෂයේ මුල් භාගයේදී මෙම රෝහල ජනතා අයිතියට පත් කිරීමට නියමිතය.

- **තෝරාගත් රෝහල් වල (රෝහල් 13 ක) සෞඛ්‍ය පහසුකම් ඉහළ නැංවීම**

  මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් රෝහල් 13 ක විශේෂිත සත්කාර සේවාවන් පුළුල් කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකෙරෙනු ඇත. 2023 අවසාන වන විටද මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය 2022 පැවති තත්වයේම තිබුණි. එයට හේතුව දේශීය අරමුදල් සහ විදේශීය අරමුදල් හරහා මුල්‍යකරණය වූ ව්‍යාපෘතිවල ඉදිරි කාර්යසාධනය සමාලෝචනයට හා නිසි විසඳුම් ලබා දීමට පත් කරන ලද අග්‍රාමාත්‍යවරයාගේ ලේකම් ප්‍රධානත්වය උසුලන මහ පරිමාණ ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත් කිරීම (RAMP) සඳහා වූ නිල කමිටුව මඟින් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවා තිබීමය. රිකිල්ලගස්කඩ හා වලස්මුල්ල මූලික රෝහල්වල සහ අළුත්ගම ප්‍රාදේශීය රෝහලේ ගොඩනැගිලි ඉදිකිරීම 100% සම්පූර්ණ කර ඇත. ඉතිරි රෝහල් 10 හි ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය පහත සඳහන් වේ.

  මූලික රෝහල් - පදවිය (98%), මැදිරිගිරිය (96%), සමන්තුරේ (95%), මහියංගනය (85%), පොතුවිල් (82%), එරාවුර් (80%), මීරිගම (71%), සහ කලවාන (15%)

  ප්‍රාදේශීය රෝහල් - කල්පිටිය (82%) සහ දර්ගා නගරය (78%)

- **ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියා සඳහා වූ ගෝලීය අරමුදල (GFATM) ව්‍යාපෘතිය**

  2003 සිට ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව තුරන් කිරීම සඳහා ගෝලීය අරමුදල ශ්‍රී ලංකාවට සහයෝගය ලබා දේ. එහි නව අධාර චක්‍රය (2022-2024) මඟින් අධාර ලබා දෙන්නේ ඒඩ්ස් සහ ක්ෂය රෝගය වැලැක්වීම සඳහා පමණි. ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2023.12.31 දින වන විට පිළිවෙලින් 69% ක් හා 35% කි.

- එච්.අයි.වී./ ඒඩිස් අධාරය - 2023 වර්ෂය සඳහා සැලසුම් කර තිබූ මුළු ක්‍රියාකාරකම් සංඛ්‍යාව 287 ක් වූ අතර ඉන් ක්‍රියාකාරකම් 250 ක් ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී. එම සංඛ්‍යාවෙන් ක්‍රියාකාරකම් 70 ක් සම්පූර්ණ කර ඇත.

- ක්ෂය රෝග ආධාරය - මුළු ක්‍රියාකාරකම් සංඛ්‍යාව 45 කි. ඉන් ක්‍රියාකාරකම් 40 ක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර 05 ක් සම්පූර්ණ කර ඇත.

- කොවිඩ් සංරචකය / අතිරේක අධාර C19 RM: ආරම්භ කර ඇති ක්‍රියාකාරකම් 12 න් 8 ක් සම්පූර්ණ කර ඇති අතර ඉතිරි 04 ඉටු කෙරෙමින් පවතී. (ගෝලීය අරමුදලෙන් ලද අනුමැතිය අනුව PSA යන්ත්‍ර මිලදී ගැනීම ඇතුලත්ව)

➢ **සෞඛ්‍ය තොරතුරු සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (D2H)**

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සඳහා ඔරොත්තු දෙන (resilient) සහ තිරසාර පද්ධතියක් සංවර්ධනය කිරීම වෙනුවෙන් වසර තුනක කාලයක් සඳහා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 20 ක් ලබා දීමට ගෝලීය අමුදල එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2021 දී ආරම්භ වූ අතර 2024 දී නිම කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘතිය ක්‍රමෝපායික අංශ 03 ක් යටතේ අදාල ආයතන වන සෞඛ්‍ය තොරතුරු, සෞඛ්‍ය සත්කාර ගුණාත්මක සහ සුරක්ෂිතතා අංශය සහ වෛද්‍ය පර්යේෂණ ආයතනය මඟින් පහත සඳහන් පරිදි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ.

1. තොරතුරු ගලා යාමේ ඒක්‍රාගත පද්ධතිය
2. ප්‍රාථමික සත්කාර සේවා ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ සේවා බෙදා හැරීම
3. ගුණාත්මක සෞඛ්‍ය සේවා බෙදාහැරීමට සෞඛ්‍ය පද්ධතියේ ධාරිතාවය වැඩිදියුණු කිරීම.

භෞතික ප්‍රගතිය: ඩිජිටල් බ්ලූප්‍රින්ට් ගෘහ නිර්මාණ ශිල්පය, අන්තර් ක්‍රියාකාරීත්ව සැලැස්ම සංවර්ධනය, සහ මානව සම්පත් සංවර්ධන සැලැස්ම නිම කරන ලදී. පුහුණු වැඩසටහන් ආරම්භ කිරීමට නියමිතය. තෝරාගත් රෝහල් 15 ක ජාලකරණය 40% කි. රෝහල්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම - 35%, ක්ෂය රෝග පරීක්ෂාව වැඩිදියුණු කිරීම - ඩිජිටල් එක්ස් කිරණ යන්ත්‍ර 10 ක් මිලදී ගැනීම (60%), LMIS සංවර්ධන ක්‍රියාවලිය ආරම්භ කිරීම (35%) සහ MRI ජාලකරණය සහ දෘඪාංග සැපයීම (40%)

➢ **ශ්‍රී ලංකා ජීව වෛද්‍ය ඉංජිනේරු සේවාවේ යටිතල පහසුකම් පුළුල් කිරීම (KOFIH)**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල ජීව වෛද්‍ය උපකරණ වල මෙහෙයුම් හා කළමණාකරණ ධාරිතාවය වැඩිදියුණු කීමය. මෙම ව්‍යාපෘතිය යටතේ ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකක ප්‍රතිනිර්මාණය කිරීම සහ පළාත් 09 තුළ ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම, සේවා සඳහා සැපයුම් ලබාදීම, වාහන හා යන්තෝපකරණ සේවා සැපයීම, ජාතික මට්ටමේ විද්‍යුත් ජීව වෛද්‍ය උපකරණ සහ නඩත්තු පද්ධතිය සකස් කිරීම, ජීව වෛද්‍ය ඉංජිනේරුවන් සඳහා ක්ෂේත්‍රය තුළ පුහුණුව ලබාදීම සහ මෙහෙයුම් හා ඇගයීම් ක්‍රියාකාරකම්. මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ. ඩොලර් 1,615,153 ක් වන අතර මෙය ආධාරයක් ලෙස සෞඛ්‍ය සත්කාරය සඳහා කොරියා පදනම විසින් කොරියානු

ජනරජය හරහා ලබා දෙනු ලැබේ. ජීව වෛද්‍ය සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා අවශ්‍ය සියළුම අනුමැතීන් ලැබී ඇති අතර ජංගම සේවා සඳහා පැනල් වෑන් 08 ක් මිලදී ගැනීම සඳහා ටොයෝටා ලංකා පෞද්ගලික ආයතනය වෙත ප්‍රදානය කිරීම් ලිපි නිකුත් කර ඇත.

2.4 සෞඛ්‍ය ප්‍රවර්ධනය

සෞඛ්‍ය සන්නිවේදනය, සෞඛ්‍ය අධ්‍යාපනය, මාධ්‍ය සහ ප්‍රචාරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශිෂ්ටත්වයේ ජාතික මධ්‍යස්ථානය වනුයේ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයයි. මූල්‍යමය සීමාවන් හේතුවෙන් පැවති අභියෝග හමුවේ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ක්‍රියාත්මක තාක්ෂණික ඒකක හතක් මඟින් 2023 වර්ෂයේ දී පහත සඳහන් කර ඇති ප්‍රධාන ජයග්‍රහණ ලබාගෙන ඇත.

- **ප්‍රතිපත්ති, උපදේශනය හා අවදානම් සන්නිවේදන ඒකකය**
  මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා සම්බන්ධ ජාතික අවදානම් සන්නිවේදන ක්‍රමෝපායික සැලැස්ම (2023-2025) සකස් කිරීම, මුද්‍රණය හා දියත් කිරීම. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන: ක්‍රමෝපායික සැලැස්ම 2024-2030 සහ වැඩකරන ස්ථාන වල සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා වැඩසටහන 2024 සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම හා මුද්‍රණය කිරීම.





- **සෞඛ්‍ය සන්නිවේදනය, ජීවන කුසලතා සහ මාධ්‍ය ඒකකය**
  සෞඛ්‍ය ප්‍රවර්ධනයේ (උපදේශනය, මැදිහත්වීම සහ සක්‍රීය කිරීම) ප්‍රධාන උපාය මාර්ග යටතේ, "වයසට ගැළපෙන ලිංගික තොරතුරු ලබා දීම" සහ "ශ්‍රී ලංකාවේ ඔසප් සෞඛ්‍යය සහ පාරිසරික බලපෑම වැඩි දියුණු කිරීම සඳහා එක්ව ක්‍රියා කිරීම" පිළිබඳ ජාතික ක්‍රියාකාරී කණ්ඩායම් දෙකක් පිහිටුවන ලදී. අයවැය ප්‍රතිපාදන නොමැතිව උපදේශනය හා අවධානම් සන්නිවේදනය පිළිබඳව විවිධ මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම හා පහසුකම් සැපයීම, මාධ්‍ය ඒකකය මඟින් සිදු කරන ලදී.





- **පුහුණු කිරීම්, තොරතුරු අධ්‍යාපන හා සන්නිවේදන (IEC) සහ ප්‍රදර්ශන ඒකකය**
  ඉදිරි පෙළ රෝහල් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සන්නිවේදනය හා මහජන සම්බන්ධතාව පිළිබඳ දක්ෂතා වර්ධනය කිරීම. දිවයින පුරා පිහිටි ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර සේවා ඒකක වෙත ඩිජිටල් සංඥා පද්ධතිය හරහා සෞඛ්‍ය අධ්‍යාපන සජීවිකරණ සහ වීඩියෝ සැලසුම් කිරීම සහ විකාශය කිරීම.





- **ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන හා සමාජ මාධ්‍ය ඒකකය**
  ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සහ සමාජ මාධ්‍ය ඒකකය, ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය කවයන් තුළ වඩාත් විශ්වසනීය සහ ප්‍රබල සෞඛ්‍ය සන්නිවේදන වේදිකාව ලෙස සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ තත්ත්වය පවත්වා ගැනීමට සමත් විය. සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ මාර්ගගත පුහුණුව සහ සහතික කිරීමේ වැඩසටහන සංවර්ධනය කිරීම අවසන් අදියරේ පවතී.

- **මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකකය**
  සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකකය මඟින් SC/USDA හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව ප්‍රාථමික පාසල් ගුරුවරුන් සඳහා පුළුල් මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන පුහුණු මොඩියුලය සකස් කිරීමට දායක විය. විවිධ සමාජ තලවල ක්‍රියාත්මක කරන මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ඇගයීමට ලක් කරමින් ප්‍රථම වරට ප්‍රජා දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් ජාතික මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධනය සමාලෝචනය සිදු කරන ලදී.






- **පවුල් සෞඛ්‍ය, පෝෂණ සන්නිවේදනය සහ හැසිරීම් පර්යේෂණ ඒකකය**
  මව්වරුන්ගේ උපකාරක කණ්ඩායම් ක්‍රියාකාරකම් පිළිබඳ ජාතික සමාලෝචනය - 2023 පවත්වන ලද අතර සෞඛ්‍ය බල ප්‍රදේශ 26 යේ සාර්ථක මව්වරුන්ගේ උපකාරක කණ්ඩායම් හා මහජන සෞඛ්‍ය කණ්ඩායම් ප්‍රතිනතය කරන ලදී. ශ්‍රී ලංකාවේ පිහිටි යුනිසෙෆ් (UNICEF) ආයතනයේ මූල්‍ය අනුග්‍රහය ඇතිව මව්වරුන්ගේ උපකාරක කණ්ඩායම් ප්‍රජා වේදිකාව ශක්තිමත් කිරීමට "අපටත් මව් හවුලක්" නැමති පොත් පිංච සකස් කර බෙදා හරින ලදී.





- **ක්‍රමෝපායික තොරතුරු, සැලසුම්, මෙහෙයුම් හා ඇගයීම් ඒකකය**
  සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය සමඟ ලියාපදිංචි වන පෙර පාසල් සංඛ්‍යාව 40% කට වඩා වැඩි ප්‍රමාණයක වේගයක් ළඟා කර ගනිමින් පෙර පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන සැකසීම් වෙබ් පාදක තොරතුරු කළමනාකරණ පද්ධතිය ආරම්භ කිරීම සහ ශක්තිමත් කිරීම; සහ 2023 දී ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක පුරා 1 වන වාර්ෂික පෙරපාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන සමාලෝචන පැවැත්වීම. සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය මහජන සම්බන්ධතා ජාලය (HPB PEN) පිහිටුවන ලද්දේ සෞඛ්‍ය අධ්‍යාපනය සහ ප්‍රවර්ධන මැදිහත්වීම් සම-නිර්මාණය කිරීම සඳහා ය. HPB PEN සමූහය විස්තීර්ණ ලිංගික අධ්‍යාපනය සහ මුල් ළමාවිය සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා සමාජ සහ චර්යා වෙනස්වීම් සන්නිවේදන ක්‍රියාකාරකම් සඳහා අන්තර්ගත සංවර්ධනය සම-නිර්මාණය කිරීමේ නිරත විය.






2.5 සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම


- **රෝහල් උසස් කිරීම සහ නැවත කාණ්ඩගත කිරීම /නව ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක (PMCUs) ස්ථාපිත කිරීම**
  - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ අභිනවයෙන් ආරම්භ කරන ලද වෛද්‍ය පීඨයේ සිසුන් සඳහා සායනික පුහුණුව ලබාදීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා බදුල්ල පළාත් මහ රෝහල, ශික්ෂණ රෝහලක් ලෙස උසස් කරන ලදී (ගැසට්පත් අංක 2324/12 හා 2023.03.20 දිනැති). ඊට අමතරව, පහත සඳහන් සෞඛ්‍ය සේවා ආයතන 03 උසස් කර නැවත කාණ්ඩගත කරන ලදී.

දිස්ත්‍රික්කය	රෝහලේ නම	පෙර පැවති රෝහල් කාණ්ඩය	උත්ශ්‍රේණිගත රෝහල් කාණ්ඩය
අම්පාර	ප්‍රාදේශීය රෝහල සෙනල්ග්‍රාම්	ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය (PMCU)	"සී" කාණ්ඩයේ ප්‍රාදේශීය රෝහල
වවුනියාව	ප්‍රාදේශීය රෝහල පූවරසන්කුලම්	"සී" කාණ්ඩයේ ප්‍රාදේශීය රෝහල	"බී" කාණ්ඩයේ ප්‍රාදේශීය රෝහල
පුත්තලම	ප්‍රාදේශීය රෝහල කොට්ටන්තීව්	ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය (PMCU)	"සී" කාණ්ඩයේ ප්‍රාදේශීය රෝහල

- ගම්පහ දිස්ත්‍රික්කයේ රුක්මලේ නව ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය සහ පුත්තලම දිස්ත්‍රික්කයේ නාගවිල්ලු සහ කිවුල යන ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක දෙක ස්ථාපිත කරන ලදී.


- **ශ්‍රී ලංකා සෞඛ්‍ය සැලසුම්කරණය සඳහා වූ මාර්ගෝපදේශය ප්‍රකාශයට පත් කරන ලදී.**
සෞඛ්‍ය සැලසුම්කරණය පිළිබඳව පැවති දිගුකාලීන අවශ්‍යතාවයක් සම්පූර්ණ කර ගැනීමට ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුග්‍රහය ඇතිව ශ්‍රී ලංකා සෞඛ්‍ය සැලසුම්කරණය සඳහා වූ මාර්ගෝපදේශය සකස් කර ප්‍රකාශයට පත් කරන ලදී. එහි අරමුණ වූයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ (රේඛීය අමාත්‍යාංශය) මෙන්ම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශවල සැලසුම් ක්‍රියාවලිය විධිමත් කිරීමය.





- **තෘතීයික හා ද්විතීයික සේවා රෝහල් කළමනාකරණය පිළිබඳ අත්පොත මුද්‍රණය කිරීම, දියත් කිරීම හා බෙදාහැරීම**







- **ප්‍රාදේශීය රෝහල්, ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක හා පළාත් සෞඛ්‍ය සේවා / අධ්‍යක්ෂ /ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කළමණාකරණය පිළිබඳ අත්පොත් සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.**

- **ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක හා ප්‍රාදේශීය රෝහල් (ඒ, බී , සී වර්ගය) සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ ලැයිස්තුව සහ ඒ හා බී කාණ්ඩවල මූලික රෝහල් සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ ලැයිස්තුව (රසායනාගාර උපකරණ හැර) සකස් කරන ලදී.**

- **දුක්ගැනවිලි සම්බන්ධීකරණය**

  "සුවසවන" නමින් දුක්ගැනවිලි සම්බන්ධීකරණ **ඒකකය** (GCU) 2019 දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථාපිත කරන ලදී. මෙහි අරමුණ වූයේ රජයේ සෞඛ්‍ය සත්කාර ආයතන මඟින් ලබාදෙන සේවාවන් පිළිබඳ මහජන අදහස්, පැමිණිලි මෙන්ම යෝජනා භාරගැනීමට පහසුකම් සැලසීමය. මෙම පද්ධතිය හදිසි ඇමතුම් අංකය - 1907 සහිත ජාතික ඇමතුම් මධ්‍යස්ථානය සහ ආයතනික දුක් ගැනවිලි බාරගැනීමේ ඒකක (IGRUs) වලින් සමන්විත වේ. මෙම සියළුම ඒකක සඳහා ආයතන භාර නිලධාරීන් පත්කර ඇති අතර දුක්ගැනවිලි තොරතුරු කළමනාකරණ පද්ධතිය පිලිබඳ පුහුණුවක් ලබා දී ඇත. මහජනතාවට හෝ එහි සේවාවන් අවශ්‍ය අය සඳහා තම සුක්ගැනවිලි හදිසි ඇමතුම් අංකය, ඊ මේල්, වට්ස්ඇප් හෝ ලිඛිතව මෙම ආයතන දැනුම් දිය හැක. ලැබෙන තොරතුරු ගොනු කර අවශ්‍ය පියවර ගැනීම සඳහා අදාල බලධාරීන් වෙත යොමු කරනු ලැබේ. මේ සම්බන්ධ සියළුම ක්‍රියාකාරකම් දුක්ගැනවිලි සම්බන්ධීකරණ ඒකකය මගින් අධීක්ෂණය කරනු ලැබේ.

හදිසි ඇමතුම් අංකය	-	1907
වට්ස්ඇප්	-	0707907907
ඊ-මේල්	-	suwasawana@health.gov.lk



2.6 සෞඛ්‍ය සත්කාර ගුණාත්මකභාවය සහ සුරක්ෂිතභාවය

- සෞඛ්‍ය සත්කාර ගුණාත්මකභාවය සහ සුරක්ෂිතභාවය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව ස්ථාපිත කිරීම



- සම්මතයන් / මාර්ගෝපදේශ /රෝගීන්ගේ සුරක්ෂිතතාවය සම්බන්ධ අත්පත්‍රිකා මුද්‍රණය කිරීම

- රෝගීන් නිරීක්ෂණ සටහන් පත්‍ර හා පසු විපරම් ආකෘති පත්‍ර මුද්‍රණය කිරීම

- ශල්‍ය කර්ම සුරක්ෂිතතා පිරික්සුම් ලැයිස්තුව (Check list) මුද්‍රණය කිරීම

- සමාන සිදුවීම් නැවත සිදුවීම වැළැක්වීමට රෝහල් සඳහා ඖෂධ සම්බන්ධ සිද්ධි වාර්තා කිරීමේ පද්ධතිය හඳුන්වා දෙන ලදී. වාර්තා කිරීමේ ආකෘති පත්‍රය සකස් කර ‘‘එච්’’ අංකය ලබාගෙන වාර්තා කිරීම සඳහා රෝහල් වෙත ලබා දුන්නේය

- මිණුම් සලකුණු (Benchmark) ආයතනවල ගුණාත්මකභාවය පිළිබඳව නිරීක්ෂණය සඳහා වලස්මුල්ල මූලික රෝහල වෙත අධ්‍යයන චාරිකාවක් සිදු කළේය.

- ලෝක රෝගී සුරක්ෂිතතා දිනය සැමරීම සඳහා සෞඛ්‍ය ආරක්ෂණයේ ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතාවය පිළිබඳ දෙදින ජාතික සම්මුතියක් 2023 සැප්තැම්බර් 15 සහ 16 යන දිනයන්හිදී පවත්වන ලදී.

- ප්‍රාථමික සත්කාර ආයතන සඳහා තත්ත්ව ඇගයීම් මෙවලම වෙබ්-පාදක පද්ධතියක් බවට සංවර්ධනය කිරීම ආරම්භ කළ අතර වෙබ් පාදක මෙවලම කළමනාකරණය කිරීම සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ප්‍රදේශ 26 හි සහ DHQS හි තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කරන ලදී. වෙබ් පාදක මෙවලම ගූගල් පෝරමයක් ලෙස සංවර්ධනය කරන ලදී.

- සෞඛ්‍ය ආරක්ෂණයේ ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතාවය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් තුනක් සහ සායනික විගණනය පිළිබඳ වැඩමුළු තුනක් පවත්වන ලදී.




- ශ්‍රී ලංකාවේ භාවිත වන Look Alike Sound Alike (LASA) ඖෂධ ලයිස්තුව සහ අධි අවදානම් (High risk) වෛද්‍ය ප්‍රතිකාර ලයිස්තුව සකස් කරන ලදී.

- උපාධි අපේක්ෂකයින්ගේ විෂය මාලාව සහ තීරණාත්මක (critical) කාර්ය මණ්ඩල කාණ්ඩ සඳහා අඛණ්ඩ වෘත්තිය සංවර්ධනය (CPD) සඳහා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම වෙනුවෙන් පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය කිරීම.

- රෝහල්වල රෝගීන්ගේ සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීමට රෝහල් චාරිකා සිදු කිරීම.
  ශක්‍යතා අධ්‍යයනය සහ ප්‍රාථමික වෛද්‍ය සත්කාර ආයතන සඳහා ගුණාත්මකභාවය අධික්ෂණය කිරීමේ මෙවලමට ක්‍රියාකාරී සංරචක එකතු කිරීමේ විෂය පථය තීරණය කිරීම සඳහා ගෝනදුව ප්‍රාදේශීය රෝහල වෙත 2023.10.04 දින චාරිකා කළේය.
  2023.11.21 දින මහනුවර ජාතික රෝහල වෙත චාරිකා කරන ලදී.

2.7 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධීකරණය

- සෑම දිස්ත්‍රික්කයකම මානව සම්පත් ඒකක ස්ථාපිත කිරීම
- හෙද සිසුන් බඳවා ගැනීම - 2021 (2019/2020 උසස් පෙළ) - වාචික පරීක්ෂණය සඳහා අපේක්ෂකයින් 3863 තෝරා ගන්නා ලදී.
- සෞඛ්‍ය මානව සම්පත් පිළිබඳ ජාතික ක්‍රමෝපායික සැලැස්ම 2020-2030 කෙටුම්පත අවසන් කිරීම



සුව සේවාවේ අතුරු වෛද්‍ය සේවා හා පරිපූරක වෛද්‍ය සේවාවල 242කට පත්වීම් ලිපි ප්‍රදානය කිරීම

2.8 වෛද්‍ය සැපයීම්

දිවයින පුරා පිහිටි රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සත්කාර ආයතන සඳහා අවශ්‍ය සියළුම ඖෂධ, ශල්‍ය අයිතම, රසායනාගාර අයිතම, විකිරණවේදී අයිතම සහ මුද්‍රිත පෝරමයන් සැපයීමේ වගකීම දරණ ප්‍රධාන ආයතනය සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය (MSD) වේ. එමෙන්ම දිවයින පුරා පිහිටි පෞද්ගලික රෝහල් ඇතුළුව සියළුම රෝහල් වෙත අන්තරායකර ඖෂධ සැපයීමේ එකම නියෝජිතයා ද වෛද්‍ය සැපයුම් අංශය වේ.

- 2023 වර්ෂයේ මිලදී ගන්නා ලද වෛද්‍ය සැපයුම්


විස්තරය	වැය ශීර්ෂය	මුළු ප්‍රතිපාදන (රුපි. මිලි.)	මුළු වියදම (රුපි. මිලි.)	මූල්‍යමය ප්‍රගතිය % වශයෙන්
වෛද්‍ය සැපයුම් අංශයට හා රෝහල්වලට වෛද්‍ය සැපයුම් (ශ්‍රී.ලං.ර.)	111-2-25-003-1204(11)	49,100	45,661.41	91.00
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව SPC (ශ්‍රී.ලං.ර.)	111-2-25-001-1204(11)	45,700	45,672.40	99.94
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව SPC (විදේශාධාර)	111-2-25-001-1204(12)	55,000	25,217.79	45.85
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව - SPMC (ශ්‍රී.ලං.ර.)	111-2-25-002-1204(11)	26,700	26,672.00	99.90
එකතුව		**176,500**	**143,223.60**	**81.15**

- වෛද්‍ය සැපයුම් අංශයේ වෛද්‍ය උපකරණ සහ රසායනාගාර අයිතම සඳහා සූත්‍රය සංශෝධනය සම්පූර්ණ කිරීම
- ශ්‍රී ලංකා ප්‍රති ක්ෂුද්‍ර ජීවී භාවිතය (AMC) ආවේක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකාවේ පිහිටි කාර්යාලයේ මහ පෙන්විම යටතේ එය ක්‍රියාත්මක කිරීම
- 2022/2023 කාලය තුල වෛද්‍ය සැපයුම් සහකාරවරුන් 66 දෙනෙකු විසින් ගබඩා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කරන ලදි.

2.9 ජාතික රුධිර පාරවිලයන සේවාව

ශ්‍රී ලංකාවේ ජාතික රුධිර පාරවිලයන සේවාව (NBTS) යනු සෞඛ්‍ය අමාත්‍යාංශයේ මධ්‍යම සම්බන්ධීකරණ විශේෂිත ආයතනය වේ. සියළුම රජයේ රෝහල් සහ බොහොමයක් පෞද්ගලික අංශයේ රෝහල් සඳහා රුධිරය සහ රුධිර නිෂ්පාදන සැපයීමේ ජාතික වගකීම දරනු ලබන්නේ මෙම ආයතනය මඟිනි. රෝහල්වල ස්ථාපිත රුධිර බැංකු 109 ක් සහ භූගෝලීය බෙදා හැරීම අනුව තොරතුරු මධ්‍යස්ථාන 24 කට සම්බන්ධ රුධිර මධ්‍යස්ථාන 02 ක් පවතී.

- රුධිරය බැහැර කිරීමේ මට්ටම <1% දක්වා අඩු වීම
- ආර්ථික අර්බුදය හමුවේ වුවද 100% ස්වේච්ඡාවෙන් ලබාදෙන රුධිර ප්‍රමාණය පවත්වාගෙන යාම
- ඉහළ බලපෑමක් සහිත තිරසර අධ්‍යාපනික වැඩසටහන (ERASMUS) හඳුන්වා දීම
- ප්‍රමිතිකරණ ක්‍රියාවලිය නොකඩවා කරගෙන යාම හා FSO15189 ප්‍රමිතිකරණය සාර්ථකව ලභාකර ගැනීම
- ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර හා ඔවුන්ගේ වෘත්තියට අදාලව නිලධාරීන් 342 ක් පුහුණුව ලැබුවේය. වෛද්‍ය නිලධාරීන් (122 දෙනෙකු), හෙද නිලධාරීන් (71 දෙනෙකු), මහජන සෞඛ්‍ය නිලධාරීන් (02 දෙනෙකු) සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල (18 දෙනෙකු)



සටහන 2: ස්වේච්ඡාවෙන් ලබාදෙන 100% ක් රුධිර ප්‍රමාණය නොකඩවා පවත්වා ගනිමින් රුධිරය එකතු කිම වාර්ෂිකව ඉහළ නැංවීම

2.10 බෝ නොවන රෝග

- **Resolve to Save Lives මඟින් ආධාර කරන ලද ව්‍යාපෘතිය:** 2020 දී, සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝ නොවන රෝග පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය වෙත අධි රුධිර පීඩනය පිළිබඳ ප්‍රොටෝකෝලය පදනම් කරගත් කළමනාකරණය සංවර්ධනය කිරීම සහ ඇන්ඩ්‍රොයිඩ් පාදක යෙදුමක් (සරල යෙදුම) භාවිතයෙන් රෝගීන් පසු විපරම් සිහිකිරීමේ පද්ධතිය, සෞඛ්‍ය තොරතුරු පද්ධතිය හා ඒකාබද්ධ කිරීම සඳහා Resolve to Save Lives ආයතනය මඟින් පර්යේෂණ ප්‍රදානයක් ලැබුණි.

  ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් ප්‍රකාශයට පත් කරන ලද අධිරුධිර පීඩනය කළමණාකරණය පිළිබඳ මාර්ගෝපදේශය මත පදනම්ව ප්‍රොටොකෝලය වැඩිදියුණු කරන ලදී. 2022 ජනවාරි සිට මෙම ව්‍යාපෘතිය කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාථමික සත්කාර රෝහල් තුනක නියමු ලෙස ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය 2023 අප්‍රේල් වලදී කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි තවත් ප්‍රාථමික සත්කාර රෝහල් එකොලහක් දක්වා පුළුල් කරන ලදී. මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි රෝහල් දහයක ද මෙම ව්‍යාපෘතිය 2023 සැප්තැම්බර් මාසයේදී ක්‍රියාත්මක කරන ලදී.

<u>ළඟාකර ගැනීම්:</u>

- නියමු රෝහල්වල අධි රුධිර පීඩනය කළමනාකරණය සඳහා අධි රුධිර පීඩන කළමනාකරණ ප්‍රොටෝකෝලය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.
- ඵලදායිතාව පාලනය කිරීම සහ රෝගීන් පසු විපරම් කිරීම සඳහා රුධිර පීඩන මාපක උපාංග හා ඇනඩ්‍රොයිඩ් (android) දුරකථන ලබා දෙන ලදී.

- ජීවන රටා වෙනස් කිරීම්, අධි රුධිර පීඩන කළමනාකරණ මාර්ගෝපදේශ, අධි රුධිර පීඩන කළමනාකරණ ප්‍රොටෝකෝල සහ සරල යෙදුම පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා රෝහල් කාර්ය මණ්ඩලය (100) සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- ඇගයීම සහ සම පුහුණු.මාර්ගෝපදේශ සකස් කරන ලද අතර පුහුණු කරන්නන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන සම්පූර්ණ කරන ලදී.
- නියමු රෝහල්වල සහ වැඩිදියුණු කිරීම සඳහා හඳුනාගත් දුර්වල ප්‍රදේශවල රෝගීන්ගේ තෘප්තිමත් සමීක්ෂණ සහ සායනික විගණනය සිදු කරන ලදී.
- සාමාන්‍ය රුධිර පීඩනය පාලනය කිරීමේ අනුපාතය 61% වන අතර මහහැරුණු පැමිණීම් අනුපාතය 13% ක් පමණි. STEPS අධ්‍යයනය අනුව ජාතික පාලන අනුපාතය 35% ක් වන අතර මෙම අගයන් අනුව ඉතා ඉහළ වර්ධනයක් පෙන්නුම් කරයි.

වර්ෂය	2022 දෙසැම්බර්	2023 දෙසැම්බර්
මුළු ලියාපදිංචි රෝගීන්ගේ සංඛ්‍යාව	5331	16634
අධි රුධිර පීඩන පාලන අනුපාතය	50%	67%
අධි රුධිර පීඩන පාලනය නොකිරීමේ අනුපාතය	37%	20%
මහ හැරුණු පැමිණීම් අනුපාතය	12%	11%
මුළු රෝහල් ගණන	3	24




➢ **පිළිකා පාලනය**


පිළිකා වැළැක්වීම හා පාලනය පිළිබඳ කේන්ද්‍රීය ආයතනය වනුයේ ජාතික පිළිකා මර්ධන වැඩසටහන (NCCP) වේ. "ශ්‍රී ලංකාවේ පිළිකා වැළැක්වීම හා පාලනය පිළිබඳ ජාතික ක්‍රමෝපායික සැලැස්ම 2020 – 2024 "අනුව පිළිකා වැළැක්වීම හා පාලනය සම්බන්ධව ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධික්ෂණය කිරීමට රේඛීය අමාත්‍යාංශයේ


අනෙකුත් අධ්‍යක්ෂක අංශ හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් සමඟ සම්බන්ධීකරණය කිරීම මෙහි කාර්යභාරය වේ.


- පෙබරවාරි 04 වැනි දින ලෝක පිළිකා දිනය, ජූලි 27 දින ලෝක හිස සහ බෙල්ල පිළිකා දිනය, පෙබරවාරි 15 වැනි දින ජාත්‍යන්තර ළමා පිළිකා දිනය, ඔක්තෝම්බර් 14 වැනි දින ලෝක ආගන්තුක සත්කාර සහ සහන සත්කාර දිනය හා ඔක්තෝම්බර් පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ මාසය සැමරීම

- ශ්‍රී ලංකාවේ තහවුරු කරන ලද මානව පිළිකා කාරක පිළිබඳ ඇට්ලස් සංවර්ධනය සහ තොරතුරු, අධ්‍යාපන හා සන්නිවේදන (IEC) ද්‍රව්‍ය, ස්වයං පියයුරු පරීක්ෂාව, මුඛ පිළිකා හා සාමාන්‍ය පිළිකා රෝහින් යොමු කිරීම සඳහා භාවිතා වන සායනික වාර්තාව (H-1314) (3 වන සංස්කරණය) සහ සවිබල ගැන්වීම සඳහා වූ වැඩිහිටි රූකවරණ අත්පොත යාවත්කාලීන කිරීම හා මුද්‍රණය කිරීම (4 වැනි සංස්කරණය).












- OPMD සහිත අලුතින් හඳුනාගත් සියලුම රෝගීන් සඳහා සම්මත සායනික වාර්තා සංවර්ධනය කිරීම, OPMD කළමනාකරණය සඳහා ජාතික මාර්ගෝපදේශ (4 වන සංස්කරණය) සහ සෞඛ්‍ය සේවා සපයන්නන් සඳහා දිවි ගලවා ගැනීමේ මාර්ගෝපදේශය, පියයුරු සායන සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය, දන්ත හා වෛද්‍ය වෘත්තිකයන් සඳහා OPMD කඩිනම් මාර්ගෝපදේශ මුද්‍රණය කර බෙදා හරින ලදී.






- 2020 සහ 2021 වර්ෂ වල ජාතික පිළිකා සිද්ධි දත්ත ප්‍රකාශයට පත් කරන ලදී. CanReg මෘදුකාංගය භාවිතයෙන් OMF ඒකක වලින් ලැබෙන මුඛ පිළිකා දත්ත ඇතුලත් කිරීමට දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා ප්‍රායෝගික පුහුණු කිරීමේ වැඩසටහන් දෙකක් පැවැත්වූ අතර

ලැප්ටොප් පරිඝනක තුනක් දියතලාව මූලික රෝහල හා කිලිනොච්චිය දිස්ත්‍රික් මහ රෝහල යන රෝහල් හි OMF ඒකක වෙත ලබා දෙන ලදී. පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය සඳහා පිළිකා රෝගීන් ලියාපදිංචිය පිළිබඳ සේවාස්ථ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.






- විශේෂඥ ශල්‍ය වෛද්‍යවරුන් හෝ පිළිකා ශල්‍ය විශේෂඥ වෛද්‍යවරුන් ගේ නායකත්වයෙන් ප්‍රධාන රෝහල් වල පියයුරු සායන ස්ථාපිත කිරීම (මීගමුව දිස්ත්‍රික් මහ රෝහල, හොරණ මූලික රෝහල, කළුතර ශික්ෂණ රෝහල, හලාවත දිස්ත්‍රික් මහ රෝහල හා කුලියාපිටිය ශික්ෂණ රෝහල). මඩකලපුව ශික්ෂණ රෝහලේ හිස්ටොපැතලොජි රසායනාගාරයේ Manual Method Immunostaining procedure ස්ථාපිත කරන ලදී.

➢ **මානසික සෞඛ්‍ය සත්කාර සේවාවන්**

- ලෝක මානසික සෞඛ්‍ය දිනය 2023 සැමරීම සඳහා "මානසික සෞඛ්‍යය විශ්ව මානව අයිතියකි" මැයෙන් සම්මන්ත්‍රණයක් ආරාධිත දේශකයින් හා විශේෂිත ආරාධිතයන් සමඟින් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්විය.





- සියදිවි නසා ගැනීම් වැළැක්වීමේ දිනය 2023 සැමරීමට "ක්‍රියාව තුලින් අපේක්ෂාව ඇති කිරීම" මැයෙන් වැඩසටහනක් ජාතික තරුණ සේවා සභාවේදී හා කොළඹ විශ්ව විද්‍යාලයේ දී පවත්වන ලදී.
- ප්‍රජා මානසික සෞඛ්‍ය හෙද නිලධාරින්, මානසික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් හා මානසික සෞඛ්‍ය විශේෂඥ වෛද්‍යවරුන් සඳහා ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනයේදී (SLIDA) පවත්වන ලදී.

- පාසැල් ළමුන් අතර මානසික සුවතාව ඇති කිරීම පිළිබඳව සෞඛ්‍ය සහ අධ්‍යාපන අංශ සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ශ්‍රී ලංකාවේ මානසික සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ නාමාවලිය මුද්‍රණය කිරීම.
- මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම සහ මත්ද්‍රව්‍ය භාවිතය පෙන්නුම් කරන රෝගීන් කළමනාකරණය කිරීම පිළිබඳ දිස්ත්‍රික් මට්ටමින් පුහුණු කිරීම් පැවැත්වීම.
- තරුණයින්, යෞවනයන් හා වැඩිහිටියන් සඳහා මානසික සුවතා වැඩසටහන් පැවැත්වීම.
- හඳුනාගත් ගේට්ටු මුරකරුවන් (gate-keepers) (පොලිස් නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්ය මණ්ඩලය, කෝච්චිරුන්, තරුණ නිලධාරීන් සහ ඖෂධවේදීන්) සඳහා සියදිවි නසාගැනීම් වැළැක්වීම් පිළිබඳ පුහුණු කිරීම්.

2.11 ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවාවන්

➢ ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකු ආධාර ව්‍යාපෘතිය)

පවතින ප්‍රාථමික වෛද්‍ය ආරක්ෂණ සැපයීමේ පද්ධතියෙහි හඳුනාගත් හිඳැස් හා අඩුපාඩු මහහරවා ගැනීම පිණිස ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ප්‍රතිඵල ලබාගත හැකි විෂය පථ 05ක් අනුව නිර්මාණය කරන ලදී. එම විෂයපථ වන්නේ, ප්‍රාථමික ආරක්ෂණය නැවත සංවිධානය කිරීම සඳහා අවශ්‍ය සියළුම ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ ප්‍රොටෝකෝලයන්ට අනුගතවීම, ප්‍රාථමික වෛද්‍ය ආරක්ෂණ සේවා සපයන්නන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම, වැඩිදියුණු කරන ලද උපකාරක සේවාවන් ලබාදීම, සමාජ කටයුතුවල යෙදීම සහ බලගැන්වීම මෙන්ම නොකඩවා සේවා සැපයීම සහතික කිරීමයි. පළාත් නවයම ආවරණය වන පරිදි ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවාවන් වැඩිදියුණු කිරීමට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රතිඵල දර්ශක ලහාකරගැනීම සාක්ෂාත් කිරීම මත මූල්‍යාධාර ලබාදීම සිදු කරනු ලැබේ. ප්‍රතිසංවිධානය කරන ලද ප්‍රාථමික සත්කාර සේවා බෙදාහැරීමේ පද්ධතියේ ප්‍රතිඵල ලැබීම මත විසර්ජන සම්බන්ධක දර්ශක (DLIS) නවයක් (09) ක් පවතී.

ව්‍යාපෘතියේ ප්‍රධාන අංග දෙකකි: අංග I යටතේ ක්‍රියාකාරකම් පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ සහ අංග II යටතේ ක්‍රියාකාරකම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාල අංශ මගින් ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රගතිය: 1. සත්‍යාපනය කළ හැකි රෝහල්වල සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම, 2. PSSP ව්‍යාපෘතියේ සන්නිවේදන ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම, 3. ජාතික මට්ටමේ වැඩසටහන් ශක්තිමත් කිරීම - වැඩසටහන් 29 ක් සම්පූර්ණ කර ඇත, 4. ප්‍රදානයන් 11 ක් අතරින් කුඩා ප්‍රදානයන් 5 ක් නිම කරන ලදී, 5. අධීක්ෂණය හා ඇගයීම: වර්ෂ 2018, 2019, 2020 හා 2021 සඳහා වාර්ෂික සැලසුම් නිම කරන ලදී.

➢ සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (HSEP) සහ අතිරේක මූල්‍යකරණය (AF) ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) අරමුදල් සපයන

මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) මඟින් මූල්‍යාධාර සපයනු ලබන අතර රට තුළ පළාත් හතරක මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කර ඇත: මධ්‍යම, උතුරු මැද පළාත, සබරගමුව හා ඌව පළාත් වල ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවාවන් වැඩිදියුණු කිරීම.


#	විස්තරය	HSEP	HSEP- AF
01	ව්‍යාපෘති අංකය	SRI 51107 - 002	SRI 51107 - 003
02	ADB ණය හා ප්‍රදාන අංකය	SRI 3727 & SRI 0618	L4121 & G9222
03	ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය / නියෝජිතායතන	මධ්‍යම, උතුරු මැද පළාත, සබරගමුව හා ඌව පළාත් වල පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු	පළාත් නවයෙහි පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු, SLINTEC, සහ සෞඛ්‍ය අමාත්‍යාංශය
04	ව්‍යාපෘති පිරිවැය	ඩොලර් මිලියන 60	ඩොලර් මිලියන 123
05	ණය ගිවිසුම අත්සන් කළ දිනය	2018 ඔක්තෝබර් 26	2021 ඔක්තෝබර් 07
06	ව්‍යාපෘතියේ ක්‍රියාත්මක දිනය	2019 පෙබරවාරි 05	2021 නොවැම්බර් 17
07	ව්‍යාපෘතිය නිමකිරීමේ දිනය	2023 නොවැම්බර් 30	2025 නොවැම්බර් 30
08	භෞතික ප්‍රගතිය (%)	80% - වසර 01ක දිගුවක් ඉල්ලා ඇත. සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත්තු 22ක් ප්‍රදානය කර ඇති අතර අත්‍යවශ්‍ය පැකේජ සඳහා උපකරණ මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තු 05ක් ලබා දී ඇත.	49% - සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත්තු 34 ක් ප්‍රදානය කර ඇති අතර වෛද්‍ය උපකරණ සහ ප්‍රතික්‍රියාකාරක ආදිය මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්තු 72 ක් ලබා දී ඇත.
09	මූල්‍ය ප්‍රගතිය	63%	31%


2.12 මහජන සෞඛ්‍ය සේවාවන්

- **ලාදුරු මර්ධන වැඩසටහන**

- දිස්ත්‍රික් සෞඛ්‍ය තොරතුරු මෘදුකාංගය 2 (DHIS2) භාවිත කරමින් ලාදුරු මර්දන වැඩසටහනේ ජාතික දත්ත පද්ධතිය සකස් කර ස්ථාපිත කරන ලදී. DHIS2 යනු සමස්ත සහ පුද්ගල මට්ටමේ දත්ත රැස් කිරීම, වාර්තා කිරීම, විශ්ලේෂණය සහ බෙදා හැරීම සඳහා විවෘත මූලාශ්‍ර, වෙබ් පාදක වේදිකාවකි.

- මෙම වේදිකාව පිළිබඳව සියළුම දිස්ත්‍රික් ලාදුරු මර්දන කණ්ඩායම් 2023 වර්ෂය තුළ දී පුහුණු කරන ලදී.






- සැඟවුනු ලාදුරු රෝගීන් හඳුනා ගැනීමට විශේෂ සමීක්ෂණ සිදුකරන ලදී.


  අධි අවධානම් දිස්ත්‍රික්ක 05 ක සිදු කරන ලද වලලු ආකාර සමීක්ෂණ / ගෙයින් ගෙට සමීක්ෂණ 27 හරහා නිවාස 7844 ක් පරීක්ෂා කර සැකසහිත ලාදුරු රෝගීන් 560 ක් හඳුනා ගෙන වර්ම රෝග සායන වෙත යොමු කළේය. බස්නාහිර පළාතේ පවත්වන ලද පාසැල් සමීක්ෂණ 12 ක් හරහා පාසැල් ළමුන් 1882 ක් පරීක්ෂා කිරීමෙන් පසු පාසැල් ළමුන් 76 ක් හඳුනා ගෙන ඇත.

- අළුතින් හඳුනාගන්නා ලාදුරු රෝගීන් හා ඔවුන්ගේ සමීපතමයන් සඳහා අත්පත්‍රිකා දෙකක් සකස් කරන ලදී.









➢ **පාරිසරික සෞඛ්‍ය, වෘත්තීය සෞඛ්‍ය සහ ආහාර සුරක්ෂිතතාවය**

- සාමාන්‍ය භාවිතයේ ඇති තෝරාගත් ආහාර වර්ගවල ඇති ඇපලටොක්සින් හඳුනාගැනීම, මාළුවල ඇති ක්ෂුද්‍ර ප්ලාස්ටික් ප්‍රමාණය, පොල් තෙල් වල ඇති පොලි ඇරෝමැටික් හා හයිඩ්‍රොකාබන් (PAH) සහ සෝයා සහ බඩඉරිඟු වල ජාන විකෘති කරන ජීවීන් ((GMO) හඳුනා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ආහාර සුරක්ෂිතතා සමීක්ෂණය 2023 පවත්වන ලදී.
- ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමට ශක්තිමත් රාමුවක් සඳහා අඩිතාලම යොදමින් ආහාර සුරක්ෂිතතා ප්‍රතිපත්තියේ පළමු කෙටුම්පත සකස් කරන ලදී.
- ජාතික ආහාර සුරක්ෂිතතා සමීක්ෂණ (2021-2022) සොයා ගැනීම් අදාල පාර්ශවකරුවන් හා තීරණ ගන්නා කණ්ඩායම් සඳහා ලබා දෙන ලදී.
- ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ රසායනික ආහාර රසායනාගාරයේ ඇපලටොක්සින් සඳහා අවශ්‍ය පහසුකම් ශක්තිමත් කරන ලදී.

➢ **වසංගත රෝග විද්‍යා ඒකකය**

එන්නත් ලබා ගැනීමට හිමිකම් සහිත ළමුන් අතර ඉහළ එන්නත් ආවරණයක් සහතික කරමින් ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන (NIP) හරහා ඉහළ ගුණාත්මක එන්නත් ලබාදීම, වසංගත රෝග විද්‍යා ඒකකයේ එක් ප්‍රධාන වගකීමක් වේ. වයස් කාණ්ඩවලට ගැලපෙන ප්‍රතිශක්තිකරණ සේවාවන් මෙහි පවතින අතර රට තුළ සිටින සියළුම යෝග්‍යතාවය සහිත ළමුන්ට ඒ සඳහා ප්‍රවේශය ඇත. එමෙන්ම ඉතා හොඳ පුහුණුවක් සහිත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්ය මණ්ඩලයක් සිටිති. පෙර වර්ෂවලදී මෙන්ම 2023 වර්ෂයේදීත් ජාතික වශයෙන් මෙන්ම දිස්ත්‍රික් මට්ටමින්ද සියළුම එන්නත් සඳහා ආවරණය 95% ඉහළ මට්ටමක පවත්වා ගෙන ඇත. දිස්ත්‍රික් හා ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් වර්ෂය පුරාවටම අඛණ්ඩව මෙම වැඩසටහන අධීක්ෂණය කල අතර ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා කාලෝචිත උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දෙන ලදී. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනෙහි (NIP) කාර්ය සාධනය සමාලෝචනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සෞඛ්‍ය දිස්ත්‍රික්ක 26සඳහා ප්‍රතිශක්තිකරණ / එන්නත් මඟින් වැලැක්විය හැකි රෝග (EPI/VPD) පිළිබඳ උපජාතික සහ ජාතික පුළුල් කරන ලද වැඩසටහන සමාලෝචනය කරන ලදී.

➢ **ජාතික වකුගඩු රෝග වැළැක්වීමේ හා පර්යේෂණ ඒකකය**

නිදන්ගත වකුගඩු රෝග (CKD) / ප්‍රභවය නොදන්නා නිදන්ගත වකුගඩු රෝග (CKDU) වැළැක්වීම සහ තරුණ වයසේ සිටම සෞඛ්‍යමත් වකුගඩු පවත්වා ගැනීමට ප්‍රජාව ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ඒකකය මඟින් පහසුකම් සපයනු ලැබේ.

- නිදන්ගත වකුගඩු රෝගය (CKD) පූර්ව හඳුනා ගැනීම සඳහා ප්‍රජා පාදක වැඩසටහන් පවත්වන ලදී . මෙම ඒකකය (NRDPRU) විසින් CKD සඳහා පුද්ගලයින් 5067 ක් පරීක්ෂාවට ලක්කර ඇති අතර ඉන් 12.2% ක් (619) CKD ප්‍රතිකාර සඳහා යොමු කල අතර 60.1% (313) අනෙකුත් වෛද්‍ය ප්‍රතිකාර (දියවැඩියාව, අධිරුධිර පීඩනය,හා ලේ හිඟකම - anaemia) සඳහා යොමු කර ඇත.





- GPS සිතියම්ගත කිරීම හා CKD /CKDU රෝගීන්ගේ සමීක්ෂණය පැවැත්වූ අතර CKDU රෝගීන් සිටින ප්‍රදේශවල ජල ප්‍රභවයන් පිළිබඳවද සමීක්ෂණය කරන ලදී. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර හා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පුද්ගලයන් 1142 ආවරණය කරමින් සිතියම් ගත කරන ලදී.

- ඵලදායි රුධිර කාන්දුකරණය (hemodialysis), අන්ත්‍රාවරණ කාන්දුකරණය (peritoneal dialysis), වකුගඩු බද්ධ කිරීම (සජීවී සහ මළ සිරුරු - cadaveric), සහන සත්කාර සිදු කිරීමට සහාය වේ.

- පේරාදෙණිය විශ්ව විද්‍යාලය, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය හා චීන විද්‍යා ඇකඩමිය හා සහයෝගිතාවයෙන් පර්යේෂණ කටයුතු කරන ලදී.

- සුරක්ෂිත පානීය ජලය සපයන ලදී - ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් ප්‍රජා RO යන්ත්‍ර විසිපහක් සපයන ලදී. මෙම යන්ත්‍රවල විදුලි බිල්පත් ගෙවීම අඛණ්ඩව සිදු කර ඇත.

- ප්‍රජාව දැනුවත් කිරීම සඳහා සෞඛ්‍ය අධ්‍යාපන මෙවලම් සකස් කරන ලදී.






➢ **මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවය**

ශ්‍රී ලංකාවේ ජලභීතිකාව වැළැක්වීම හා මර්දනය සඳහා වගකිවයුතු හා සමස්ථ සම්බන්ධීකරණය සඳහා වූ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය වනුයේ සෞඛ්‍ය පශු වෛද්‍ය අධ්‍යක්ෂක අංශයයි.

- ජලභීතිකාව හේතුවෙන් සිදුවන මිනිස් මරණ සංඛ්‍යාව 25-30 සිට 16 දක්වා සැලකිය යුතු සංඛ්‍යාවකින් 2023 දී අඩුවීම.



සටහන - 03 මානව ජලභීතිකාව මර්දනය හා වැළැක්වීමේ ක්‍රියාකාරකම් වල ප්‍රවණතාව

- ශ්‍රී ලංකාවේ ජලභීතිකාව තුරන් කිරීම සඳහා වූ ජාතික ක්‍රමෝපායික සැලැස්ම 2023.06.21 දින දියත් කරන ලදී.

- සම්මත මෙහෙයුම් ප්‍රොටොකෝල (SOP) සකස් කල අතර ජලභීතිකාව මර්දනය කිරීමේ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් පිළිබඳව ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් පැවැත්වීම.





➢ **නිරෝධායන ඒකකය**

- ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි (IHR) -2005 පිළිබඳ රාජ්‍ය අංශයේ වාර්ෂික වාර්තාකරණය කිරීමේ මෙවලම සම්බන්ධයෙන් උපදේශකවරුන්ගේ රැස්වීම පවත්වන ලදී.
- මෙරට සත්ව සෞඛ්‍ය , මානව සෞඛ්‍ය සහ පාරිසරික අංශවල ප්‍රධාන පාර්ශවකරුවන්ගේ හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ හවුල්කරුවන්ගේ සහභාගිත්වයෙන් ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි සහ පශු වෛද්‍ය සේවාවේ කාර්යසාධනය (IHR-PVS) පිළිබඳ ජාතික සම්බන්ධීකරණ වැඩමුළුව, 2023 පෙබරවාරි මාසයේදී පවත්වන ලදී.

- ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගයෙන් අවධානම් ඇගයීමේ ක්‍රමෝපායික මෙවලම (STAR) පිළිබඳ වැඩමුළුව විවිධ ආයතන වල පාර්ශවකරුවන් 70කට වඩා සහභාගිත්වයෙන් 2023 මැයි මාසයේදී පවත්වන ලදී.
- රටතුළ ට ඇතුළුවන ප්‍රධාන ස්ථාන වල කාර්ය මණ්ඩලය සඳහා මැලේරියාව, එච්.අයි.වි/ඒඩ්ස්, බෝනොවන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
- ගුවන්තොටුපලවල ගුවන්යානා අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ සෞඛ්‍ය අධ්‍යාපනික වැඩසටහන් සහ මත්තල ගුවන්තොටුපලේ පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලය සඳහා ඩෙංගු මර්දනය පිළිබඳ වැඩසටහන් පවත්වන ලදී.

2.13 ඖෂධ නිෂ්පාදනය, සැපයීම සහ නියාමනය

- ඖෂධ නිෂ්පාදන කලාප ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ අනුරාධපුරයේ ඔයාමඩුව, හොරණ, මිල්ලැව සහ හම්බන්තොට ආරුබොක්ක ප්‍රදේශවල ඖෂධ නිෂ්පාදන කලාප ආරම්භ කරන ලදී. මෙම කලාප සඳහා අවශ්‍ය ජලය හා විදුලිය සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ලබා දෙන ලදී. ආයෝජනයේ ප්‍රතිඵල ලබාගැනීම තහවුරු කිරීමට තෝරාගත් ආයෝජකයින් 20 දෙනෙකු සමඟ වසර 10 ක කාලසීමාවක් සඳහා නැවත මිලදීගැනීමේ එකඟතා ගිවිසුමකට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2023 දී එළඹිණි. ඒ අනුව, මෙම කලාපයේ ඖෂධ වර්ග 416 ක් සහ ශල්‍ය අයිතම 121 ක් නිෂ්පාදනය කරනු ලැබේ.

- "ස්වස්ථ" නමින් නව තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදී. එහි අවසාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ සියළුම රෝහල් සහ සෞඛ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය ඖෂධ නීතීගත සංස්ථාව (SPC), රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතීගත සංස්ථාව (SPMC) සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) ආවරණය වන පරිදි නව තොරතුරු කළමනාකරණ පද්ධතියක් ඇති කිරීමය. අදාළ පාර්ශවකරුවන් ගේ යෝජනා හා නිරීක්ෂණ පදනම්ව මේ වන විට මෘදුකාංග සකස් කිරීමට තෝරාගත් මෘදුකාංග සකස් කරන්නා විසින් සම්පූර්ණ කර ඇත.

- ප්‍රාදේශීය මට්ටමින් පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා "පුහුණු කරන්නන් පුහුණු කිරීමේ (TOT) "නේවාසික වැඩමුළු සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වා ඇත. ඒ අනුව, ප්‍රධාන ඖෂධවේදීන්, ඖෂධවේදීන් සහ වෛද්‍ය නිලධාරීන් 130 ක් පමණ පුහුණු කරන්නන් ලෙස පුහුණු කර ඇත. සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක මට්ටමින් රජයේ විශ්වවිද්‍යාල වල දී පවත්වා ඇති අතර 1000 ක් පමණ නිලධාරීන් පුහුණුව ලබා ඇත.





- එසේම, වෛද්‍ය සැපයුම් අංශයේ විවිධ කාණ්ඩවලට අයත් නිලධාරින් සහ වෙනත් නිලධාරින් සඳහා පරීක්ෂිලක පිළිගැනීමේ පරීක්ෂණ වැඩසටහන් (UAT) සාර්ථකව සම්පූර්ණ කර ඇත. ''ස්වස්ථ'' (SWASTHA) වෛද්‍ය සැපයුම් කළමනාකරණ පද්ධතිවල වසම් නාමය https://swastha.health.gov.lk/ ලෙස ලියාපදිංචි කර ඇති අතර එය 2023 ජුනි 12 වන දින සිට වෛද්‍ය සැපයුම් අංශය, ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශය සහ රෝහල්වල යොදවා ඇත. එබැවින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ස්වස්ථ වෛද්‍ය සැපයුම් තොරතුරු කළමනාකරණ පද්ධතිය, 2023 අගෝස්තු මස සිට ''සී'' වර්ගයේ ප්‍රාදේශීය රෝහල් කාණ්ඩය දක්වා පුළුල් කර ඇත. ''සී'' වර්ගයේ ප්‍රාදේශීය රෝහල්වල නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන් හතරක් සහ ඖෂධ සංයෝජක නිලධාරින් සඳහා එක් වැඩසටහනක් පවත්වන ලදී.

දැනට මෙම ස්වස්ථ පද්ධතිය මඟින් රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල, වැඩිහිටි දන්ත සායන හා පාසල් දන්ත සායන ඇතුළුව සියළුම සෞඛ්‍ය සත්කාර ආයතන ආවරණය කරයි.

2.14 දේශීය වෛද්‍ය අංශය

- **ප්‍රතිපත්ති සම්පාදනය, අණ පනත් හා නීති සම්බන්ධ කටයුතු**

නීති අංශය

i. 1961අංක 31දරණ ආයුර්වේද පනතට සංශෝධනයක් ලෙස ඉදිරිපත් කරන ලද 2023 අංක 19 දරණ ආයුර්වේද පනත (සංශෝධිත), 2023 ඔක්තෝබර් 13වන දින ගැසට් කිරීම.

ii. දේශීය වෛද්‍ය ජාතික ප්‍රතිපත්තිය කෙටුම්පත් කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කර ඇත.

iii. ආයුර්වේද නීති සංග්‍රහය සකස් කොට නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතියෙන් පසුව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

iv. පෞද්ගලික ආයුර්වේද ආරෝග්‍යශාලා, බෙහෙත් ශාලා සහ ආයුර්වේද ස්වස්ථ සංරක්ෂණ මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමන කටයුතු සඳහා වූ නියෝග කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීම.

- **වර්ෂය තුළ එළඹෙන ලද විශේෂ ගිවිසුම් (MOU) පිළිබඳ විස්තර**

ඉන්දියානු ජනරජය හා ශ්‍රී ලංකා ජනරජය අතර පාරම්පරික වෛද්‍ය ක්‍රම සහ හෝමියෝපති ක්ෂේත්‍රයේ සහයෝගීතාවය ඇති කිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත.

ශිල්පීය අංශය

i. පාරම්පරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බෙංගාල බොක්ක ප්‍රවේශය (BIMSTEC) කාර්යසාධක බලකායේ පස්වන රැස්වීම 2023ජූනි 27-26දිනවල තායිලන්තයේ නොන්තබුරි හිදී පැවැත්විණි . මේ සඳහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය නියෝජනය කරමින් දේශීය වෛද්‍ය අංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) සහ ආයුර්වේද කොමසාරිස් සහභාගී

විය. මෙහිදී දියවැඩියාව හා COVID-19 සඳහා සහයෝගී පර්යේෂණ ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ඉදිරි වැඩපිළිවෙල සඳහා එකඟතාවය ඇති කර ගන්නා ලදී .

ii. පාරම්පරික වෛද්‍ය දැනුම (TMK), ජාන සම්පත් ආරක්ෂා කිරීම (GR) සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිබඳ 2වන BIMSTEC සමුළුව 2024දී ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට නියමිත අතර ඒ සඳහා මූලික කටයුතු සිදු කිරීම .

iii. 2024 දී සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව පිළිබඳ BIMSTEC කාර්සාධක බලකායේ හයවන රැස්වීම ශ්‍රී ලංකාවේදී පැවැත්වෙන අතර ඒ සම්බන්ධයෙන් වන පූර්ව කටයුතු සිදු කිරීම.

- **ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය පිටු දැකීම (SGBV) සඳහා බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම**

කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය, අදාළ අමාත්‍යාංශ සමඟ එක්ව 2028-2024 වසර සඳහා පුළුල් SGBV ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමින් සිටී. ඒ අනුව දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් හිංසනයන් හා විෂමතාවයන් වැළැක්වීම සඳහා දේශීය වෛද්‍ය අංශය විසින් සිය කැපවීම ප්‍රකාශ කරමින් ඒ සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම මේ වන විට කෙටුම්පත් කර ඇත.

- **දේශීය වෛද්‍ය අංශයේ නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්**

2023වර්ෂයේදී දේශීය වෛද්‍ය අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය වෙනුවෙන් පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම පහත පරිදි වේ.

අනු අංකය	දිනය	පුහුණු වැඩසටහන	ආයතනය	තනතුර	වියදම (රු.)	සහභාගි වූ නිලධාරීන් ගණන
01	2023.02.09 සිට 31..2023.08	දෙමළ භාෂා පුහුණු වැඩසටහන	දේශීය වෛද්‍ය අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය	සංවර්ධන නිලධාරී හා රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර	112,500.00	30
02	2023.03.31	කාර්ය පටිපාටික රීති වැඩමුළුව	සෞඛ්‍ය අමාත්‍යාංශය	මාණ්ඩලික නිලධාරී , සංවර්ධන නිලධාරී හා රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර	8,450.00	10
03	-2023.07 12,19,26 -2023.08 02,09,16,23	කාර්යාල කළමනාකරණය සඳහා ඉංග්‍රීසි භාෂා සහතිකය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	සංවර්ධන නිලධාරී	12,500.00	06

04	2023.07.27	වැටුප් පරිවර්තනය (Online)	නිපුණතා සංවර්ධන අරමුදල	සංවර්ධන නිලධාරී	7,500.00	01
05	2023.07.31	කාර්යාල ලිපි ලිවීම හා සටහන් ලිවීම	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	සංවර්ධන නිලධාරී හා රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර	50,000.00	10
06	2023.09.12	රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය	සංවර්ධන නිලධාරී	20,000.00	04
07	2023 සැප්තැම්බර් 12 හා 13	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	සංවර්ධන නිලධාරී	40,000.00	04
08	2023.09.17 සිට 2023.12.07	දෙමළ භාෂා පුහුණු වැඩසටහන	බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	සංවර්ධන නිලධාරී	5,600.00	02
09	2023 සැප්තැම්බර් 19 හා 20	ප්‍රසම්පාදනය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව	ශ්‍රී පදනම	මාණ්ඩලික නිලධාරී , සංවර්ධන නිලධාරී හා රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර	98,000.00	07
10	2023.10.03 2023.10.10 2023.10.17	විගණන විමසුම් සඳහා පිලිතුරු සැපයීම	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	සංවර්ධන නිලධාරී හා රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර	30,000.00	02
11	2023.10.25	පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	සංවර්ධන නිලධාරී හා රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර	15,000.00	03
12	2023.11.30	ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහයකයින් සහ රියදුරන්ගේ වෘත්තිය සංවර්ධනය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	කාර්යාල කාර්ය සහායක	5,000.00	01
13	2023.12.15	අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම	නිපුණතා සංවර්ධන අරමුදල	සංවර්ධන නිලධාරී	24,000.00	04

14	2023.12.15 2023.12.16	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර	20,000.00	02
එකතුව					546,550.00	93

- **අයවැය ප්‍රතිපාදන මත සිදු කළ සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති**

i. පෝෂණ මන්දිර ස්ථාපිත කිරීම

ගුණාත්මක බවින් යුත් ඉහළ සෞඛ්‍යාරක්ෂිත දේශීය ආහාර භාවිතය ප්‍රචලිත කිරීම හා බෝ නොවන රෝග වලින් ජනතාව මුදා ගැනීමේ අරමුණින් පෝෂණ මන්දිර ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ 2023 .වර්ෂයේ මේ සඳහා වෙන්ව තිබූ රු.මි 2.5. ප්‍රතිපාදන මත යක්කල යෝජිත දේශීය වෛද්‍ය කලාපය තුළ කුටි 04ක් සකස් කර ස්ථාපනය කිරීමට කටයුතු කර ඇත .මේ සඳහා දරණ ලද පිරිවැය රු.මි 1.30කි.

ii. ආයුර්වේද සංරක්ෂණ සහා සවිබල ගැන්වීම

වසර දහස් ගණනක් අඛණ්ඩව පැවත එන පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය කරමින් පාරම්පරික වෛද්‍යවරයාගේ ජීවන තත්ත්වය නගාසිටුවීමත් ,ස්වකීය වෛද්‍ය වෘත්තියේ අනන්‍යතාවය සුරකිමින් පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ ප්‍රගමනයට දායක කර ගැනීමත් අරමුණු කර ගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පාරම්පරික වෛද්‍යවරුන් බලගැන්වීම සඳහා ආයුර්වේද සංරක්ෂණ සහා ක්‍රියාත්මක කරයි.

2023 වර්ෂයේ ආයුර්වේද සංරක්ෂණ සහා ව්‍යාපෘතිය සඳහා රු.මි. 3.0.ක ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වූ අතර සංරක්ෂණ සහා සවිබල ගැන්වීම, සාමාජිකයන්ගේ දැනුම ප්‍රවර්ධනය, සුළු පරිමාණ ඖෂධ නිෂ්පාදන යන්ත්‍ර ලබා දීම සහ පුස්තකාල පහසුකම් ප්‍රවර්ධනය යන කටයුතු මේ තුළින් සිදු කර ඇත .මේ සඳහා වැය කරන ලද මුළු පිරිවැය රු 2,650,868.59 .කි .

ක්‍රියාකාරකම	**භෞතික ප්‍රගතිය**	**මූල්‍ය ප්‍රගතිය (රු.)**
ආයුර්වේද සංරක්ෂණ සහා සවිබල ගැන්වීම හා දැනුවත් කිරීම.	වැඩසටහන් 20ක් ක්‍රියාත්මක කර ඇත.	1,774,015.00
කුඩා ඖෂධ නිෂ්පාදන යන්ත්‍ර ලබාදීම.	කොළ යුෂ නිස්සාරණය කිරීමේ යන්ත්‍ර 3 ක් සපයා ඇත.	374,325.00
පුස්තකාල ආශ්‍රිත පහසුකම් සැපයීම.	සංරක්ෂණ සහා 10ක පුස්තකාල සඳහා වීදුරු අල්මාරි (වානේ) 10 ක් සපයා ඇත.	502,528.59

iii. හෝමියෝපති ක්‍රම සංවර්ධනය

හෝමියෝපති ක්‍රම සංවර්ධනය සඳහා 2023වර්ෂයේ රු.මි. 2.5ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්ව තිබූ අතර එමඟින් හෝමියෝපති රෝහලේ නේවාසික රෝගී අංශය නැවත රෝගීන් සඳහා විවෘත කිරීමට හැකිවන පරිදි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලද අතර හෝමියෝපති රෝහලේ නිල නිවාස සංකීර්ණයේ සුළු අළුත්වැඩියා කටයුතු ද මේ යටතේ සිදු කරන ලදී . මේ සඳහා වැය කරන ලද මුළු පිරිවැය රු . 2,499,981.78කි.

iv. හෝමියෝපති වෛද්‍ය සභාව

හෝමියෝපති වෛද්‍ය සභාව වෙත රු.මි.1.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් 2023 වර්ෂය සඳහා වෙන්ව තිබූ අතර ඒ යටතේ හෝමියෝපති සායන සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ මිලදී ගැනීම, පරිගණක උපාංග (UPS) මිලදී ගැනීම සහ වෛද්‍ය සභාව සඳහා මහ පෙන්වීමේ නාම පුවරු 03ක් සකස් කිරීම සිදු කර ඇත. මේ සඳහා වැය කරන ලද මුළු පිරිවැය රු389,440 .කි (මිලදී ගැනීමට සැලසුම් කර තිබූ බොහෝ වෛද්‍ය උපකරණ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ලබා දීම මත ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය නොවීය).

v. බෝ නොවන රෝග පාලනය සහ වැළැක්වීම සඳහා දේශීය වෛද්‍ය මැදිහත් වීම

ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග පාලනය සහ වැළැක්වීම සඳහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ දායකත්වය ලබා ගැනීමේ කාලීන අවශ්‍යතාවය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වැය විෂයය 11-080-2509-002-26-2-111 යටතේ රු.මි.10.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් දේශීය වෛද්‍ය අංශය වෙත පවරා දෙන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ප්‍රධාන උප ව්‍යාපෘති 12ක් යටතේ ක්‍රියාත්මක කරන ලද අතර එහි ක්‍රියාත්මක ප්‍රගතිය පහත දක්වා ඇත.

ප්‍රගති සාරාංශය			
අනු අංකය	උප ව්‍යාපෘතිය / යාකාරකමක්‍ර	වාර්ෂික වෙන් කළ මුදල (රු.මි.)	භෞතික ප්‍රගතිය
01	ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමවල දුර්ලභ හෝ ලබා ගත නොහැකි ඖෂධීය අමුද්‍රව්‍ය සඳහා දේශීය ප්‍රතිනිධි භාවිතය.	0.115	• දේශීය වෛද්‍ය ක්‍රම වල දුර්ලභ ඖෂධීය ශාක වෙනුවට ආදේශක භාවිතය සම්බන්ධයෙන් විද්වත් කථිකාවක් අදාළ සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර ඒ සම්බන්ධයෙන් සුවධරණී අත්පොත ප්‍රකාශයට පත් කර ඇත. • අදාළ ප්‍රතිනිධි ඖෂධ පිළිබඳ තොරතුරු ඒකරාශී කර ඇත.
02	දේශීයව සපයාගත හැකි ඖෂධීය ද්‍රව්‍යයන්ගේ භෞත-රසායනික පරාමිතීන් විශ්ලේෂණය කිරීම.	0.7	භෞත-රසායනික පරාමිතීන් විශ්ලේෂණය සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය (දේශීයව මිලදී ගත හැකි) මිලදී ගෙන ඇති අතර අවශ්‍ය නියඳීන් එක් රැස්කර ඇත.

03	දේශීය වෛද්‍ය ක්‍රමවල බහු ආංශික අත්දැකීම් සහ දැනුම හුවමාරු කර ගැනීම මඟින් බෝනොවන රෝග සඳහා උපාය මාර්ගික විසඳුම් සෙවීම .	0.2	අසංක්‍රාමික රෝග නිවාරණයෙහිලා ආයුර්වේද හා දේශීය, පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුම හා ව්‍යවහාර විධි යාවත්කාලීන කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වා ඇත.
04	බෝ නොවන රෝග පාලනය කිරීම හා වැළැක්වීම සඳහා දේශීය වෛද්‍යානුසාරී පෝෂණමය මැදිහත්වීම .	2.265	පෝෂණ ගුණයෙන් අනූන දේශීය ආහාර හා සංස්කරණ විධි සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා ආහාර හා පෝෂණය පිළිබඳ වැඩසටහන් මාලාවක් මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පැවැත්විණි. ඒ යටතේ, වැඩසටහන් 386 ක ප්‍රමාණයක් පවත්වා ඇත.
05	“සුවධරණී - සිසු නැණ දිරිය” - දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ පාසල් පාදක ප්‍රශ්න විචාරාත්මක තරඟාවලිය .	1.61	‘‘සුවධරණී සිසු නැණ දිරිය’’ පාසල් දැනුම මිනුම තරඟාවලිය පරිපාලන දිස්ත්‍රික්ක 24 නියෝජනය වන පරිදි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පාසල් අතර පවත්වන ලදී තරඟමෙහිදී සිංහල මාධ්‍ය . 16 ක් හා දමිළ මාධ්‍ය තරඟ 08 ක් පවත්වන ලදී.
06	මහජන සංකේන්ද්‍රික දේශීය ආහාර හා පෝෂණය පිළිබඳ දැනුම හා යෙදීම් වැඩි දියුණු කිරීම .	1.11	දේශීය වෛද්‍ය ක්‍රමවේද ඔස්සේ ආහාර හා පෝෂණය පිළිබඳ දැනුම ජනතාව වෙත ලබා දීම සඳහා දේශීය ආහාර ප්‍රදර්ශන හා ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාව හා ඒකාබද්ධ විවිධ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදී.
07	ශ්‍රී ලංකාවේ මන්දපෝෂණ ගැටලුව මහඟරවා ගැනීම සඳහා දේශීය වෛද්‍ය ක්‍රමවල යථාභූති අත්දැකීම් බෙදා ගැනීම .	0.5	ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධනයෙහිලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබන ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කරමින් ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය සිදු කරන ලදී. මෙහිදී ප්‍රජා සෞඛ්‍ය කාර්යෙහිලා නියුතු ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 40 ක් සහ සිද්ධ හා යුනානි වෛද්‍යවරුන් 14 දෙනෙකු ධාරිතා සංවර්ධනය සිදු කර ඇත.
08	බෝ නොවන රෝග පාලනය කිරීම හා වැළැක්වීම සඳහා සායන හා රෝග නිවාරණ වැඩසටහන්.	0.5	බෝ නොවන රෝගයන්ගෙන් වැළකී නිරෝගීව සිටීම සඳහා ජනතාව දැනුවත් කිරීමත්, පවතින රෝගී තත්ත්වයන් පරීක්ෂා කිරීම, උපදේශනය හා අවශ්‍යතාවය මත ඖෂධ ලබා දීම වෛද්‍ය සායන මඟින් සිදු කර ඇත. තෝරාගත් ස්ථානයන්හි සිදු කරන ලද වෛද්‍ය සායන මෙන්ම අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය සමඟ ඒකාබද්ධව වැඩසටහනක් ලෙස ද මෙය ක්‍රියාත්මක කර ඇත.

09	බෝ නොවන රෝග පාලනය කිරීම හා වැළැක්වීම සඳහා යෝග අභ්‍යාසවල යෙදීම .	1.0	1. ජාත්‍යන්තර යෝග දිනයට සමගාමීව පැවති පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන . 2. නමවන ජාත්‍යන්තර යෝග දින සැමරුම් වැඩසටහන - 2023 3. පාරම්පරික වෛද්‍යවරුන් සඳහා සිදු කරනු ලබන යෝග වැඩසටහන් 4. යෝග මාර්ගෝපදේශ අත් පොත සකස් කිරීම . 5. සුවධරණී -සුරු දරුවෝ - සති පාසල් සංකල්පය 6. දේශීය වෛද්‍ය අංශයේ නිලධාරීන් සඳහා යෝග අභ්‍යාස පුහුණු කිරීමේ වැඩසටහන 7. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සිදු කරනු ලබන යෝග අභ්‍යාස පුහුණු කිරීමේ වැඩසටහන් හා යෝග ප්‍රවර්ධනයට අවශ්‍ය පහසුකම් සම්පාදනය මේ ඔස්සේ සිදු කොට ඇත.
10	සුවධරණී ඔසු ගොවි ගම්මාන ව්‍යාපෘතිය.	0.875	දේශීය වෛද්‍ය ක්‍රමයේ ප්‍රවර්ධනයට අවශ්‍ය ඖෂධීය අමුද්‍රව්‍ය සුලභ කිරීමටත්, ඔසු වගාව තුළින් ග්‍රාමීය ජනතාවගේ සමාජ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, ඒ යටතේ ඔසු ගොවි පුහුණු වැඩසටහන් 19 ක්, ඔසු ගොවි තාක්ෂණ උපදේශනය සහ ඔසු බීජ, රෝපණ ද්‍රව්‍ය සහ ඔසු පැළ බෙදාදීමේ වැඩසටහන් තෝරාගත් දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කර ඇත.
11	දේශීය වෛද්‍ය අංශය සඳහා ආයතනික හා අන්තර් ආයතනික ප්‍රතිඵල රාමුවක් සහිත කාර්ය සාධන දර්ශක සකස් කිරීම.	0.125	දේශීය වෛද්‍ය අංශයට අදාළ ප්‍රතිඵල රාමුවක් සකස් කිරීම සහ එම ප්‍රතිඵල මිණුම් කිරීම සඳහා කාර්යසාධක දර්ශන හඳුනා ගැනීම අදාළ සියළු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලද අතර එහිදී දේශීය වෛද්‍ය අංශයට අදාළ ප්‍රධාන වග විය යුතු ක්ෂේත්‍ර (Trust Areas) හඳුනා ගැනීම සිදු කරන ලද අතර එක් එක් ක්ෂේත්‍ර සඳහා වන ප්‍රතිඵල (Outcome) හඳුනා ගැනීමටද කටයුතු කර ඇත .
12	ඩිජිටල් තාක්ෂණය මඟින් දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ දැණුම ව්‍යාප්ත කිරීම.	1.0	දේශීය වෛද්‍ය අංශය මඟින් ලබා දෙනු ලබන මහජන සේවාවන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සහ දේශීය වෛද්‍ය දැනුම ජනගත කිරීම අරමුණු කරගනිමින් දේශීය වෛද්‍ය අංශයේ වෙබ් අඩවිය සංවර්ධනය කර එළි දක්වා ඇත .www.mim.gov.lk
එකතුව		**10.0**	

මෙහි මුළු වියදම රුපියල් 8,907,894.47 ක් විය.

vi. නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා ඖෂධ ලබාදීම

2023 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන යටතේ පාලනය වන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා ඖෂධ සැපයීම වෙනුවෙන් රු.මි. 75.0 ක ප්‍රතිපාදන වෙන් වූ අතර ඉන් රු.මි. 16.251 ක් පෙර වර්ෂයට අදාල හිඟ බිල්පත් ගෙවීමට යොදාගන්නා ලදී. පළාත් පාලන ආයතන විසින් මෙම වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලබා ගත් ඖෂධ වෙනුවෙන් රු.මි. 58.748 ක ගෙවීම් කර ඇත.

vii. සහයෝගී සත්කාර වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම

ඇලෝපති වෛද්‍ය ක්‍රමය සහ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සමඟ ඇතිකර ගන්නා එකඟතාව මත හඳුනාගත් රෝග සම්බන්ධයෙන් සහයෝගී සත්කාර සේවා ආරම්භ කිරීම කාලීන අවශ්‍යතාවයකි. ඒ අනුව, මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 10.0 ක ප්‍රතිපාදන සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ලබා දුන් අතර එම ප්‍රතිපාදන මඟින් ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල මේ සඳහා සූදානම් කිරීමේ කටයුතු සිදු කරන ලදී. ඒ යටතේ, වාට්ටු අංක 03 ප්‍රතිසංස්කරණය, වාට්ටු අංක 03 හි හදිසි ප්‍රතිකාර ඒකකයේ (ETU) වෙන් කිරීමේ (partition) කටයුතු හා පින්තාරු කිරීම, මුළුතැන්ගෙය ප්‍රතිසංස්කරණය කිරීම සහ වෙනත් සුළු අළුත්වැඩියා කටයුතු සිදුකර ඇත.

➢ **ආයුර්වේද දෙපාර්තමේන්තුව**

- **ආයතනික කාර්යයන්**

අනු අංකය	කාර්යය	සේවක ගණය හා සංඛ්‍යාව
01	බඳවාගැනීම්	– ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික වෛද්‍ය නිලධාරී තනතුරු 62ක් (විශ්‍රාම වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක්) බඳවාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම. – PL 01 තනතුරු 491ක් හා රියදුරු පුරප්පාඩු 14ක් බඳවාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම.
02	උසස් කිරීම්	– ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ විශේෂඥ ශ්‍රේණියට හා පරිපාලන 1ශ්‍රේණියට උසස් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම. – 2020.10.27දින සිට ක්‍රියාත්මක වන නව සේවා ව්‍යවස්ථාවට අනුව ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 1 ශ්‍රේණියට උසස් කිරීමට කටයුතු කිරීම – පෞද්ගලික ලිපි ගොනුව මඟින් ලබා දෙන ශ්‍රේණි උසස් කිරීම් යනාදිය අදාළ කාලසීමාවන් තුළදී ලබා දී ඇත.
03	අනුමත කාර්ය මණ්ඩල සංශෝධන	ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධ ආයතනයන්ට අනුමතව පැවති ආශ්‍රිත සේවයට අයත් නිලධාරීන් 40කගේ තනතුරු නාමය සංවර්ධන නිලධාරී ලෙස සංශෝධනය කිරීම

- **දේශීය පුහුණු වැඩසටහන්**

  ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් 2023වර්ෂය තුළ දේශීය පුහුණු වැඩසටහන් සඳහා මාණ්ඩලික නිලධාරීන්, වෛද්‍ය නිලධාරීන් සහ අනෙකුත් සියළු ශ්‍රේණි නියෝජනය වන පරිදි කාර්ය මණ්ඩලයේ 102ක් යොමු කර ඇත . මෙහිදී ප්‍රසම්පාදන කටයුතු , කාර්යාල ක්‍රම , මුදල් රෙගුලාසි, අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සහ ප්‍රවාහන කළමනාකරණය ආදී ක්ෂේත්‍රයන් පිළිබඳ මූලික පුහුණුවක් මේ යටතේ ලබා දී ඇත .

- **සංවර්ධන අංශය**

  භෞතික සම්පත් සංවර්ධන කටයුතු (භෞතික හා මූල්‍ය ප්‍රගතිය)

කාර්යය	මූල්‍ය ප්‍රතිපාදනය (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය (%)
ප්‍රධාන කාර්යාලයේ එදිනෙදා ඇති සුළු අළුත්වැඩියා කටයුතු	140,000	90	100
ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන අළුත්වැඩියා	3,000,000	94	100
ආයුර්වේද ශික්ෂණ රෝහල්වල සුළු අළුත්වැඩියා කටයුතු	287,000	100	100
ආයුර්වේද ශික්ෂණ රෝහල්වල ප්‍රධාන අළුත්වැඩියා කටයුතු	20,000,000	99	100
නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ සුළු අළුත්වැඩියා කටයුතු	121,000	100	100
නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ ප්‍රධාන අළුත්වැඩියා කටයුතු	1,200,000	99	100
දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ ප්‍රධාන අළුත්වැඩියා කටයුතු	2,000,000	99	100
ඔසු උයන්වල ප්‍රධාන අළුත්වැඩියා කටයුතු	2,000,000	97	100

- **පර්යේෂණ හා ව්‍යාප්ති සේවා ඔසු උයන් මඟින් ඖෂධීය අමුද්‍රව්‍ය සැපයීම**

  ආයුර්වේද පර්යේෂණ රෝහල් ,ශික්ෂණ රෝහල් හා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය සඳහා ඔසු උයන් මඟින් ඔසු අමුද්‍රව්‍ය සපයනු ලබන අතර 2023වසර තුළ එලෙස සපයන ලද අමු ද්‍රව්‍ය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

ඔසු උයන	සපයන ලද අමු ඖෂධ ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	රෝහල /ආයතනය
පින්නදූව	13.9	ජාතික ආයුර්වේද රෝහල - බොරැල්ල
පල්ලෙකැලේ	59.5	ආයුර්වේද ඖෂධ සංස්ථාව
හල්දුම්මුල්ල	136.7	ජාතික ආයුර්වේද රෝහල -බොරැල්ල
ගිරාඳුරුකෝට්ටේ	407.07	ජාතික ආයුර්වේද රෝහල -බොරැල්ල
පට්ටිපොළ	12	බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය

- **ශිල්පීය අංශය**

ආයුර්වේද නාමය භාවිතා කරමින් පවත්වාගෙන යනු ලබන නීත්‍යානුකූල නොවන ආයතන බිහිවීම වළක්වාලීමත්, මහජනතාවට වඩාත් ආරක්ෂාකාරී ගුණාත්මක සේවයක් ලබාදීමත් යන කරුණු මුල් කර ගනිමින් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ආයුර්වේද ඔසුසල්, ආයුර්වේද ඖෂධාගා , ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන හා පංචකර්ම ආයතන ආදී ආයතනයන් නියාමනය සිදු කරනු ලබයි. ඒ අනුව 2023 වර්ෂයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා එවන් ආයතන වෙත අයදුම්පත් 1,087ක ප්‍රමාණයක් නිකුත් කර ඇති අතර එහි වටිනාකම රු. 2,665,520.00 කි.

ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර ලබාදීම- 2023 (බලපත්‍ර වර්ග අනුව)

අනු අංකය	ආයතන සඳහා බලපත්‍ර නිකුත් කළ සංඛ්‍යාව		ලැබූ ආදායම (රුපියල්)
01	වියළි ඖෂධ ආනයන බලපත්‍ර නිකුත් කළ සංඛ්‍යාව	283	141,500.00
02	හෝටල් තුළ පංචකර්ම ආයතන	29	326,000.00
03	පංචකර්ම ආයතන	10	90,500.00
04	දේශීය නිෂ්පාදන සඳහා බලපත්‍ර නිකුත් කළ සංඛ්‍යාව	367	413,280.00
05	දේශීය නිෂ්පාදන සඳහා මාධ්‍ය බලපත්‍ර නිකුත් කළ සංඛ්‍යාව	26	15,200.00
06	නිදහස් වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම	28	15,000.00
07	ආනයනික නිෂ්පාදන සඳහා බලපත්‍ර නිකුත් කළ සංඛ්‍යාව	143	1,569,250.00
08	සාම්පල ආනයන බලපත්‍ර නිකුත් කළ සංඛ්‍යාව	18	9,200.00
09	ආනයනික නිෂ්පාදන සඳහා මාධ්‍ය බලපත්‍ර නිකුත් කිරීම	4	2,400.00
	එකතුව	**908**	**2,582,330.00**

- **විභාග අංශය**

2023 වර්ෂය තුළ පවත්වන ලද විභාග හා එහි ප්‍රගතිය

අනු අංකය	ක්‍රියාකාරකම	පැවැත්වූ කාල වකවානුව	අයදුම්කරුවන් සංඛ්‍යාව	වෙනත් කරුණු
01	රජයේ ආයුර්වේද ඖෂධ සංයෝජක ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව - 2023 (දකුණු පළාත්) ලිඛිත පරීක්ෂණය	2023.01.17,,19 ,20, 23, 24, 25	35	ප්‍රතිඵල නිකුත් කර ඇත.
02	රජයේ ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2023	2023.01.28, 30	160	ප්‍රතිඵල නිකුත් කර ඇත.

03	පෞද්ගලික සම්බාහන පාඨමාලාවේ අවසාන ඇගයීම් පරීක්ෂණය	,2023.02.11 ,12 ,18 19	16	ප්‍රතිඵල නිකුත් කර ඇත.
04	ආයුර්වේද ශාස්ත්‍රී වාර්ෂික පරීක්ෂණය - 2022 (වාචික පරීක්ෂණය)	2023.03.08 ,09 ,10 ,13 ,14,15 16	141	ප්‍රතිඵල නිකුත් කර ඇත.
05	ආයුර්වේද ශාස්ත්‍රී වාර්ෂික පරීක්ෂණය - 2022 (ප්‍රායෝගික පරීක්ෂණය)	2023.03.12	40	ප්‍රතිඵල නිකුත් කර ඇත.
06	හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය 2023	2023.04.24, 25 ,26 ,27 28 2023.05.02	80	හෝමියෝපති වෛද්‍ය සභාව වෙත ප්‍රතිඵල භාර දී ඇත.
07	පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය - 2023	2023.05.20,21	444	ප්‍රතිඵල නිකුත් කර ඇත.
08	සිද්ධ විද්‍යාලයේ අවසන් වසර සිසුන් සඳහා වාර්ෂික පරීක්ෂණය - 2023	,2023.06.14 ,15 ,16 ,19 ,20 21සහ 2023.07.22	24	ප්‍රතිඵල නිකුත් කර ඇත.
09	MN 01හා MT 02කේත අංක යටතේ බඳවා ගත් සම්බාහන හා හෙසජ්ජක තනතුරෙහි III වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2023	2023.08.05	14	ප්‍රතිඵල නිකුත් කර ඇත.
10	හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණ - 2023	2023.08.21 ,22 23	49	හෝමියෝපති වෛද්‍ය සභාව වෙත ප්‍රතිඵල භාරදී ඇත.
11	ආයුර්වේද ශාස්ත්‍රී අතිරේක පරීක්ෂණය - 2022	2023.08.24,29- 31හා 2023.09.01	211	ප්‍රතිඵල නිකුත් කර ඇත.
12	පෞද්ගලික සම්බාහන පාඨමාලාවේ අවසාන ඇගයීම් පරීක්ෂණය - 2023 (සැප්තැම්බර්)	2023.09.23 හා 2023.10.07, 08	07	ප්‍රතිඵල නිකුත් කර ඇත.

13	ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් සඳහා වන II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2023	2023.11.04	73	ප්‍රතිඵල නිකුත් කර ඇත.
14	ආයුර්වේද ශාස්ත්‍රී අතිරේක පරීක්ෂණය- 2022 (වාචික පරීක්ෂණය)	2023.11.27,28 ,29 , 30 2023.12.01,04, 06	89	ප්‍රතිඵල නිකුත් කර ඇත.
15	ආයුර්වේද ශාස්ත්‍රී වාර්ෂික පරීක්ෂණය- 2022 (ප්‍රායෝගික පරීක්ෂණය)	2023.12.03 හා 10	44	ප්‍රතිඵල නිකුත් කර ඇත.
16	PL 01 හා PL 02 කේත අංක යටතේ බඳවා ගත් තනතුරු සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	2023.12.07හා 08	138	ප්‍රතිඵල නිකුත් කර ඇත.

- **රෝගී ප්‍රතිකාර සේවා**

  - **ශික්ෂණ රෝහල්**

රෝහල	**බොරැල්ල**	**ගම්පහ**	**කයිතඩි**	**ත්‍රිකුණාමලය**
මූලික තොරතුරු				
වාට්ටු ගණන	11	4	5	2
ඇඳන් ගණන	217	105	15	10
වෛද්‍යවරු ගණන	109	59	16	6
හෙද කාර්ය මණ්ඩලය	36	20	3	3
අනෙකුත් කාර්ය මණ්ඩලය	259	79	59	14
රෝගී ප්‍රතිකාර සේවා				
ප්‍රතිකාර කරන ලද බාහිර රෝගීන් ගණන	270,377	33,287	24,553	16,065
ප්‍රතිකාර කරන ලද නේවාසික රෝගීන් ගණන	2,578	994	1,008	42
සායන මඟින් ප්‍රතිකාර කරනු ලැබූ රෝගීන් ගණන	147,305	48,580	13,147	2,277
පංචකර්ම මඟින් ප්‍රතිකාර කරනු ලැබූ රෝගීන් ගණන	325	1,413	615	272
ශික්ෂණ පහසුකම් ලබා දෙන ලද වෛද්‍ය සිසුන් සංඛ්‍යාව				
ශික්ෂණ පහසුකම් ලබා දෙන ලද වෛද්‍ය සිසුන් සංඛ්‍යාව	472	311	289	500

➢ **ඖෂධ නිෂ්පාදනය**

රෝහල	බොරැල්ල	කයිතඩි	යක්කල	ත්‍රිකුණාමලය
බෝතල්				
ආසව	1,180	-	383	-
තෛල	5,988	3,283.25	1,646	123
සිරප්	-	308.75	-	45.6
ක්වාථ	37,550	-	451.289	-
පාන	-	-	-	-
කෂාය	16,997	3,293.5	3,928.64	-
වෙනත්	27,892	-	140	-
අනුපාන) මිලි.ලීටර(60	86	1,292.32	-	-
නේත්‍රා බිංදු	85	-	-	-
කිලෝ ග්‍රෑම්				
ගුලි	116.76	83.532	-	-
කල්ක	695.6	-	80.5	-
ලේප	391.05	46.78	214.025	-
චූර්ණ	2,012.76	956.145	810.11	13.309
ක්ෂාර	7.319	-	-	-
පාණ්ඩ	209.573	591.31	1,975.15	-
පත්තු	401.37	575.76	288.19	4.908
ලේහ	-	31.5	-	

ගුග්ගුලු	-	31.5	0	-
තැවිලි	72.2	-	253.95	-
වටී	128.275	-		-
වර්ති	0.490	-		-
රස බෙහෙත්	38.970	-		-
ශෝධිත ගුගුල්	78.2	-		-
පංචවල්කල	-	-		-
පැලැස්තර	23.12	-		-
මැල්ලුම්	29.32	-		-
යුනානි ඖෂධ	-	-	84.57	-

රෝහල	අම්පාර	හම්බන්තොට	මැදවච්චිය	නාවින්න	මංචන්තුඩාව
බෝතල්					
තෙල	2,441.25	93	102.5	2,392	184
පැණි	-		-	37	-
ක්වාථ	-	5,133	10.5	-	-
කෂාය	733.433	332.5	302.57	3,488.24L	-
අනුපාන	335.030	10	3	1,866.66 L	-
පාන	-	-	29.55	-	-
වෙනත් (තැම්බූ වතුර)	-	211	-	1,866.66 L	-
වෙනත් (ද්‍රව)	-	-	60.5	-	-
නේත්‍රා බිංදු	-	-	-	57 L	-
කිලෝ ග්‍රෑම්					
ලේප	-	17.157	-	449.37	-
චූර්ණ	15.8	3.9	52.712	1,776.27	-
පාණ්ඩ	32.35	-	3.055	-	-
පත්තු	79.040	9,463	56.135	57.22	-
තැවිලි	385.62	81.858	95.475	-	-

➢ **පර්යේෂණ රෝහල්**

පර්යේෂණ රෝහල්	නාවින්න	අම්පාර	හම්බන්තොට	මැදවච්චිය	මහනුවර	නින්දවූර්	මහියංගනය
මූලික තොරතුරු							
වාට්ටු ගණන	4	2	4	2	2	0	-
ඇඳන් ගණන	68	31	102	24	26	1	12
වෛද්‍යවරු ගණන	53	5	15	3	4	2	3
හෙද කාර්ය මණ්ඩලය	11	6	8	4	-	-	-
අනෙකුත් කාර්ය මණ්ඩලය	111	44	50	30	31	5	13
රෝගී ප්‍රතිකාර සේවා							
ප්‍රතිකාර කරන ලද බාහිර රෝගීන් ගණන	52136	24088	30503	8838	1023	4763	3221
ප්‍රතිකාර කරන ලද නේවාසික රෝගීන් ගණන	738	317	534	254	-	-	-
සායන මඟින් ප්‍රතිකාර කරනු ලැබූ රෝගීන් ගණන	31596	20523	17014	200	-	1083	343
පංචකර්ම මඟින් ප්‍රතිකාර කරනු ලැබූ රෝගීන් ගණන	1748	-	408	-	-	-	-

➢ **දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය**

- සීමාවාසික වෛද්‍ය, පාරම්පරික වෛද්‍ය, හෙද නිලධාරී ඇතුළු අනෙකුත් කණ්ඩායම් සඳහා 2023 වසර තුළ පුහුණු වැඩසටහන් 37ක් පවත්වා ඇති අතර ප්‍රතිලාභීන් ගණන 1,615ක් වේ.
- ප්‍රජා සෞඛ්‍ය /මාතෘ හා ළමා වැඩසටහන් 22 ක් පවත්වා ඇති අතර ප්‍රතිලාභීන් ගණන 520කි.
- පෞද්ගලික ස්වස්ථතාව මාතෘ හා ළමා පෝෂණ ,යෝග සහ සීමාවාසික වෛද්‍ය පුහුණුව සඳහා අවශ්‍ය අත් පත්‍රිකා හා ග්‍රන්ථ සකස් කර ඇත.
- විවිධ ක්ෂෙත්‍ර යටතේ අදාළ ව්‍යාප්ත සේවාවන් සිදු කිරීමට අදාළ මොඩියුල සහ සම්මත ක්‍රමවේද සකස් කිරීම, මාර්ගෝපදේශ අත්පොත් සහ ව්‍යාපෘති සකස් කිරීමේ කටයුතු සිදු කර ඇත.

➢ **ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය - අනුරාධපුරය**

ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය මඟින් වැඩිහිටි ජනතාවගේ හා පෙර පාසල් හා පාසල් දරුවන්ගේ සෞඛ්‍ය සංරක්ෂණය අරමුණු කර ගනිමින් වැඩසටහන් බොහොමයක් ක්‍රියාත්මක කර ඇත . බෝ නොවන රෝග පාලනය, බෝ වන රෝග පාලනය, මාතෘ සංරක්ෂණ, ඖෂධ පැලෑටි සංරක්ෂණ, මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන, ගෘහ ඒකක දැනුවත් කිරීමේ වැඩසටහන් හා ප්‍රජා සත්කාරක හා වෙනත් වැඩසටහන් මේ යටතේ පවත්වා ඇත.

➢ **ඔසු පැළ නිෂ්පාදන හා අලෙවි කාර්යයන්**

- 2023 වසර තුළ ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ඔසු උයන් 06ක් මඟින් ඔසු පැළ 71,786ක් නිෂ්පාදනය කළ අතර ඉන් පැළ 23,504ක් අලෙවි කර ලබා ගත් ආදායම රු1,047,354 .කි.
- මෙම වසර තුළ ඉහත ඔසු උයන් 06මඟින් රු98,750 .ක් වටිනා පැළ 2,406ක් නොමිලේ බෙදා හැරීමට ද කටයුතු කර ඇත.

➢ **බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය**

පර්යේෂණ ප්‍රගතිය 2023 - වර්ෂය තුළ ආරම්භ කර දැනට සිදු කරගෙන යන සහ 2023 වර්ෂය අවසන් කළ පර්යේෂණ පිළිබඳ තොරතුරු සහ එක් එක් අංශ අනුව සිදු කරන ලද කාර්යයන් පහත දැක්වේ.

අනු අංකය	පර්යේෂණ / සිදු කරන ලද කාර්යය	ප්‍රමාණය
01	සාහිත්‍ය පර්යේෂණ	06
02	උද්භිද විද්‍යා පර්යේෂණ	08
03	ඖෂධීය අමු ද්‍රව්‍ය පරීක්ෂාව (නිදර්ශන පරීක්ෂාව)	135
04	ව්‍යාප්ති සේවා (වියළි ශාක නිදර්ශක හඳුනාගැනීම ,ඖෂධ වගාව සහ අස්වනු සැකසීම ,ඖෂධ ශාක රෝපණය රසායනාගාර පර්යේෂණ වාර්තා ,ප්‍රමිතිකරණ පිළිබඳ ක්‍රම ආදි)	225
05	දැනුවත්කිරීමේ වැඩසටහන්	07
06	තාක්ෂණික උපදෙස් හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන්	03
07	ප්‍රදර්ශන	02
08	ක්ෂේත්‍ර පරීක්ෂාවන් - ඔසු වගා	02
09	ප්‍රමිතිකරණ	04
10	සහයෝගිතා - පර්යේෂණ	05
11	ඖෂධ නිෂ්පාදන සංවර්ධන ආශ්‍රිත පර්යේෂණ	02
12	වෙනත් වැඩසටහන්	03

➢ **ආයුර්වේද වෛද්‍ය සභාව**

1. වර්ෂය තුළ සාමාන්‍ය සර්වාංග උපාධිධාරීන් 313ක්, සාමාන්‍ය සර්වාංග ඩිප්ලෝමාධාරීන් 30, පාරම්පරික සර්වාංග 82ක් හා පාරම්පරික විශේෂ 130ක් ලෙස වෛද්‍යවරුන් 555 දෙනෙකු සඳහා ලියාපදිංචිය ලබා දී ඇත.
2. සර්වාංග වෛද්‍යවරුන් 945ක් හා විශේෂ වෛද්‍යවරුන් 294 ක් ලෙස මෙම වසරේලියාපදිංචිය අළුත්කර ඇති මිළු වෛද්‍යවරුන් සංඛ්‍යාව 1,239 කි.
3. පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා වාචික පරීක්ෂණ මණ්ඩල 29 ක් පවත්වා ඇති අතර ඒ සඳහා සහභාගී වූ අයදුම්කරුවන් 336 දෙනාගෙන් 151 ක් දෙනෙකු ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබා ඇත.
4. ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුට තම ලියාපදිංචියෙන් පසුව ලබා ගන්නා යම් සුදුසුකමක් අතිරේක සුදුසුකමක් ලෙස සභාව පිළිගත් විට එය නාම

ලේඛනයට ඇතුළත් කිරීමට ඇති හැකියාව අනුව 2023 වර්ෂයේ ලියාපදිංචි වෛද්‍යවරුන් 11 දෙනෙකුගේ අතිරේක සුදුසුකම් සභාව විසින් අනුමත කර ඇත.

5. 2023 වර්ෂයේ ලැබුණු පැමිණිලි 15න් 14ක විමර්ශන කටයුතු අවසන් කර ඇත.

➢ **හෝමියෝපති වෛද්‍ය සභාව**

- **වෛද්‍යවරු ලියාපදිංචි කිරීම**

2016 අංක 10දරණ හෝමියෝපති පනතේ (1)30වගනතිය යටතේ හෝමියෝපති ලියාපදිංචිය සඳහා වූ පළමු විභාගය 2023අප්‍රේල් 24දින සිට මැයි 02දින දක්වාත් දෙවන විභාගය 2023.08.21 සිට 23 දක්වාත් පවත්වන ලද අතර එහිදී සමත් වූ 45දෙනෙකු 2023.09.05 දින හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ හෝමියෝපති වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කරන ලදී .

- **රජයේ හෝමියෝපති සායනවල කාර්යසාධනය**
  - හෝමියෝපති වෛද්‍ය සභාව මඟින් මෙහෙයවනු ලබන රජයේ හෝමියෝපති සායන 13ට අමතරව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආරම්භ කළ නව සායනයත් සමඟ මෙම වසර තුළ හෝමියෝපති සායන 14කින් රෝගීන් 84,041 ක් ප්‍රතිකාර ලබා ගෙන ඇත.
  - 2023වසර තුළ හෝමියෝපති ජංගම සායන 15මඟින් රෝගීන් 1,977ක් ප්‍රතිකාර ලබාගෙන ඇත.

- **හෝමියෝපති ඖෂධ ආයතන සඳහා නිර්දේශ ලබාදීම**
  - 2023 වර්ෂයේ හෝමියෝපති ඖෂධ ආයතන වෙත ඇමරිකානු ඩොලර් 75,062.02 ක් වටිනා බලපත්‍ර 12ක් සඳහා තාක්ෂණික කමිටුවේ නිර්දේශ ලබා දී ඇත.
  - මෙම වසර තුළ හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් ලෙස සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි වූ තිදෙනෙක්ද සමඟ මෙරට සමස්ථ ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන් සංඛ්‍යාව 318කි.

➢ **හෝමියෝපති රෝහල**

(i) 2022 වසරේ ප්‍රතිකාර සේවා ලබාදීම

රජයේ හෝමියෝපති රෝහල මඟින් බාහිර රෝගීන් 23,462 ක් සඳහා ප්‍රතිකාර ලබා දී ඇත. 2020 වසරේදී හෝමියෝපති රෝහලෙහි කොවිඩ් අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම නිසා අභ්‍යන්තර රෝගී අංශය වසා තිබූ අතර, 2023 නොවැම්බර් මස සිට නැවත නේවාසික රෝගී අංශයේ කටයුතු ආරම්භ කරන ලදී.

(ii) හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපන කටයුතු හා විදේශීය වැඩමුළු

හෝමියෝපති වෛද්‍ය උපාධිය හැදෑරීමට, ඉන්දියාවේ ආයුෂ් අමාත්‍යාංශය මඟින් ලබා දෙන ශිෂ්‍යත්ව යටතේ ශ්‍රී ලාංකික සිසුන් 10 දෙනෙකු කල්කටාවේ ජාතික හෝමියෝපති ආයතනයට යොමු කරන ලදී.

(iii) ඖෂධ ආනයනය

රජයේ හෝමියෝපති රෝහල මඟින් හෝමියෝපති වෛද්‍ය සභාව යටතේ පවතින නිදහස් හෝමියෝපති සායන සඳහා ඖෂධ බෙදාහැරීම සිදු කරයි. හෝමියෝපති ඖෂධ, රාජ්‍ය ඖෂධ සංස්ථාව මඟින් ආනයනය කර, වැලිසර රජයේ හෝමියෝපති රෝහලට ලබාදීම සිදු කරයි. 2023 වසරේදී, රු. මිලියන 71.35 ක වටිනාකමකින් යුත් ඖෂධ ආනයනය කර ඇත.

- **ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**

(i) නිෂ්පාදනය

2023 වර්ෂය තුළ සංස්ථාව විසින් රු. මිලියන 644.775ක නිෂ්පාදනයක් වාර්තා කර ඇත .

(ii) අලෙවිය

සංස්ථාවට අයත් අලෙවි මධ්‍යස්ථාන 17 ක් සහ දිස්ත්‍රික් බලය ලත් අලෙවි නියෝජිතයින් 13ක් මඟින් අලෙවි කටයුතු සිදු කරනු ලැබේ. නිෂ්පාදන අලෙවියේදී වැඩි ප්‍රමාණයක් රාජ්‍ය අංශයේ ආයතන(ආයුර්වේද රෝහල් , පළාත් හා ප්‍රාදේශීය නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා) වෙත අලෙවි කරනු ලැබේ. ඒ අනුව සංස්ථාව රුපියල් මිලියන 1218ක අලෙවියක් සිදු කර ඇති අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව 29%ක වැඩිවීමකි.

(iii) නව නිෂ්පාදන හඳුන්වාදීම

අරළු පෙති, සුවධරණී කැප්සියුල්, පංචමූල ලඝු ද්‍රාක්ෂා කෂාය පෙති, ඒරණ්ඩ සප්තක කෂාය පෙති, දන්තිමූලාදී කෂාය පෙති, සංස්ථා ප්‍රථමාධාර පෙට්ටි, සංස්ථා තෛල ඇසුරුම්, තැවිලි පොට්ටනිය (නිර්ගුණ්ඩියාදී/පිණ්ඩ/නාරායන), කාංචනාර ගුග්ගුලු (ග්‍රෑම් 250) ජාතිඵලාදී චූර්ණය (ග්‍රෑම් 500) යන නිෂ්පාදන 2023.12.31 දින වෙළඳපොලට හඳුන්වා දෙන ලදී. එමෙන්ම සියළුම පෙති වර්ග , ගුලි වර්ග සහ කැප්සූල් වර්ග Blister pack ආකාරයෙන් ඇසුරුම් කර වෙළඳපලට නිකුත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදී.

(iv) ප්‍රාග්ධන ව්‍යාපෘති

ආයතනයේ නිෂ්පාදන පිරිවැය අවම කිරීමේ අරමුණින් අර්ධ ස්වයංක්‍රීය තාප හැකිලීමේ ඇසුරුම් යන්ත්‍ර (Heat Shrink Packaging Machines) 02ක් ස්ථාපනය කිරීම සහ ස්වයංක්‍රීය පෙති ගණන් කිරීමේ යන්ත්‍රයක් (Automatic Tablet Counting Machine) ස්ථාපනය කිරීම.

(v) ඔසු උයන් සංවර්ධනය

දංගොල්ල, රන්දෙනිගම සහ මැදවච්චිය ඔසු උයන් වල අලෙවි ආදායම පහත පරිදි වේ.

ඔසු උයන	වාර්ෂික ආදායම (රු.)
දංගොල්ල	4,588,489.85
රන්දෙනිගම	4,387,444.88
මැදවච්චිය	24,512.00
එකතුව	**8,800,446.73**

(vi) නව ආයුර්වේද අලෙවි මධ්‍යස්ථාන ආරම්භ කිරීම

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙහි අනුරාධපුර අලෙවි මධ්‍යස්ථානය නව ස්ථානයක 2023.06.15 දින ස්ථාපිත කළ අතර, උතුරු මැද පළාතේ වැවෙන සියළුම වියලි ඖෂධ වර්ග රැස් කිරීම සහ ඔසු අමුද්‍රව්‍ය මිලදී ගැනීම් මධ්‍යස්ථානයක්ද ස්ථාපිත කරන ලදි.

(vii) www.sladc.lk වෙබ් අඩවිය සම්මානයට පාත්‍ර වීම

ආයුර්වේද ඖෂධ සංස්ථාවේ නිළ වෙබ් අඩවිය වන www.sladc.lk වෙබ් අඩවිය 2023 වර්ෂයේදී පවත්වන ලද හොඳම වෙබ් අඩවිය තෝරා ගැනීමේ සම්මාන උළෙලේදී හොඳම සෞඛ්‍ය සහ සුවතා වෙබ් අඩවිය යන කාණ්ඩය යටතේ ලෝකඩ සම්මානය ලබා ගන්නා ලදි.

(viii) තත්ත්ව සහතික) ISO)

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් (ISO 9001:2015) තත්ව කළමනාකරණ පද්ධතිය සඳහා නාවින්න ප්‍රධාන නිෂ්පාදනාගාරයේ සහ පතිරගොඩ නව නිෂ්පාදනගාරය තුළ සිදු කරන ලද විගණනයට අනුව එය නිසි පරිදි නියාමනය වන බවට තහවුරු කරන ලදි.

(ix) රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ආරම්භ කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී උද්ගත වූ ගැටළු සහගත තත්ත්වයන් හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව ඇණහිට තිබූ බැවින් 2023 වර්ෂයේ සිට මෙම කටයුතු නැවතත් ආරම්භ කළ අතර, 2024 වර්ෂය අවසානයට පෙර සම්පූර්ණ කිරීමට නියමිතව ඇත.

(x) කෙටීමේ යන්ත්‍රය ස්ථාපිතකර භාවිතයට ගැනීම

2020 වර්ෂයේ දී රු.5,049,166.67 පිරිවැයක් දරා මිල දී ගෙන තිබූ මෙම යන්ත්‍රය 2020 වර්ෂයේ අගෝස්තු මාසයේ දී ස්ථාපිත කර නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනීම 2023 වර්ෂයේ මැයි මස දී සිදු කරන ලදී. එමගින් ඖෂධ අමුද්‍රව්‍ය පෙර සැකසුම් කාර්යය කාර්යක්ෂම කිරීමට හැකිවී ඇත.

(xi) භාවිතා කරන ලද හිස් බෝතල් රැස් කිරීම හා පිරිවැය පාලනය

පිරිවැය අවම කරමින්, භාවිතයෙන් ඉවත් කර තිබූ බෝතල් නැවත භාවිතා කිරීමටත් කටයුතු කරන ලදි. මෙලෙස 2023 වර්ෂයේ භාවිතා කරන ලද බෝතල් සංඛ්‍යාව 350,000 පමන වේ.

(xii) නිෂ්පාදනාගාරයේ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම

දිර්ඝකාලීනව පුරප්පාඩුව පැවති නිෂ්පාදනාගාර කාර්යමණ්ඩල නිෂ්පාදන සහායක තනතුරු 50ක් සම්පූර්ණ කිරීමට මෙම වර්ෂයේදී කටයුතු කර ඇත.මෙමගින් නිෂ්පාදන ධාරිතිවය වැඩි කිරීමටත් නිෂ්පාදන කටයුතු කාරියක්ෂමව ඉටු කිරීමටත් හැකි වී ඇත.

(xiii) **ERP** පරිගණක මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම

දැනට භාවිතා කරනු ලබන පරිගණක මෘදුකාංග පද්ධතියෙන් ඔබ්බට ගොස් සෑම අංශයක්ම සම්බන්ධ විය හැකි පරිදි වැඩි පහසුකමක් සහිතව නවීකරණය වූ මෙම ERP පරිගණක මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත. මේ සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමට මිළ ගණන් කැඳවීමක් සිදු කර ඇති අතර ඉදිරිපත් කර ඇති ලංසු ඇගයීම් කටයුතු දෙසැම්බර් මස තුළ සිදුකරන ලදි. 2024 වර්ෂයේදී මෙම ERP මෘදුකාංග පද්ධතිය සක්‍රීයව භාවිතා කිරීමට සැළසුම් කර ඇත.

.....

වෛද්‍ය පී. ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

2024/11/07

3 පරිච්ඡේදය

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023		සටහන	තත්‍ය 2023	2022	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		292,150,453,218	157,927,902,245	ඒසිඒ-3
-	කැන්පතු		1,334,716,489	784,200,755	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		1,141,199,128	1,232,790,489	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		294,626,368,835	159,944,893,489	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		294,626,368,835	159,944,893,489	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		875,322,682	125,153,299	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		293,751,046,153	159,819,740,190	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
116,459,228,032	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	114,689,616,415	111,126,392,855	
183,946,853,968	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	170,109,814,212	89,891,540,715	ඒසිඒ-2(ii)
12,119,968,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	8,454,093,900	6,438,236,327	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
312,526,050,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		293,253,524,527	207,456,169,897	
	මූලධන වියදම්				
13,529,300,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	8,891,609,411	3,160,082,684	
38,524,010,789	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	11,605,503,841	13,761,753,193	
218,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	154,200,869	204,252,921	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
2,282,944,676	හැකියා වර්ධනය	14	2,065,306,252	1,477,231,808	
9,948,866,895	වෙනත් මූලධන වියදම්	15	3,347,513,899	14,792,707,200	
64,503,122,360	මුළු මූලධන වියදම් (උ)		26,064,134,272	33,396,027,805	
	කැන්පතු ගෙවීම්		1,213,249,048	659,752,806	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		1,264,445,494	1,084,003,608	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		2,477,694,541	1,743,756,413	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		321,795,353,341	242,595,954,115	
377,029,172,360	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(28,044,307,188)	(82,776,213,925)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(28,044,672,640)	(82,776,579,377)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		365,452	365,452	ඒසිඒ-3
			(28,044,307,188)	(82,776,213,925)	

3.3 මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2023	2022
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	204,292,957,237	200,118,271,330
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	3,697,321,387	3,574,075,021
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	365,452	365,452
මුළු වත්කම්		**207,990,644,076**	**203,692,711,803**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		1,717,664,316	1,715,885,391
දේපළ පිරියත හා උපකරණ සංචිතය		204,292,957,237	200,118,271,330
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	1,979,657,071	1,858,189,630
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	365,452	365,452
මුළු වගකීම්		**207,990,644,076**	**203,692,711,803**

පිටු අංක 7/142 සිට 61/231 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 62/232 සිට 141/256 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළදිරවී කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි I
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය : 27/02/2024
දිනය : 27/2/2024	දිනය : 27/2/2024	
වෛද්‍ය ඩී. නිලෙනීපාල	වෛද්‍ය ඩී. නිලෙනීපාල	ඒ.එම්.සුරවීරරත්න
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි I
සෞඛ්‍ය අමාත්‍යාංශය	සෞඛ්‍ය අමාත්‍යාංශය	සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"	"සුවසිරිපාය"	"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,	385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,	385,පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.	කොළඹ 10.	කොළඹ 10.

2

3.4 මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශය

ඒසිඒ-සි

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	6,339,574,727	4,821,281,260
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	292,150,087,766	157,923,769,291
අත්තිකාරම් අයකර ගැනීම්	1,137,300,968	1,304,228,473
නැන්පතු ලැබීම්	1,334,716,489	777,242,765
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	300,961,679,951	164,826,521,789
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	276,291,120,141	195,134,187,374
සහනාධාර සහ මාරුකිරීම්	3,114,118,919	1,697,599,059
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	297,284,965	(43,331,821,429)
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	875,322,682	125,153,299
අත්තිකාරම් ගෙවීම්	1,264,259,101	1,092,346,241
නැන්පතු ගෙවීම්	1,213,249,048	544,621,262
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	283,055,354,857	155,262,085,806
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	17,906,325,094	9,564,435,983
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	17,906,325,094	9,568,203,486
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	17,906,325,094	9,568,203,486
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(17,906,325,094)	(9,568,203,486)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	(3,767,502)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	(3,767,502)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	365,452	4,132,954
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	365,452	365,452

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

නැත

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රුපියල් මිලියන

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රුපියල්)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %
20.02.01.01	රජයේ ගොඩනැගිලි සඳහා කුලිය	175.00	175.00	263.53	151
20.02.01.99	රජයේ වත්කම් මත ආදායම වෙනත් කුලී ගාස්තු	18.00	18.00	30.36	169
20.02.02.99	වෙනත් පොලී	103.80	103.80	103.09	99
20.03.01.00	විකුණුම් ආදායම සහ ගාස්තු - දෙපාර්තමේන්තු විකුණුම්	30.00	30.00	75.03	250
20.03.02.99	විකුණුම් ආදායම සහ ගාස්තු - පරිපාලන ගාස්තු අයකිරීම්	35.00	35.00	62.71	179
20.03.03.02	විකුණුම් ආදායම සහ ගාස්තු - දඩ සහ රාජසන්තක කිරීම්	8.00	8.00	89.22	1115
20.03.99.00	විකුණුම් ආදායම සහ ගාස්තු - වෙනත් රිසිට්පත්	815.00	1500.00	2736.00	182
20.05.99.00		0	0	0	0
20.06.02.00		0	0	0	0
20.06.02.02	ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම - වෙනත්	0	0	2.88	0

3.7 ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

(රු. ,000)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝජිත ප්‍රතිපාදනය, අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	245,550,000	312,526,050	293,253,524	94
ප්‍රාග්ධන	59,940,000	64,503,122	26,064,134	40

3.8 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

(රු. ,000)

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු. ,000)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල %
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	228 - අධිකරණ අමාත්‍යාංශය	අධිකරණ වෛද්‍ය නිළධාරීන් සඳහා ඉන්ධන සහ ප්‍රවාහන දීමනාව ගෙවීම	20,000	16,500	15,418	93

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රුපියල්

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය්	**2023.12.31** දිනට භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව අනුව ශේෂය ₱	**2023.12.31** දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය ₱	ඉදිරියේදී ගිණුම්ගත කිරීමට නියමිත	% ලෙස ප්‍රගතිය වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	69,985,238,027.79	69,985,238,027.79		
9152	ප්‍රවාහන උපකරණ	67,124,483,112.82	67,124,483,112.82		
9153	ඉඩම්	52,771,735,512.00	52,771,735,512.00		
9154	අසපෘශ්‍ය වත්කම්	99,326,825.91	99,326,825.91		
9160	කෙරීගෙන යන වැඩ	27,348,131,535.28	27,348,131,535.28		
	මුළු එකතුව	**217,328,960,013.80**	**217,328,960,013.80**		

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එම්ඊඩී/බී/එම්එව් /02/2023/92

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 ජූලි 04 දින

සෞඛ්‍ය අමාත්‍යාංශය කොළඹ 10. 05 JUL 2024 ආරක්ෂණ හා සම්බන්ධතා අංශය

SECRETARY 05 JUL 2024 1523123 MINISTRY OF HEALTH

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

02. ජාතික විගණන පනතේ 39(1) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙතද, භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත හා අදාළ අමාත්‍යවරයා වෙතද දැනුම් දිය යුතුය.

03. එම පනතේ 39(2) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ ඇතුළත් මා විසින් පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේ නම් ඒ බවද මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි.

ප. මාසකෝරාල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

ප. මාසකෝරාල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් : 01. සෞඛ්‍ය අමාත්‍යතුමා - දැ.ගැ.පි.
02 මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා - දැ.ගැ.පි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	එම්ඊඩී/බී/එම්එච් /02/2023/92	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2024 ජූලි 04 දින

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබෙනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දෝෂ

විගණන නිරීක්ෂණය		නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2023 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය ACA 2(ii) ආකෘතියේ සඳහන් එකිනෙක වියදම්වල ශුද්ධ ප්‍රතිපාදනය හා තත්‍ය වියදම අතර වෙනසට හේතු ලෙස ඉදිරිපත් කර තිබුණු ඇතැම් කරුණු පිළිගත හැකි කරුණු නොවන බව නිරීක්ෂණය විය. විස්තර පහතින් දැක්වේ.		
	i. 111-01-02-1-1508-02 වෛද්‍ය මණ්ඩල (වෛද්‍ය මණ්ඩල ආඥා පනත) වැය විෂයය සඳහා රු.2,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර 2021 වර්ෂයේ සිට මෙම ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. අමාත්‍යාංශය විසින් ඉතිරිවීම් වලට හේතුව ලෙස දක්වා තිබුනේ, වෛද්‍ය ආඥා පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති බවත් අමාත්‍යාංශය විසින් මෙම වැය විෂයයට ඇස්තමේන්තු නොකළද මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන වෙන් කරන බවත්ය. නමුත් මෙම ප්‍රතිපාදනය ඇස්තමේන්තුවෙන් ඉවත් කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.	වියදම් දැරීමට අපේක්ෂා නොකරන වැයවිෂයයන් සඳහා ප්‍රතිපාදන වෙන් නොකළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. මෙම වැය විෂය සඳහා කෙටුම්පත් ඇස්තමේන්තු නොකරන ලද බව, අයවැය සාකච්ඡා වලදීද මෙම ප්‍රතිපාදනය ඉවත් කරන ලෙස දැනුම් දෙන ලද බව, නමුත් මෙය ආඥා පනතක් බැවින් පාර්ලිමේන්තුවේ අනුමැතියක් අවශ්‍ය බව මහා භාණ්ඩාගාරය විසින් පවසන ලද බව හා මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය වෙත උපදෙස් ලබා දී ඇති බව.
	ii. 111-01-02-1-1508-04 සුව කළ නොහැකි රෝගීන් සඳහා වන වික්ටෝරියා නිවාස වැය විෂය සඳහා රු.3,000,000 ප්‍රතිපාදන වෙන් කළ තිබුණද සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණු අතර අදාළ ඉල්ලීම් ඉදිරිපත් නොවීම නිසා මෙලෙස සියයට 100 ක ප්‍රතිපාදන ඉතිරි වීමට හේතුව ලෙස දක්වා තිබුණි. 2021 වර්ෂයේදීද වෙන්	-එම-	මෙය ප්‍රදානයක් වන අතර, වසර **02** කින් පමණ මෙය ලබා ගෙන නොමැති බව හා ඉදිරියේදී ඇස්තමේන්තු නොකිරීමට වග බලා ගන්නා බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදනයම උක්ත හේතුව මත වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි. ඒ අනුව මෙම ඉතිරි වීමට හේතුව ඉල්ලීම් ඉදිරිපත් නොවීමද, වෙනත් කරුණක්ද යන්න නිශ්චය කළ නොහැකි විණි.		
	iii. 111-02-13-178-2001(13) සෞඛ්‍ය පද්ධතීන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති (ආසියානු සංවර්ධන බැංකුව) වැය විෂය සඳහා රු. 675,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර අක්මුදල් ප්‍රමාණවත් තරම් ඉදිරිපත් නොවීම , රාජ්‍ය වියදම් අවම කිරීම හා සිවිල් වැඩ කොන්ත්‍රාත්වල ප්‍රගතිය මන්දගාමී වීම නිසා මෙලෙස සියයට 100 ක ප්‍රතිපාදන ඉතිරි වීමට හේතුව ලෙස දක්වා තිබුණි. කෙසේ වුවත්, 1990 සුවසැරිය ආයතනය සඳහා ගිලන් රථ (Ambulances) මිලදී ගැනීම සඳහා වෙන් කළ මෙම ප්‍රතිපාදනය නියමිත ලංසු නොලැබීම මත අවලංගු වීම් හේතුවෙන් ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව.
	iv. 111-02-13-177-2103(12) හා 111-02-13-177-2103(17) කොවිඩ් 19 එන්නත්කරණ වැඩසටහන ශක්තිමත් කිරීම ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකුව) වැය විෂයයන් සඳහා පිළිවෙලින් රු. 475,000,000 ක් හා 70,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණු අතර අක්මුදල් ප්‍රමාණවත් තරම් ඉදිරිපත් නොවීම , රාජ්‍ය වියදම් අවම කිරීම හා සැලසුම් කළ කටයුතු වසර තුළ අත්හිටුවීම නිසා මෙලෙස සියයට 100 ක ප්‍රතිපාදන ඉතිරි වීමට හේතුව ලෙස දක්වා තිබුණි. කෙසේ වුවත්, අපේක්ෂිත ලෙස එන්නත්කරණයට මහජනයා යොමු නොවීම මත කොවිඩ් 19 එන්නත්කරණ වැඩසටහන සඳහා ලබාදුන් සම්පූර්ණ ප්‍රතිපාදන මුදල ඉතිරි වී තිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ)	ACA 2(iii) ආකෘතියේ සඳහන් 111-01-02-1409, 111-01-21-1101, 111-01-21-1203, 111-01-21-1002, 111-01-21-1403, 111-01-21-1506, 111-02-17-1409, 111-02-20-1-1101, 111-02-15-2401, 111-02-26-012-2509(13), 111-02-26-013,- 111-02-26-014-2509(13), වැය විෂයන්වල මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර වෙනස්කම්වලට ඉදිරිපත් කර තිබුණු හේතු විගණනයේදී පිළිගත නොහැකි විය.	මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර වෙනස්කම්වලට බලපාන ලද නිවැරදි හේතූන් ඉදිරිපත් කළ යුතුය.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව කාර්යමණ්ඩල පුහුණු සැලැස්මක් සකස් කර ඒ අනුව තාත්වික ඇස්තමේන්තු සකස් කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති බව.

1.2.2 **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

1.2.2.1 **මූල්‍ය නොවන වත්කම්**

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
(අ)	2018 වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම්වල පිරිවැය රු.මිලියන 46,940.73 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ඉන් රු.මිලියන 7,102.99 ක් 2019 වර්ෂයේදී අළුතින් ඉඩම් අත්පත් කර ගැනීමක් ලෙස දක්වා තිබුණි.	මෙම වැරදි නිවැරදි කර 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	නිර්දේශය සමඟ එකඟ වන බව, අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන **CIGAS** වැඩසටහන හා භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශවල සමස්ත තොරතුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල් හා අනෙකුත් ආයතනවල **CIGAS** තොරතුරු හා ගැලපීමේ දී ගැටළු රාශියක් මේ වන විට හඳුනාගෙන ඇත. එම ගැටළු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කර නිරාකරණය කර ගැනීම සඳහා සෞඛ්‍ය ආයතන 61ක මාසික ගිණුම් සාරාංශය ගබඩා සමීක්ෂණ අංශය වෙත මාසිකව ලබාගෙන

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			වත්කම් ගිණුම් තැබීම පරීක්ෂා කරනු ලබන බව, මෙම ක්‍රියාවලිය 2023 ජනවාරි සිට ආරම්භ කර ඇති අතර එම ගැටළු 2024.05.13 දින පැවති රජයේ ගිණුම් කාරක සභාවේ නියෝගවලට අනුව මාස 06ක් ඇතුළත නිරාකරණය කිරීමට කටයුතු කරනු ලබන බව.
(ආ)	2018 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.මිලියන 14,793.13 කින් අඩුවෙන් දක්වා තිබීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට මූලධන වත්කම් ඊට සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි.	-එම-	-එම-
(ඇ)	භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන අනුව 2019 වර්ෂය තුළදී අත්පත් කර ගෙන තිබුණු ගොඩනැගිලි හා ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 6,501.94 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණු අතර 2019 වර්ෂය තුළදී අත්පත් කර ගෙන තිබුණු වත්කම් වල පිරිවැය රු.මිලියන 2,967.27 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	-එම-	-එම-
(ඈ)	භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන එස්ඒ 80 මූල්‍ය නොවන වත්කම් ගිණුම් මාසික සාරාංශයට හා එස්ඒ 82 සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවට අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල පිරිවැයෙහි පැවති රු.මිලියන 19,789.44 ක වෙනසට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2024 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඉ)	2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2021 ජනවාරි 01 දිනට දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය රු.මිලියන 192,229.15 ක් වූවද, භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු මූල්‍ය නොවන වත්කම් ගිණුම් මාසික සාරාංශය (SA 80) හා සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) ප්‍රකාරව එම අගය පිළිවෙලින් රු.මිලියන 172,439.71 ක් හා රු.මිලියන 184,327.77 ක් වූයෙන් පැවති පිළිවෙලින් රු.මිලියන 19,789.44 ක හා රු.මිලියන 7,901.38 ක වෙනස්කම්වලට හේතු අනාවරණය නොකෙරුණි.	-එම-	-එම-
(ඊ)	2021 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2(i) ආකෘතිය) හා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු මාසික වියදම් සාරාංශය (SA 10) ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් හා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) ප්‍රකාරව එම අගය අතර වූ රු.මිලියන 16,877.89 ක වෙනස සඳහා හේතු අනාවරණය නොකෙරුණි.	-එම-	-එම-
(උ)	2020 වර්ෂයේදී විවිධ දේශීය, විදේශීය ආයතන, සංවිධාන හා පුද්ගලයින් විසින් අමාත්‍යාංශයට හා ඒ යටතේ පවතින රෝහල් ආයතන හා විවිධ අංශ වෙත මූල්‍ය නොවන ආධාර හෝ පරිත්‍යාග ලෙස වටිනාකම රු.මිලියන 1,339.25 ක භාණ්ඩ උපකරණ හා වෛද්‍ය සැපයීම්ද වටිනාකම නොදත් භාණ්ඩ හා උපකරණ ඒකක 2,444 ලබා දී තිබුණු බැව් තහවුරු වූවද ඒවායේ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.	ගිණුම්ගත නොකළ සියළුම වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කරමින් 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	-එම-
(ඌ)	2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු විදේශාධාර ව්‍යාපෘති 54 ක් යටතේ දරන ලද රු.මිලියන 7,603.09 ක වියදම් තුළ ඇතුළත් මූල්‍ය	ව්‍යාපෘති යටතේ අත්පත් කරගත් සියළුම වත්කම් ගිණුම්ගත කළ බව තහවුරු කරන ලිඛිත සාක්ෂි	-එම-

NAOSL ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	නොවන වත්කම් අත්පත් කර ගැනීම් හා සංවර්ධනය සඳහා දරන ලද වියදම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.	
(ඒ)	2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව හා භාණ්ඩාගාර සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව එදිනට මූල්‍ය නොවන වත්කම්වල අගය හා 2022 වර්ෂයේ භාණ්ඩාගාර සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව 2022 ජනවාරි 01 දිනට එම අගය අතර රු. මිලියන 5,244.56 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනසට හේතුව විගණනයේදී පැහැදිලි නොකෙරුණි.	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2024 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	-එම-
(ඓ)	2022 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2(i) ආකෘතිය) හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 10 ට අනුව, 2022 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් හා භාණ්ඩාගාරයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව එම අගය අතර රු. මිලියන 11,423.16 ක වෙනසක් පැවතුණි.	-එම-	-එම-
(ඔ)	කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,326.05 ක මූල්‍ය නොවන වත්කම් මිලදීගෙන තිබුණු අතර මෙම වත්කම්වල පිරිවැය අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	ව්‍යාපෘති යටතේ අත්පත් කරගත් සියළුම වත්කම් ගිණුම් ගත කළ බව තහවුරුවන ලිඛිත සාක්ෂි කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.	-එම-
(ඕ)	විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන **59** කට අදාළව **2022** දෙසැම්බර් **31** දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව රෝහල් /ආයතන **25** ක ඉඩම් මෙන්ම රෝහල් /ආයතන **05** ක	කඩිනමින් මෙම වත්කම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.		
(ක)	ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට හා සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අයිතිය පවරන ලද වාහන දෙකක පිරිවැය රු.**11,550,000** ක් **2022** දෙසැම්බර් **31** දිනට සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය වාර්තාවල ඇතුළත්ව තිබුණි.	මෙම වරද නිවැරදි කර ඒ බව විගණනයට තහවුරු කළ යුතුය.	-එම-
(ග)	විගණනය විසින් ඉල්ලුම් කළ තොරතුරු ඇතැම් ආයතන විසින් ලබා දී නොතිබුණි. අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්, අනෙකුත් සෞඛ්‍ය ආයතන, පුහුණු ආයතන හා අංශ 11 ක 2017, 2018, 2019 යන වර්ෂ වලට අදාළව එකතුව රු. මිලියන 2.66 ක් පිරිවැය වූ භාණ්ඩ හා බදුල්ල පළාත් මහ රෝහලට අදාළ පිරිවැය සඳහන් නොකළ භාණ්ඩ පොත් වලින් කපා හැරීමට කටයුතු කර තිබුණි. නමුත් එම අපහරණය කළ භාණ්ඩවල පිරිවැය අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කළේද යන්න විගණනය වෙත තහවුරු කර නොතිබුණි.එසේම ඇතැම් රෝහල් වල අපහරණ කටයුතු අවසන් කර නොතිබුණු අවස්ථාද, පත්කරන ලද අපහරණ මණ්ඩල විසින් අදාළ අපහරණ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණු අවස්ථාද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන්ට අදාළ ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අවස්ථාද නිරීක්ෂණය විය.	විගණනය විසින් ඉල්ලුම් කර ඇති තොරතුරු සියළුම ආයතන විසින් ලබා දිය යුතු අතර අපහරණය කළ වත්කම් වලට අදාල නිවැරදි ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකළ යුතුය.එමෙන්ම සමීක්ෂණ මණ්ඩල වාර්තා ලැබීමෙන් පසු විෂමතා, ඌනතා සහ නැතිවීම් කිසිවක් වෙතොත් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව ක්‍රියා කළ යුතුය.	-එම-
(ච)	ආයතන / රෝහල් හා අංශ 31 ක් වෙත 2020 හා 2021 වර්ෂ වලදී ලැබී තිබුණු රු. මිලියන 2,588.30 වටිනා භාණ්ඩ හා ආයතන / රෝහල් හා අංශ 30 ක් වෙත ලැබී තිබුණු වටිනාකම පිළිබඳ තොරතුරු ඇතුළත් නොවූ අවස්ථා 2057 කට අදාළ භාණ්ඩ විධිමත් පරිදි ලේඛනගත කර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.	සියළුම පරිත්‍යාග නියමිත පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඡ)	2023 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව 2023 ජනවාරි 01 දිනට දේපළ, පිරියත හා උපකරණවල අගය රු මිලියන 195,221.42 **ක්** විය. නමුත් භාණ්ඩාගාර මුද්‍රිත, මූල්‍ය නොවන වත්කම් ගිණුම් මාසික සාරාංශය (SA 80) හි 2023 ජනවාරි 01 දිනට වූ ආරම්භක ශේෂය රු. මිලියන 200,118.27ක් විය.	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2024 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ගබඩා සමීක්ෂණ අංශය මගින් තොරතුරු රැස් කිරීමේ දී CIGAS පද්ධතියේ ක්‍රියාත්මක රෝහල් හා ආයතන වලින් පමණක් තොරතුරු ලබාගෙන ගිණුම් ගත කරනු ලබන අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් (SA 80) සැකසීමේ දී අදාළ රෝහල් හා ආයතන වලින් ලද තොරතුරු වලට අමතරව ව්‍යාපෘති හා TOD මගින් අමාත්‍යාංශය වෙත ලබා දෙන වැය අගයන් යොදා ගෙන ඇති බව නිරීක්ෂණය වන අතර මෙම වරද නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව.
(ජ)	2022 වර්ෂයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල අගය රු. මිලියන 200,118.27 ක් වූ අතර 2023 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු එම වාර්තාවේ 2023 ජනවාරි 01 දිනට එම අගය රු මිලියන 195,221.42 ක් විය. මේ අනුව රු.මිලියන 4,896.85 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනසට හේතුව විගණනයේදී පැහැදිලි නොකෙරුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, SA 82 සැකසීම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර පෙර වර්ෂයේ වර්ෂ අවසාන ශේෂය මෙම වර්ෂයේ ආරම්භක ශේෂය බවට පත් නොවීමට අදාළ හේතුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් තහවුරු කරගෙන නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව.
(ට)	2023 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2(i) ආකෘතිය) හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 10 ට අනුව, 2023 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.මිලියන 11,605.50 ක් වූවද භාණ්ඩාගාරයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව සමාලෝචිත වර්ෂයේ වත්කම් මිලදී ගැනීම රු. මිලියන	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ආරම්භක ශේෂය (ඉඩම් හා ගොඩනැගිලි) නිවැරදි කර ඇති අතර 2023 වර්ෂයේ සියළු මිලදී ගැනීම් ප්‍රාග්ධනිත කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර 2024.07.31 දින වන විට සම්පූර්ණ කිරීමට කටයුතු යොදා ඇති බව.

	3,698.37 ක් වූයෙන් වත්කම්වල පිරිවැය රු. මිලියන 7,907.13 ක් අඩුවෙන් දක්වා තිබුණි.		
(ය)	අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු. මිලියන 204,292.96 ක් වූවද විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන 63 ක 2023 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව එම වත්කම්වල වටිනාකම රු. මිලියන 215,870.86 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. මිලියන 11,577.90 ක වෙනසක් නිරීක්ෂණය විය.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.මිලියන 204,292.96ක් වූවද විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන 63 ක 2023 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව එම වත්කම් වල වටිනාකම රු.මිලියන 215,870.86 ක් වන අතර එහි වෙනස වන රු.මිලියන 11,577.90 ක පිළිබඳ පරීක්ෂා කර වෙනස්කම් වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදු කර නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන බව.
(ඩ)	2024 මාර්තු 25 දිනට විගණනය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 05 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 6,620.90 ක මූල්‍ය නොවන වත්කම් මිලදිගෙන තිබුණු නමුත් මෙම වත්කම් වලින් පිරිවැය රු. මිලියන 3,385.32 වත්කම් පමණක් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.	මෙම වැරදි නිවැරදි කර 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ඒ අනුව අදාළ වෙනසට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදු කර නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරන බව.
(ණ)	2023 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් රෝහල් /ආයතන 63 ක පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව රෝහල් /ආයතන 27 ක ඉඩම්	කඩිනමින් මෙම වත්කම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2024.04.30 දින වන විට තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත්

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	මෙන්ම රෝහල් /ආයතන 04 ක ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.		ආයතනවල තක්සේරු කර ඇති සියළු ඉඩම් හා ගොඩනැගිලි වත්කම් ගිණුම් වලට ඇතුළත් කර ඇති බව.
(ත)	2018 වර්ෂයෙන් පසු පේරාදෙණිය රෝහල් පරිශ්‍රයේ වකුගඩු ප්‍රතිකාර ඒකකයක් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ප්‍රතිපාදන යටතේ මහල් 03 කින් සමන්විත ශල්‍ය වාට්ටු සංකීර්ණයක් ඉදිකර තිබුණද මෙම ගොඩනැගිලිවල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	-එම-	එම ගොඩනැගිලි වල වටිනාකම ගිණුම් වලට ඇතුළත් කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇති බව, මෙම රෝහල් පරිශ්‍රයේ වකුගඩු ප්‍රතිකාර ඒකකය හා මහල් 3 කින් සමන්විත ශල්‍ය වාට්ටු සංකීර්ණය ඇතුළුව රෝහල් භූමියේ ස්ථාපිත ගොඩනැගිලි පරීක්ෂා කර වර්තමාන මිල ගණන් යටතේ තක්සේරු කර තක්සේරු වාර්තාවක් ලබා දෙන ලෙසට ඉල්ලා ඇති බව, ඒ සඳහා මෙතෙක් ප්‍රතිචාර ලැබී නොමැති බව. එබැවින් නව තක්සේරු වටිනාකම් හඳුනාගන්නා තෙක් එම ගොඩනැගිලි වටිනාකම් ගිණුම්ගත කළ නොහැකිව ඇත.

1.2.3 අග්‍රිම ගිණුම

විගණන නිරීක්ෂණය ----------	නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
1997 වර්ෂයේ සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එන, මඩකළපුව ශික්ෂණ රෝහලට අයත් රු.362,702 ක අග්‍රිම ශේෂය 2021 වර්ෂයේ නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස අග්‍රිම ගිණුමට මාරු කර තිබුණු අතර එම ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.	මෙම අග්‍රිම ශේෂය කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මඩකලපුව ශික්ෂණ රෝහලට අයත් රු. 362,702 ක නිරවුල් නොවූ අග්‍රිම ශේෂය පියවීමේ ඉදිරි කටයුතු සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන නීති නිලධාරී මගින් නීතිපති

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

		දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා ඇති බව.

1.2.4 **විගණන සාක්ෂි නොවීම**

විගණන නිරීක්ෂණය ----------	නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
මුළු පිරිවැය රු.මිලියන 204,292.96 ක් වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳව විස්තරාත්මක උපලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා සහ CIGAS වැඩසටහන අනුව දැක්වෙන වත්කම් පිළිබඳ තොරතුරු, ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් ශේෂයට ගැලපීම් කර තිබුණු රු.මිලියන 20,775.78 ක මුදලට, සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබුණු රු. මිලියන 3,698.37 ක වත්කම් මිලදී ගැනීම් වලට මෙන්ම රු. මිලියන 6,944.27 ක වත්කම් අපහරණයන් වලට අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණු බැවින් එම අගයන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. එමෙන්ම අතුරු වෛද්‍ය සේවයට අයත් තනතුරු 08 කට අයත් නිලධාරීන් 238 ක් සහ පරිපූරක වෛද්‍ය සේවයට අයත් තනතුරු 03 කට අයත් නිලධාරීන් 111 ක් සේවයේ යෙදී සිටිද නැද්ද යන්න හා සේවයේ සිටීනම් කුමන සේවා ස්ථානයක ඔවුන් සේවය කරන්නේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ස්ථාන මාරුවී ගිය, වැඩ තහනමට ලක් වූ, සේවය අතහැර ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 69 දෙනෙකුගෙන් අයවීමට තිබුණු රු.14,301,604 කට අදාළ දේපල/වාහන ණය ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. අමාත්‍යාංශය සතු වාහන උපයෝජනය පිළිබඳ කාර්යසාධනය ඇගයීම සඳහා අවශ්‍ය 2021, 2022 හා 2023 වර්ෂ තුනට අදාළ තොරතුරුද විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු අතර ඊට අමතරව විවිධ කාරණා සම්බන්ධයෙන් තොරතුරු කැඳවීම් ලිපි 34 කින්		

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

කැඳවූ විගණනය සඳහා අවශ්‍ය තොරතුරු 2024 අප්‍රේල් 09 දින වන විටත් ඉදිරිපත් නොකිරීම හෝ සම්පූර්ණ තොරතුරු ඉදිරිපත් නොකිරීම හෝ හේතුවෙන් අදාළ ක්ෂේත්‍ර නිසි ලෙස විගණනය කළ නොහැකි විය. ඇතැම් තොරතුරු කැඳවීමේ ලිපි නිකුත්කර මාස 30 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණි. මේ පිළිබඳ සවිස්තරාත්මක විස්තර පහතින් දැක්වේ.			
(අ)	2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ACA 6 ආකෘතිය) සඳහා අමුණා තිබුණු භාණ්ඩාගාරය විසින් ඉදිරිපත් කරන ලද SA 80 හා SA 82 යන ආකෘතින් අනුව දැක්වෙන වත්කම්, අමාත්‍යාංශයේ නව CIGAS වැඩසටහන අනුව දැක්වෙන වත්කම් සමඟ සැසඳේද යන්න පරීක්ෂා කිරීම සඳහා නව CIGAS වැඩසටහන අනුව දැක්වෙන වත්කම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම් කළද එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මේ හේතුවෙන් අමාත්‍යාංශය විසින් සත්‍ය වශයෙන්ම පවත්වාගෙන යනු ලබන මූල්‍ය නොවන වත්කම් මොනවාද යන්න සත්‍යාපනය කර ගැනීමට නොහැකි විය.	අමාත්‍යාංශයේ නව CIGAS වැඩසටහනට අනුව දැක්වෙන වත්කම් පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ඒ අනුව 2023 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය සඳහා භාණ්ඩාගාරය විසින් ඉදිරිපත් කරන ලද SA 80 හා SA 82 අනුව දැක්වෙන වත්කම්,අමාත්‍යාංශයේ නව CIGAS වැඩසටහන අනුව දැක්වෙන වත්කම් සමඟ සැසඳේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා අමාත්‍යාංශය විසින් සත්‍ය වශයෙන්ම පවත්වාගෙන යනු ලබන මූල්‍ය නොවන වත්කම් මොනවාද යන්න පිළිබඳව හා සමාලෝචිත වර්ෂය තුළදී වෙනත් ආයතන වලින් අමාත්‍යාංශයට මාරු කරන ලද වත්කම් විධිමත් පරිදි පවරාගෙන තිබේද යන්න හා භෞතිකව පවතීද යන්න පිළිබඳව අවශ්‍ය නිවැරදි තොරතුරු පරීක්ෂා කර 2024.07.31 දිනට පෙර ඉදිරිපත් කරන බව.
(ආ)	භාණ්ඩාගාර මුද්‍රිත සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් ශේෂයට ගැලපිම් කර තිබුණු රු. මිලියන 20,775.78 ක මුදලට, සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබුණු රු. මිලියන 3,698.37 ක වත්කම් මිලදී ගැනීම් වලට මෙන්ම රු. මිලියන 6,944.27 ක වත්කම් අපහරණයන් වලට හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව	සියළු තොරතුරු ඇතුළත් වන පරිදි උපලේඛන පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය.	**CIGAS** හි වත්කම් ගිණුම්ගත කරන මොඩියුලය මගින් නිවැරදි කර ගන්නා තොරතුරු මත භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමට ඉදිරියේදී සැලසුම් කරමින් පවතින බව.

	පැවති රු. මිලියන 204,292.96 ක මූල්‍ය නොවන වත්කම් ශේෂයට අදාළ විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් මෙකී අගයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.		
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළදී වෙනත් ආයතන වලින් අමාත්‍යාංශයට මාරුකරන ලද රු. මිලියන 613.19 ක වත්කම් පැවතියද ඒ පිළිබඳ විස්තරාත්මක උපලේඛන විගණනයට ලබා නොදීම හේතුවෙන් එම වත්කම් විධිමත් පරිදි ආයතනයට පවරා ගෙන තිබේද යන්න පරීක්ෂා කිරීමට හෝ මෙම වත්කම් භෞතිකව ආයතනය සතුව පවතීද යන්න පරීක්ෂා කිරීමට හෝ නොහැකි විය.	-එම-	වාර්ෂික සමීක්ෂණවලදී තොරතුරු තහවුරු කර ගැනීමට කටයුතු කරන අතර, ගිණුම් දෙපාර්තමේන්තුව හා එක්ව **CIGAS** යටතේ තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව.
(ඈ)	සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල් හා අනෙකුත් ආයතන වෙනුවෙන් 2023 වර්ෂයට අදාළව සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත 2024 මාර්තු 19 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු අතර, 2022 වර්ෂය සඳහා අමාත්‍යාංශයට අයත් රෝහල්/ ආයතන අතුරින් ආයතන 36 ක් පමණක් 2024 මාර්තු 26 විගණිත දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර තිබුණි.කෙසේ වුවත් මින් රොහල්/ආයතන 28 ක් පොදු ,ශල්‍ය උපකරණ හා වාහන යන සියළුම අංශ වෙනුවෙන් සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	මෙම තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 42 (අ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා ඉල්ලා ඇති තොරතුරු හා අනෙකුත් සාක්ෂි ලබා නොදෙන සෑම තැනැත්තෙකුම වරදක් සිදුකරන ලෙස සලකා කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ඒ අනුව 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු කිරීම සඳහා සියළුම රෝහල් හා ආයතන සඳහා මේ වන විට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර අනුමත කර ඇති අතර සියළුම රෝහල් හා ආයතනවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. 2024 ජුනි 15 දින වන විට සියළු රෝහල් හා ආයතනවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර දැනට රෝහල් හා ආයතන 04ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත යොමු කර ඇති බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඉ)	අතුරු වෛද්‍ය සේවයට අයත් තනතුරු 08 කට අයත් නිලධාරීන් 238 ක් සේවයේ යෙදී සිටිද, නැද්ද යන්න හා සේවයේ සිටීනම් කුමන සේවා ස්ථානයක ඔවුන් සේවය කරන්නේද යන්න පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව නොමැති බව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන 3) විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව නිරීක්ෂණය විය.	අමාත්‍යාංශය විසින් බඳවා ගනු ලබන සියළුම තනතුරුවලට අදාළව සියළු තොරතුරු ඇතුළත් විධිමත් දත්ත පද්ධතියක් සකස්කර යාවත්කාලීනව පවත්වගෙන යා යුතුය.	අතුරු වෛද්‍ය සේවයට අයත් තනතුරු 08කට අයත් නිලධාරීන් 238 ක් සම්බන්ධයෙන් ඇතැම් වර්ෂ වලට අදාළවන තොරතුරු පරිපාලන ආයතනික ශාඛාවේ නඩත්තු වන සැකිලි ගොනු වලින් සොයා ගැනීමට අපහසු වන අතර එම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කරන රේඛීය අමාත්‍යාංශයට අයත් රෝහල් ආයතන වෙතින් විමසා අදාළ තොරතුරු යාවත්කාලීන කර ගැනීමට කටයුතු කරමින් පවතින බව, මේවන විට අතුරු වෛද්‍ය සේවයට අදාළ තනතුරු හා නිලධාරීන් සම්බන්ධයෙන් තොරතුරු යාවත්කාලීන කරමින් පවතින අතර මීට අමතරව මෙම තොරතුරු සම්බන්ධයෙන් ඉදිරියේදී විධිමත් දත්ත පද්ධතියක් යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතින බව, මීට අමතරව රේඛීය අමාත්‍යාංශය මගින් බඳවාගෙන පළාත් සභා වෙත අනුයුක්ත කරන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කරනු ලබන්නේ පළාත් සභා මගින් වන බැවින් එම නිලධාරීන්ගේ තොරතුරු රේඛීය අමාත්‍යාංශය සතුව නොමැති බව.
(ඊ)	පරිපූරක වෛද්‍ය සේවයට අයත් තනතුරු 03 කට අයත් නිලධාරීන් 111 ක් සේවයේ යෙදී සිටිද, නැද්ද යන්න හා සේවයේ සිටීනම් කුමන සේවා ස්ථානයක ඔවුන් සේවය කරන්නේද යන්න පිළිබඳ තොරතුරු	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	අමාත්‍යාංශය සතුව නොමැති බව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන 3) විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව නිරීක්ෂණය විය.		
(උ)	ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 40 දෙනෙකුගෙන් අයවිය යුතු බව දැක්වෙන රු.9,164,419 ක් වූ දේපල/ වාහන ණයවලට අදාළ ණය ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණු බැවින් විගණනයේදී එම ශේෂයන්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.	මෙම තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 42 (අ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා ඉල්ලා ඇති තොරතුරු හා අනෙකුත් සාක්ෂි ලබානොදෙන සෑම තැනැත්තෙකුම වරදක් සිදුකරන ලෙස සලකා කටයුතු කළ යුතුය.	නිලධාරීන් 11 කට අදාළ දේපල සහ වාහන ණය ලිපිගොනු මේ වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර ඇති අතර දේපල සහ වාහන ණය ලිපිගොනු මේ වන විටත් ඉදිරිපත් කර නොමැති ආයතනයන් වෙත ලිපිගොනු ඉදිරිපත් කරන ලෙස දන්වා යවා ඇති බව, මාස 03ක් ඇතුළත අදාළ දේපළ සහ ණය ලිපිගොනු අදාළ ආයතන විසින් ඉදිරිපත් නොකළහොත් විමර්ශනයක් සිදු කිරීමට කටයුතු කරනු ලබයි.
(ඌ)	වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු රු.3,420,632 ක ණය ශේෂ වලට අදාළ දේපල/ වාහන ණය ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකළ බැවින් විගණනයේදී එම ශේෂයන්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.	-එම-	-එම-
(එ)	සේවය අතහැර ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු බව දැක්වෙන රු. 1,204,198 ක දේපල/ වාහන ණයවලට අදාළ ණය ලිපිගොණු විගණනයට ඉදිරිපත් නොකළ බැවින් විගණනයේදී එම ශේෂයන්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.	-එම-	-එම-
(ඒ)	විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු බව දැක්වෙන රු. 512,355 ක දේපල ණයවලට අදාළ ණය ලිපිගොනු විගණනයට ඉදිරිපත්	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	නොකළ බැවින් විගණනයේදී එම ශේෂයන්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.		
(ඔ)	2021, 2022 හා 2023 වර්ෂ තුන තුළ අමාත්‍යාංශය සතු වාහන උපයෝජනය සම්බන්ධයෙන් විගණනය විසින් ඉල්ලීම් කරන ලද තොරතුරු 2024 අප්‍රේල් 03 දින දක්වාම විගණනය වෙත ඉදිරිපත් නොකළ බැවින් අමාත්‍යාංශය සතු වාහන උපයෝජනය සම්බන්ධයෙන් නිසි පරීක්ෂාවක් කළ නොහැකි විය.	-එම-	2023/28 දරන තොරතුරු කැඳවීම සඳහා ආයතන 02 කට අදාළ තොරතුරු ලබා දී ඇති අතර අනෙකුත් සියළුම තොරතුරු සහ **MED/A/MH/**01/**INFO/**2021/33 හා **MED/B/MH/**01/**INFO/**2023/28 ට අදාළ සියළුම තොරතුරු කඩිනමින් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අධ්‍යක්ෂ (ප්‍රවාහන) දැනුවත් කර ඇති බව.

1.2.5 **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

නිරීක්ෂණය ----------	නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වූවත්, 2024අප්‍රේල් 04 දින වන විටත් පිළිතුරු නොලත් මුළු විගණන විමසුම් සංඛ්‍යාව 70 ක් වූ අතර, වසරකට වැඩි කාලයක් ගතව ඇතත් පිළිතුරු එවා නොතිබුණු විමසුම් සංඛ්‍යාව 6 ක් විය.	සියළුම විගණන විමසුම් සඳහා නියමිත කාලයන් තුළ පිළිතුරු ඉදිරිපත් කළ යුතුය.	මෙහි දක්වා ඇති විගණන විමසුම් අතරින් වසරකට වඩා වැඩි විගණන විමසුම් තවදුරටත් 06ක් සඳහා පිළිතුරු ලබා දීමට පවතින අතර ඉදිරියේදී කඩිනමින් එම විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කරන අතර අනෙකුත් විගණන විමසුම් සඳහා ද මෙම අමාත්‍යාංශය හා ඊට අදාළව පවතින රෝහල් හා ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வுத் திணைக்களம்
NATIONAL AUDIT OFFICE

1.2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නිරීක්ෂණය ----------				නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
නීති,රීති හා රෙගුලාසිවලට යොමුව ----------		වටිනාකම ---------- රු.මිලියන	අනුකූල නොවීම ----------		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි				
	i. මුදල් රෙගුලාසි 138	4.336	ගෙවීම් වවුචර්පත් වලට ගෙවීම් කිරීමට පෙර බලයලත් සහතික කිරීමේ නිලධාරියා විසින් වියදම සහතික කළ යුතු අතරම එසේ සහතික කිරීමේදී එම මුදල් රෙගුලාසියේ දක්වා ඇති 01 සිට 09 දක්වා වූ වගන්ති කෙරෙහි විශේෂ අවධානය යොමුකර එම කරුණු සම්පූර්ණ වී ඇද්ද යන්න සැහීමට පත්වීමෙන් පසු වියදම් සහතික කිරීම සහතික කිරීමේ නිලධාරියාගේ වගකීම වන්නේය. එසේ වූවද කළුතර ශික්ෂණ රෝහලේ 2023 මැයි සහ ජූනි මාසවල ගෙවීම් වවුචර්පත් 06 කට අදාළව එකතුව රු.4,336.611 ක ගෙවීම්, වියදම්	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඊට අනුකූල නොවන පරිදි නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය.	නිලධාරීන්ගේ ණය ගෙවීමට හා බිල්පත් පියවීමට අදාළ වියදම් සහතික කිරීම ගණකාධිකාරි විසින් ප්‍රතික්ෂේප කරන ලද බැවින් රෝහල් අධ්‍යක්ෂ විසින් වියදම සහතික කිරීම සිදු කර ඇති බව,

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			සහතික කිරීමකින් තොරව සිදු කර තිබුණි.		
	ii. මුදල් රෙගුලාසි 138, 139(1), 257, 141(3) (අ) සහ (ඈ)		කළුතර ශික්ෂණ රෝහලේ 2023 මැයි මස ගෙවීම් වවුචර්පත් 02 කට අදාළ උප වවුචර්පත් 58 ක ගෙවීම් එකතුව වූ රු 14,511,536 ක් වටිනා ගෙවීම් අනුමත කිරීම, වියදම් සහතික කිරීම හා ගෙවීම යන සියළු කටයුතු රෝහල් අධ්‍යක්ෂවරිය විසින් සිදුකර තිබුණි. මෙය මු.රෙ.135 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් බෙදා හරින ලද මූල්‍ය බලතල ක්‍රියාත්මක කිරීමේදී පිළිපැදිය යුතු 138,139 හා 257 යන මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීමක් වන අතර, චෙක්පත්වල දෙවන අත්සන්කරු ලෙස අත්සන යොදා ඇති අත්සන්කරු වන රෝහල් පරිපාලන නිලධාරිනිය විසින්ද 138,139(1),257,141(3) (අ) සහ (ඈ) යන මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීමක් සිදුකර ඇති බැව් නිරීක්ෂණය විය.	-එම-	-එම-
	iii. මුදල් රෙගුලාසි 110		සෑම ආයතනයක් විසින් ම මුදල් රෙගුලාසි 102 යටතේ සඳහන් වූ	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වර්තමානයේ මෙම රෝහලේ හානි පාඩු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			හානි පිළිබඳ විස්තර සටහන් පවත්වා ගෙන යාම සඳහා ලේඛන පවත්වා ගත යුතු වූවද කළුතර ශික්ෂණ රෝහල විසින් හානි හා පාඩු වාර්තා කිරීමේ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.		ලේඛනයක් පවත්වාගෙන යන බව.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16.5 ඡේදය	23.973	අධ්‍යයන හෝ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගිය නිලධාරීන් නැවත සේවයට නොපැමිණීම හා අවම සේවා කාලයක් සේවය නොකිරීම මත අදාළ නිලධාරීන් සමඟ එළඹුණු බැඳුම්කර ගිවිසුම් වටිනාකම් රජයට අයකර ගත යුතු වූවත්, මාතර මහ රෝහල විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, විගණිත දිනය වූ 2023 ඔක්තෝබර් 31 දින වන විට මාස 07 සිට අවුරුදු 11 යි මාස 03 දක්වා වූ දීර්ඝ කාලයක සිට සේවයට වාර්තා නොකළ නිලධාරීන් 14 දෙනෙකුගෙන් එකතුව රු.23,973,868 ක් වූ බැඳුම්කර වටිනාකම් අයකරගෙන නොතිබුණු අතර, අදාළ නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හෝ වගකිව යුතු නිලධාරීන් විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි	අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සියළුම ආයතනවලට අදාළව ගිවිසුම් කඩකළ නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	ගිවිසුම් බැඳුම්කර අයවිය යුතු නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු වටිනාකම් සම්බන්ධයෙන් පවතින දුර්වලතාවයන් විගණකාධිපති වාර්තා මගින් පෙන්වා දෙන අතරම රාජ්‍ය ගිණුම් කාරක සභාවේදීද අවධානයට යොමු වන බැවින් මේ සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමේ අරමුණින් මේ සම්බන්ධ කමිටුවක් පත්කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			තවද, මාතර මහ රෝහල විසින් එක් වෛද්‍ය නිලධාරියෙකුගෙන් අයකර ගත යුතු රු.8,916,181 ක බැඳුම්කර වටිනාකම අයකර ගැනීම සම්බන්ධයෙන් 2018 ජුනි 14 දිනෙන් පසුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.		
(ඇ)	2021 දෙසැම්බර් 24 දිනැති අංක 26/2021 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 ඡේදය	0.148	2023 වර්ෂය තුළදී රජයේ නිලධාරීන්ට ගෙවූ විශේෂ අත්තිකාරම් මුදල් එම වර්ෂය තුළදීම අයකර අවසන් කළයුතු වූවද නිලධාරීන් 112 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයවිය යුතු විශේෂ අත්තිකාරම් ශේෂය රු.148,450 ක් විය.	චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, සේවය අතහැර යාම, වැඩ තහනම් වීම, නොදන්වා විදේශගත වීම හා තාවකාලිකව වැටුප් නැවැත්වීම වැනි කරුණු මත අවසන් වාරික අයකර ගත නොහැකි වූ අතර මේ වන විට අයකර ඇති බව.
(ඇ)	1989 මාර්තු 23 දිනැති අංක 19/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03(3) ඡේදය	-	කාර්යාලීය කාර්ය මණ්ඩල සඳහා පෙ.ව. 8.30 ට කලින් අතිකාල වැඩ අනුමත කළ නොහැකි බව දක්වා ඇතත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාර්යාලීය නිලධාරීන් වෙනුවෙන් පෙ.ව. 08.30 ට කලින් අතිකාල වැඩ අනුමත කර ඒ වෙනුවෙන් ගෙවීම් කරන බව නිරීක්ෂණය විය.	චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු අතර ඊට අනුකූල නොවන පරිදි කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය.	සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී සියළු රාජකාරී කටයුතු ඉටුකර ගැනීමට නොහැකි බැවින් අතිකාල දීමනා මත සේවයේ යෙදවීම සිදුව ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2.7 අවධිමත් ගනුදෙනු

විගණන නිරීක්ෂණය		නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	කරාපිටිය ශික්ෂණ රෝහල් පරිශ්‍රය බදුකුලී හෝ ගාස්තු ගෙවීමෙන් තොරව බාහිර කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු හා ආයතනයක් විසින් අනවසරයෙන් වැඩබිම් හා කාර්යාල පවත්වාගෙන යන බවත් ඒ වෙනුවෙන් රෝහල් පරිශ්‍රයේ වර්ග මීටර් 1177 ක පමණ වූ භූමි ප්‍රමාණයන් භාවිතා කරන බවත් නිරීක්ෂණය විය. මෙසේ රෝහල් පරිශ්‍රයේ අනවසරයෙන් රැඳී සිටින බාහිර කොන්ත්‍රාත්කරුවන් හා ආයතන විසින් පාවිච්චි කරනු ලබන ජලය හා විදුලිය වෙනුවෙන් කිසිදු ගාස්තුවක් රජයට නොගෙවන බව නිරීක්ෂණය විය. ඒ අනුව ඔවුන් විසින් පාරිභෝජනය කරන ජලය හා විදුලිය වෙනුවෙන් වූ ගාස්තු රෝහල විසින් ගෙවන බවට නිරීක්ෂණය වූ අතර ඒ තුළින් රජයේ මුදල් සාවද්‍ය පරිහරණයට හා නිශ්කාර්ය වියදම් වීමට රෝහලේ වගකිව යුතු නිලධාරීන් විසින් ඉඩහැර තිබුණු බව නිරීක්ෂණය විය.	මේ සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, කොන්ත්‍රාත්කරුවන්ට රෝහල් පරිශ්‍රයෙන් ඉවත් වන ලෙස දැනටමත් දැනුම් දී ඇති බව, ඒ අනුව ඉදිරියේ දී කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් විදුලි ජල වියදමක් රෝහලට ඇති නොවන බව, කොන්ත්‍රාත්කරුවන් රෝහල තුළ වැඩ බිමිවල විදුලිය සහ ජලය භාවිතා කරමින් සිදු කරනු ලබනුයේ රෝහල් නඩත්තුවලට අදාළ කොන්ත්‍රාත් කාර්යයන් බව, ඒ සඳහා ඔවුන් ඉදිරිපත් කරන සෑම බිල්පතකින්ම පාරිභෝජනය කරන ජලය හා විදුලිය සඳහා බිල්පත් වටිනාකමින් සියයට 1 ක මුදලක් අයකර ගෙන ඇති බව.
(ආ)	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන මූල්‍ය පාලන බලතල පැවරීමේ චක්‍රලේඛය ප්‍රකාරව හා අංක 02-2/2023 දරන හා 2023 ජුනි 23 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව ආපනශාලා කුලී ආදායම් හා වෙනත් සේවා කුලී ආදායම් රාජ්‍ය ආදායමට බැර කළ යුතු වූවත්, කරාපිටිය ශික්ෂණ රෝහල විසින් ඊට අනුකූලව කටයුතු නොකළ එකතුව රු.2,560,806 ක් වූ රජයේ ආදායම් විගණිත දිනය වූ 2023 ජුනි 02 දින වන විටත් රාජ්‍ය ආදායමට බැර නොකර	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ආපනශාලා කුලී හා වෙනත් කුලී ආදායම් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරමින් පවතින බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வாளர் அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	සුභසාධන ගිණුම්වලට බැර කිරීමට හා සැපයුම්කරුවන්ගෙන් එකතු කර නොගැනීමට කටයුතු කර තිබුණු බව විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.		
(ඇ)	නිල වාහන සැපයීම වෙනුවෙන් මාසික ප්‍රවාහන දීමනා ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කර තිබුණු 2016 මාර්තු 09 දිනැති හා අංක 05/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 වගන්ති හා 2008 ජුනි 26 දිනැති හා අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 වන වගන්තියට අනුකූල නොවී කරාපිටිය ශික්ෂණ රෝහලේ නිල වාහන වෙනුවෙන් මාසික ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලබාගන්නා නිලධාරීන්ට 2022 වර්ෂයේදී හා 2023 වර්ෂයේ විගණිත දිනය දක්වා අවස්ථා 22 දී සංචිත වාහන භාවිතා කිරීම වෙනුවෙන් එකතුව රු. 252,626 ක්වූ ඉන්ධන වියදම් දරා තිබුණි. එසේම සංචිත වාහන භාවිතා කළ එක් අධිකරණ විශේෂඥවරයෙකු කරාපිටිය වෛද්‍ය පීඨයට අනුයුක්ත නිලධාරියෙක් බව ද වැඩිදුරටත් නිරීක්ෂණය විය.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලබා ගන්නා අධිකරණ වෛද්‍ය විශේෂඥ නිලධාරීන්ගේ සංචිත වාහන භාවිතා කිරීම හේතුවෙන් රු.252,626 ක මුදල අයකර ගැනීමට කටයුතු කරන ලෙස හඳුනාගෙන ඇති බව, මේ සම්බන්ධව මෙම රෝහලේ විශේෂඥ වෛද්‍යවරයා ලිඛිතව දැනුවත් කර ඇති බව, එක් අධිකරණ විශේෂඥ වෛද්‍යවරයකු රුහුණු විශ්ව විද්‍යාලයේ සේවය කරන බැවින්, රුහුණු විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත අයකර එවන ලෙස දන්වා ඇති බව, එසේ වුවත් මෙතෙක් අයකර ගැනීමට නොහැකි වී ඇති බව, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 30.04.2002 හා සබැඳි චක්‍රලේඛන අංක **DDG(MS)** 46/2002 හි 12 ඡේදය ප්‍රකාරව අධිකරණ වෛද්‍ය කටයුතු වෙනුවෙන් විද්‍යාත්මක අපරාධමය කරුණු අධ්‍යයනය සඳහා කරුණු එක්රැස් කිරීමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් රෝහල විසින් සැපයීම සිදු කරනු ලැබිය යුතු බව සඳහන් කර ඇති බව, ඒ අනුව අයකිරීම ගැටළු සහගත බව.
(ඈ)	නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සම්බන්ධයෙන් නිකුත් කර තිබුණු අංක 13/2008(vi) දරන හා 2021 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූල නොවී කරාපිටිය ශික්ෂණ රෝහල විසින් 2022 වර්ෂයේදී නිල වාහන හිමිකම් ඇති අධිකරණ වෛද්‍ය විශේෂඥ නිලධාරීන් දෙදෙනෙකු (02) වෙත ලංකා ඔටෝ ඩීසල් මිල වෙනුවට	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ලංකා ඔටෝ ඩීසල් මිල වෙනුවට සුපර් ඩීසල් මිල පදනම්ව ඉන්ධන දීමනාව ගණනය කිරීම හේතුවෙන් වැඩිපුර ගෙවා ඇති රු.127,380 ක මුදල අදාළ විශේෂඥ වෛද්‍යවරුන්ගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරන බව.

	ලංකා සුපර් ඩීසල් මිල මත පදනම්ව ඉන්ධන දීමනා ගණනය කර ගෙවීම හේතුවෙන් එකතුව රු. 127,380 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඒ අනුව චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකූල නොවී වැඩිපුර ගෙවූ මුදල් කඩිනමින් අයකරගෙන රාජ්‍ය ආදායමට බැර කළ යුතු බවට වැඩි දුරටත් නිරීක්ෂණය විය.		
(ඉ)	මහනුවර ජාතික රෝහලේ හදිසි අනතුරු ඒකකයේ විශේෂඥ වෛද්‍යවරයෙකු 2022 අගෝස්තු 06 දින සිට 2022 දෙසැම්බර් 6 දින දක්වා කාලය තුළ දින පොත යාවත්කාලීන කර නොතිබුණු අතර, 2022 අගෝස්තු 06 දිනෙන් පසු නිවාඩු ලේඛනයේද කිසිදු සටහනක් නොතිබුණි. රෝහල මගින් නඩත්තු කරනු ලබන විදේශ නිවාඩු ලබාගෙන රටින් බැහැරවීමේදී සටහන් කළයුතු ලේඛනයේද සටහන් කර නොතිබුණි. ඒ අනුව සත්‍ය වශයෙන්ම මෙම වෛද්‍යවරයා එම කාලය තුළ රාජකාරියේ නිරත වූයේද නැද්ද යන්න තහවුරු කරගැනීමකින් තොරව අගෝස්තු සහ සැප්තැම්බර් මාස සඳහා වැටුප් ගෙවා තිබුණු අතර වැඩිපුර ගෙවන ලද වැටුප් රු.161,209 ක් තවදුරටත් අයකරගත යුතුව පැවතුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම නිලධාරියාගෙන් තවදුරටත් අය කර ගැනීමට ඇති මුදල වන රු.161,209 ක මුදල මහනුවර ජාතික රෝහලේ සරප් අංශය වෙත ගෙවා රිසිට්පත ඉදිරිපත් කරන ලෙස දන්වා යවා ඇති අතර ඔහුට විද්‍යුත් තැපැල් මගින්ද දැනුවත් කර ඇති බව, නමුත් මේ වන තෙක් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැති බැවින් මෙම අය කිරීම් සිදු කර ගැනීමට අවශ්‍ය නීති පියවර ගැනීමට කටයුතු කරන බව.
(ඊ)	මහනුවර ජාතික රෝහලේ වෛද්‍ය නිලධාරීන්ගේ නේවාසිකාගාර බිම් මහලේ එම නිලධාරීන්ගේ දරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් හා පෙර පාසලක් පවත්වාගෙන යාමට පෞද්ගලික ආයතනයකට ඉඩකඩ ලබා දී තිබුණි. මේ සඳහා 2021 ඔක්තෝබර් 12 දිනැති අංක KD/RG/3954 දරන තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාව මගින් රු.78,500 ක මාසික කුලියක් තක්සේරු කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ පෞද්ගලික ආයතනයෙන් මාසික කුලී අය කර නොතිබුණි. මේ	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ලිපි මගින් සභාපති, වෛද්‍ය නිලධාරී සුභ සාධක සංගමය, ජාතික රෝහල, මහනුවර වෙත ගොඩනැගිල්ලේ මාසික තක්සේරු කුලිය රු.78,500 ක් ගෙවන ලෙස ලිඛිතව දන්වා ඇති බව, **GMOA** මැදිහත් වීමෙන් සෞඛ්‍ය ලේකම් සමඟ සාකච්ඡා කර තීරණයක් ගන්නා බව වෛද්‍ය නිලධාරීන්ගේ සුභසාධක සංගමය විසින් දන්වා ඇති බව, එතෙක් අතුරු පියවරක් වශයෙන් මාසිකව රු. 25,000 බැගින් ගෙවීමට එකඟව මාස 04 ක් සඳහා රු.100,000 ක්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	හේතුවෙන් 2021 නොවැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා වූ මාස 26 ක කාලය සඳහා පමණක් රජයට රු.2,041,000 ක ආදායමක් අහිමි වී තිබුණි.		රෝහලේ සරප් අංශයට ගෙවීම් කර ඇති බව, ඉන් පසු කිසිදු ගෙවීමක් සිදු කර නොමැති බැවන් වෛද්‍ය නිලධාරී සංගමයේ සභාපති වෙත අදාළ ගොඩනැගිලි හිඟ මුදල සහ මාසික කුලී මුදල ගෙවන ලෙස දන්වා ඇති බව.
(උ)	පේරාදෙණිය ශික්ෂණ රෝහලේ වෛද්‍ය නිලධාරීන්ගේ නේවාසිකාගාරයේ බිම් මහලේ එම නිලධාරීන්ගේ දරුවන් සඳහා වර්ග අඩි 2475 ක භූමි ප්‍රමාණයක පෙර පාසලක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට පෞද්ගලික ආයතනයකට ඉඩකඩ ලබා දී තිබුණි. මෙය 2007 වර්ෂයේ සිට පවත්වාගෙන යන නමුත්, ඒ සඳහා නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. 2022 පෙබරවාරි 10 දිනැති අංක KD/RG/3969 දරන තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාව අනුව රු.50,000 ක මාසික කුලියක් තක්සේරු කර තිබුණද, මෙය ආරම්භ කළ 2007 වර්ෂයේ සිට 2023 ජනවාරි 31 දින දක්වා කුලී මුදලක් අයකරගෙන නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම රෝහලේ වෛද්‍ය නිලධාරී නේවාසිකාගාර බිම්මහලේ එම නිලධාරීන්ගේ දරුවන් සඳහා පවත්වාගෙන යනු ලබන පෙර පාසල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා 2022 පෙබරවාරි 10 දිනැති තක්සේරු වාර්තාවට අනුව රු.50,000 ක මාසික කුලියක් තක්සේරු කර තිබුනද අංක **MH/DEV/WF/**01/2023 හා 2023.05.31 දිනැති ලිපියෙන් තක්සේරු කළ මුදලින් සියයට 50 ක්වන රු.25,000 ක් මාසිකව අයකර ගන්නා ලෙසට දන්වා එවා ඇති බව, ඒ අනුව 2023 ජනවාරි මස සිට මාසිකව රු.25,000 බැගින් වූ මාසික කුලියක් අයකර 2002-01-01 ආදායම් ශීර්ෂය වෙත මාසික ගිණුම් ශාරාංශ මගින් බැර කරනු ලබන බව.
(ඌ)	මහනුවර ජාතික රෝහල විසින් ලංසු කැඳවීම සඳහා රෝහල විසින් ඉදිරිපත් කරනු ලබන අවශ්‍යතා ලේඛනය අනුව 2022/2023 වර්ෂය සඳහා මාසික අවශ්‍යතාවය එළවළු,පළතුරු, කුකුල් මස්, සහල් සහ ධාන්‍ය වර්ග පිළිවෙලින් මාසිකව කිලෝග්‍රෑම් 26322, 15906, 1284, 38520 සහ 1284 ඇස්තමේන්තු කර තිබුණද සත්‍ය වශයෙන්ම මාස 10 ක ඇණවුම්වල සාමාන්‍ය පරීක්ෂා කිරීමේදී ඇණවුම් කර තිබුණේ මාසිකව පිළිවෙලින් කිලෝග්‍රෑම් 5213, 1661, 70.5, 10725 සහ 303 කි. ඒ අනුව රෝහල විසින් ආහාර	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මහනුවර ජාතික රෝහලට අමු ආහාර සැපයීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සිදු වන මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා තාර්කික ක්‍රමවේදයක් යටතේ මේ සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ඇති කමිටුවක් මගින් වර්තමාන රෝගී සත්කාර සේවාවට අදාළව විශ්ලේෂණාත්මක ඇගයීමක් කොට පරිභෝජනයට ගැලපෙන පරිදි අමු ආහාර ඇස්තමේන්තුව සමාලෝචනය කිරීමට කමිටුවක් පත් කර එම වාර්තාවේ නිර්දේශ ඉදිරි වර්ෂයේ අමු ආහාර ලංසු කැඳවීමේදී සලකා

ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வுத் திணைக்களம்
NATIONAL AUDIT OFFICE

	ඇණවුම් කිරීමේදී ආහාර, පළතුරු හා අනෙකුත් ද්‍රව්‍ය වලින් අයිතම කිහිපයක් ඇණවුම් නොකිරීම හා තවත් අයිතම කිහිපයක මාසික අවශ්‍යතාවයෙන් ඉතාමත් සුළු ප්‍රමාණයක් එනම් සියයට 5 ත් සියයට 28 ත් අතර ඇණවුම් කර තිබුණි. ඒ අනුව කිසිදු තාර්කික ක්‍රමවේදයකින් තොරව මාසික ද්‍රව්‍ය අවශ්‍යතාවය ඇස්තමේන්තු කර තිබුණි.		බැලීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.
(එ)	මාතර මහ රෝහලේ විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍යවරුන් දෙදෙනෙකු සේවයේ නිරත වූ අතර, විගණන දින වූ 2023 නොවැම්බර් 30 දින වන විට පොරොත්තු ලේඛනගත රෝගීන් සංඛ්‍යාව 227 කි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
	i. මාතර මහ රෝහලෙහි ශල්‍යාගාර A හි විකලාංග ශල්‍ය A නාම ලේඛනය අනුව 2023 නොවැම්බර් 21 දින සිදුකර තිබුණු TKR (Total Knee Replacement) ශල්‍යකර්මය සඳහා රෝහලේ ශල්‍ය ගබඩාවේ තිබුණු TKR Implant භාවිතා කර තිබුණද, රෝගියාගේ පෞද්ගලික මුදල් වැයකර මිලදීගෙන රෝහලට සපයන TKR Implant රෝගියාගේ ශල්‍යකර්මයට භාවිතා කරන බව දන්වමින් රු.550,000 ක් පෞද්ගලික සැපයුම්කරුවෙකු වෙත ගෙවීම වෙනුවෙන් අදාළ විශේෂඥ වෛද්‍යවරයාගේ හා රෝහල් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව අදාළ TKR Implant රෝහල් ගබඩාවේ පැවතියදී පෞද්ගලික සැපයුම්කරුවෙකු වෙත රු.550,000 ක් ගෙවීමට රෝගියා පෙළඹවීම තුළින් අවිධිමත් ගනුදෙනුවක් නිර්මාණය වී ඇති බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.	-එම-	රෝගියෙකු තම කැමැත්තෙන් තම ශල්‍යකර්මය සඳහා හෝ අන් රෝගීන්ගේ භාවිතය සඳහා හෝ යම් පරිත්‍යාගයක් හෝ අඩුපාඩුව පවතින ද්‍රව්‍යයක් සැපයීම කරන්නේ නම් එය විධිමත් පරිදි එය එම රෝගියාගේම රෝගී තත්ත්වයට ප්‍රතිකාර කිරීමට යොදාගැනීම හෝ පොදු භාවිතයට නිකුත් කරනු ලබන බව, **TKR Implant** වෛද්‍ය සැපයුම් අංශය මගින් රෝහලට ලබා දිය යුතු අතර පවතින යම් යම් තත්ත්වයන් මත ඒවා හිඟවන අවස්ථාවන්හිදී සමහර රෝගීන් තම වියදමෙන් එම උපකරණ මිලදීගෙන තම ශල්‍යකර්මය උදෙසා සපයන අතර එය සෘජුවම නැවත සවිකරනු ලබන නමුත් එයද යම් අයුරකින් පරිත්‍යාගයක් වන බැවින් එය අදාළ ශල්‍යකර්මයට සිදුකරන අංශය විසින් ලේඛනගත කර ඉදිරි කටයුතු කරන ලබන බව, එහෙත් රෝහල සතුව යම් උපාංගයක් ඒ අවස්ථාවේ තිබෙනම් එම උපාංගය යොදා ගනිමින්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			ශල්‍යකර්මය සිදු කිරීම අත්‍යාවශ්‍ය කරුණක් බැවින් ඒ අනුව කටයුතු කරනු ලබන බව.
	ii. කෙසේ වුවද, විගණන පරීක්ෂාවෙන් දින දෙකකට පසු එනම් ශල්‍යකර්මයෙන් දින 02 කට පසුව සැපයුම්කරු විසින් TKR Implant වෙනුවට රු. 566,000 ක් වටිනා වෙනත් විකාලංග ශල්‍ය ද්‍රව්‍ය අයිතම 22 ක් සැපයීමේ ඉන්වොයිසයක් රෝගියා වෙත නිකුත් කර තිබුණු අතර, එය පදනම් කර ගනිමින් එකතුව රු.216,000 ක් වටිනා TKR Implant නොවන වෙනත් විකලාංග ශල්‍ය ද්‍රව්‍ය ඒකක 12 ක් විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් භාරගෙන ගබඩාවෙහි තැන්පත් කර තිබුණු බවත් නිරීක්ෂණය වූයෙන් පෞද්ගලික සැපයුම්කරුවෙකු විසින් රෝගියෙකු නමට නිකුත් කරන ලද ඉන්වොයියක් මත පදනම්ව ශල්‍ය ද්‍රව්‍ය විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍යවරයා විසින් රෝහලට භාර ගැනීමට බලපෑ සාධාරණ හේතු විගණනයේදී නිරීක්ෂණය නොවූ අතර එය රෝහලේ ක්‍රියාත්මක ස්වස්ත පාලන පද්ධතියට හා අභ්‍යන්තර පාලන පද්ධතියට අනුකූල නොවන තත්ත්වයක් බවට වැඩිදුරටත් නිරීක්ෂණය විය.	-එම-	වෙනත් විකලාංග ශල්‍ය ද්‍රව්‍ය අදාළ ආයතනය විසින් සැපයූ බව සඳහන් කර තිබුණද රෝහලේ පවතින වාර්තා අනුව මෙම රෝහල වෙත ලැබී නොමැති බව විකලාංග විශේෂඥ වෛද්‍යවරයාගේ ප්‍රකාශයෙන්, ප්‍රධාන ඖෂධවේදීගේ හා ශල්‍යාගාර **A** භාර හෙද සොයුරියගේ ප්‍රකාශයන් මගින් අනාවරණය වූ බව.
	iii. රෝහලට ලැබෙන ආධාර හා පරිත්‍යාග රෝහල් අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය මත හා ඖෂධ හා ශල්‍ය උපකරණ ගබඩා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ලේඛනගත කිරීමෙන් පසු විධිමත් පරිදි භාරගත යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු නොකර රෝගියෙකුගේ නමින් නිකුත් කර තිබුණු ඉන්වොයිසියක් මත පදනම්ව	-එම-	ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා දේශීය මෙන්ම විදේශීයවද පරිත්‍යාග, ආධාර, උපකාර නිරන්තරයෙන් ලැබීම සාමාන්‍ය තත්ත්වයක් බවට පත්වී ඇති අතර වර්තමානයේ පවතින ආර්ථික අර්බුදයත් සමඟ සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යාමට මහත් පිටුවහලක් වූ බව, ශල්‍යාගාරයේ සැත්කම් සිදුකිරීම

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	සැපයුම්කරු වෙතින් රෝහලට සැපයූ විකලාංග ශල්‍ය ද්‍රව්‍ය 12 ක් විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍යවරයා විසින් භාර ගැනීම රෝහල් අභ්‍යන්තර පාලන පද්ධතියට අනුකූල නොවන තත්ත්වයක් බවට විගණනයේ දී නිරීක්ෂණය විය.		රෝගියාගේ රෝගී තත්ත්වය මත වෙනස්වන අතර පොරොත්තු ලේඛනය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නේ එක් එක් රෝගියාගේ රෝගී තත්ත්වය මත අදාළ විශේෂඥ වෛද්‍යවරයා වන බැවින් ඒ සම්බන්ධ කටයුතු රෝහලේ පොදු පරිපාලනයෙන් බැහැර බව, තවද පොරොත්තු ලේඛනයේ සිටින ඕනෑම රෝගියෙකු සඳහා රෝහල තුළ ශල්‍යද්‍රව්‍ය පවතින අවස්ථාවක එම ශල්‍ය ද්‍රව්‍ය යොදාගෙන ආදාළ ශල්‍යකර්මය සිදුකිරීම රෝහලේ වගකීමක් බව, ඔබ විසින් සඳහන් කර ඇති ආදාළ ආයතනය විසින් සපයා ඇති බවට සඳහන් විකලාංග ශල්‍ය ද්‍රව්‍ය රෝහලේ ශල්‍ය ගබඩාව වෙත ලැබී නොමැති බව ප්‍රධාන ශල්‍ය ඖෂධවේදී විසින් සඳහන් කර ඇති බව.
	iv. විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍යවරුන් විසින් සෑම විටම තමන් යටතේ ප්‍රතිකාර ලබන රෝගීන් පරීක්ෂා කිරීම සඳහා රෝහල් වාට්ටු දිනපතා අධීක්ෂණය කරන බවත් උපදෙස් ලබා දෙන බවත් වෛද්‍යවරුන්ගේ දිනපොත් පරීක්ෂා කිරීමෙදී නිරීක්ෂණය වූවද, රෝහලේ වාට්ටු අංක 19 හා 21 හාරව සිටින විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍යවරයා විසින් ඊට අනුකූලව කටයුතු නොකරන බව අදාළ රෝගීන් හා වාට්ටු කාර්ය මණ්ඩලය සමඟ සිදුකළ සාකච්ඡාවලදී අනාවරණය විය. මෙම තත්ත්වයන් හේතුවෙන් විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍යවරයා පරීක්ෂා කිරීමට පැමිණෙන තෙක් රෝගීන්ට නියමිත දින ගණනට වඩා වැඩි දින ගණනක් රෝහල්ගතව සිටීමට සිදු වී ඇති බව අදාළ වාට්ටුව පිළිබඳ භෞතික පරීක්ෂාවේදි නිරීක්ෂණය වූ අතර ඒ	-එම-	විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස ඔහුට ශල්‍ය වාට්ටු, රෝහලේ දෛනික හදිසි අනතුරු වාට්ටු, ළමා හදිසි අනතුරු දිනයන් නිරීක්ෂණය, ඊට පසු දිනයන්හි විකලාංග රෝගීන් පරීක්ෂාව, අහඹරුවාදා, සිකුරාදා සහ සති දෙකකට වරක් බදාදා සහ සෙනසුරාදා දිනයන් හි ශල්‍යකර්මවලට සහභාගී වීම, රෝහලේ හදිසි අනතුරු වාට්ටුව, දැඩිසත්කාර ඒකක මගින් සහ වෙනත් වාට්ටු වලින් ලැබෙන රෝගීන්ගේ **referral** පරීක්ෂාවට සහභාගී වීම, රෝහලේ වෛද්‍ය මණ්ඩලයට සහභාගී වීම සහ වෙනත් රැස්වීම් වලට සහභාගී වීම, රෝගීන් සඳහා වන විවිධාංගික සාකච්ඡා (**MDT**), රෝගීන්ගේ **CT** හා **MRI** පිළිබඳ විශේෂඥ වෛද්‍ය හමු, ක්ෂුද්‍ර ජීවී විශේෂඥ හමු සහ ව්‍යාධවේදී විශේෂඥ වෛද්‍ය හමුවලට සහභාගී වීමට සිදුවන බව, විකලාංග ශල්‍ය වාට්ටුවක දිනපතා පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ ශල්‍ය වෛද්‍යවරයෙකු සිටින බවත්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	තුළින් රෝගීන් මහත් පීඩාවන්ට ලක්වී ඇති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.		රෝගියාගේ ශල්‍යකර්මයෙන් පසුව රෝගියාගේ තත්ත්වය සාමාන්‍ය පරිදි සිදුවන විට වරක් හෝ දෙවරක් විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයා විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ශල්‍ය කර්මය ආශ්‍රිත සංකූලතා නොමැති නම් රෝගියා වාට්ටුවෙන් පිටකිරීම සාමාන්‍ය පරිදි සිදුවන බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව පහතින් දැක්වෙන නිරීක්ෂණවලට අනුව තහවුරු විය.			
(අ)	2023 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් පුනරාවර්තන වැය විෂයයන් 2 ක් සඳහා සලසා ගෙන තිබුණු රු. මිලියන 2.5 ක් වූ මුළු ප්‍රතිපාදනයම, මුදල් රෙගුලාසි 66 හා 69 මගින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.	මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, 2023 වර්ෂය සඳහා අත්‍යවශ්‍ය වැය විෂයන් සඳහා කෙටුම්පත් කරන ලද මුළු ඇස්තමේන්තුව මහා භාණ්ඩාගාරය විසින් ලබා නොදීම නිසා අදාළ වියදම් දැරීමට වෙන්වූ ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවූ බව, එමෙන්ම 2023 වර්ෂය තුළ පැවති ආර්ථික අස්ථාවරභාවය හේතුවෙන් 2023.01.27 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2023 හි 02 ඡේදයට අනුව රාජ්‍ය වියදම් කළමනාකරණය

			මැයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් පරිදි ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීමට දැඩිව උපදෙස් ලැබුණු අතර, ඒ අනුව එම චක්‍රලේඛ පදනම් කර ගෙන වියදම් කළමනාකරණය මැයෙන් 2023.02.13 දින අභ්‍යන්තර චක්‍රලේඛයන්ද නිකුත් කරන ලද බව, මේ අනුව කල් දැමිය හැකි කාර්යයන් කල් දැමීම හා අත්‍යවශ්‍යම කාර්යයන් ඉටු කිරීම සඳහා ඉතිරි වූ වැය විෂයයන් මගින් මාරු කිරීම් කර සෞඛ්‍ය සේවාව බාධාවකින් තොරව පවත්වා ගෙන යන ලද බව.
(ආ)	2023 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් පුනරාවර්තන වැය විෂයයන් 4ක් හා මූලධන වැය විෂයයක් සඳහා සලසා ගෙන තිබුණු රු. මිලියන 200 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන්, සියයට 67ත් සියයට 97 ත් අතර ප්‍රතිශතයකින් මුදල් රෙගුලාසි 66 හා 69 මගින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.	-එම-	-එම-
(ඇ)	2023 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් පුනරාවර්තන වැය විෂයයන් 6ක් හා මූලධන වැය විෂයයන් 9ක් සඳහා සලසා ගෙන තිබුණු පිළිවෙලින් රු. මිලියන 27,641 ක් හා රු. මිලියන 2,458 ක් වශයෙන් එකතුව රු. මිලියන 30,099 ක් වූ ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තු මගින් හා මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් මගින් පිළිවෙලින් රු. මිලියන 52,974.78 කින් හා රු. මිලියන 2,626.64 කින් ලෙස සියයට 100 සිට සියයට 750 දක්වා ප්‍රතිශතයන්ගෙන් වැඩි කර ගෙන තිබුණි.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඈ)	පුනරාවර්තන වැය විෂයයන් 5 ක් හා මූලධන වැය විෂයයන් 24 ක් ඇතුළුව වැය විෂයයන් 29 ක් සඳහා සලසා ගෙන තිබුණු එකතුව රු. මිලියන 13,411 ක මූලික ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.	-එම-	-එම-
(ඉ)	මූලධන වැය විෂයයන් 51 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 14 ක් සඳහා සලසාගෙන තිබුණු රු. මිලියන 34,439.10 ක්වූ මූලික ප්‍රතිපාදනයෙන් රු. මිලියන 7,178.67ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසුව ඉතිරි වූ රු. මිලියන 27,260.42 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 21,041.81 ක ප්‍රතිපාදන උපයෝජනයට ගෙන නොතිබුණි. එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 99 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණි.	-එම-	-එම-
(ඊ)	පුනරාවර්තන වැය විෂයයන් හා මූලධන වැය විෂයයන් 4 ක් බැහින් වැය විෂයයන් 8 ක් සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් සලසා ගෙන තිබුණු රු. මිලියන 749.25 ක් වූ අතිරේක ප්‍රතිපාදනයන්ගෙන් රු. මිලියන 642.02 ක් ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිවීම් වල ප්‍රතිශතය අතිරේක ප්‍රතිපාදනයෙන් සියයට 49 ත් සියයට 114 ත් අතර පරාසයක පැවතුණි.	-එම-	-එම-
(උ)	පුනරාවර්තන වැය විෂයයන් 2 ක් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් සලසා ගෙන තිබුණු රු. මිලියන 79 ක් වූ අතිරේක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම හා මූලික ඇස්තමේන්තුවෙන්ද යම් කොටසක් ඉතිරි වී තිබුණි.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வுச் சுவுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වැය ශීර්ෂ අංක 111 යටතේ විගණනයට ඉදිරිපත් කර තිබුණු මුල්‍ය ප්‍රකාශනවල සටහන **(iii)** ආකෘතිය (භාණ්ඩාගාරය විසින් ඉදිරිපත් කරන ලද සමුච්චිත බැදීම් හා බැරකම් වාර්තාව -**SA** 92) ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනට තිබුණු බැදීම් ශේෂය පිළිවෙලින් රු.5,519,647,987 ක් වූ අතර බැරකම් ශේෂය රු.607,956,560 ක් විය. ඒ සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.			
(අ)	මුදල් රෙගුලාසි 94 **(i)** ප්‍රකාරව, වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක්, සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු අතර දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා සලසන ලද ප්‍රතිපාදන මුදල් නොඉක්ම විය යුතුය. නමුත් අමාත්‍යාංශයට අයත් ආයතන විසින් මෙහෙයුම් වැඩසටහන යටතේ වැය විෂයයන් 17 කට ලබා දී තිබුණු ප්‍රතිපාදනයන්හි ඉතිරිය ඉක්මවා රු. මිලියන 1,395.07 ක් හා සංවර්ධන වැඩසටහන යටතේ වැය විෂයයන් 5 කට ලබා දී තිබුණු ප්‍රතිපාදනයන්හි ඉතිරිය ඉක්මවා රු. මිලියන 81.71ක් ලෙස එකතුව රු. මිලියන 1,476.78 ක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹ තිබුණි.	මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	එකඟ වන බව, අදාළ වර්ෂය සඳහා කෙටුම්පත් ඇස්තමේන්තු සකස් කිරීමේදී රෝහල් සහ සියළුම ආයතනයන්හි බැරකම්ද ගෙන්වා ගනු ලබන අතර, එම බැරකම්ද සැලකිල්ලට ගෙන වියදම් ඇස්තමේන්තු සකස් කරනු ලබන බව, නමුත් මහා භාණ්ඩාගාරය විසින් කෙටුම්පත් ඇස්තමේන්තුව සඳහා ඉල්ලුම් කරන ලද මුළු ප්‍රතිපාදනයම ලබා නොදෙන අතර පසුගිය වර්ෂයේ සත්‍ය වියදම පදනම් කර ගෙන ප්‍රතිපාදන ලබා දෙනු ලබන බව, තවද රෝහල් හා සෞඛ්‍ය ආයතන විසින් පොදු මහජනතාව වෙනුවෙන් සෞඛ්‍ය සේවාවන් අඛණ්ඩව සැපයීම් වෙනුවෙන් අනිවාර්යයෙන්ම ඉටුකරගත යුතු සේවාවන් හා සැපයීම් සිදුකර

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			ගැනීමට සිදුවන බව, මෙහිදී පවතින ප්‍රතිපාදන මතම රැඳී සිට කටයුතු කිරීමට ප්‍රායෝගිකව අපහසු වන බව, කෙසේ වෙතත් මින් ඉදිරියට ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් හා බැරකම් ඇති කර නොගන්නා ලෙසට අදාළ බලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව.
(ආ)	වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් හෝ අළුතින් ඇතිකරන ලද වැය විෂයයන් හෝ නොවන, මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන යටතේ වැය විෂයයන් 15 ක් වෙනුවෙන් රු.මිලියන 79. 18ක් වූ බැරකම්වලට එළඹ තිබුණි.	බැඳීම් හා බැරකම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.	එකඟ වන බව, සෞඛ්‍ය අමාත්‍යාංශය සතු රෝහල් හා ආයතන තුලින් විශාල බැරකම් ප්‍රමාණයක් ඇතුළත් කිරීමේදී සිදු වූ අතපසු වීමකින් වැය විෂයන් කිහිපයක් වැරදි ලෙස සටහන් කර ඇති බව, නැවත මෙවැනි අතපසුවීම් සිදු නොවීමට අදාළ වගකිවයුතු නිලධාරීන් දැනුවත් කර ඇති බව.
(ඇ)	වෛද්‍ය සැපයීම් අංශයට අදාළව එම අංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2024 පෙබරවාරි 28 දින සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉදිරිපත් කරන ලද බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව බැරකම් ශේෂය රු.මිලියන 79,784.95 ක් වූවද, අමාත්‍යාංශ මුල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. මිලියන 1,274.91 ක් වූයෙන් රු.මිලියන 78,510.04 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශවල අඩුවෙන් දක්වා තිබුණි.	-එම-	එකඟ වන බව, මගේ අංක FBL/මූල්‍ය ප්‍රකාශන/2022 සහ 2024.04.29 දිනැති ලිපිය මගින් මේ පිළිබඳව වෛද්‍ය සැපයීම් අංශයෙන් විමසා ඇති අතර ඒ සඳහා පිළිතුරු ලද වහාම ඔබ වෙත ඉදිරිපත් කරන බව, කෙසේ වෙතත් පවතින ප්‍රතිපාදනයන්ට යටත්ව බැඳීම් ඇතිකර ගන්නා ලෙසට සියළු ආයතන දැනුවත් කර ඇති බව.
(ඈ)	මහනුවර ජාතික රෝහලට ජල පහසුකම් ලබාදෙනු ලබන මහනුවර මහනගර සභාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළව නිකුත් කළ ජල බිල්පත්හි සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 27,883,003 ක හිඟ ශේෂයක් පැවතියද එම හිඟ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල බැරකම්	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, රෝහලට ජල පහසුකම් සපයා දීම වෙනුවෙන් මහනුවර නගර සභාව වෙත 2023.12.31 දිනට ගෙවිය යුතු ජල බිල්පත් වලට අදාළව බැඳීම් හා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ලෙස වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. තවද එම හිඟ ශේෂයෙන් පසුගිය වර්ෂයන්ට අදාළ රු.10,610,220 ක මුදල නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබුණි.		බැරකම් වටිනාකම් වශයෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල බැරකම් පිළිබඳ ප්‍රකාශනය (1) හි මහනුවර මහ නගර සභාව නමින් වැය ශීර්ෂය 111-1-5-0-1403(11) විදුලිය හා ජලය යටතේ රු.23,460,515 ක් ලෙස වාර්තා කර ඇති බව, තවද, බැරකම් ආකෘතියේ බැඳීම් පිළිබඳ විස්තර තීරුවේ වැරදීමකින් වරිපනම් බදු ගෙවීම යනුවෙන් මුද්‍රණය වී ඇති අතර එය ජල බිල්පත් ගෙවීම යනුවෙන් නිවැරදි විය යුතු බව.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ වෛද්‍ය සැපයීම් අංශයේ බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව යන ආයතන දෙකට ගෙවිය යුතු මුදල් හා එම ආයතන දෙකෙහි මූල්‍ය ප්‍රකාශන අනුව වෛද්‍ය සැපයීම් අංශයෙන් අයවීමට ඇති මුදල් අතර රු. මිලියන 26,685.72 ක වෙනසක් පැවතුණි.	මෙම ශේෂයන් සැසඳීම් කර ආයතන අතර එකඟතාවයකට පැමිණිය යුතුය.	රු. මිලියන 67,908.15ක වටිනාකමක් (SPC සහ SPMC) ප්‍රමාද දෝෂයක් හේතුවෙන් බැරකම් ලෙස සටහන් වී ඇති අතර එය SPC සහ SPMC යන ආයතන වලට අදාළ වැය විෂයන් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ගෙවන ලද අක්මුදල් වලට අනුව පියවීමට පැවති වටිනාකම බව, 2023 වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ලද අක්මුදල් සෘජුවම වැය විෂයන්ට ගිණුම් ගත කර ඇති අතර එයට එරෙහිව නොපියවා තබා ගත් වවුචර්වල වටිනාකම මෙලෙස ඉදිරිපත් කර ඇති බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

විගණන නිරීක්ෂණය		නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව, කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් ලබා දීමට ගණන්දීමේ නිලධාරියාට හැකි වුවත්, 2023 අගෝස්තු 21 දින මාණ්ඩලික නිලධාරියෙකු වෙත රු.100,000 ක් අත්තිකාරමක් නිකුත්කර රු.124,800 ක වියදම් දැරීම හේතුවෙන් රු.24,800 ක් නැවත ප්‍රතිපූර්ණය කර තිබුණි.	මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	එකඟ වන බව, මාණ්ඩලික තත්ත්වයේ නිලධාරියෙකු වෙත රු.100,000 ක අත්තිකාරමක් නිකුත් කළද, අනුමත ඇස්තමේන්තු මුදල ඉක්මවා යම් අනපේක්ෂිත වියදම් දැරීම හේතුවෙන් එසේ දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා විධිමත් අනුමැතීන් සහිතව ඉදිරිපත් වන අවස්ථා බොහෝ කලාතුරකින් අනපේක්ෂිත ලෙස සිදුවන බව.
(ආ)	උක්ත චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව, කාර්යය නිම කර දින 10 ක් ඇතුළත ලබා ගත් තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වූවද, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 67 කදී ලබා දී තිබුණු එකතුව රු.මිලියන 3.12 ක් වූ තත්ත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමවී මාස 01 ත් මාස 02 ත් දක්වා අතර කාල පරාසයක් ප්‍රමාද වී පියවා තිබුණි.	තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවූ වහාම පියවිය යුතුය.	විවිධ අංශ වලින් විවිධ වැඩසටහන් සඳහා ලබාගන්නා ලද තත්ත්කාර්ය අතුරු අග්‍රිම හා ඉන්ධන අත්තිකාරම් අදාළ කාර්යය නිම වූ වහාම හෝ කාර්යය නිමකර දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතු වූවත්, ඒ ඒ අංශ වෙත පවතින මානව සම්පත් හිඟතාවය, අඛණ්ඩ ලෙස වැඩසටහන් පවත්වා ගෙන යාම, කොළඹින් දුර බැහැර ප්‍රදේශවල වැඩසටහන් මාලාවක් ලෙස වැඩසටහන් පවත්වා ගෙන යාම, මාණ්ඩලික නිලධාරීන් කාර්යාලයෙන් බැහැර රාජකාරී සඳහා සහභාගී වීම වැනි කාරණා හේතුවෙන් ප්‍රමාදයන් සිදුවන බව ඒ ඒ අංශ විසින් සඳහන් කර ඇති බව, අත්තිකාරම් නිසි කලට පියවීම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			පිළිබඳව වාචිකව හා ලිඛිතව දැනුවත් කිරීම් සිදුකරනු ලබන බව, කෙසේ නමුත් මෙම ගැටළුව විසඳා ගැනීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන විධි ක්‍රම තවදුරටත් විධිමත් කිරීමට කටයුතු යොදමින් පවතින බව.
(ඇ)	2023 වර්ෂයේ විවිධ වැඩසටහන් වෙනුවෙන් නිලධාරීන් හට ලබා දුන් ඉන්ධන අත්තිකාරම් කාර්යය අවසන් වූ වහාම පියවීම සිදු කළ යුතු වූවද සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 24 කට අදාළව රු.630,477 ක මුදලක් පියවා තිබුණේ මාස 01 ත් මාස 02 ත් අතර කාල ප්‍රමාදයකින් පසුවය.	-එම-	-එම-
(ඈ)	සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 19 කදී ලබාගෙන තිබුණු රු.542,235 ක තත්ත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය සඳහා යොදා නොගෙන දින 01 සිට දින 22 දක්වා කාලයක් අත රඳවා තබා ගෙන ආපසු පියවා තිබුණි.	-එම-	-එම-
(ඉ)	සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 85 කදී ලබාගෙන තිබුණු තත්ත්කාර්ය අතුරු අග්‍රිම රු.1,337,545 කින් කාර්යය නිමවූ පසු ඉතිරි වූ රු 311,915 ආපසු පියවීම සඳහා දින 02 සිට දින 86 දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.	-එම-	-එම-
(ඊ)	සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 06 කදී විවිධ වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන් වෙත නිකුත් කර තිබුණු රු.2,010,700 ක මුදලින් එම වැඩසටහන් පැවත්වීමෙන් පසු ඉතිරි වූ රු.678,095 ක් ආපසු පියවීම සඳහා දින 39 සිට දින 81 දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.	-එම-	විවිධ වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙත නිකුත් කරන ලද අත්තිකාරම් සහ එම වැඩසටහන් පැවැත්වීමෙන් පසු ඉතිරි වූ මුදල් ආපසු පියවීමේ කාර්යය වැඩසටහන් අවසන් වූ වහාම සිදුකරන ලෙසට ඒ ඒ අංශ ප්‍රධානීන් වෙත දැනුවත් කර ඇතත්, වැඩසටහන් එක් දිනකට පමණක් සීමා නොවී දින ගණනාවක්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			පුරා පැවතීම හේතුවෙන් පියවීම් ප්‍රමාද වන බව.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 03 කදී ලබාගෙන තිබුණු රු.200,060 තත්ත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය සඳහා සියයට 50 කට වඩා අඩුවෙන් යොදා ගෙන දින 04 සිට දින 11 දක්වා කාලයක් අත රඳවා තබාගෙන ආපසු පියවා තිබුණි.	-එම-	වැඩසටහන් සඳහා තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබාගැනීමේදී වඩාත් තාත්වික ඇස්තමේන්තු සකස් කරන ලෙස අදාළ අංශ වෙත දන්වා ඇති අතර, අදාළ කාර්යයන් සඳහා සියයට 50 කට වඩා අඩුවෙන් අග්‍රිම යොදාගැනීම සහ මුදල් රෙගුලාසි අනුව දින 10 ක් ඇතුළත නොපියවීමට හේතු එක් එක් අංශ වෙතින් වෙන වෙනම විමසා ඇති බව.
(ඈ)	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අනෙකුත් අත්තිකාරම් (7000-0-0-111-0-002) යටතේ වෛද්‍ය සැපයුම් අංශයට වර්ෂ ගණනාවකට පෙර ලබාදුන් රු.1,222,599,026 ක අත්තිකාරම සමාලෝචිත වර්ෂය තුළදීද පියවීමට කටයුතු කර නොතිබුණි.	නොපියවූ අත්තිකාරම් නියමිත පරිදි ගිණුම් ගත කළ යුතු අතර මෙම අත්තිකාරම් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය.	වෛද්‍ය සැපයීම් අංශයට අයත් නොපියවූ අක්‍රිය අත්තිකාරම් ගිණුම නිරවුල් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව මේ වන විට රැස්වී අදාළ කරුණු ගැඹුරින් අධ්‍යයනය කර ඇති අතර මෙම නොපියවූ අත්තිකාරම් ශේෂය රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ලබා දුන් අත්තිකාරම් නිරවුල් කිරීම ගිණුම් ගත කිරීමට නොහැකි වූ බවත් මේ සඳහා මුදල් ගෙවීමක් හෝ මුදල් අයකිරීමක් අවශ්‍ය නොවන බවටත් තහවුරු කර ඇති බව, එබැවින් 2024 වර්ෂය තුළ නාමික ප්‍රතිපාදනයක් ලබාගෙන මෙම අක්‍රිය අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීම සුදුසු බවට කමිටුව නිර්දේශ කර ඇති බව, ඒ අනුව කටයුතු කිරීමට නියමිත බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(එ)	ශ්‍රී ලංකා දන්ත රෝහලෙහි හා අනුරාධපුර ශික්ෂණ රෝහලෙහි වර්ෂ 2002 හා 2019 වර්ෂ තුළදී සිදු වූ මුදල් මංකොල්ලයන් වෙනුවෙන් වූ අදාළ පාඩුව පියවීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලබාදුන් මුදලින් 2023 දෙසැම්බර් 31 දිනට නොපියවූ පිළිවෙලින් රු.2,288,037 ක් හා රු.6,321,785 ක අත්තිකාරම මූල්‍ය ප්‍රකාශන වල (ඒසීඒ - 5) විවිධ අත්තිකාරම් යටතේ දක්වා නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, මෙම වටිනාකම් 2023 භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල 111 වැය ශීර්ෂය යටතේ ඇතුළත් කර නොමැති බව.

2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.			
(අ)	සේවයේ නියුතු නිලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු.1,310,515 ක් වූ ණය ශේෂ වලට අදාළ නිලධාරීන් 07 දෙනෙකුගේ තනතුර සඳහන් කර නොතිබුණු අතර එකතුව රු.903,283 ක් වූ නිලධාරීන් 12 දෙනෙකුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් නොවිය.	මෙම තොරතුරු ඇතුළත්ව 2024 වර්ෂයේ සැසඳුම් ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2024 වසර අවසන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සැකසීමේදී සියළු නිලධාරීන්ගේ තනතුරු සහ හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන බව.
(ආ)	2023 දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් 264 කට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට පැවති ණය ශේෂ 2023 වර්ෂයේදී අයකරගෙන නොමැති බව නිරීක්ෂණය විය. මේ අනුව මෙම නිලධාරීන් සත්‍ය ලෙසම සේවයේ යෙදී සිටින නිලධාරීන්ද යන සැකය විගණනයේදී බැහැර කිරීමට නොහැකි විය.	මෙම එක් එක් නිලධාරියාගේ ණය ශේෂ අය නොකිරීමට හේතු විගණනයට ඉදිරිපත් කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඇ)	2023 දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් 3,203 කට අදාළව ආපදා ණය, දේපල ණය ඇතුළුව 2022 වර්ෂය අවසානයට පැවති ණය ශේෂයන්ගෙන් 2023 වර්ෂය තුළ අයකරගෙන තිබුණු ණය මුදල පිළිබඳව විගණනයට ගැටළු සහගත විය.	මෙම එක් එක් නිලධාරියාගේ ණය ශේෂ අය කිරීමේ නිවැරදිතාවය විගණනයට තහවුරු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2023 වර්ෂයට අයත් ආපදා ණය, දේපල ණය ඇතුළුව 2022 වර්ෂය අවසානයට පැවති ණය ශේෂයන් නියමිත පරිදි වර්ෂයේ මාස 12 සඳහාම නියමිත වාරික අයකර තිබුණු අතර එම වාරික ඉතා අඩු අගයක් වශයෙන් පැවතීමට හේතු වූයේ අදාළ ණය නිකුත් කළ කාල වකවානු වලදී එම නිලධාරීන්ගේ මූලික වැටුප දැනට වඩා අඩු මුදලක් වීම නිසා නිකුත් කරන ලද මුළු ණය ප්‍රමාණයද අඩු ප්‍රමාණයක් වීම නිසා බව.
(ඈ)	2023 දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් 406 කට අදාළව ආපදා ණය ශේෂයන් 2023 වර්ෂය තුළදී අය කර නොතිබුණු අතරම, පිළිගත නොහැකි අගයන්ගෙන් ආපදා ණය ශේෂය හා 2023 දෙසැම්බර් 31 දිනට මුළු ණය ශේෂය වැඩිවී තිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම නිලධාරීන්ගෙන් නියමිත වාරික වර්ෂය තුළ අයකර තිබුණු අතර වර්ෂය තුළදී එම නිලධාරීන්ගේ ණය ශේෂයන් නැවත අලුත් කිරීම මත ණය ශේෂය වැඩි වී ඇති බව.
(ඉ)	සැසඳුම් ප්‍රකාශයේ ඇමුණුම 3 අනුව වෙනත් රජයේ- අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවීමට පැවති ණයගැති ශේෂය රු.59,915,683 ක් විය. 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය අනුව නිලධාරියා මාරුවී ගොස් මාස දෙකක් ඇතුළත ණය ශේෂ නොපියවන ලද්දේ නම්, මාරුවීම ලැබූ දෙපාර්තමේන්තුව තුළ අදාළ නිලධාරියා සේවය කරන බව තහවුරු කොට ගෙන එම දෙපාර්තමේන්තුවට ලිඛිතව දැනුම් දීමක් කොට තුන්වන මාසයේදී මාරුව ලබාදුන් දෙපාර්තමේන්තුව විසින් මාසික ගිණුම් සාරාංශය මගින් එම ණය ශේෂ අයකර ගතයුතු අතර මාස තුනකට පසුව එම ණයශේෂ නොපෙන්වීමට වගබලා ගත යුතුය. නමුත් 2023 දෙසැම්බර්	ආයතන සංග්‍රහයේ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිලධාරියා ස්ථාන මාරුවී ගොස් මාස 03 ක් ඇතුළත ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් මාස **03** ක් ඇතුළත පියවා ගනු ලබන බව, **2020** වර්ෂයේ සිට අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය සහ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමෙන් අනතුරුව එම වර්ෂය තුළදීම නිරවුල් කරනු ලබන බව, එබැවින් **2020** වර්ෂයට පසුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	31 දින වන විට සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතන හා අංශ 61 කට අදාළව රු.59,915,683 ක ණයගැති ශේෂ සම්බන්ධයෙන් යටෝක්ත වක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එසේම ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1:6 සහ 1:7 යන වගන්තිවලට අනුකූලව කටයුතු කර නොමැති බවද නිරීක්ෂණය විය. මෙම ණයගැති ශේෂයන් අතුරෙන් රු.42,228,351 ක් වූ ණයගැති ශේෂ වර්ෂ 5ට වඩා වැඩි පැරණි ණය ශේෂයන් වූ අතර එය මුළු ණයගැති ශේෂයෙන් සියයට 70 ක් පමණ විය. ඉතිරි ණයගැති ශේෂ වලින් රු.14,456,909 ක් වූ ණයගැති ශේෂ මාස 03 ඉක්ම වූ ණයගැති ශේෂ විය. මේ අනුව සමස්ත ණයගැති ශේෂයෙන් රු.56,685,260 ක් හෙවත් සියයට 95 ක් නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් උද්ගත වූ ණයගැති ශේෂ බව විගණනයේදී නිරීක්ෂණය විය.		අමාත්‍යාංශය ඇතුළත ණයගැති ණයහිමි ශේෂයන් ඇති වීමට ඉඩ නොදෙන අතර පැරණි ණය ශේෂයන් පිළිබඳවද තොරතුරු සොයා බලා නිරවුල් කරනු ලබන බව, පළාත් සභා තුළින් අමාත්‍යාංශය වෙත පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමේ කටයුතු සිදු කරනු ලබන අතර ස්ථාන මාරු ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් නිරවුල් කරන ලෙස අදාළ පළාත් සභා ආයතන වෙත දැනුම් දී නිරවුල් කිරීමේ කටයුතු සිදු කරන බව.
(ඊ)	සැසඳුම් ප්‍රකාශයේ උපලේඛන අංක 3.2.1 හි සෞඛ්‍ය අමාත්‍යාංශය හා එයට අයත් ආයතන වලට අනුයුක්තව සිට වෙනත් රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.870,142 ක ණයගැති ශේෂයෙන් රු. 108,700 ක ණයගැති ශේෂයට අදාළ නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර නොතිබුණි.	නිලධාරීන් නිශ්චිතව හඳුනා ගත හැකි පරිදි මෙම තොරතුරු පවත්වා ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2024 වසර අවසන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සැකසීමේදී සියළු නිලධාරීන්ගේ හැඳුනුම්පත් අංකය ඇතුළත් කරනු ලබන බව.
(උ)	සැසඳුම් ප්‍රකාශයේ උපලේඛන අංක 3.2.2 හි දැක්වෙන සෞඛ්‍ය අමාත්‍යාංශය හා එයට අයත් ආයතන වෙත ස්ථාන මාරුවූ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ වලින් එකතුව රු.1,152,635 ක් වූ ණයගැති ශේෂ 27 කට අදාළ ස්ථාන මාරුවීම් ලද නිලධාරීන්ගේ තනතුර දක්වා නොතිබුණු අතර රු.12,131,232 ක ණයගැති ශේෂ 185 කට අදාළ නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංක දක්වා නොතිබුණි.	නිලධාරීන් නිශ්චිතව හඳුනා ගත හැකි පරිදි මෙම තොරතුරු පවත්වා ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2024 වසර අවසන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සැකසීමේදී සියළු නිලධාරීන්ගේ තනතුරු සහ හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන බව.
(ඌ)	උපලේඛන අංක 3.3 අනුව පළාත් සභා වෙත ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 46,708,940 ක ණයගැති ශේෂය තුළ	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව. මෙම නිලධාරීන්ට අයත් ණය ශේෂයන් වසර 10 ට වඩා පැරණි ණය ශේෂයන් වන බැවින්

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	රු.2,062,255 ක් වූ ණයගැති ශේෂ 16 කට අදාළ ස්ථාන මාරු වූයේ කුමන ආයතනයකටද යන්න සඳහන් කර නොතිබුණි.		තොරතුරු සොයා ගැනීමේ අපහසුතා පවතින අතර 2024.06.30 ගිණුම සැකසීමේදී සියළු නිලධාරීන්ගේ ස්ථාන මාරු වූ ආයතනයන් ඇතුළත් කරන බව.
(ඒ)	උපලේඛන අංක 3.3 හි දැක්වෙන රු.6,855,286 ක් වූ ණයගැති ශේෂ 92 කට අදාළ නිලධාරින්ගේ තනතුරු නාමය සඳහන් කර නොතිබුණි. එසේම මින් රු.36,034,920 ක් වූ ණය ශේෂ 560 කට අදාළ නිලධාරින්ගේ ජාතික හැඳුනුම්පත් අංක දක්වා නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, බොහෝ නිලධාරීන්ගේ ණය ශේෂයන් වසර 10 ට වඩා පැරණි ණය ශේෂයන් වන අතර 2024 වසර අවසන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සැකසීමේදී සියළු නිලධාරීන්ගේ තනතුරු සහ හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන බව.
(ඓ)	උපලේඛන අංක 3.3 හි දැක්වෙන රු.2,173,935 ක ණයගැති ශේෂ 75 කට අදාළ නිලධාරීන් ස්ථාන මාරුවී ගිය පළාත් සහා ආයතනය කුමක්ද යන්න නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම නිලධාරීන්ට අයත් ණය ශේෂයන් වසර 20 ට වඩා පැරණි ණය ශේෂයන් වන බැවින් තොරතුරු සොයා ගැනීමේ අපහසුතා පවතින අතර 2024 වසර අවසන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සැකසීමේදී සියළු නිලධාරීන්ගේ ස්ථාන මාරු වූ ආයතනයන් ඇතුළත් කරන බව.
(ඔ)	උපලේඛන අංක 3.3 හි දැක්වෙන එකතුව රු.2,454,852 ක් වූ ණයගැති ශේෂ 40 ක් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතන වෙතට ස්ථාන මාරුවීම් ලද නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයගැති ශේෂයන් විය.	මෙම තත්ත්වයට හේතු වූ කරුණු හඳුනාගෙන අදාළ ගැලපීම් කඩිනමින් සිදු කළ යුතුය	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම ණය ශේෂයන් නිවැරදි ඇමුණුම් තුළ 2024 වසර අවසන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සැකසීමේදී ඇතුළත් කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඕ)	උපලේඛන අංක 3.2.2 ඇතුළත් 2023 දෙසැම්බර් 31 දිනට අයවීමට පැවති රු.12,336,602 ක ණයගැති ශේෂ සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන වලට ස්ථාන මාරුවූ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයගැති ශේෂ විය. 2019, 2020, 2021 හා 2022 වර්ෂ හතරට අදාළ විගණකාධිපති වාර්තා මගින් මෙම තත්ත්වය ඔබගේ අවධානයට යොමුකරන ලද අතර එකම වැය ශීර්ෂයක් තුළ පවතින ආයතන අතර ණයගැති හා ණයහිමි ශේෂ පැවතිය නොහැකි බැවින් මෙම ණයගැති ශේෂ පිළිබඳව පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස නිර්දේශ කළද 2023 දෙසැම්බර් 31 දින දක්වා මෙම ණයගැති ශේෂ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2020 වර්ෂයේ සිට අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය සහ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමෙන් අනතුරුව එම වර්ෂය තුළදීම නිරවුල් කරනු ලබන බව, එබැවින් 2020 වර්ෂයට පසුව අමාත්‍යාංශය ඇතුළත ණයගැති ණයහිමි ශේෂයන් ඇති වීමට ඉඩ නොදෙන අතර පැරණි ණය ශේෂයන් පිළිබඳවද තොරතුරු සොයා බලා නිරවුල් කරන බව.
(ක)	සැසඳුම් ප්‍රකාශයේ උපලේඛන අංක 3.9.2 හි ඇතුළත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනවල සිට ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 7 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු.234,840 ක් වූ ගෙවිය යුතු ණයහිමි ශේෂයන් විය. එකම වැය විෂයකට අයත් ආයතන අතර ණයහිමි ශේෂ ඇතිවිය නොහැකි බැවින් මෙම ණය ශේෂවල නිවැරදිතාවය විගණනයේදී ගැටළුකාරී විය.	-එම-	-එම-
(ග)	වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 271 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු.11,216,174 ක් වූ අතර ඉන් රු.7,480,476 ක් හෙවත් සියයට 67 ක ණය ශේෂ වර්ෂ 5 කට වඩා පැරණි ණය ශේෂ වූ අතර රු.9,486,261 ක් හෙවත් සියයට 85 ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ විය.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, වැඩ තහනම් වූ නිලධාරීන්ගේ ණය ශේෂයන් නිරවුල් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස් වෙතින් නිලධාරීන්ගේ වර්තමාන ලිපිනයන් ලබා ගැනීමෙන් අනතුරුව ණය ශේෂ නිරවුල් කරන ලෙස නිලධාරීන් හට දැනුවත් කිරීම, ග්‍රාම නිලධාරීන් හරහා දැනුවත් කිරීම, ප්‍රදේශයට අයත් පොලිසිය දැනුවත් කිරීම, ඇපකරුවන් දැනුවත් කිරීම වැනි ක්‍රියාමාර්ග

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			ගැනීම තුළින් ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරන බව.
(ච)	එකතුව රු.500,334 ක් වූ වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 08 දෙනෙකුගේ තනතුර සඳහන් කර නොතිබුණු අතර එකතුව රු.6,993,834 ක් වූ නිලධාරීන් 122 දෙනෙකුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් නොවිය.	නිලධාරීන් නිශ්චිතව හඳුනා ගත හැකි පරිදි මෙම තොරතුරු පවත්වා ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2024 වසර අවසන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සැකසීමේදී සියළු නිලධාරීන්ගේ තනතුරු සහ හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන බව.
(ඡ)	සේවය අතහැර ගිය නිලධාරීන් 1121 දෙනෙකුගෙන් එකතුව රු.34,903,560 ක ණය ශේෂයන් අයවිය යුතුව තිබුණු අතර ඉන් රු.11,765,191 ක් හෙවත් සියයට 34 ක ණය ශේෂ වර්ෂ 5 කට වඩා පැරණි ණය ශේෂ වූ අතර රු.22,401,077ක් හෙවත් සියයට 64 ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ විය. මෙම ශේෂය වසරක් පාසා අඛණ්ඩව වැඩිවන අතර, ණය අයකර ගැනීම පිළිබඳව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන ඇති බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් නිරවුල් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස් වෙතින් නිලධාරීන්ගේ වර්තමාන ලිපිනයන් ලබා ගැනීමෙන් අනතුරුව ණය ශේෂ නිරවුල් කරන ලෙස නිලධාරීන් හට දැනුවත් කිරීම, ග්‍රාම නිලධාරීන් හරහා දැනුවත් කිරීම, ප්‍රදේශයට අයත් පොලිසිය දැනුවත් කිරීම, ඇපකරුවන් දැනුවත් කිරීම වැනි ක්‍රියාමාර්ග ගැනීම තුළින් ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරන බව.
(ජ)	එකතුව රු.2,636,421 ක් වූ සේවය අතහැර ගිය නිලධාරීන් 80 දෙනෙකුගේ තනතුර සඳහන් කර නොතිබුණු අතර එකතුව රු. 12,732,979ක් වූ නිලධාරීන් 459 දෙනෙකුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් නොවිය.	නිලධාරීන් නිශ්චිතව හඳුනා ගත හැකි පරිදි මෙම තොරතුරු පවත්වා ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2024 වසර අවසානයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සැකසීමේදී සියළු නිලධාරීන්ගේ තනතුරු සහ හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන බව.

NAOSL ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ට)	විශ්‍රාම ගිය නිලධාරීන් 423 දෙනෙකුගෙන් අයවිය යුතු ණය මුදල රු.19,996,087 ක් වූ අතර එයින් රු.7,853,389 ක් හෙවත් සියයට 39 ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ විය.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, විශ්‍රාම ගිය නිලධාරීන්ගේ දීර්ඝකාලීනව අය නොවන විශ්‍රාමික නිලධාරීන්ගේ ණය ශේෂයන් අවම කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කර ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව, මියගිය නිලධාරීන්ගේ මරණ පාරිතෝෂිකය මේ දක්වා නිරවුල් නොවී පවතින නිලධාරීන්ගේ උරුමකරුවන් දැනුවත් කර අයකර ගැනීම් සිදු කරන ලෙස හා අනෙකුත් විධිවිධාන පරිදි අයකිරීම් සිදු කිරීමට උපදෙස් ලබා දී ඇති බව, විශ්‍රාම ගිය සහ මියගිය නිලධාරීන්ගේ උරුමකරුවන් විශ්‍රාම පාරිතෝෂිකය සහ මරණ පාරිතෝෂිකය ලබා ගැනීමට ඉදිරිපත් නොවීම මත ණය ශේෂයන් නිරවුල් කර ගැනීමේ අපහසුතා ඇති වී ඇති බව, නමුත් ණය අයකර ගැනීමේ චේතනාව මත පදනම්ව උරුමකරුවන් ඉදිරිපත් නොවන නිලධාරීන්ගේ විශ්‍රාම පාරිතෝෂිකය සහ මරණ පාරිතෝෂිකය සකස්කර ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස රෝහල් සහ ආයතන වෙත දැනුම් දී ඇති බව.
(ඪ)	එකතුව රු.2,557,390ක් වූ විශ්‍රාම ගිය නිලධාරීන් 31 දෙනෙකුගේ තනතුර සඳහන් කර නොතිබුණු අතර එකතුව රු.1,613,738 ක් වූ නිලධාරීන් 42 දෙනෙකුගේ ජාතික හැඳුනුම් පත් අංකය සඳහන් නොවිය.	නිලධාරීන් නිශ්චිතව හඳුනා ගත හැකි පරිදි මෙම තොරතුරු පවත්වා ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2024 වසර අවසානයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සැකසීමේදී සියළු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			නිලධාරීන්ගේ තනතුරු සහ හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන බව.
(ඩ)	මියගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ වගන්ති 4.4 සිට 4.6 දක්වා වූ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වූවත්, එම විධිවිධාන පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය මුදල රු.7,038,713 ක් වී තිබුණි. ඉන් නිලධාරීන් 33 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,614,341 ක් හෙවත් සියයට 23 ක ණය ශේෂ වර්ෂ 05 කට වඩා පැරණි ණය ශේෂ විය. එසේම මෙම ණයගැති ශේෂයෙන් රු.4,827,157 ක් හෙවත් සියයට 69 ක් වර්ෂයකට වඩා වැඩි ශේෂ විය.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව.
(ණ)	මියගිය නිලධාරීන් 4 දෙනෙකුගෙන් අයවිය යුතු රු.126,049 ක ණයගැති ශේෂ වලට අදාළ නිලධාරීන්ගේ තනතුරු නාමය සඳහන් කර නොතිබුණි. එසේම මියගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.581,481 ක ණයගැති ශේෂ වලට අදාළ නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර නොතිබුණි.	නිලධාරීන් නිශ්චිතව හඳුනා ගත හැකි පරිදි මෙම තොරතුරු පවත්වා ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2024 වසර අවසානයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සැකසීමේදී සියළු නිලධාරීන්ගේ තනතුරු සහ හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන බව.
(ත)	පේරාදෙණිය ශික්ෂණ රෝහලේ සේවය කරමින් සිටියදී මියගිය රියදුරු ආර්. ඒ.කේ.යු.රණසිංහ මහතාගේ දේපල ණයට අදාළ ණය ලිපිගොනුව විගණනයට ඉදිරිපත් නොකළ අතර ශේෂ තහවුරු කරන ලිපිගොනුවක් පමණක් ඉදිරිපත් කර තිබුණි. ණය මුදලට අදාළ චෙක්පත නිකුත් කිරීමෙන් සති දෙකකට පසුව අදාළ නිළධාරියා මියයාම හේතුවෙන් මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමෙන් පසුව ඉතිරි රු.191,345 ක ණය ශේෂය වසර 21 කට වඩා කාලයක් අය නොවී පවතින ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. ණයකරුගේ මරණ සහතිකය අනුව විවෘත තීන්දුවක් ලබා දීම මත අග්‍රහාර රක්ෂණයෙන් රක්ෂිත මුදල ලබා දීම ප්‍රතික්ෂේප කර තිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිගේ	මේ සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, පේරාදෙණිය ශික්ෂණ රෝහලේ සේවයේ නියුතුව මියගිය රියදුරු ආර්. ඒ.කේ.යු.රණසිංහ මයාගේ දේපල ණය ගොනුව අස්ථාන ගතවී ඇති බැවින් ණය ලිපි ගොනුව ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව, නමුත් එලෙස ලිපිගොනු අස්ථානගත වීමට නොහැකි බැවින් ඒ පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව, එසේම ඉහත කාරණයන්ට අමතරව මොහු අදාළ

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	අංක FCC/05/අය නො. ණයශේෂ/2009 දරන 2009 ජුනි 12 දිනැති ලිපිය ප්‍රකාරව දේපල ණයට අදාළ ලියවිලි භාර ගැනීමට ක්‍රියා නොකළ නිලධාරිනියගෙන් ණය ශේෂය අයකර ගැනීමට නියෝග ලබා දී තිබුණද, එම කටයුතු 2023 මැයි 31 දින වන විටත් සිදු කර නොතිබුණි.		ණය මුදල 2001.02.28 දින ලබාගෙන ඇති අතර ඉන්පසු ඊට ආසන්නතම දිනකදී හදිසියේ දැඩි ලෙස රෝගාතුරව රෝහල් ගතව සිට 2001.03.23 දින මරණයට පත්වීම හේතුවෙන් විෂය නිලධාරීන් හට නිවැරදි ඔප්පු පිටපත ලබා ගැනීමට හෝ ණය මුදලින් සිදුවූ කිසිම ගණුදෙණුවක් හෝ තොරතුරක් ලබා ගැනීමට නොහැකි වීමත් මත සහ මරණයට හේතුව වශයෙන් විවෘත තීන්දුවක් ලබා දීම මත රක්ෂණ ණය ආවරණය ලබා ගැනීමට පවා නොහැකි වූ වාතාවරණයක හදිසියේ මියගිය ඔහුගේ ණය ගෙවීම සඳහා විෂය නිලධාරීන් වෙත වගකීම පැවරීම සාධාරණ නොවන බව.
(ඵ)	පළාත් සභා යටතේ පැවති පොළොන්නරුව මහ රෝහල 2010 අගෝස්තු 01 දින මධ්‍යම රජයට පවරා ගැනීමෙන් පසුව පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහට ස්ථාන මාරු ලබා පැමිණෙන ලද එන්. ජී. සෝමවීර මයාගේ රු.93,458 ක ණය ශේෂය උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයට පියවා තිබියදී 2011 වසරේදී මැදිරිගිරිය ප්‍රාදේශිය සභාව විසින් අදාල ණය මුදල් පියවා නොමැති බවට කරන ලද ඉල්ලීම අනුව උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයෙන් නැවත වරක් මුදල් ගෙන්වා ගැනීමේ අරමුණින් පොළොන්නරුව මහ රෝහල විසින් අදාළ ණය මුදල මැදිරිගිරිය ප්‍රාදේශිය සභාවට පියවා තිබුණි. ණය ශේෂය පියවා තිබියදී නැවත වරක් ණය ශේෂය පියවීම සඳහා කටයුතු කර තිබුණු අතර, අපරීක්ෂාකාරි ලෙස සිදුකළ මෙම ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබීම විගණනයේදී ගැටළු සහගත විය. තවද, 2023 ජූලි විගණිත දින වනවිටත්	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, එන්. ජී සෝමවීර මහතා ශික්ෂණ රෝහල - පොළොන්නරුව වෙත ස්ථාන මාරු වී පැමිණි නිලධාරියකු වන අතර එම ණය මුදල ශික්ෂණ රෝහල - පොළොන්නරුව 2010-08-01 දින මධ්‍යම රජයට පවරාගත් අවස්ථාවේ, පියවීම සඳහා උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හරහා සිදු කිරීමට කටයුතු කර ඇති බව, එහෙත් 2013 වසර වන තෙක් එම ණය මුදල පියවී නොමැති බව දන්වා එවීම මත මෙම ආයතනය විසින් අදාළ මුදල සඳහා වෙක්පතක් මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව වෙත

	පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයෙන් අදාළ මුදල් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.		යැවීමට කටයුතු කර ඇති අතර, එම ණය ශේෂයට අදාළ මුදල උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් අප වෙත ලබා දෙන මෙන් ඉල්ලීම් කර ඇති බව, එහෙත් එම මුදල මේ වෙන තෙක් පියවීමට හෝ අදාළ ණය මුදල් පියවූ ආකාරය පිළිබඳ හෝ කිසිම දැනුම් දීමක් අප වෙත උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් සිදුකර නොමැති බව, මේ සම්බන්ධව කිහිප වරක්ම උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හා උතුරු මැද පළාත් ලේකම් කාර්යාලය යන ආයතන දැනුවත් කළද කිසිදු ආයතනයකින් අදාළ කිසිදු තොරතුරක් අප වෙත ලබා දීමට කටයුතු කර නොමැති බව, එම ණය මුදල ලබා දී තිබුණේ මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව මගින් වන බැවින් ශික්ෂණ රෝහල - පොළොන්නරුව සතුව එම ණය ලිපිගොනුව නොමැති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.5 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2023 දෙසැම්බර් 31 දිනට මාසික ගිණුම් සාරාංශ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ කේවල ගිණුම් සාරාංශ ලේඛන අතර රු.16,485,076 ක ශුද්ධ වෙනසක් පැවතුණි.	මෙම වෙනසට හේතු හඳුනාගෙන කඩිනමින් නිවැරදි කළ යුතුය.	සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතන හා රෝහල්වල පොදු තැන්පත් ශේෂයන් සිගාස් වැඩසටහනෙහි කේවල ශේෂයන් සමඟ සැසඳෙන අතර මාසික හා වාර්ෂික හර බැර වටිනාකම්ද සැසඳෙන බව, උක්ත වෙනසට හේතු විය හැක්කේ 2016 වර්ෂයේ පැරණි පොදු තැන්පත් ගිණුම් ශේෂ රජයේ ආදායමට බැර කිරීමේදීත් පැරණි ශේෂ අලුතින් ආරම්භ කරන ලද පොදු තැන්පත් ගිණුම් වලට මාරු කිරීමේදි උද්ගත වී ඇති අවුල් සහගත තත්ත්වයන් නිසා ඇති වූ වෙනස ලෙස අනුමාන කළ හැකි බව, භාණ්ඩාගාර ගිණුම් සාරංශ මුද්‍රිත පිටපතෙහි ආරම්භක ශේෂයේ පවතින වෙනස නිරවුල් කිරීමට කටයුතු සලසා දෙන ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුව සමඟ ද සාකච්ඡා කර ඇති බව, කෙසේ වෙතත් සියලුම පොදු තැන්පත් ශේෂයන් නැවත සමාලෝචනය කර වෙනස නිරවුල් කිරීමට කටයුතු කරන බව.
(ආ)	මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව, අමාත්‍යාංශයට අයත් ආයතන 15 කට අදාළ වර්ෂ 02 ඉක්ම වූ එකතුව රු. මිලියන 1,144.89 ක තැන්පතු	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ඉදිරියේදි නිරවුල් කිරීමට කටයුතු කරන බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.		
(ඇ)	සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යන තැන්පත් ලෙජරය අනුව කල්මුණේ මූලික රෝහලට අදාළ ගිණුම් අංක 16/99 හි බැර පැත්තේ එකතුව රු.450,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.	වගකීමෙන් යුතුව කටයුතු කරන ලෙස අදාළ නිලධාරින්ට අවවාද කළ යුතුය.	නිවැරදි එකතුව වූ රු.2,054,277 ක් වැරදීමකින් රු.2,504,277 එකතුව ලෙස සඳහන් කිරීම ඊට හේතු වූ බව, මින් ඉදිරියට මෙවැනි වරදක් සිදු නොකිරීමටත් නිවැරදිව ගිණුම් ගත කිරීමටත් වග බලා ගන්නා බව.

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
(අ)	ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ.396 (ඇ) ප්‍රකාරව කටයුතු කළයුතු වූවත්, බැංකු ගිණුම් 24 කට අදාළව රු.1,085,852 ක් වටිනා චෙක්පත් 30 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව.
(ආ)	රෝහල් 3 කට අදාළව අවස්ථා 04 කදී බැංකුවේ තැන්පත් කරන ලද නමුත් උපලබ්ධි නොවී පැවති චෙක්පත්වල අගය රු. 4,424 ක් විය. චෙක්පත් උපලබ්ධි වී නොතිබීමේ කාලපරිච්ඡේදය මාස 01ත් 05 ත් අතර විය.	මේ සම්බන්ධයෙන් සොයාබලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව.
(ඇ)	ජාතික අක්ෂි රෝහලට අදාළව රු. 92,510 ක වටිනාකමින් යුතු හඳුනා නොගත් ලැබීම් අවස්ථා 07 ක් නිරීක්ෂණය විය.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව.
(ඈ)	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2024 මාර්තු 04 සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කළ ලිපිය මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලංකා බැංකුවේ ගිණුම් අංක 7040278 යටතේ	නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම ගිණුමේ 2020 වර්ෂයෙන් පසුව ගණුදෙනු කිසිවක් සිදු වී නොමැති අතර අතපසුවීමකින්

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	පවත්වාගෙන ගිය නිල බැංකු ගිණුම අක්‍රියව පවතින බවත් එය තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැතිනම් වසා දැමීමට කටයුතු කරන ලෙසත් දන්වා තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මෙම ගිණුම වසා දමා නොමැති වූවද විගණන කටයුතු සඳහා අමාත්‍යාංශය විසින් 2023 දෙසැම්බර් 31 දිනට අදාළව ලබාදුන් බැංකු සැසඳුම් සමඟ අමාත්‍යාංශය පවත්වාගෙන යන බැංකු ගිණුම් ලැයිස්තුවේ මෙම ගිණුම පෙන්නුම් කර නොතිබුණි.		අක්‍රියව පවතින මෙම ගිණුම පිළිබඳ විස්තර 2023 දෙසැම්බර් 31 ඉදිරිපත් කළ බැංකු සැසඳුම් වාර්තාවේ පෙන්නුම් කර නොතිබුණ බව, මෙම අක්‍රිය බැංකු ගිණුම වසා දැමීම සඳහා කටයුතු කරන බව.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
(අ)	මානව සම්පත් සම්බන්ධීකරණ අංශය		
	i. ජාතික සෞඛ්‍ය උපායමාර්ගික මහා සැලැස්ම 2016-2025 හි සෞඛ්‍ය පරිපාලන හා සෞඛ්‍ය මානව සම්පත පිළිබඳ තේමා මූලික අංශ 2 හි හඳුනාගත් සෞඛ්‍ය මානව සම්පත් ගැටළු ලෙස අවම සේවක සංඛ්‍යාව හා සම්මතයන් (Norms) ප්‍රමිතිගත නිර්ණායක අනුව සංශෝධනය විය යුතු බව දක්වා ඇත. (සේවා ඉල්ලුම/ වැඩ ප්‍රමාණය/ ජන විකාශ, භූගෝලීය හා භෞමික සාධක /ජාත්‍යන්තර ප්‍රමිතීන් ආදිය) මෙම ගැටළු සඳහා යෝජිත උපායන් ලෙස සෞඛ්‍ය මානව සම්පත් ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම (සැලසුම් කිරීම/ බදවා ගැනීම/පුහුණුව/ යෙදවීම/ වෘත්තීය සංවර්ධනය) දක්වා ඇත. ඒ අනුව මානව සම්පත් උපායමාර්ගික සැලැස්ම සංවර්ධනය කිරීමට	මෙම කටයුතු සැලසුම් කළ පරිදි නිම කළ යුතුය.	එකඟ වන බව, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත කාර්යාලය මගින් මෙම සැලැස්ම සකස් කළ අතර, එය අවසන් කෙටුම්පත් අවස්ථාවේ පවතින බව, එම කාර්යාලය විසින් පත් කරන ලද විශේෂඥ කමිටුව මගින් මෙම කාර්යය සිදු කරන ලද අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඔවුන් විසින් සපයන ලදී, මෙම කරුණු මෙසේ තිබියදී ශ්‍රී ලංකාව මුහුණ දුන් සමාජ ආර්ථික අභියෝගයන් සහ එම අභියෝග

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	2023 වර්ෂය තුළ සැලසුම් කළද තෙවන කෙටුම්පත් වාර්තාව පිළියෙල කර විශේෂඥ අදහස් ලබාගැනීම සඳහා අදාළ පාර්ශවයන්ට හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ අදහස් ලබා ගැනීමටද යොමු කර තිබුණ අතර වර්ෂය අවසන් වන විටත් අවසන් වාර්තාව සකසා නොතිබුණි.		හේතුකොටගෙන මානව සම්පත් කළමනාකරණය ඇතුළු නව ප්‍රවණතා සැලකිල්ලට ගෙන මෙම කෙටුම්පත යාවත්කාලීන කිරීම සහ ඒ මත පදනම්ව නව මානව සම්පත් ක්‍රියාකාරී සැලැස්මක් (**Human Resource for health Master Plan** 2025-2035) පිළියල කිරීමටත් මේ වන විට මූලික කටයුතු සිදු කෙරෙමින් පවතින බව, එබැවින් අදාළ සැලසුම් දෙකම මෙම වසර තුළ සකසා අවසන් කිරීමට අපේක්ෂා කරන බව.
	ii. 2019/2020 වර්ෂවල උසස්පෙළ හදාරන ලද සිසුන්ගෙන් ශිෂ්‍ය හෙද 2021 කණ්ඩායම 2023 ඔක්තෝබර් 31 දින වන විට බඳවාගැනීම් අවසන් කිරීමට සැලසුම් කර තිබුණද 2023 ඔක්තෝබර් වනවිට අයදුම්පත් කැඳවීම් පමණක් අවසන් කර තිබූ අතර සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම 2024 වර්ෂයට යොදාගෙන තිබුණි.	-එම-	එකඟ වන බව, 2018 වර්ෂයේ සිට හෙද, පරිපූරක හා අතුරු වෛද්‍ය යන සේවාවන්ට අයත් පාඨමාලා සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සමඟ එක්ව මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් කැඳවා සිසුන් තෝරාගැනීම මානව සම්පත් කළමනාකරණ අංශය විසින් සිදු කරනු ලබන බව.
	iii. 2018/2019 වර්ෂවල උසස්පෙළ හදාරන ලද සිසුන්ගෙන් පරිපූරක වෛද්‍ය කාර්ය මණ්ඩල ශිෂ්‍ය 2020 කණ්ඩායම බඳවාගැනීම 2023 ජූලි 31 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගැසට් නිවේදනය කෙටුම්පත් කිරීම පමණක් සිදුකර තිබුණි.	-එම-	එකඟ වන බව, ඉහත පරිදි මෙම බඳවා ගැනීමද සිදු කරනු ලබන්නේ අදාල පාලන අංශවල ඉල්ලීම පරිදි බව
	iv. 2018/2019 වර්ෂවල උසස්පෙළ හදාරන ලද ශිෂ්‍යාවන්ගෙන් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී ශිෂ්‍ය පුහුණු 2021 කණ්ඩායම බඳවා ගැනීම් කටයුතු 2023 අගෝස්තු 01 දින ආරම්භ කර 2024 මාර්තු	-එම-	මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	31 දිනට අවසන් කිරීමට සැලසුම් කළද මෙම කාර්යය සිදු නොකර පෙර කණ්ඩායමේ තෝරගත් ශිෂ්‍ය ලැයිස්තුවෙන් 2 වන කණ්ඩායම ලෙස සිසුන් 1000 ක් බඳවා ගැනීමට තීරණය කර තිබුණි. මෙම බඳවා ගැනීම් 2024 මාර්තු 31 දිනටත් අවසන් කර නොතිබුණි.		
(ආ)	සෞඛ්‍ය සේවා තත්ත්ව හා ආරක්ෂණ		
	i. තීරණාත්මක කාර්යය මණ්ඩල (වෛද්‍යවරුන්, හෙදියන් සහ පරිපූරක වෛද්‍ය) කාණ්ඩවල උපාධි අපේක්ෂක විෂය මාලාවට ඇතුළත් කිරීම සඳහා සෞඛ්‍ය ආරක්ෂණ තත්ත්ව සහ ආරක්ෂිත මොඩියුල සංවර්ධනය කිරීමට 2023 වර්ෂයේදී සැලසුම් කර තිබුණද එය ආරම්භ කර නොතිබුණි.	-එම-	පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.
	ii. 2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා වෛද්‍ය සම්මේලනය සහ වෘත්තීය විද්‍යාල සමඟ එක්ව සායනික පාලනය (Clinical Governance) පිළිබඳ වැඩ සටහන් සියළු පළාත්වල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘති යෝජනාව අනුමත කර අයවැය අනුමැතියට යවා තිබීම පමණක් සිදු කර තිබුණි.	-එම-	පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	පවුල් සෞඛ්‍ය කාර්යාංශය පවුල් සැලසුම් මාර්ගෝපදේශ හා ප්‍රමිති මෙහෙයුම් ක්‍රියාවලිය (SOP) අවසන් කර මුද්‍රණය කිරීමට සැලසුම් කළද, එය අවසන් කර නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, පවුල් සැලසුම් මාර්ගෝපදේශ හා ප්‍රමිති මෙහෙයුම් ක්‍රියාවලිය **(SOP)** සංශෝධන කටයුතු සඳහා තාක්ෂණික සහය ලබා ගන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානය **(WHO)** මගින් සකස් කරන නවතම ලේඛන වලින් බව, නමුත්, එම ජාත්‍යන්තර මාර්ගෝපදේශ අප වෙත ලැබීමට 2023 ඔක්තෝබර් මස දක්වා ප්‍රමාද

			වූ හෙයින් එම කර්තව්‍ය අපේක්ෂා කළ පරිදි 2023 වසරේ දී සිදු කිරීමට නොහැකි වූ බව, එබැවින් එම කාර්යය 2024 වර්ෂයේ දී සිදු කිරීමට කටයුතු කරන බව.
(ඈ)	දේශීය වෛද්‍ය අංශය බෝ නොවන රෝගවල ප්‍රතිචාර සඳහා නිතර භාවිතා කරන ආනයනික ද්‍රව්‍ය වෙනුවට ආදේශ කළ හැකි අමු ද්‍රව්‍යවල භෞතික රසායනික පරාමිතීන් විශ්ලේෂණය කිරීමට 2023 දී සැලසුම් කළද, එම කාර්යය කිරීමට අවශ්‍ය සාම්පල එකතුකිරීම පමණක් සිදුකර තිබුණි	-එම-	පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.
(ඉ)	HIV/AIDS Cntrol Programme under GFATM Funds මෙම ව්‍යාපෘතිය යටතේ කරුණු 287 ක් ඉටුකර ගැනීමට සැලසුම් කර තිබුණි. එයින් කරුණු 69 ක් එනම් සියයට 24 ක් ආරම්භ කර නොතිබුණු අතර කරුණු 109 ක් එනම් සියයට 38 ක ප්‍රගතිය සියයට 25ට අඩු මට්ටමේ විය.	-එම-	පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.
(ඊ)	Health System Enhancement Project (ADB) මධ්‍යම, ඌව, උතුරු මැද, සබරගමුව පළාත්වල ප්‍රාථමික සෞඛ්‍ය සේවා වැඩි දියුණු කිරීම යටතේ රෝහල් 42 ක ප්‍රාථමික වෛද්‍ය සේවා සිවිල් වැඩ සංවර්ධනය කිරීමට මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂා කර තිබුණි. ඉන් රෝහල් 21 ප්‍රගතිය දක්වා නොතිබුණ අතර සෞඛ්‍ය ක්ෂේත්‍ර මධ්‍යස්ථාන 127 ක් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කර තිබුණද ඉන් මධ්‍යස්ථාන 95 ක ප්‍රගතිය දක්වා නොතිබුණි.	-එම-	සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් පළමු අදියරය යටතේ ප්‍රාථමික රෝහල් 43ක සිවිල් වැඩ සංවර්ධනය කිරීමට නියමිතවූ අතර එයින් 41ක සිවිල් වැඩ කටයුතු මේ වන විට නිම කර ඇති බව, රෝහල් 2ක පමණක් සිවිල් වැඩ කටයුතු කර ගෙන යමින් පවතින බව, දෙවන අදියරය යටතේ ප්‍රාථමික රෝහල් 50ක සිවිල් වැඩ සංවර්ධන කටයුතු කිරීමට සැලසුම් කළ බව, එයින් රෝහල් 21ක වැඩ කටයුතු දැනටමත් නිම කර ඇති අතර රෝහල් 25ක වැඩ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			කටයුතු කෙරෙමින් පවතින බව, තවද එක රෝහලක සිවිල් වැඩ කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටින අතර රෝහල් 3ක සංවර්ධන කටයුතු ප්‍රමාණවත් අරමුදල් නොමැති වීම හේතු කොටගෙන සිදු නොකරන බව, මෙම ව්‍යාපෘතිය මගින් කරනු ලබන සිවිල් වැඩ සංවර්ධන කටයුතුවල ප්‍රගතිය පිළිබඳ සාරාංකටයුතු දැනටමත් නිම කර ඇත. සෞඛ්‍ය ක්ෂේත්‍ර මධ්‍යස්ථාන 21ක සංවර්ධන කටයුතු අරමුදල් නොමැතිවීම මත සිදු නොකිරීමට තීරණය කර ඇත.
(උ)	දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සංවර්ධිත දුම්කොළ බදු සූත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ඇල්කොහොල් බදුකරණ සූත්‍රයක් සකස් කිරීමට අපේක්ෂා කළද, 2023 වසර අවසන් වන විට එය සපුරා ගෙන නොතිබුණි.	-එම-	සංවර්ධන බදු සූත්‍රය පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කරගෙන යන බව, එසේම 2023 අග භාගයේදී මධ්‍යසාර සඳහා බදුකරණ සූත්‍රයක් සකස් කිරීමට අදාළ කටයුතු සිදුකර ගෙන යනු ලබන බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	මහනුවර ජාතික රෝහලේ අධි ප්‍රෝටීන් / අධි ශක්ති සහිත ආහාර අවශ්‍ය රෝගීන්, දියවැඩියා රෝගීන්, වකුගඩු රෝගීන් සඳහා දිනපතා පළතුරු නිර්දේශ කර ඇණවුම් කර තිබුණද එම පළතුරු ප්‍රමාණයන් සැපයීමට සැපයුම්කරු අපොහොසත් වී තිබුණි. 2023 ජූලි මාසයෙහි ඇණවුම් කරන ලද පැපොල් කි.ග්‍රෑ 180.45 කින් කි.ග්‍රෑ 48.3 ක් පමණක් සහ කෙසෙල් කි.ග්‍රෑ 512.15 කින් කි.ග්‍රෑ 14.5 ක් පමණක් සැපයුම්කරු විසින් සපයා තිබුණු අතර ඇණවුම් කරන ලද දොඩම ගෙඩි 941 ක් අලිපේර ගෙඩි 50 ක් අඹ ගෙඩි 14 ක් ඇපල් ගෙඩි 22 ක් සහ මිදි කි.ග්‍රෑ 2.2 ක් සැපයුම් කිරීමට සැපයුම්කරු අපොහොසත් වී තිබුණි. තවද සාමාන්‍ය කිරිපිටි (යොදය සහිත) කි.ග්‍රෑ 277ක් සහ ළදරු කිරිපිටි කි.ග්‍රෑ 31 ක් වශයෙන් 2023 ජූලි මස ඇණවුම් කර තිබුණද කිරිපිටි කිසිවක් රෝහලට ලබා දී නොතිබුණි. මේ හේතුවෙන් රෝගීන්ට නිර්දේශිත ආහාර ලබා දීමට නොහැකි වී තිබුණි.	මෙම තත්ත්වය වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මේ සම්බන්ධව නියමිත පරිදි රෝහල විසින් ඇණවුම් කළ පළතුරු ප්‍රමාණයන් සපයන ලෙස නිරන්තරයෙන් වාචිකව සහ ලිඛිතව අදාළ කොන්ත්‍රාත්කරු වෙත දැනුවත් කිරීම් සිදු කළ ද සැපයුම්කරු විසින් ඇතැම් ආහාර සපයනු නොලබන අතර ඇතැම් ආහාර ප්‍රමාණයන් අඩුවෙන් සපයනු ලබන බව, මෙම අඩුපාඩු නිවැරදි කර ගන්නා ලෙසත් කොන්ත්‍රාත්කරු වෙත දැනුවත් කළ ද මේ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැති බව, එබැවින්, අමු ආහාර සැපයුම් කිරීම සම්බන්ධ ඉදිරි කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු වලදී රෝහල විසින් ඇණවුම් කරන සම්පූර්ණ ආහාර ප්‍රමාණයම සැපයීම් කිරීමට අපොහොසත් වන අවස්ථාවලදී යම් දඩයක් හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකි වන පරිදි ගිවිසුමට අදාළ කොන්දේසි ඇතුළත් කිරීමට සුදුසු බව නිර්දේශ කර ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ)	බෝ නොවන රෝග නිවාරණ ඒකකය මෙම ඒකකයේ උපදේශනය, හවුල්කාරීත්වය හා නායකත්වය යන උප අංශය යටතේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගත් කරුණු පිළිබඳ විස්තර පහත දැක්වේ.		
	i. ජාතික බෝ නොවන රෝග සභාව (**National NCD Council**) මාස 06 කට වරක් කැඳවිය යුතු වූවද 2023 වසර තුළ එක් වරක් හෝ කැඳවා නොතිබුණි.	සැලසුම් කළ පරිදි නියමිත කාලය තුළ නිමකිරීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව.
	ii. සෑම මාස තුනකට වරක් බෝ නොවන රෝග මෙහෙයුම් කමිටුව රැස්විය යුතු වූවද 2023 වර්ෂය තුළ රැස්වීම් තිබුණේ එක් වරක් පමණි.	-එම-	-එම-
	iii. සෑම මාස 03 කට වරක් බෝනොවන රෝග සම්බන්ධ ජාතික උපදේශනාත්මක මණ්ඩලය (**NABNCD**) රැස්විය යුතු වූවද 2023 වර්ෂයට එක් වරක් පමණක් පවත්වා තිබුණි.	-එම-	-එම-
	iv. ජාතික මට්ටමෙන් වාර්ෂික උපදේශන සැලැස්ම සහ දිස්ත්‍රික් සැලැස්ම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා රැස්වීම් කැඳවීමට අපේක්ෂා කර තිබුණද 2023 ජුනි 28 දින පමණක් රැස්වීමක් පවත්වා තිබුණි	-එම-	-එම-
	v. ඒකාබද්ධ අක්ෂි රැකවරණය පිළිබඳ ජාතික උපායමාර්ගීය සැලැස්ම සහ අධීක්ෂණ රාමුව සංවර්ධනය කිරීමට 2023 වර්ෂය තුළ සැලසුම් කර තිබුණද එම කර්තව්‍ය වර්ෂය තුළ නිම කර නොතිබුණි.	-එම-	-එම-
	vi. ඇදුම හා නිදන්ගත පෙනහළු රෝග (**Asthma & COPD**) සඳහා ජාතික රෝග ලේඛනය (**National Disease Registry**)	-එම-	-එම-

	සංවර්ධනය කිරීම සඳහා උපදේශන රැස්වීම් පැවැත්වීමට 2023 වර්ෂය තුළ සැලසුම් කර තිබුණු අතර අධ්‍යක්ෂ ජනරාල් හා වෘත්තීය විද්‍යාල සමඟ මූලික රැස්වීම පැවැත්වීම පමණක් සිදු කර තිබුණි.		
	vii. තුවාල වැලැක්වීමේ ජාතික කවුන්සිලයක් **(National Injury Prevention Council – NIPC)** පිහිටුවා වසරකට සාකච්ඡා 02 ක් පැවැත්වීමට 2023 වසර තුළ සැලසුම් කළද එය සිදුකර නොතිබුණි.	-එම-	-එම-
	viii. දියේ ගිලීම වැළැක්වීම සඳහා ජාතික උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීමට 2023 සැලසුම් කළද එය ඉටුකර නොතිබුණි.	-එම-	-එම-
	ix. සියළු වර්ගවල කෘතිම තටාක සඳහා ආරක්ෂිත ප්‍රමිතීන් සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණද එය සම්පූර්ණ කර නොතිබුණි	-එම-	-එම-
	x. පාසල්වල කෘතිම තටාකවල ආරක්ෂිත ප්‍රමිතීන් හඳුන්වා දීමට සැලසුම් කළද එම කාර්ය අවසන් කර නොතිබුණි.	-එම-	-එම-
	xi. ජාතික ළමා ආරක්ෂණ උපායමාර්ග සංවර්ධනය කිරීමට අපේක්ෂා කළද එය ඉටුකර ගෙන නොතිබුණි.	-එම-	-එම-
	xii. පාසල් දිවාසුරැකුම් මධ්‍යස්ථාන හා පෙර පාසල් වලට ආරක්ෂිත සැලසුම් ලැයිස්තුව බෙදාහැරීමට සැලසුම් කළද එම කාර්යය 2023 වර්ෂය තුළ නිමකර නොතිබුණි.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வுப் அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	xiii. ආරක්ෂිත ගැටළු වාර්තා කිරීමට "පාසල් ආරක්ෂණ ලේඛනයක් **(School Safety Register)"** සංවර්ධනය කිරීමට 2023 වර්ෂය තුළ සැලසුම් කළද එය ඉටුකර ගෙන නොතිබුණි.	-එම-	-එම-
	xiv. නොසලකා හරින ලද නිවර්තන තුවාල (විෂ හා විෂ සහිත සර්ප දෂ්ඨ කිරීම්) **(National Action Plan on Neglected Tropical Injuries (Poisoning Venomous Snake Bites)** පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට අපේක්ෂා කර තිබුණද එය සම්පූර්ණ කර නොතිබුණි.	-එම-	-එම-
	xv. වැඩිහිටියන් අතර වැටීම වැළැක්වීම සඳහා උපායමාර්ගයන් සකස් කිරීමට සැලසුම් කළද එය සම්පූර්ණ කර නොතිබුණි.	-එම-	-එම-
	xvi. සේවාස්ථාන ආරක්ෂණ පිරික්සුම් ලැයිස්තුවක් සංවර්ධනය කිරීමට සැලසුම් කළද එය ආරම්භ කර නොතිබුණි.	-එම-	-එම-
	xvii. වැඩිහිටි නිවාස ආරක්ෂණ පිරික්සුම් ලැයිස්තුවක් සංවර්ධනය කිරීමට සැලසුම් කළද එය අවසන් කර නොතිබුණි.	-එම-	-එම-
	xviii. සෞඛ්‍ය සේවා සැපයීමේ එක් එක් මට්ටම් සඳහා (ප්‍රාථමික, ද්විතික, තෘතියික සත්කාර මට්ටම්) තුවාල, හදිසි කළමනාකරණ සඳහා අත්‍යවශ්‍ය උපකරණ හා ඖෂධ ලැයිස්තුවක් සකස් කිරීමට සැලසුම් කළද එය ඉටු කර නොතිබුණි.	-එම-	-එම-
	xix. අන්තර් රෝහල් මාරු කිරීම සඳහා අවම ප්‍රමිතීන් **(Minimum Standard for Inter Hospital Transfer)** සංවර්ධනය කිරීමට සැලසුම් කළ ද එය අවසන් කර නොතිබුණි.	-එම-	

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	xx. ප්‍රථමාධාර සඳහා ජාතික උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීමට සැලසුම් කළද එය ආරම්භ කර නොතිබුණි.	-එම-	-එම-
(ඇ)	ජාතික පිළිකා මර්දන වැඩසටහන		
	i. 2020 හා 2021 වර්ෂයන්ට අදාළ ජාතික පිළිකා ලේඛනය මුද්‍රණය කිරීමට 2023 වර්ෂය තුළ අපේක්ෂා කර තිබුණ ද 2020 වර්ෂයට අදාළ ලේඛනය පමණක් මුද්‍රණය කර තිබුණි.	-එම-	-එම-
	ii. **HHIMS** හි නියමු පිළිකා රෙජිස්ටර් මොඩියුලය **(Piloting Cancer Register Module of HHIMS)** සකස් කිරීමට 2023 වර්ෂයේ සැලසුම් කර තිබුණි.මේ සඳහා මූලික සැලසුම් කිරීම් සිදුකර තිබුණ අතර **ICTA** ආයතනය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය තොරතුරු ඒකකය හරහා **HHIMS** මත පදනම් වූ විද්‍යුත් මොඩියුලය නියමිත වේලාවට සංවර්ධනය නොකළ බැවින් පිළිකා ලියාපදිංචි කිරීමේ මොඩියුලය නිම කිරීම සිදුකර නොමැති බව දක්වා තිබුණි.	-එම-	-එම-
(ඈ)	ප්‍රතිපත්ති විශ්ලේෂණ හා සංවර්ධන අංශය ශ්‍රී ලංකා මානව රක්තපාත ප්‍රාථමික සෛල බද්ධකිරීම සහ සෛල චිකිත්සාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය **(National Policy on Human Hematopoietic Stem Cell Transplantation and Cellular Therapy in Sri Lanka)** සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දීමට 2023 වසරේ අවසන් ප්‍රතිපත්ති ලියවිලි සැකසීමට අපේක්ෂා කර තිබුණද ප්‍රතිපත්ති කෙටුම්පත පමණක් සම්පාදනය කර තිබුණි.	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි.
(ඉ)	ලෝක බැංකු ආධාර යටතේ 2019 වර්ෂයේදී ආරම්භ කර 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර තිබූ ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේදී පමණක් රු.මි.1,445 ක		

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ප්‍රතිපාදනයක් උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.		
	i. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් වූ ප්‍රාථමික සෞඛ්‍ය සේවා සපයන ආයතන හා මහ රෝහල්වල ප්‍රාථමික සෞඛ්‍ය අංශයන් වෙත අනුයුක්ත කර ඇති ජනගහනය තුළ සිටින වයස අවුරුදු 35 ට වැඩි ජනගහනයෙන් සියයට 25 ක ප්‍රමාණයක් ලියාපදිංචි කර බෝ නොවන රෝග හඳුනා ගැනීම සඳහා යොමු කළ යුතු වූවත් 2019 සිට 2023 සැප්තැම්බර් 15 දක්වා වූ කාලය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ රෝහල් 13 ක වයස අවුරුදු 35 ට වැඩි හඳුනා ගෙන තිබූ මුළු ජනගහනයෙනුත් ලියාපදිංචි කර ප්‍රතිකාර කර තිබූ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 20.4 ක් වී තිබුණි.	ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලභා කර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම DLI දර්ශකය මේ වන විටත් ළඟා කරගෙන ඇති බව.
	ii. මෙම ව්‍යාපෘතිය යටතේ වියපැහැදම් සබැඳි දර්ශක **(DLI)** අංක 08 අනුව වයස අවුරුදු 35-45 ත් අතර මුළු කාන්තා ජනගහනය ආවරණය වන පරිදි ගැබ්ගෙල පිළිකා පරීක්ෂණ සිදු කල යුතු වූවත්, අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වල 2019 වර්ෂයේ-සිට 2022 දක්වා වූ කාලය තුළ වයස අවුරුදු 35 ක් වූ මුළු කාන්තා ජනගහනයෙන් ගැබ් ගෙල පිළිකා පරීක්ෂා සිදු කර ඇති පරතරය සියයට 48-70 ක් අතර අගයක් වූ අතර 2022 වර්ෂයේදී එය සියයට 50.3 ක් දක්වා අඩු වී තිබුණි.	-එම-	DLI අංක 8 ට අදාළ දත්ත පෙන්නුම් කරන ලද වාර්තාව ඉදිරිපත් කර ඇති බව.
	iii. 2022 වර්ෂයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වශයෙන් ගත් කල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 05 ක සිදු කළ නියැදි පරීක්ෂාවන්ට අනුව එම ප්‍රතිශතයද සියයට 22-40 පරාසයක පැවති අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 15 ක සිදු කළ නියැදි	-එම-	පිළිතුරු ලබාදී නොතිබුණි.

	පරීක්ෂාවට අනුව වයස අවුරුදු 45 ක් වූ මුළු ජනගහනයෙන් ගැබ්ගෙල පිළිකා පරීක්ෂා කර තිබූ ප්‍රතිශතයේ පරාසය 05-36 ක් විය. ඒ අනුව ව්‍යාපෘතියේ වියපැහැදැම් සබැඳි දර්ශක **(DLI)** අංක ඉතා පහළ මට්ටමක පැවතීම තුළ ව්‍යාපෘතියේ ඉලක්කගත අරමුණු සම්පූර්ණ වී නොතිබුණ බැව් නිරීක්ෂණය විය.		
	iv. තඹුත්තේගම මූලික රෝහල සඳහා පවතින ලැපරොස්කොපි **(Laparoscopy)** යන්ත්‍රය පරණ සහ අක්‍රීය තත්ත්වයේ පවතින බැවින් අළුත් යන්ත්‍රයක් රෝහල වෙත ලබා දෙන ලෙස 2021 වසරේ රෝහලේ වෛද්‍ය අධිකාරි විසින් ඉල්ලීම් කර තිබුණි. ඒ අනුව අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ **(PSSP)** 2022 වසරේ අංක 631-70-04-2102-25**(iii)** දරන ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ වැය විෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර තිබුණද මිලදි ගැනීමක් සිදු නොකර 2023 වසරේදි උක්ත ව්‍යාපෘතිය යටතේම රු.47,000,000 ක ප්‍රතිපාදනයක් වෙන් කොට 2024 ජනවාරි 12 විගණිත දින වන විටත් මිලදී ගැනීමක් සිදුකර නොතිබුණි. ඒ අනුව ලැපරොස්කොපි යන්ත්‍රය මිලදී ගැනීම සඳහා වෙන්කල ප්‍රතිපාදන වසර 02 ක කාලයක් තිසිදු කාර්යයකට උපයෝජනය නොවීම මෙන්ම පැවති යන්ත්‍රය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කළමනාකරණය අපොහොසත්වීම නිසා රෝගි සත්කාර සේවාවේ කාර්යසාධනය ඉහළ නැංවීමට තිබුණු අවස්ථා එමගින් අහිමි වී තිබිණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, විධිමත් ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් තඹුත්තේගම මූලික රෝහල සඳහා Laparoscopy යන්ත්‍රයක් මිල දී ගැනීමට අවස්ථා කිහිපයකදීම කටයුතු කර ඇති බව, මේ සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කර පවතින තත්ත්වය නිවැරදි කර රෝගී සත්කාරක සේවාවේ කාර්යසාධනය ඉහල නැංවීම සඳහා කටයුතු කරන ලෙස අවශ්‍ය පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු යොදන බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வுத் திணைக்களம்
NATIONAL AUDIT OFFICE

3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය		නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	පේරාදෙණිය ශීක්ෂණ රෝහලේ ප්‍රසූතිකාගාරය තුළ 2018 වර්ෂයේ නව ශල්‍ය කාමරයක් ඉදිකර තිබූ අතර ඊට අවශ්‍ය භෞතික සම්පත් වන ශල්‍ය ඇඳක්, නිර්වින්දන යන්ත්‍රය, මොනිටර් යන්ත්‍රය යනාදී උපකරණ සපයා තිබුණ ද 2023 ඔක්තෝබර් 22 වන විටද නව ශල්‍යාගාරයේ සැත්කම් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘති සැලසුම් කිරීමේදී එම ව්‍යාපෘතිය ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය වන මානව සම්පත් සපුරා ගැනීමේ හැකියාවද සලකා බැලිය යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම රෝහලේ ප්‍රසූතිකාගාරය ඉදිකර අවශ්‍ය උපකරණ ලබා දී තිබුනද එම නව ශල්‍යාගාරය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍යම කාර්ය මණ්ඩලයේ හිඟතාවය මත පැරණි ශල්‍යාගාරය තුළදීම ශල්‍යකර්ම ඉටුකිරීම සිදු කළ බව,
(ආ)	වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් රු. මිලියන 45.28 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මගින් එහි කාර්යන් සිදු කිරීමට සැලසුම් කර තිබුණු අතර ඉන් පර්යේෂණ කටයුතු සඳහා රු. මිලියන 5 ක් පමණක් වෙන් කර තිබුණි. සම්පූර්ණ කරන ලද පර්යේෂණ කාර්යන් සඳහා හා අනුමත කරන ලද පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා රු. මිලියන 2.46 ක් පමණක් මෙම මුදලින් වියදම් කර තිබුණි.මේ අනුව වෛද්‍ය-පර්යේෂණ ආයතනය මගින් පර්යේෂණ සඳහා ප්‍රමුඛතාවයක් දක්වා නොමැති බව නිරීක්ෂණය විය.	පර්යේෂණ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකළ යුතුයි.	සැලැස්ම අනුව මහාභාණ්ඩාගාරය විසින් අවශ්‍ය මුදල් වෙන් නොකරන බැවින් වෙන් කර ඇති මුදල පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්නා මෙන් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබා-දී ඇති බව.
(ඇ)	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ මහ පෙන්වීම මත පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ තෝරා ගත් රෝහල්වල බාහිර රෝගී අංශ ජාලගත කිරීමේ තාක්ෂණික ව්‍යාපෘතිය අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීම සඳහා 2012 වර්ෂයේදී විලව්චිය සහ ඇලයාපත්තුව ප්‍රාදේශීය රෝහල් වෙත එකතු වටිනාකම රු.5,574,780 ක් වූ පරිගණක සහ උපාංග සපයා දී තිබූ අතර 2018	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු අතර මිලදී ගත් උපකරණ	නිවැරදි තත්ත්ව විශ්ලේෂණයක් සිදු කිරීමෙන් තොරව 2012 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද බව, ඒ හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වූ අතර කෙසේ වෙතත් අකාර්යක්ෂමතාව අවම කිරීම ඵලදායිතාවය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	වර්ෂයේදී කැබිතිගොල්ලෑව, පදවිය සහ කැකිරාව යන මූලික රෝහල් සඳහා ලබා දී තිබූ එකතු වටිනාකම රු.3,107,897 ක් වූ පරිගණක උපාංග වසර 05 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.	ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	ඉහළ නැංවීම සලකා අදාළ පරිගණක හා අනෙකුත් කාර්යාල උපකරණ වෙනත් රෝහල් කිහිපයක භාවිතයට ගැනීමට කටයුතු කරන ලද බව, කෙසේ නමුත් 2018 වර්ෂයේ ඩිජිටල් (**Digital**) කරන ව්‍යාපෘතිය ප්‍රමාද වී ආරම්භ කළ ද මේ වන විට ජාලගතකරණ ව්‍යාපෘතිය කාර්යාලයන් හි ක්‍රියාත්මකව වෙමින් පවතින බව.

3.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
(අ)	ජාතික **ECMO** මධ්‍යස්ථාන ඒකකය ඉදිකිරීම වෙනුවෙන් කරාපිටිය ශික්ෂණ රෝහල විසින් පුද්ගලික සමාගමක් සමඟ රු.21,002,903 ක වටිනාකමකට 2021 දෙසැම්බර් 27 දින ගිවිසුම් ගතවී තිබුණි. රෝහලේ හෘද හා උරස් ශල්‍ය දැඩි සත්කාර ඒකකය ආසන්නයේ ඉදිකිරීම් ආරම්භ කර අතරමඟ වැඩ නතර කර තිබුණු මෙම ඉදිකිරීම් වෙනුවෙන් විගණිත දින වන විට කොන්ත්‍රාත්කරුට එකතුව රු. 7,319,097 ක් ගෙවා තිබුණි. මේ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
	i. කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව 2022 ජුනි 28 දින වන විට කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් වැඩ අවසන් කර ගොඩනැඟිල්ල රෝහල වෙත භාර දිය යුතු වූවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු බැවින් විගණිත දින වන විට කොන්ත්‍රාත්කරුට ගෙවීම් වවුචර් 03 ක් මඟින් ගෙවා තිබුණු එකතුව රු.7,319,097 ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණි.	මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද මුදල ඵලදායි ලෙස උපයෝජනය සඳහා සුදුසු පියවර ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා **GELSA** නම් සංවිධානයක් පරිත්‍යාග වශයෙන් ඉටුකර දීමට එකඟවී ඇති බැවින් ඒ සඳහා පියවර ගෙන ඇති බව, කොන්ත්‍රාත්තු නතර කරන තෙක් කොන්ත්‍රාත්කරු විසින්

			ඉටුකරන ලද වැඩ සඳහා බිල්පත් 02 ත් අදාළ ගෙවීම සිදු කර ඇති බව.
	ii. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීමට අනුව රෝහල් අධ්‍යක්ෂකගේ අංක **THKA/AC/**03/53/2021 දරන හා 2022 ජුනි 28 දිනැති ලිපිය අනුව අමු ද්‍රව්‍ය මිල ගණන් හා තෙල් මිල ඉහළ යාම හේතුවෙන් ගිවිසුම්ගත මුදලට කොන්ත්‍රාත්තුව ඉටුකළ නොහැකි බවට කළ ඉල්ලීම අනුව සකස් කළ නව ඇස්තමේන්තු වටිනාකම රු. 40,918,214 ක් එනම් සියයට 194 ක් ඉහළ අගයක් ගැනීම නිසා කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට 2022 අගෝස්තු 15 දින රැස් වූ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි.	-එම-	-එම-
	iii. ඒ අනුව ගිවිසුම්ගත වටිනාකමට ඉදිකිරීම් වැඩ ඉටුකළ නොහැකි බව දැනුම් දෙන දිනය වන විට කොන්ත්‍රාත්කරු විසින් නිමකර ඇති වැඩ අයිතම වෙන වෙනම හඳුනාගෙන ඉතිරි වැඩ සඳහා පමණක් නව ඇස්තමේන්තු සකස් කළ යුතු බැවින් එම ඇස්තමේන්තුවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත් නොවූයෙන් සංශෝධිත ඇස්තමේන්තුව හා මිල විචලනය සම්බන්ධයෙන් ගැටළු පවතින බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.	මෙම සියළුම තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.	-එම-
	iv. විගණන භෞතික පරීක්ෂා කළ දින වන විට කොන්ත්‍රාත්කරු විසින් ගොඩනැගිල්ලේ බිම් මහලේ පාදම, **Slab** මට්ටම දක්වා කණු හා **Slab** එක දැමීම පමණක් නිමකර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් වැඩ ආරම්භ කර මාස 06 ක් එනම් ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කිරීමට නියමිත දිනය වන විට කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරීම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය සියයට 35 කට වඩා අඩු බව නිරීක්ෂණය විය. ඒ අනුව කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරීම් වැඩවල අසාමාන්‍ය ප්‍රමාදය හේතුවෙන් පළමු ඇස්තමේන්තුව ප්‍රකාරව	මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	-එම-

1961
NAVA
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ඉදිකිරීම් වැඩ අවසන් කිරීමට නොහැකි වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව රෝහලේ වගකිව යුතු නිලධාරීන්ගේ අධීක්ෂණය කිරීමේ හා පසුවිපරම් කිරීමේ කටයුතුවල දුර්වලතා හේතුවෙන් නියමිත දිනට ඉදිකිරීම් වැඩ අවසන් කර ගැනීමට නොහැකි වී ඇති බවත් ඒ හේතුවෙන් නව ඇස්තමේන්තුව යටතේ වැඩ නිම කිරීමට යාමේදී රජයේ මුදල් වැඩිපුර වියදම් කිරීමට සිදුවන බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය.		
	v. හෘද උරස් ශල්‍ය ඒකකයේ සිටින ජ්‍යෙෂ්ඨතම හෘද උරස් ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයාගේ කාර්ය මණ්ඩල කිසිවෙකුගේ හෝ අනෙකුත් කාර්ය මණ්ඩලයේ එකඟතාවයෙන් තොරව හා දැනට පවතින හෘද උරස් ශල්‍ය දැඩි සත්කාර ඒකකයේ සායනික හා වාස්තු විද්‍යාත්මක පරිසරය විනාශ කරමින් මෙම **ECMO** මධ්‍යස්ථානය ඉදිකිරීම ආරම්භ කර ඇති බවට අදාළ පාර්ශවයන්ගෙන් ලිඛිත හා වාචික සාක්ෂි විගණනයට ඉදිරිපත් වූයෙන් අදාළ ඉදිකිරීම සම්බන්ධයෙන් සිදුකරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ, අනුමත ගෘහ නිර්මාණ සැලසුම්වල හා සහතික කළ පිටපත් මෙන්ම ඉදිකිරීම් සඳහා ලැබුණු තාක්ෂණික හා සායනික නිර්දේශයන්වල හා විධිමත් අනුමැතිය ලබා දීමේ ලිපිවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	-එම-	-එම-
	vi. හෘද උරස් ශල්‍ය ඒකකයේ විශේෂඥ වෛද්‍යවරයා විසින් දිගින් දිගටම මෙම **ECMO** ඒකකය ඉදිකිරීම මගින් හෘද උරස් ශල්‍ය දැඩි සත්කාර ඒකකයට හා අදාළ රෝගීන්ට සිදුවන හානිදායක තත්ත්වයන් පිළිබඳව රෝහල් අධ්‍යක්ෂවරයා නිරන්තරයෙන් ලිඛිතව දැනුවත් කර තිබියදී, ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයකින් හෝ ශක්‍යතා වාර්තාවක් මගින් තොරතුරු අනාවරණය කර ගැනීමෙන් තොරව මෙම ඉදිකිරීම සිදුකර ඇති	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	බවත්, එය හෘද උරස් ශල්‍ය රෝගීන්ට අහිතකර ලෙස බලපාන බවත් නිරීක්ෂණය වූ අතර, හෘද උරස් ශල්‍ය ඒකකයේ විශේෂඥ වෛද්‍යවරයා සමඟ විගණනය සිදුකළ සාකච්ඡාවේදී හා ලබාගත් ලිඛිත හා වාචික සාක්ෂි අනුව ඒ බව වැඩිදුරටත් පැහැදිලි වන බවට නිරීක්ෂණය විය.		
(ආ)	වැය විෂය අංක 111-2-13-69-2104 යටතේ මුල්ලේරියාව මූලික රෝහල තුළ ජාතික ආඝාත ප්‍රතිකාර මධ්‍යස්ථානයක් (National Stroke Treatment Centre) ඉදිකිරීම සඳහා රු.මිලියන 60 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ අතර කොන්ත්‍රාත්කරු සමඟ මිල ගණන් නොගැලපීම හේතුවෙන් එම ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවා තිබුණු අතර 2022 වර්ෂයේදී ලැබුණු බිල්පත් පියවීමට රු.26,412,267 ක් වියදම් කර තිබුණි.	මේ පිළිබඳව පරීක්ෂා කර දරන ලද මුදල ඵලදායී ලෙස උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.
(ඇ)	වැය විෂය අංක 111-02-13-012-2104 (11) යටතේ රේඛීය අමාත්‍යාංශය මඟින් පාලනය කරණු ලබන රෝහල්වල හදිසි ප්‍රතිකාර අංශ (ETU) සංවර්ධනය කිරීමට 2023 වර්ෂයේ අපේක්ෂා කර තිබුණද ප්‍රදානය කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති 07 ක් තාවකාලිකව අත්හිටුවා තිබුණි.	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි.
(ඈ)	රු.මිලියන 61 ක් වියදම් දරන ලද කළුතර ශික්ෂණ රෝහලේ වෛද්‍ය වාට්ටු සංකීරණයේ ඉදිකිරීම් නවතා තිබුණු අතර රු.මිලියන 25 ක් වියදම් දරන ලද හලාවත මහ රෝහලේ මහල් 6 ක වෛද්‍ය වාට්ටු සංකීරණයේ ඉදිකිරීම්ද නවතා තිබුණි.	-එම-	කළුතර ශික්ෂණ රෝහලේ වෛද්‍ය වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය සමඟ සාකච්ඡා කර නැවත වැඩ ආරම්භ කිරීමට එකඟතාවය පළකොට ඇති බව, ඒ අනුව ලබා දී ඇති අත්තිකාරම් මුදලට සරිලන ලෙස වැඩ ආරම්භ කර ඉතිරි වැඩ කොටස් 2025 අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් නිම කිරීම අපේක්ෂා කරන බව, හලාවත මහ රෝහලේ මහල් 6ක වෛද්‍ය වාට්ටු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			සංකීර්ණය මහාචාර්ය ඒකකයක් ලෙස ස්ථාපනය කිරීමට පෞද්ගලික ආයෝජකයෙකු සමඟ සාකච්ඡා කර ඇති අතර එම ආයෝජකයා ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමට එකඟතාව පළකර ඇති බව, ඒ අනුව තීරණය ලැබෙනතුරු ගොඩනැඟිල්ල ඉදිකිරීම් කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇති අතර 2024 වර්ෂය සඳහා රු.මි. 200 ක ප්‍රතිපාදන වෙන්කර ඇති බව.

3.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
(අ)	කරාපිටිය ශික්ෂණ රෝහලේ රක්ත කාන්දු පෙරණ ඒකකය හා වකුගඩු රුධිරවාහිනී බද්ධ කිරීමේ ඒකකය ස්ථාපිත කිරීම වෙනුවෙන් රු.790,081,600 ක් වටිනා ඇස්තමේන්තුවක් මත මහල් 8කින් සමන්විත ගොඩනැඟිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2014 අගෝස්තු 13 දින වැඩ ආරම්භ කර තිබුණු අතර, 2023 ජුනි 02 විගණිත දින වන විට ඉදිකිරීම් ආරම්භ කර වසර 08 ක් ඉක්ම ගියද, ඇස්තමේන්තු ප්‍රකාරව ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණු අතර, ගොඩනැඟිල්ල විධිමත් පරිදි කරාපිටිය ශික්ෂණ රෝහල වෙත භාර දීමට එහි කොන්ත්‍රාත්කරු විසින් කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.	-	-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	i. ගොඩනැඟිල්ලෙහි ඉදිකිරීම් වැඩ 2014 අගෝස්තු 13 දින ආරම්භ කර 2016 පෙබරවාරි 13 දින වැඩ අවසන් කළයුතු වූවද, අදාළ දිනට වැඩ අවසන් කර නොතිබුණි. රෝහල් අධ්‍යක්ෂකගේ අංක AC/03/2014 දරන හා 2019 දෙසැම්බර් 06 දිනැති ලිපියේ 02 ඡේදය ප්‍රකාරව, මෙම ගොඩනැඟිල්ල 2018 ජනවාරි 03 දින විවෘත කිරීමට සැලසුම් කර තිබුණද, නියමිත පරිදි වැඩ අවසන් කිරීමට නොහැකිවීම මත 2020 දෙසැම්බර් 30 ගොඩනැඟිල්ල රෝහල වෙත භාරදීමට නියමිතව තිබුණි. එදිනටද කොන්ත්‍රාත්කරු විසින් වැඩ අවසන් කර ගොඩනැඟිල්ල භාර දී නොතිබුණු අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දීමේ ලිඛිත සාක්ෂි හෝ දින දීර්ඝ කළ කාලය තුළ වැඩ අවසන් කිරීමේ සැලැස්ම පිළිබඳ සාක්ෂි කිසිවක් ලිපිගොනුව සතු නොවන බව නිරීක්ෂණය විය.	මෙම ව්‍යාපෘතියේ වැඩ කොටස් නිමකර කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, රක්ත කාන්දු පෙරණ ඒකකය හා වකුගඩු රුධිර වාහිනී බද්ධ කිරීමේ ඒකකයේ ඉදිකිරීම් සම්බන්ධව කොන්ත්‍රාත් පාලනය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබන අතර අප රෝහල් භූමිය තුළ ඉදිකරන මෙම ගොඩනැඟිලි සම්බන්ධයෙන් අපගේ නිරීක්ෂණ අවශ්‍ය අවස්ථා වලදී පමණක් අමාත්‍යාංශය වෙත ලබාදෙන බව, රක්ත කාන්දු පෙරණ හා වකුගඩු රුධිරවාහිනී බද්ධ කිරීමේ ඒකකය වර්ෂ 2018 .01.08 දින විවෘත කිරීමට නියමිත බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය සේවා අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ **DDG(PHS)**/01/**P**/1/2017 හා 2017.06.08 දිනැති ලිපියෙන් දන්වා ඇති බව, ඒ අනුව අවශ්‍ය උපකරණ රෝහල වෙත ලබා ගැනීමේ කටයුතු කර ඇති බව, උපකරණ _මිලදී ගැනීම සිදු කළත් බලාපොරොත්තු වූ ලෙස ගොඩනැඟිල්ල නිමකර රෝහල වෙත භාරනොදුන් බැවින් එම ඒකක ආරම්භ වන තුරු අදාළ ස්ථානවල තබා ගැනීමට සිදුවූ බව, ශල්‍යාගාරයේද යම් යම් අඩුපාඩු තිබූ හෙයින් ශල්‍යාගාරය ආරම්භ කිරීමට නොහැකි වීඇති බව, මෙම ඒකක දෙක ආරම්භ කිරීම ප්‍රමාදවීමට රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය ද හේතු වූ බව, ගොඩනැගිල්ලේ වැඩ කටයුතු සියයට 98 ක්

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வுத் அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	-	-	අවසන් කර එහි දැඩි සත්කාර ඒකකය හා ශල්‍යාගාරය හැර ඉතිරි කොටස් විධිමත්ව රෝහල වෙත භාර දී භාවිතයට ගනිමින් ඇති බව, ඉතිරි සුළු වැඩකොටස් 2024 වර්ෂයේ අවසන්කර සියළුම අංශ රෝහල වෙත පවරාදීමට කටයුතු සිදුකරමින් පවතින බව, මේ වන විට ඉතිරි වැඩ කොටස් ඉදි කිරීම ආරම්භ කර ඇති අතර ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බව, ගොඩනැගිල්ලේ මධ්‍යම වායුසමීකරණ පද්ධතියෙන් අභ්‍යන්තර ස්ථානවලට ජලය කාන්දු වීම මේ වන විට නිවැරදි කර ඇති බව, ඉදිකිරීම්වල අඩුපාඩු සකස් කරන ලෙස කොන්ත්‍රාත් කරුවෙත විවිධ අවස්ථාවලදී දැන්වූවද හිඟ බිල්පත් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් එම අඩුපාඩු සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත්කරු කටයුතු කර නොකළ බව, 2023 වර්ෂයේ දෙසැම්බර් මස දී, ගෙවීමට තිබූ හිඟ බිල්පත් ගෙවීමෙන් අනතුරුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය මගින් මේ වන විට අඩුපාඩු පිළිසකර කොට ඇති බව.
	ii. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වැඩ අවසන් කිරීමට ප්‍රථම රක්ත කාන්දු පෙරණ ඒකකයට හා වකුගඩු රුධිරවාහිනී බද්ධ කිරීමේ ඒකකයට අවශ්‍ය එකතුව රු.198,865,893 ක්වූ ශල්‍ය හා වෛද්‍ය උපකරණ හා කාර්යාල උපකරණ මිලදීගෙන තිබුණු අතර, 2023 ජූනි 02 විගණිත දින වන විට ඒවා ගොඩනැගිල්ලේ තැනින් තැන ගොඩගසා නිෂ්කාර්යයව පැවතුණි.	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	iii. රක්ත කාන්දු පෙරණ ඒකකයට හා වකුගඩු රුධිරවාහිනී බද්ධ කිරීමේ ඒකකයට 2018 වර්ෂයේදී මිලදීගෙන තිබුණු එකතුව රු. 83,575,671 ක්වූ කාණ්ඩ 20 කට අදාළ ශල්‍ය හා වෛද්‍ය උපකරණ අයිතම 114 ක් 2023 ජුනි 02 විගණිත දින වන විටත් නිෂ්කාර්යව පැවතුණු අතර, එම උපකරණ සියල්ලේම වගකීම් කාලය (Warranty Period) උපයෝජනයට පෙර සිටම අවසන් වී තිබුණි.	-එම-	-එම-
	iv. රක්ත කාන්දු පෙරණ ඒකකය හා වකුගඩු රුධිරවාහිනී බද්ධ කිරීමේ ඒකකය සඳහා මිලදී ගෙන තිබුණු ඇතැම් ශල්‍ය, වෛද්‍ය හා අනෙකුත් උපකරණ කිහිපයක් රෝහලේ වෙනත් ඒකකවල වාට්ටු හා ප්‍රතිකාර අංශවල භාවිතයට නිකුත් කර තිබුණු බැවින් එම උපකරණ මිලදී ගැනීමේ අරමුණුවලට පරිබාහිර අරමුණු වෙනුවෙන් අවිධිමත් ලෙස භාවිතා කර තිබුණු බවට නිරීක්ෂණය විය.	-එම-	-එම-
	v. ගොඩනැගිල්ලේ ස්ථාපිත කර තිබුණු මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය තුළින් ජලය ගොඩනැගිල්ලේ අභ්‍යන්තර ස්ථානවලට කාන්දු වෙමින් පැවතුණ බවත්, ඒ හේතුවෙන් ගොඩනැගිලි බිත්ති, සිවිලිම හා භූමිය මෙන්ම ශල්‍යාගාර, රෝගී ප්‍රතිකාර වාට්ටු, ඖෂධ ගබඩා, ශල්‍ය හා වෛද්‍ය උපකරණවලට හා කාර්යාල උපකරණවලට අහිතකර ලෙස බලපෑම් එල්ල කර ඇති බවට නිරීක්ෂණය වූයෙන් ඒ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු.73,450,329 ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණු බවට නිරීක්ෂණය විය.	මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් පිළිබඳව ස්වාධීන පරීක්ෂණයක් සිදුකළ යුතුය.	-එම-
	vi. ඉදිකිරීම් ව්‍යාපෘති ඉංජිනේරු ඇමතූ රෝහල් අධ්‍යක්ෂගේ අංක THKA/A/3/21/2019/II දරන හා 2022 මැයි 05 දිනැති ලිපිය ප්‍රකාරව වායුසමීකරණ පද්ධතිය තුළින් සිදුවන ජල කාන්දුව හා	-එම-	-එම-

	ගොඩනැඟිල්ලෙහි තිබුණු ඇතැම් ඉදිකිරීම් අඩුපාඩු පිළිසකර කරන ලෙස දැනුවත් කර තිබුණද, 2023 ජුනි 02 වගණිත දින වන විටත් එම අඩුපාඩු නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරු කටයුතු කර නොතිබුණු අතර, ඉදිකිරීම් ගොඩනැඟිල්ල තුළ දැනට පවත්වාගෙන යන සායනවලට අහිතකර බලපෑමක් එල්ල කර තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.		
(ආ)	කරාපිටිය ශික්ෂණ රෝහල තුළ විවිධ ව්‍යාපෘති වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කර ඇති එකතුව රු. මිලියන 4,133.5 ක් වූ ගොඩනැඟිලි 05 ක් වෙනුවෙන් වගණිත දින වන විට කොන්ත්‍රාතකරුවෙකුට ව්‍යාපෘති 03 වෙනුවෙන් එකතුව රු. මිලියන 1,361.7 ක් ගෙවා තිබුණු අතර ව්‍යාපෘති 02 වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට ගෙවූ මුදල් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.		
	i. කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව වගණිත දින වන විට වැඩ අවසන් කර භාරදිය යුතු එකතුව රු. මිලියන 4,133.5 ක්වූ ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන 1,361.7 ක් ගෙවා තිබුණද වැඩ අවසන් කර නොතිබුණු අතර, ප්‍රමාද කාලය මාස 06 ත් 34 ත් අතර විය. ඒ අනුව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණු මුදල් නිශ්කාර්ය වියදම් වී තිබුණු බව නිරීක්ෂණය විය.	මෙම ව්‍යාපෘති සඳහා වැයකළ මුදල් ඵලදායි කර ගැනීමට පියවර ගත යුතුය.	ළමා වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් අත්තිවාරම් මට්ටම දක්වා ඉදිකරීම් කර ඇති අතර ඉතිරි ඉදිකිරීම් කටයුතු මහා පරිමාණ ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණ - හා වේගවත් කිරීමේ බලතල සහිත නිලධාරී කමිටුව **(RAMP)** මගින් අත්හිටුවීමට තීරණය කර ඇති බව, දන්ත වාට්ටු සංකීරණය ඉදිකිරීම් **(RAMP)** කමිටුව මගින් තාවකාලිකව ගොඩනැඟිල්ල ඉදිකිරීම අත්හිටවූ අතර ඉදිකිරීම් පාරිසරික හානිවලින් වැළැක්වීම සඳහා ආරක්ෂා කිරීමට අවශ්‍ය උපදෙස් කොන්ත්‍රාත්කරු වෙත ලබා දී ඇති බව, වකුගඩු ඒකකයේ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			ඉදිකිරීම් කටයුතු මේ වර්ෂය තුළ නිම කිරීමට කටයුතු කර ඇති බව, ශල්‍ය වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් සියයට 49 ක් පමණ අවසන් කර තිබූ අතර **(RAMP)** කමිටුව මගින් ඉදිකිරීම් අත්හිටුවන ලද බව, නමුත් මෙම ශල්‍ය වාට්ටු සංකීර්ණයේ අවශ්‍යතාවය ඉතා දැඩිව පවතින හෙයින් අංක: අමප/24/0150/610/006 හා 2024.02.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉතිරි වැඩ කොටස්වල ඉදිකිරීම කටයුතු 2024 වර්ෂයේදී ආරම්භ කර ඇති බව, අසාත ඒකකය ප්‍රයෝජනයට ගැනීමට හැකිවන පරිදි 2023 වර්ෂයේ වැඩ නිම කර රෝහලට භාරදුන් අතර ඉහළ මාලයේ ස්වසන රෝග ප්‍රතිකාර ඒකකයක් ලෙස ඉදිකිරීම කටයුතු සිදු කිරීම 2024 වර්ෂයේ ආරම්භ කර ඇති බව, ළමා වාට්ටු සංකීර්ණය හැර අනෙකුත් වාට්ටු සංකීර්ණ ප්‍රයෝජනයට ගතහැකි ආකාරයට ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු නිම කිරීම මේ වන විට ආරම්භ කර ඇති බව,
	ii.	විගණිත දින වන විට වැඩ අවසන් කළ යුතු ඉදිකිරීම් ව්‍යාපෘති වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණු එකතුව රු.මිලියන 681.4 ක්වූ වැඩ අත්තිකාරම්වලින් රු. මිලියන 334.2 ක් ආපසු අයකර ගෙන නොතිබුණි. ඒ අනුව රජයේ මුදල් කොන්ත්‍රාත්කරුවන් ළඟ දීර්ඝ කාලයක් නිශ්කාර්යව පැවති බවත්, අත්තිකාරම් බැඳුම්කරවල කාලය දීර්ඝ කිරීම හෝ රජයට පවරා	මෙම අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ගැනීම සම්බන්ධ සාක්ෂි හෝ කිසිවක් විගණනයට ඉදිරිපත් නොවූණි.		
	iii. විගණිත දින වන විට වැඩ අවසන් කළ යුතු එකතුව රු.මිලියන 3,274.6 ක්වූ ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු අගයක් ගෙන තිබුණු අතර එම ව්‍යාපෘතිවල වැඩ කඩිනමින් අවසන් කර මහජන භාවිතයට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘති සඳහා වැයකළ මුදල් ඵලදායි කර ගැනීමට පියවර ගත යුතුය.	-එම-
	iv. ඉහත විගණන නිරීක්ෂණ අනුව රෝහලේ ආරම්භ කර ඇති ඉදිකිරීම් ව්‍යාපෘතිවල වැඩ අවසන් නොකිරීම නිසා එම ව්‍යාපෘති ආරම්භ කිරීමට පදනම් වූ අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීමට නොහැකි වී ඇති බවත්, ඒ වෙනුවෙන් වැයකරන ලද රජයේ මුදල් නිශ්කාර්ය වියදම් වී ඇති බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය.	-එම-	-එම-
(ඇ)	රසායනාගාර සේවා අංශය යටතේ නියැදි ප්‍රවාහනයට අදාළ මාර්ගෝපදේශ සකස් කිරීමට සැලසුම් කළද එය අවසන් කර නොතිබුණි.	මෙම කටයුතු සැලසුම් කළ පරිදි සිදුකළ යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.
(ඈ)	ශ්‍රී ලංකාවේ බරවා රෝගය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සඳහා 2023 වසරේ අවසන් ප්‍රතිපත්ති ලියවිලි සැකසීමට අපේක්ෂා කළ ද එය ඉදිරි වර්ෂ 02 තුළදී සිදු කිරීමට කල් දමා තිබුණි.	-එම-	බරවා මර්දන ව්‍යාපාරයට අදාල ශ්‍රී ලංකාවේ බරවා රෝගය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සඳහා 2023 වසරේ අවසන් ප්‍රතිපත්ති ලියවිලි සැකසීමට අපේක්ෂා කර තිබූ නමුත් එය සකස් කරමින් පවතින අවස්ථාවේ ඇතිවූ ගැටළු කිහිපයක් හේතුවෙන් අදාළ කාර්යය කල් තැබීමට සිදුවූ බව, අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කරන විට හදුනාගත් දිස්ත්‍රික්ක හා දැනට බරවා රෝගය පවතින හා නොපවතින

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			දිස්ත්‍රික්කවල එම අදාළ සේවාවන් පවත්වාගෙන යාමට මානව සම්පත් හා අනෙකුත් භෞතික සම්පත්වල ගැටළුකාරී තත්ත්වයක් මතුවී ඇති බව,
(ඉ)	ශ්‍රී ලංකාවේ මානව ජලභීතිකා රෝගය තුරන් කිරීම පිළිබඳ කෙටුම්පත් ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමට 2023 වර්ෂය තුළ සැලසුම් කර තිබුණද 2024 වර්ෂයට එය කල් දමා තිබුණි.	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි.
(ඊ)	මුල්ලේරියාව නැගෙනහිර කොළඹ මූලික රෝහල තුළ රු.මිලියන 813 ක ඇස්තමේන්තු වියදමක් සහිත ඉහල ප්‍රමුඛතා ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 07 ක් 2023 වර්ෂය තුළ සම්පූර්ණ කර නොතිබූ අතර රු. මිලියන 904 ක ඇස්තමේන්තු වියදමක් සහිත ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 16කින් ව්‍යාපෘති 13 ක් වර්ෂය තුළ ආරම්භ කර නොතිබුණි.	-එම-	එකඟ නොවන බව, 2023 වර්ෂය සඳහා මෙම රෝහලේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ඉහත වැඩ විෂයයන් සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් සිදු කරනු ලබන අතර ජාතික සැලසුම් අනුමැතිය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් අදාළ ලේඛන අමාත්‍යාංශ සැලසුම් අංශය වෙත ඉදිරිපත් කර ඇති බව, එහි සියලුම කටයුතු සිදු කරනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් බව, ඒ සඳහා මෙම රෝහලේ කිසිදු මැදිහත්වීමක් සිදු නොකරන අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම මත ජාතික සැලසුම් පද්ධතියට මෙම අංශ ඇතුළත් කිරීම සඳහා භූමිය පමණක් මෙම රෝහල මගින් ලබා දී ඇති බව. තවද මිලියන 904 ක ඇස්තමේන්තුගත වියදම් සහිත ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 16 ක් ආරම්භ කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් කර තිබුණද ඉහත සඳහන් කරන ලද ව්‍යාපෘති සඳහා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			ඇස්තමේන්තු කර ඇති මිලියන 800 ට අමතරව ඉතිරි මිලියන 104 න් මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීම, පල්දෝරු පද්ධතියේ අළුත්වැඩියා කටයුතු සහ හෙද නේවාසිකාගාරයේ අළුත්වැඩියා කටයුතු සඳහා 2023 වර්ෂය තුල ප්‍රතිපාදන ලැබී ඇති අතර අනෙකුත් වැඩ විෂයයන් සඳහා 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලැබී නොමැත.
(උ)	බදුල්ල පළාත් මහ රෝහලේ මහල් 10 කින් යුතු වකුගඩු සත්කාර ඒකකය සඳහා දරන ලද වියදම රු.මි.61 ක්වූ අතර එහි ඉදිකිරීම් නවතා තිබුණි.	මෙම ව්‍යාපෘති සඳහා වැයකළ මුදල් ඵලදායි කර ගැනීමට පියවර ගත යුතුය.	වකුගඩු සත්කාර ඒකකය ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ඒකකය ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කරමින් ඇති බව.
(ඌ)	රු.මි.339 ක වියදමක් දරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ මහල් 20 කින් යුතු හෙද පීයයේ ඉදිකිරීම්වල දුර්වල ප්‍රගතියක් ඇති බව වාර්තා කර තිබුණි.	-එම-	මෙහි ඉදිකිරීම කටයුතු **(RAMP)** කමිටුව මගින් තාවකාලිකව 2022 වර්ෂයේ දී අත්හිටුවා ඇති බව.
(එ)	2022 වර්ෂයේදී කරාපිටිය ශික්ෂණ රෝහල විසින් ඖෂධ හා ශල්‍ය පාරිභෝජ්‍යය ද්‍රව්‍ය මිලදී ගැනීමට වෛද්‍ය සැපයුම් අංශය වෙත අනුමැතිය සඳහා යොමු කරන ලද අවස්ථා 113 කදී එකතුව රු.15,815,499 ක් වූ ඒකක 13,785 ක් සඳහා Pronto පරිගණක පද්ධතිය මගින් අනුමැතිය ලබා දීමට දින 02 සිට දින 55 ක් දක්වා වූ ප්‍රමාද කාලයක් ගෙන තිබුණු අතර අවස්ථා 86 කදී ඒකක 136,502 ක් රෝහල වෙත මිලදී ගැනීම වෙනුවෙන් එකතු වටිනාකම රු.11,902,432 ක් වූ ඇණවුම් සැපයුම්කරුවන් වෙත ලබා දී රෝහල වෙත සැපයීමට දින 02 සිට දින 142 ක් දක්වා වූ ප්‍රමාද කාලයක් සැපයුම්කරුවන් විසින් ගෙන තිබුණි.	මෙම ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.	විශේෂඥ වෛද්‍යවරුන් විසින් කරාපිටිය ශික්ෂණ රෝහලේ ඖෂධවේදීන් වෙත ප්‍රාදේශීයව මිලදී ගැනීම සඳහා යොමු කරනු ලබන ඖෂධ ඇනවුම් **PRONTO** පද්ධතිය හරහා වෛද්‍ය සැපයුම් අංශය වෙත අනුමැතිය සඳහා යොමු කරනු ලබන බව, ඒ සඳහා වෛද්‍ය සැපයුම් අංශයෙන් අනුමැතිය ලබා ගැනීමේදී අදියර 03කින් අනුමත වීම අවශ්‍යවන අතර ඒ සඳහා යම්කිසි කාලයක් ගත වෙයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඒ)	2023 වර්ෂයේදී කරාපිටිය ශික්ෂණ රෝහල විසින් ඖෂධ හා ශල්‍ය පාරිභෝජ්‍යය ද්‍රව්‍ය මිලදී ගැනීමට වෛද්‍ය සැපයුම් අංශය වෙත අනුමැතිය සඳහා යොමු කරන ලද අවස්ථා 72 කදී එකතුව රු.12,203,835 ක් වූ ඒකක 27,375 ක් සඳහා Pronto පරිගණක පද්ධතිය මගින් අනුමැතිය ලබාදීමට දින 02 සිට දින 42 ක් දක්වා වූ ප්‍රමාද කාලයක් ගෙන තිබුණු අතර අවස්ථා 72 කදී ඒකක 17,128 ක් රෝහල වෙත මිලදී ගැනීම වෙනුවෙන් එකතු වටිනාකම රු.17,203,081 ක් වූ ඇණවුම් සැපයුම්කරුවන් වෙත ලබා දී රෝහල වෙත සැපයීමට දින 02 සිට දින 160 ක් දක්වා වූ ප්‍රමාද කාලයක් සැපයුම්කරුවන් විසින් ගෙන තිබුණි.	-එම-	සැපයුම්කරුවන් සතුව රෝහලේ අවශ්‍යතාව පිරිමැසීම සඳහා අවශ්‍ය තරම් ඖෂධ තොග ගබඩා කර නොමැති අවස්ථාවල අප ලබාදුන් ඇනවුම් අනුව ඔවුන් ඖෂධ සමාගම් වෙතින් ඖෂධ ලබාගෙන රෝහල වෙත ලබා දීමේදී යම්කිසි කාලයක් ගතවන බව, මිලගණන් කැඳවීමේදී සැපයුම්කරුවන් වෙත ඖෂධ තොග තිබුනද අප විසින් ඇනවුම් කරන අවස්ථාව වන විට එම තොග අලෙවිකර අවසන් වීම හේතුවෙන් ද ප්‍රමාදවීම් සිදුවන බව, හැකි උපරිම ඉක්මනින් රෝගියා වෙත ප්‍රාදේශීයව මිලදී ගත් ඖෂධ ලබා දීමට පියවර ගෙන ඇති බව, මෙසේ මිලදී ගෙන ඇති අයිතමයන් බොහොමයක් හදිසි අවශ්‍යතා නොවන අතර, රෝහලේ නිතරම පැවතිය යුතු අත්‍යවශ්‍ය ඖෂධ වෛද්‍ය සැපයීම් අංශයේ නොමැති අවස්ථාවලදී අවම තොග තත්ත්වය පවත්වාගැනීම සඳහා මිලදී ගන්නා ලද අයිතමයන් බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.1.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය		නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2020 හා 2021 වර්ෂවලදී ආරම්භ කර කරාපිටිය ශික්ෂණ රෝහල තුළ ක්‍රියාත්මක කර තිබුණු රු.1,333,707 ක් වූ හදිසි නඩත්තු හා ඉදිකිරීම් ව්‍යාපෘති 15 ක් 2023 මැයි 30 විගණිත දින වන විටත් අවසන් කර නොතිබුණි.	මෙම ව්‍යාපෘති සඳහා වැයකළ මුදල් ඵලදායි කර ගැනීමට පියවර ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, මෙම කාලපරිච්ඡේදයේ රටේ පැවැති ආර්ථික අර්බුදය තුළ කොන්ත්‍රාත් කටයුතු නතර කරන ලද බව, ගෙවීම් කර ඇත්තේ එතෙක් නිම කර ඇති ප්‍රමාණයන් මත CECB නිර්දේශ මත බව, තව ද මෙම කොන්ත්‍රාත් අතුරින් තෝරා ගත් කොන්ත්‍රාත් පමණක් මූල්‍ය/ ප්‍රාග්ධන ප්‍රතිපාදන තත්ත්වය සලකා බලා නැවත ඉදිකිරීම් ආරම්භ කර ඇති බව.
(ආ)	කරාපිටිය ශික්ෂණ රෝහල තුළ ක්‍රියාත්මක ඇස්තමේන්තු වටිනාකමේ එකතුව රු.63,100,000 ක්වූ කර්මාන්ත 10 ක වැඩ අවසන් කිරීමට 2023 මැයි 30 විගණිත දිනය වන විටත් කොන්ත්‍රාත්කරුවන් විසින් කටයුතු කර නොතිබුණු අතර වසර 1 ත්-2 ත් අතර කාලයක සිට එම ඉදිකිරීම් අතරමග නතර කර තිබුණි.	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வுத் அலுவலகம்
NATIONAL AUDIT OFFICE

3.1.7 අරමුදල් නොමැති වීම හේතුවෙන් ක්‍රියාත්මක නොකරන ලද ක්‍රියාකාරකම්

විගණන නිරීක්ෂණය		නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානය 2023 වර්ෂය තුළ රුධිර ප්‍රවාහන සේවා වැඩිදියුණු කිරීම වෙනුවෙන් වාහන 5ක් (Mini Coaches) මිලදී ගැනීමට අපේක්ෂා කර තිබුණද අරමුදල් නොමැති වීම හේතුවෙන් එය මිලදීගෙන නොතිබුණි.	මෙම කටයුතු සැලසුම් කළ පරිදි සිදුකළ යුතුය.	2023 වර්ෂය තුළ ජාතික රුධිර පාරවිලයන සේවය වෙත වාහන මිල දී ගැනීම වෙනුවෙන් කිසිදු වැය කාණ්ඩයක් යටතේ ප්‍රතිපාදනයක් නිදහස් කර නොමැති බව.
(ආ)	පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහල සඳහා ඉතා හදිසි අවශ්‍යතාවයක්ව තිබුණු නිර්විර්ත්දන යන්ත්‍රයක් මිලට ගැනීම සඳහා රු.මි.20 ක් ඇස්තමේන්තු කර තිබුණද, ප්‍රතිපාදන 4 වන කාර්තුව තුළ ලැබීම හේතුවෙන් එය වසර තුළ මිලදීගෙන නොතිබුණි.	-එම-	නිර්විර්ත්දන යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ජාතික තරහකාරී ලංසු කැඳවීම් ක්‍රමය උපයෝගි කර ගන්නා ලද අතර 2023.09.27 දින ලංසු විවෘත කරන ලද බව, මිල ගණන් ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත 2023.10.04 දින භාර දෙන ලද බව, එම මිල ගණන් සඳහා තාක්ෂණික ඇඟයීම් කමිටුව විසින් නිර්දේශිත සමාගම වන **Dimo** ආයතනය වෙතින් **NMRA** සහතිකය ලබා ගැනීමෙන් අනතුරුව ඇණවුම ඉදිරිපත් කරන ලෙස 2023.11.01 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබා දෙන ලද බව, 2023.12.22 දිනය වන විටත් **NMRA** සහතිකය අදාළ සමාගම විසින් ලබා නොදුන් නිසා ඒ බව නැවත ඇගයීම් කමිටුව වෙත දන්වා සිටින ලද බව, කෙසේ වෙතත් වර්ෂ අවසාන වන විටත් **NMRA** සහතිකය නොතිබුණු නිසා

			අවසන් කාර්තුවේ මෙම යන්ත්‍ර මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන තිබුණද රෝහල විසින් යන්ත්‍රය ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබුණද එම වසරේදී අදාළ යන්ත්‍රය මිලදී ගැනීම හැකියාවක් නොලැබුණු බව.
(ඇ)	ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ව්‍යාපෘති 145 කින් ව්‍යාපෘති 32 ක් අරමුදල් නොමැති වීම හේතුවෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.	-එම-	2023 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා 2022 වර්ෂයේ අග භාගයේදී ජාතික සෞඛ්‍ය විද්‍යායතනය යටතේ ඇති සෞඛ්‍ය ආයතන වලින් හා ආයතනය අභ්‍යන්තරයේ ඇති එක් එක් ඒකක වලින් ඔවුන්ගේ අවශ්‍යතාවයන් ලබා ගැනීම සිදු කරන ලද බව, පසුව ඒවාගේ ප්‍රමුඛතාවය අනුව පෙල ගැස්වීම සිදුකර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සිදු කරන ලද බව, සිදු කිරීමට බලාපොරොත්තු වූ ව්‍යාපෘති සඳහා සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණයම එම වර්ෂය තුලදී නොලැබුන බැවින් ප්‍රමුඛතාවය පදනම් කර ගනිමින් ලැබුණු ප්‍රතිපාදන මගින් ව්‍යාපෘති සිදු කරනු ලැබූ බව, එහිදී සිදු කර ගැනීමට නොහැකි වූ ව්‍යාපෘති නැවත 2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ගන්නා ලද බව, මේ වන විට 2024 වර්ෂය සඳහා කොටස් වශයෙන් වරින් වර දේශීය හා විදේශීය ප්‍රතිපාදන ලැබෙමින් පවතින බැවින් ලැබෙන ප්‍රතිපාදන මගින් 2023 වර්ෂයේ සිදු

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			කර ගැනීමට නොහැකි වූ ව්‍යාපෘති එම නමින්ම ඉටුකර දීමට මේ වන විට කටයුතු සිදු කරමින් පවතින බව.
(ඇ)	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය සේවා 1 යටතේ සිදුකිරීමට අපේක්ෂා කළ ව්‍යාපෘති 19 ක් අරමුදල් නොමැති වීම හේතුවෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි.

3.2 මෙහෙයුම් දුර්වලතා

විගණන නිරීක්ෂණය		නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශය යටතේ පවතින රෝහල් වෙත පැමිණෙන හෘද රෝගීන් හෘද සැත්කම් සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහල වෙත යොමු කිරීම, එම රෝගීන්ට එම රෝහල විසින් සිදුකරනු ලබන හෘද සැත්කම් හා ප්‍රතිකාර සඳහා වූ ගාස්තු, එම රෝහල වෙත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන ඖෂධ හා අනෙකුත් වෛද්‍ය සැපයීම්වල වටිනාකමට හිලව් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
	i.	මනා විනිවිදභාවයකින් හා විධිමත් ක්‍රමවේදයක් යටතේ ක්‍රියාත්මක කළ යුතු මෙම වැඩසටහන සඳහා රෝගීන් යොමුකිරීම හා ගාස්තු ගෙවීම සඳහා ලැබී ඇති අනුමැතිය කුමක්ද යන්න පිළිබඳව විමසීමේදී 2014 සැප්තැම්බර් 19 දින සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් හා තවත් නිලධාරීන් 08 දෙනෙකුගේ ප්‍රධානත්වයෙන් පැවති රජයේ රෝහල් වලින් හෘද සැත්කම් සඳහා ශ්‍රී ජයවර්ධනපුර	විනිවිදභාවයකින් යුත් ක්‍රමවේදයක් සකස් කර විධිමත් පරිදි අනුමත කළ යුතු අතර එම ක්‍රමවේදය වක්‍රලේඛයක් ලෙස ප්‍රකාශයට පත්කළ යුතුය.	අමාත්‍යාංශය වෙත පැමිණෙන හෘද රෝගීන් අවශ්‍යතාවය මත හෘද සැත්කම් සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහල වෙත යොමු කිරීමේදී එම රෝගීන්ට එම රෝහල විසින් සිදු කරනු ලබන හෘද සැත්කම් හා ප්‍රතිකාර සඳහා වූ ගාස්තු පියවීම සඳහා අංක

		රෝහලට යොමු කරන රෝගීන්ගේ බිල්පත් ගෙවීම් විධිමත් කිරීම පිළිබඳ සාකච්ඡාවට අදාළ සාකච්ඡා සටහනක් පමණක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී ඇති එකම අනුමැතිය මෙම සාකච්ඡා සටහන පමණක්ද යන්න විගණනයේදී ප්‍රශ්නකාරී විය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන එම ක්‍රමවේදය මෙම ක්‍රියාවලියට සම්බන්ධවන සියළු පාර්ශවයන් වෙත චක්‍රලේඛයක් ලෙස හෝ වෙනත් ලිඛිත නියෝගයක් ලෙස නිකුත් කිරීම අවශ්‍ය බවත් එසේ නොමැති වූව හොත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් විවිධ අක්‍රමිකතාවයන් සිදුවිය හැකි බවත් විගණනයේදී නිරීක්ෂණය විය.		අමප/23/071/610/020 හා 2023 මැයි මස 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබා දුන් අනුමැතියට අනුව 2024 වර්ෂයේ සිට වැය විෂය ලබා දී ඇති අතර එකී ප්‍රතිපාදන වලින් මෙම වසරේ සිට බිල්පත් පියවීම සිදු කරනු ලබන බව. තවද අමාත්‍යාංශය විසින් හෘද සැත්කම් සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහල වෙත රෝගීන් යොමු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
	ii.	2014 සැප්තැම්බර් 19 දින සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් හා තවත් නිලධාරීන් 08 දෙනෙකුගේ ප්‍රධානත්වයෙන් පැවති රජයේ රෝහල් වලින් හෘද සැත්කම් සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහලට යොමු කරන රෝගීන්ගේ බිල්පත් ගෙවීම් විධිමත් කිරීම පිළිබඳ සාකච්ඡාවට අදාළ සාකච්ඡා සටහනට අනුව මෙම වැඩ සටහන සඳහා අවබෝධතා ගිවිසුමක් (MOU) සකස් කිරීමට තීරණයක් ගෙන තිබුණද එවැනි අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	තීරණය කළ පරිදි අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ යුතුය	අංක අමප/23/071/610/020 හා 2023 මැයි මස 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඉදිරි කටයුතු සිදුකරන බව.
	iii.	2018 ඔක්තෝබර් 10 දිනැති ශ්‍රී ලංකා ජාතික රෝහලේ එවකට වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියකට අනුව හෘද රෝග හා හෘද උරස් ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත එක් සතියක දින පහේදී රෝගීන් 05 දෙනෙකු පමණක් ලියාපදිංචිය සඳහා යොමුකරන බවත්, එක් එක් අවස්ථාවන් වලදී රෝගීන්ගේ හදිසි අවශ්‍යතාව මත ලියාපදිංචි සංඛ්‍යාව වැඩිවිය හැකි බවත් දක්වා	විනිවිදභාවයකින් යුත් ක්‍රමවේදයක් සකස් කර විධිමත් පරිදි අනුමත කළ යුතු අතර එම ක්‍රමවේදය චක්‍රලේඛයක් ලෙස ප්‍රකාශයට පත්කළ යුතුය.	විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් කර ඇති බව.

	තිබුණි. නමුත් 2014 සැප්තැම්බර් 19 දින පැවති සාකච්ඡා සටහනට අනුව එක් සතියකට රෝගීන් 05 දෙනෙකුගේ සැත්කම් එනම් ජාතික රෝහල මගින් දෙදෙනෙකු, මහනුවර හා කරාපිටිය ශික්ෂණ රෝහල මගින් මෙන්ම අනෙකුත් රෝහල් අතුරෙන් එක් රෝගියෙකු බැගින් සිදුකරන බව දක්වා තිබුණි. නමුත් එක් එක් රෝහල් වලින් රෝගීන් තෝරාගන්නා පදනම හා එම තෝරාගැනීම් සඳහා නිර්දේශ කිරීමේ හා අනුමත කිරීමේ වගකීම පවරා ඇති ආකාරය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.		
	iv. මෙම වැඩපිළිවෙල යටතේ සැත්කම සඳහා වැයවන මුදල් පමණක් අමාත්‍යාංශය විසින් දරන බවටත්, සැත්කමෙන් පසුව රෝගියා වෙනුවෙන් වැයවන සියළු වියදම් රෝගියා විසින් ගෙවිය යුතු බවටත් 2014 සැප්තැම්බර් 19 දින පැවති සාකච්ඡාවේදී ගන්නා ලද තීරණයේ දැක්වේ. නමුත් එම තීරණයට අනුකූල නොවන පරිදි සමස්ථ වියදම අමාත්‍යාංශය මගින් පියවන බව නිරීක්ෂණය විය.	-එම-	මුළු මුදලම බිල්පත්වල සඳහන්ව ඇති බව.
	v. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වෛද්‍ය සැපයීම් අංශය විසින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලට අවස්ථා 207 කට අදාළව නිකුත් කරන ලද ඉන්වොයිස්වල ඖෂධ ඇතුළු වෛද්‍ය සැපයීම්වල වටිනාකම සඳහන් කර නොතිබුණි. මෙසේ අයකිරීමකින් තොරව වෛද්‍ය සැපයීම් ශ්‍රී ජයවර්ධනපුර රෝහලට නිකුත් කිරීම සඳහා ලැබුණු විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	මෙම ද්‍රව්‍ය නොමිලේ නිකුත් කිරීම සඳහා ලැබුණු විධිමත් අනුමැතියක් තිබෙනම් එය විගණනයට ඉදිරිපත් කළ යුතු අතර එවැනි අනුමැතියක් නොමැති නම් මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	වෛද්‍ය සැපයීම් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක **MSD/FIN/MSB/**10/2023 හා 2024.04.08 දිනැති ලිපියෙහි ඇමුණුම 02 මගින් වර්ෂ 2015 සිට 2023 දක්වා අවස්ථා 207කට අදාළව විස්තර ඉදිරිපත් කර ඇති බව.
(ආ)	විගණිත දිනය වූ 2023 මැයි 12 දින කරාපිටිය ශික්ෂණ රෝහලේ වෛද්‍ය නිලධාරීන්ගේ දිනපොත් නඩත්තු කිරීම පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		

	i.	සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2016 මාර්තු 30 දිනැති පොදු වක්‍රලේඛ අංක 01-12/2016 ප්‍රකාරව සියළු වෛද්‍ය නිලධාරීන් දින පොත් පවත්වාගෙන යා යුතු සේම එම දින පොත්වල දිනපතාම සටහන් යොදා දින පොත පවත්වාගෙන යනු ලබන නිලධාරියා විසින් දින පොතේ සියළු සටහන් සඳහා, සටහන ඇතුළත් කරනු ලබන අවස්ථාවේදීම කෙටි අත්සන යොදා සෑම මසකම වැඩ කරනු ලබන පළමු වන දිනයේදී ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු වූවත්, විශේෂඥ වෛද්‍ය නිලධාරීන් 37 දෙනෙකු හා වෛද්‍ය නිලධාරීන් 131 දෙනෙකු විසින් විගණිත දිනය වූ 2023 මැයි 12 දින වන විටත් අප්‍රේල් මාසය සඳහා ලියන ලද දින පොත් රෝහල් අධ්‍යක්ෂකගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු අතර මනා පසුවිපරම් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, විශේෂඥ වෛද්‍ය නිලධාරීන් 37 දෙනා හා වෛද්‍ය නිලධාරීන් 131 දෙනා සම්පූර්ණ කරන ලද දින පොත් විගණිත දිනට පසුදින කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද බව.
	ii.	ඉහත වක්‍රලේඛය ප්‍රකාරව වෛද්‍ය නිලධාරියකු විසින් දිනපොත් දෙකක් පවත්වාගෙන යා යුතු අතර මාසයක් හැර මාසයක් වෙන් වෙන්ව ඒවායේ සටහන් ඇතුළත් කළ යුතුය. මෙසේ කළ යුතු වන්නේ එක් දින පොතක් පරීක්ෂා කර බැලීමට කාර්යාලයට ඉදිරිපත් කර ඇති විටක දෛනික සටහන් අනෙක් දිනපොතේ නොවරදවාම ඇතුළත් කිරීමට හැකිවනු පිණිස වූවද, වෛද්‍ය නිලධාරීන් 79 දෙනෙකුගේ 2023 මාර්තු මාසයට අදාළ දින පොත් කාර්යාලයෙන් ආපසු ලබාගෙන නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, වෛද්‍ය නිලධාරීන් අතරින් ඒ වන විට සේවයෙහි යෙදී සිටි නිලධාරීන් ද විගණිත දිනට පසු දින කාර්යාලයෙන් දින පොත් ලබා ගැනීමට කටයුතු කර ඇති බව.
	iii.	ඒ අනුව වක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව 2023 මැයි මාසයේ දිනපොත් වෛද්‍යවරුන් 79 දෙනාගේ, රාජකාරි දිනය, රාජකාරියට වාර්තා කරන වේලාව (උදේ වරුව, සවස් වරුව, සේවා මුර රාජකාරි), රාජකාරියෙන් බැහැර යන වේලාව (උදේ වරුවේ සේවයෙන් පසු, සවස් වරුවේ සේවයෙන් පසු, සේවා මුර රාජකාරියෙන් පසු), ඇමතුම් රාජකාරි (සේවයට වාර්තා කරන	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, දින පොතෙහි විශේෂඥ වෛද්‍ය නිලධාරි නිර්දේශය අනුව සේවයෙහි යෙදුනු බවට තහවුරු වන බැවින් ඔවුන්ට එම කාලසීමාව සඳහා වැටුප් හා දීමනා ගෙවීමටද කටයුතු කරන ලද බව, තවද මෙම කාලය තුළ රෝගී

	වේලාව, සේවයෙන් පිටව යන වේලාව) යන තොරතුරු පිළිබඳ සාක්ෂි විගණන භෞතික පරීක්ෂාවේදී ලබාගත නොහැකි වූ බැවින් එම කාලය සඳහා අදාළ වෛද්‍යවරුන්ට වැටුප් හා දීමනා ගෙවීමට කටයුතු කිරීම චක්‍රලේඛයට අනුකූල නොවන බැව් විගණනයේදී නිරීක්ෂණය විය.		සත්කාරක සේවාවල බිඳවැටීමක් වාර්තා වී නොමැති බව.
	iv. චක්‍රලේඛයේ 08 ඡේදය ප්‍රකාරව අදාළ උපදෙස්වලට අනුව ක්‍රියා නොකරන නිලධාරීන්ට විරුද්ධව ආයතන ප්‍රධානියා විසින් විනයානුකූල පියවර ගතයුතු වූවත්, ඉහත විස්තර දැක්වෙන වෛද්‍යවරුන් 247 දෙනා සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. එසේම වෛද්‍යවරුන්ගේ දින පොත් පවත්වාගෙන යාම සම්බන්ධ චක්‍රලේඛයේ විධිවිධාන සියළුම වෛද්‍යවරුන් විසින් අනුගමනය කරන බවට තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් රෝහල් අධ්‍යක්ෂකගේ හා නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් දෙදෙනාගේ අධීක්ෂණය හා සුපරීක්ෂණය ඉතා දුර්වල මට්ටමක පවතින බවට වැඩිදුරටත් නිරීක්ෂණය විය.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, වෛද්‍ය නිලධාරීන්ගේ දින පොත් පවත්වාගෙන යාමේදී මතු වී ඇති ගැටළු මග හරවා ගනිමින් පොදු චක්‍රලේඛ 01-12/2016 ප්‍රකාරව දින පොත් නඩත්තු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව.
(ඇ)	කරාපිටිය ශික්ෂණ රෝහල විසින් හෘද හා උරස් ශල්‍ය විශේෂඥ වෛද්‍යවරුන්ට ශල්‍යාගාර වෙන්කරදීම සම්බන්ධයෙන් අනුමත සැලැස්මක් විගණනයට ඉදිරිපත් නොවූණු අතර, විශේෂඥ වෛද්‍යවරුන්ගේ වාවික එකඟතාවයන් අනුව ශල්‍යාගාර වෙන් කරගෙන ශල්‍යකර්ම සිදුකරන බවට නිරීක්ෂණය විය. ඒ අනුව රෝහලේ හෘද හා උරස් ශල්‍යාගාර 03 එක් එක් විශේෂඥ වෛද්‍යවරයා යටතේ ලියාපදිංචි වී ඇති පොරොත්තු ලේඛනගත රෝගීන් ප්‍රමාණයට සෑහෙන පරිදි ඔවුන් විසින් ශල්‍යාගාර වෙන්කර ගෙන නොතිබුණි.	සායනික දැනුමක් සහිත විශේෂඥයන් විසින් විද්‍යාත්මක පදනමක් සහිත පරීක්ෂාවක් සිදු කර රෝගීන්ට වඩාත් හොඳ සේවාවක් සැපයීමට හැකි ක්‍රමවේදයක් සකස් කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, ශල්‍යාගාර වෙන් කර දීම සිදු කර ඇත්තේ සතියේ දින වලට අනුව බව, ඒ අනුව සතියේ අදාළ දින වි.වෛද්‍යවරුන් වෙත වෙන් කර දී ඇති බව, පොරොත්තු ලේඛනවල සිටින රෝගීන් ප්‍රමාණය අනුව වෙන් කර දීම සිදු කළ නොහැකි බව, වෛද්‍යවරයාගේ ජනප්‍රියතාව හා කාලයක් තිස්සේ සිදු කර ඇති ශල්‍යකර්ම ප්‍රමාණය මත පොරොත්තු ලේඛනය දිගු වන බව, එම පොරොත්තු ලේඛන අනුව ශල්‍යකර්ම වෙන් කිරීමට

			කටයුතු කළහොත් අනෙකුත් ශල්‍ය වෛද්‍යවරු දෙදෙනාට ඉතාම සුළු කාලයක් ශල්‍යකර්ම සඳහා ඉතුරු වන බව, මෙලෙස පොරොත්තු ලේඛනවල සිටින රෝගීන් ප්‍රමාණය මත ශල්‍යාගාර වෙන් කර දීම ශ්‍රී ලංකාවේ රෝහල් තුළ සිදු නොවන බව.
(ඈ)	ඒ අනුව සතියේ සෑම දිනකම ශල්‍යාගාර 01 ක් හෝ 02 ක් නිශ්කාර්යව පැවතීම හේතුවෙන් රෝගීන්ගේ දෛනික ශල්‍යකර්ම ප්‍රමාදවීමෙන් පොරොත්තු ලේඛනගත හෘද හා උරස් ශල්‍ය රෝගීන් ප්‍රමාණය දිනෙන් දින වැඩිවන බවට නිරීක්ෂණය විය. ඒ අනුව විගණිත දිනට ශල්‍යකර්ම සිදුකර ගැනීමට ලියාපදිංචිව පොරොත්තු ලේඛනගතව සිටින මුළු රෝගීන් 5,697 කින් රෝගීන් 4,784 ක් හෙවත් සියයට 84 ක් පොරොත්තු ලේඛනගතව සිටින විශේෂඥ වෛද්‍යවරයාට සතියකට දින 02 ක් පමණක් වෙන්කර දීමට හා රෝගීන් 823 ක් හෙවත් සියයට 16 ක් පොරොත්තු ලේඛනගතව සිටින විශේෂඥ වෛද්‍යවරුන් 03 දෙනෙදෙකුට ශල්‍යාගාරය සතියකට දින 03 ක් වෙන්කර දීමට කටයුතු කිරීම සාධාරණ පදනම් මත සිදුකර නොමැති බවට නිරීක්ෂණය විය. ඒ අනුව හෘද හා උරස් ශල්‍යාගාර කාර්යක්ෂමව හා සඵලදායීව රෝගී සත්කාරක සේවා සඳහා යොදා ගැනීමට රෝහලේ වගකිව යුතු පාර්ශව විසින් කටයුතු කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	-එම-	-එම-
(ඉ)	2023 වර්ෂයේ විගණිත දින වූ මැයි 15 දිනට එක් එක් විශේෂඥ වෛද්‍යවරුන් විසින් සිදුකර ඇති ශල්‍යකර්ම පරීක්ෂාවට අනුව විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනෙකු විසින් අනෙකුත් විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනාට සාපේක්ෂව අසාමාන්‍ය අඩු ප්‍රමාණයක් එනම් පිළිවෙළින් ශල්‍යකර්ම 3 ක් හා 8 ක් පමණක් සිදුකර තිබුණු බැවින් හා එම වෛද්‍යවරුන් දෙනොගේ ශල්‍යකර්මවලින් පසු සිදුවන රෝගී මරණ	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, මෙහිදී එක් විශේෂඥ වෛද්‍යවරයෙකු සිදු කරන ශල්‍යකර්ම ප්‍රමාණයට සාපේක්ෂව අනෙකුත් විශේෂඥ වෛද්‍යවරු දෙදෙනා සිදු කරන ශල්‍යකර්ම ප්‍රමාණයේ අඩුවක් පෙන්වා ඇති බව, නමුත් වෛද්‍යවරයකු විසින් සිදු කරන

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ප්‍රතිශතය පිළිවළින් සියයට 66 ක් හා සියයට 48 ක් වැනි ඉහළ අගයක් ගැනීමෙන් අදාළ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවාවල ගුණාත්මකභාවය හා කාර්යසාධනය සම්බන්ධයෙන් ගැටළු පවතින බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.		ශල්‍යකර්ම ප්‍රමාණය වෛද්‍යවරයාගේ සහජ දක්ෂතාවය හා පලපුරුද්ද මෙන්ම ඔහු විසින් ශල්‍යකර්ම සඳහා තෝරාගන්නා රෝගීන්ගේ රෝගී තත්ත්වයේ ස්වභාවය, එම වෛද්‍යවරයාට වෙන් කර ඇති වෛද්‍ය කාර්ය මණ්ඩලයේ පළපුරුද්ද වැනි කරුණු මත රදා පවතින බව, මෙසේ සිදු කරන හෘද ශල්‍යකර්ම ප්‍රමාණය වෛද්‍යවරයාගේ සහජ දක්ෂතාවය, කාර්යක්ෂමතාවය හා පළපුරුද්ද මත තීරණය වන බව, මෙම තත්ත්වය මත නවක වෛද්‍යවරයකු විසින් සිදුකරන ශල්‍යකර්ම ප්‍රමාණය අඩු වීමට හේතු විය හැකි බව.
(ඊ)	විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව ඉකුත් වර්ෂ 13 තුළදී හෘද හා උරස් ශල්‍යාගාරයට අනුයුක්ත විශේෂඥ වෛද්‍යවරුන් විසින් සිදුකරන ලද ශල්‍යකර්ම ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවේදී එක් විශේෂඥ වෛද්‍යවරයෙක් විසින් සිදුකළ ශල්‍යකර්ම ප්‍රමාණය හා තවත් විශේෂඥ වෛද්‍යවරියක් විසින් සිදුකර තිබුණු ශල්‍යකර්ම ප්‍රමාණය අතර අසාමාන්‍ය වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව එක් විශේෂඥ වෛද්‍යවරයෙක් විසින් ඉකුත් වර්ෂ 13 තුළදී ශල්‍යකර්ම 6,933 ක් එනම් වාර්ෂික සාමාන්‍ය ශල්‍යකර්ම 533 ක් සිදුකර තිබුණද, අනෙක් විශේෂඥ වෛද්‍යවරිය විසින් ශල්‍යකර්ම 1,573 ක් හෙවත් වාර්ෂික සාමාන්‍ය ශල්‍යකර්ම 121 ක් පමණක් සිදුකර තිබුණි. ඒ අනුව පළමු විශේෂඥ වෛද්‍යවරයා විසින් සිදුකළ ශල්‍යකර්ම ප්‍රමාණයට වඩා ශල්‍යකර්ම 5,360 ක් එනම් වාර්ෂික සාමාන්‍ය ශල්‍යකර්ම 412 ක් අඩුවෙන් දෙවන විශේෂඥ වෛද්‍යවරිය විසින් සිදුකර ඇති බව නිරීක්ෂණය වූ අතර, ඊට බලපෑ සාධාරණ හේතු හා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූණි. එසේම තවත් විශේෂඥ වෛද්‍යවරයෙකු විසින්ද 2022	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	වර්ෂයේ ශල්‍යාකර්ම 94 ක් වැනි අඩු ප්‍රමාණයක් සිදු කිරීමෙන් රෝගී සත්කාරක සේවාවන්ගේ පූර්ණ සේවා නියුක්තියක් නිරීක්ෂණය නොවීය.		
(උ)	සෞඛ්‍ය අමාත්‍යාංශ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක TCS/B/09/2019 දරන හා 2022/01/20, 2022/11/18 හා 2023/05/25 දිනැති ලිපි ප්‍රකාරව මාස 06 න් 06 ට කුරුණෑගල ශික්ෂණ රෝහලින් කරාපිටිය ශික්ෂණ රෝහල වෙත තාවකාලිකව අනුයුක්ත කර තිබුණු විශේෂඥ වෛද්‍යවරයා සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
	i. ශල්‍යාගාර තුනකින් සමන්විත රෝහලේ හෘද හා උරස් ශල්‍ය ඒකකයට විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනෙකු ස්ථිරව සේවා නියුක්ත කර තිබියදී 2023 අගෝස්තු විගණිත දින වන විට වසර 01 යි මාස 09 ක කාලයක් එක දිගට මෙම විශේෂඥ වෛද්‍යවරයා රෝහලට අනුයුක්ත කර තිබුණු අතර ඊට බලපෑ සාධාරණ හේතු විගණනයට ඉදිරිපත් නොවීය.	මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, කුරුණෑගල ශික්ෂණ රෝහලේ දැනට හෘද හා උරස් ශල්‍ය ඒකකයක් නොමැතිවීම නිසා, මෙම වි.වෛද්‍යවරයා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කරාපිටිය ශික්ෂණ රෝහල වෙත තාවකාලිකව අනුයුක්ත කර ඇති බව.
	ii. වෛද්‍යවරයා වෙතින් ශල්‍යාකර්ම සිදු කර ගැනීමට පොරොත්තු ලේඛනගතව රෝගීන් 66 දෙනෙකු සිටියද ඔහු විසින් විගණිත දින දක්වා වූ මාස 05 තුළ ශල්‍යාකර්ම 03 ක් පමණක් සිදුකර තිබුණු අතර ඉන් රෝගීන් දෙදෙනෙකු එනම් ශල්‍යාකර්ම සිදුකළ මුළු රෝගීන්ගෙන් සියයට 66 ක් මියගොස් තිබුණි. ඒ අනුව අදාළ වෛද්‍යවරයාගේ රෝගී සත්කාරක සේවාවන්ගේ ගුණාත්මක බව හා සඵලදායී බව සම්බන්ධයෙන් ගැටළු පවතින බව විගණනයේදී බැහැර කළ නොහැකි විය	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, රෝහල තුළ පවතින වෛද්‍ය නිලධාරීන්ගේ හිඟය නිසා මෙම වි.වෛද්‍යවරයා සඳහා වෛද්‍යවරු වෙන්කර දී නොමැති බව, තාවකාලික වෛද්‍යවරයෙකු වීමද මේ සඳහා බලපා ඇති බව, තවද නිර්විත්දන වෛද්‍යවරුන්ගේ හිඟය නිසා තෙවන වි. වෛද්‍යවරයාට ශල්‍යාගාර පහසුකම් ලබා දීමේදීද අඩු ප්‍රමුඛතාවයක් හිමි වන බව, මෙම කරුණුද මෙම සිදු කළ අඩු ශල්‍යාකර්ම ප්‍රමාණයට බලපා ඇති බව, මේ වනවට මෙම

			තත්ත්වය මගහරවා ඇති බව, මෙහිදී සිදු කළ ශල්‍යාකර්ම 3න් රෝගීන් දෙදෙනකු මිය යාම මත ගුණාත්මක බව තීරණය කිරීම සාධාරණ නොවන බව, හෘද සැත්කම්,ශල්‍ය වෛද්‍ය විෂය පථය තුළ ඇති ඉතාම සංකීර්ණ, අවධානම් හා වැඩි මරණ අනුපාත ඇති සැත්කම් වර්ගයක් බව, මේ සඳහා දැනුම ,කුසලතා මෙන්ම අත්දැකීම්ද ඉතා වැදගත් බව, මෙම වෛද්‍යවරයා මෙම ක්ෂේත්‍රය තුළ නවක වෛද්‍යවරයකු බැවින් සම්පූර්ණ ඵලදායිතාවය ලබා ගැනීම සඳහා කාලයක් ගතවනු ඇති බව.
	iii. කෙසේ වුවද, අදාළ විශේෂඥ වෛද්‍යවරයාට 2023 වර්ෂයේ ජනවාරි මස සිට මැයි මාසය දක්වා මුළු පොරොත්තු රෝගීන් 66 ක් වැනි අඩු ප්‍රමාණයක් සිටියදී එකතුව රු.746,199 ක්වූ නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා ගෙවීමට බලපෑ සාධාරණ හේතු විගණනයට නිරීක්ෂණය නොවූයෙන් අදාළ සේවා කාලය තුළදී වෛද්‍යවරයා විසින් ඉටුකරන ලද සාමාන්‍ය රාජකාරි, නිවාඩු දින හා අතිකාල රාජකාරි මොනවාද යන්න හඳුනා ගැනීම වෙනුවෙන් විධිමත් කමිටුවක් මගින් පරීක්ෂා කළ යුතු බව නිරීක්ෂණය විය.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, මේ සම්බන්ධව පරීක්ෂා කර බැලීම සඳහා කමිටුවක් පත් කර පරීක්ෂණ සිදු කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතින බව.
(ඌ)	ඉහත දැක්වෙන විගණන නිරීක්ෂණයන් අනුව හෘද හා උරස් ශල්‍ය ඒකකයේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ රාජකාරි වැඩවල කාර්යසාධනය ඇගයීම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවත්, පොරොත්තු ලේඛනගත රෝගීන් ප්‍රමාණය පහළ දැමීම සඳහා ශල්‍යාකර්ම කඩිනම් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදීමෙන් රෝගී සත්කාරක සේවා කාර්යක්ෂම කිරීමට විශේෂඥ දැණුම ඇති අයගෙන් යුත් කමිටුවක්	සායනික දැනුමක් සහිත විශේෂඥයන් විසින් විද්‍යාත්මක පදනමක් සහිත පරීක්ෂාවක් සිදු කර රෝගීන්ට වඩාත් හොඳ සේවාවක්	පිළිතුරු ලබා දී නොතිබුණි.

	මගින් සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීමට අවධානය යොමුකළ යුතු බවත් වැඩදුරටත් නිරීක්ෂණය විය.	සැපයීමට හැකි ක්‍රමවේදයක් සකස් කළ යුතුය.	
(ඒ)	ගලහ හද්‍රාවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානය සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. ගිලානෝපස්ථාන මධ්‍යස්ථානය ආරම්භයේදී මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබූ අංක 17-9955 දරන මෝටර් කාර් රථය වසර ගණනක සිට භාවිතා කර නොතිබූ බවත් අනාරක්ෂිතව මධ්‍යස්ථාන භූමියේ පැවති අතර එම රථය නැවත අළුත්වැඩියා කිරීමට හෝ විධිමත්ව අපහරණය කිරීමට 2023 දෙසැම්බර් 31 දින වන විටද කටයුතු කර නොතිබුණි.	මෙම මොටර් රථය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	විගණනයෙන් විමසා සිටින අංක 17-9955 දරන මෝටර් රථය මහා භාරකාර දෙපාර්තමේන්තුවට අයත්වන බැවින් මධ්‍යස්ථාන හිමි නමගෙන් කරුණු විමසා සිටියද එම හිමි නම විසින් 2023.07.29 දිනැතිව සෞඛ්‍ය අමාත්‍යාංශ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙතින් උපදෙස් ඉල්ලා ඇති බව, ඉන්පසුව සෞඛ්‍ය අමාත්‍යාංශ මූල්‍ය නිලධාරී විසින් ඔහුගේ අංක **CA/AQ/FCC** 08/01/2023/139 හා 2024.02.09 දිනැතිව මා වෙත යොමු කරන ලද ලිපියෙන් මෙම රථය ආරක්ෂා කිරීම හා අපහරණය සඳහා අතිරේක ලේකම් (සංවර්ධන) විසින් උපදෙස් ලබා දී ඇති බවට දන්වා ඒ අනුව ප්‍රගතිය වාර්තා කරන ලෙසටද දන්වා ඇති බව.
	ii. ගලහ භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයේ වර්ෂ 2019 පසු භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබීම, පරිත්‍යාග ලෙස ලැබෙන භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ගත නොකිරීම, සේවය කරනු ලබන සෞඛ්‍ය කාර්යය සහයකයින් විධිමත් අධීක්ෂණයක් යටතේ පාලනය නොවීම, අමු ආහාර ඇණවුම් කිරීම සහ දානයන් ලැබීම් සහ මුදල් පරිත්‍යාග ලැබීම් විනිවිද භාවයකින් සිදු නොවීම, භික්ෂූන්	සම්මත කරන ලද පාර්ලිමේන්තු පනතේ විධිවිධාන අනුව ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය 2023 සැප්තැම්බර් මස 14,15 යන දෙදින පැවැත්වූ අතර එහිදී නිරීක්ෂණය වූ එම මධ්‍යස්ථාන හිමි නම වෙත ලද පරිත්‍යාග භාණ්ඩ අයිතම 92 ක් ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කළ බවද 2023 වර්ෂයට අදාළ

	වහන්සේලාගේ පෞද්ගලික ලිපිගොනු නිවැරදිව පවත්වාගෙන නොයාම යනාදී ගැටළු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.		භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේවන විට සිදු කර ඇති බව, මීට අමතරව සෞඛ්‍ය කාර්ය සහායකයින් අධීක්ෂණය, අමු ආහාර ඇනවුම් කිරීම දානයන් ලැබීම, මුදල් පරිත්‍යාග, භික්ෂූන් වහන්සේලාගේ පෞද්ගලික ලිපි ගොනු පවත්වා ගෙන යාම ආදිය දැනට එම මධ්‍යස්ථාන හිමි නම ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුවන අතර 2023.07.28 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා වූ පරිදි ලේකම්තුමා ප්‍රමුඛ පාලක මණ්ඩලයේ එකඟතාවයෙන් එම මධ්‍යස්ථානයේ ලිපි ලේඛන සඳහා අත්සන් තැබීමේ බලය අදාළ මධ්‍යස්ථාන හිමි නම වෙත පවරා ඇති අතර ඒ අනුව කාර්ය මණ්ඩලය අධීක්ෂණ කටයුතු ලිපි ලේඛන නඩත්තුව ආදිය එම හිමි නම වෙත පැවරෙන බව.
	iii. භික්ෂූන් වහන්සේලා මධ්‍යස්ථානයට ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ විනය සම්බන්ධව කටයුතු කිරීම හා උන්වහන්සේලාගේ ඉවත් වීම් හෝ ඉවත් කිරීම් නීත්‍යානුකූල ආකාරයෙන් සිදුකිරීමේ ක්‍රමවේදයක් මධ්‍යස්ථානය තුළ දක්නට නොතිබූණි.	-එම-	ගලහ භික්ෂු මධ්‍යස්ථානය සම්බන්ධයෙන් 2023.07.28 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා වූ පරිදි ලේකම්තුමා ප්‍රමුඛ පාලක මණ්ඩලයේ එකඟතාවයෙන් එම මධ්‍යස්ථානයේ ලිපි ලේඛන සඳහා අත්සන් තැබීමේ බලය අදාළ මධ්‍යස්ථාන හිමි නම වෙත පවරා ඇති අතර ඒ අනුව කාර්ය මණ්ඩලය අධීක්ෂණ කටයුතු ලිපි ලේඛන නඩත්තුව ආදිය එම හිමි නම වෙත පැවරෙන බව නිරීක්ෂණය වන බැවින් මෙම ගැටළු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			සම්බන්ධයෙන් සියළු අධීක්ෂණ කටයුතු මධ්‍යස්ථාන හිමි නම වෙත ඒකරාශී වී ඇති බව.
	iv. ගලහ භද්‍රාවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානය විසින් සංවර්ධන කටයුතු, නේවාසික භික්ෂූන් වහන්සේලාගේ අවශ්‍යතා සැපයීම හා සේවකයින්ගේ සුභසාධනය සඳහා 2021 වර්ෂයේ මැයි 19 දින විධිමත් අනුමැතියකින් තොරව අරමුදලක් පිහිටුවා තිබුණි. මුදල් රෙගුලාසි 381 ප්‍රකාරව කටයුතු නොකර මධ්‍යස්ථාන සංවර්ධන අරමුදල නමින් 2023 මාර්තු 18 දින ලංකා බැංකුවේ අංක 88617272 දරන ගිණුමක් විවෘත කර තිබුණු අතර, 2023 අප්‍රේල් 28 දින වන විට එම ගිණුමේ රු. 944,882 ක ශේෂයක් පැවතුණි. තවද ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ භික්ෂූන් වහන්සේලා විසින් රු. 330,000 ක මූල්‍යමය පරිත්‍යාග සිදු කර තිබූ අතර, එම මුදල් කුමන ගිණුමකට බැර කලේද යන්න සහ කුමන කාර්යයන් සඳහා වියදම් කලේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූණි.	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි.
(ඒ)	මහනුවර ජාතික රෝහලේ ප්‍රධාන විදුලි සැපයුම් ගිණුම් 07 කට අදාලව 2023 දෙසැම්බර් 31 දින වන විට රු.78,045,229 ක මුදලක් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවිය යුතුව පැවති අතර නියමිත කාලය තුළ විදුලි බිල්පත් පියවීම සිදු නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.7,601,235 ක දඩ මුදලක් ගෙවීමට සිදුව තිබුණි.	දඩ මුදල් ගෙවීමෙන් වැලකී සිටීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2023 දෙසැම්බර් සහ 2024 ජනවාරි මාසයේදී ලැබුන අක් මුදල් මගින් 2023 දෙසැම්බර් මාසය දක්වා ඉදිරිපත් කර තිබූ ජල හා විදුලි බිල්පත් පිළිවෙලින් රු.23,460,515 ක් සහ රු.67,653,083 ක් වශයෙන් රු.91,113,598 ක මුදලක් 2024 ජනවාරි මාසයේදී ගෙවා අවසන් කළ බව, 2023 ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වන විදුලි බිල් දින 14 ක් ඇතුළත ගෙවීම් නොකළ විට දඩ අය කිරීමේ තීරණය ඉවත් කර පෙර ලබා දුන් සහනය නැවත ලබා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			දෙන මෙන් සෞඛ්‍ය ලේකම් මගින් ලංකා විදුලි බල මණ්ඩලය හා මහජන උපයෝගීතා කොමිසම වෙතින් ඉල්ලා යවා ඇති බව, කෙසේ වූවද, මේ වන විට දඩ මුදල් ද ඇතුළත්ව විදුලි බිල් ගෙවීම කරනු ලබන බව.
(ඔ)	පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව මගින් අයකරනු ලබන ලියාපදිංචි ගාස්තු ආදායමෙන් පළාත් සභා වෙත ප්‍රේෂණය කළ යුතු සියයට 50 ක මුදලින් 2023 වර්ෂය ආරම්භයට ගෙවිය යුතු ශේෂය රු.44,518,057 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ගෙවියයුතු මුදල රු.13,828,250 ද සමඟ ගෙවිය යුතු මුළු මුදල රු.58,346,307 ක් විය. ඉන් සමාලෝචිත වර්ෂය තුළ රු.21,446,466 ක් හෙවත් ගෙවිය යුතු මුදලින් සියයට 37 ක් පමණක් නිරවුල් කිරීමට කටයුතු කර තිබුණි. උතුරුමැද, මධ්‍යම, නැගෙනහිර හා ඌව පළාත සඳහා ගෙවිය යුතු කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ නිරවුල් කර නොතිබුණි.	පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව.
(ඕ)	1980 අංක 26 දරන ආහාර පනතේ 1 වන වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට මෙම පනත ක්‍රියාත්මක වන බව දක්වා ඇත. නමුත් එවැනි ගැසට් නිවේදනයක් පිළිබඳ තොරතුරු සොයාගත නොහැකි බව දන්වා ඇත. මේ අනුව මෙම පනත ක්‍රියාත්මක කිරීම සඳහා නිත්‍යානුකූල බලයක් ලැබී තිබේද යන්න ගැටළුකාරී විය. මෙවැනි තත්ත්වයක් තුළ මෙම පනත යටතේ සාදන ලද සියළු නියෝග හා පනතේ දැක්වෙන අනෙකුත් සියළු විධිවිධානවල වලංගුතාවය ගැටළුකාරී විය.	අදාළ ගැසට් නිවේදනයේ සහතික කළ පිටපතක් විගණනයට ඉදිරිපත් කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 1980 අංක 26 දරන පනතේ 1 වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පනත ක්‍රියාත්මක වන දිනය රැගත් නියමයන් ගැසට් පත්‍රයේ පළකර ඇති බව.

(ක)	1980 අංක 26 දරන ආහාර පනතේ 32(1) වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම 32(2) වගන්තිය අනුව රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර පනතේ 32(3) වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වූවත්, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මේ ආකාරයට පනතේ 32(1) වගන්තිය යටතේ සාදන ලද නියෝග 50 ක් පැවතියද මෙම කිසිදු නියෝගයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමත කර නොතිබුණි. මෙම තත්ත්වය වගකිව යුතු නිලධාරීන්ගේ වගකිම නිසිලෙස ඉටු නොකිරීමේ තත්ත්වයක් බව විගණනයේදී නිරීක්ෂණය විය.	තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 1980 අංක 26 පනතේ 32 වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම එම කාල වකවානු තුළ සේවය කළ නිලධාරීන් විසින් සිදු කර ඇති නමුත් ඒ පිළිබඳ ලිඛිත තොරතුරු සොයා ගැනීම දුෂ්කර වී ඇති බව.
(ග)	2011 අංක 29 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 26 දරන ආහාර පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව ස්ථාපිත කරන ලද 25 දෙනෙකුගෙන් සමන්විත ආහාර උපදේශන කමිටුව 2022 වර්ෂයේදී අවස්ථා 09 කදී රැස්වී තිබුණි. මෙම උපදේශන කමිටුව සඳහා කමිටු සමාජිකයින්ගේ පැමිණීම දුර්වල මට්ටක පැවතුණි. 2022 වර්ෂයේදී පවත්වන ලද කමිටු රැස්වීම් 09 සඳහා සමාජිකයින්ගේ පැමිණීමේ සාමාන්‍යය සියයට 43.55 ක් විය. පනතේ 11(1) වගන්තිය අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රධාන ආහාර බලධාරියා වන අතර ඔහු ආහාර උපදේශන කමිටුවේ සභාපතිවරයාද වූවත්, 2022 වර්ෂයේ පවත්වන ලද කමිටු රැස්වීම් 09 න් රැස්වීම් 04 කට පමණක් ඔහු සහභාගි වී තිබුණි. උපදේශන කමිටු සමාජිකයින් වන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා-1), ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු නියෝජිත, ආහාර කොමසාරිස්වරයා සහ එක් පාරිභෝගික නියෝජිතයෙකු 2022 වර්ෂයේ පවත්වන ලද කිසිදු රැස්වීමකට සහභාගී වී නොතිබුණි. මින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා -1) වෙනුවෙන් සමාජිකයෙකු පත්කරද නොතිබුණි. කමිටු සමාජිකයින් 04 දෙනෙකු	කමිටු සමාජිකයින්ගේ පැමිණීම වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.	පනතට අනුව කමිටුවේ සංඝපූර්ණය සාමාජිකයන් 07ක් බව, 2022 වර්ෂයට පසු කෝවිඩ් කාල වකවානුව වන අතර එම කාලය තුළ කමිටු රැස්වීම් 09ක් පවත්වා ඇති බව, පනත ප්‍රකාරව දක්වා ඇති පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා) 1 වෙනුවෙන් නාමිකයකු (සාමාජිකයකු) පත් කිරීමට හැකියාවක් නොමැති බව, ඒ හැර අනෙකුත් නිරීක්ෂණ සමඟ එකඟ වන බව,

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා -1) වෙනුවෙන් සමාජිකයෙකු පත්කරද නොතිබුණි. කමිටු සමාජිකයින් 04 දෙනෙකු පමණක් 2022 වර්ෂයේ පවත්වන ලද සියළුම රැස්වීම් වලට සහභාගි වී තිබුණි.		
(ව)	කළුතර ශික්ෂණ රෝහලේ සායන ගොඩනැගිල්ල ඉදිරිපිට පිහිටුවා ඇති සායන පොත් අලෙවි කුටිය තුළ නෙස්කැෆේ සහ එක් කෙටි කෑම වර්ගයක් පමණක් අලෙවි කිරීමට අවසර දී තිබුණද එම අවසර දී ඇති ප්‍රමාණය ඉක්මවා කෙටි කෑම වර්ග කිහිපයක්ම අලෙවි කරමින් දෛනිකව සැලකිය යුතු ආදායමක් ඉපයීමට 2022 වර්ෂයේ මැද භාගයේ සිට 2023 වර්ෂය අවසානය දක්වාම රෝහලේ පාලනාධිකාරිය විසින් ඉඩ දී තිබුණි. මේ ආකාරයෙන් රජයට කිසිදු ආදායමක් ලැබීමකින් තොරව මෙන්ම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන්ද බැහැරව පෞද්ගලික පාර්ශවයක් වෙත ආදායම් ඉපයීමට පාලනාධිකාරිය විසින් ඉඩ දී තිබීම විගණනයේදී ගැටළු සහගත කරුණක් විය.	මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	රෝහලේ සායන ගොඩනැගිල්ල ඉදිරිපිට නවතා ඇති රෝද හතරක් මත පවතින සායන පොත් අලෙවි කුටිය, රෝහලේ සුබ සාධක සංගමය විසින් රෝගීන්ට සායන පොත් අලෙවි කිරීම සඳහාම ආරම්භ කරන ලද්දක් බව, මෙහි සුබ සාධක සංගමයට පරිත්‍යාග ලෙස ලැබුණු නෙස්කැෆේ යන්ත්‍රය භාවිතා කර රෝගීන්ට ඉතා සහන මිලට නෙස්කැෆේ හා කෙටි කෑමවර්ග කිහිපයක් අලෙවි කිරීම සිදුකරන ලද බව, මෙම වෙළඳ කුටිය ආරම්භ කළ දිනයේ සිට මසකට රු.1000 බැගින් වනසේ රජයට කුළිය අයකර ඇති බව හා මේ වනවිට මෙම වෙළඳ කුටිය වසා දමා ඇති බව.

177

3.3 විදේශ ආධාර ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය ----------	නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්, චීන සමාගමක් සහ මැලේසියානු සමාගමක් අතර 2019 ඔක්තෝබර් 02 දින අත්සන්		

NAOSL
ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வாளர் அலுவலகம்
NATIONAL AUDIT OFFICE

කරන ලද ගිවිසුමකට අනුව ස්ථාපිත කිරීමට යෝජිත විද්‍යුත් රූප සංරක්ෂණය, සන්නිවේදන විකිරණ තොරතුරු පද්ධතිය (PACS/RIS) සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.			
(අ)	මෙවැනි පද්ධතියක් අදාළ රෝහල් 20 තුළ ස්ථාපිත කර දෙන ලෙස එකී රෝහල් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට සිදුකරන ලද ලිඛිත ඉල්ලීමක් හෝ එවැනි ඉල්ලීමක් වෙනත් පාර්ශවයකින් හෝ ඉදිරිපත් කළ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කරන ලද මෙම ව්‍යාපෘතියට අදාළ ලිපිගොනු තුළ ඇතුළත් නොවීය.	මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ සිට වගකිව යුතු නිලධාරීන් කටයුතු කළ ආකාරය සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර රට තුළ පවතින ආර්ථික තත්ත්වයට අනුව ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තීරණය කර ගිවිසුම් සංශෝධනය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.	පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.
(ආ)	අනායාවිත ව්‍යාපෘති යෝජනාවක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලද මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමක්, ව්‍යාපෘතියට අදාළව පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමක් හෝ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් හෝ අමාත්‍යාංශ මට්ටමින් සිදුකළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. එසේම මෙම යෝජනාව ඉදිරිපත් කරන විටත් රජයේ රෝහල් පද්ධතිය තුළ ක්‍රියාත්මක HHIMS, HIMS වැනි මෘදුකාංග කිහිපයක්	-එම-	-එම-

	සංවර්ධනය කර ක්‍රියාත්මක වෙමින් පැවති අතර මෙම මෘදුකාංගවලද මෙම විද්‍යුත් රූප සංරක්ෂණය, සන්නිවේදන විකිරණ තොරතුරු පද්ධති (PACS/RIS) මොඩියුලය අන්තර්ගත වූ අතර එම මෘදුකාංගය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම්වල ඌනතාවයක් පමණක් පැවතුණි. යෝජිත නව පද්ධතිය ලබාගැනීම හා ඒ වන විටත් පැවති මෘදුකාංග තුළ මෙම විද්‍යුත් රූප සංරක්ෂණය, සන්නිවේදන විකිරණ තොරතුරු පද්ධති (PACS/RIS) මොඩියුලය ක්‍රියාත්මක කිරීමට හැකියාවක් පවතින බැවින් අලුතින් මොඩියුලයක් මිලදී ගැනීම නිෂ්කාර්ය වියදමක් බැව් නිරීක්ෂණය විය.		
(ඇ)	මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස තෝරාගත් රජයේ රෝහල් 20 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පිරිවැය එක්සත් ජනපද ඩොලර් 35,000,000 ක්ද එම මුදල එක්සත් ජනපද ඩොලර් 3,360,000 ක පොළියක් සහිතව වර්ෂ 11 ක් තුළ ගෙවීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017 මාර්තු 01 දිනැති අමාත්‍යමණ්ඩල සංදේශය මගින් ඉල්ලා තිබුණි. 2017 මාර්තු 21 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මෙම යෝජනාව සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් 2017 මාර්තු 20 දිනැති ලිපිය මගින් අවධානය යොමුකරන ලද නිරීක්ෂණයන් සැලකිල්ලට ගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි.	-එම-	-එම-
(ඈ)	මෙම යෝජනාව සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් 2017 මාර්තු 20 දිනැති ලිපිය මගින් අවධානය යොමුකරන ලද නිරීක්ෂණයන් සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද සම්මුති සාකච්ඡා කමිටුව (CANC) විසින් සාකච්ඡා කිරීමෙන් පසුව සංශෝධිත ව්‍යාපෘති යෝජනාව සඳහා අනුමැතිය ලබාගැනීම පිණිස නැවත අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2018 දෙසැම්බර් 28 දින ඉදිරිපත් කර තිබුණි. මේ අනුව යෝජිත රෝහල් 20 තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පිරිවැය	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	එක්සත් ජනපද ඩොලර් 33,250,000 ක්වූ අතර එම මුදලෙහි පොලිය එක්සත් ජනපද ඩොලර් 1,305,818.18 ක් සමඟ වර්ෂ 11 ක් තුළ ගෙවිය යුතු විය. නමුත් මෙහිදී අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද සම්මුති සාකච්ඡා කමිටුව (CANC) වෙත හෝ අමාත්‍ය මණ්ඩලය වෙත, අමාත්‍යාංශය සතු රෝහල් තුළ ක්‍රියාත්මක වන HHIMS, HIMS වැනි මෘදුකාංග හරහා මෙම විද්‍යුත් රූප සංරක්ෂණය, සන්නිවේදන විකිරණ තොරතුරු පද්ධතිය (PACS/RIS) ක්‍රියාත්මක කිරීමේ හැකියාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් හෝ පවතින මෘදුකාංග සංවර්ධනය කර ඊට අවශ්‍ය සර්වර් (Server), අන්තර් ජාල පහසුකම් හා අනෙකුත් උපාංග ලබා දීමේ පිරිවැය සහ මෙම නව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් හෝ සිදුකර නොතිබුණි.		
(ඉ)	2019 ජනවාරි 14 පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දී තිබුණු අතර පාර්ශවයන් තුන අතර ලිඛිත ගිවිසුමකට 2019 ඔක්තෝබර් 02 දින අත්සන් කර තිබුණි. මෙම ගිවිසුමේ පිටු 74 ක් අඩංගු බව දැක්වූව ද 74 වන පිටුව විගණනයට ඉදිරිපත් කරන ලද කිසිදු ලිපිගොණුවක ඇතුළත් නොවීය. එසේම ගිවිසුමේ පටුනෙහි යොමුව දක්වා ඇති පිටු අංකද නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. මෙතරම් වැදගත් ගිවිසුමක් අත්සන් කිරීමේදි වගකිව යුතු පාර්ශවයන් ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.	-එම-	-එම-
(ඊ)	ගිවිසුමේ ඇමුණුම් අංක "සී" (C) අනුව මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම මාස 03 ක් ඇතුළත අවසන් කිරීමට එකඟ වී තිබුණද ව්‍යාපෘතියේ කටයුතු කිසිදු ආකාරයකට නියමිත කාල රාමුව ඇතුළත ක්‍රියාත්මක කිරීමට අදාළ පාර්ශවයන් කටයුතු කර නොතිබුණි. රෝහල් 05 ක පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා ලැබුණු විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් කරන ලද ලිපිගොනු තුළ ඇතුළත් නොවීය. යෝජිත කාලරාමුව තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම මත ණය වාරික ගෙවීම්	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	සඳහා එකඟ වූ කාලරාමුව, වාරික මුදල හා පොලිය ඇතුළත් උපලේඛනය සංශෝධනය කර ගිවිසුම සංශෝධනය කළ යුතුව තිබුණද වගකිව යුතු පාර්ශවයන් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2019 දෙසැම්බර් අවසානය වන විට සමස්ත ව්‍යාපෘතියේ කටයුතු අවසන් කළ යුතු වූවත්, රෝහල් 05 ක ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම 2023 වර්ෂය වන විටත් සම්පූර්ණයෙන් නිම කිරීමට අපොහොසත් වී තිබුණි.		
(උ)	2019 ඔක්තෝබර් සිට වර්ෂ තුනකට පසුව 2022 ජූලි මස පුද්ගලයින් 05 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් රෝහල් 05කට අදාළව මෙම ව්‍යාපෘතියේ පළමු වාරිකය ගෙවීමට පෙර ව්‍යාපෘතියේ ක්‍රියාත්මකභාවය පිළිබඳ ඇගයීමක් සිදුකර තිබුණු අතර එම ඇගයීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
	i. කමිටුව විසින් ඇගයීමට ලක් කර සතුටුදායකභාවය සම්බන්ධයෙන් තම මතය ප්‍රකාශ කරන ලද නිර්ණායකයන් 04 ක් සතුටුදායක නොවන (Not Satisfactory) බවත්, නිර්ණායකයන් 38 ක් සම්පූර්ණයෙන් සතුටුදායක නොවන (Partially Satisfactory) බවත් දක්වා තිබුණි. මෙම වාර්තාවට අනුව නිර්ණායකයන් 16 ක් පමණක් සතුටුදායක මට්ටමේ පවතින බව සහතික කර තිබුණි. මේ අනුව සමස්ථයක් ලෙස මෙම ව්‍යාපෘතිය රෝහල් 05 ක ක්‍රියාත්මක කිරීම සතුටුදායක මට්ටමක නොමැති බව මෙම ඇගයීමට අනුව තහවුරු වී තිබුණි.	-එම-	-එම-
	ii. මෙම තත්ත්වය තුළ පළමු වාරිකයෙන් කොටස් ගෙවීමක් (partial payment of first installment) පමණක් සිදුකිරීම මෙම කමිටුව නිර්දේශ කර තිබුණු අතර ගෙවනු ලබන ප්‍රතිශතය එම වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණයන් අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තීරණය කළ යුතු බව දක්වා තිබුණි.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	iii. මෙම කමිටු නිර්දේශයන් අනුව හා ව්‍යාපෘතියේ විෂයපථය හා ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව සම්පූර්ණයෙන්ම වෙනස් වීම මත ගිවිසුම්ගත ගෙවීම් උපලේඛනය පදනම් කරගෙන වාරික ගෙවීමේ කිසිදු හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
(ඌ)	2021 ඔක්තෝබර් 04 දින මෙම ව්‍යාපෘතියේ තත්ත්වය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සටහනක් විෂයභාර අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබුණු අතර 2021 ඔක්තෝබර් 18 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එම අමාත්‍ය මණ්ඩල සටහන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ කෙරෙහි අවධානය යොමුකර ඒ අනුව කටයුතු කරන ලෙස දන්වා තිබුණි. 2021 ඔක්තෝබර් 13 මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවලට අනුව පවතින මූල්‍ය සීමාවන් තුළ ඉතිරි රෝහල් 15 තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පසුව සලකා බැලීම සුදුසු බව දක්වා තිබුණි. මේ අනුවද ණය වාරික ගෙවීම සඳහා එකඟ වූ ගෙවීම් උපලේඛනය සංශෝධනය කිරීමට වගකිව යුතු පාර්ශවයන් කටයුතු කළ යුතුව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	-එම-	-එම-
(එ)	ණය ගෙවීම් උපලේඛනය සංශෝධනය කිරීමකින් තොරව දැනට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක රෝහල් 05 සඳහා අදාළ මුදල කොටස් වශයෙන් ගෙවීමට හා ඉතිරි රෝහල් 15 තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2023 පෙබරවාරි 08 දින ඉදිරිපත් කර තිබුණි. මේ අනුව 2023 මාර්තු 20 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සංදේශයේ 3.1 යෝජනාව වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද රෝහල් 05 ට අදාළව කොටස් ගෙවීමක් කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණු අතර ව්‍යාපෘතියේ ඉතිරි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින්	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ අනුව කටයුතු කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. එසේම එම කරුණු සලකා බැලීමෙන් පසුව විස්තරාත්මක වාර්තාවක් විෂයභාර අමාත්‍යවරයා මගින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයට නියම කර තිබුණි. මෙහිදී මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් තම නිරීක්ෂණවල අංක 1 යටතේ මෙම ව්‍යාපෘතිය රෝහල් 05 ක පමණක් ක්‍රියාත්මක කර ඇති බවත්, ගෙවීම් උපලේඛනය රෝහල් 20 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ බවත්, ගිවිසුම් ගත වගකීම් අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ රෝහල් 05 ට අදාළව කොටස් මුදල් ගෙවීමේ අවශ්‍යතාවය පෙන්වා දී තිබුණද ඒ කෙරෙහි අවධානය යොමු නොකර මුල් ගිවිසුම අනුව රෝහල් 20 තුළම අදාළ ව්‍යාපෘතිය මාස 03 ක් ඇතුළත ක්‍රියාත්මක කිරීම මත ගෙවිය යුතු පළමු ණය වාරිකය ගෙවීම සඳහා කටයුතු කරමින් පැවති බව විගණනයට ඉදිරිපත් කරන ලද ලිපිගොනු අනුව නිරීක්ෂණය විය.		
(ඒ)	අමාත්‍ය මණ්ඩල අනුමැතිය පදනම් කරගෙන මුල් ගිවිසුම අනුව රෝහල් 20 තුළම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් පසුව එළඹෙන ඊලඟ වර්ෂයේදී ගෙවිය යුතු වාරික මුදල වූ එ.ජ.ඩොලර් 3,022,727.27 ක් ගෙවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලෙස 2023 අප්‍රේල් 11 දින සෞඛ්‍ය ලේකම් විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා තිබුණි. 2023 මැයි 03 දිනැති ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් අවධාරණය කර තිබුණේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත්තේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක රෝහල් 05 ට අදාළ වාරික ගෙවීමකට පමණක් බැවින් එම වාරික මුදල නිවැරදිව ඉදිරිපත් කරන ලෙස විය. රෝහල් 05 ට අදාළව වියදම් ඇස්තමේන්තුවක් සැපයුම්කරු ලවා සකස් කරවාගෙන එම මුදල එ.ජ. ඩොලර් 5,480,018 ක් ලෙස හඳුනාගෙන තිබුණද නැවත වරක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් එ.ජ.ඩොලර් 3,022,727.27 ක් වූ රෝහල්	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	20 ටම අදාළ වාරික මුදල ගෙවීම සඳහා ප්‍රතිපාදන සෞඛ්‍ය ලේකම් විසින් 2023 මැයි 10 දින ඉල්ලා තිබුණි. නැවත වරක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් රෝහල් 05 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ පිරිවැය එ.ජ. ඩොලර් 5,480,018 ක් නම් ඒ අනුව ගෙවිය යුතු වාරිකය තීරණය කළ යුතු බව අවධාරණය කරමින් නැවත සලකා බලා ගෙවිය යුතු වාරික මුදල නිශ්චිතව දන්වන ලෙස 2023 මැයි 15 දින සෞඛ්‍ය ලේකම් වෙත දන්වා තිබුණි. නමුත් ඒ පිළිබඳව අවධානයක් යොමු නොකරමින් ගෙවිය යුතු වාරික මුදල එ.ජ.ඩොලර් 3,022,727.27 ක් බව 2023 මැයි 17 දින නැවතත් දන්වා තිබුණි. මේ අනුව සෞඛ්‍ය බලධාරීන් වගකීම් විරහිතව කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය විය.		
(ඔ)	මේ අනුව පරිපූරක ප්‍රතිපාදනයක් ලෙස රු. මිලියන 968 ක් මේ සඳහා වෙන්කර දී තිබුණි. අමාත්‍යාංශය පත් කළ 05 දෙනෙකුගෙන් යුත් කමිටුවේ නිර්දේශය, අමාත්‍යමණ්ඩල අනුමැතිය හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද කරුණු දැක්වීම් සැලකිල්ලට නොගෙන 2023 ජුනි 15 දිනැති බැංකු හර නිවේදනය අනුව එ.ජ.ඩොලර් 3,022,727.27 ක් වෙනුවෙන් රු.9,984,908 ක බැංකු ගාස්තු සමඟ රු.1,007,484,807 ක් ගෙවා තිබුණි. මීට අදාළව 2023 ජුනි 28 දිනැති රු.968,000,000 ක අංක සී 1010 දරන ගෙවීම් වවුචරය හා 2023 දෙසැම්බර් 31 දිනැති රු.39,484,907 ක අංක සී.2580 දරන ගෙවීම් වවුචරය පිළියෙල කර තිබුණි. ඉහතින් දැක්වෙන නිරීක්ෂණයන් අනුව මෙම ගෙවීම විධිමත් පරිදි බලය ලත් ගෙවීමක් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.	-එම-	-එම-
(ඕ)	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද රෝහල් 05 හි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී උද්ගත වූ ගැටළුකාරී තත්ත්වයන් විසඳා ගැනීම වෙනුවෙන් මෙම රෝහල් 05 වෙනුවෙන් රු. මිලියන 63 ක ප්‍රතිපාදන ලබාදෙන ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) විසින් 2022 ජුනි	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	06 දින ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ (PSSP) අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලා තිබුණි. මේ අනුව විධිමත් අධ්‍යයනයකින් මෙම ගැටළු අදාළ ව්‍යාපෘතිය යටතේ විසඳිය යුතුද යන්න හඳුනාගැනීමකින් තොරව මෙම රෝහල් 05 ට ප්‍රතිපාදන නිකුත් කර තිබුණි.		
(ක)	සැලසුම් අංශය විසින් මෙම ව්‍යාපෘතියට අදාළව විගණනයට ඉදිරිපත් කරන ලද ලිපිගොනුවල ඇතුළත් විය යුතු වූ සැලකිය යුතු ලිපි ප්‍රමාණයක් ඇතුළත් වී නොතිබුණි. මෙවැනි ඉහළ මූල්‍ය වටිනාකමක් සහිත ව්‍යාපෘතියකට අදාළ ලිපිගොනුවල ඇතුළත් ලිපි මේ ආකාරයට අස්ථානගත වීම ඉතාමත් අහිතකර තත්ත්වයක් බව නිරීක්ෂණය විය.	-එම-	-එම-

3.4 **ප්‍රසම්පාදනයන්**

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
(අ)	2021 ඔක්තෝබර් 01 දින සිට 2022 සැප්තැම්බර් 30 දින දක්වා කරාපිටිය ශික්ෂණ රෝහලේ පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීම සඳහා සමාගමක් සමඟ ගිවිසුම්ගත වී තිබුණු අතර ගිවිසුම් කාලය අවසන් වන තෙක් ඊළඟ වර්ෂය සඳහා නව සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු ද අවසන් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව සමත් වී නොතිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. තෝරාගත් සැපයුම්කරු විසින් සැපයීමට ගිවිසුම්ගත වූ වෙළඳ නාමයන් සහිත පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍ය ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී රෝහලට සපයා නොතිබුණු අතර,	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන්	රසායනික ද්‍රව්‍ය භාර ගැනීම හා බෙදා හැරීම කටයුතු රෝහලේ අධ්‍යක්ෂකගේ අංක **THKA/S/**4/1/04 හා 2023.02.15 දිනැති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

		සැපයුම්කරු විසින් ලංසු ලේඛන සමඟ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණු වෙළඳ නාමය සහිත පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය වෙනුවට වෙනත් වෙළඳ නාමයක් සහිත රසායනික ද්‍රව්‍යයන් විධිමත් අනුමැතියකින් තොරව රෝහලට සපයා තිබුණි. ඒ අනුව සැපයුම්කරු විසින් ගිවිසුමට අනුකූල නොවන පරිදි සැපයූ වෙළඳ නාමයන් සහිත රසායන ද්‍රව්‍ය 2022 ජනවාරි මස සිට විගණිත දිනය වූ 2023 මැයි 15 දින දක්වා සපයා තිබුණු අතර, ඒ පිළිබඳ සොයා බැලීමෙන් තොරව සැපයුම්කරුගේ සේවාව රෝහල විසින් ලබාගෙන තිබුණි. ඒ අනුව සැපයුම්කරු විසින් සැපයූ පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍යවල ප්‍රමිතිය හා තිබිය යුතු රසායනික සංයුතිය පිළිබඳව ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනයෙන් (ITI) සහතික කරගෙන නොතිබුණු අතර, ගිවිසුම් ප්‍රකාරව සපයා නොමැති පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය වෙනුවෙන් 2021 ඔක්තෝබර් 01 සිට 2022 සැප්තැම්බර් 31 දක්වා රු.2,402,550 ක් හා 2022 ඔක්තෝබර් 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා රු.599,640 ක් වශයෙන් එකතුව රු.3,002,190 ක් සැපයුම්කරුට ගෙවීමට හා 2023 ජනවාරි සිට මැයි දක්වා එකතුව රු.7,722,000 ක් සැපයුම්කරුට ගෙවීම සඳහා වවුචර් සකස් කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට හා සැපයුම් ගිවිසුමේ කොන්දේසිවලට අනුකූල නොවන ක්‍රියාවක් බවට විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය වූයෙන් අදාළ ගෙවීම් අවිධිමත් වියදම් වන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	ලිපි මගින් ආසාදන පාලන ඒකකය වෙත පවරා ඇති බව.
	ii.	2022/2023 වර්ෂය සඳහා සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ ලංසු ලේඛනවල IV වන කොටසේ අවශ්‍යතා උපලේඛනයේ අංක 3 කොන්දේසිය අනුව හා පිරිසිදු කිරීමේ සේවා සඳහා ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් කාලය තුළ පිරිසිදු කිරීමේ සේවා සඳහා වාර්ෂිකව සපයාගත යුතු එකතුව රු.1,063,104 ක් වටිනා උපකරණ ලැයිස්තුවට අනුව සැපයිමට එකඟ වූ උපකරණ ඒකක 229 සපයා	-එම-	දෛනිකව පවිත්‍රතා කටයුතු සඳහා භාවිතා වන මෙම උපකරණ රෝහලේ නිලධාරීන් භාරයේ තබා ගෙන නිකුත් කිරීම, භාර ගැනීම සිදු කිරීම ප්‍රායෝගික නොවන බැවින් එම පිරිසිදු කිරීමේ උපකරණ එම අයීක්ෂණ නිලධාරීන් භාරයේම පවතින බව,

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	නොතිබුණු අතර, ඉකුත් වර්ෂවලදී භාවිතා කරන ලද වෙනත් වර්ගවලට හා ප්‍රමිතිවලට අයත් ක්ෂය වූ හා අබලන් වූ උපකරණ පිරිසිදු කිරීම සඳහා භාවිතා කරන බවත්, ඒවා ගබඩාවල පැවති බවත් නිරීක්ෂණය වූයෙන් ගුණාත්මක පිරිසිදු කිරීමේ සේවයක් සැපයුම්කරු විසින් රෝහලට ලබා නොදෙන බව විගණන භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව ලංසු මිල ගණන් ලබා දීමේදී සැපයුම්කරු විසින් ඒ වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු රු.1,063,104 ක් වූ ලංසු මිල සැපයුම්කරුට ගෙවීමට කටයුතු කිරීම ගිවිසුම් ප්‍රකාරව සිදුකළ නොහැකි බවට නිරීක්ෂණය වූයෙන් එම ගෙවීම් අවධිමත් ගෙවීම් වන බවට වැඩිදුරටත් නිරීක්ෂණය විය.		අවශ්‍යතාවය පරීදි අවශ්‍ය යන්ත්‍රෝපකරණ පිළිබඳ ගැටළුවක් ඇති වන විටදී එම පරීක්ෂා කිරීම් සිදු කරන අතර, එම උපකරණ රෝහල වෙත භාර ගන්නා ස්ථිර උපකරණ (උදලු, කැති) නොවන අතර, අදාළ වෙළඳ නාමයන්ගෙන්ම යුත් උපකරණ ද යන්න තහවුරු කර ගෙන නොමැති බව, නමුත් අදාළ උපකරණ ගිවිසුම් ප්‍රකාරව අංශ ප්‍රධානි ආසාදන පාලන ඒකකය වෙත භාර දෙන ලෙස අදාළ සමාගම වෙත හා අංශ ප්‍රධානි - ආසාදන පාලන ඒකකය වෙතද පිටපත් සහිතව ලිඛිතව දන්වා ඇති බව, මෙම උපකරණ සඳහා ගිවිසුම් ප්‍රකාරව මාසික බිල්පත් වලින් සෘජු ගෙවීම් නොකරන නමුත් පොදුකාර්ය පිරිවැය අයිතම යටතේ ගෙවීම් සිදු විය හැකි බැවින් අදාළ උපකරණ නියමිත වෙළඳ නාම වලින්ම සපයන තෙක් ගෙවීම් නොකරන බව.
	iii. 2022/2023 වර්ෂය සඳහා සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ ලංසු ලේඛනවල IV වන කොටසේ අවශ්‍යතා උපලේඛනයේ අංක 4 කොන්දේසිය අනුව හා පිරිසිදු කිරීමේ සේවා සඳහා ගිවිසුම් ප්‍රකාරව පිරිසිදු කිරීමේ සේවය සඳහා මාසිකව/වාර්ෂිකව සැපයිය යුතු උපකරණ ලැයිස්තුව අනුව සැපයිය යුතු උපකරණ නියමිත ප්‍රමිතියෙන් හා වර්ගයන්ගෙන් සපයා නොතිබුණි. ඒ අනුව ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු නොකළ සැපයුම්කරුට ඒ වෙනුවෙන් රු.2,050,800 ක් ගෙවීමට කටයුතු කිරීම ගිවිසුම් ප්‍රකාරව සිදුකළ	-එම-	පිරිසිදු කිරීමේ උපකරණ භාර ගැනීම හා බෙදා හැරීමේ කටයුතු අංක THKA/S/4/1/04 හා 2023.02.15 දිනැති ලිපිය මගින් ආසාදන ඒකකය වෙත පවරා ඇති බව, ඒ අනුව රසායනික ද්‍රව්‍ය හා උපකරණ භාර ගැනීම පිළිබඳ වෙළඳ නාමයන්ද සහිතව සියළු තොරතුරු ආසාදන පාලන ඒකකය වෙත ලබා දී ඇති බව, නමුත් රසායනික ද්‍රව්‍ය හා උපකරණ භාර ගැනීමේදී

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	නොහැකි බවට නිරීක්ෂණය වූයෙන් එම ගෙවීම් අවිධිමත් ගෙවීම් බවට වැඩිදුරටත් නිරීක්ෂණය විය.		ඊට අනුකූලව කටයුතු කර නොමැති බවට වන විගණන නිරීක්ෂණය හා එකඟ වන බව, අදාළ රසායනික ද්‍රව්‍ය හා උපකරණ වෙනුවෙන් වන ගෙවීම් අත්හිටුවන ලද බව, පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා උපකරණ බෙදා හැරීම සම්බන්ධව ලොග් සටහන් පවත්වා ගැනීම සම්බන්ධව විගණන නිරීක්ෂණයට ලක් වූ බැවින් අදාළ කරුණු නිවැරදි කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත් බව.
	iv. සැපයුම්කරු විසින් මාසිකව සපයන පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය හා පිරිසිදු කිරීමේ උපකරණ රෝහලේ ආසාදන පාලන ඒකකය විසින් භාරගන්නා බවත්, එම ඒකකය විසින් එක් එක් අංශවලට පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය හා පිරිසිදු කිරීමේ උපකරණ නිකුත් කරන බවත් නිරීක්ෂණය වූවද, අසාදන පාලන ඒකකය විසින් ලැබීම් නිකුත් කිරීම් හා ශේෂය පිළිබඳ යාවත්කාලීන තොරතුරු ඇතුළත් කර තොග ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ අනුව විගණිත දින වන විට සැපයුම්කරු විසින් රෝහලට සැපයූ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය හා පිරිසිදු කිරීමේ උපකරණ ප්‍රමාණයන් හා ඒවා නිකුත් කිරීමේ ප්‍රමාණයන් හා භෞතික ශේෂය සනාථ කරගැනීමට අදාළ සාක්ෂි ලබාගැනීමට විගණනයේදී නොහැකි විය.	-එම-	-එම-
(ආ)	2022/2023 වර්ෂය සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලෙහි පල්දෝරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු. 7,351,960 ක් වූ ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් හා පල්දෝරු සේවාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	i. 2023 අගෝස්තු මස විගණිත දින වන විට අවුරුදු 30 කට ප්‍රථම නේවාසික රෝගීන් 600 ධාරිතාවයට ගැලපෙන පරිදි ඉදිකරන ලද මෙම අපජලය අපහරණ පද්ධතිය වර්තමානයේදී නේවාසික රෝගීන් 2000 ක් හා කාර්ය මණ්ඩලය 4000 ක් වෙනුවෙන් කිසිදු සංවර්ධනයකින් තොරව යොදාගන්නා බවට නිරීක්ෂණය විය. ඒ අනුව පල්දෝරු පද්ධතිය සංවර්ධනය කිරීමකින් තොරව අබලන් තත්ත්වයෙන්ම වැඩි අපද්‍රව්‍ය ධාරිතාවයක් පිරිසිදු කිරීමට යොදාගන්නා බවට නිරීක්ෂණය වූයෙන් ඉන් බාහිර පරිසරයට මුදා හැරෙන අපජලයේ ගුණාත්මකභාවය හා ප්‍රමිතිය පිරිහී ඇති බවත්, ඒ තුළින් පාරිසරික අහිතකර තත්ත්වයන් නිර්මාණය වී ඇති බවත් විගණනයේදී බැහැර කළ නොහැකි විය.	බාහිර පරිසරයට මුදා හැරෙන අපජලයේ ගුණාත්මකභාවය හා ප්‍රමිතිය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.	රෝහලේ පිටවන අපජලය ධාරිතාවය සඳහා පවතින පල්දෝරු පද්ධතිය ප්‍රමාණවත් නොවූවද බාහිර පරිසරයට මුදා හරින අප ජලය සෞඛ්‍යාරක්ෂිත තත්ත්වයෙන් යුතුව මුදා හැරීමට කටයුතු කර ඇති බව, පල්දෝරු පද්ධතියක අවශ්‍යතාවය පිළිබඳව දිගින් දිගටම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත දන්වා ඇති බව, ඉදිරියේදී පල්දෝරු පද්ධතිය පිළිබඳවද, පල්දෝරු පද්ධතියක් නඩත්තු කිරීමට අදාළ තාක්ෂණික දැනුමක් සහිත නිලධාරීන් මෙම ආයතනයේ කාර්යය මණ්ඩලය තුළ නොමැති බව, එම නිසා පිරිවිතර සකස් කිරීම, ඇගයීම, කිරීමට නියමිත වැඩ සහ කරනු ලැබූ නඩත්තු සේවා ආදිය පිළිබඳ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ නිර්දේශ කොන්ත්‍රාත් ප්‍රදානය සහ ගෙවීම කිරීමට නිර්දේශ ලෙස ලබා ගන්නා බව, මෙම පල්දෝරු පද්ධතිය නඩත්තුව සහ මෙහෙයවීම උදෙසා සදහා ජාතික තරඟකාරී ලංසු මිල කැඳවීමක් මගින් ලංසු කැඳවා ඇති බව, එසේ වූවත් ඒ සඳහා දැනට මෙම කොන්ත්‍රාත්තුව කර ගෙන යන කොන්ත්‍රාත්කරු පමණක් මිල ඉදිරිපත් කර ඇති බව, එම නිසා රෝහල් කටයුතු කරගෙන යාමේ අවශ්‍යතාවය සලකා ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			උපදේශන කාර්යාංශයේ මිල ගණන් ඇගයීමට යටත් ව කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති බව.
	ii. 2022/2023 වර්ෂය වෙනුවෙන් පල්දෝරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සකස් කරන ලද රු.7,351,960 ක් වටිනා ඇස්තමේන්තුව සකස් කිරීමට පදනම් කරගත් මිල විශ්ලේෂණයන් (HSR/BSR/ISR/SSR) විගණනයට ඉදිරිපත් නොවූයෙන් ඇස්තමේන්තු රේටයන්වල ආර්ථික බව හා යෝග්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.	මෙම තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.
	iii. රෝහලේ ගලිවල ඇතිවන අවහිරතා වැළැක්වීම වෙනුවෙන් ඇස්තමේන්තුවේ අයිතම අංක 14 යටතේ රු.1,900,000 ක් ඇස්තමේන්තු කිරීමට බලපෑ සාධාරණ හේතු ඉදිරිපත් නොවූ අතර, තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් අදාළ අයිතමය වෙනුවෙන් රු.2,700,000 ක් එනම් ඇස්තමේන්තු අගයට වඩා සියයට 42 ක් වැඩියෙන් මිල ඉදිරිපත් කර තිබුණු අතර, ඒ පිළිබඳව සැලකීමෙන් තොරව කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වීමෙන් අවිධිමත් ගෙවීම් සඳහා ඉඩකඩ සලසා දී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.	මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් සිදුකර. අවිධිමත් ගෙවීම් සඳහා ඉඩකඩ සලසා දුන් වගකිව යුත්තන්ට එරෙහිව විනයානුකූල කටයුතු කලයුතු අතර පල්දෝරු පද්ධතියේ මෙහෙයුම් කටයුතු පිළිබඳ විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කල යුතුය.	-එම-
	iv. පල්දෝරු පද්ධතියේ මෙහෙයුම් කටයුතු කරනු ලබන කොන්ත්‍රාත්කරුගේ ලිපිලේඛන පරීක්ෂා කිරීමේදී එක් සේවකයකු පමණක් රු. 1,000 ක් දෛනිකව ගෙවීමේ පදනමට සේවයේ යොදවා තිබුණු බැවින් ඉංජිනේරු ඇස්තමේන්තුවේ අයිතම අංක 02 වෙනුවෙන් ප්‍රමාණ පත්‍රවල දැක්වුණු රු.1,440,000 ක්වූ	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	වටිනාකම නිවැරදි නොවන දත්ත මත හා කොන්ත්‍රාත්කරුවන්ට අසාමාන්‍ය ලාභ උපයාගැනීමේ අරමුණු ඇතිව ඇතුළත් කළ වියදම් වන බවට නිරීක්ෂණය විය. ඒ අනුව ගිවිසුමේ දැක්වෙන පරිදි කොන්ත්‍රාත්කරු සත්‍ය වශයෙන් දෛනික සේවකයෙකු පමණක් සේවයේ යොදවා ගනිමින් පල්දෝරු පද්ධතිය ක්‍රියාත්මක කරන නිසා තවත් සේවකයෙකු වෙනුවෙන් ගෙවන ලද රු.720,000 ක් අවධිමත් හා නිශ්කාර්ය වියදම් වන බවට වැඩිදුරටත් නිරීක්ෂණය විය.		
	v. ලංසු ලේඛන පිළියෙල කිරීමේදී පල්දෝරු පද්ධතිය සඳහා ඒ හා සමාන අත්දැකීම් හා සුදුසුකම් ඇති වෘත්තීය හා තාක්ෂණික නිලධාරීන් (අවම NVQ 4 සුදුසුකම්ලත්) සිටිය යුතු බවට තොරතුරු ඇතුළත් කර තිබුණද, තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ යන්ත්‍ර ක්‍රියාකරු (Plant operator) අදාළ සුදුසුකම් සපුරා නොතිබුණි. ඒ අනුව ඇස්තමේන්තු ප්‍රකාරව අදාළ වැඩ අයිතමය වෙනුවෙන් රු.1,080,000 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීම නිෂ්කාර්ය වියදම් වී තිබුණි. කෙසේ නමුත් යන්ත්‍ර ක්‍රියාකරු පල්දෝරු පද්ධතිය මෙහෙයවීමේ කටයුතු සිදුකරන කොන්ත්‍රාත්කරුගේ අනෙකුත් වැඩ කොන්ත්‍රාත්වල සේවයේද යෙදෙන සේවකයකු බවට නිරීක්ෂණය වූයෙන් පූර්ණකාලීනව පල්දෝරු පද්ධතියේ සේවයේ නොයෙදෙන බැව් නිරීක්ෂණය විය.	-එම-	-එම-
	vi. පල්දෝරු පද්ධතියේ ඇස්තමේන්තුවේ වැඩ අයිතමයන් අනුව වාර්ෂික නුපුහුණු ශ්‍රමිකයන් දෙදෙනකුට වේතන, යන්ත්‍ර ක්‍රියාකරුගේ වැටුප් හා ගලි අවහිරතා පිරිසිදු කිරීමේ වියදම් වෙනුවෙන් පිළිවෙලින් රු.1,080,000 ක්, රු.1,560,000 ක් හා රු.2,200,000 ක් වශයෙන් එකතුව රු.4,840,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර, එය රු.6,683,600 ක් වූ මුළු සේවා ඇස්තමේන්තුවෙන් සියයට 72 ක් විය. රෝහල් කාර්ය මණ්ඩලය	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	තුළ යන්ත්‍ර සුපරීක්ෂකවරයෙකු (Plant supervisor) හා Plumber/Pump Machine Operator සේවකයින් දෙදෙනකු වශයෙන් නිලධාරීන් තිදෙනෙකු සේවයේ නිරත වන බැවින් පල්දොරු පද්ධතියේ වැඩ ඔවුන් මගින් ඉටුකරවා ගැනීමට හැකියාව තිබුණු බවත්, එසේ කටයුතු නොකිරීම හේතුවෙන් බාහිර සැපයුම්කරුට ගෙවූ රු.4,840,000 ක් නිශ්කාර්ය වියදම් වන බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය.		
	vii. ඉහත දැක්වෙන විගණන නිරීක්ෂණයන් අනුව පල්දෝරු පද්ධතියේ මෙහෙයුම් කටයුතු පිළිබඳ ප්‍රසම්පාදන කටයුතු, ඇස්තමේන්තු සකස් කිරීම, ලංසු ලේඛන හා පිරිවිතර සකස් කිරීම ආදිය සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් රෝහල තුළ ක්‍රියාත්මක නොවන බවත් කොන්ත්‍රාත්කරු තෝරාගැනීමේ ක්‍රමවේදයේ විනිවිදභාවයක් නොමැති බවත්, පල්දෝරු සේවාව පිළිබඳව රෝහලේ වගකිව යුතු නිලධාරීන් විසින් නිසි පරිදි අධික්ෂණය හා සුපරීක්ෂණය සිදු නොකරන බවත් නිරීක්ෂණය විය.	-එම-	-එම-
(ඇ) -	මහනුවර ජාතික රෝහලට 2022/2023 වර්ෂයේ අමු ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව රු.507,472,200 කට (වැට් රහිත) වාර්ෂික කොන්ත්‍රාත් මුදලකට 2022 අගෝස්තු 01 සිට ජූලි 31 දක්වා කාලපරිච්ඡේදයට අදාලව ගිවිසුම්ගතවීමකින් තොරව 2023 ජනවාරි 17 දිනැති ලිපියකින් කොන්ත්‍රාත්කරුවෙකුට පවරා තිබුණි. පසුව 2023 ජූලි 31 දින කොන්ත්‍රාත් කාලය අවසන් වීමට නියමිත දිනට ආසන්නව 2023 ජූලි 14 දින ගිවිසුම අත්සන් කර තිබුණි. ඒ අනුව අදාළ කාලය තුළ ගිවිසුම්ගතවීමකින් තොරව සැපයීම් කටයුතු ඉටු කරවා ගෙන තිබුණි. එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ඡේදය ප්‍රකාරව 2022 අගෝස්තු 01 දින සිට 2023 අගෝස්තු 28 දින දක්වා වලංගු වන පරිදි රු.50,747,220 ක කාර්යසාධන ඇපකරයක් 2023 පෙබරවාරි 07 දිනට පෙර ලබා දිය යුතු	මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් සිදුකර. වගකිව යුත්තන්ට එරෙහිව විනයානුකූල කටයුතු කලයුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව. -

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	බවට කොන්ත්‍රාත්කරුට දන්වා සිටියද කොන්ත්‍රාත්කරු එය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පරිබාහිරව කටයුතු කර සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් 2023 ජුනි 14 දිනැති ලිපියකින් රු.8,457,870 ක කාර්යසාධන ඇපකරයක් ලබාදෙන ලෙස දන්වා තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන වලට පරිබාහිරව කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතා අනුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.		
(ඇ)	සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහලේ 2023/2024 වර්ෂය සඳහා අමු ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව 2023 වර්ෂයේ මැයි 01 දින සිට ඔක්තෝබර් 31 දින දක්වා ලබා දී තිබුණු පුද්ගලික ආයතනය වෙතම, කාලය දීර්ඝ කර 2023 නොවැම්බර් 01 දින සිට 2024 අප්‍රේල් 30 දින දක්වා කාලයට රු.18,473,490 කට (වැට් රහිත) කොන්ත්‍රාත් මුදලකට ලබා දීමට 2023 ඔක්තෝබර් 31 දිනැති අංක MH/PB/06/RF/34/2023 දරන අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) ගේ ලිපියට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. කෙසේ නමුත් 2023 දෙසැම්බර් 08 දින වන විටද එයට අදාළ ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ඡේදය ප්‍රකාරව රු.1,847,349 ක් වටිනා කාර්යසාධන සුරක්ෂණයද ඉදිරිපත් කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් සිදුකල යුතුය.	මෙම ප්‍රසම්පාදනයේ ලංසු කැඳවීම වර්ෂයක කාලයක් සඳහා සේවාව ලබා ගැනීම වෙනුවෙන් සිදු කර ඇති බව, කෙසේ වෙතත් එවකට රට තුළ පැවති අවිනිශ්චිත තත්ත්වයන් හේතුවෙන් තෝරාගත් සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු මෙම ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් කර තිබූ මිල ගණන් වෙළඳපල සාමාන්‍ය මිල ගණන් වලට වඩා වැඩි ඉතා ඉහල අගයක් වූ බැවින් මූලිකව වසරක කාල සීමාවෙන් මාස 06 ක කාලයකට පමණක් කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කර ඇති බව, ඒ අනුව පසුකාලීනව සිදු වූ ඩොලරයේ අගය අඩුවීම සහ ආනයනික සීමාවන් ලිහිල් කිරීම යනාදී කරුණු හේතුවෙන් අයිතම බොහොමයක් වෙළඳපල මිල ගණන් අඩුවී තිබූ බැවින් වෙළඳපල මිල ගණන් සැලකිල්ලට ගෙන සැපයීම් සිදු කරනු ලබන කොන්ත්‍රාත්කරුගෙන් ඉදිරි මාස 06 සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති බව, එබැවින් මෙහිදි කොන්ත්‍රාත් කාලය දීර්ඝ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			කිරීමක් සිදු වී නොමැති අතර රජයට වාසිවන අයුරින් ඉතිරි මාස 06ක කාලය සඳහා මිල සංශෝධනය කර ඇති බව, රට තුළ උද්ගතව තිබූ ආර්ථික අර්බුදය හමුවේ කොන්ත්‍රාත්කරුවන් කාර්යසාධන ඇපකර ලබා නොදීමේ පසුබිමක් තුළ රෝහල්වල අමු ආහාර සැපයීමේ සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා කාර්යසාධන ඇපකර ලබා ගැනීමකින් තොරව සහ කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව වුවද මෙම සේවාව අදාළ කොන්ත්‍රත් ප්‍රදානයන් අවලංගු නොකර අඛණ්ඩව ලබා ගෙන ඇති බව, කෙසේ වෙතත් කාර්යසාධන ඇපකර ලබා ගෙන කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරන තෙක් කිසිදු ගෙවීමක් සිදු නොකිරීමට එම රෝහල මගින් කටයුතු කර ඇති බව, මේ වන විට රට සාමාන්‍ය අතට හැරෙමින් පවතින බැවින් නිසි කොන්ත්‍රාත් පරිපාලන ක්‍රම අනුගමනය කරමින් කටයුතු කරමින් පවතින බව, 2024.02.24 දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර ඇති අතර රු.1,872,549 වන කාර්යසාධන ඇප බැඳුම්කරය ද ලබා ගෙන ඇති බව.
(ඉ)	නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහල තුල නේවාසික රෝගීන්ට හා කනිෂ්ඨ කාර්ය මණ්ඩලයට 2023 වර්ෂය සඳහා සෘජුවම පිසූ ආහාර සැපයීම සඳහා ලංසු කැඳවා තිබුණු අතර ඒ සඳහා ලංසු 4 ක් ඉදිරිපත් වී තිබූ අතර රු.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, 2023 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ප්‍රසම්පාදනගේ අනුමැතියට යටත්ව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	37,152,025 ක අවම ලංසුව ඉදිරිපත් කළ සැපයුම්කරුට තාක්ෂණික ඇගයීම් කමිටුව කිසිදු සාධාරණ හේතු දැක්වීමකින් තොරව ලංසුව ප්‍රදානය ප්‍රතික්ෂේප කර රු.38,407,360 ක දෙවන අවම ලංසුව ඉදිරිපත් කළ සැපයුම්කරුට කොන්ත්‍රාත්තුව පිරිනමා රු.1,255,335 ක පාඩුවක් සිදු කර තිබුණි.		පිසූ ආහාර සඳහා සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදනය කර ඇති බව, ඒ සඳහා ලංසුකරුවන් 04 දෙනෙකු විසින් මිල ගණන් ඉදිරිපත් කළ බව, ඒ අනුව පිරිවැය , ගුණාත්මභාවය හා රෝහලේ මීට පෙර අවස්ථා වලදී පිසූ ආහාර සැපයීම පිළිබඳව වරින් වර වාර්තා වූ විවිධ කරුණු සම්බන්ධව හා මුළුතැන්ගෙය මගින් සපයනු ලබන ආහාරවල ගුණාත්මකභාවය ආදී කරුණු සියල්ල පිළිබඳවම සලකා සාමාන්‍ය ආහාර වටයක පළමු හා දෙවන ලංසුකරු අතර මිල පරතරය රු10 ක් 15 වැනි සුළු මිල පරතරය පිළිබඳ පමණක් සලකමින් තාක්ෂණික ඇගයීම් කමිටු බර නොතබා පිරිවැය හා ගුණාත්මකභාවය යන කරුණු සියල්ල සලකා බලා වඩාත්ම සුදුසු ලංසුකරු වන දෙවන අවම ලංසුකරුට 2023 වර්ෂයට ආහාර සැපයීමට සුදුසු බව නිර්දේශ ලබා දී ඇති බව.
(ඊ)	පේරාදෙණිය ශික්ෂණ රෝහලේ විකලාංග අංශයේ ශල්‍යකර්ම සඳහා භාවිතා කිරීමට Pneumatic Trauma Orthopedics Drill System උපකරණයක් මිලදී ගැනීම සඳහා 2023 ජූලි 13 දින ලංසු කැඳවා තිබූ අතර, අවම ලංසුව වන රු.8,512,931 ක මුදලක් ඉදිරිපත් කර තිබූ ලංසුකරු ඇගයීමට ලක්කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව 2023 අගෝස්තු 16 දින ඉදිරිපත් කර තිබුණ ද ප්‍රසම්පාදන කමිටුව රැස්වී තිබුණේ දින 35 ක ප්‍රමාදයකින් පසුව එනම් 2023 සැප්තැම්බර් 20 දිනය. 2023 නොවැම්බර් 22 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව නැවත ලංසු	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම උපකරණය මිලදී ගැනීමට මාස 4 ක කාලයක් ගතවීම සඳහා ලංසු ඇගයීමේ කටයුතු ප්‍රමාද වූයේ එහි තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කරනු ලබන ජීව වෛද්‍ය ඉංජිනේරුවරයා දැනට රෝහල් 04 ක රාජකාරී කටයුතු ආවරණය කරනු ලබන බැවින් හා විශේෂඥ වෛද්‍ය

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	කැඳවීම තීරණය කර තිබුණද, 2023 දෙසැම්බර් 14 දින වන විටද නැවත ලංසු කැඳවීමක් කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.4.1 අනුව අවශ්‍ය විධිමත් අනුමැතීන් ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් සැලසෙන පරිදි ලංසු ඇගයීම් හැකිතාක් ඉක්මනින් සිදුකළ යුතු වූවද ලංසු කැඳවීම 2023 ජූලි 13 දින ආරම්භ කර තිබූ අතර ලංසු විවෘත කිරීම ජූලි 28 දින සිදු කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව 2023 අගෝස්තු 16 දින සහ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සැප්තැම්බර් 20 ලබා දී තිබුණි. මෙම ප්‍රසම්පාදනයේ ඇගයීම් ක්‍රියාවලිය සඳහා ලංසු විවෘත කිරීමෙන් පසු මාස 04 කට ආසන්න කාලයක් ලබාගැනීම හේතුවෙන් විකලාංග ශල්‍ය කටයුතු සඳහා අත්‍යාවශ්‍ය වූ උක්ත උපකරණය සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගැනීමට නොහැකි වී තිබුණි.		නිලධාරීන් රෝගී පරීක්ෂණ කටයුතු, සායන කටයුතු හෝ ශල්‍යකර්ම ආදියෙහි පවතින ඉතාමත් කාර්ය බහුල තත්ත්වයන් මැද මෙම ඇගයීම් කටයුතු සිදු කරනු ලබන අතරම ඔවුන්ගේ නිශ්චිත රාජකාරි කටයුතු වලින් බැහැර වන අවස්ථාවන්හිදී හා ජීව වෛද්‍ය ඉංජිනේරුවරයා රෝහල තුළ කටයුතු කරන අවස්ථාවන්හිදී පමණක් මෙම තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම පැවැත්වීමට සිදුව ඇති බව, ඉදිරියේදී මෙම ගැටළුව අවම කර ගනිමින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7:4:1 පරිදි කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දුන් බව.
(උ)	පේරාදෙණිය ශික්ෂණ රෝහලේ විකලාංග අංශය සඳහා Battery Operated Trauma Orthopedic Drill උපකරණ මිලදී ගැනීම සඳහා 2023 ජූලි 13 දින පුවත්පත් දැන්වීම් පළකර ලංසු කැඳවා තිබුණු අතර ආයතන 02 ක් ලංසු ඉදිරිපත් කර තිබුණි. 2023 ජූලි 28 දින ලංසු විවෘත කර තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව 2023 අගෝස්තු 16 දින ලබා දී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුව විසින් 2023 ඔක්තෝබර් 03 දින රු. 14,712,638 ක අවම ලංසු වටිනාකම ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙතින් මිලදී ගැනීමට තීරණය කර 2023 ඔක්තෝබර් 31 දින ලංසුකරු වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණද, 2024 පෙබරවාරි 28 දින වන විටද මෙම උපකරණය මිලදී ගෙන නොතිබුණි. මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.4.1 කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම උපකරණය මිලදී ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමේදී අදාළ ආයතනය විසින් ඇණවුම නිකුත් කළ දින සිට සති 06 ක කාලයක් සැපයීම සඳහා ගතවන බව දැනුම් දී තිබුණු බව, ඒ අනුව මෙම ප්‍රමාදය සම්බන්ධයෙන් කරුණු විමසීමේදී නිෂ්පාදන ක්‍රියාවලියේ පවතින ප්‍රමාදයක් හේතුවෙන් මෙම උපකරණය සැපයීමට ප්‍රමාද වන බව නිෂ්පාදන ආයතනය විසින් දැනුම් දී තිබූ බැවින් තවදුරටත් සැපයුම් කාලය 2024.03.30 දින තෙක් දීර්ඝ කර දෙන ලෙස එම ආයතනය විසින් ඉල්ලා තිබුණු බව, ඒ

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			අනුව මාගේ 2023.12.08 දිනැති ලිපියෙන් 2024.03.30 දිනට පෙර එම උපකරණය රෝහල වෙත සපයන ලෙසට අදාළ ආයතන වෙත දැනුම් දී තිබූ අතර 2024.03.30 දින එම උපකරණය රෝහල වෙත සපයා ඇති බව.
(ඌ)	මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ කසළ මළු (Garbage Bags) මිලදී ගැනීම හා භාවිතය පිළිබඳ සිදුකරන ලද විගණනයේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ කසළ මළු (Garbage Bags) අවශ්‍යතාව තීරණය කිරීමේදී හා 2022 වර්ෂය තුළ රු.1,218,892 ක හා 2023 වර්ෂය තුළ රු.3,283,766 ක කසළ මළු (Garbage Bags) මිලදී ගැනීමේදී රෝහලේ පවතින කසළ බඳුන්වල ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් විශාල, මධ්‍යම හා කුඩා ප්‍රමාණයන්ගේ කසළ මළු (Garbage Bags) මිලදී ගැනීමට කටයුතු නොකර, පිරිමැසුම්දායක බවින් තොරව මධ්‍යම ප්‍රමාණයේ කසළ බහාලුම් සඳහා ද විශාල කසළ මළු භාවිතා කරමින් පැවති අතර, විගණනයේදී භෞතිකව පරීක්ෂා කළ වාට්ටු 03 ක භාවිතා වන මධ්‍යම ප්‍රමාණයේ කසළ බඳුන් 17 ක් වෙනුවෙන් ද විශාල ප්‍රමාණයේ කසළ මළු යොදා තිබුණි.	පිරිමැසුම්දායක බවින් යුතුව කසළ මළු භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2022 වර්ෂයේ විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර කසල මළු මිලදී ගත්තද , රටේ උද්ගතව පැවති මූල්‍ය අර්බුදය මත ආනයන සීමා කර තිබීම හේතුවෙන් අමුද්‍රව්‍ය මිල ගණන් විශාල වශයෙන් ඉහල යාම මත මාතලේ රෝහල වෙත කසල මළු ලබා දීමේදී සැපයුම්කරු විසින් ඇණවුම් කළ ප්‍රමාණයට වඩා අඩුවෙන් කසල මළු සැපයූ අවස්ථා ගණනාවක්ම පැවති බව, ඒ හේතුව මත ඉතා සීමිතව කසල මළු පාවිච්චිය සඳහා යෙදීමට සිදු වූ අතර යම් යම් අවස්ථාවන්හිදී ඒ වන විට තමන්ට භාර දී තිබෙන කසල මළුවල විශාලත්වය නොසලකා සේවා අවශ්‍යතාවය පරිදි කසල බඳුන් සඳහා යෙදීමට ඒ ඒ වාට්ටු භාර නිලධාරීන්ට සිදු වූ අවස්ථා තිබුණු බව, එසේ වූවද මේ වන විට විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හරහා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			අවශ්‍යතාවයට ගැලපෙන ලෙස කසල මළු සැපයීම සිදු කෙරෙන අතර කසල බඳුන් වලට ගැලපෙන කසල මළු යෙදීමද සිදුවන බව, එමෙන්ම කසල බඳුන් සංඛ්‍යාවද අවශ්‍යතාවයට ගැලපෙන ලෙස ස්ථානගත කර ඇති බව.
	ii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 8.9.1 හි විධිවිධාන ප්‍රකාරව රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වූවත්, 2022 වර්ෂයේ සිට 2023 ජුනි 30 දින දක්වා කාලපරිච්ඡේදය තුළ 2022 පෙබරවාරි 27, 2022 ජූලි 26 හා 2023 මාර්තු 16 යන අවස්ථා 03 කදී මිල ගණන් කැඳවා තෝරා ගෙන තිබූ සැපයුම්කරුවකු වෙතින් රු.2,979,670 ක, රු.2,707,737 ක හා රු.3,288,670 ක කසළ මළු මිලදී ගැනීමට තීරණය කර 2022 වර්ෂය තුළ රු.1,218,892 ක හා 2023 වර්ෂය තුළ රු.3,283,766 ක කසළ මළු (Garbage Bags) මිලදී ගැනීමේ කොන්ත්‍රාත් කාර්යයන් කිසිවකදී එසේ ගිවිසුම්ගතවී නොතිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, රෝහල තුළ සිදු කෙරෙන ප්‍රසම්පාදන කාර්යයන් බහුතරයක් රු.500,000 ක වටිනාකම 2022 වර්ෂයේ ඉක්ම වන හෙයින් සැපයුම්කරුවන් අතර ගිවිසුම්ගත වීමක් සිදු නොවූ අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ගිවිසුම්ගත විය යුතු බවට විගණනයෙන් පෙන්වා දී ඇති එම කරුණ පිළිගන්නා බව.
	iii. 2022 වර්ෂයේ පළමු කොන්ත්‍රාත් ප්‍රදානය සිදුකර තෝරාගත් සැපයුම්කරු විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලංසු ලේඛන අනුව එකඟවූ කොන්දේසි පරිදි කසළ මළු (Garbage Bags) සපයා නොතිබුණු බව රෝහලේ මහජන සෞඛ්‍ය පරීක්ෂක හා මහජන සෞඛ්‍ය භාර වෛද්‍ය නිලධාරිගේ 2022 ජූලි 26 දිනැති ලිපිය අනුව නිරීක්ෂණය වූ අතර එලෙස කොන්ත්‍රාත් කාර්යසාධනය අසාර්ථක වන විට එයින් ප්‍රසම්පාදන ආස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ප්‍රකාරව කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ට නොඅඩු මුදලක් කාර්යසාධන සුරක්ෂණයක්	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2022 වර්ෂයේ අනපේක්ෂිත ලෙස රට තුළ උද්ගත වූ මූල්‍ය අර්බුදය මත කසල මළු සඳහා ඇණවුම් යවා තිබුණද ලංසු ලේඛන අනුව එකඟ වූ කොන්දේසි පරිදි කොන්ත්‍රාත්කරු විසින් කසල මළු සැපයීමට අපොහොසත් වූ බව, පෙර වර්ෂවල කසල මළු සැපයීමේදී සැපයුම්කරුවන් විසින් ගැටළුවකින් තොරව කසල මළු සපයා ඇති බැවින් කාර්යසාධන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ලෙස ලබා ගැනීමට කටයුතු කළ යුතු වූවද කසළ මළු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කාර්යන් කිසිවකදී කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි.		සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නැති බව.
	iv. 2022 පෙබරවාරි 27 දින මිල කැඳවීමට අදාළ 2022 මාර්තු 10 දිනැති ප්‍රසම්පාදන තීරණය හා 2022 මාර්තු 15 දිනැති ප්‍රසම්පාදන අනුමැතිය දැක්වීමේ ලිපිය අනුව තෝරාගත් සැපයුම්කරු වෙත රෝහලේ කසළ මළු (Garbage Bags) වාර්ෂික අවශ්‍යතාවය වූ මළු 220,320 ක් මිලදී ගැනීම වෙනුවෙන් කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබියදී හා මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලංසු ලේඛනය අනුව එම සම්පූර්ණ ඇණවුම පළමු තොගය ද්‍රව්‍ය ඇණවුමෙන් මසක් තුළ හා දෙවන තොගය ජූනි මාසය තුළ ලෙස අවස්ථා දෙකකදී සැපයීමට එකඟව තිබියදී, එපරිදි කසළ මළු (Garbage Bags) සපයා ගැනීමට කටයුතු නොකර මළු 55,800 ක් පමණක් සපයා ගෙන, 2022 ජූලි 26 දින නැවත මිල ගණන් කැඳවා පෙර එකඟවී තිබූ මිල ගණන්වලට වඩා වැඩි මිල ගණන් යටතේ පෙර සැපයුම්කරුටම 2022 අගෝස්තු 23 දිනැතිව නැවතත් කොන්ත්‍රාත් ප්‍රදානය කර මිලදී ගැනීම හේතුවෙන් රජයට රු.164,954 ක පාඩුවක් සිදුවී තිබුණි.	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, කොන්ත්‍රාත්කරු විසින් වාර්ෂික අවශ්‍යතාවය සැපයීමට එකඟව තිබියදී 2022 වර්ෂයේ රටේ පැවති මූල්‍ය අර්බුදය හමුවේ ඇණවුම අඛණ්ඩව රෝහල වෙත නොලැබුණ අතර, අප විසින් දිගින් දිගටම කරන ලද විමසීම් වලදී ආනයන සීමා කිරීම මත අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම හේතුවෙන් එම මිල ගණන් යටතේ කසල මළු සැපයිය නොහැකි බව සැපයුම්කරු විසින් දන්වන ලද බව, දෙවන සැපයුම්කරුගෙන්ද ඉදිරිපත් කළ මිල ගණන් යටතේ කසල මළු සැපයිය නොහැකි බව දුරකථනයෙන් විමසා තහවුරු කර ගත් අතර, රෝහලේ ආසාදනයක් පැතිරීම වැළැක්වීම සඳහා කසළ කළමනාකරණය අත්‍යවශ්‍ය වන හෙයින් මෙම ගැටළුවට පිළිතුරක් ලෙස යළි මිල ගණන් කැඳවීමට තීරණය කරන ලද බව, සේවයේ හදිසි අත්‍යවශ්‍යතාවය මත දුරකථනයෙන් කරන ලද සංවාද සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි තබා නොගැනීම රෝහලෙන් සිදු වූ අඩුපාඩුවක් බව පිළිගන්නා අතර, ඉදිරියේදී සෑම අවස්ථාවකදීම ලිඛිත සාක්ෂි තබා ගැනීමට

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			කටයුතු කරන මෙන් විෂය නිලධාරීන් දැනුවත් කොට ඇත. බව.
	v. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කර ඇති සෞඛ්‍ය සත්කාර අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණු මොඩියුලය අනුව මිලදීගන්නා කසළ මළු (Garbage Bags) නියමිත ප්‍රමිතියෙන් (Microns/Gauge) යුක්ත ද යන්න තහවුරු කර ගැනීම සඳහා සැපයුම්කරුවන්ගෙන් ප්‍රමිත සහතික ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එවැනි ප්‍රමිත සහතිකයක් ඉදිරිපත් කරන ලෙසට මිල කැඳවීමේ ලේඛනවලද කොන්දේසි ඇතුළත් කර නොතිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින්ද ප්‍රමිත සහතිකයක් පිළිබඳ සලකා බලා නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද 2000 අංක 53 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතේ 23A වගන්තිය යටතේ පරිසර ආරක්ෂණ බලපත්‍ර (Environment Protection Licence) ලබාගත යුතු ආයතන පිළිබඳ ලැයිස්තු දැක්වෙන 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ B කොටස අනුව පොලිතින් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ආයතන පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන තිබිය යුතු වූවද තෝරාගත් සැපයුම්කරුට/ ඔහු සපයන කසළ මළු (Garbage Bags) සඳහා එවැනි පරිසර ආරක්ෂණ බලපත්‍රයක් පැවතියේද යන්න සලකා බලා නොතිබුණි.	-එම-	කසල මළු සඳහා ලංසු කැඳවීමේ ලිපියේ මෙම කසල මළු මිලදී ගැනීමේ දී එම බෑග් සඳහා ඇති ප්‍රමිත සහතික පිළිබඳ විස්තර, නියමිත මයික්‍රෝන් ප්‍රමාණය පිළිබඳ අනුකූලතා සහතික, නිෂ්පාදකයාට ඇති යෝග්‍යතා සම්බන්ධ විස්තර, අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවය පිළිබඳ විස්තර නිශ්චිතව දැක්විය යුතු අතර සනාථ කිරීම සඳහා ලිපි ඉදිරිපත් කළ යුතු බවට කොන්දේසි ඇතුළත් කොට ඇති බව, කසල මළු පොදු ගබඩාවට භාර ගැනීමට පෙර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් මාතලේ මධ්‍යම පරිසර අධිකාරිය වෙත යවා කසල බෑගයේ සණකම පරීක්ෂා කර බැලීම සිදු කර ඇති බව, පොලිතීන් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ආයතන පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගෙන තිබිය යුතු අතර අපගේ වර්තමාන සැපයුම්කරු පොලිතින් නිෂ්පාදන ලබා ගන්නා ආයතනයේ නිෂ්පාදන සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගෙන ඇති බව.
	vi. ප්‍රසම්පාදන තීරණ අනු අංක කර සටහන් කිරීම සඳහා මාතලේ දිස්ත්‍රික් මහ රෝහල මගින් විධිමත් ප්‍රසම්පාදන තීරණ ලේඛනයක් නඩත්තු කර නොතිබුණු අතර තීරණ වාර්තාව රෝහල් අධ්‍යක්ෂකගේ අත්සන් සඳහා යොමු කිරීමට ලේඛනයක් පමණක් නඩත්තු කර තිබුණද එහි අංක කිරීමද අපැහැදිලි තත්ත්වයක	මෙම කටයුතු විධිමත් කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ප්‍රසම්පාදන තීරණ අනු අංක කර සටහන් කිරීම සඳහා විධිමත් ප්‍රසම්පාදන තිරණ ලේඛනයක් මේ වන විට නඩත්තු කරන බව, ප්‍රධාන ප්‍රසම්පාදන කාර්යයන් වෙනුවෙන් වෙන්ව

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	පැවතුණි.රෝහලේ ප්‍රධාන ප්‍රසම්පාදන කාර්යයන් වෙනුවෙන් හෝ වෙන් වෙන්ව ගොනු නඩත්තු කිරීමක් සිදු නොකර එකම ගොනුවක ප්‍රසම්පාදන කාර්යයන් කිහිපයකට අදාළ ලිපි ලේඛන ගොනුගත කර තිබීම හා ප්‍රසම්පාදන ගොනුව පිටු අංක කර නොතිබීම වැනි තත්ත්වයන් හේතුවෙන් ප්‍රසම්පාදන ගොනු නඩත්තු කිරීමද අවිධිමත් තත්ත්වයක පැවතුණි.		විධිමත්ව පිටු අංක කර ගොනු පවත්වාගෙන යාම වර්තමානය වන විට සිදු කරන බව.
	vii. තෝරා ගත් සැපයුම්කරු ඉදිරිපත් කර තිබූ කසළ මළු (Garbage Bags) සාම්පල කිසිවක් ගබඩාව වෙත ලබා දී නොතිබුණි. ඒ අනුව සපයනු ලබන්නේ එකඟ වූ පිරිවිතර සහිත කසළ මළු ද යන්න දළ වශයෙන් හෝ තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් නොතිබුණු බවත් කසළ මළු (Garbage Bags) 100 හා 50 බැගින් අසුරා ඇති ඇසුරුමෙහි සැපයුම්කරුගේ නම, නිෂ්පාදිත ආයතනය Gauge, Microns ප්‍රමාණ ආදිය පිළිබඳ කිසිදු සටහනක්ද නොමැති බවත් නිරීක්ෂණය විය. 2022 වර්ෂය තුළ හා 2023 ජුනි 30 දින දක්වා කසළ මළු 94,774 ක් ගබඩාවට ලැබීමේදී පාට හා ප්‍රමාණ අනුව වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි සටහන් නොකර වරකට ලද මළු එකතුව තොග ලේඛනවල සටහන් කර නිකුත් කරමින් පැවති බැවින් එක් එක් වර්ණයෙන් හා ප්‍රමාණ වලින් පැවති භෞතික ශේෂය තොග ලේඛන අනුව හඳුනාගැනීමට නොහැකි වීමෙන් තොග පාලනය දුර්වල තත්වයක පැවති බවත් මුදල් රෙගුලාසි 751 (4) ප්‍රකාරව කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය විය.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, තෝරාගත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබූ කසල මළු රෝහලේ මහජන සෞඛ්‍ය පරීක්ෂක හා අසාදන පාලන හෙද නිලධාරි විසින් පරීක්ෂාවට ලක් කළ පසු පොදු ගබඩාව වෙත යොමු කරන බැවින් අදාළ සාම්පලය මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත ලබා දී තිබූ බවත් ගබඩා නිලධාරි වෙත ලබා දී නොතිබූ බව, කසල මළු 100 හා 150 බැගින් අසුරා ඇති ඇසුරුමෙහි සැපයුම්කරුගේ නම නිෂ්පාදිත ආයතනය, ගණකම ආදි තොරතුරු සටහන් කළ ලේබලයක් සමඟ සපයන මෙන් සැපයුම්කරු වෙත දැනුම් දී ඇති බව, 2022 වර්ෂයේ මෙම රෝහලේ පොදු ගබඩාව සීමිත ඉඩකඩ ප්‍රමාණයක ඉතා අපහසුවෙන් නිලධාරි ඌණතාවය මත එක් නිලධාරියෙකු විසින් පවත්වාගෙන යන ලද බව, මේ වන විට පොදු ගබඩාව අළුතින් ඉදිවෙමින් පවතින අතර, ප්‍රමාණවත් ලෙස නිලධාරීන් රෝහල වෙත ලැබීම මත ගබඩාව වෙත නිලධාරීන් දෙදෙනකුද අනුයුක්ත කර ඇති

			බව, ඒ අනුව ඉදිරියේදී පාට හා ප්‍රමාණ අනුව වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි භෞතික ශේෂය තොග ලේඛන අනුව හඳුනාගත හැකි පරිද්දෙන් පවත්වාගෙන යාමට කටයුතු කරන බව.
(ඒ)	මාතලේ දිස්ත්‍රික් මහ රෝහල විසින් ඖෂධ කවර මිලදී ගැනීම් සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඖෂධ කවර 500,000 ක් බැගින් මිලදී ගැනීම වෙනුවෙන් අවස්ථා 2 කදී මිල ගණන් කැඳවා තෝරා ගෙන තිබූ සැපයුම්කරුවන් වෙතින් 2023 වර්ෂයේදී හා 2024 වර්ෂයේදී ජනවාරි 22 දින දක්වා පිළිවෙලින් ඖෂධ කවර 986,400 ක් මිලදී ගෙන තිබුණද ඖෂධ කවර සැපයිය යුතු කාලසීමාව හා වරකට සැපයිය යුතු කවර ප්‍රමාණය ආදිය පිළිබඳ ලිඛිත එකඟතාවයක් ඇති කර නොගැනීම හේතුවෙන් වරින්වර කවර 1000 - 72100 අතර දක්වා වූ විවිධ ප්‍රමාණවලින් 2024 ජනවාරි 22 දින දක්වා අවස්ථා 27 කදී කවර සැපයීම් සිදු කර ඇති අතර එම අවස්ථාවලදී සැපයූ ප්‍රමාණයම ඖෂධාගාර වෙත නිකුත් කිරීමට සිදු වීම හේතුවෙන් ගබඩාවේ දෛනිකව සාමාන්‍ය තොග මට්ටමක් පවත්වා ගැනීමට නොහැකි වී තිබුණු බවත් 2023 මැයි 31 දින සිට 2023 සැප්තැම්බර් 22 දින දක්වා මාස 03 ½ කට වැඩි කාලපරිච්ඡේදයක් හා නැවතත් 2024 මාර්තු 20 දිනවන විටත් ඖෂධ කවර ගබඩාවට ලැබී නොතිබුණු බැවින් හා රෝහල් ඖෂධාගාර තුළද ඖෂධ කවර අවසන් වී තිබුණු බැවින් රෝගීන් වෙත කොළ කැබලිවල ඔතා ඖෂධ ලබා දීමට සිදුව තිබුණු බවත් නිරීක්ෂණය විය.	මෙම කටයුතු විධිමත් සැළසුමකට අනුව සිදුකළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ඖෂධ කවර මිලදී ගැනීම සඳහා පෙර සැපයුම්කරු විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හරහා තෝරාගෙන තිබුණද ඖෂධ කවර අවශ්‍ය ප්‍රමාණයට සැපයිය නොහැකි වීම මත යම් යම් ගැටළුකාරී තත්ත්වයන් ඇති වූ බව, එහෙත් වර්තමානය වන විට විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හරහා 2024/03/18 වන දින නව සැපයුම්කරුවකු තෝරාගෙන ඇති අතර 2024/03/19 දින ඖෂධ කවර ඇණවුම් කර ඇති බව, 2024/04/19 දින වන විට අවශ්‍ය ඖෂධ කවර ලක්ෂ 15 ක ප්‍රමාණයම රෝහල වෙත ලැබී ඇති අතර 2024 වර්ෂය අවසානය දක්වාම එම සංඛ්‍යාව ප්‍රමාණවත් වන බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ii. රෝහලේ බාහිර රෝගී අංශ ඖෂධාගාරයට පමණක් දිනකට ඖෂධ කවර 3,000 ක් පමණ අවශ්‍ය වන බව නිරීක්ෂණය වූ අතර ඖෂධාගාර දෙක සඳහා වාර්ෂික අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගනිමින් ප්‍රසම්පාදන කාර්යය නොකිරීම මත හා තෝරාගත් සැපයුම්කරුට අදාළ මිල ගණන් පිළිගත් බව සඳහන් කරමින් යවන ලද ප්‍රතිග්‍රහණ ලිපිය සමඟ අදාළ භාණ්ඩ සැපයිය යුතු දිනය හෝ කාලසීමාව හා වරකට අවශ්‍ය ප්‍රමාණය ආදිය සඳහන් කිරීම හෝ වෙනත් ලිඛිත එකඟතාවයක්ද නොවූ බැවින් කවර නොමැති අවස්ථාවන්වලදී සුළු මුදලින් මිලදී ගැනීමට සිදුව තිබූ අවස්ථාද පැවතුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, 2023 වර්ෂයට සැපයුම්කරුවන් 7 දෙනෙකු සහ 2024 වර්ෂයට සැපයුම්කරුවන් 8 දෙනෙකුද ලියාපදිංචි වී ඇති බව.
(ඒ)	සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ (රසායනාගාර සේවා) 2023 ඔක්තෝබර් 04 දිනැති අංක D/LS/LAW/01/2022-46-A දරන ලිපිය මගින් ලද අනුමැතියක් යටතේ මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ රසායනාගාරය සඳහා Fully Automated 5 Part Hematology Analyzer යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.100,970 ක් වැයකර 2023 ඔක්තෝබර් 06 දින භාෂාත්‍රයෙන් පළකර තිබුණු පුවත්පත් දැන්වීමෙහි 2023 ඔක්තෝබර් 13 දින සිට 2023 ඔක්තෝබර් 26 දින දක්වා ලංසු කැඳවීම් ලිපි ලබාගත හැකි බවත් 2023 ඔක්තෝබර් 26 දින පෙ.ව 11.30 ට හෝ ඊට ප්‍රථම ලංසු ඉදිරිපත් කළ යුතු බවටත් දක්වා තිබීම මත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය අනුව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ අවම කාලසීමාව වූ දින 21 ක සීමාව උල්ලංඝනය කරමින් ලංසු ලිපි ලේඛන ලබා ගැනීමට දින 13 ක කාලයක් පමණක් ලබා දී තිබුණි. පසුව ලංසු ලේඛන භාර ගැනීමේ අවසන් දිනය 2023 ඔක්තෝබර් 31 දින ලෙස සංශෝධනය කර නැවත පුවත්පත් දැන්වීම් පළකර තිබූ බැවින් ඒ සඳහා වැයවී තිබුණු රු.36,570 ක මුදල නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් රසායනාගාර සේවා විසින් 5 **part Haematology Analyzer** මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු 2023/12/14 දිනට පෙර අවසන් කොට ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතු බවට 2023/10/04 දිනැති ලිපිය මගින් දන්වා තිබුණු බව, එබැවින් මෙම ඇනලයිසර් යන්ත්‍රය මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉතා කඩිනමින් සිදු කළ යුතුව තිබුණු බව, ඒ අනුව එම මිලදී ගැනීමට අදාළ ලංසු කැඳවීමට 2023 ඔක්තෝබර් 06 දින පුවත්පත් දැන්වීම් පළ කිරීම මගින් විවෘත මිල ගණන් කැඳවන ලද බව, මිල ගණන් කැඳවන අවස්ථාව වන විට සියළුම පිරිවිතර ඇතුළත් කර ලංසු ලියවිලි සැකසීම අවසන්

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			කර නොතිබුණු බව, ප්‍රසම්පාදන අස්ථිත්වය මගින් පිරිවිතර සකසා, මෙම රෝහලේ වැඩ බැලීමට පත්කර ඇති පේරාදෙණිය ශික්ෂණ රෝහලේ ජීවවෛද්‍ය ඉංජිනේරු මහතාගෙන්ද සමන්විත තාක්ෂණ ඇගයුම් කමිටුවේ නිර්දේශය ලබා ගැනීමට දින කීපයක් ගතවන හෙයින් අදාළ ලංසු ලියවිලි සැකසීමෙන් පසුව 2023/10/13 දින සිට ලංසු ලියවිලි නිකුත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව අදාළ ප්‍රසම්පාදනය කඩිනමින් සිදු කළ යුතු බැවින් දින 14 ක කාලයක් තුළ ලංසු විවෘත කිරීමට ලබා දීම රෝහල මගින් සිදුවූ අතපසු වීමක් බව, මින් ඉදිරියට මෙවන් අතපසුවීම් නොවීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව, ලංසු කරුවන් විසින් කරන ලද ඉල්ලීමකට අනුව 2023 ඔක්තෝබර් මස 23 වන දින පූර්ව ලංසු රැස්වීමක් පවත්වන ලද බව, එහිදී පිරිවිතරවල සංශෝධනයන් කීපයක් සිදුවූ අතර ලංසුකරුවන්ගේ ඉල්ලීම මත සංශෝධිත පිරිවිතර වලට අනුකූලව මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ලංසු භාරගැනීමේ අවසන් දිනය 2023/10/31 දක්වා දීර්ඝ කරන ලද බව, ඒ බව වහාම ලංසුකරුවන් වෙත දැන්විය යුතු හෙයින් සහ මුල් ලංසු කැඳවීම පුවත්පත් දැන්වීමක් මගින් සිදුකරන ලද බැවින්, මෙතෙක් ලංසු ලියවිලි මිලදී නොගත් විභව ලංසු කරුවන් ද දැනුවත්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			කළ යුතු බැවින් මෙම ලංසු කැඳවීමේ අවසන් දිනය දීර්ඝ කිරීම පිළිබඳ තොරතුරු පුවත්පත් දැන්වීමක් මගින් පළ කිරීම සිදු කරන ලද බව.
(ඔ)	කොළඹ ජාතික රෝහලේ 2022 වර්ෂයේ වාර්ෂික අමු ආහාර අවශ්‍යතාවය නැවුම් එළවළු හා පළතුරු, වියළි ආහාර ද්‍රව්‍ය, බේකරි නිෂ්පාදන, ඇසුරුම් කළ ආහාර සහ බිත්තර හා කුකුල්මස් යනුවෙන් කාණ්ඩ 05 ක් යටතේ ඇස්තමේන්තු කර තිබුණු අතර ජාතික තරඟකාරී ලංසු කැඳවීම් ක්‍රමය යටතේ වෙන් වෙන් වශයෙන් ලංසු කැඳවා තිබුණද, බේකරි නිෂ්පාදන හැර අනෙකුත් ආහාර කාණ්ඩ හතර වෙනුවෙන් ලංසුකරුවන් දෙදෙනකුද, බේකරි නිෂ්පාදන වෙනුවෙන් එක් ලංසුකරුවකු පමණක්ද ලංසු ඉදිරිපත් කර තිබුණි. එහිදි ඉදිරිපත් වූ අවම ලංසු වටිනාකමට වඩා රු.මිලියන 51 කින් වැඩි ලංසු වටිනාකමකට ඉහත කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණු අතර ඊට හේතු ලෙස අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරු විසින් සතුටුදායක සේවාවක් සපයා නොතිබීම සහ එම ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳ සැහීමකට පත් නොවීම යන කරුණු අමාත්‍යාංශ ප්‍රසම්පාදන B කමිටුව විසින් දක්වා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ කාලය 2022 දෙසැම්බර් 31 දින අවසන් වීමට නියමිතව තිබුණ ද එම කොන්ත්‍රාත් කාලය 2023 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහතින් දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. 2022 වර්ෂයේ රෝහලේ සත්‍ය අමු ආහාර ද්‍රව්‍ය භාවිතය එහි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 32 ක් වී තිබීමෙන් එම ඇස්තමේන්තුව සියයට 68 කින් එනම් රු.මිලියන 250 කින් අධි ඇස්තමේන්තු කර තිබුණි. ආහාර කාණ්ඩ මට්ටමෙන් සලකා බැලීමේදි රෝහලේ සත්‍ය අමු ආහාර ද්‍රව්‍ය භාවිතය එහි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 6.5 සිට සියයට 40 දක්වා	මේ සම්බන්ධයෙන් පූර්ණ ස්වාධීන විමර්ශනයක් සිදුකළ යුතුය.	එකඟ වන බව, මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක උපදෙස් මාලාවක් හැකි ඉක්මණින් කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව ලබා දීමට කටයුතු කරන බව.

	වූ අවම පරාසයකද, අමු ආහාර ද්‍රව්‍ය අයිතම මට්ටමෙන් සලකා බැලීමේදී, අමු ආහාර කාණ්ඩ 4 ක් යටතේ වූ අමු ආහාර ද්‍රව්‍ය අයිතම 93 න් අමු ආහාර ද්‍රව්‍ය අයිතම 73 ක වාර්ෂික සත්‍ය භාවිතය සියයට 50 කට වඩා අඩු මට්ටමකද පැවතුණි. එසේම ඇස්තමේන්තු වටිනාකම රු.1,196,040 ක් වූ අයිතම් 12 ක් කිසිදු අවස්ථාවක මිලදී ගෙන නොතිබුණු බවත්, රතු කැකුළු සහල්, තැම්බු සහල්, මුං ඇට, සුදු කව්පි සහ කඩල යන අමු ආහාර ද්‍රව්‍ය අයිතම පහේ අධි ඇස්තමේතුව මගින් පමණක් මුළු පිරිවැය ඇස්තමේන්තුවට සිදුකර තිබුණු බලපෑම සියයට 40කට වඩා වැඩි බවත් නිරීක්ෂණය විය.		
	ii. මෙලෙස රෝහලේ අමු ආහාර ද්‍රව්‍ය අවශ්‍යතාවය සියයට 68 කින් අධි ගණනය කිරීම නිසා ලංසුකරුවන් ලබා දිය යුතු වන කාර්යසාධන ඇපකර වටිනාකම සත්‍ය අමු ආහාර ද්‍රව්‍ය අවශ්‍යතාවයට සාපේක්ෂව සියයට 25 සිට සියයට 152 ක ඉහළ පරාසයක පැවති බවත් එමගින් හැකියාවක් සහිත කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ට ප්‍රසම්පාදනයන් සඳහා සාධාරණ ලෙස සහභාගිවීම අධෛර්යමත් කර තිබුණු බවත්, තරහකාරී අවම මිලක් යටතේ අමු ආහාර ද්‍රව්‍ය සපයා ගැනීම වෙනුවට ඉදිරිපත් වූ අවම ලංසු වටිනාකමට වඩා රු. මිලියන 51 කින් වැඩි ලංසු වටිනාකමකට අමු ආහාර ද්‍රව්‍ය සපයා ගැනීමේ තත්ත්වයකට රෝහල පත්කර තිබුණු බවත්, මෙලෙස වර්ෂ කිහිපයක් සිට අමු ආහාර ද්‍රව්‍ය අවශ්‍යතාවය අධි ගණනය කිරීම නිසා 2023 වර්ෂය වන විට ලංසුකරුවන්ගේ ඉදිරිපත් වීම ලංසුකරුවන් 1 දක්වා අඩු වී තිබුණු බවත්, අමු ආහාර ද්‍රව්‍ය සඳහා වූ සත්‍ය අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන තාත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කළේ නම් බේකරි නිෂ්පාදන, බිත්තර හා කුකුල්මස් සැපයීම වැනි ප්‍රසම්පාදනයන් ප්‍රාදේශීය මිල ගණන් කැඳවීම් යටතේද සිදුකළ හැකිව පවතින බවත් නිරීක්ෂණය විය.	-එම-	එකඟ වන බව, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් කිරීමට පසුව එම කමිටුව විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන්වල සාධාරණත්වය නැවත ඇගයීමට ලක් කිරීමට කටයුතු කරනු ලබන බව, එමෙන්ම, ඉදිරියේදී කරනු ලබන ප්‍රසම්පාදනයේදී විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි මිල ඇස්තමේන්තුවක් සකස් කිරීමට කටයුතු කරන බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	iii. මෙම ප්‍රසම්පාදනයට අදාළව අමු ආහාර ද්‍රව්‍ය අයිතමයන්ගේ ඒකක මිල 2021 ඔක්තෝබර් 05 දිනැති මිල කමිටු වාර්තාව පදනම් කරගෙන ඇස්තමේන්තු කර තිබුණද එම මිල කමිටු වාර්තාවේ ඒකක මිල ගණනය කළ ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. විගණනය විසින් තොග මිල පමණක් නොව සිල්ලර මිල ගණන්ද සැලකිල්ලට ගෙන ගණනය කරන ලද සාමාන්‍ය මිලට සාපේක්ෂව ඇස්තමේන්තුගත ඒකක මිල වැඩිවීම සියයට 1 සිට සියයට 118 දක්වා වූ ඉහළ පරාසයක විහිදෙන පරිදි අධි ගණනය කර තිබීම නිසා අමු ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනයේ මුළු පිරිවැය ඇස්තමේන්තුව නැවත වරක් අධි ගණනය කර තිබුණු බවත්, ලංසු මගින් ඉදිරිපත් කරන ඒකක මිල ගණන් ඇගයීම සඳහා තාත්වික නොවන ඇස්තමේන්තු භාවිතා කර තිබුණු බවත් නිරීක්ෂණය විය.	-එම-	එකඟ නොවන බව.
	iv. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 50 ප්‍රකාරව සකසුරුවම්කම සහ කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවට ගණන්දීමේ නිලධාරියා වගකිව යුතු වූවත් රෝහලේ අමු ආහාර ද්‍රව්‍ය මෙපරිදි ඇස්තමේන්තු කිරීම සම්බන්ධයෙන් වූ වගකීම ඉටුකිරීමට රෝහල් පරිපාලනය අපොහොසත් වී තිබුණි.	-එම-	එකඟ නොවන බව.
	v. 2022 වර්ෂයේ ඇසුරුම් කළ ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ ආයතනය 2022 ජුනි 03 දින සිට කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණු අතර සැපයුම්කරු වෙතින් ලබා ගත යුතු රු.7,968,138 ක කාර්යසාධන ඇපකරය ලබාගෙන නොතිබීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව අතහැර දැමීම නිසා රජයට සිදුව තිබුණු පාඩුව අවම කර ගැනීමට නොහැකි තත්ත්වයකට පත්කර තිබුණි.	-එම-	එකඟ වන බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	vi. රටේ පැවති උද්ධමන තත්ත්වය හමුවේ 2022 ජූලි මස දක්වා අවස්ථා 08 කදී ගිවිසුම් ගතව තිබුණු මිල ගණන් වැඩි කර තිබුණු අතර එසේ වැඩිකරන ලද මිලට තවත් සියයට 10 ක් ඉන්ධන සහ අනෙකුත් පොදුකාර්ය පිරිවැය ඉහළ යාම වෙනුවෙන් එක් එක් අයිතමයේ ඒකක මිලට ගලපා සැපයුම්කරුවන් වෙත ගෙවීම් කර තිබුණි. එසේම 2022 අගෝස්තු මස අමු ආහාර අයිතම 04 කට අදාළව පමණක් මිල වැඩිකිරීමක් කර තිබුණු අතර අනෙකුත් අමු ආහාර අයිතම සඳහා 2022 ජූලි මස සිදුකරන ලද මිල වැඩිවීමම 2022 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහතින් දැක්වෙන නිරීක්ෂණයන් සිදු කෙරේ.		
	➢ වරින් වර මිල වැඩිවීම් ලබා දීමේ දී ඊට පදනම් කර ගන්නා මිල ගණන් ලබා ගන්නා වෙළඳපල මූලාශ්‍රයන් හේතු දැක්වීමකින් තොරව වෙනස්කර තිබීමෙන් සහ සැපයුම්කරු විසින් තොග වශයෙන් මිල දී ගන්නා අමු ආහාර ද්‍රව්‍ය සඳහා මිල වැඩි වීම් ලබා දීමේදී සිල්ලර මිල ගණන් ද සැලකිල්ලට ගෙන තිබීමෙන් අමු ආහාර ද්‍රව්‍ය අයිතමයන්ගේ මිල වැඩි කිරීම සඳහා නිශ්චිත සහ සාධාරණ ක්‍රමවේදයක් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුගමනය කර නොතිබුණු බැව් නිරීක්ෂණය විය.	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි
	➢ ගිවිසුම් සහ ලංසු කොන්දේසි ප්‍රකාරව අඛණ්ඩ අමු ආහාර සැපයුමක් පවත්වා ගැනීමට අදාළ දිස්ත්‍රික්කය තුළ හෝ අදාළ රෝහලට කිලෝමීටර 20 ක දුර සීමාව ඇතුළත ආහාර ගබඩාවක් පවත්වා ගත යුතුවන තත්ත්වයක් තුළ අමු ආහාර ද්‍රව්‍ය කිලෝග්‍රෑම් එකක් කිලෝමීටරයක් දුර ප්‍රවාහනය කිරීම වෙනුවෙන් දැරීමට සිදුවන පිරිවැය ගණනය කිරීමකින් තොරව අමු ආහාර ද්‍රව්‍ය අයිතමයක් සඳහා වැඩිකරන ලද මිලට සියයට 10 ක් එකතුකර සැපයුම්කරුවන් වෙත ගෙවා තිබීම නිසා 2022	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ජූලි සිට දෙසැම්බර් දක්වා මාස 6 ක කාලය තුළ ඉන්ධන සහ අනෙකුත් පොදුකාර්යය පිරිවැය වැඩි වීම වෙනුවෙන් සැපයුම්කරුවන්ට රු.11,165,539 මුදලක් එනම් දෛනිකව ආසන්න වශයෙන් රු.60,682 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව විධිමත් පරීක්ෂාවක් සිදුකර ඉන්ධන සහ අනෙකුත් පොදුකාර්යය පිරිවැය වැඩි වීම වෙනුවෙන් සැපයුම්කරුවන් වෙත ගෙවා තිබෙන වැඩිපුර මුදල ගණනය කර සැපයුම්කරුවන්ගෙන් හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතු බවට නිරීක්ෂණය කෙරේ.		
	➢ ලංසු ඉදිරිපත් කිරීමේදී එක් ලංසුකරුවකු විසින් අමු ආහාර අයිතම 61 ක් සඳහා ඇස්තමේන්තු ගත ඒකක මිලට සාපේක්ෂව සියයට 50 සිට සියයට 80 දක්වා වූ පරාසයක විහිදෙන පරිදි අඩු මිලක් ද අමු ආහාර අයිතම 20 කට අදාළව සියයට 50 කට වඩා අඩු මිලක් ද ඉදිරිපත් කර ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණු නමුත් අමු ආහාර අයිතම සඳහා ඉහත මිල අඩුවීමේ ප්‍රතිශතය, මිල වැඩි කිරීම් ලබා දී තිබුණු අවස්ථා 9 දීම සැලකිල්ලට ගෙන නොතිබීමෙන් මිල වැඩි කිරීම් මුල් ප්‍රසම්පාදන තීරණයට අනුගත වී නොතිබුණි. ඒ අනුව සැපයුම්කරුවන්ට වැඩිපුර ගෙවන ලද මිල ගණනය කර සැපයුම්කරුවන්ගෙන් හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතුබවට නිරීක්ෂණය කෙරේ.	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි
	➢ 2022 වර්ෂයේ මුල් අර්ධ වර්ෂය තුළ සාමාන්‍ය මිල මට්ටම ඉහළ යාමත් සමඟ අවස්ථා 9 කදී මිල වැඩි කර සැපයුම්කරුවන්ට ගෙවීම් කර තිබුණ ද 2022 වර්ෂයේ අගභාගයේදී අමු ආහාර ද්‍රව්‍යවල සාමාන්‍ය මිල මට්ටම පහළ යාමේ වාසිය රජය වෙත ලබා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව "බී"	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	විසින් ක්‍රියා කර නොතිබුණි. ඒ අනුව 2022 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කොළඹ ජාතික රෝහල විසින් මිල දී ගෙන තිබුණු අමු ආහාර ද්‍රව්‍ය අයිතම පහකට අදාළව සිදුකරන ලද වැඩි දුර පරීක්ෂාවේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික වාර්තා ප්‍රකාරව පිටකොටුව සිල්ලර වෙළඳපල මිල ගණන්වලට සාපේක්ෂව රු.6,962,732 ක මුදලක් වැඩියෙන් සැපයුම්කරුවන්ට ගෙවා තිබුණි. මෙම වැඩිපුර ගෙවීම පිටකොටුව තොග මිල ගණන්වලට සාපේක්ෂව මීට වඩා වැඩිවිය හැකි අතර මෙම ගණනය කිරීම ආහාර ද්‍රව්‍ය අයිතම පහකට පමණක් සීමා වන බැවින් ඉහත කාලය තුළ කොළඹ ජාතික රෝහල විසින් මිල දී ගෙන තිබුණු සියලුම අමු ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙපරිදි වැඩිපුර ගෙවීමක් සිදුකර තිබෙදැයි යන්න පරීක්ෂා කර සැපයුම්කරුවන්ගෙන් හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කළයුතු බවට නිරීක්ෂණය කෙරේ.		
	➢ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව "බී" විසින් 2022 ජූලි මස සිදුකර තිබුණු මෙම මිල වැඩි කිරීම රෝහල් 10 කට අදාළ කර ගෙන තිබුණු බැවින් එම රෝහල් විසින් අමු ආහාර ද්‍රව්‍ය මිල දී ගැනීම සම්බන්ධයෙන් එම රෝහල්වලට අදාළවන ප්‍රදේශයේ පවතින ප්‍රාදේශීය මිල ගණන් යොදාගෙන මෙවැනි පරීක්ෂාවක් කර වැඩිපුර ගෙවීමක් සිදුකර තිබෙදැයි යන්න ගණනය කර සැපයුම්කරුවන්ගෙන් හෝ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කළයුතු බවට තවදුරටත් නිරීක්ෂණය කෙරේ.	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි
	➢ මෙලෙස අමු ආහාර ද්‍රව්‍යවල සාමාන්‍ය වෙළඳපල මිල මට්ටම පහළ යාමේ වාසිය රජයට ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා අධික ලාභයක් ඉපයීමට සැපයුම්කරුවන් හට ඉඩ සලසා තිබුණු අතර පහතින් දැක්වෙන අක්‍රමිකතාවන් සිදු කිරීමට ද ඉඩකඩ	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	සැලසී තිබුණි. උදාහරණ වශයෙන් 2022 ජූලි සිට දෙසැම්බර් දක්වා සැපයුම්කරු විසින් මයිසූර් පරිප්පු කිලෝග්‍රෑම් 1 කින් උපයා තිබුණු ලාභ ආන්තිකය රු. 17 සිට 224 දක්වා වැඩී වීමත් සමඟ ශ්‍රී ලංකා ජාතික රෝහලේ 2022 වර්ෂයේ මුල් මාස 04 හි කිලෝග්‍රෑම් 2444 ක් වූ සාමාන්‍ය මාසික මයිසූර් පරිප්පු පරිභෝජනය කිලෝග්‍රෑම් 6228 ක් දක්වා අසාමාන්‍ය ලෙස ඇස්තමේන්තුගත මාසික මයිසූර් පරිප්පු අවශ්‍යතාවය ද ඉක්මවා යමින් පරිභෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂා කිරීමේදී 2022 වර්ෂයේදී රෝහලේ නේවාසික රෝගීන්ගේ සහ කණිෂ්ඨ සේවකයන්ගේ ආහාර පෝෂණ සැලැස්ම වෙනස් කර නොතිබුණු බවද නිරීක්ෂණය විය.		
	vii. 2022 සැප්තැම්බර් සිට 2022 දෙසැම්බර් වන විට අමු ආහාර ද්‍රව්‍යවල වෙළඳපළ මිල ගණන් ක්‍රමිකව අඩුවීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය වූ අතර එලෙස මිල අඩු වීමේ ප්‍රවණතාවය 2023 මුල් මාස 03 දී ද නිරීක්ෂණය විය. නමුත් මෙම කොන්ත්‍රාත්තුවේ කාලය 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව මාස 3 ක කාලයක් එනම් 2023 මාර්තු 31 දක්වා දීර්ඝ කිරීමේදී මෙලෙස මිල අඩු වීමේ ප්‍රවණතාවය පිළිබඳ අවධානය යොමු කිරීමකින් තොරව කොන්ත්‍රාත්තුවේ වූ සියළුම අමු ආහාර ද්‍රව්‍ය අයිතම සඳහා නව මිල ගණන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන B කමිටුව විසින් අනුමත කර තිබුණි. අමු ආහාර ද්‍රව්‍ය අයිතම 05ක් නියැදියක් ලෙස ගෙන පරීක්ෂා කිරීමේදී, 2022 දෙසැම්බර් 27 දින වන විට පිටකොටුව සිල්ලර වෙළඳපල මිලට සාපේක්ෂව ඒකකයකින් රු. 23 සිට රු. 117 ක ලාභයක් ලැබෙන පරිදි නව මිල තීරණය කර ඉහත අමු ආහාර ද්‍රව්‍ය අයිතම 05 සඳහා සැපයුම්කරු වෙත ගෙවා තිබුණු බවත්, 2023 මාර්තු 31 වන විට මෙලෙස ඒකකයකින් ලැබෙන ලාභය රු. 31 සිට රු. 156 ක් දක්වා වර්ධනය වී තිබුණු බවත්, ඒ අනුව ඉහත අමු ආහාර ද්‍රව්‍ය අයිතම 05 සඳහා	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	2023 ජනවාරි මාසයේ සිට මාර්තු මාසය දක්වා පිටකොටුව සිල්ලර වෙළඳපල මිලට සාපේක්ෂව රු.5,169,068 ක මුදලක් සැපයුම්කරුට වැඩියෙන් ගෙවා තිබුණු බවත් නිරීක්ෂණය විය. මෙම ගණනය කිරීම ආහාර ද්‍රව්‍ය අයිතම පහකට පමණක් සීමා වන බැවින් ඉහත කාලය තුළ කොළඹ ජාතික රෝහල විසින් මිල දී ගෙන තිබුණු සියලුම අමු ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙපරිදි වැඩිපුර ගෙවීමක් සිදුකර තිබේදැයි යන්න පරීක්ෂා කර සැපයුම්කරුවන්ගෙන් හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතු බවට නිරීක්ෂණය කෙරේ.		
(ඕ)	කොළඹ ජාතික රෝහලේ විවිධ අංශ විසින් ලොන්ඩ්‍රියට ගෙනවිත් භාරදෙන කිලිටි වූ රෙදි භාරගෙන, වර්ගකර සේදුම් අංශයට භාරදීම සහ අයන් අංශයෙන් ලැබෙන රෙදි නැවත වර්ග කර අදාළ අංශ වෙත යොමු කිරීම සෞඛ්‍ය අංශ සුළු සේවකයින් 17 දෙනෙකුගේ කණ්ඩායමක් විසින් සිදු කරනු ලබන අතර එසේ වර්ගකර ලැබෙන රෙදි සේදුම් යන්ත්‍රවලට යොමු කිරීම, වියලන යන්ත්‍ර සඳහා රෙදි යොමු කිරීම සහ රෙදි අයන් කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරමින් මිල ගණන් කැඳවා වසර දෙකක් සඳහා එනම් 2022 පෙබරවාරි 01 දින සිට 2024 ජනවාරි 31 දක්වා පුද්ගලික ආයතනයකට මාසිකව රු.796,000 බැගින් රු.19,104,000 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එසේම ලොන්ඩ්‍රිය සතුව පවතින යන්ත්‍ර 25 සේවා කිරීම සහ නඩත්තු කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.	-	-
	i. මෙම කොන්ත්‍රාත්තුවේ කාර්යභාරය ලෙස "කිසියම් දිනක සේදීම සඳහා ඒ ඒ අංශවලින් ඉදිරිපත් කරන රෙදි එදිනම සෝදා වැඩ අවසන් කර ආපසු භාර දීමට කටයුතු කළ යුතුය" යන්න සංක්ෂිප්තව ගිවිසුමෙහි ඇතුළත් කර තිබුණ ද ඔවුන් වෙත පැවරෙන කාර්යයන් මොනවාද යන්න නිශ්චිතව හඳුනාගෙන නොතිබීමෙන් ඉහතින්	මේ සම්බන්ධයෙන් පූර්ණ ස්වාධීන විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	දැක්වූ කොන්ත්‍රාත්තුවේ කාර්යභාරයට අදාළව රෝහලේ ඒ ඒ අංශවලින් ඉදිරිපත් කරන කිලිටි රෙදිපිළි භාර ගැනීම, වර්ග කිරීම, පිරිසිදු කරන ලද රෙදිපිළි වර්ග කිරීම සහ ආපසු ඒ ඒ අංශවලට භාර දීම වෙනුවෙන් රෝහලේ සෞඛ්‍ය අංශ සුළු සේවකයින් 17 දෙනෙකුගේ කණ්ඩායමක් සේවයේ යොදවා තිබුණි.		
	ii. කොන්ත්‍රාත්තුවේ කාර්යභාරය වෙනුවෙන් දැරීමට සිදුවන වියදම පිළිබඳ පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු නිසා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන්වල සාධාරණ බව ඇගයීම සඳහා නිර්ණායකයන් නොතිබුණු අතර ගිවිසුම මගින් කොන්ත්‍රාත්කරු වෙත මාසිකව ගෙවීමට එකඟ වී තිබුණු රු.796,000 මුදල සාධාරණදැයි යන්න තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.	-එම-	-එම-
	iii. ගිවිසුමේ 05 වන කොන්දේසිය ප්‍රකාරව රෙදිපිළි සේදීමේ කටයුතු සිදුකර විදුලි ලොන්ඩ්‍රිය පවත්වාගෙන යාම සඳහා 16 දෙනෙකුගෙන් යුත් අවම කාර්යමණ්ඩලයක් සේවයේ යෙදවිය යුතු වූවත් දඩ අයකිරීමේදී එම අවම සිමාව 13 දෙනෙකු දක්වා අඩුකර තිබීමෙන් කොන්ත්‍රාත්කරු විසින් 2022 පෙබරවාරි 01 දින සිට 2023 අප්‍රේල් 30 දින දක්වා දින 454 න් 311 ක්ම අවම සේවක සංඛ්‍යාව වූ සේවකයින් 16 දෙනෙකුට වඩා අඩුවෙන් සේවයේ යොදවා තිබුණි. ඒ අනුව ඉහතින් දැක්වූ කොන්ත්‍රාත්තුවේ කාර්යභාරය ඉටුකිරීම සඳහා අවශ්‍ය වන අවම කාර්යමණ්ඩලයේ ප්‍රමාණය රෝහල විසින් නිවැරදිව තීරණය කර නොතිබුණු බවත්, වැඩිපුර කාර්යමණ්ඩලයක් අවශ්‍ය බව දක්වමින් ලංසු කැඳවීම හරහා වැඩි මිලක් කොන්ත්‍රාත්තුව සඳහා ඉදිරිපත් කිරීමේ පරිසරයක් නිර්මාණය කර දී තිබුණු බවත් නිරීක්ෂණය කෙරේ.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	iv. රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරු ලෙස මෙම කොන්ත්‍රාත්කරුව තෝරාගෙන තිබුණද ලංසු ලේඛනයෙහි කොන්දේසි 01 ප්‍රකාරව අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රය සහ විශාල ධාරිතාවයකින් යුතු ලොන්ඩ්‍රියක් පවත්වාගෙනයාම පිළිබඳ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක් ලබා තිබෙන බවට ලිඛිතව තහවුරු කර නොතිබුණි.	-එම-	-එම-
	v. ලංසු ලේඛන මගින් ඉල්ලා තිබුණු සුදුසුකම් සපුරා තිබුණු බවට රෝහල වෙත සහතිකපත්‍ර ඉදිරිපත් කර තිබුණු සේවකයන් වෙනුවට සුදුසුකම් සපුරා තිබුණු බවට රෝහල වෙත ලිඛිතව තහවුරු නොකළ සේවකයින් කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය පුරාවටම සේවයේ යොදවා තිබුණ ද මේ පිළිබඳව රෝහල් පරිපාලනයේ අවධානය යොමු වී නොතිබුණි. මෙපරිදි සුදුසුකම් රහිත සේවක කණ්ඩායමක් වෙත රෝහලේ රෙදිපිළි සේදීමේ කටයුතු සඳහා විදුලි ලොන්ඩ්‍රිය පවත්වාගෙන යාමට ඉඩකඩ සැලසීම මගින් රෝහල් අවශ්‍යතාවය අනුව නිසි පරිදි රෙදිපිළි සේදීම් කටයුතු සිදු නොවීමේ අවධානම සහ යන්ත්‍ර භාවිතය පිළිබඳ සහතිකපත්‍ර නොමැති සුදුසුකම් රහිත සේවකයන් විසින් රෝහලේ විදුලි ලොන්ඩ්‍රියේ තිබෙන යන්ත්‍ර හැසිරවීම හරහා එම යන්ත්‍රවලට හානි සිදු වීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.	-එම-	-එම-
(ක)	2021 ජුනි 01 දින සිට 2023 මැයි 31 දක්වා වර්ෂ දෙකක් වෙනුවෙන් කොළඹ ජාතික රෝහලේ විදුලි ලොන්ඩ්‍රියේ වූ යන්ත්‍ර 18 ක් සේවා හා නඩත්තු කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමක් වෙත 2021 ජුනි 06 පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහතින් දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வுத் திணைக்களம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	i. මෙම පෞද්ගලික සමාගමේ අයිතිකරුවෙකු ලෙස කටයුතු කරන පුද්ගලයා ඉහතින් දැක්වූ රෙදිපිළි සේදීමේ කටයුතු සිදුකර විදුලි ලොන්ඩ්‍රිය පවත්වාගෙන යාමේ කොන්ත්‍රාත්තුව පවරා තිබුණු ආයතනයේ සභාපතිවරයා වශයෙන්ද කටයුතු කරන අතර අවම වශයෙන් සේවකයින් 16 දෙනෙකුගෙන් යුක්ත වූ රෙදිපිළි සේදීමේ කාර්යමණ්ඩලයේ සේවකයකු ලෙස ද නම ඇතුළත් කර මාසික ගෙවීම් ලබා ගෙන තිබුණි. එසේම ලොන්ඩ්‍රියේ රෙදි පිරිසිදු කිරීමේ සේවයේ යොදවා තිබුණු සේවකයින් විසින්ම ඇතැම් දිනවල ලොන්ඩ්‍රියේ යන්ත්‍රවල මාසික සේවා හා නඩත්තු කිරීම් කටයුතු සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.	මේ සම්බන්ධයෙන් පූර්ණ ස්වාධීන විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	එකඟ වන බව, මෙම ආයතනයේ අයිතිකරු අදාළ රෙදිපිළි සේදීමේ ආයතනයේ අයිතිකරුද වන අතර එහි කළමනාකරු වශයෙන්ද රාජකාරී සිදු කරන බැවින් 16 දෙනෙකුගෙන් යුක්ත අවම කාර්යමණ්ඩලයේ කළමනාකරු ද ඇතුළත් විය යුතු බවට ගිවිසුම්ගත වී ඇති බව, ලොන්ඩ්‍රියේ රාජකාරී සඳහා ප්‍රමාණවත් සේවකයන් පිරිසක් වාර්තා කිරීම සිදු වී නොමැති අවස්ථාවලදී අදාළ පුද්ගලයාද රාජකාරී සිදු කර නම ඇතුළත් කර ඇති බවට තහවුරු කර ගැනීමට කටයුතු කරන බව, විදුලි ලොන්ඩ්‍රියේ යන්ත්‍ර නඩත්තු කිරීම සඳහා ගිවිසුම්ගත පෞද්ගලික ආයතනය වෙතින් මිල කැඳවීම් සිදු කර අදාළ ආයතනයෙන් නඩත්තු හා සේවා සිදු කර ගැනීමට කටයුතු කරන අතර ඒ බව රෝහලේ විදුලි කාර්මික ශිල්පී විසින් තහවුරු කර රෝහල් පරිපාලනය වෙත දැනුම් දෙනු ලබන බව.
	ii. ඒ අනුව ස්වාධීනව ක්‍රියාත්මක විය යුතු කර්තව්‍යයන් දෙකක් සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණ ද එකම පුද්ගලයකු යටතේ පාලනය වන ආයතන දෙකක් තෝරා ගෙන තිබීමෙන් එම ප්‍රසම්පාදනයන් මගින් රෝහල අපේක්ෂා කළ අරමුණු ඉටුනොවීමේ අවධානම විගණනයේදී බැහැර කළ නොහැකි අතර ලොන්ඩ්‍රිය තුළ ඉහතින් දැක්වූ පරිදි අක්‍රමිකතා සිදුවීමේ පරිසරයක් රෝහල විසින් නිර්මාණය කර දී තිබුණි.	-එම-	එකඟ නොවන බව, විදුලි ලොන්ඩ්‍රියේ යන්ත්‍ර නඩත්තු කිරීම සඳහා පුවත්පත් දැන්වීම් මගින් මිල කැඳවීම් සිදු කර අවම මිල ඉදිරිපත් කර තිබූ ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර ඇති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			අතර ඒ තුළින් අක්‍රමිකතා සිදු වී ඇතිද යන්න පරීක්ෂා කර බලා විගණනය වෙත ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව.
	iii. මෙම ප්‍රසම්පාදනයට අදාළව පිළියෙල කර තිබුණු ලංසු ලේඛන ප්‍රකාරව යන්ත්‍ර සම්බන්ධයෙන් මාසයකට වරක් සාමාන්‍ය සේවා කිරීම් කාර්යයන් 09 ක් (Routine Services) සිදුකළ යුතු බවට සඳහන් කර තිබුණ ද එම කොන්දේසි කොන්ත්‍රාත්කරු සමඟ 2021 ජූලි 07 වන දින එළඹී තිබුණු ගිවිසුම තුළ හෝ ලංසු කොන්දේසි ගිවිසුමේ කොටසක් වන බවට වූ වගන්ති හෝ ගිවිසුම තුළ ඇතුළත් කර නොතිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරුගේ අභිමතය පරිදි සේවා හා නඩත්තු කිරීම් සිදුකිරීමේ පරිසරයක් රෝහල විසින් නිර්මාණය කර දී තිබුණි.	-එම-	එකඟ වන බව, මාසික නඩත්තු කිරීම තහවුරු කර ගැනීමෙන් අනතුරුව අදාළ අංශ භාර විදුලි කාර්මික ශිල්පියාගේ නිර්දේශය මත පමණක් මාසික නඩත්තු සේවා සඳහා ගෙවීම් කටයුතු සිදු කර ඇති බව, කෙසේ වෙතත්, ඉදිරියේදී මේ සම්බන්ධයෙන් වන වගන්ති ගිවිසුමට ඇතුළත් කරන බව.
	iv. රෝහල් පරිපාලනය විසින් ලංසු හා ගිවිසුම් කොන්දේසි පිළිබඳව බිම් මට්ටමින් මෙම කාර්යය අධීක්ෂණය කරන රෝහලේ විදුලි ශිල්පියාව දැනුවත් කර නොතිබුණු බවත්, යන්ත්‍ර සේවා හා නඩත්තු කිරීම් සහ අළුත්වැඩියා කිරීම් සිදු කරනු ලබන අවස්ථාවේදී අධීක්ෂණය කිරීම සඳහා විෂයභාර විදුලි ශිල්පියා විසින් සහභාගී වූයේද යන්න ලිඛිතව තහවුරු නොවන බවත්, යන්ත්‍ර සේවා හා නඩත්තු කිරීම් සිදු කරනු ලබන කොන්ත්‍රාත් ආයතනය විසින් මාසික සේවා හා නඩත්තු කිරීම සඳහා පැමිණෙන දිනයන් පිළිබඳව රෝහලේ විෂයභාර විදුලි ශිල්පියාව කලින් දැනුවත් කිරීමක් සිදු කර නොතිබුණු බවත්, ඇතැම් අවස්ථාවල සේවා කිරීමෙන් අනතුරුව විදුලි ශිල්පියාව දැනුවත් කර තිබුණු බවත්, සහ කොන්ත්‍රාත්කරු විසින් යන්ත්‍ර මාසික සේවා හා නඩත්තු කිරීම් ලෙස බ්ලෝවර් කිරීම මගින් යන්ත්‍රවල දූවිලි ඉවත් කිරීම, බාහිරව පිරිසිදු කිරීම, බෙයාරින්වලට ග්‍රීස් දැමීම හා හදුනාගනු ලබන ඇතැම් කොටස් අළුත්වැඩියා කළ යුතු බවට දැනුම් දීම පමණක්	-එම-	එකඟ නොවන බව, අදාළ කාර්යය සඳහා අනුයුක්ත කර ඇති රෝහල් විදුලි කාර්මික ශිල්පීගෙන් පැහැදිලි කිරීම් ලබා ගනිමින් පවතින අතර ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.

ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வாளர் அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	සිදු කර තිබුණු බවත් රෝහලේ විදුලි ශිල්පී නිලධාරියාගෙන් ලබා ගත් ප්‍රකාශය අනුව නිරීක්ෂණය විය.		
	v. කොන්ත්‍රාත්කරු විසින් මාසික ගෙවීම් ලබා ගැනීම සඳහා සේවා කිරීම් කාර්යයන් 15කට ආසන්න ප්‍රමාණයක් සිදුකළ බව සේවා හා නඩත්තු වාර්තා මගින් දක්වා තිබුණු නමුත් 2021 සහ 2022 යන වර්ෂවලදී සිදුකර තිබුණු අළුත්වැඩියාවන් නියැදියක් ගෙන පරීක්ෂා කිරීමේදී, අළුත්වැඩියාවට ලක් වූ යන්ත්‍ර කොටස් සම්බන්ධයෙන් ඒවායේ තත්ත්වය එම අළුත්වැඩියාවන්ට පෙර, අළුත්වැඩියාව අතරතුර සහ අළුත්වැඩියාවෙන් පසුව නිකුත් කර තිබුණු සේවා හා නඩත්තු වාර්තා මගින් ඊට මුළුමනින්ම වෙනස් වූ සාවද්‍ය තත්ත්වයක් වාර්තා කර තිබුණි. ඒ අනුව රෝහල විසින් සාවද්‍ය සේවා හා නඩත්තු වාර්තා මත පදනම්ව මාසික ගාස්තු කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු බවත්, අවම වශයෙන් අළුත්වැඩියා අවස්ථාවලදී හෝ එම යන්ත්‍ර කොටස්වල තත්ත්වය සම්බන්ධයෙන් සේවා හා නඩත්තු වාර්තා මගින් අධීක්ෂණයක් සිදු කිරීමකින් තොරවම එම අළුත්වැඩියා සඳහා අනුමැතිය ලබා දී තිබුණු බවත් නිරීක්ෂණය විය. එබැවින් විධිමත් පරීක්ෂණයක් සිදුකර කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය පුරාවටම සාවද්‍ය සේවා හා නඩත්තු වාර්තා මත පදනම්ව ගෙවා තිබෙන සේවා ගාස්තු සහ අළුත්වැඩියා වියදම් කොන්ත්‍රාත්කරුගෙන් හෝ ඊට වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කළ යුතු බවට නිරීක්ෂණය කෙරේ.	-එම-	එකඟ නොවන බව, කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් අංශභාර විදුලි ශිල්පියාගෙන් පැහැදිලි කිරීම් විමසා ඇති අතර හැකි ඉක්මණින් විගණනය වෙත වාර්තා කිරීමට කටයුතු කරන බව.
	vi. යන්ත්‍ර සේවා සහ නඩත්තු කිරීමේ ප්‍රසම්පාදනයේදී වසර දෙකක කාලසීමාවක් සඳහා ලංසු ලේඛන මගින් ඉල්ලා තිබුණු යන්ත්‍ර අමතර කොටස් සැපයීමට කොන්ත්‍රාත්කරු විසින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු නමුත් එසේ ඉදිරිපත් කරන ලද මිල ගණන්වල සාධාරණ බව ඇගයීම සඳහා නිර්ණායකයන් රෝහල විසින් හඳුනාගෙන නොතිබුණි. එසේම වසර දෙකක කාල සීමාව තුළ ලොන්ඩ්‍රියේ වූ	-එම-	එකඟ නොවන බව, මේ පිළිබඳව පරීක්ෂා කිරීම් සිදු කරන අතර හැකි ඉක්මණින් විගණනය වෙත වාර්තා කිරීමට කටයුතු කරන බව, කෙසේ වූවද, සියළු අළුත්වැඩියාවන් මේ සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ඇති යාන්ත්‍රික

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	යන්ත්‍ර සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී අවස්ථා 07 කදී සිදුකරන ලද අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රෝහල විසින් සියයට 181 සිට සියයට 1067 ක පරාසයක විහිදෙන පරිදි එකඟ වූ මිලට වඩා වැඩි මිලක්, එම මිල වැඩිවීම් මූලාශ්‍ර ලේඛන මගින් තහවුරු කර ගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර මුදලක් ගෙවා තිබේදැයි යන්න නිශ්චය කර කොන්ත්‍රාත්කරුගෙන් හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කළ යුතු බවට නිරීක්ෂණය කෙරේ.		ඉංජිනේරුවරයෙකු ඇතුළත් තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් ඇගයීමෙන් අනතුරුව සිදුකරනු ලබන බව.
	vii. යන්ත්‍ර සේවා සහ නඩත්තු කිරීමේ ගිවිසුමේ 1 (viii) ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් සතියේ දින පහ තුළ කාර්මික නිලධාරියෙකු ලොන්ඩ්‍රිය තුළ සේවයේ යෙදවිය යුතු වූවද ඔහුගේ පැමිණීම සහ පිටවීම හා දෛනිකව සිදුකළ කාර්යයන් රෝහල වෙත වාර්තා කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කිරීමේදී එසේ සේවකයකු සේවයේ යොදවා තිබුණු බවට තහවුරු කරගෙන නොතිබුණි. එසේම එක් එක් යන්ත්‍රය සම්බන්ධයෙන් සිදුකරන ලද සේවා කිරීම්, යන්ත්‍ර අක්‍රීය වූ දිනයන්, යන්ත්‍ර පරීක්ෂාවට ලක් කළ දිනයන් හා වේලාවන්, යන්ත්‍ර අක්‍රීයවීම් රෝහල වෙත සන්නිවේදනය කරන ලද දිනය, අළුත්වැඩියා සිදු කළ දිනයන්, අළුත්වැඩියාවේදී ඉවත් කරන ලද යන්ත්‍ර කොටස් මොනවාද, ඒවා රෝහල වෙත විධිමත් පරිදි භාර දීම, එකතු කර තිබුණු යන්ත්‍ර කොටස් පිළිබඳ විස්තර, අළුත්වැඩියාවන් නිසි පරිදි භාර ගැනීම සහ ඉහත කරුණු නිසිපරිදි සිදු කෙරෙන බවට අධීක්ෂණය කිරීම සටහන් කෙරෙන ලොග් පොත් පවත්වා ගැනීම හෝ වෙන යම් ලේඛනයක් හෝ පවත්වා ගෙන ගොස් නොතිබුණි. මේ හේතුවෙන් ලොන්ඩ්‍රියේ පවතින එක් එක් යන්ත්‍රයක් සම්බන්ධයෙන් අවශ්‍ය කෙරෙන තීරණ	-එම-	එකඟ වන බව, මෙම සේවකයන් පැමිණීම හා පිටවීම සටහන් කිරීමට ලේඛනයකුත් සහ යන්ත්‍රවල තත්ත්වයන් සටහන් කිරීමට ලොග් පොතක්ද භාවිත කිරීමට අදාළ අංශයට උපදෙස් ලබා දීමට කටයුතු කරන බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ගැනීම සඳහා රෝහල් පරිපාලනයට නිවැරදි තොරතුරු සැපයෙන යාන්ත්‍රණයක් නොතිබුණි.		
	viii. ඉහත යන්ත්‍ර 18 සම්බන්ධයෙන් 2023/24 වර්ෂයේ සේවා සහ නඩත්තු කිරීම් කොන්ත්‍රාත්තුව සඳහා 2021/23 වර්ෂ දෙක වෙනුවෙන් තෝරාගෙන තිබුණු කොන්ත්‍රාත්කරුවම තෝරාගෙන තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් 2021/23 සඳහා රෝහල වෙත ඉදිරිපත් කරන ලද අමතර කොටස් මිල ගණන් සමඟ 2023/24 කොන්ත්‍රාත්තුවට අදාළව ඉදිරිපත් කරන ලද මිල ගණන් සැසඳීමේදී අමතර කොටස් මිල ගණන්හි වැඩි වීම 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 12 සිට සියයට 2900 ක් දක්වා වූ විශාල වැඩිවීමක් බවට නිරීක්ෂණය විය. මෙපරිදි යන්ත්‍ර අමතර කොටස් මිල ගණන් විශාල ලෙස වැඩි වීම තහවුරු කර ගැනීමකින් තොරව 2023 අගෝස්තු 01 සිට 2024 ජූලි 31 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ගිවිසුම්ගත වී තිබීම හේතුවෙන් යන්ත්‍ර අමතර කොටස් සඳහා ඉහල මිල ගණන් ගෙවීමට සිදුවන පරිසරයක් රෝහල විසින් නිර්මාණය කර දී තිබුණි.	-එම-	එකඟ වන බව, කෙසේ වුවද, ඉදිරිපත් කර ඇති මිල ගණන් යටතේ අමතර කොටස් මිලදී ගැනීමක් සිදු නොකරන අතර පුවත්පත් මගින් මිල කැඳවීම් සිදු කර තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ලංසුකරුගෙන් අමතර කොටස් මිලදී ගැනීම සිදු කරන බව.
	ix. විදුලි ලොන්ඩ්‍රියේ අවශ්‍යතාවය සඳහා රතු සහ නිල් පැහැති ප්‍රධාන සම්පීඩක යන්ත්‍ර දෙකක් සහ ප්‍රධාන බොයිලේරු දෙකක් පවතින අතර මෙම යන්ත්‍රවලට අමතරව තවත් සම්පීඩක යන්ත්‍ර 02 සහ මිනි බොයිලේරු 03 ක් ලොන්ඩ්‍රිය තුළ පැවතිය ද ඉන් මිනි බොයිලේරු දෙක භාවිතයට ගත නොහැකි අයුරින් අබලන් වී තිබුණු අතර සම්පීඩක යන්ත්‍ර 02 සහ මිනි බොයිලේරුවක් භාවිතයට ගෙන නොතිබුණි. නමුත් භාවිතයට ගත නොහැකි අයුරින් අබලන් වී තිබුණු මිනි බොයිලේරු දෙක සේවා සහ නඩත්තු ගිවිසුමට ඇතුළත් කර යන්ත්‍රයකට රු.7,500 බැගින් මාසිකව ගෙවා තිබුණි. එබැවින් අක්‍රියව තිබුණු මිනි බොයිලේරු සම්බන්ධයෙන් ගෙවා තිබෙන සේවා කිරීම් ගාස්තු ගණනය කර කොන්ත්‍රාත්කරුගෙන් හෝ වගකිවයුතු	-එම-	එකඟ වන බව, මෙම යන්ත්‍රය නැවත අළුත්වැඩියා කළ හැකි මට්ටමේ පවතින අතර නැවත අළුත්වැඩියා කරන තෙක් මාසිකව සේවා කටයුතු සිදු කරන බව, එසේ නොමැති වුවහොත් යන්ත්‍රය නැවත භාවිත කිරීමට නොහැකි තත්ත්වයට පත්වන බව, එහෙයින් නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කරන බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	පාර්ශවයන්ගෙන් අය කළ යුතු බවටත්, භාවිතයට නොගන්නා සම්පීඩක යන්ත්‍ර දෙක සහ මීනි බොයිලේරුව මාසිකව සේවා කළ බව දන්වා සිටිය ද එම සේවා කිරීම් නිසි පරිදි සිදුකර තිබුණේ ද යන්න තහවුරුවක් නොවුණු අතර එම යන්ත්‍ර අපේක්ෂිත ක්‍රියාකාරී මට්ටමේ පවතින්නේ ද යන්න තහවුරු කර ඒවා තවදුරටත් සේවා කිරීමේ ඵලදායිතාවය පිළිබඳව විධිමත් පරීක්ෂාවක් කළ යුතු බවට නිරීක්ෂණය කෙරේ.		
	x. ඉහතින් දැක්වූ යන්ත්‍ර 18ට අමතරව 2018 වර්ෂයේදී පෞද්ගලික ආයතනයකින් මිලදීගෙන තිබුණු තවත් යන්ත්‍ර 05 ඉහතින් දැක්වූ සේවා කිරීම් සහ නඩත්තු සේවා සපයන කොන්ත්‍රාත්කරුටම පවරා ගිවිසුම් ගත වී තිබුණි. එහිදී 2021 සැප්තැම්බර් 15 වන දින සිට 2022 සැප්තැම්බර් 14 වන දින දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් යන්ත්‍ර සැපයුම්කරු ලංසු ලේඛන සමඟ සිව්වන වසර සඳහා ඉදිරිපත් කරන ලද සේවා හා නඩත්තු මිල වූ රු.750,000 වාර්ෂික මුදල කොන්ත්‍රාත්කරුට ගෙවීමට එකඟ වී තිබුණු නමුත් යන්ත්‍ර මිලදී ගැනීමට අදාළවන ලංසු ලේඛන තුළ දක්වා තිබුණු සේවා හා නඩත්තු ගිවිසුමට අදාළ කොන්දේසිවලින් සම්පූර්ණයෙන් බැහැර වූ කොන්දේසි ඉහත සේවා හා නඩත්තු ගිවිසුමට ඇතුළත් කර තිබුණි.	-එම-	එකඟ වන බව, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර නව කොන්දේසි ඇතුළත් කරන බව.
	xi. එසේම ඉහතින් දැක්වූ සේවා හා නඩත්තු මිල වූ රු.750,000 ක වාර්ෂික මුදල තුළ සේවා කිරීම් සහ නඩත්තුව සඳහා වූ සියළුම කොටස් සැපයීමේ පිරිවැය අන්තර්ගත බව යන්ත්‍රයේ සැපයුම්කරු විසින් දක්වා තිබුණ ද එම කොටස් මොනවාද යන්න නිශ්චිතව හඳුනා ගෙන නොතිබීමත්, සේවා හා නඩත්තු කටයුතු පවරා තිබුණු කොන්ත්‍රාත්කරු විසින් යන්ත්‍ර අළුත්වැඩියා කටයුතුවලදී යන්ත්‍රයේ සැපයුම්කරු විසින් නිෂ්පාදිත අමතර කොටස් භාවිතා කර තිබුණු බවට තහවුරු කර ගෙන නොතිබීමත්, අමතර කොටස් සැපයිය යුතු	-එම-	එකඟ වන බව, විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි මේ සම්බන්ධයෙන් නව වගන්ති ඇතුළත් කිරීමට කටයුතු කරන බව, කෙසේ වෙතත්, අදාළ නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සිදු කළ පසු අංශභාර විදුලි කාර්මික ශිල්පී විසින් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් පසුව ගෙවීම් සිදු කරනු ලබන බව.

NAOSL
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	මිල ගණන් පිළිබඳ රෝහල සමඟ පූර්ව එකඟතාවයක් නොතිබීමත් නිසා අළුත්වැඩියා කටයුතුවලදී සපයා තිබුණු අමතර කොටස් වෙනුවෙන් රෝහල විසින් ගෙවන ලද මුදලේ සාධාරණ බව තහවුරු කරගැනීමට විගණනයේදී නොහැකි විය.		
	xii. 2018 වර්ෂයේදී ස්ථාපිත කර තිබුණු අංක 26 දරන ෆ්ලැට් අයන් යන්ත්‍රය (3200mm) නිසි ක්‍රියාකාරී මට්ටමේ නොතිබුණු බැවින් (විදුලිය අධික ලෙස වැය වීම සහ අයන් වීම මන්දගාමී ලෙස සිදුවීම) ස්ථාපිත කරන ලද දිනයේ සිට ලොන්ඩ්‍රිය තුළ භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මෙලෙස භාවිතයට නොගන්නා මෙම යන්ත්‍රය ද සේවා හා නඩත්තු ගිවිසුමට ඇතුළත් කර මාසිකව රු.15,500 බැගින් 2021 සැප්තැම්බර් සිට 2023 අප්‍රේල් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා පමණක් රු.310,000 ක ගෙවීමක් කොන්ත්‍රාත්කරු වෙත සිදුකර තිබුණි. නමුත් මෙම යන්ත්‍රය සම්බන්ධයෙන් කිසිදු සේවා කිරීමක් සිදුකර නොමැති බවට නිරීක්ෂණය විය. මෙපරිදි රෝහලේ අවශ්‍යතාවය ඉටුකිරීමට ප්‍රමාණවත් නොවන යන්ත්‍රයක් මිලදී ගෙන එහි නඩත්තුව වෙනුවෙන් දිගින් දිගටම රජයේ මුදල් වැය කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර අදාළ අලාභයන් ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කළ යුතු බවට නිරීක්ෂණය කෙරේ.	-එම-	එකඟ වන බව, මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදු කර විගණනය වෙත වාර්තා කරන බව.
	xiii. 2024 ජනවාරි 26 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී විදුලි ලොන්ඩ්‍රියේ තිබුණු රෙදි වියලන යන්ත්‍ර 02 ක් හා රෙදි සෝදන යන්ත්‍ර 02 ක් මාස 02 කට අධික කාලයක සිට ක්‍රියාවිරහිත වී තිබුණු බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් රෝහල සඳහා අවශ්‍ය කෙරෙන දෛනික රෙදි පිරිසිදු කිරීමේ සේවාව නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා අහිතකර ලෙස බලපෑමේ අවධානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.	-එම-	එකඟ වන බව, මෙම අවස්ථාවේදී අදාළ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පැවති අතර මෙහිදී ඇගයීම් කටයුතු සඳහා යම් කාලයක් ගත වූ බැවින් යම් ප්‍රමාදයක් සිදු වී ඇති බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	xiv. ලොන්ඩ්‍රිය තුළ රැස්වන උණුසුම් වාතය පාලනය කිරීමට අවශ්‍ය කෙරෙන එක්ස්හෝස්ට් ෆෑන් හෝ වෙනත් ක්‍රමවේදයක් භාවිතා කර නොතිබුණු බවට නිරීක්ෂණය විය. බොයිලේරුව මගින් ජනනය කෙරෙන උණුසුම් ජල වාෂ්ප (හුමාලය) රෙදි පිරිසිදු කිරීමේ කටයුතු සඳහා ප්‍රවහනය කෙරෙන පද්ධතියේ ඇතැම් ස්ථාන වලින් පිටතට කාන්දු වන අතර උණුසුම් ජල වාෂ්ප රෙදි පිරිසිදු කිරීමේ කටයුතු සඳහා භාවිතා කිරීමෙන් අනතුරුව කාණු පද්ධතිය තුළට බැහැර කෙරේ. මෙලෙස බැහැර කෙරෙන උණුසුම් ජල වාෂ්ප නැවත පද්ධතිය තුළට එකතු කිරීමේ හැකියාවක් පවතින්නේද යන්න සොයා බලා එමගින් දැවිතෙල් භාවිතය කාර්යක්ෂම කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමි.	-එම-	එකඟ වන බව, බොයිලේරුව මගින් ජනනය කෙරෙන හුමාලය ප්‍රවාහනය කරන නළ පද්ධතිය මේ වන විට අළුත්වැඩියා කර ඇති අතර විගණනය පෙන්වා දී ඇති පරිදි පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ජල වාෂ්ප පද්ධතියට එකතු කර කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව.
(ග)	2022 මාර්තු 01 වනදා සිට 2023 පෙබරවාරි 28 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා මහරගම අපේක්ෂා රෝහල වෙනුවෙන් ආරක්ෂක සේවා සැපයීම සම්බන්ධයෙන් වූ කොන්ත්‍රාත්තුව, පුද්ගලික සමාගම වෙත පිරිනමා තිබුණ අතර එම කොන්ත්‍රාත් කාලය 2023 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි. එසේම 2023 අප්‍රේල් 01 සිට 2024 මාර්තු 31 දක්වා වන කාලපරිච්ඡේදය වෙනුවෙන් ලංසු කැඳවීමකින් තොරව මෙම පුද්ගලික සමාගමෙන්ම මාසිකව රු.2,897,113 ක මුදලකට ආරක්ෂක සේවාව ලබා ගැනීමට 2023 මාර්තු 07 දිනැති අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. මෙම කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව 2023 වර්ෂයට අදාළව ආරක්ෂක සේවා ලබා ගෙන තිබුණේදැයි යන්න විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.		
	i. 2024 පෙබරවාරි 05 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී, ගිවිසුම් ප්‍රකාරව රාත්‍රී ආරක්ෂක සේවයේ යෙදවිය යුතු ආරක්ෂක සේවකයින් 32 වඩා සේවකයින් 10 ක් අඩුවෙන් ආරක්ෂක සේවකයින් 23 දෙනෙකු සේවයේ යොදවා තිබුණු බවත්, ඉන් 19 දෙනෙකු 2024	මේ සම්බන්ධයෙන් පූර්ණ ස්වාධීන විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන්	පැමිණීමේ හා පිටවීමේ ලේඛනයේ අත්සන් කරන පුද්ගලයා විසින්ම තම අත් අකුරින්ම සේවා අංකය නම හා තනතුර පොතේ සටහන් කිරීමට දැනුවත් කිරීම, මෙමගින්

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வுப் அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	පෙබරවාරි 04 දිවා ආරක්ෂක සේවයේ යොදවා සිටි නිලධාරීන් වූ බැවින් එය ගිවිසුම් කොන්දේසිවලට පටහැනි බවත්, සේවයේ යොදවා තිබුණු නිලධාරීන් 23 දෙනාගෙන් නිලධාරීන් 15 දෙනෙකු පමණක් රෝහල් පරිපාලනය වෙත යොමු කරනු ලබන ආරක්ෂක නිලධාරීන්ගේ දිවා හා රාත්‍රී සේවා මුරයන් සඳහා පැමිණීම සහ පිටවීම අත්සන් කරන ලේඛනයේ අත්සන් කර තිබුණු බවත්, ඉන් 12 දෙනෙකු ව්‍යාජ නම් යොදා අත්සන් කර තිබුණු බවත් සහ දෙදෙනෙකු සතුව හැඳුනුම්පත් නොමැතිවීම හේතුවෙන් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත නොහැකි වූ බවත් නිරීක්ෂණය විය.	සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	ව්‍යාජ අත්සන් හා නම් ඇතුළත් කිරීම හා වැලැක්වීම හා අධීක්ෂණය පහසු කර ගැනීම, මෙම අනු අංකයේ සටහන් කර ඇති **DUTY ROSTER** යන ලේඛනය ආරක්ෂක අංශය මගින් පෞද්ගලිකව පවත්වාගෙන යන ලේඛනයක් වන අතර ඒ පිළිබඳව රෝහල් පරිපාලනය දැනුවත් කර නොමැති බැවින් ඒ පිළිබඳ තොරතුරු ආරක්ෂක අංශයෙන් ලබා ගැනීම, රෝහල විසින් මෙතෙක් ගෙවීම් කරන ලද්දේ ආරක්ෂක අංශය විසින් ඉදිරිපත් කරන ලද දිවා රාත්‍රී පැමිණීමේ ලේඛනය අනුව බව, මෙම අනු අංකයේ සටහන් කර ඇති යන ලේඛනය ආරක්ෂක අංශය මගින් පෞද්ගලිකව පවත්වාගෙන යන ලේඛනයක් වන අතර ඒ පිළිබඳව රෝහල් පරිපාලනය දැනුවත් කර නොමැති බැවින් ඒ පිළිබඳ තොරතුරු ආරක්ෂක අංශයෙන් ලබා ගැනීම, රෝහල වෙත යොමුකරන පැමිණීමේ ලේඛනය අනුව නිලධාරීන් පැය 12 ඉක්මවා රාජකාරි සිදු කළ බව දක්නට නැති බව, මෙම අනු අංකයේ සටහන් කර ඇති **DUTY ROSTER** (දිවා රාත්‍රී රාජකාරි ලකුණු කිරීමේ ලේඛනය) යන ලේඛනය ආරක්ෂක අංශය මගින් පෞද්ගලිකව පවත්වාගෙන යන ලේඛනයක් වන අතර ඒ පිළිබඳව රෝහල් පරිපාලනය දැනුවත් කර නොමැති බව, මෙහි සඳහන් ස්ථානයන්හි ක්ෂේත්‍ර

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வுச் அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			පොත් යාවත්කාලීන කරන ලෙස ආරක්ෂක අංශය දැනුවත් කිරීම සිදු කර ඇති බව, ඉහත සඳහන් සොරකම් පිළිබඳව විමර්ශනය සිදුවෙමින් පවතින අතර ඉන්පසු 2023 වර්ෂයට අදාළ බිල්පත් සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කරන බව.
	ii. එසේම 2023 කාලපරිච්ඡේදය පුරාවටම, රෝහල් පරිපාලනය වෙත යොමු කරනු ලබන ආරක්ෂක නිලධාරීන්ගේ දිවා හා රාත්‍රී සේවා මුරයන් සඳහා පැමිණීම සහ පිටවීම අත්සන් කරන ලේඛනයේ අත්සන් කර තිබුණු සේවකයින්ගේ නම්, දිවා රාත්‍රී රාජකාරී ලකුණු කිරීමේ ලේඛනයේ (Duty Roster) සටහන් කර තිබුණු නම් සමඟ නොසැසඳුණි.	-එම-	-එම-
	iii. ලංසු කොන්දේසි 12.3 ප්‍රකාරව කිසිදු ආරක්ෂක නියාමකයකු/පරීක්ෂක නිලධාරියෙකු එක් විටකදී අඛණ්ඩව පැය 12 කට වඩා වැඩියෙන් සේවයේ නොයෙදවිය යුතු අතර ඒ සඳහා කිසිදු ගෙවීමක් රෝහල විසින් සිදු නොකරන බව සඳහන් වූවද, දිවා රාත්‍රී රාජකාරී ලකුණු කිරීමේ ලේඛනය ප්‍රකාරව 2023 ජනවාරි මාසය තුළ සේවකයින් 21 දෙනෙකු පැය 12 ඉක්මවා පැය 24 සිට පැය 732 දක්වා වූ පරාසයක විහිදෙන පරිදි අඛණ්ඩව ආරක්ෂක සේවාවේ යොදවා තිබුණු බවත් , මෙම තත්ත්වය 2023 වර්ෂය පුරාවටම පැවති බවත්, ඒ සඳහා රෝහල විසින් ගෙවීම් කර තිබුණු බවත් නිරීක්ෂණය විය. නමුත් මෙම තත්ත්වය රෝහල් පරිපාලනය වෙත යොමු කරනු ලබන ආරක්ෂක නිලධාරීන්ගේ දිවා හා රාත්‍රී සේවා මුරයන් සඳහා පැමිණීම සහ පිටවීම අත්සන් කරන ලේඛනය තුළ පිළිඹිබු නොවන අයුරින් ව්‍යාජ නම් යොදා වංචනික ලෙස එම ලේඛනය සකස්කර	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	තිබුණු බවත්, මෙම තත්ත්වය රෝහල් පරිපාලනය විසින් අධීක්ෂණය කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.		
	iv. මෙපරිදි ලංසු කොන්දේසිවලට පටහැනිව පැය 12 ඉක්මවා ආරක්ෂක නිලධාරීන් සේවයේ යොදවා තිබීම නිසා ගිවිසුම් ප්‍රකාරව දෛනිකව ආරක්ෂක නියාමකයින් 58 දෙනෙකු යෙදවිය යුතු වුවත් දිවා රාත්‍රී රාජකාරී ලකුණු කිරීමේ ලේඛනය ප්‍රකාරව 2023 වර්ෂය පුරාවටම ගිවිසුම් ගත ආරක්ෂක නියාමකයින්ගේ අවශ්‍යතාවයෙන් සියයට 50 කට වඩා අඩුවෙන් සේවයේ යොදවා තිබුණි. එසේම 2023 අප්‍රේල් මාසය හැරුණු විටෙක අනෙකුත් මාසවල නියමිත අධීක්ෂණ නිලධාරීන් සංඛ්‍යාවට වඩා නිලධාරීන් 01ක් හෝ 02 ක් අඩුවෙන් සේවයේ යොදවා තිබුණි.	-එම-	-එම-
	v. ආරක්ෂක නිලධාරීන් විසින් කිසියම් නිශ්චිත කාලයකට වරක් තමන්ට පැවරෙන කලාපයේ සෝදිසි පරීක්ෂාවක් කර කලාපයේ ආරක්ෂක තත්ත්වය පිළිබඳ ක්ෂේත්‍ර පොතක සටහන් කර අත්සන් කළ යුතු අතර විශේෂිත ආරක්ෂාවක් සැපයිය යුතු වන විදුලි ජනක යන්ත්‍ර කාමරය, ඖෂධ, ශල්‍ය සහ අනෙකුත් ගබඩාවන්, පල්දෝරු පද්ධතිය වැනි ස්ථාන අඛණ්ඩව නිරීක්ෂණය කෙරෙන බවට තහවුරු වන පරිදි එම ස්ථාන අසල තබා තිබෙන පොත් යාවත්කාලීනව පවත්වාගත යුතු වුවත් එවැන්නක් සිදුකර නොතිබුණි.	-එම-	ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග අනුව මෙහි සඳහන් අවදානම අවම කරන බව.
	vi. ඒ අනුව ගිවිසුම් ප්‍රකාරව නියමිත ආරක්ෂක සේවකයින් සංඛ්‍යාවෙන් අඩකට වඩා අඩුවෙන් සේවයේ යොදවා තිබීමත්, ආරක්ෂක සේවකයින් පැය 12 ඉක්මවා අඛණ්ඩව ආරක්ෂක සේවයේ යොදවා තිබීමත්, ව්‍යාජ නම් ඇතුළත් කර සාවද්‍ය ලෙස ආරක්ෂක සේවකයින් පැමිණීමේ සහ පිටවීමේ ලේඛන සකස් කර රෝහල වෙත ඉදිරිපත් කර තිබීමත් සහ එය රෝහලේ අධීක්ෂණයට ලක් වී	-එම-	මෙතෙක් රෝහල් පරිපාලනය වෙත පෙර දින රාත්‍රියේ **Point List** උදැසන ඉදිරිපත් කරන ලද බව, මින් පසු රාත්‍රී මුරයේ **point list** ලැයිස්තුව එදින උදයේම පරිපාලනය වෙත ඉදිරිපත් කිරීමට දැනුවත් කර ඇති බව, හැඳුනුම්පත් පැළඳීම පිළිබඳව ආරක්ෂක

	නොනිබීමත් නිසා ලංසු කොන්දේසි 12.5 ප්‍රකාරව රෝහලේ භූමි භාගය සහ එහි පිහිටි සියළුම නිශ්චල හා චංචල දේපල සහ වත්කම්වල ආරක්ෂාව නිසි පරිදි සලසා ගැනීමේ අරමුණු ඉටු වී නොනිබුණු අතර ආරක්ෂක සේවාව ලබා ගැනීම සම්බන්ධයෙන් වූ රෝහල් අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පැවතුණි. කොන්ත්‍රාත් කාලසීමාව තුළදී රෝහලේ සවිකර තිබෙන වායුසමීකරණ යන්ත්‍රවල බාහිර ඒකකවල කොටස් (Outdoor Units) හොරෙන් ගලවා ගෙන යාම පිළිබඳව, රෝහල තුළ ගාල්කර තිබුණු යතුරුපැදියක් සොරකම් කිරීම පිළිබඳව හා අනවසර රථවාහන රෝහල් පරිශ්‍රය තුළ ගාල් කිරීම් පිළිබඳව වාර්තා වී තිබීමෙන් රෝහලේ භූමි භාගය සහ එහි පිහිටි සියළුම නිශ්චල හා චංචල දේපල සහ වත්කම්වල ආරක්ෂාව නිසිපරිදි නොලැබීමේ තත්ත්වය තවදුරටත් තහවුරු වී තිබුණි.		අංශය පෙර දැනුවත් කර ඇති අතර ඒ සඳහා සිහිකැඳවීම් කළ බව.
	vii. රෝහලට ඉදිරිපත් කරනු ලබන පැමිණීමේ හා පිටවීමේ ලේඛනයට ව්‍යාජ නම් හා අත්සන් ඇතුළත් කිරීම හා ඒ අනුව රෝහල විසින් ගෙවීම් කිරීම මගින් රෝහලේ ආරක්ෂාව සම්බන්ධයෙන් උද්ගතවන කිසියම් ගැටළුවකදී වගකීම් පැවරීමේදී මතුවිය හැකි අවදානම සහ සාවද්‍ය ලෙස නම් සහ අත්සන් සටහන් කර ඒ අනුව රෝහල විසින් වැටුප් ගෙවන ලද පුද්ගලයින් එම කාලය තුළ බාහිර සමාජයේ සිදු කළ හැකි විෂමාචාරයන්ට සම්බන්ධ වූ අවස්ථාවකදී ඒ සඳහා නීතිමය රැකවරණයක් ලැබීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.	-එම-	දැනට 2023 වර්ෂයට අදාළව ඔක්තෝබර් මාසයේ සිට ගෙවීම් අත්සිටුවා ඇති බව, එක් එක් නිලධාරියාගේ සත්‍ය අත්සන ලබාගෙන දැනට රෝහල වෙත ඉදිරිපත් කර පැමිණීමේ ලේඛන රසපරීක්ෂක වෙත යැවීමට කටයුතු කිරීම හා රස පරීක්ෂක වාර්තාවෙන් පසු අදාළ අයකර ගැනීම් සිදුකිරීමට කටයුතු කරන බව.
	viii. ලංසු කොන්දේසි 12.1 ප්‍රකාරව දිනපතා එක් එක් සේවා මුරය ආරම්භ කිරීමට ප්‍රථම ඊළඟ වැඩමුරය සඳහා එක් එක් ස්ථානයේ සේවයේ යොදවනු ලබන ආරක්ෂක නිලධාරීන්ගේ නම් ලැයිස්තුවක් රෝහල් ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු වුවද එවැන්නක්	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	කොන්ත්‍රාත්කරු විසින් 2023 වර්ෂය පුරාවටම සිදුකර නොතිබුණු බවත්, ඒ වෙනුවට අදාළ මුරය අවසාන වීමෙන් පසු ව්‍යාජ නම් ඇතුළත් ලැයිස්තුවක් රෝහල් ප්‍රධානියා වෙත ඉදිරිපත් කර තිබුණු බවත්, ලංසු කොන්දේසි 12.21 පටහැනිව ආරක්ෂක සේවය ආරම්භයේ ඉදිරිපත් කරන ලද නාම ලේඛනයට පරිබාහිරව ආරක්ෂක සේවකයින් 21 දෙනෙකු රෝහල් ප්‍රධානියා දැනුවත් කිරීමකින් තොරව ආරක්ෂක සේවයේ යොදවා තිබුණු බවත්, එය ලංසු කොන්දේසි 12.1 පටහැනිව බවත් නිරීක්ෂණය විය. 2024 පෙබරවාරි 04 වන දින රාත්‍රී මුර සේවයේ යෙදී සිටි නියාමකවරු 03 දෙදෙනකු තම ආයතනයේ හැඳුනුම්පත පැළඳ නොසිටි අතර ඔවුන් සතුව ආයතනයේ හැඳුනුම්පත හෝ ජාතික හැඳුනුම්පත නොතිබුණු බවත් නිරීක්ෂණය විය.		
	ix. ඒ අනුව ගිවිසුම්ගත ආරක්ෂක සේවකයින් සංඛ්‍යාවට වඩා අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබීමත්, ආරක්ෂක සේවකයින් පැය 12 ඉක්මවා අඛණ්ඩව ආරක්ෂක සේවයේ යොදවා තිබීමත්, ව්‍යාජ නම් ඇතුළත් කර සාවද්‍ය ලෙස ආරක්ෂක සේවකයින්ගේ පැමිණීමේ සහ පිටවීමේ ලේඛන සකස් කර රෝහල වෙත ඉදිරිපත් කර තිබීමත් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබෙන මුදල ගණනය කර එය ආපසු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ.	-එම-	-එම-
(ව)	කළුතර ශික්ෂණ රෝහලේ පාලනාධිකාරිය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවන අයුරින් පහත සඳහන් කටයුතු සිදු කර තිබුණි.		
	i. රෝහලේ හෙද නේවාසිකාගාරයේ සහ මුළුතැන්ගෙයි උදුන් 02 ක අළුත්වැඩියා කටයුතු රු.134,225 ක් වැය කර ප්‍රසම්පාදන	-එම-	රෝහලේ හෙද නේවාසිකාගාරයේ සහ මුළුතැන්ගෙයි උදුන් දෙකේ අළුත්වැඩියා

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ක්‍රියාවලියකින් තොරව පෞද්ගලික පාර්ශවයක් ලවා සිදුකර ගෙන තිබුණි.		කටයුතු නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලියන් යටතේ සිදු කර ඇති බව.
	ii. කළුතර ශික්ෂණ රෝහල යටතේ පාලනය වූ අලුත්ගම රෝහලට අයත් අංක LW-0797 දරන ගිලන්රථයේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීමේදී ඉදිරිපත් කර තිබුණු මිල ගණන් අනුව අළුත්වැඩියාවට ලක්විය යුතු වැදගත්ම අංශය ගැන අවධානය යොමු කිරීමකින් තොරව (ධාවනය කරන අවස්ථාවේදී ඇක්සිලේටරය නිසි ලෙස ක්‍රියා නොකිරීම) තාක්ෂණ නිලධාරියාගේ නිර්දේශය මත රු.135,750 ක අවම මිල ඉදිරිපත් කර තිබූ ගරාජය ලවා අළුත්වැඩියාව සිදුකර ගෙන තිබුණද රථයේ දෝෂය යථා තත්ත්වයට පත් වී නොතිබුණි. ඉදිරිපත්කර තිබුණු ලංසු තාක්ෂණික ඇගයීම් කමිටුවකට යොමුකර නිර්දේශ ලබාගෙන ප්‍රසම්පාදන අනුමැතිය මත සාර්ථක ලංසුකරු තෝරා ගැනීමකින් තොරව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තාක්ෂණික නිලධාරියාගේ නිර්දේශය මත කටයුතු කිරීමෙන් මෙම තත්ත්වය ඇති වී තිබුණි.	-එම-	**LW 0797** ගිලන්රථයේ ධාවනය කරන අවස්ථාවේදී ඇක්සිලේටරය නිසි ලෙස ක්‍රියා නොකිරීමේ දෝෂය ඩිසල් පොම්පය අළුත්වැඩියා කිරීමෙන් ඉටු කර ගත යුතු අමතර අළුත්වැඩියාවක් බැවින් ඒ සඳහා වෙන ම මිල ගණන් කැඳවීම සුදුසු බව අදාළ ගරාජ විසින් පැහැදිලි කරන ලද බව, අළුත්ගම රෝහලට මෙම ගිලන්රථය පමණක් ඇති බැවින්, මිල ගණන් ඉදිරිපත් කර ඇති අළුත්වැඩියාවන් පමණක් සිදු කර මෙය ධාවන තත්ත්වයට පත් කළ හැකි බැවින් මෙම අළුත්වැඩියාව කඩිනමින් සිදු කිරීමට ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුවේ එකඟතාවය මත කටයුතු කළ බව.
(ඡ)	කළුතර ශික්ෂණ රෝහලේ 2022/2023 වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		-
	i. කළුතර ශික්ෂණ රෝහලේ පිරිසිදු කිරීමේ සේවාවට අදාළ ලංසු කොන්දේසි ප්‍රකාරව පිරිසිදු කිරීමේ සේවාවට අදාළ එක් එක් අංශ පිරිසිදු කිරීම සඳහා කම්කරුවන් 141 ක් යෙදවිය යුතුව තිබූ අතර, එම ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට 20 ක් වත් පිරිමි කම්කරුවන් යෙදවිය යුතු විය. එසේ වුවද, යොදවා තිබූ සමස්ත කම්කරුවන් ගණන 116 ක් පමණක් වූ අතර එයින් යොදවා තිබූ පිරිමි	කොන්ත්‍රාත් ගිවිසුම පරිදි සේවාව ලබාගැනීමට වහකිව යුතු නිලධාරීන් කටයුතු කළ යුතුය.	ගිවිසුම් අනුව කම්කරුවන් සේවයේ යෙදවිය යුතු බවට අදාල ආයතනය දැනුවත් කර ඇති අතර මේ වන විට පිරිමි සේවකයින් නිවැරදිව සේවයේ යොදවා ඇති බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	කම්කරුවන් ගණන 13 ක් හෙවත් සියයට 11 ක් පමණක් විය. එසේම ලංසු කොන්දේසි ප්‍රකාරව රෝහලේ සේවා අවශ්‍යතාවය අනුව සේවකයන් සැපයීම කොන්ත්‍රාත්කරුගේ වගකීමක් වූවද මෙහිදී එම වගකීම පැහැර හැර ඇති බවත්, එක් එක් අංශ සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව යොදා නොතිබීමෙන් පිරිසිදු කිරීමේ සේවාව නිසි ආකාරයෙන් සිදු නොවීම සම්බන්ධව රෝහල් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.		
	ii. පිරිසිදු කිරීමේ සේවා කොන්ත්‍රාත් ගිවිසුමේ 5.11 වගන්තිය ප්‍රකාරව ගෙවීම් කිරීමේදී කොන්ත්‍රාත්කරු විසින් වැටුප් හා අතිකාල දීමනා ගිවිසුම්ගත ආකාරයෙන්ම තම සේවකයන්ට ගෙවන බවට තහවුරුවක් ලබා දිය යුතු විය. ඒ අනුව කම්කරුවකු සඳහා අවම දෛනික සාමාන්‍ය ශ්‍රම පිරිවැය රු.1,343.50 ක් ගෙවිය යුතු වූවද, කොන්ත්‍රාත්කරු විසින් කම්කරුවෙකුට දිනකට රු.1,000 ක දෛනික වැටුපක් පමණක් ගෙවා තිබුණි. ඒ අනුව 2022 ජූලි සිට 2023 මාර්තු මස දක්වා කාලපරිච්ඡේදය තුළ කම්කරුවන් වෙනුවෙන් සාමාන්‍ය සතියේ දිනවල සපයන ලද සේවය සඳහා රු.53,307,393 ක මුදලක් රෝහල විසින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු විසින් කම්කරුවන් වෙත ගෙවා තිබූ මුදල රු.39,678,000 කට වඩා අඩු මුදලක් විය. ඒ හේතුවෙන් එම මාස 08 ක කාලපරිච්ඡේදය තුළ කම්කරුවන්ගේ සාමාන්‍ය දින වැටුප් වලින් පමණක් රු.13,539,392 කට වඩා වැඩි මුදලක් කොන්ත්‍රාත්කරු විසින් අසාමාන්‍ය ලාභ ලෙස රඳවාගෙන තිබුණු බැව් නිරීක්ෂණය විය.	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු අතර රෝහල විසින් වැඩිපුර ගෙවා ඇති වැටුප් නැවත අයකළ යුතුය.	මෙම කරුණු සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුමේ 5.11 වගන්තිය ප්‍රකාරව ලංසු ලේඛනවල සඳහන් කර ඇති වැටුප් හා අතිකාල දීමනා සේවකයින්ට ගෙවන ලෙස කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇති බව, තවද මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්) සහ අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) දැනුවත් කිරීමට කටයුතු යොදා ඇති බව.
	iii. කම්කරුවන් සඳහා සාමාන්‍ය අතිකාල පැයක පිරිවැය රු.138.75 ක් වුවද කොන්ත්‍රාත්කරු විසින් සාමාන්‍ය අතිකාල පැයකට රු.50 බැහින් පමණක් කම්කරුවන් වෙත ගෙවීම් කර තිබුණි. ඒ අනුව 2022	-එම-	එම

NAOSL
ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வாளர் தலைமையகம்
NATIONAL AUDIT OFFICE

	ජූලි සිට 2023 මාර්තු දක්වා කාලපරිච්ඡේදය සඳහා කම්කරුවන්ගේ සාමාන්‍ය අතිකාල ගෙවීම් ලෙස රු.4,586,242 ක් රෝහල විසින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු විසින් කම්කරුවන් වෙත සාමාන්‍ය අතිකාල ලෙස ගෙවා තිබුණේ රු.1,652,700 ක මුදලක් පමණි. ඒ හේතුවෙන් රු.2,933,542 ක මුදලක් අසාමාන්‍ය ලාභ ලෙස කොන්ත්‍රාත්කරු විසින් රඳවාගෙන තිබුණි.		
	iv. ලංසු ලේඛන ප්‍රකාරව වැඩ පරීක්ෂකවරයෙකු සඳහා අවම දෛනික සාමාන්‍ය ශ්‍රම පිරිවැය රු.1,546.55 ක් ගෙවිය යුතු වුවද ප්‍රධාන වැඩ පරීක්ෂක සඳහා පමණක් රු.1,790 ක මුදලක් ගෙවා තිබුණු අතර අනෙකුත් වැඩ පරීක්ෂකවරුන් 05 දෙනා සඳහා රු.1,100 ක් බැගින් වූ දෛනික වැටුපක් ගෙවන බව අනාවරණය විය. ඒ අනුව වැඩ පරීක්ෂකවරුන් 05 දෙනා වෙත වැටුප් ගෙවීමේදී ගෙවිය යුතු දෛනික වැටුපට වඩා රු.446.55 ක් අඩුවෙන් ගෙවා තිබූ අතර, 2022 ජූලි සිට 2023 මාර්තු දක්වා කාලපරිච්ඡේදය තුළ වැඩ පරීක්ෂකවරුන්ගේ සාමාන්‍ය දින වැටුප් ගෙවීම් වලින් රු.536,118 ට ආසන්න මුදලක් කොන්ත්‍රාත්කරු විසින් රඳවාගෙන තිබුණි.	-එම-	එම
	v. ලංසු ලේඛන අනුව වැඩ පරීක්ෂකවරයෙකු සේවයේ යෙදෙන සාමාන්‍ය අතිකාල පැයක් සඳහා රු.157.50 ක් ගෙවිය යුතු වුවද, 2022 ජූලි සිට 2023 මාර්තු දක්වා කාලපරිච්ඡේදය සඳහා අතිකාල පැය 1,617 ක් සේවයේ යෙදීම වෙනුවෙන් රු.254,677 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණ ද කොන්ත්‍රාත්කරු විසින් වැඩ පරීක්ෂකවරුන් වෙත එසේ අතිකාල ගෙවීමක් සිදු නොකර එම මුදල කොන්ත්‍රාත්කරු විසින් ලබාගෙන තිබුණි.	-එම-	එම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	vi. ලංසු කොන්දේසි ප්‍රකාරව විශේෂයෙන්ම පෝය නිවාඩු හා ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි සේවකයන්ගේ අමතර සේවයේ යෙදීම වෙනුවෙන් පඩිපාලක සභා විධිවිධානයන්ට අනුකූලව ශ්‍රම පිරිවැය ගණනය කර ඇති අතර, ඊට අනුව වැඩ පරීක්ෂකවරුන්ට හා කම්කරුවන්ට විශේෂ අතිකාල පැයක් සඳහා ශ්‍රම පිරිවැය ලෙස පිළිවෙලින් රු.210 ක් හා රු.185 ක් වශයෙන් ගෙවිය යුතු විය. එසේ වුවද 2022 ජූලි මස සිට 2023 මාර්තු දක්වා කාලපරිච්ඡේදය සඳහා විශේෂ අතිකාල පැය 27 ක් හා පැය 648 ක් වෙනුවෙන් රු.5,670 ක් හා රු.119,880 ක් වශයෙන් එකතුව රු.125,550 ක මුදලක් රෝහල විසින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණ ද කොන්ත්‍රාත්කරු විසින් වැඩ පරීක්ෂකවරුන්ට හා කම්කරුවන්ට එසේ විශේෂ නිවාඩු අතිකාල පැය සඳහා ගෙවීම් කර නොමැති බව අනාවරණය විය. ඒ අනුව පඩිපාලක සභා තීරණයන් අනුව ගෙවිය යුතු විශේෂ නිවාඩු අතිකාල දීමනා, අදාළ වැඩ පරීක්ෂකයන් හා කම්කරුවන්ට නොගෙවා එම මුදල් කොන්ත්‍රාත්කරු විසින් ලබාගෙන තිබුණි.	-එම-	එම
	vii. පිරිසිදු කිරීමේ සේවා කොන්ත්‍රාත් ගිවිසුමේ 5.13 (v) වගන්තිය ප්‍රකාරව මාසිකව අවශ්‍ය වන උපකරණ හා රසායනික ද්‍රව්‍ය ප්‍රමාණයන් සෑම මසකම රෝහල මගින් දැනුම් දෙන ලද දිනයේ ආසාදන පාලන ඒකකයේ හෙද නිලධාරීන්ට හෝ ආසාදන පාලන ඒකකය භාර නිලධාරියෙකුට ඉදිරිපත් කර එය නිවැරදි බවට ලොග් සටහන් පවත්වා ගත යුතු විය. තවද, එසේ නොකිරීම වෙනුවෙන් අදාල මාසය සඳහා රු.2,500 ක අතිරේක පිරිවැයක් ද, ඒ වෙනුවෙන් රෝහලට අමතර පිරිවැයක් දැරීමට සිදුවූවහොත් එම මුදල හා සියයට 25 ක අතිරේක පිරිවැයක් ද කොන්ත්‍රාත්කරුගෙන් අය කිරීමට ආයතන ප්‍රධානියා කටයුතු කළ යුතු බව දක්වා ඇත. නමුත් මෙම පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා උපකරණ සෑම මසකම වරින් වර කොටස් වශයෙන් අවස්ථා	කොන්ත්‍රාත් ගිවිසුම පරිදි සේවාව ලබාගැනීමට වහකිව යුතු නිලධාරීන් කටයුතු කළ යුතුය.	පිරිසිදු කිරීමේ සේවාව සපයන ආයතනය විසින් ඔවුන්ට පවතින ලොරි රථය කුඩා එකක් බැවින් මාසිකව අවශ්‍ය උපකරණ හා රසායන ද්‍රව්‍ය කිහිප විටක දී රෝහල වෙත රැගෙන විත් භාර දෙනු ලබන බව, එහෙත් මෙම භාණ්ඩ සැපයිය යුතු නියම දිනට පෙර ලබා දී අවසන් කරන බැවින් දඩ මුදල් අය කරයුතු නොවන බව, මාසිකව අවශ්‍ය භාණ්ඩ සැපයූ පසු එම මුළු ප්‍රමාණයන් ලේඛනගත කිරීමට කටයුතු කර ඇති බව.

	03 කදී පමණ රැගෙන විත් තිබූ අතර, එම ද්‍රව්‍ය හා උපකරණ වලට අදාළ නිකුත් කිරීමේ ඇණවුම් ගබඩා භාරකරු වෙත ලබා දීම පසු දිනක සිදුකර තිබුණි. එනම්, ද්‍රව්‍ය හා උපකරණ භාරදෙන අවස්ථාවේදී එම ප්‍රමාණයන් නිවැරදි බවට තහවුරුවක් ලබාගෙන නොතිබූ අතර, ඒ වෙනුවෙන් උක්ත පරිදි දඩ මුදල් අයකිරීමටද කටයුතු කර නොතිබුණි.		
	viii. ලංසු කොන්දේසි ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලබාගත් තත්ත්ව සහතිකය (SLS) හෝ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ප්‍රමිතිය (SLS Standards) ට අනුකූල බවට කාර්මික තාක්ෂණ ආයතනය (ITI) මගින් සහතික ලත්, අඩංගු රසායනික ද්‍රව්‍ය සංයුතිය හා ප්‍රමාණය ඇසුරුමෙහි විධිමත් පරිදි සඳහන් කළ යුතු විය. එසේම විවෘත නොකරන ලද ඇසුරුම් කර මුද්‍රා තබන ලද රසායනික ද්‍රව්‍ය සැපයිය යුතු වූවත්, කොන්ත්‍රාත් ආයතනය විසින් රෝහලට සපයා තිබුණු පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය අඩංගු ඇසුරුම් ශ්‍රී ලංකා ප්‍රමිතිය සහතික කරන ලද විවෘත නොකරන ලද වෙළඳපොල ඇසුරුම් නොවීය. එසේම එම ඇසුරුම් මුද්‍රා තබන කම්බියක් ආධාරයෙන් මුද්‍රා තබා තිබුණද ඒවා වෙළඳපොලේ ඇති විවෘත නොකරන ලද මුද්‍රා තැබූ ඇසුරුම් ලෙස සැලකිය නොහැකිය. එසේම ITI ආයතනය මගින් සහතික ලත්, අඩංගු රසායනික ද්‍රව්‍ය සංයුතිය හා ප්‍රමාණය ඇසුරුමෙහි විධිමත් පරිදි සඳහන් කර නොතිබුණි. තවද රසායනික ද්‍රව්‍ය සැපයීමෙන් පසු හිස්වන බහාලුම් දිගින් දිගටම ආපසු කොන්ත්‍රාත්කරු විසින් රැගෙන ගොස් නැවත එම බහාලුම් වලටම පුරවන ලද රසායනික ද්‍රව්‍ය සැපයීමට ඉඩ දී තිබීම ප්‍රමිතියෙන් තොර හා තත්ත්වයෙන් බාලකරන ලද රසායනික ද්‍රව්‍ය සැපයීමට රෝහල විසින්ම අවස්ථාව සලසා දීමක් විය.	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර ප්‍රමිතියෙන් තොර රසායනික ද්‍රව්‍ය භාවිතයට අවස්ථාව ලබාදුන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	රසායන ද්‍රව්‍ය නියමිත ප්‍රමිතියට නොමැති බව දැන ගත් පසු ඒ සඳහා ගෙවීම් කිරීම නතර කර ප්‍රමිතියෙන් යුතු රසායන ද්‍රව්‍ය සෘජුව රෝහල විසින් මිල දී ගැනීමට කටයුතු කරන ලද බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ix. 2022 ජූලි 01 සිට 2023 ජුනි 30 දක්වා කාලපරිච්ඡේදය පුරාම ඉහත අඩුපාඩු සහිතව රසායනික ද්‍රව්‍ය සපයා තිබූ අතර, වරින් වර රෝහලේ ආසාදන පාලන ඒකකය විසින් ද රසායනික ද්‍රව්‍යවල ඇතැම් අඩුපාඩු පෙන්වා දී තිබියදීත් රෝහලේ පරිපාලනය විසින් ලංසු කොන්දේසිවල සඳහන් ආකාරයට ප්‍රමිතියෙන් යුත් රසායනික ද්‍රව්‍ය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබූණු බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
	x. රෝහල වෙත පිරිසිදු කිරීමේ සේවය සැපයීමේදී නියමිත ප්‍රමිතියට අනුව පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය සපයනු ලබන බවට ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් එකඟ වී තිබූ අතර, එසේම ඒ පිළිබඳව රෝහල විසින්ද අධීක්ෂණය කරන බව දක්වා තිබුණි. එසේ වූවද කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය අවසාන වන තෙක්ම එම රසායන ද්‍රව්‍ය සාම්පල් වරින් වර ITI ආයතනය වෙත ඉදිරිපත් කොට නියමිත ප්‍රමිතියෙන් යුතු බවට තහවුරු කර ගැනීමට අවශ්‍ය කටයුතු රෝහල් පරිපාලනය විසින් සිදු කර නොතිබුණි. කෙසේ වූවද විගණන පරීක්ෂාවෙන් පසු 2023 අගෝස්තු 15 දින සිදුකරන ලද සාම්පල් 06 කට අදාළ පරීක්ෂාවේදී එම සාම්පල් 06 ම නියමිත ප්‍රමිතියට නොමැති බව ITI ආයතනයෙන් තහවුරු කර තිබුණි. නියමිත ප්‍රමිතියෙන් තොර, සපයන ලද රසායන ද්‍රව්‍ය වෙනුවෙන් සැපයුම්කරු වෙත 2022 ජූලි සිට 2023 මාර්තු දක්වා ගෙවා තිබූණු රු.3,023,405 ක මුදල විගණනයෙන් පෙන්වා දුන් පසු කොන්ත්‍රාත්තරුගෙන් අයකරගෙන තිබුණද මෙම කාලපරිච්ඡේදය තුළ සෞඛ්‍ය ආරක්ෂිත පිරිසිදු කිරීමේ සේවාවක් රෝහල වෙත ලැබී නොමැති බව මේ අනුව තහවුරු වේ.	-එම-	-එම-
(ජ)	මාතර මහ රෝහලේ 2022 හා 2023 වර්ෂවල ආපනශාලාව බදු දීම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	i. 2022 මාර්තු 15 දිනැති ප්‍රසම්පාදන තීරණය අනුව පළමු ලංසුකරුට ටෙන්ඩරය පිරිනැමීමට තීරණය කර තිබුණ ද එකී ලංසුකරු ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් දෙවන ලංසුකරු තෝරාගෙන තිබුණු අතර දෙවන ලංසුකරු විසින් ද ලංසු මිල ගෙවීම ප්‍රතික්ෂේප කිරීම නිසා දිනකට රු.10,000 ක් වූ අවම මිලකට ටෙන්ඩරය පිරිනැමීමට ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව ලංසු මිල ගණන් සියලු ලංසුකරුවන් ප්‍රත්ක්ෂේප කර තිබියදී නැවත මිල ගණන් කැඳවා රජයට වඩා වාසිදායක සුදුසු සැපයුම්කරුවෙකු තෝරාගැනීමට කටයුතු නොකර 2022 අප්‍රේල් 01 සිට 2022 අගෝස්තු 31 දක්වා පළමු හා දෙවන ලංසුකරුවන්ගේ වාර්ෂික බදුකුලී වටිනාකමට වඩා පිළිවෙළින් රු. 1,710,000 ක් සහ රු.900,000 ක් වූ අඩු වටිනාකමකට ආපනශාලාව බදු දීම හේතුවෙන් සමාන වටිනාකමින් රජයේ ආදායම් අහිමි කර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	රජයට උපරිම වාසිදායක වන පරිදි හා තරහකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කර ආපනශාලා කුලියට දිය යුතුය.	2022.04.01 දින සිට වසරක කාලයක් වෙනුවෙන් පුද්ගලයෙකු හට ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව මගින් තීරණය කොට තිබුණු බව, නමුත් එම කාලය වන විට රට තුළ පැවති මහත් වූ ව්‍යාකූල තත්ත්වයන් යටතේ පළමුවන ලංසුකරු විසින් කර ඇති ඉල්ලීමට අනුව ඔහුගේ ලංසු අයදුම්පත ප්‍රතික්ෂේප කර දෙවන අයදුම්කරු විසින් කර ඇති ඉල්ලීමට අනුව දිනකට රු.8,000 ක මුදල වෙනුවට දිනකට රු. 10,000 ක කුලියක් ගෙවීමේ පදනම මත 2023.04.01 දින සිට රට තුළ පවතින අවිනිශ්චිත තත්ත්වය සමනය වන තෙක් ආපනශාලාව පවත්වාගෙන යාමට ඇගයීම් කමිටුව නිර්දේශ කරන ලද බව, ඒ අනුව එකී තත්ත්වය සමනය වී රට සාමාන්‍ය තත්ත්වයට පත් වෙමින් පවතින බැවින් 2023.08.31 දින නැවත මිල ගණන් කැඳවා නව ගිවිසුමක් අත්සන් කර ඇති බව.
	ii. ලංසු කැඳවීමේ ලේඛන අනුව "ගිවිසුම් අත්සන් කිරීම පැහැර හරින අයදුම්කරුවන්ගේ ලංසු ඇපකරය රාජසන්තක කර එම අයදුම්කරුවන්ගේ නම් රජයේ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට නියම කරනු ලැබේ" යන්න සඳහන් වූවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, පළමු ලංසුකරුගේ රු.200,000 ක් වූ ලංසු ඇපකරය රාජ්‍ය ආදායමට බැර නොකර 2022 ඔක්තෝබර් 09 වන	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය.	පළමුවන ලංසු අයදුම්කරු විසින් ගිවිසුම අත්සන් කිරීම පැහැර හැරීමක් සිදුකර නොමැති අතර ලංසු ඇපකරය නිදහස් කර දෙන ලෙස ඉල්ලීමක් සිදු කර තිබුණු බව, එවකට රට තුළ පැවැති අර්බුදකාරී තත්ත්වය හා මහජනතාව පත්ව ඇති ආර්ථික අපහසුතාවයන් සැලකිල්ලට ගෙන ලංසු

	දින සැපයුම්කරුට අවධිමත් ලෙස නිදහස් කර තිබුණි. ඒ අනුව රෝහලේ වගකිව යුතු නිලධාරීන් විසින් ප්‍රම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.		අයදුම්කරුගේ කාරුණික ඉල්ලීම සලකා බලා ලංසු ඇපකරය නිදහස් කිරීමට කටයුතු කළ බව.
	iii. 2022 අගෝස්තු මාසයට අදාළ ආපනශාලා කුලීය රු.310,000 ක් වර්ෂයක කාල පමාවකින් පසුව ආපනාශාලා හිමිකරුගෙන් අයකර ගෙන තිබුණි.	-එම-	2022 අගෝස්තු මාසයට කුලිය හා ජල ගාස්තුව අතපසුවීමකින් අයකර ගැනීමට ප්‍රමාද වී තිබූ අතර සැපයුම්කරු විසින් අධ්‍යක්ෂ, මහ රෝහල නමට තැන්පත් කර තිබූ රු.300,000 ක මුදල ඒ සඳහා පවරා ගනීමට කටයුතු කිරීමට නියමිතව තිබුණු බව, කෙසේ වෙතත් මේ වන විට අය වීමට නියමිතව තිබූණු මුදල අයකරගෙන රජයේ ආදායමට බැර කර ඇති බව.
(ට)	ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ විද්‍යුත් අංශයට Patient Monitors සඳහා වටිනාකම රු.24,520,000 ක් වූ SP02 Sensors අයිතම 4,000 ක අමතර කොටස් උපාංග ප්‍රසම්පාදනයේදී ලංසු කොන්දේසි 3.7 ට අනුව ලංසුකරුවන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ලබාගෙන තිබිය යුතු වූවත් එසේ ලියාපදිංචි සහතිකය නොමැති ලංසුකරුවන් තිදෙනෙකුගෙන් සාම්පල කැඳවා ලංසු ඇගයීම සිදුකර ලියාපදිංචි සහතිකය නොමැති ලංසුකරුවකුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7, 7.8.6, හා 7.11 ට අනුකූලවද කටයුතු කර නොතිබුණි.	-එම-	වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේදී අදාළ වෛද්‍ය උපකරණ සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය තිබුණද අමතර කොටස් හා උපාංග සඳහා වෙන වෙනම සහතික ලබා දී නැති බව, එම නිසා අදාළ ඇගයීමේදී ලංසුකරුවන් විසින් අමතර කොටස් හා උපාංගවලටම අදාළ වන සහතික ඉදිරිපත් කර නොතිබූ බැවින් ඇගයීම් කටයුතු වලදී එය නොසලකා හැර අදාළ උපාංග මත ඇගයීම කරන ලද බව, එලෙසම අමතර කොටස් හා උපාංග භාවිතය සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් පැන නැගී නැති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வுப் அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඨ)	ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් වටිනාකම රු.7,300,000 වූ NIBP Cuffs 4000 ක් ප්‍රසම්පාදනයේදී ලංසු කැඳවීම් ලේඛනයේ කොන්දේසි අංක 3.7 ට අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි (NMRA) සහතිකය අවශ්‍යතාවය දක්වා තිබුණු අතර ලැබුණු ලංසු 11 න් ලංසු 04 ක් NMRA ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් විය. ලංසු ඇගයීම සඳහා එක් NMRA සහතිකයක් ඇති ලංසුකරුවෙකු සමඟ 5 දෙනෙකුගෙන් සාම්පල් කැඳවා තිබුණි . ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.7 ට හා 7.9.1 ට අනුකූල නොවන ලෙස ලංසු ඇගයීම් සිදුකර තිබුණු අතර ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය නොතිබුණු ලංසුකරුවකුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.	-එම-	-එම-
(ඩ)	ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් වටිනාකම රු.1,450,000 ක්වූ Infusion Pumps සඳහා අමතර කොටස් උපාංග ප්‍රසම්පාදනයේදී තෝරාගත් ලංසුකරු ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 82 වගන්තිය අනුව NMRA සහතිකයක් ලබාගෙන නොතිබුණු අතර ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7, 7.8.6, හා 7.11 ට අනුකූලව කටයුතු කර නොතිබුණි.	-එම-	-එම-
(ත)	ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ විද්‍යුත් අංශයට අදාළ වෛද්‍ය උපකරණ නඩත්තුව සඳහා උපාංග අමතර කොටස් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදි පහත දැක්වෙන කරුණු නිරීක්ෂණයන් විය.		-
	i. ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 82 වගන්තියට අනුව වෛද්‍ය උපකරණ සඳහා අමතර කොටස් උපාංග ආනයනය කිරීමට බලපත්‍රයක් ලබා ගත යුතුය. වටිනාකම රු.3,702,675 ක්වූ Patient Monitors සඳහා Nibp Pumps ප්‍රසම්පාදනයේදී ලංසු කොන්දේසිවල ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකයේ	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	අවශ්‍යතාවය දක්වා නොතිබුණි. කෙසේ වුවත් සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් විවිධ සන්නම් නාම යටතේ මිලදී ගත් Nibp Pumps 150 ක් සඳහා NMRA ලියාපදිංචි සහතිකය නොතිබුණි.		
	ii. වටිනාකම රු.21,300,000 ක් වූ Patient Monitors සඳහා Etoc2 Sensor සන්නම් නාම තුනක් යටතේ ඒකක 120 මිලදී ගැනීමේදී ලංසු කොන්දේසි 3.7 වගන්තියට අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරී සහතිකය (NMRA) ලබාගත යුතු බව දක්වා තිබුණද ලංසු ඇගයීමේදී එම සහතිකය නොමැති ලංසුකරුවන් ඇගයීමට ලක් කර තිබුණු බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.7 ට අනුකූල නොවූ අතර ලංසුව ප්‍රදානය කර තිබූ ලංසුකරුට ජාතික ඖෂධ නියාමන අධිකාරී සහතිකය නොතිබුණි.	-එම-	-එම-
	iii. ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ විද්‍යුත් අංශයට අවශ්‍ය වන අමතර කොටස් උපාංග ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.5 ට අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් නොකර විද්‍යුත් අංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරුවරයාගේ නිර්දේශයට අනුව ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය ලබා දී තිබුණි. අවස්ථා 12 කට අදාළ වටිනාකම රු.44,365,447 අමතර කොටස් උපාංග ප්‍රසම්පාදන තනි නිලධාරියකුගේ අභිමතය පරිදි මිලදී ගැනීම සඳහා වූ නිර්දේශයට ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දීම සිදුකර තිබුණි.	-එම-	විගණන විමසුමේ සඳහන් කරුණු සමඟ එකඟ වන අතර වර්තමානය වන විට සියළුම ඇගයීම් කටයුතු විධිමත් පරිදි තාක්ෂණික ඇගයීම් කමිටුවක් හරහා සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව.
(ඇ)	2022 හා 2023 වර්ෂවල දී දේශීය මිලදී ගැනීම් යටතේ කරාපිටිය ශික්ෂණ රෝහල විසින් වට්ටෝරු කමිටු අනුමැතිය නොලත් (Non Formulary) රු.763,748 ක වටිනාකමින් යුත් අයිතම 03 ක ඒකක 890 ක් මිලදී ගෙන තිබුණි.	විධිමත් අනුමැතිය සහිත වෛද්‍ය සැපයීම් පමණක් මිලදී ගත යුතුය.	2022 හා 2023 වර්ෂ වලදී දේශීය මිලදී ගැනීම් යටතේ වට්ටෝරු කමිටු අනුමැතිය නොලත් අයිතම (Non-formulary item) 2ක් අවස්ථා තුනකදී වෛද්‍ය සැපයුම් අංශයේ නිර්දේශය සහිතව ආයතනික වට්ටෝරු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			කමිටු අනුමැතිය නොලත් අයිතම සඳහා පත්කළ විශේෂඥ කමිටුවේ සහ ආයතනික ඖෂධ සමාලෝචන කමිටුවේ අනුමැතිය සහිතව මිලදී ගෙන රෝගීන් සඳහා නිකුත් කර ඇති බව.
(ද)	2023 වර්ෂය වෙනුවෙන් මහරගම අපේක්ෂා රෝහල සඳහා පිරිසිදු කිරීමේ සේවා සපයා ගැනීමේදී, රසායි වෛද්‍ය සංකීර්ණය හැර අපේක්ෂා රෝහල සහ රසායි වෛද්‍ය සංකීර්ණය වශයෙන් කොන්ත්‍රාත් දෙකකට බෙදා වෙන වෙනම ප්‍රසම්පාදන කටයුතු සිදුකර කොන්ත්‍රාත් දෙකම එකම පිරිසිදු සේවා සැපයුම්කරුවකු වෙත ලබා දී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව පිරිසිදු කිරීමේ සේවාව රෝහල වෙත ලබා ගෙන තිබේදැයි යන්න පිළිබඳව සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහතින් දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. සම්පූර්ණ රෝහල සඳහා පිරිසිදු කිරීමේ සේවා සැපයීම එක් කොන්ත්‍රාත්තුවක් ලෙස ගෙන ප්‍රසම්පාදන කටයුතු සිදු කළ හැකිව තිබියදී 2019 වර්ෂයේ සිට රසායි වෛද්‍ය සංකීර්ණය හැර අපේක්ෂා රෝහල සහ රසායි වෛද්‍ය සංකීර්ණය වශයෙන් කොන්ත්‍රාත් දෙකකට බෙදා වෙන වෙනම ප්‍රසම්පාදන කටයුතු සිදුකර කොන්ත්‍රාත් දෙකම එකම කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනමා තිබුණි. මෙලෙස කටයුතු කිරීම නිසා කොන්ත්‍රාත් දෙක වෙනුවෙන් වෙන වෙනම පොදුකාර්ය පිරිවැය දැරීමට සිදුකර තිබුණු අතර වළක්වාගත හැකිව තිබුණු පොදුකාර්ය පිරිවැය කොටසක් එලෙස වළක්වා ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය.	රසායි වෛද්‍ය සංකීර්ණයේ පවිත්‍රතා සේවය සැපයීම ආරම්භයේදී ඒ සඳහා ආධාර සැපයූ ආයතනය මගින් පහසුකම් සැලසීමෙන් මෙම සේවාව සිදුකර ඇති බව, පසුව, ආධාර සැපයූ ආයතනය රසායි ආයතනයේ පරිපාලන කටයුතු රෝහල වෙත පැවරීමෙන් අනතුරුව එම සංකීර්ණයේ පවිත්‍රතා සේවය සැපයීම සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකු පත් කරගෙන ඇති බව, ඒ අනුව, රසායි සංකීර්ණය සහ අපේක්ෂා රෝහලේ පවිත්‍රතා සේවය සැපයීමට අදාළ කොන්ත්‍රාත්තු මාස 06 ක කාල පරාසයක් සහිතව ක්‍රියාත්මක වූ හෙයින් වෙන වෙනම ප්‍රසම්පාදන කටයුතු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			සිදුකර කොන්ත්‍රාත් ප්‍රදානයන් සිදුකර ඇති බව, කෙසේ වූවද, මින් ඉදිරියට මෙම ඒකක 02 කම එකම කොන්ත්‍රාත්තුවක් යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමට තීරණය කර ඇති බව.
	ii. රසායි වෛද්‍ය සංකීර්ණය හැර අපේක්ෂා රෝහලේ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා 2021/2022 ලංසු ලේඛන මගින් හඳුනාගෙන තිබුණු මුළු ශ්‍රම පිරිවැයෙන් සියයට 15 ක් වූ පොදුකාර්ය පිරිවැය සීමාව රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ පසුව සියයට 25 දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන සී2 කමිටු විසින් ඉහල දමා තිබුණ ද, ආර්ථික අර්බුදය හමුවේ කොන්ත්‍රාත්කරුවන්ගේ පොදුකාර්ය පිරිවැය කොපමණ ප්‍රමාණයකින් වැඩි වන්නේද යන්න ඇගයීමක් සිදුකර නොතිබුණි.	-එම-	සේවක නඩත්තුව සඳහා වන පිරිවැය, කාර්යාල නඩත්තුව, මාසිකව/වාර්ෂිකව සැපයිය යුතු උපකරණ පිරිවැය සහ වෙනත් පිරිවැය (මෙම පිරිවැය කොන්ත්‍රාත්කරුගෙන් කොන්ත්‍රාත්කරුට වෙනස් වේ) ආදි පිරිවැය සංරචක වලින් පොදුකාර්ය පිරිවැය සමන්විත වේ. මෙම සමහර පිරිවැය සංරචක (උදා - බදු ආදිය) විගණනය දක්වා ඇති පරිදි මූලාශ්‍ර මගින් තහවුරු කළහැකි වූවත්, බොහෝ පොදු පිරිවැය සංරචක (උදා - උපකරණ වල ක්ෂයවීම්, නඩත්තු පිරිවැය සහ ක්‍රියාත්මක කිරීමේ පිරිවැය) එසේ මූලාශ්‍ර මගින් තහවුරු කළ නොහැකි නිසා සමස්ත පොදුකාර්ය පිරිවැය මූලාශ්‍ර මගින් තහවුරු කළ යුතුයැයි දැක්වීම ප්‍රායෝගික නොවේ. තවද, මෙලෙස තහවුරු කළ නොහැකි පිරිවැයන් පිළිබඳව ප්‍රමාණාත්මක ඇගයීමක් සිදු කිරීමද ඉතා අපහසු කාර්යයකි. කෙසේ වූවද, විගණනයේ නිරීක්ෂණය පිළිබඳව අවධානය යොමු කොට මූලාශ්‍ර මගින් තහවුරු කළ හැකි පොදුකාර්ය පිරිවැය සංරචක එසේ තහවුරු

ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வுத் திணைக்களம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			කර ගැනීමෙන් අනතුරුව පමණක් ගෙවීම් සිදු කෙරෙන බවට වන කොන්දේසි ඉදිරියේදී කොන්ත්‍රාත් ගිවිසුම් වලට ඇතුළත් කරනු ඇත. ඒ අනුව, මූලාශ්‍ර මගින් තහවුරු කරගත හැකි පොදුකාර්ය පිරිවැය සංරවක සඳහා එසේ තහවුරු කර ගැනීමෙන් අනතුරුව පමණක් ගෙවීම් කිරීමට ඉදිරි කොන්ත්‍රාත්තු වලදී අවකාශ සැලසෙනු ඇත.
	iii. මුළු පොදුකාර්ය පිරිවැය සීමාව සියයට 25 දක්වා ඉහළ දමා තිබුණද වැඩිවන පොදුකාර්ය පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් මූලාශ්‍ර ලේඛන මගින් තහවුරු කළ යුතු වන බවට කොන්දේසියක් ලංසු ලේඛනවලට ඇතුළත් නොවීම නිසා කොන්ත්‍රාත්කරු විසින් පොදුකාර්ය පිරිවැය යටතේ සේවක නඩත්තුව සහ මාසිකව/වාර්ෂිකව සැපයිය යුතු උපකරණ වෙනුවෙන් පෙර වර්ෂයේ පිරිවැයට වඩා පිළවෙලින් සියයට 280 සහ සියයට 146 ක පිරිවැය වැඩිවීමක් සහිතව මිල ඉදිරිපත් කරන අතරතුර වෙන් වෙන්ව සඳහන් නොකළ වෙනත් පොදුකාර්ය පිරිවැය සඳහා පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 1027 ක පිරිවැය වැඩි කිරීමක් සහිතව මිල ඉදිරිපත් කිරීමට ඉඩ සලසා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවීමක් සිදුකර තිබෙනම් එම මුදල ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතු බවට නිරීක්ෂණය කෙරේ.	-එම-	-එම-
	iv. පිරිසිදු කිරීමේ සේවාව සැපයීමේ ලංසු ලියවිලිවල II කොටස ලංසු දත්ත පත්‍රිකාවේ ITB 11.1 (ඉ) (j) වගන්තිය ප්‍රකාරව පිරිසිදු කිරීමේ සේවය සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය නිසි ප්‍රමිතියක් ඇති බවට සහතිකයක් පිළිගත් ආයතනයකින් ලබා ගෙන ඉදිරිපත් කළ යුතු	-එම-	පිරිසිදු කිරීමේ සේවාව සැපයීම සඳහා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන රසායන ද්‍රව්‍ය ඇතුළු විවිධ ද්‍රව්‍ය සඳහා වෙන වෙනම ප්‍රමිතීන් පරීක්ෂා කිරීම සඳහා අදාළ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	වූවත් කොන්ත්‍රාත්කරු විසින් ලංසු ලේඛන ප්‍රකාරව සැපයිය යුතු රසායන ද්‍රව්‍ය වර්ග 12 න් 4 ක් සඳහා පමණක් රසායනාගාර වාර්තා ඉදිරිපත් කර තිබුණු අතර සෝදන කුඩු සඳහා ඉදිරිපත් කර තිබුණු රසයනාගාර වාර්තාව 2018 වර්ෂයේදි ලබා ගන්නා ලද පැරණි එකක් විය. එසේම Disinfectant Cleaner යන රසායන ද්‍රව්‍ය වර්ගය සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු රසායනාගාර වාර්තාව කුමන වෙළඳ නාමයකට අදාළව ඉදිරිපත් කර තිබුණු වාර්තාවක්ද යන්න තහවුරු කර ගෙන නොතිබුණි.		රසායන වාර්තා ලබා ගැනීම සහ ප්‍රමිතිය සඳහා ඉදිරිපත් කරන සහතිකවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම කල්ගත වන, සංකීර්ණ සහ අපහසු කටයුත්තක් වී ඇති බව, තවද, ලංසුව ඉදිරිපත් කරන අවස්ථාවේදී ඉදිරිපත් කරන වෙළඳ නාමයන් කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කරන අවස්ථාවේදී සපයා ගැනීමේ දුෂ්කරතාද මතුවිය හැකි බව, ඒ අනුව, ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී සැපයීමට බලාපොරොත්තු වන ද්‍රව්‍ය සියල්ල 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන පිරිවිතර වලට අනුකූල ප්‍රමිතිගත තත්ත්වයන් සහිත අදාළ ද්‍රව්‍ය පමණක් සැපයිය යුතු වන බවට කොන්ත්‍රාත් කොන්දේසි වලට ඇතුළත් කරන බව, ඒ අනුව, පනතේ නියෝග වලට අනුකූල වෙළඳපොළෙහි ලබාගත හැකි ප්‍රමිතිගත රසායනික ද්‍රව්‍ය පමණක් සපයා ගැනීම මගින් කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සඳහා රෝහල් විසින් කටයුතු කරනු ඇති බව.
	v. මෙලෙස සැපයිය යුතු රසායන ද්‍රව්‍ය සඳහා රසායනාගාර වාර්තා සපයා නොතිබිය දී සහ ඉදිරිපත් කරන ලද රසායනාගාර වාර්තා අනුව සැපයීමට එකඟවන රසායන ද්‍රව්‍ය වර්ග 4 න් 3 ක් ම නිසි ප්‍රමිතියකින් තොර ඒවා බවට තහවුරු වී තිබියදී, සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන සී 2 කමිටුව විසින් මෙම කොන්ත්‍රාත්කරුව සාරානුකූල ලංසුකරුවකු	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ලෙස තෝරා ගෙන තිබුණි. මෙම තත්ත්වය අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව වගකීම් විරහිතව හා නොසැලකිලිමත්ව කටයුතු කිරීමක් බවට විගණනයේදී නිරීක්ෂණය විය.		
	vi. මේ පිළිබඳව විගණනය විසින් පෙන්වා දීමෙන් අනතුරුව රෝහල විසින් පවිත්‍රතා සේවා සපයන ආයතනය විසින් සපයා තිබුණු රසායනික ද්‍රව්‍ය වර්ග 9 ක් සම්බන්ධයෙන් 2024 මාර්තු මස කාර්මික තාක්ෂණ ආයතනය වෙතින් ප්‍රමිතිය පිළිබඳ පරීක්ෂාවක් සිදුකරවා ගෙන පරීක්ෂණ වාර්තා ලබාගෙන තිබුණි. ඉන් රසායනික ද්‍රව්‍ය වර්ග 6 ක්ම ප්‍රමිතියේ පරාමිතික අගයන්ට අනුකූල වී නොතිබුණු අතර ඉතිරි රසායනික ද්‍රව්‍ය වර්ග 3 සම්බන්ධයෙන් ලබාගෙන තිබුණු රසායනාගාර වාර්තාවල ප්‍රමිතියේ පරාමිතික අගයන් දක්වා නොතිබුණු බැවින් එම රසායනික ද්‍රව්‍ය වර්ග 3 ප්‍රමිතියට අනුකූල වී තිබේද යන්න තහවුරුවක් නොවීය. එසේම ලංසු ලේඛන සමඟ ඉදිරිපත් වූ රසායනාගාර වාර්තා අනුව ප්‍රමිතියට අනුකූල නොවුණු Toilet Comed Cleaner සහ Dish wash Powder යන රසායනික ද්‍රව්‍ය වර්ග 2 කද ප්‍රමිතියට අනුකූල නොමැති බව තවදුරටත් 2024 මාර්තු මස සිදුකර තිබුණු රසායනාගාර වාර්තා මගින් තහවුරු විය. ඒ අනුව ලංසු කොන්දේසිවලට පටහැනිව ගිවිසුම් වර්ෂය පුරාවටම සපයන ලද රසායනික ද්‍රව්‍ය වෙනුවෙන් ගෙවන ලද මුදල් සැපයුම්කරුගෙන් හෝ ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකළ යුතු බව සහ ඉහත රසායනාගාර වාර්තා ලබා ගැනීම වෙනුවෙන් රෝහල විසින් දරන ලද රු.266,806 ක මුදල පවිත්‍රතා සේවා සැපයුම්කරුගෙන් අයකළ යුතු බව ද නිරීක්ෂණය කෙරේ.	-එම-	මේ සම්බන්ධයෙන් සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සම්බන්ධිත පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව.
	vii. 2022 නොවැම්බර් 23 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන සී 2 කමිටු තීරණයේ කොන්දේසි 04 ප්‍රකාරව ලංසු ලේඛනයේ ඉදිරිපත්	-එම-	2022/2023 වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ලංසු ලේඛනවල රසායනික ද්‍රව්‍ය

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	කර ඇති රසායන ද්‍රව්‍ය වර්ගයන් සහ ප්‍රමිතීන් එම වෙළඳ නාමයන් හා ප්‍රමිතීන් යටතේම රෝහල වෙත සපයන්නේද යන්න තහවුරු කර ගැනීමෙන් අනතුරුව ගෙවීම් කළ යුතු අතර ලංසු ලියවිලිවල V කොටසෙහි 8.3 කොන්දේසිය ප්‍රකාරව නියමිත ප්‍රමිතියෙන් යුත් උපකරණ හා රසායනික ද්‍රව්‍ය භාවිතා කරන බවට ආසාදන පාලන ඒකකයේ ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා හෝ බලය පවරන ලද නිලධාරියකුගෙන් ලබා ගත් සහතිකය මාසික බිල්පත් නිරවුල් කිරීමේදී සලකා බැලිය යුතුය. නමුත් රෝහලේ ආසාදන පාලන ඒකකයේ ප්‍රධාන හෙද නිලධාරිනි විසින් රසායනික ද්‍රව්‍ය නිසි ප්‍රමාණයන්ගෙන් වෙළඳපොල ඇසුරුම් සහිතව සපයා ඇති බවට පමණක් සහතික කර තිබුණු තත්ත්ව වාර්තා මත පදනම්ව මාසික ගෙවීම් රෝහල විසින් සිදුකර තිබුණි. එබැවින් රසායනික ද්‍රව්‍ය නියමිත ප්‍රමිතියෙන් යුත් ඒවා බවට තහවුරු කර ගැනීමකින් තොරව ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව කොන්ත්‍රාත්කරු වෙත රසායනික ද්‍රව්‍ය වෙනුවෙන් ගෙවා තිබුණි.		සම්බන්ධයෙන් වෙළඳ නාමයක් සඳහන් කර නොතිබුණු බව, ඉදිරියේදී පවිත්‍රතා ආයතනය විසින් රෝහල වෙත සපයනු ලබන රසායනික ද්‍රව්‍ය වලට අදාළව පැවතිය යුතු ගුණාත්මකභාවය , පරිහරණය කළ යුතු පිළිවෙල, නිවැරදි තණුකරණ ක්‍රියාවලියේ සම්මත තත්ත්වයන් ආදිය ඇතුළත් වන පරිදි මූලික පිරිවිතරයන් (Specification) රෝහල වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන අංශය දැනුවත් කිරීමට කටයුතු කිරන බව.
	viii. ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් සපයනු ලබන රසායනික ද්‍රව්‍යවල වෙළඳපල නාමය, ප්‍රමිතිය සහ නිෂ්පාදන ඇසුරුම් මොනවාද යනවග පරීක්ෂා කර භාර ගත යුතු වුවත් රෝහල විසින් භාර ගෙන තිබුණු රසායනික ද්‍රව්‍යවල වෙළඳපල නාමය, කොන්ත්‍රාත්කරු විසින් රෝහලට ලබා දෙන බිල්පත්වල සඳහන් කර තිබුණු වෙළඳපල නාමයන්ගෙන් වෙනස් විය.	-එම-	අදාළ රසායනික ද්‍රව්‍ය හා උපකරණ භාර ගැනීමේදී ඒවායේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් තහවුරු කර ගැනීමට අසාදන පාලන ඒකකය වෙත පැවරීමත් එමගින් මාසිකව ලැබෙන වාර්තා මත පදනම්ව ඉදිරි ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන බව.
	ix. රසාවි වෛද්‍ය සංකීරණය හැර අපේක්ෂා රෝහලේ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා වාර්ෂිකව සැපයිය යුතු උපකරණ අයිතම 17 කට අදාළව එහි වාර්ෂික අවශ්‍යතාවයට වඩා උපකරණ 66 ක් අඩුවෙන් ද රසාවි වෛද්‍ය සංකීරණයේ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා වාර්ෂිකව සැපයිය යුතු උපකරණ අයිතම 05 කට අදාළව එහි වාර්ෂික	-එම-	වාර්ෂික උපකරණ සඳහා ලංසු ලේඛනවල මිල ගණන් ඉදිරිපත් කර නොමැති අතර ඒ සඳහා රෝහල විසින් මුදල් ගෙවීමක් සිදු කර නොමැති බව, ලංසු ලේඛනයේ පොදුකාර්යය පිරිවැය යටතේ දක්වා ඇත්තේ

	අවශ්‍යතාවයට වඩා උපකරණ 14 ක් අඩුවෙන් ද කොන්ත්‍රාත්කරු විසින් රෝහලට සපයා තිබුණි. මෙලෙස වාර්ෂික අවශ්‍යතාවයට වඩා අඩුවෙන් උපකරණ සැපයීම හරහා රෝහලේ පිරිසිදු කිරීමේ කටයුතු නිසි පරිදි සිදු නොවීමේ අවධානම හෝ එසේ නොවේ නම් වාර්ෂික අවශ්‍යතාවය අධි ඇස්තමේන්තුවක් කර තිබෙන බවට නිරීක්ෂණය විය. එසේම කොන්ත්‍රාත්කරු විසින් රෝහලට අඩුවෙන් සපයා තිබුණු උපකරණ සම්බන්ධයෙන් ලංසු ලේඛන V කොටසේ 4.7.2 කොන්දේසිය ප්‍රකාරව කිසිදු අයකිරීමක් රෝහල විසින් සිදුකර නොතිබුණි.		"මාසික/ වාර්ෂික සැපයිය යුතු උපකරණ සඳහා පිරිවැය" ලෙසයි. නමුත් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී වෙන් වෙන් වශයෙන් දක්වා නොමැති බව, දක්වා ඇත්තේ මාසිකව සැපයිය යුතු උපකරණ පිරිවැය පමණක් බව, තවද අදාළ උපකරණ රෝහලේ අවශ්‍යතාවය අනුව සැපයිය යුතු බවට ලංසු ලේඛනවල දක්වා ඇති බව, මේ සම්බන්ධයෙන් ආයතනය වෙතින් විමසන ලද අතර එම ආයතනය දන්වා ඇත්තේ අදාළ වාර්ෂික උපකරණ , ගිවිසුම් වර්ෂය පුරාවටම රෝහල වෙත ලබා දෙන බවත් එක වර ලබා දීමට අවශ්‍ය නම් ලංසු ලේඛනවල දක්වා ඇති පරිදි මාසික/වාර්ෂික උපකරණ සඳහා ඉදිරිපත් කර ඇති සම්පූර්ණ මුදලම ගෙවන ලෙස බව.
	x. එසේම වර්ෂ කිහිපයක සිට එකම කොන්ත්‍රාත්කරු රෝහලේ පිරිසිදු කිරීමේ කටයුතුවල නිරත වන අතර වාර්ෂිකව රෝහල විසින් කොන්ත්‍රාත්කරුගෙන් භාර ගත යුතුවන උපකරණ වලට කුමක් සිදුවූයේද යන්න තොරතුරු විගණනයට ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. මෙම උපකරණ වාර්ෂිකව කොන්ත්‍රාත් කාලය අවසානයේදී රෝහලට භාරදීමට හෝ ඊළඟ වර්ෂයේ භාවිතය සඳහා යොදා ගන්නේ නම් ඒ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීමට වග බලාගත යුතු වූවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	-එම-	මෙම වාර්ෂික උපකරණ සඳහා රෝහල වෙතින් ගෙවීමක් සිදු නොකරන බැවින් එම උපකරණ රෝහල භාරයට ගැනීම සුදුසු නොවන බව, නව සේවා ගිවිසුම් 02 කට අදාළව අදාළ වාර්ෂික උපකරණ ලැයිස්තු පරීක්ෂා කර ඇති අතර නිහ උපකරණ රෝහල වෙත භාර දෙන ලෙස ආයතනය දැනුවත් කර ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	xi. රසායි වෛද්‍ය සංකීරණය හැර අපේක්ෂා රෝහලේ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා ගිවිසුම් ප්‍රකාරව සැපයිය යුතු රෙදි කෑලි, සිවිලිං බ්‍රෂ්, ග්ලාස් වයිපර්, සහ ඩෂ් මොබ් 2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් කාලපරිච්ඡේදය පුරාවටම කොන්ත්‍රාත්කරු විසින් සපයා නොතිබුණු අතර රෝහල් ගොඩනැඟිලිවල මකුළු දැල් ඉවත් කිරීම් සහ ජනේල් පිරිසිදු කිරීම් නිසි පරිදි සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම මෙලෙස කොන්ත්‍රාත්කරු විසින් සපයා නොතිබුණු ඉහත අයිතම වෙනුවෙන් එම අයිතමවලට අදාළව කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුණු මිල රෝහල විසින් අයකර ගෙන තිබුණ ද, රෙදි කෑලි වෙනුවෙන් රෝහල අය කර ගෙන තිබුණු රු.75 ක මිල කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු රු. 250 ක මිලට වඩා අඩු විය. ඒ අනුව රු.58,800 ක මුදලක් (12x28x175) කොන්ත්‍රාත්කරු වෙත වැඩියෙන් ගෙවා තිබුණි. එමෙන්ම ලංසු ලේඛන V කොටසේ 4.7.2 කොන්දේසිය අනුව කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම් ප්‍රකාරව රෝහලට නොසපයන අයිතම වෙනුවෙන් සියයට 25 ක අතිරේක මුදලක් අය කල යුතු වුවත් රෝහල විසින් එලෙස කටයුතු කර නොතිබුණි. වැඩිපුර ගෙවන ලද මුදල සහ අය කර නොතිබුණු සියයට 25ක අතිරේක මුදල කොන්ත්‍රාත්කරුගෙන් හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතු බවට නිරීක්ෂණය කෙරේ.	-එම-	වැඩිපුර ගෙවා ඇති රු. 58,800 ක මුදල හා ඊට අදාළ සියයට 25 ක අතිරේක මුදලද ගණනය කර ඉදිරි බිල්පත් වලින් අයකර ගැනීම හා ආයතනය දැනුවත් කිරීමට කටයුතු කරන බව.
	xii. ගිවිසුම් ප්‍රකාරව රසායි වෛද්‍ය සංකීරණය හැර අපේක්ෂා රෝහල සහ රසායි වෛද්‍ය සංකීරණයේ දිවා සේවා වැඩ මුරය සඳහා පිරිසිදු කිරීමේ කම්කරුවන් 99 ක් සහ වැඩ සුපරීක්ෂකවරුන් 05 ක් සේවයේ යෙදවිය යුතු වුවත් 2024 පෙබරවාරි 05 වන දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී එදින දිවා සේවා වැඩ මුරය සඳහා පිරිසිදු කිරීමේ කම්කරුවන් 85 ක් සහ වැඩ සුපරීක්ෂකවරුන් 4 ක් පමණක් එනම් ගිවිසුම්ගත ප්‍රමාණයට වඩා සේවකයින් 15 ක් අඩුවෙන් සේවයේ යොදවා තිබුණු බව නිරීක්ෂණය විය. එදින සේවයට වාර්තා	-එම-	විගණන නිලධාරීන් විසින් පරීක්ෂා සිදු කරන ලද දිනට අදාළව නොසිටි සේවකයින් සඳහා සේවා ගිවිසුම් ප්‍රකාරව අය කිරීමට කටයුතු කරන බව, දැනටමත් සතියකට වරක් බැගින් පවිත්‍රතා සේවකයින්ගේ පැමිණීම සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂාවන් සිදු කිරීම ආරම්භ කර ඇති බව, පවිත්‍රතා සේවකයින්ගේ අත්සන් පොත නිවැරදිව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	කළ බවට පැමිණිමේ ලේඛනයේ අත්සන් කරන ලද සේවකයින් 15 ක් සත්‍ය ලෙස සේවයේ යේදී නොසිටි බව නිරීක්ෂණය විය. මෙලෙස සේවයේ යොදවා නොතිබුණු ප්‍රමාණය ගිවිසුම්ගත ප්‍රමාණයෙන් සියයට 15 ක් විය. විස්තර ඇමුණුම 05 හි දැක්වේ. නමුත් කොන්ත්‍රාත්කරු විසින් රෝහල වෙත ඉදිරිපත් කර තිබුණු පිරිසිදු කිරීමේ සේවකයින්ගේ පැමිණිමේ ලේඛන ප්‍රකාරව 2023 වර්ෂය පුරාවටම ගිවිසුම් අනුව සේවයේ යෙදවිය යුතු සේවක සංඛ්‍යාව හෝ ඊට ආසන්න සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබුණු බවට වාර්තා කර තිබීම විගණනයේදී ගැටළු සහගත වන අතර ඒ සම්බන්ධයෙන් රෝහලේ අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය කෙරේ.		පවත්වාගෙන යන ලෙසත් ව්‍යාජ අත්සන් නොයොදන ලෙස හා එසේ සිදු කර ඇති බවට නිරීක්ෂණය වුවහොත් අත්සන් ලේඛනයෙන් කපා හැරීමටත් , අදාළ මාසික බිල්පත් වලින් දඩ මුදල් අය කර ගෙවීම් සිදු කිරීමටත් එලෙස සිදු කරන බවට ආයතනය දැනුවත් කිරීමටත් කටයුතු කිරීමට පියවර ගෙන ඇති බව.
	xiii. රසාවි වෛද්‍ය සංකීරණයේ පිරිසිදු කළ යුතුවන ඒකක/වාට්ටු ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් අවශ්‍ය යැයි තීරණය කර තිබුණු පිරිසිදු කිරීමේ සේවක සංඛ්‍යාව රෝහලේ මුළු අවශ්‍යතාවයෙන් සියයට 31 ක් වූවත් රසාවි වෛද්‍ය සංකීරණයේ පිරිසිදු කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් මාසිකව සැපයිය යුතු උපකරණ 10 ක අවශ්‍යතාවය රෝහලේ මුළු අවශ්‍යතාවයෙන් සියයට 43 සිට සියයට 84 දක්වා පරාසයක පැවතීමෙන් රසාවි වෛද්‍ය සංකීරණයේ පිරිසිදු කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් මාසිකව සැපයිය යුතු උපකරණ සම්බන්ධයෙන් අධි ඇස්තමේන්තුවක් සිදුකර තිබුණු බව නිරීක්ෂණය කෙරේ.	-එම-	පවිත්‍රතා කමිටුව විසින් නැවත වරක් රෝහලේ සියළු අංශ හා ඒකකයන් සඳහා මෙම උපකරණයන්හි අවශ්‍යතාවයන් ගණනය කර යාවත්කාලීන වාර්තාවක් සකසා ඉදිරියේදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන අංශය වෙත යොමු කිරීමට කටයුතු කිරීමට පියවර ගෙන ඇති බව.
	xiv. පිරිසිදු කිරීමේ කාර්යමණ්ඩලය සඳහා රෝහල් භූමිය තුළ කාර්යාල පහසුකම් සලසා දී තිබුණද ඒ වෙනුවෙන් ලංසු ලේඛන V කොටසේ 4.7.11 කොන්දේසිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුගෙන් කිසිදු ගාස්තු අයකිරීමක් රෝහල විසින් සිදුනොකරන බව නිරීක්ෂණය විය.	-එම-	මේ වන විටත් මෙම කාර්යාල සඳහා තක්සේරු දෙපාර්මේන්තුව මගින් තක්සේරු වාර්තාවක් කැඳවා අදාළ බිම් කුලී අයකිරීම් මාසිකව සිදු කරනු ලබන බව, ජලය හා විදුලිය සඳහා අය කිරීම් සම්බන්ධයෙන්

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			රෝහලේ තාක්ෂණ නිලධාරී විසින් ලබා දී ඇති නිර්දේශ පරිදි ජලය හා විදුලි මීටර් සවි කරන තෙක් නිශ්චිත මුදලක් ඉදිරියේදී අයකිරීමට කටයුතු කරන බව, විදුලි හා ජල මීටර් සවි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව.
(ධ)	2012 දෙසැම්බර් 05 දිනැති අංක අමප/12/1602/509/005-11 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමේ අරමුණින් රජයේ රෝහල්වලට අවශ්‍ය වාර්ෂික ශල්‍ය ගෝස් අවශ්‍යතාවය දේශීය නිෂ්පාදකයන්ගෙන් ලබාගෙන තිබුණු අතර එහිදී වෛද්‍ය සැපයීම් අංශයේ ලියාපදිංචි වී සිටින ශල්‍ය ගෝස් නිෂ්පාදකයන්ට වාර්ෂික කෝටා ක්‍රමයකට ගෝස් සැපයීමට අනුමැතිය ලබා දී තිබුණි. නමුත් 2022 වර්ෂයේදී වෛද්‍ය සැපයීම් අංශය විසින් සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (HSEP) හරහා රු.268,500,000 ක් වටිනා ශල්‍ය ගෝස් මීටර් මිලියන 03 ක් ආනයනය කර මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහතින් දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
-	i. PRONTO පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව රෝහල්වල වාර්ෂික ගෝස් අවශ්‍යතාවය දළ වශයෙන් මීටර් මිලියන 53 ක් වූ අතර වෛද්‍ය සැපයීම් අංශය විසින් වාර්ෂිකව මීටර් මිලියන 30 ක් පමණක් ඇස්තමේන්තු කර ඇණවුම් ඉදිරිපත් කළ ද අමාත්‍යාංශය විසින් කාර්තුවකට මීටර් මිලියන 6 බැගින් මීටර් මිලියන 24 ක් සඳහා පමණක් කෝටා ලබා දී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුවල නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී ගැටළු මතු වූ අතර 2022 වර්ෂය වෙනුවෙන් කෝටා ක්‍රමයට සැපයීමට වාර්ෂික අවශ්‍යතාවයෙන් සියයට 57 ක් සඳහා පමණක් ඇණවුම් ඉදිරිපත් කර තිබුණු අතර ඉතිරි සියයට 43 සපුරා ගැනීමට කටයුතු කර නොතිබුණු බවත්, මේ	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය.	Pronto පරිගණක පද්ධතිය අනුව වාර්ෂිකව ශල්‍ය ගෝස් අවශ්‍යතාවය දළ වශයෙන් මීටර් මිලියන 53 ක් වූ අතර එය ආයතන වලින් එවන ලද පුරෝකථනය කළ වාර්ෂික ඇස්තමේන්තුව බව, වෛද්‍ය සැපයුම් අංශය ඇණවුම් කරනුයේ සාමාන්‍ය ක්‍රමයට අනුව පසුගිය දත්ත සමඟ ගලපා ඉදිරි වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද අවශ්‍යතාවය වූ ශල්‍ය ගෝස් මීටර මිලියන 30 ක් බව, එම මිලියන 30 ක

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	හේතුවෙන් ව්‍යාජ හිඟයක් පෙන්නුම් කර හදිසි මිලදී ගැනීම් සිදුකිරීමට අවස්ථාව සලසා ගෙන තිබුණු බවද නිරීක්ෂණය විය.		අවශ්‍යතාවය වෛද්‍ය සැපයුම් අංශයට අවශ්‍ය ශල්‍ය ගෝස් සපයා ගැනීම සඳහා වූ කමිටුව වෙත ඉදිරිපත් කර එම කමිටුවේ උපදෙස් මත ශල්‍ය ගෝස් සැපයුම්කරුවන් වෙත සලාක නිකුත් කර ලබා ගැනීමට කටයුතු කර ඇති බව, එසේම එම මිලියන 30 කාර්තු 4 කට බෙදා ගෝස් සලාක ලෙස සැපයුම්කරුවන් අතර බෙදා දී සපයා ගන්න ලද බව, නමුත් මෙම කෝටා ප්‍රමාණය ලද සැපයුම්කරුවන්ගෙන් සමහර සැපයුම්කරුවන් තම කෝටා ප්‍රමාණය සම්පූර්ණයෙන්ම ලබා නොදීම නිසා මෙම මිලියන 6 ක අඩුපාඩුව සිදුවී ඇති බව, වෛද්‍ය සැපයුම් අංශය වෙත ලැබෙන ආයතනික වාර්ෂික අවශ්‍යතාවය, පසුගිය වසර 05 ක වාර්ෂික අවශ්‍යතාවය, නිකුත් කිරීම් හා පරිභෝජනය පදනම් කර ගනිමින් වෛද්‍ය සැපයීම් අංශය විසින් නැවත පුරෝකථනය කරනු ලබන බව, ඇණවුම් කරනු ලබන්නේ මෙම පුරෝකථන අවශ්‍යතාවය පමණක් බව,. එම නිසා ආයතන වලින් ඉල්ලා ඇති වාර්ෂික අවශ්‍යතාවයේ ඉතිරි සියයට 43 ක ප්‍රමාණය ඇණවුම් කර ලබා ගැනීම අතිරික්තයක් විය හැකි බැවින් එසේ ඇණවුම් කර නැති බව.
	ii. 2022 වර්ෂයේදී වෛද්‍ය සැපයීම් අංශයේ ලියාපදිංචි ශල්‍ය ගෝස් සැපයුම්කරුවන් 302 න් සැපයුම්කරුවන් 36 දෙනෙකු විසින් 2022	-එම-	ඉහත (අ) යටතේ වෛද්‍ය සැපයුම් අංශයේ පුරෝකථන ඇස්තමේන්තුව සකස් කිරීමත්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	වර්ෂයේ ඇතිව තිබුණු ආර්ථික අර්බුදය හේතුවෙන් පැවති මිල ගණන් යටතේ තම කෝටාවට අදාළ ගෝස් සැපයීමට නොහැකි බව දැනුම් දීමත්, මුළු වාර්ෂික අවශ්‍යතාවය නිවැරදිව ඇස්තමේන්තු කර අවශ්‍යතාවය සපුරා ගැනීමට කටයුතු නොකිරීමත් හේතුවෙන් රෝහල්වල ගෝස් හිඟයක් හටගෙන තිබුණු බව නිරීක්ෂණය වූ අතර වෛද්‍ය සැපයීම් අංශය විසින් සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හරහා (HSEP) ගෝස් මීටර් මිලියන 12 ක් මිලදී ගැනීමට තීරණය කර තිබුණි. එහිදී මාස 03ක ආරක්ෂිත තොගයක් පවත්වා ගෙන යාම සඳහා ගෝස් මීටර් මිලියන 03 ක් ලබා ගැනීමටත්, රු.මිලියන 500 ඉක්ම වූ ප්‍රසම්පාදනයන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවට සිදුකළ නොහැකි වීම මත ඇණවුම මීටර් මිලියන 03 දක්වා අඩුකර ලංසු කැඳවීමටත්, වැඩබලන වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකගේ සහභාගීත්වයෙන් 2022 නොවැම්බර් 21 දින පැවති ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේදී වෛද්‍ය සැපයීම් අංශයේ හදිසි අවශ්‍යතාවයක් ලෙස දක්වමින් ලංසු ඉදිරිපත් කර තිබුණු එකම ලංසුකරු වූ Sisili Projects Consortium පුද්ගලික සමාගමට ගෝස් මීටර් මිලියන 03 ක ඇණවුම ප්‍රදානය කිරීමටත් අනුමැතිය ලබා දී තිබුණි. ඒ වන විට වෛද්‍ය සැපයීම් අංශය තුළ වැඩි මිලට ගෝස් මිලදී ගැනීමේ හදිසි අවශ්‍යතාවයක් නොතිබුණු බවත්, ඇණවුම් ප්‍රදානය කළ අවස්ථාව වනවිට දේශීය සැපයුම්කරුවන් විසින් ගෝස් මීටර 3,635,700 ක ප්‍රමාණයක් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු බවත්, 2022 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ආසන්න වශයෙන් ගෝස් මීටර් මිලියන 08 ක ලැබීම් හා නිකුත් කිරීම් සිදුකර තිබුණු බවත් නිරීක්ෂණය විය.		ඒ අනුව අවශ්‍යතාවය ලබා ගැනීමට කටයුතු කරන ආකාරය දක්වා ඇති බව, එම නිසා මෙම ඇති වූයේ යැයි කියන ශල්‍ය ගෝස් හිඟය ඇති වූයේ වාර්ෂික අවශ්‍යතාවයේ ඇස්තමේන්තු ගත කිරීමේ ගැටළුවක් නිසා නොව කෝටා ලබා ගත් සැපයුම්කරුවන්ගෙන් ලැබිය යුතු කෝටා නිසි ලෙස නොලැබීම නිසා බව, විදේශ විනිමය හිඟතාවය හේතුවෙන් ගෝස් සඳහා අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය ආනයන බාධා ඇති වීම නිසා මෙය සිදු වූ බව, මෙම ශල්‍ය ගෝස් හිඟය පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමකදී ගත් තීරණයන් අනුව ශල්‍ය ගෝස් මිලියන 12ක් සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (HSEP) හරහා ලබා ගැනීමට තීරණය කරන ලද අතර ඒ අනුව මෙම තීරණය ගෙන ඇති බව, ඉහත සඳහන් කරුණු නිසා ගෝස් සඳහා ආරක්ෂිත තොගයක අවශ්‍යතාවය ලබා ගැනීමට ආසියානු සංවර්ධන බැංකු (ADB-HSEP) ව්‍යාපෘතිය හරහා ගෝස් මීටර් මිලියන 12ක ඇනවුමක් ලබා දීමට තීරණය කිරීම සෞඛ්‍ය අමාත්‍යතුමා ගේ මූලිකත්වයෙන් පැවති රැස්වීම් වලදී ගත් ප්‍රතිපත්තිමය තීරණයක් බව,. පවතින ගබඩා ඉඩකඩ සීමා වීම නිසා එම ප්‍රමාණය ගෝස් මීටර මිලියන 12 සිට මිලියන 3 දක්වා අඩු කර ලංසු කැඳවීම ද

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			ඉහත රැස්වීම හා අදාළ තාක්ෂණික ඇගයීම් හා ටෙන්ඩර් මණ්ඩලය හරහා සිදුකර ඇති බව, මෙම ටෙන්ඩරය ගෝස් මීටරයක් රු.89.50 (VAT රහිත මිල) කට හා රු.268,500,000 ක මුළු වටිනාකමට ප්‍රදානය කරන ලද්දේ තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව මගින් බව.
	iii. මෙලෙස ඇණවුම ලබාගත් සැපයුම්කරු, වෛද්‍ය සැපයීම් අංශයේ කෝටා ක්‍රමය යටතේ රු.74.96 බැගින් ගෝස් සපයන ලද දේශීය සැපයුම්කරුවකු බවත්, මෙම ඇණවුමේදී මීටරයක් රු.89.50 බැගින් ඉන්දියාවෙන් ආනයනය කර සැපයීමට ලංසුව ඉදිරිපත් කර තිබුණු බවත් නිරීක්ෂණය විය. නමුත් මෙම තොගය සැබෑ ලෙසම ඉන්දියානු නිෂ්පාදකගෙන්ම ලබාගත් තොගයක්ද නැතිනම් දේශීයව නිෂ්පාදනය කළ තොගයක්ද යන්න වෛද්‍ය සැපයීම් අංශය විසින් තහවුරු කරගෙන නොතිබුණි.	-එම-	ආසියානු සංවර්ධන බැංකු (ADB – HSEP) ව්‍යාපෘතිය හරහා පිරිනමන ලද මෙම ශල්‍ය ගෝස් ඇණවුම මීටරයක් රු.89.50 බැගින් ඉන්දියාවෙන් ආනයනය කර සැපයීමට අදාළ තීරණය එම ව්‍යාපෘතිය මගින් සිදු කර ඇති බව.
	iv. දේශීය සැපයුම්කරුවන්ගෙන් මීටරයක් රු.74.96 බැගින් මිලදී ගැනීමට හැකියාව පැවතියදී සහ 2022 නොවැම්බර් මස වන විට දේශීය සැපයුම්කරුවන් විසින් කෝටාවට අදාළ තොග සපයමින් සිටියදී නව සැපයුම්කරු වෙතින් මාසයකට මීටර් 100 රෝල් 3750 බැගින් ගෝස් මීටර් මිලියන 03 ක් මාස 08 ක් පුරාවට ලබා ගැනීමට සැපයුම් කාලසටහන් ලබා දී තිබුණු අතර අදාළ නිලධාරීන් විසින් ඊට මාස 09 කට පෙර ලබා ගත් තීරණයක් පදනම් කර ගනිමින් සෞඛ්‍ය ලේකම්වරයාගේ උපදෙස් ලබාගැනීමකින් තොරව, ප්‍රමාණවත් තොග පවතින අවස්ථාවක වෛද්‍ය සැපයීම් අංශය විසින් තොග තත්ත්වය සලකා බලා ඇණවුම අවලංගු කළ යුතුව තිබුණ ද, මෙලෙස වැඩි මිලට තොග ලබා ගැනීමට කටයුතු කර තිබුණි.	-එම-	HSEP ව්‍යාපෘතිය මඟි මගින් න් විදේශයෙන් ගෙන ඒමට වෙන් කර ප්‍රධානය කරන ලද ශල්‍ය ගෝස් සැපයුම්කරු විසින් සපයනු ලබන ශල්‍ය ගෝස් මීටර් මිලියන 03ක් ආරක්ෂිත තොගයක් ලෙස ලබා ගන්නා ලෙස මෙම සම්පූර්ණ ටෙන්ඩරය ශල්‍ය ගෝස් මීටර් මිලියන 12 ක් වූ අතර නැවත එය මීටර් මිලියන 03ක් දක්වා අඩු කර ආරක්ෂිත තොගයක් ලෙස ලබා ගන්නා ලෙස ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති වෛද්‍ය සැපයීම් අංශයේ HSEP

NAOSL
ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வாளர் அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි රජයට සිදු වන පාඩුව අවම වන ආකාරයට කටයුතු නොකිරීමත්, අදාළ ඇණවුම අවලංගු කිරීමේ හැකියාව පැවතිය දී ඒ ආකාරයට කටයුතු නොකිරීමත්, ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අදාළ ඇණවුම ප්‍රදානය කිරීමට පෙර වෛද්‍ය සැපයීම් අංශයේ හා රෝහල්වල තොග තත්ත්වය පිළිබඳ වාර්තාවක් ලබාගත්තේ නම්, මෙම තීරණ හේතුවෙන් සිදු වූ පාඩුව අවම කර ගැනීමට හෝ මීට වඩා අඩු ප්‍රමාණයකට ඇණවුම ප්‍රදානය කිරීමෙන් සිදුවන පාඩුව අවම කළ හැකිව තිබුණු බවත් නිරීක්ෂණය විය.		ව්‍යාපෘතිය සමඟ පවතින සැපයුම් පිළිබඳව කළමනාකරණ රැස්වීමකදී තීරණය කර ඇති බව, 2023 මැයි 30 දින වෛද්‍ය සැපයීම් අංශය වෙත ලද මීටර් 50,000 ක තොගයක් සම්බන්ධයෙන් තොග පාලන නිලධාරීන් විසින් අදාළ සහකාර අධ්‍යක්ෂකවරයා හරහා වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකගෙන් කරන ලද විමසීමකට අනුව ඔහු විසින් ඒ සඳහා සෞඛ්‍ය ලේකම්වරයාගේ උපදෙස් ලබා ගැනීමට දැනුම් දී තිබුණු බව, මෙම ලිපිගොනුව සෞඛ්‍ය ලේකම්වරයා වෙත යොමු කිරීමේදී ප්‍රථමයෙන් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සැපයීම්) වෙත යොමු කළ හා සාකච්ඡා කළ අවස්ථාවේදී දැනටමත් ඇණවුම සක්‍රීය බැවින්ද, සාකච්ඡාවට කිහිපයකදීම මෙය ආරක්ෂිත තොගයක් ලෙස ලබා ගන්නා ලෙස උපදෙස් ලැබුණු බැවින්ද, සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවන බවත් සැපයුමෙන් සැපයුම අනුමැතියට නැවත නැවත ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය නොවන නිසා ඉදිරියට කරගෙන යන ලෙස වාචිකව උපදෙස් ලබා දුන් බව, ඒ අනුව ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂවරයා එම උපදෙස් අනුව කටයුතු කර ඇති බව,. එසේම ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති වෛද්‍ය සැපයුම් අංශයේ HSEP ව්‍යාපෘතියේ සැපයුම් පිළිබඳ කළමනාකරණ රැස්වීමේදී

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			ආනයනික සැපයුම්කරුගෙන් ගෝස් මීටර් මිලියන 3 ක ප්‍රමාණයක් ආරක්ෂිත තොගයක් ලෙස ලබා ගන්නා ලෙස පැහැදිලිව වෛද්‍ය සැපයීම් අංශයට හා HSEP ව්‍යාපෘතියට උපදෙස් ලබා දී ඇති බව.
	v. මේ හේතුවෙන් දේශීය වශයෙන් තොග තිබිය දී ගෝස් ආනයනය කිරීම නිසා මීටරයක් සඳහා වැඩිපුර රු.14.54 බැගින් මීටර මිලියන 03 ක් මිල දී ගැනීමෙන් රු.මිලියන 43.6 ක පාඩුවක් රජයට සිදු වන බවත්, රු.මිලියන 43.6 පාඩුවක් විඳිමින් පොරොත්තු තොගයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බවත්, මුළු වාර්ෂික අවශ්‍යතාවය නිසි පරිදි ඇස්තමේන්තු කර දේශීය සැපයුම්කරුවන්ගේ කෝටාව ඉහළ නංවා දේශීය කර්මාන්තය සුරැකෙන පරිදි අදාළ සැපයීම් ලබා ගැනීමට නිලධාරීන් කටයුතු කර නොතිබුණු බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.	-එම-	ආනයනය කළ තොගය වන ශල්‍ය ගෝස් මීටර මිලියන 3ක ප්‍රමාණය ආරක්ෂිත තොගයක් ලෙස ලබා ගන්නා ලෙස ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් වෛද්‍ය සැපයුම් අංශයත් ප්‍රසම්පාදන පිළිබඳව 19/08/2022 දින පවත්වන ලද රැස්වීමේදී ශල්‍ය ගෝස්වල මාස 03ක තොගයක් මෙම ආනයනික ඇණවුමෙන් ලබා ගන්නා ලෙස තීරණය කර ඇති නිසා යම් ප්‍රමාණයක ශල්‍ය ගෝස් ප්‍රමාණයක් වෛද්‍ය සැපයීම් අංශය සඳහා තිබුණ ද මෙම තොගය ලබා ගත යුතු වූ බව, දේශීය වශයෙන් ශල්‍ය ගෝස් තොග ලබා ගැනීමේදී මිල තීරණය කරනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මිල කමිටුවක් මගින් වන අතර ආනයනික ගෝස් ටෙන්ඩරය භසුරුවන ලද HSEP ව්‍යාපෘතියේ ටෙන්ඩර වටිනාකම් එයට අවේනික ලෙස පත්කළ ප්‍රසම්පාදන කමිටු තීරණයක් බැවින් මෙසේ දේශීය තොගය හා ආනයනික තොගය අතර මිල වෙනසක් දක්නට ලැබුණු බව, කෙසේ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			වෙතත් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීමට කටයුතු කර ඇති බව.
(න)	වෛද්‍ය සැපයීම් තොග කළමනාකරණය සඳහා පැවති MSMIS පරිගණක පද්ධතිය (Pronto පද්ධතිය) 2015 සිට ආරම්භ කර 2023 මැයි මස අවසානය දක්වා ක්‍රියාත්මක කර තිබුණු අතර එම පද්ධතිය වෙනුවෙන් රු.මිලියන 633.6 ක වියදමක් දරා තිබුණි. 2023 ජුනි මස එම පරිගණක පද්ධතිය ඉවත් කර ඒ වෙනුවට වෛද්‍ය සැපයීම් කළමනාකරණය සඳහා වූ විස්තීරණ තොරතුරු කළමනාකරණ පද්ධතියක් ලෙස ස්වස්ථ නමැති පරිගණක පද්ධතියක් ආදේශ කර තිබුණි. මෙම පද්ධතිය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා රු.මිලියන 101.8 ක ඇස්තමේන්තුගත වටිනාකමට Loons Lab නමැති පෞද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණු අතර 2023 ජූලි වන විට මෙම නව පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර ව්‍යාපෘතිය (PSSP) හරහා රු.මිලියන 51 ක් මෙම පෞද්ගලික සමාගම වෙත ගෙවා තිබුණි. එසේම තවත් රු.මිලියන 36.6 ක් පුහුණු වැඩසටහන් සහ ලී බඩු මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී පහතින් දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. තොරතුරු තාක්ෂණය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙනම අංශයක් සෞඛ්‍ය තොරතුරු අංශය ලෙස ස්ථාපිත කර තිබියදීත්, මෙම ස්වස්ථ පද්ධතියේ ප්‍රසම්පාදන කටයුතු සඳහා හෝ පද්ධතියේ තාක්ෂණික ඇගයීම් කටයුතු සඳහා එම අංශය සහභාගී කරවා ගෙන නොතිබුණි.	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය.	ස්වස්ථ පරිගණක පද්ධතිය රජයේ ප්‍රතිපත්ති තීරණයක් ලෙස ආරම්භ කළ අතර, එය පැවැති Pronto පද්ධතියේ සේවා ගිවිසුම් අවසන් වීමෙන් පසු සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් දත්ත කළමණාකරණය සඳහා 2023.06.09 දින සිට භාවිතයට ගන්නා ලද බව, එවකට ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන, සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවා තිබූ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			අතර පූර්ණ ලෙස වෛද්‍ය සැපයුම් කළමනාකරණය එම රාජ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කරන ලද බව, පෙර පැවැති pronto පරිගණක පද්ධතිය කළමනාකරණය ද, වෛද්‍ය සැපයුම් අංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කරන ලද බව, ඒ අනුව රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස ආරම්භ කළ නව ස්වස්ථ විස්තීරණ තොරතුරු පද්ධතිය ප්‍රසම්පාදනය කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කරන ලද බව, එහි ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය, සෞඛ්‍ය තොරතුරු තාක්ෂණය, වෛද්‍ය සැපයුම් ඒකකය ආදී සියලුම පාර්ශව කරුවන් නියෝජනය වන පරිදි විශේෂඥයින්ගෙන් 07 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් කටයුතු කරන ලද බව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ තොරතුරු කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ මෙම කාර්ය සඳහා පත් කරන ලද ප්‍රධාන ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස ආරම්භයේ සිට කටයුතු කර ඇති බව.
	ii. මෙම පද්ධතිය සංවර්ධනය කිරීමේ මූලික අදියරේදී පද්ධති පරිශීලකයන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ඒ පිළිබඳ ඇගයීමක් සිදුකර නොතිබුණි.	-එම-	මෙම පද්ධතිය ආරම්භයේ සිටම පද්ධති සංවර්ධනය කිරීමේදී (System Development) මාස 11 පමණ කාලයක් තුළ වෛද්‍ය සැපයුම් අංශය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශ,

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			රෝහල් හා ඖෂධාගාරවල ඖෂධවේදීන් ආදී සියලුම පාර්ශවකරුවන් සමඟ සමීපව අවශ්‍යතා හඳුනා ගැනීමේ වැඩසටහන් පවත්වා ඇති බව, ඒ සඳහා පෙර පැවති පද්ධතිය පරිශීලනය කිරීම, ඔවුන්ගේ සේවා ස්ථානවලට ගොස් ඔවුන්ගේ කාර්ය අවබෝධ කර ගැනීමේ සැසි, ඔවුන් සමඟ අවශ්‍යතා හඳුනාගැනීමේ සාකච්ඡා, නේවාසික පුහුණු වැඩමුළු ආදී වැඩසටහන් ඉතා විශාල ප්‍රමාණයක් සිදුකර ඇති බව, මූලික අවශ්‍යතා හඳුනාගැනීමෙන් පසු, මූලික wireframes සහ prototypes සියලුම පාර්ශ්වකරුවන් හා එක්ව සමාලෝචනය කර වැඩිදුර දියුණු කිරීමේ වැඩමුළු, හඳුන්වාදීමේ වැඩමුළු විශාල ප්‍රමාණයක් සිදුකර ඇති බව, එසේම එක් එක් මොඩියුලය සඳහා වෙන් වෙන් වශයෙන් පුද්ගලයින් හා කණ්ඩායම් හඳුනාගෙන ඔවුන් සමඟ වෙන් වෙන්ව පද්ධතිය සමාලෝචනය කිරීම සංවර්ධනය කිරීම නව අවශ්‍යතා හඳුනාගැනීම සිදුකර ඇති බව.
	iii. සෞඛ්‍ය අංශ තුළ ඒ වන විටත් ක්‍රියාත්මක කරමින් පැවතුණු HHIMS, HIMS වැනි පද්ධතින් සමඟ මෙම ස්වස්ථ පද්ධතිය සමායෝජනය (Integrated) කරන්නේ කෙසේද යන්න අවධානය යොමුකර නොතිබුණි.	-එම-	Pronto පද්ධතිය HIMS,HHIMS හෝ වෙනත් සෞඛ්‍ය අමාත්‍යාංශය සතු කිසිදු පද්ධතියක් සමඟ සම්බන්ධ කළ නොහැකි (Can not interoperable) යල් පැන ගිය තාක්ෂණය භාවිත කළ පද්ධතියක් වීම නව පද්ධතියක් නිර්මාණය කිරීමට රාජ්‍ය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			ප්‍රතිපත්ති තීරණයක් ගැනීමට එක් මූලික හේතුවක් වූ බව, ඒ අනුව නව පද්ධතිය වෙනත් පද්ධති සමඟ inter-operable විය යුතු බව මූලික කොන්දේසියක් ලෙස දක්වා ඇති බව, Request for Proposal(RFP) හා Terms of Reference(TOR) යන ප්‍රසම්පාදන ලේඛනවල complete bidirectional communication ලෙස එම පද්ධතිය Interoperability ස්ථාපනය අවධාරණය කර ඇති බව, මේ කාර්යය සඳහා සෞඛ්‍ය තොරතුරු ඒකකය සමඟ සාකච්ඡාවන් ගණනාවක්ද පවත්වා ඇති බව, එසේම Sri Lanka Digital Health Blue print – Version 01(2023) අනුකූලව interoperability /intergration සිදුකිරීමට අවශ්‍ය මඟපෙන්වීම ලබාදෙන ලෙස අධ්‍යක්ෂ සෞඛ්‍ය තොරතුරු වෙත දැනුවත් කිරීම් සිදු කර ඇති බව, මේ අනුව වෙනත් පද්ධති සමඟ integration ඉතා වැදගත් ලෙස සලකා විශේෂ අවධානයක් යොමු කර ඇති අතර එම කාර්යය ආරම්භ කර ඇති බව.
	iv. පැවති Pronto පද්ධතිය තවදුරත් පුළුල් කර පවත්වා ගෙන යාම සඳහා අතිරේකව දැරීමට සිදුවන පිරිවැය සහ ස්වස්ථ පද්ධතිය සම්පූර්ණ කිරීම සඳහා දැරීමට සිදුවන පිරිවැය සංසන්දනය කරමින් නිවැරදි පිරිවැය විග්‍රහයක් සිදුකර නොතිබුණු අතර එමගින් මෙම සම්පූර්ණ ස්වස්ථ පද්ධතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාවය පිළිබඳ තහවුරුවක් නොවීය.	-එම-	2022/01/10 දින ගරු මුදල් අමාත්‍යතුමා විසින් ලබා දුන් අමාත්‍යමණ්ඩල නිරීක්ෂණවලට අනුකූලව “පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක්” සිදුකර එය අමාත්‍යමණ්ඩලය වෙත 2022.05.20 දින යොමු කර ඇති බව, ඒ අනුව ඒ පිළිබඳ ගරු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			අමාත්‍යමණ්ඩලය විසින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අමප අංක 21/2156/109/128 පිළිබඳ වූ 2022.01.10 අමාත්‍යමණ්ඩල තීරණයට අනුගතව ස්වස්ථ වෛද්‍ය සැපයුම් පද්ධතිය ස්ථාපනය කිරීමට අවශ්‍යය පියවර ගන්නා ලෙස සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම්ට නියම කළ බව 2022.05.31 දින අමාත්‍යමණ්ඩලයේ ලේකම් දැනුම් දී ඇති බව.
	v. සියළුම සෞඛ්‍ය තොරතුරු පද්ධති, සෞඛ්‍ය අමාත්‍යාංශය දැනට අනුමත කරන ලද Digital Health Blue Print සමඟ අනුකූල විය යුතු වූවත් මෙම ස්වස්ථ පද්ධතිය ඊට අනුකූලව සංවර්ධනය කර නිබෙන බවට විගණනයේදී තහවුරු නොවීය.	-එම-	digital Health Blue print – Version 01 2023 වර්ෂයේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් එළි දක්වන ලද බව, ස්වස්ථ පද්ධතිය නිර්මාණය කිරීම 2022 ජනවාරි මස ආරම්භ කරන ලද බව, ඒ අනුව මෙම SWASTHA පද්ධතිය නිර්මාණය කිරීමේදී Digital Health Blue print – Version 01 අවසන් කර නිකුත් කර නොතිබුණු බව, ඒ අනුව එවකට පැවැති එකම මාර්ග උපදේශකයවූ National Digital Health Guideline and Standard(NDHGS) – 2.0 අනුකූලව සංවර්ධනය කිරීම ආරම්භ කරන ලද බව, එසේ වූවද 2023 වර්ෂයේ දී Digital Health Blue print එළිදැක්වීමෙන් පසුවද ඒ සමඟ ද අනුකූල වන ලෙස ස්වස්ථ පද්ධතිය යළි සැකසීම සිදු කර ඇති බව, එසේම Digital Health Blue Print හි 2.4.5. Point Of Service (POS) පද්ධතියක් ලෙස ස්වස්ථ

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			පද්ධතිය හඳුනාගෙන ඇති අතර Blue Print නිර්මාණය කිරීමට දායක වූ ප්‍රධාන කොටස් හිමියන් ලෙස operators of existing curative and preventive sector health information system යටතේ ස්වස්ථ කාර්යමණ්ඩලය සහයෝගය දක්වා ඇති බව, එසේම 7.3.1. Existing Project Alignment යටතේ මෙම බ්ලූ ප්‍රින්ට් නිර්මාණය කරන අවස්ථාවේ ස්වස්ථ පද්ධතිය නිර්මාණය කිරීම ආරම්භ කර ඇති බව.
	vi. සැපයුම්කරු හා සෞඛ්‍ය ලේකම් අතර අත්සන් කරන ලද ගිවිසුමේ 6.5 වගන්තිය අනුව රාජ්‍ය අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන විශේෂඥ කමිටුව විසින් පද්ධතියේ සෑම මොඩියුලයක් සඳහාම ගෙවීම් කිරීමට පෙර සමාලෝචනය කර අනුමත කළ යුතු නමුත් පත්කර තිබුණු විශේෂඥ කමිටුව තුළ පද්ධති සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් සහිත සමාජිකයකු ඇතුළත් කර නොතිබුණු අතර මෙම පද්ධති සංවර්ධනය සඳහා උපදේශන සේවා සැපයීමට ඉදිරිපත් වූණු කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යාලයෙන් හෝ මේ සම්බන්ධව නිර්දේශ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව රු. මිලියන 51 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.	-එම-	මෙම පද්ධතියේ තාක්ෂණික සවිමක් බව පිළිබඳ විශේෂඥ උපදේශන ලබා දුන් කොළඹ විශ්වවිද්‍යාලය මගින් සහතිකයක් ලබා දීමෙන් අනතුරුව පද්ධතියේ පුළුල් ලෙස භාවිතයට (island wide implementation) සිදුකිරීම ආරම්භ කරන ලද බව, මෙම පද්ධතිය සංවර්ධනය කළ මොඩියුල පූර්ණ ලෙස නිරීක්ෂණය කර, ඉන් පසුව තාක්ෂණික ඇගැයීම් කමිටුවක් මගින් ඇගයීමට ලක් කර එම මොඩියුල්වලට අදාළ ගෙවීම් පමණක් සිදුකර ඇති බව, එම තාක්ෂණික ඇගැයීම් කමිටුව සෞඛ්‍ය තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු, වෛද්‍ය සැපයුම් අංශයේ නියෝජිතයෙකු, ප්‍රධාන ගණකාධිකාරිවරයෙකු සමන්විත වූ බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	vii. සෞඛ්‍ය අංශයේ ආයතන විශාල සංඛ්‍යාවක් සම්බන්ධීකරණය කෙරෙන මෙවන් සංකීර්ණ පද්ධතියක් අදියර වශයෙන් හඳුන්වා දීමටත්, ප්‍රමාණවත් කාලයක් පද්ධති දෙකම සමාන්තරව ක්‍රියාත්මක කරවීම (Parallel Run) සිදුකිරීමටත් කටයුතු නොකර පැවති Pronto පද්ධතිය භාවිතා කිරීම අත්හිටුවා ස්වස්ථ පද්ධතිය 2023 ජූලි 09 වන දින සිට ක්‍රියාත්මක කිරීමට අනිවාර්ය කර තිබුණි.	-එම-	තොග කළමනාකරණය මධ්‍යගතව සිදුවන නිසා එකම තොගය පද්ධති දෙකක් මගින් කළමනාකරණය කිරීමේදී තොග තුලනය කිරීම නිවැරදිව සිදුකිරීමට නම් එම පද්ධති දෙක අතර සජීව අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය බව, නමුත් ප්‍රායෝගිකව සමාන්තර පද්ධති දෙකකට දත්ත ඇතුළත් කිරීම හා දත්ත කළමනාකරණයේ දී ඇති වූ අපහසුතා හා ගැටලු හේතුවෙන් මධ්‍යගතව පවත්නා තොගයක් පද්ධති දෙකක් මාර්ගයෙන් පරිභෝජනය කිරීමේදී තුලනය කිරීම හා පවත්නා සංකීර්ණ ගැටලුකාරී තත්ත්ව හා ස්වස්ථ පද්ධතිය සම්බන්ධ SLT සම්බන්ධතාවය හා Pronto පද්ධතිය සම්බන්ධ Dialog APN සම්බන්ධතාවය ද එක විට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික පහසුකම් බහුතරයක් රෝහල් සතුව නොමැතිවීම් නිසාවෙන් සමාන්තර පරීක්ෂාවන් ප්‍රායෝගිකව දීර්ඝකාලීනව සිදු කිරීමට නොහැකි වූ බව, එසේම ස්වස්ථ පද්ධතියට උපදේශනය සපයන කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක ඒකකය මගින් සමාන්තර පරීක්ෂාවක් සිදු කිරීම සති දෙකක පමණ කාලයක් යෝග්‍ය බව පැවැති මෙහෙයුම් කමිටු රැස්වීමේ දී දන්වා දන්වා සිටින ලද බව.

	viii. ස්වස්ථ පද්ධතිය ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් මතු වී ඇති ගැටළුකාරී තත්ත්වය පිළිබඳව වෛද්‍ය සැපයීම් අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා ශික්ෂණ රෝහල්, දිස්ත්‍රික් රෝහල්, මූලික රෝහල් ආවරණය කරමින් දිවයින පුරා ප්‍රාදේශීය වශයෙන් ඇති රෝහල් 28 ක් හා ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශ (RMSD) 12 ක් 2023 ජුනි මස 30 දින විගණන පරීක්ෂාවකට ලක් කෙරුණි. එහිදී මෙම පද්ධතියේ පරිශීලකයන්ගේ අවශ්‍යතාවයට ගැලපෙන අයුරින් පද්ධතිය සංවර්ධනය නොවීම නිසා පද්ධතිය දෛනික කටයුතු සඳහා භාවිතා කිරීමේදී විවිධ ගැටළු හටගෙන තිබුණු බවත්, පැවති Pronto පද්ධතියේ දත්ත මෙම පද්ධතියට සමායෝජනය කිරීමේදී දත්තවල නිවැරදි භාවය පිළිබඳ ගැටළු හටගෙන තිබුණු බවත්, වෛද්‍ය සැපයීම් ජාලයට සම්බන්ධ වන ප්‍රධාන ආයතන වන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, වෛද්‍ය සැපයීම් අංශය, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වැනි ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැගෙන පරිදි මෙම පද්ධතියට සම්බන්ධ කර නොතිබුණු බවත්, දත්ත ඇතුළත් කිරීමේදී සහ දත්තවල ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් පාලනයන් ස්ථාපිත කර නොබුණු බවත්, තොග කළමනාකරණ තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි වාර්තා ලබා ගත නොහැකි බවටත් නිරීක්ෂණය විය.	-එම-	මෙම පද්ධතිය පූර්ණ ලෙස භාවිතයට ගැනීම 2023/06/09 දින සිට ආරම්භ කළ බව, මෙම විශේෂ විගණන පරීක්ෂණය 2023/07/17 දින සිදුකළ අතර ඒ වන විට මෙම පද්ධතිය හඳුන්වා දී දින 38 ක් පමණක් ගත වී තිබුණු බව, පැරණි පද්ධතියෙන් අලුත් පද්ධතියකට මාරුවීමේදී පාරිශීලකයින් කොපමණ පාලක තත්ත්වයටතේ පුහුණු කළද විවිධ ගැටලු, පුහුණුවීමෙන් ලද දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීමේදී අත්වන ගැටලු, පරිගණක දෘඩාංග ආශ්‍රිතව ඇතිවන ගැටලු, අන්තර්ජාල හා සම්බන්ධ වීමේදී ඇතිවන ගැටළු ආදී විවිධ ගැටළු මතුවීම සාමාන්‍යයෙන් සිදුවන අතර එම ගැටලු මගහරවා ගැනීම සඳහා විශේෂ දුරකථනය අංකයක්, Helpdesk, WhatsApp ආදි උපකාරක සේවා පැවැත්වීමට කටයුතු කරන ලද බව, පැය 24 පුරාම පැවැති මෙවන් ක්‍රියාවලි, online හා Physical Training Programs මගින් මෙම ගැටලු නිරාකරණය කිරීමට හැකියාව ලැබී ඇති බව, එසේම පද්ධති පාරිශීලකයින් සඳහා අවශ්‍ය සියලුම ආකාරයේ වාර්තා ලබා ගැනීමේ පහසුකම්, Dashboard පහසුකම් මේ වනවිට පූර්ණ ලෙසම සියලුම ග්‍රාහකයින් වෙත ලබා දී ඇති බව, මේ වන විට සියළුම රෝහල්, ප්‍රාදේශීය ඖෂධ සැපයුම් ඒකක, වෛද්‍ය සැපයුම් ඒකකය,

			රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ආදී ආයතනවල වෛද්‍ය සැපයුම් ක්‍රියාවලිය සම්බන්ධ කටයුතු සඳහා එම ආයතන මනා සම්බන්ධයකින් කාර්යයන් සිදුකිරීම සඳහා ස්වස්ථ පද්ධතිය භාවිතා කරන බව.
	ix. මෙම ස්වස්ථ පද්ධතියේ සංවර්ධන කටයුතු අවසන් කරන ලද එක් එක් මොඩියුලයට අදාළව පරිශීලක පිළිගැනීමේ (User Acceptance) සහතික ලබා ගෙන නොතිබුණි. ඒ වෙනුවට පද්ධතියට අදාළ පවත්වා තිබුණු වැඩමුළුවලට සහභාගී වූ අයගේ පැමිණීමේ ලේඛන User Acceptance සහතික ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර මෙම පැමිණීමේ ලේඛනවල රියදුරන්ගේ නම් ද සටහන් කර තිබුණි.	-එම-	User Acceptance සඳහා තනි තනි පුද්ගලයන් වශයෙන් නොව වැඩමුළු පවත්වා ඇති බව, ඒ පිළිබඳ තොරතුරු විගණනයට ලබා දී ඇති බව, වැඩමුළු පැවැත්වීම සිදු කිරීමේදී එම වැඩමුළුවලට සහභාගි වූ පුද්ගලයින්ට ආහාර ලබා දීම සඳහා ඔවුන්ගේ රියැදුරන්ගේ නාමලේඛනද අවශ්‍ය වන බැවින් රියදුරන්ගේ නම් ලබාගැනීම සිදුකර ඇති බව.
	x. 2023 ඔක්තෝබර් 20 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ අනුකාරක සභාවේ නියෝගයක් අනුව මෙම පද්ධතිය ඇතුළුව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ පරිගණක පද්ධති පිළිබඳ මොරටුව විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණු වාර්තාව මගින් ද ඉහතින් දැක්වූ අඩුපාඩු නිරීක්ෂණය කර තිබුණු අතර ස්වස්ථ පද්ධතියට අදාළව එහි වූ නිර්දේශයන් පහත පරිදි විය.		
	➢ අවශ්‍යතා එකතු කිරීම, යෙදුම් සැලසුම් කිරීම, යෙදවීමේ ප්‍රවේශය, ක්‍රියාත්මක කිරීම, පරීක්ෂා කිරීම සහ ඒකාබද්ධ කිරීමේ අදියර ඇතුළුව අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා	මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කළ යුතුය.	මොරටුව විශ්ව විද්‍යාලය මගින් ස්වස්ථ පද්ධතිය පිළිබඳ පරීක්ෂණ සිදු කිරීම සඳහා පරිශීලක ප්‍රවේශ, පරිශීලක නාම, මුරපද

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ස්වස්ථ පද්ධතිය අඛණ්ඩව පවත්වා ගෙන යාමට හෝ වැඩිදියුණු කළ හැකිද යන්න තීරණය කිරීම සඳහා ස්වස්ථ පද්ධතිය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් සිදු කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය තොරතුරු අංශය, ස්වාධීන තාක්ෂණික විශේෂඥයින් හා වෙනත් පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් විශේෂඥ කමිටුවක් පත්කිරීම.		ලබා ගැනීමක් මේ වනතුරු සිදුකර නොමැති බව, එසේම පද්ධතිය පිළිබඳ අවබෝධයක් සහිත වෛද්‍යවරු, පරිගණක තාක්ෂණ ශිල්පීන්, පද්ධති සංවර්ධන නිලධාරීන්, මෘදුකාංග ඉංජිනේරුවන් සමඟ නිල වශයෙන් පද්ධතියට ඇතුළත් වී නිල සමායෝජනයක් සිදු කර නොමැති බව, මෙය 2024/04/26 දින පැවැත්වූ COPA රැස්වීමේදී ද සෞඛ්‍ය අමාත්‍යාංශය නිල වශයෙන් ප්‍රකාශ කරන ලද බව, එමෙන්ම COPA රැස්වීමේදී අදාළ මොරටුව විශ්වවිද්‍යාල නියෝජිතයින් එය පිළිගත් අතර ඔවුන් විවිධ ලේඛන, පැමිණිලි හා ඔවුන් වෙත විවිධ පාර්ශව යොමු කළ වාචික ප්‍රකාශ අනුව එම පරීක්ෂණය සිදුකළ බව COPA කමිටුවට දැනුම් දෙන ලද බව, එසේම මෙම වාර්තාව 2024/06/12 වන දින වන විටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඖෂධ නිෂ්පාදනය සැපයීම් හා නියාමන අංශය වෙත ලබා දී නොමැති අතර එබැවින් එහි අන්තර්ගතය හෝ නිර්දේශ පිළිබඳ කිසිදු අදහසක් ප්‍රකාශ කිරීමේ හැකියාවක් නොමැති බව, එම වාර්තාව නිල වශයෙන් ලැබුණු පසු මෙම පද්ධතියේ තාක්ෂණික උපදේශනය සපයන කොළඹ විශ්ව විද්‍යාලය සමඟ සාකච්ඡා කර එම කරුණු හා පද්ධතිය එකිනෙක නැවත පරීක්ෂාකර බලා	

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			වෙනස්කම් අවශ්‍ය වේ නම් එම වෙනස්කම් සිදුකිරීමට හැකියාව ඇති බව.
	➢ එම විශේෂඥ කමිටුව ලබාදෙන නිර්දේශ මත සිදුකළ යුතු වෙනස්කම් කොන්ත්‍රාත්කරු විසින් සිදු කිරීම.	-එම-	-එම-
	➢ ස්වස්ථ පද්ධතියේ සැලැස්ම හා සංවර්ධනය ප්‍රමාණවත් නොවන බවට විශේෂඥ කමිටුව තීරණය කරන්නේ නම් අමාත්‍යාංශය විසින් නව පද්ධතියක් නැවත සකස් කිරීම සිදු කළ යුතු බවත්, ඒ අතර කාලය තුළ පැවති MSMIS පද්ධතිය භාවිතා කිරීම කළ හැකි බව.	-එම-	-එම-
	xi. එවක සිටි සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2021 දෙසැම්බර් 10 දිනැතිව ඉදිරිපත් කරන ලද අංක අමප/21/2156/309/123 දරන නව තොරතුරු කළමනාකරණ පද්ධතිය "ස්වස්ථ හඳුන්වා දීම" ට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් එවකට පැවති පද්ධතිය සත්‍ය පරිභෝජන දත්ත ලබා ගැනීමට සහ ඖෂධ පරිභෝජන රටාව මත වාර්ෂික ඖෂධ ඇස්තමේන්තු කිරීම සඳහා සහාය නොදක්වන බවටත්, සියළු සෞඛ්‍ය ආයතන එකිනෙකට සම්බන්ධ කරමින් වාට්ටු සහ ෆාමසි කවුන්ටර් මට්ටම් දක්වා සියළු ආයතන සමඟ සන්නිවේදනය කිරීමට ස්වස්ථ පද්ධතිය සැලසුම් කර නිර්මාණය කර හඳුන්වා දෙන බවටත් දක්වා තිබුණි. ඒ අනුව ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද යොමුකිරීමේ අනුදේශ (Terms of Reference) අනුව වෛද්‍ය සැපයීම් සම්බන්ධ විස්තීරණ තොරතුරු කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීමටත්, රෝහල් සම්බන්ධ රෝගීන්ගේ දත්ත විශ්ලේෂණය, රෝගීන් ඇතුළත් කිරීම, ලියාපදිංචිය, මුදාහැරීම, බෙහෙත් වට්ටෝරු ජනනය ඇතුළු මොඩියුල සඳහා 2022 දෙසැම්බර්	-එම-	2018 සිට මෙතෙක් ඉදිරිපත් කර ඇති 2018,2022,2024 විශේෂ විගණන වාර්තාවලට අනුකූලව වාර්ෂික ඇස්තමේන්තු සත්‍ය පරිභෝජන දත්ත පදනම්ව සිදු කළ යුතු බව ඉතා දැඩි ලෙස නිර්දේශ කර ඇති බව, ඒ අනුව රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස වාර්ෂික ඇස්තමේන්තු සැකසීම සත්‍ය පරිභෝජන දත්ත මත පදනම්ව සිදුකිරීමට තීරණය කරන ලද බව, ඒ අනුව ස්වස්ථ පද්ධතිය නිර්මාණය කර ඇති අතර, එම පද්ධතිය මගින් වෛද්‍යවරයා බෙහෙත් වට්ටෝරු නිකුත් කිරීම හා ඖෂධවේදීන් බෙහෙත් වට්ටෝරුව නිකුත් කිරීම ග්‍රහණය කොට සත්‍ය පරිභෝජනය තත්කාලීන ලෙස ගණනය කිරීමට හැකිවන ලෙස නිර්මාණය කර ඇති

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	31 දින වන විට රු.මිලියන 15 ක් ගෙවීම් සිදුකිරීමටත් කටයුතු සිදුකර තිබුණි. නමුත් රජයේ සියළුම රෝහල්වලට අදාළව ඖෂධ තොග කළමනාකරණයත්, රෝගී සත්කාර කළමනාකරණයත් එක් පද්ධතියක් හරහා ආවරණය කෙරෙන අයුරින් සැලසුම් කර තිබුණු මෙම ස්වස්ථ පද්ධතිය වර්තමානය වන විට පෙර පැවති Pronto පද්ධතිය ක්‍රියාත්මක වූ පරිදි රෝහල් ඖෂධ ගබඩාව දක්වා පමණක් තොරතුරු එක්රැස් කර ගත හැකිවන අයුරින් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබුණි. එසේම රෝහල් විසින් සිදුකරන ඇතැම් වෛද්‍ය සායන දක්වා ද තොරතුරු රැස්කිරීමට මෙම පද්ධතිය භාවිතා කිරීමට සැලසුම් කරන බව අමාත්‍යාංශය විසින් දන්වා තිබුණ ද එම සායන මොනවාද යන්න නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.		බව, එමෙන්ම රෝගීන් PHN (Personal Health No) අනුව හඳුනා ගැනීමත්, ඔවුන්ට එකම ඖෂධ නැවත නැවත නිකුත්වීම හඳුනා ගැනීම ආදී පහසුකම් ලබා දී ඇති බව, මේ වන විට පද්ධතිය මගින් බෙහෙත් වට්ටෝරු මිලියන 1.6ක් පමණ නිකුත් කර ඇති බව, ඒ අනුව MSMIS ස්වස්ථ මෘදුකාංග මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය සතු සියලුම රෝහල්වල රෝගියාගේ බෙහෙත් තුණ්ඩුව දක්වා පරිගණකගත කිරීමට අමාත්‍යාංශයේ මූල්‍යමය ප්‍රමුඛතා සහ ප්‍රතිපත්තිමය තීරණ වලට යටත්ව සිදුකළ හැකි බව, රටේ පවත්නා ආර්ථික තත්ත්වය යටතේ මෙම අවස්ථාවේදී රටේ සියලුම රෝහල්වල OPD, Clinic හා Pharmacy counter සඳහා ව්‍යාප්ත කිරීමට පරිගණක hardware ලබා ගැනීමට ඇති නොහැකියාව හේතුවෙන් පද්ධතිය ඖෂධ ගබඩා දක්වා සෑම රෝහලකමද, අවශ්‍ය hardware සපයාගත හැකි ආයතන වලට තව දුරටත් ව්‍යාප්ත කිරීම සිදුකරන බව.
	xii. ස්වස්ථ පරිගණක පද්ධතියේ පවතින ගැටළු හේතුවෙන් 2023 අගෝස්තු මාසයේ සිට විගණිත දිනය වූ 2023 නොවැම්බර් 29 දින දක්වා වූ කාලය තුළ වෛද්‍ය සැපයීම් මිලදී ගැනීමට අදාළව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත නිරවුල් නොකළ හර නිවේදන පත්‍ර වටිනාකම රු.20,202,740,429 ක්වූ අතර සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතිය මත දෝෂ සහිතව මුද්‍රණය වූ වවුචර්පත් පවත්නා ලේඛන සමඟ සන්සන්දනය කර විෂය භාර නිලධාරීන් විසින් මුද්‍රිත වවුචර්පත්	-එම-	2023 අගෝස්තු මාසයේ සිට විගණන දිනය දක්වා තිබූ නිරවුල් නොකළ හර නිවේදන පත් සංඛ්‍යාවේ වටිනාකම රු.20,202,740,429 ක් ලෙසට දක්වා ඇති බව, අද දිනය (2024/03/06) වන විට ගැටළුකාරී තත්ත්වයන් යම් දුරකට නිරාකරණය කර ගෙන “SWASTHA”

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	අතින් නිවැරදි කර ගෙවීම් සඳහා ඉදිරිපත් කිරීමෙන් පසු ඉන් 2024 මාර්තු 06 දින වන විට තවදුරටත් නිරවුල් නොකළ හර පත්‍ර වටිනාකම රු.10,989,442.187 ක් විය.		පරිගණක පද්ධතියෙන් ගෙවීමට යොමු කරන ලද හර නිවේදන පත් වටිනාකම රු. 9,213,298,242 ක් බව, ඒ අනුව තව දුරටත් 2024/03/06 දිනය වන විට නිරවුල් කිරීමට ඇති හර නිවේදනපත් සංඛ්‍යාව රු.10,989,442,186 ක් බව, එම හර නිවේදනපත් වල පවතින දෝෂ "SWASTHA" අංශයේ නිලධාරීන් හා SPC ආයතනයද සම්බන්ධ කර ගනිමින් නිවැරදි කිරීම් කටයුතු සිදු කරමින් නිරවුල් කිරීමට කටයුතු කරමින් ඇති බව.
	xiii. ස්වස්ථ පරිගණක පද්ධතිය තුළ වටිනාකම් නිවැරදිව සටහන් නොවීම, ප්‍රමාද ගාස්තු සටහන් නොවීම ආදී අඩුපාඩු හේතුවෙන් වෛද්‍ය සැපයීම් මිලදී ගැනීමට අදාළව 2023 අගෝස්තු සිට 2023 නොවැම්බර් 29 දින දක්වා කාලයට අදාළව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත ඉන්වොයිසිපත් 653 කට අදාළව ගෙවිය යුතු රු. 5,678,913,028 කින් ඉන්වොයිසිපත් 343 කට අදාළ රු. 2,982,951,254 ක් 2024 මාර්තු 06 දින වන විටත් ගෙවීම් කර නොතිබුණි.	-එම-	විගණිත දිනය වන විට ගෙවීමට තිබූ මෙම INVOICE 653 න් "SWASTHA" පරිගණක පද්ධතියේ ගැටළු නිවැරදි වීමෙන් පසු INVOICE 310 ක් පමණ ගෙවීම සඳහා යොමු කර ඇති බව, එම ප්‍රමාණයේ දළ වටිනාකම 2,695,961,774 ක් පමණ බව.
	xiv. සෞඛ්‍ය අංශයට අදාළ සියළුම රජයේ රෝහල් සහ ආයතනවල වෛද්‍ය සැපයීම් කළමනාකරණය සඳහා වූ විස්තීරණ තොරතුරු කළමනාකරණ පද්ධතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද මෙවන් සංකීර්ණ පද්ධතියක් නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව සංවර්ධනය කර තිබීම නිසා රජයට කිසියම් අලාභයක් හෝ අතිරේක පිරිවැයක් දැරීමට සිදු කර තිබේද යන්න ස්වාධීන සහ විශේෂඥ දැනුමක් සහිත කමිටුවක් මගින් පරීක්ෂා කර ඊට වගකිවයුතු පාර්ශවයන්ට	-එම-	2025 වර්ෂය සඳහා ස්වස්ථ පද්ධතිය මගින් මාර්ගගතව (Online) වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ ආයතන හා ගබඩා ගණන 2360 ක් බව, 2024/05/01 දින වන විට අවම වශයෙන් ඇණවුම් 05 ක් ස්වස්ථ පද්ධතිය මගින් ලබා ගැනීම සිදුකළ ආයතන හා ගබඩා ගණන 1891 ක් බව, පෙර පැවැති

	එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවයත්, වෛද්‍ය සැපයීම් කළමනාකරණය සඳහා නිවැරදි සහ යාවත්කාලීන තොරතුරු සැපයෙන තොරතුරු පද්ධතියක් කඩිනමින් ස්ථාපනය කර පවත්වා ගැනීමේ අවශ්‍යතාවයත් විගණනයේදී නිරීක්ෂණය කෙරේ.		MSMIS Pronto පද්ධතිය ව්‍යාප්තව පැවැතියේ MSD හා RMSD ගබඩා ඇතුළුව ආයතන 250ක පමණ ප්‍රමාණයක බව, ඒ සඳහා User Licence 502 පමණ භාවිතා කළ බව, ඒ අනුව අවම වශයෙන් ලංකාවේ පවතින සියලුම වෛද්‍ය ආයතන (1159 පමණ) සහ සෞඛ්‍ය වෛද්‍ය ආයතනයන්හි (350 පමණ) ප්‍රධාන ගබඩා ඒකකයක් දක්වා පමණක් ව්‍යාප්ත කළ ද අමතර User Licence 1000 ක් පමණ මිලදී ගත යුතු බව, ප්‍රධාන රෝහල්වල ප්‍රධාන ගබඩා (Pharma, Surgical, Consumable, Non consumable, Lab, Radiology) ආදී ලෙස කිහිපයක් පවතින බැවින් එම පද්ධති පරිශීලකයින් සඳහාද License මිලදී ගැනීමට අවශ්‍ය බව, 2020 වසරේ විනිමය අනුපාතය අනුව User Licence එකක් සඳහා රු 296,177 ක් වැය වී ඇති බව, ඒ අනුව 2020 වර්ෂයේ විනිමය අනුපාතයට අනුකූලව තව User Licence 1000 ක් ලබා ගන්නේ නම් පමණක් වැය වන මුදල රු. 296,176,000 ක් (මිලියන 296 ක් පමණ) බව, MSMIS ස්වස්ථ පද්ධතිය නිර්මාණය කිරීම සඳහා වැය වන මුළු මුදල වසර තුනක නඩත්තු වියදම් සහිතව රුපියල් මිලියන 101ක් බව, මේ වන විට MSMIS ස්වස්ථ පද්ධතිය ආයතන 1891 දක්වා ව්‍යාප්ත වී ඇති අතර එම ආයතන සඳහා එක් පරිශීලකයකුට පමණක් User

			Licence මිලදීගෙන MSMIS Pronto පද්ධතිය ව්‍යාප්ත කළේ නම් යන වියදම රු 560,066,244 ක් (මිලියන 560 ක් පමණ) බව, මේ වන විට MSMIS ස්වස්ථ පද්ධතිය තුළ පද්ධති පරිශීලකයින් 12,000ක ප්‍රමාණයක් එදිනෙදා වැඩ කටයුතු සිදු කරනු ලබන ලබන බව, ඒ අනුව දැනටමත් මෙම පද්ධතිය රජයට ඉතා විශාල සෘජු මූල්‍යමය ප්‍රතිලාභයක් සිදුකර ඇති බව.

3.5 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
(අ)	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2011 ඔක්තෝබර් 31 දින අංක **SAS/SA**/07/11 දරන ලිපිය මගින් සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන් හා ආයතන ප්‍රධානීන් වෙත යොමුකරන ලද ලිපිය මගින් ලබා දී තිබුණු නියෝග වලට අනුකූල නොවන පරිදි කුරුණෑගල ශික්ෂණ රෝහල් බලධාරීන් විසින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරික්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. 2012 වර්ෂයේදී සිට සියළුම රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන විසින් ආපනශාලා සේවාවන් සඳහා ලංසුකරුවන් තොරා ගැනීම ඒ ඒ ආයතන විසින් සිදුකළ යුතු බවත්, අපනශාලාවලට අදාළ විදුලිය හා ජලය සඳහා වියදම් ආපන ශාලා පවත්වාගෙන යන පුද්ගලයින් විසින්	මේ සම්බන්ධයෙන් පූර්ණ ස්වාධීන විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන්	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	දැරිය යුතු බවත්, ආපනශාලා කුලී රජයේ ආදායමට බැරකළ යුතු බවත්, ඉහත ලිපිය මගින් දන්වා තිබුණි. නමුත් කුරුණෑගල ශික්ෂණ රෝහල් බලධාරීන් විසින් මෙම නියෝගයන්ට පටහැනිව රෝහල් ගොඩනැඟිල්ලක් සමුපකාර සමිතියක් වෙත විධිමත් ලිඛිත ගිවිසුමක් රහිතව කුලියට ලබා දී එම ගොඩනැගිල්ලේ ආපනශාලාව, සන්නිවේදන පියස හා ඊට අදාළ භූමිය අදාළ සමුපකාර සමිතිය විසින් වෙනත් පාර්ශවයන් වෙත බදු දීම හේතුවෙන් වර්ෂයකට රු.6,085,200 ක පමණ රාජ්‍ය ආදායම අහිමි කිරීමක් සිදුකර තිබුණි.	සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	
	ii. 2016 අගෝස්තු දක්වා මේ ආකාරයට කටයුතු කිරීම හේතුවෙන් රජයට සිදුවූ පාඩුව මාස 3 ක කාලයක් තුළ අයකර ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම් හෝ සිදු කරන ලෙස 2021 අප්‍රේල් 09 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නියෝග කළද 2024 මාර්තු දක්වා එම මුදල අයකර ගැනීමට නොහැකිවී තිබුණි.	-එම-	-එම-
(ආ)	මහනුවර ජාතික රෝහලේ සේවයේ නියුතු සෞඛ්‍ය රියදුරෙකු 2018 වර්ෂයේ සිට 2023 ජූලි 31 දින දක්වා කිසිදු රාජකාරියක් ඉටු කර නොතිබුණි. ඔහුවෙත එම කාලය තුළ රෝහලේ බලධාරීන් විසින් කිසිදු රාජකාරියක් පවරා නොතිබුණු අතර එම කාලයට අදාළව වැටුප් ලෙස රු. 2,732,944 ක් ගෙවා තිබුණි.	මේ සම්බන්ධයෙන් පූර්ණ ස්වාධීන විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම රියදුරු විසින් ලබා ගෙන තිබූ වැටුප් රහිත නිවාඩු ගණනය කොට 2023 මැයි මස දින 20 සඳහා රු.31,219 ක්, 2023 ජූනි මස දින 20 ක් සඳහා රු.43,551 ක් සහ 2023 ජූලි මස දින 10 ක් සඳහා රු.15,609 ක් ද වශයෙන් දින 57 ක් සඳහා මුළු මුදල රු.90,380 ක් වශයෙන් ගණනය කර 2023 සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලට අදාළ වැටුපෙන් අයකර රජයේ ගිණුමට බැර කළ බව, එමෙන්ම, 2023 දෙසැම්බර් සහ 2024 ජනවාරි මස වැටුපෙන් 2022.01.01 දින සිට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			2022.06.30 දින දක්වා කාලය තුළ වැටුප් රහිත නිවාඩු දින 47 ක් සඳහා රු.75,811 ක මුදලක් අය කර ඇති බව, ඉතිරි කාල සීමාව සඳහා වැටුප් රහිත නිවාඩු ගණනය කරමින් පවතින අතර එම ගණනය කිරීම් සිදු කර අය කිරීම් වාර්තා කරන බව, තවද, මේ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් ආරම්භ කර ඇති අතර මූලික පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව අවශ්‍ය වූවහොත් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා අවශ්‍ය නිර්දේශ සහිතව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන බව.
(ඇ)	2015 මැයි 28 දිනැති අංක 01 - 21/2015 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 06 ඡේදයට අනුව කනිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා උදැසන ආහාර සැපයීම සම්බන්ධව කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබියදී සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහලේ සහ ගම්පොළ ශික්ෂණ රෝහලේ කනිෂ්ඨ සේවකයින්ට උදැසන ආහාර වේලක් ලබා දීමට කටයුතු කර තිබුණි.	මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය.	කණිෂ්ඨ සේවකයින් සඳහා උදැසන පාන් හා තේ වේල වෙනුවට බත් ආදේශ වූ ආකාරය පිළිබඳ මධ්‍යම පළාත් රෝහල් සඳහා වන විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදීද 2024.04.08 දින සාකච්ඡාවට ලක් වූ බව, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද අභ්‍යන්තර ලිපි අංක **SAS/TB/**04/48/2007 හා 2007.11.01 දිනැති ලිපිය අනුව උදැසන ආහාර වේල සඳහා පාන් වෙනුවට බත් ලබා දී ඇති බව, මේ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සොයා බලා ඉදිරියේදී අප වෙත දැනුම් දෙන බව ඉහත විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන් විසින් දන්වා

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			සිටින ලද බව, කෙසේ වෙතත් කරුණු අධ්‍යනය කර ඉදිරියේදී මේ සම්බන්ධව දැනුවත් කිරීමට බලාපොරොත්තු වන බව.
(ඇ)	2015 මැයි 28 දිනැති අංක 01-21/2015 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව මාසිකව සපයනු ලබන සේවකයන්ගේ ආහාර වෙනුවෙන් 1979 මැයි මස 25 දිනැති අංක SDA/04/79 දරන සෞඛ්‍ය පොදු චක්‍රලේඛය අනුව සේවකයාගේ වැටුපෙන් මාසිකව රු.10 ක් වැනි සුළු මුදලක් අයකර තිබුණි. 1979 වර්ෂයට සාපේක්ෂව ආහාරවල මිල කිහිප ගුණයකින් ඉහළ ගොස් ඇති අතර වැටුප් ඉතා ඉහළ අගයකින් වැඩි වී ඇත. වසර 44 ක සිට නොවෙනස් ගාස්තුවක් අය කිරීම හේතුවෙන් රජයට විශාල පිරිවැයක් දැරීමට සිදුවී ඇති අතර සේවකයින් හට ආහාර ලබා දීම සිදු කරනු ලබන්නේ නම් එය රජයට වැය බරක් නොවන පරිදි පිරිවැය ආවරණය වන පරිදි ක්‍රමවේදයක් සකස් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය මේ දක්වා කටයුතු කර නොතිබුණි.	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි.
(ඉ)	2022 ජනවාරි 21 සිට මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය සහ සිසිලි හනාරෝ එන්කෙයා පුද්ගලික සමාගම සමඟ 2019 ජූලි 11 දින එළඹී තිබුණු තෙපාර්ශවික ගිවිසුම අනුව සිදුකර තිබුණි. එම ගිවිසුම අනුව කහ, රතු හා දම් පැහැති කසළ මළු (Garbage Bags) සහ රතු පටිය සහිත කහ පෙට්ටි සිසිලි හනාරෝ එන්කෙයා ආයතනය විසින් රෝහල වෙත සැපයිය යුතු අතර 2022 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කිසිදු අවස්ථාවක එම ආයතනයෙන් රෝහල වෙත කසළ මළු (Garbage Bags) සහ රතු පටිය සහිත කහ පෙට්ටි සපයා නොතිබුණි. සැපයිය යුතු කසළ මළු (Garbage Bags) සඳහා ගාස්තුවක්ද ඇතුළත්වන ලෙස 2022 වර්ෂයේ සිට 2023 ජූලි දක්වා සායනික අපද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 104,564 ක් සඳහා එකතුව රු.20,673,915 ක් එම ආයතනයට ගෙවීමට සිදුව තිබුණද රතු පටිය සහිත	ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2022 ජනවාරි 21 සිට මෙම රෝහලේ සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේදී සෞඛ්‍ය අමාත්‍යාංශය මධ්‍යම පරිසර අධිකාරිය හා සිසිලි හනාරෝ එන්කෙයා පුද්ගලික සමාගම අතර පවතින ගිවිසුම අනුව කහපාට සහ රතුපාට කසළ මළු සිසිලි හනාරෝ එන්කෙයා පුද්ගලික සමාගම විසින් රෝහල වෙත ලබා දිය යුතු වුවත් එම ආයතනය විසින් අදාළ කසළ මළු රෝහල වෙත ලබා දී නොතිබිණ බව, ඒ හේතුවෙන් එම කසළ මළු වෙනත් බාහිර පාර්ශවයක් වෙතින් මිලදී

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	කහ පෙට්ටි වෙනුවට රෝහලේ ආසාදිත පාලන ඒකක මගින් කාඩ්බෝඩ් පෙට්ටි භාවිතා කරමින් Sharp bin නිපදවමින් පැවති අතර කහ හා රතු කසළ මළු (Garbage Bags) මිලදීගැනීම වෙනුවෙන් රෝහලෙන්ද රු.2,070,004 ක් නැවත වියදම් දරා තිබුණි.		ගැනීම වෙනුවෙන් රෝහල විසින් දරා තිබූ රු.2,070,004 ක මුදල 2023 දෙසැම්බර් මස සිසිලි හනාරෝ එන්කෙයා පුද්ගලික සමාගම වෙතින් අයකරගත් බව.
(ඊ)	2022 දෙසැම්බර් 31 දිනැති මුදල් පාලන බලතල පැවරීම 2023 වර්ෂය යන මැයෙන් වූ සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛයේ 10.3.5 හි උපදෙස් අනුව ආපනශාලා වලින් හා අනෙකුත් විවිධ මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ආදායම් සුභ සාධක ගිණුම්වලට බැර නොකර රජයේ ආදායමට බැර කළ යුතු වූවද මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන් සඳහා වෙන් කර ඇති විවේකාගාර ගොඩනැගිල්ලේ වර්ග අඩි 492 ක් පමණ ප්‍රමාණයක් තුළ විශේෂඥ වෛද්‍යවරුන්ගේ හා වෛද්‍යවරුන්ගේ ආහාර අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා පෞද්ගලික පාර්ශවයක් විසින් පවත්වාගෙන යන ආපනශාලාව විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකර බදු කුලියක් රජයේ ආදායමට බැර නොවන ලෙස පවත්වාගෙන යන බවත් අදාළ ආපනශාලාවේ කටයුතු සඳහා භාවිතා කරන ජලය හා විදුලිය වෙනුවෙන් රෝහල විසින් වැය දරමින් පැවති බවත් නිරීක්ෂණය විය.	අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම රෝහලේ සියළුම වෛද්‍ය නිලධාරීන් සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා සහ පහසුකම් සැලසීම වෙනුවෙන් පැරණි රසායනාගාර ගොඩනැගිල්ලේ ඉහල මාලය වෛද්‍ය විවේකාගාරය සඳහා වෙන් කර දී ඇති බව, පළාත් සභාව මගින් රෝහල පාලනය කරන ලද අවධියේ සිටම මෙම ඒකකය පවත්වාගෙන යාම සඳහා විශේෂඥ වෛද්‍ය නිළධාරීන් ඇතුළුව වෛද්‍ය නිළධාරීන් විසින් සංගමයක් පිහිටුවා ඔවුන්ගේ අරමුදල් මගින් මෙම පහසුකම් ඔවුන් විසින්ම සපයාගෙන යනු ලබන අතර ඒ සඳහා රෝහල විසින් කිසිදු වියදමක් දරනු නොලබන බව, මෙම ඒකකය තුළ අංග සම්පූර්ණ රැස්වීම් ශාලාවක්, සන්නිවේදන ඒකකයක්, විවේකාගාරයක් සහ ආපන ශාලාවක් ඔවුන් විසින් ස්ථාපිත කරගෙන ඇති බව, මෙම ඒකකයන් ස්ථාපිත කිරීම වෙනුවෙන් රෝහල විසින් කිසිදු උපකරණයක් හෝ භාණ්ඩයක් සැපයීමක් සිදු කර නොමැති අතර එම ඒකකය සඳහා අදාළ ගොඩනැඟිල්ල පමණක් ලබා දීම සිදුකර

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

ඇති බව, එම ගොඩනැඟිල්ල සඳහා සපයා ඇති විදුලිය සහ ජලය සඳහා පමණක් රෝහල මඟින් ගෙවීම් සිදු කරනු ලබන බව, මෙම ඒකකයේ ස්ථාපිත කර ඇති ආපන ශාලාව සඳහා භාවිතා කරනු ලබන ජලය හා විදුලිය වෙනුවෙන් කිසිදු මුදලක් අය කර නොගන්නා බව විගණනය විසින් පෙන්වා දී ඇති අතර ඉහත සඳහන් කළ පරිදි මෙම ඒකකය වෛද්‍ය නිලධාරීන් විසින් ආරම්භ කර ඇති සංගමය මඟින් පවත්වාගෙන ගොස් ඇති බැවින් එම ජල බිල්පත් වලින් සහ විදුලි බිල්පත් වලින් රජය වෙත යම් ප්‍රතිශතයක් අයකර ගැනීම සම්බන්ධයෙන් මෙතෙක් අවධානය යොමු වී නොමැති බව, එබැවින් මෙම බිල්පත් අයකිරීම සම්බන්ධයෙන් විගණනය විසින් පෙන්වා දී ඇති ආකාරය අනුව එම ආපන ශාලාව වෙත සැපයෙන විදුලි සහ ජල සම්බන්ධතාවය සඳහා වෙන වෙනම මීටර් සවිකර එම වැයවන ඒකක අනුව මාසිකව භාවිතා කරනු ලබන ජලය සහ විදුලිය ප්‍රමාණය ගණනය කර එම ප්‍රමාණය රෝහලේ මාසික බිල්පත් වටිනාකම් වලින් අයකර ගැනීම සඳහා කටයුතු යොදා ඇති බව.

3.6 **වත්කම් කළමනාකරණය**

විගණන නිරීක්ෂණය		නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නමින් ලියාපදිංචි කරන ලද අංක PB-6544 දරන කැබ් රථය කිසිදු විධිමත් අනුමැතියක් රහිතව 2016 පෙබරවාරි 15 දින කඩුවෙල ප්‍රදේශයේ පිහිටි පුද්ගලික වාහන අළුත්වැඩියා කරනු ලබන ආයතනයක් වෙත රැගෙන ගොස් එය අළුත්වැඩියා කර නැවත ගෙන්වා ගැනීමට කටයුතු නොකර එම ආයතනය තුළ අතහැර දමා තිබුණු බව 2023 ඔක්තෝබර් 04 දින එම ආයතනයට ගොස් සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් තවදුරටත් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණුද නිරීක්ෂණය විය.		
	i.	මෙම වාහනය ක්ෂය රෝගය සහ මැලේරියාවට එරෙහිව සටන් කිරීමේ ගෝලීය ව්‍යාපෘතියට ලබා දී තිබුණු වාහනයක් බව විගණනයට ලැබුණු තොරතුරු අනුව නිරීක්ෂණය වූ අතර මෙම වාහනය ගංවතුර අවස්ථාවකදී ධාවනය කිරීමේදී වාහනයේ එන්ජිමට ජලය මිශ්‍ර වීම හේතුවෙන් හානියට පත්ව ඇති බවටත් ඒ බව සඟවා වාහනය පණ ගැන්වීමට හැකි ආකාරයට සකස් කර දෙන ලෙස දන්වා ගරාජයට භාරදී ඇති බවටත් තොරතුරු විගණනයට වාර්තා වූවත් ඒ බව සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.	මේ සම්බන්ධයෙන් පූර්ණ ස්වායත්ත විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ii. අමාත්‍යාංශය විසින් විගණනයට ලිඛිතව දන්වා තිබුණු පරිදි මෙම වාහනය අළුත්වැඩියාව සඳහා යොමුකර ඇති බව වාර්තා කර තිබුණි . නමුත් 2023 ඔක්තෝබර් 04 දින මේ පිළිබඳව ප්‍රවාහන අංශයේ නිලධාරීන්ගෙන් විමසීමේදී දන්වා සිටියේ මීට ප්‍රථමව සේවය කළ අධ්‍යක්ෂ (ප්‍රවාහන) තනතුර දැරූ නිලධාරින් දෙදෙනෙකු විසින් ලබාදුන් නියෝගයන්ට අනුව වාහන අළුත්වැඩියා ස්ථානවල සිදුකරන ලද භෞතික පරීක්ෂාවලදී මෙම වාහනය හඳුනා ගත් බවත් ඒ අනුව මෙම වාහනය අමාත්‍යාංශ සංචිත වාහනයක් ලෙස ලේඛනගත කළ බවත්ය. මේ ආකාරයට මෙම වාහනය කිසිදු විධිමත් යොමු කිරීමකින් තොරව අදාළ ගරාජය තුළ දිරාපත් වෙමින් පවතින බව වගකිව යුතු නිලධාරින් දෙදෙනෙකු විසින් හඳුනාගෙන තිබුණද විගණනය විසින් පරීක්ෂාවට ලක් කරන තුරු කිසිදු පියවරක් නොගැනීම ඉතාමත් අහිතකර හා වගකීම් විරහිතව කටයුතු කිරීමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.	-එම-	-එම-
	iii. මෙම වාහනය අදාළ ව්‍යාපෘතියට ලබා දීම, එය භාවිතා කිරීම, වාහනය හානියට පත්වන අවස්ථාවේදී වාහනය ධාවනය කළ කාර්යය හා ඊට සහභාගී වූ නිලධාරීන්, මෙම සිද්ධිය පිළිබඳව පොලිසියට පැමිණිලි කර තිබේද, මෙම වාහනය අළුත්වැඩියාව සඳහා නිෂ්පාදකයාගේ ඇස්තමේන්තුවක් ලබා ගත්තේද, එවැනි ඇස්තමේන්තුවක් ලබාගත්තේ නම් එම ඇස්තමේන්තුවට අනුව අළුත්වැඩියාව සිදු නොකිරීමට හේතුව, මෙම සිද්ධිය පිළිබඳව මූලික විමර්ශනයක් සිදු කලේද, සිදු කලේ නම් එහි නිර්දේශ මොනවාද, මෙම ගරාජය වෙත වාහනය රැගෙන යාමට අනුමැතිය ලබාදුන්නේ කවුද, එසේ රැගෙන යාම සඳහා හා එම ආයතනයෙන් වාහනය අළුත්වැඩියා කිරීමට ප්‍රසම්පාදන අනුමැතියක් තිබේද, වාහනය නැවත භාර ගැනීමට කටයුතු නොකිරීමට හේතුව, මෙම තත්ත්වය වගකිව යුතු පාර්ශවයන්ගෙන් වසන් කිරීම පිළිබඳව, තොරතුරු	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	දැනගැනීමෙන් පසුවද අමාත්‍යාංශ නිලධාරින් අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නොගෙන සිද්ධිය යටපත් කිරීමට කටයුතු කිරීම, මෙම තත්ත්වය තුළ වාහනයට සිදුවූ හානිය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම හා මෙම වාහනය සම්බන්ධයෙන් වහාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් පූර්ණ විධිමත් හා ස්වාධීන පරීක්ෂණයක් සිදු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන අතර දිගින් දිගටම විගණනය විසින් පෙන්වා දී තිබීයදීත් අමාත්‍යාංශ වාහන කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු නොකිරීම පිළිබඳව ඔබගේ කඩිනම් අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමි.		
(ආ)	හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයාට ලබා දී තිබුණු වාහන දෙකක්(02) 2024 මාර්තු 15 දින දක්වා නැවත අමාත්‍යාංශයට භාරදීමට කටයුතු කර නොතිබුණද ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර අදාළ වාහන නැවත අමාත්‍යාංශයට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර අදාළ වාහන නැවත අමාත්‍යාංශයට ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.
(ඇ)	කරාපිටිය ශික්ෂණ රෝහල සතුව ශ්‍රේණි 05 කට අයත් රජයේ නිවාස 84 ක් පැවතුණු අතර, එම සියළුම නිවාස මාසික ආර්ථික කුලී පදනම යටතේ විවිධ සේවාවන්වල සේවයේ නියුතු රෝහල් නිලධාරින්ට වෙන්කර ලබා දී තිබුණි. රජයේ නිල නිවාස සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදය හා සෞඛ්‍ය, මහාමාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ (සෞඛ්‍ය) අංක 1977 දරන හා 1997 ජුනි 06 දිනැති "නිල නිවාස පිළිබඳව පාලන කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් නිකුත් කර තිබුණු පොදු චක්‍රලේඛය ප්‍රකාරව රජයේ නිවාස සම්බන්ධයෙන් කටයුතු කළ යුතු අතර, ඒ පිළිබඳව සිදුකළ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	i. රෝහලේ රජයේ නිවාස වෙනුවෙන් 2023 වර්ෂයේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ආර්ථික කුලිය තක්සේරු කර රෝහලේ අධ්‍යක්ෂක වෙත ඉදිරිපත් කර තිබුණද, එම තක්සේරු කුලී අය නොකර 2019 වසරේදී තක්සේරු කර තිබුණු ආර්ථික කුලිය රජයේ නිවාසවලින් අයකිරීම නිසා විගණන පරීක්ෂාවට ලක්වුණු 2023 ජනවාරි මස සිට අගෝස්තු මාසය දක්වා කාලසීමාවට අදාළව එකතුව රු.3,262,800 ක්වූ රජයේ නිවාස ආදායම් අයකරගෙන නොතිබුණි.	ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.	එකඟ වන බව, ආයතන සංග්‍රහයේ **XIX** පරිච්ඡේදයේ 5:6 වගන්තියේ විධිවිධාන පරිදි අමාත්‍යාංශ ලේකම්ගේ අවසරය ලබා ගැනෙීමෙන් පසු හිඟ මුදල් සහිතව අය කිරීමට කටයුතු කරන ලද බව.
	ii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.1 වගන්තිය ප්‍රකාරව යම්කිසි තනතුරකට වෙන් කරන ලද නිල නිවාස හැර අනෙකුත් සියළුම නිවාසවල බදු කාලය වර්ෂ 05 ක් වූවත්, ඊට අනුකූල නොවී බදු කාල සීමාව ඉක්මවා වසර 01 ත් වසර 15 ත් අතර කාලයක් රජයේ නිවාසවල පදිංචිව සිටින නිලධාරීන් 19 දෙනෙකු නිරීක්ෂණය විය. ඒ අනුව එම නිලධාරීන් රජයේ නිවාසවලින් ඉවත් කර පොරොත්තු ලේඛනවල සිටින රජයේ නිවාස ඉල්ලුම්කරුවන්ට ඒවා ලබා දීමට රෝහලේ නිවාස වෙන්කරන නිලධාරියා විසින් විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි.	-එම-	එකඟ වන බව, නෛතික ක්‍රියාවලිය සඳහා උපදෙස් ලද පසු ඒ අනුව කටයුතු කරන බව, නෙරපා හැරීමේ නිවේදන නිකුත් කර ඇති බව.
	iii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 09 වන වගන්තිය ප්‍රකාරව රජයේ නිවාසයක අනවසරයෙන් හෝ බදු කාලය ඉක්මවා පදිංචිව සිටින නිලධාරීන් ඉවත් කිරීමට 1971 අංක 3 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 7 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතින් විධිවිධාන සැලදී තිබුණද, ඊට අනුකූලව කටයුතු කිරීමට රෝහලේ වගකිව යුතු නිලධාරීන් විසින් විගණිත දින වන විටත් සමත් වී නොතිබුණි.	-එම-	එකඟ වන බව, නිවාස බදු කාලය ඉක්මවා පදිංචිව සිටින නිලධාරීන් ඉවත් කිරීම සඳහා සෞඛ්‍ය ලේකම් විසින් 1969 අංක 7 දරණ රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීම) පනත යටතේ අස්කිරීමේ නිවේදන අදාළ නිලධාරීන් වෙත කිහිප අවස්ථාවකම නිකුත් කර ඇති බව, තවද මේ පිළිබඳව

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			නිරන්තරයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයද දැනුවත් කරමින් ලිපි යවා ඇති බව.
(ඇ)	කරාපිටිය ශික්ෂණ රෝහලේ වෛද්‍ය රසායනාගාර පරීක්ෂණ සඳහා 2017 වර්ෂයේදී මිලදීගෙන තිබුණු එකතුව රු.16,897,350 ක්වූ වෛද්‍ය රසායනාගාර පරීක්ෂණ උපකරණ 03 ක් වසර 07 ක කාලයක් තුළ කිසිදු රසායනාගාර පරීක්ෂණයක් සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවති බවත්, ඉන් එකතුව රු. 11,602,350 ක්වූ යන්ත්‍ර 02 ක් ඒවා මිලදීගත් දින සිටම භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණු බවත් නිරීක්ෂණය විය.	මේ සම්බන්ධයෙන් පූර්ණ ස්වාධීන විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	එකඟ වන බව, මෙම උපකරණ මිල දී ගැනීම් තීරණයේ සිට මිල දී ගැනීම දක්වා වූ සමස්ථ ක්‍රියාවලියම විමර්ශනයක් කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇති බව, එසේ වුවත් විමර්ශනය කරාපිටිය රෝහල මගින් කරන ලෙස 2024.02.22 දිනැති ලිපියෙන් දන්වා ඇති බව, මාගේ 2024.03.15 දිනැති ලිපියෙන් හදිසි වැටලීම් අංශයේ මගින් හෝ ස්වාධීන විමර්ශනයක් කරන ලෙස නැවත ඉල්ලා ඇති බව, එම විමර්ශනයේ තීරණ අනුව අවශ්‍ය කටයුතු කරන බව.
(ඉ)	2021 මාර්තු 04 දින ලෝක බැංකු ආධාර යටතේ කරාපිටිය ශික්ෂණ රෝහලට ලැබී තිබුණු රු. 3,346,500 ක් (ඇ.ඩො. 17,250) (ඇ.ඩො.1 = රු. 194) වටිනා MaXterile FL90 වර්ගයේ පීඩනතාප (Autoclave) යන්ත්‍රය එදින සිට එනම් වසර 02 ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. එමෙන්ම මුදල් රෙගුලාසි අංක 751 ප්‍රකාරව රජයේ ආයතනයකට ලැබෙන සියළුම භාණ්ඩ වහාම භාණ්ඩ ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, මෙම යන්ත්‍රය රෝහලට ලැබී වසර 02 ක් ඉක්ම ගියද, ඉන්වෙන්ට්‍රි ලේඛනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම මුදල් රෙගුලාසි අංක 756 ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන්වල දී ඒ සම්බන්ධයෙන් අනාවරණය වී නොතිබුණු බැවින් රෝහලේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු විධිමත් පරිදි සිදු වී නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	-එම-	දේශීය නියෝජිත ආයතනයේ තාක්ෂණික තොරතුරු ලබාගැනීමෙන් අනතුරුව **Biomedical Engineer (BME)** වෙත යොමුකර, **BME** උපදෙස් මත විදුලිය හා ජල සැපයුමත්, ජල අපවාහන නළ පද්ධතියත් ස්ථාපිත කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සපයා ගැනීමත්, අදාළ සම්බන්ධීකරණ කාර්යයනුත් සිදු කර යන්ත්‍රය ක්‍රියාකරවීමේදී නිරීක්ෂණය වූ විදුලි විසන්ධිවීම නිවැරදි කරගෙන, නිවැරදි ක්‍රියාකාරීත්වය සහතික කරන ලද්දේ 2023-07-12 දින බව, ඒ අනුව ඉන්වෙන්ට්‍රි ගත කර

			දැනට රසායනාගාරයේ පරිහරණයට යොදා ඇති බව.
(ඊ)	කරාපිටිය ශික්ෂණ රෝහලෙහි ස්ථාපිත සෙම්පටල පරීක්ෂණ ඒකකයට (stroke unit) අයත් හා දෙවන මහලෙහි ගබඩා කර තිබුණු අයිතම 10 කට අයත් උපකරණ ඒකක 45 ක් 2023 මාර්තු 16 වන දින සිට විගණිත දින දක්වාම භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.	මෙම උපකරණ පූර්ණ උපයෝජනය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.	එකඟ නොවන බව, ඕනෑම වෛද්‍ය උපකරණයක් ඉන්වෙන්ට්‍රි ගත කිරීම සිදු වනුයේ අදාළ අංශ විසින් විධිමත්ව අපේක්ෂිත කාර්යය යොදාගත හැකි බව තහවුරු කළ පසුව බව, මෙම යන්ත්‍රය කෝවිඩ් වසංගත තත්ත්වය තුළ සම්මත ක්‍රියාපරිපාටි අනුගමනය කර ක්‍රියාකාරීත්වය තහවුරු කර ගැනීම ප්‍රමාද විය ඒ තුළ ඉන්වෙන්ට්‍රි ගත කිරීමට ප්‍රමාද වී ඇති බව, කරාපිටිය ශික්ෂණ රෝහලේ **Stroke Unit** එකෙහි ගබඩා කර ඇති මෙහි සඳහන් උපකරණ අභිනවයෙන් ඉදිකරනු ලබන විශ්ව විද්‍යාල ඒකකය සඳහා 2023 මාර්තු 16 වන දින පරිත්‍යාග ලෙස ලැබී ඇති බව, මෙම උපකරණ පාවිච්චි කරන ලද ඒවා වන අතර විගණිත දින වන විටද ඒවායේ ඇතැම් කොටස් නොලැබී තිබුණු බව, මෙම උපකරණ විශ්ව විද්‍යාල ඒකකයට ලැබී ඇති බැවින් රෝහලේ වෙනත් වාට්ටු හා ඒකක වෙත නිකුත් කළ නොහැකි බව.
(උ)	සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මහනුවර ජාතික රෝහල වෙත 2018 ඔක්තෝබර් 30 දින ලබා දී තිබුණු රු.18,000,000 ක් වටිනා අංක LW - 1553 දරන බෙන්ස් වර්ගයේ ගිලන් රථය 2020 සැප්තැම්බර් 23 දින මහනුවර සිට කන්දකාඩු නිරෝධායන මධ්‍යස්ථානය වෙත ආසාදිත	මෙම වාහනයේ අළුත්වැඩියා කටයුතු අවසන් කර කඩිනමින් ප්‍රයෝජනයට ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම ගිලන් රථයේ අළුත්වැඩියා කටයුතු බොහෝමයක් මේ වන විට අවසන්ව ඇති අතර ගිලන් රථය සඳහා බැටරි සහ ටයර් අවශ්‍ය බව දන්වා එවා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	රෝගියෙකු ප්‍රවාහනය කර නැවත පැමිණෙමින් සිටියදී අනතුරකට ලක් වී තිබුණි. මෙම ගිලන්රථය අළුත්වැඩියාව සඳහා එහි රක්ෂණ නියෝජිත ආයතනයෙන් රු.8,300,000 ක ගෙවීමක් නිර්දේශ කර 2022 දෙසැම්බර් 08 දින රු.6,225,000 ක මුදලක් අළුත්වැඩියා කටයුතු සඳහා අදාළ සමාගමට ගෙවීම් කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටද අදාල වාහනය අළුත්වැඩියා කර නොතිබුණි.		ඇති බව, මේ සම්බන්ධයෙන් මෙම රෝහලේ කාර්මික නිලධාරී (ප්‍රවාහන) විසින් පරීක්ෂා කර ගිලන් රථයට ටයර් 5 ක් සහ බැටරි 02 ක් රක්ෂණ ආවරණයට යටත්ව මිලදී ගැනීම සුදුසු බව නිර්දේශ කර ඇති බව, එබැවින්, එම ටයර් සහ බැටරි මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතින බව.
(ඌ)	පේරාදෙණිය ශික්ෂණ රෝහලේ රෝගීන් ප්‍රවාහනය සඳහා භාවිතා කරන ලද අංක LW – 0523 දරණ රු 1,800,000 ක් වූ මයික්‍රෝ ගිලන් රථය එන්ජිම අළුත්වැඩියාවක් සිදු කළ යුතුව පැවති බැවින් 2019 වර්ෂයේ මැයි මස සිටද අංක 48-0415 දරන ගිලන් රථය 2022 ජනවාරි 22 දින අනතුරකට ලක් වී භාවිතයෙන් ඉවත් කර තිබුණද එම රථ අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීමට 2023 ජනවාරි 31 විගණන දින වන විටත් කටයුතු කර නොතිබුණි.	මෙම වාහන පිළිබඳව පරීක්ෂා කර කඩිනමින් සුදුසු පියවර ගත යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.
(එ)	පේරාදෙණිය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ නිල නිවාසය 2020 පෙබරවාරි 08 වන දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වසර 04 කට ආසන්න කාලයකට නිෂ්කාර්යව පවතින අතර එය අළුත්වැඩියා කර භාවිතයට ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.	මෙම නිල නිවාසය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම රෝහලේ අධ්‍යක්ෂ නිල නිවාසය සඳහා වෙන් කර ඇති නිල නිවාසය දැනට පදිංචි වීමට නොහැකි තත්වයේ පවතී.එනම් නිල නිවාසයේ පිටුපස කොටසේ වහලය සම්පූර්ණයෙන්ම අළුත්වැඩියා කළ යුතුව පවතින අතර සිවිලිම දිරාපත්ව විදුලි පද්ධතියද අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ ඇති බව, එසේම නාන කාමරය හා මුළුතැන්ගෙයද සම්පූර්ණ වශයෙන් අළුත් වැඩියා කළ යුතු බව, එම නිවසේ එක්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			කොටසක් අපහරණ ගබඩාවක් වශයෙන්ද භාවිතයට ගන්නා බව, කෙසේ වෙතත් පසුගිය වර්ෂවල සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් රෝහල වෙත ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් රෝහල් නඩත්තු වලදී ප්‍රමුඛතාවය හිමි වී නොමැති බව, දැනට සම්පූර්ණ වශයෙන් අළුත්වැඩියා කිරීමක් මෙම නිල නිවාසය සම්බන්ධව සිදු කළ යුතු බව, ඒ අනුව ඉහත සියළු කාරණා දන්වා එම නිවාසයේ ඇති එක් කාමරයක් අධ්‍යක්ෂ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ පොරොත්තු කාමරයක් ලෙස තාවකාලිකව භාවිතා කිරීමට අනුමැතිය ලබා දෙන ලෙසට 2023.03.22 දිනැති ලිපියෙන් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇති බව, එක් කාමරයක් අධ්‍යක්ෂ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ පොරොත්තු කාමරයක් ලෙස තාවකාලිකව භාවිතා කිරීමට අනුමැතිය මේ වන විට ලබා දී ඇති අතර ඒ අනුව කටයුතු කරන බව.
(ඒ)	රජයේ ඉඩම් පිළිබඳ කාර්යය සංග්‍රහයේ 224 වන වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් මැනීම් සිදු කර විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වූවද පේරාදෙණිය ශික්ෂණ රෝහලට අයත් හෙක්ටයාර 7.754 ක භූමි ප්‍රමාණය එසේ පවරාගෙන නොතිබුණි.	රජයේ ඉඩම් පිළිබඳ කාර්යය සංග්‍රහයේ 224 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.
(ඔ)	මහනුවර ජාතික රෝහලේ ප්‍රවාහන අංශය සතුව රථ වාහන 46 ක් පැවතියද වර්ෂාවෙන් හා හිරු එළියෙන් ආරක්ෂා වන පරිදි රථ වාහන 10 කටත් අඩු සංඛ්‍යාවක් පමණක් ගාල් කිරීමට ගිලන් රථ නැවතුම්පල තුළ	රෝහල සතු වාහන ආරක්ෂා කිරීම සඳහා කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, 2024 වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ලැබීමට නියමිත ප්‍රතිපාදන උපයෝගී කර

	පමණක් පහසුකම් සපයාගෙන තිබුණු අතර අනෙකුත් රෝහල සතු රථ වාහන 30 කට අධික ප්‍රමාණයක් එළිමහනේ නැවැත්වීමට සිදුව තිබුණි. කෙසේ වුවද රෝහලේ වෛද්‍යවරුන්ගේ සහ සේවකයින්ගේ රථවාහන නැවැත්වීම සඳහා පහසුකම් සහිතව රථ ගාල් ඉදිකර තිබුණි.		ගනිමින් ගිලන් රථ යම් ප්‍රමාණයක් හෝ ආරක්ෂිතව ගාල් කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ගැනීමට තීරණය කර ඇති අතර ඒ අනුව, සුදුසු ස්ථාන පරීක්ෂණ සිදු කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කරන මෙන් **CECB** ආයතනයට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව.
(ඕ)	මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ යටතේ ලියාපදිංචි CPQK 4896 සහ QK – 4893 දරන ත්‍රීරෝද රථ 2017 වර්ෂයේදී මහනුවර ජාතික රෝහලට ලබා දී තිබුණද එහි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම වාහන කඩිනමින් පවරාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ යටතේ ලියාපදිංචි මෙම ත්‍රීරෝද රථ මේ වන විට මහනුවර ජාතික රෝහලේ රෝගී සත්කාර සේවා සඳහා යොදවා ගන්නා අතර එම ත්‍රීරෝද රථ මහනුවර ජාතික රෝහල වෙත පවරා ගැනීම සම්බන්ධයෙන් මේ වන විට කටයුතු සිදු කරමින් පවතින බව.
(ක)	මහනුවර ජාතික රෝහලේ ඉඩම 1946 දෙසැම්බර් 20 දිනැති අංක 9642 දරන ගැසට් පත්‍රයේ 3457 හි සඳහන් පරිදි කැබලි අංක 04 හැර අංක 01 සිට 23 දක්වා වූ කැබලි 22 ක් අක්කර 28 රූට් 17, පර්චස් 313.2 ක ප්‍රමාණයක් රෝහලට පවරා දී තිබුණි. 1989 වර්ෂයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු විසින් සම්පාදිත මූලික පිඹුර 3405 අනුව කැබලි අංක 01 සිට 24 දක්වා කැබලි 24 ක් දක්වා තිබුණු බවත් ඒ අනුව 1946 වර්ෂයේ හෙක්ටයාර් 14.248 ක් වූවද 1989 වර්ෂයේ පිඹුර අනුව හෙක්ටයාර් 23.637 ක් විය. ඒ අනුව හෙක්ටයාර් 9.389 ක් (පර්චස් 3712.14) භූමි ප්‍රමාණයක වෙනසක් පැවතුණි.	රෝහල සතු ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ගැසට් මඟින් පවරා නොමැති කොටස් නිසි පරිදි රජයට අත්පත් කර ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ නීති අංශය හරහා සෞඛ්‍ය ලේකම් මඟින් ඉඩම් අමාත්‍යාංශය වෙතින් අදාළ පැවරීම් කටයුතු සිදු කර ගැනීමට කටයුතු කරමින් සිටින බව.

(ග)	2018 අප්‍රේල් 26 දිනැති අංක KDS/KGK/4/5/5/42/03 දරන මහනුවර කඩවත් සතර සහ ගඟවට කොරළේ සහකාර ප්‍රාදේශීය ලේකම්ගේ ලිපියට අනුව රෝහල් ඉඩම තුළ අනවසර පදිංචිකරුවන් 169 දෙදෙනෙකුගෙන් 27 දෙනෙකුට නඩු පවරා තිබුණු අතර එයින් අවසන් තීන්දු ලබාදුන් නඩු ගොනු 06 කට නෙරපීම් නියෝග ලබා දී තිබුණද එම නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, නෙරපීම් නියෝග ක්‍රියාත්මක කිරීමට අධිකරණ රෙජිස්ට්‍රාර් වෙත ඉල්ලීම් යොමු කර ඇති බව, එමෙන්ම නෙරපීම් නියෝග ලබා දී ඇති 5 දෙනෙකුගේ විස්තර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා දී ඇති අනවසර පදිංචිකරුවන්ගේ 2024 වර්ෂයේ ලේඛනයේ ඇතුළත් නොවීම නිසා අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීමට නොහැකිවී ඇති බව, එසේම නඩු ගොනු 04 ක මුද්‍රණ දෝෂ පැවැතීම හේතුවෙන් එම නියෝග ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව, එම ගොනු නිවැරදි කරගැනීමට අවශ්‍ය නීතිඥ සහය කඩිනමින් ලබා දෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශ නීති අංශයට ඉල්ලීම් යොමු කර ඇති බව, නඩු අංක 21654/19 හි නෙරපීම් නියෝගය ක්‍රියාත්මක කිරීම 2024.05.06 දිනට නියමිතව ඇති බව.
(ච)	මහනුවර රෝහල විසින් නඩු පවරා තිබුණු අනවසර පදිංචිකරුවන්ගෙන් අයෙක් වන මු.පි අංක 01 කොටසේ පදිංචි පදිංචිකාරිණිය විසින් ඇයගේ නෙරපීම් නියෝගයට එරෙහිව නඩු අංක CA 65/2019 යටතේ අභියාචනාධිකරණයේ නඩුවක් පවරා තිබුණි. එකී නඩුවේ තීන්දුව 2021 ජූලි 27 දින ලබා දී තිබුණු අතර 1958 අංක 98 දරන ගැසට් පත්‍රය පදනම් කරගෙන මෙම කැබළි අංක 01 යන කොටස රෝහලට පවරා ගෙන නොමැති බවට අවසන් තීන්දුවෙන් ප්‍රකාශ කර තිබුණි. මේ අනුව රෝහල විසින් නඩු පැවරීමට පදනම් කරගෙන තිබුණු මූ.පි 3405 හි ඉඩම් කැබළි	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, එසේ නමුත් කැබැලි අංක 1 කොටස මූලික පිඹුර මූ.පි 3405, පත්ඉරුපත්, පැවරුම් සහතිකය අනුව රෝහලට හිමිකම් කියන බැවින් නෙරපීම් නඩු පැවරීමට කටයුතු කර ඇති බව, කැබැලි අංක 01 කොටස නිරවුල් කිරීමේ කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශ නීති අංශය හරහා ඉඩම් අමාත්‍යාංශය වෙතින් සිදු කර ගැනීමට කටයුතු කරමින් පවතින බව.

	සියල්ල රෝහලට නීත්‍යානුකූලව පවරාගෙන නොතිබෙන බව මෙම තීන්දුව අනුව නිරීක්ෂණය විය.		
(ඡ)	මහනුවර මහ රෝහලට අයත් දෙයියනෙවෙල ග්‍රාමයේ මු.පි 803 දරන රූඩ් 3 පර්චස් 21.8 ඉඩමෙහි නාගරික අපජල කළමණාකරණ ව්‍යාපෘතියේ අපජල පොම්පාගාරයක් ඉදිකර තිබුණි. මෙම අපජල පොම්පාගාරය මේවන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින අතර මෙම කොටසේ රෝහලේ කනිෂ්ඨ සේවකයින්ගේ නිල නිවාස 02 ක් පවතින බවත් භූමියේ ආරක්ෂාව සඳහා ආරක්ෂක නිළධාරියෙකු යොදවා තිබුණු බවත් සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම භූමිය ඉහළ ආර්ථික වටිනාකමකින් යුත් ප්‍රදේශයක පවතින බැවින් එය ඵලදායී කටයුත්තකට යොදවා නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මහනුවර දෙයියන්නෙවෙල ග්‍රාමයේ මූලික පිඹුර 803 දරන ඉඩම් කොටසේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රාථමික විදුලි උපපොලක් ඉදි කිරීමට සැලසුම් කර ඇති බව, එමඟින් දිනෙන් දින ඉහල යන රෝහලට අවශ්‍ය විදුලි ඉල්ලුම සපුරා ගැනීම අපේක්ෂා කරන බව.
(ජ)	රජයේ ඉඩම පිළිබඳ කාර්ය සංග්‍රහයේ 224 වන වගන්තිය ප්‍රකාරව නාවලපිටිය දිස්ත්‍රික් රෝහල පවත්වාගෙන යනු ලබන පස්ඛාගේ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් අක්කර 09 රූඩ් 03 පර්චස් 29.17 ක ඉඩමේ අයිතිය රෝහලට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද රෝහලේ භූමිය වටේ ආරක්ෂිත වැටක්ද ඉදිකර නොතිබුණි. මේ හේතුවෙන් අනවසර පුද්ගලයින් රෝහල් භූමියට ඕනෑම අවස්ථාවක ඇතුළු වීමේ අවදානමක් පවතින බවත් අනවසර අත්පත් කර ගැනීම් සිදු කරගැනීමේ අවදානමක් පැවතුණි.	රජයේ ඉඩම් පිළිබඳ කාර්යය සංග්‍රහයේ 224 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහල විසින් භුක්ති විඳින හෙක්ටයාර් 3.8229 වූ ඉඩම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව, රජයේ ඉඩම් ආඥාපනත යටතේ පැරුම් සහතිකයක් ලබා ගැනීම සඳහා මැණුම් ඉල්ලීම් අංක 26/20249(655) හා 64/2023(619) යන ඉල්ලීම් 02කට අදාළව අනවසර කරුවන් හඳුනා ගැනීම සඳහා අනුරේඛා සකස් කර ගැනීමේ කටයුතු මිනින්දෝරු කාර්යාලය විසින් සිදු කරනු ලබන බව, ඒ අනුව ඊට අදාළ මැනුම් කටයුතු අවසන්වීමෙන් අනතුරුව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			B04/ඉඩම්/නාවලපිටිය/2023/17 හා 2024/03/25 දිනති ලිපිය ප්‍රකාරව පැවැරුම් සහතිකය ලබා ගත හැකි බව. ආරක්ෂිත වැට ඉදි කිරීමේ කටයුතු අදියර වශයෙන් නිම කිරීමට අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන මේ වන විට රේඛිය අමාත්‍යාංශය වෙතින් ලැබී ඇති බැවින් ඊට අදාළ ලංසු කැඳවීම 2024/04/29 දින සිදු කර ඇති බව, ඒ අනුව ලංසු අංක **DGHN/FK/**07/2024 මගින් රු.4,992,250 ක වටිනා කමට ලංසු කැඳවීම සිදු වන අතර විධිමත්ව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමෙන් පසුව අදාළ ඉදි කිරීම් කටයුතු සිදු කරන බව.
(ට)	2020 මාර්තු 31 දින මහනුවර ජාතික රෝහලේ හෘද රෝග අංශය තුළ ස්ථාපිත කළ Philips Volcano IVUS & FFR යන්ත්‍රය 2023 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුනි.	මේ සම්බන්ධයෙන් පූර්ණ ස්වායත්ත විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මහනුවර ජාතික රෝහලේ හෘද රෝග අංශය තුළ ස්ථාපිත මෙම යන්ත්‍රයට අදාළ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සපයන ලෙස දිගින් දිගටම අවස්ථා ගණනාවකදී රෝහල විසින් එම යන්ත්‍රය සැපයීමේ දේශීය නියෝජිත ආයතනයට ලිඛිතව දැනුවත් කිරීම් සිදු කර ඇති අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය වෙත ද අවස්ථා ගණනාවක දී අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කර ඇති බව, නමුත් මේ වන තෙක් අවශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි වී ඇති බැවින් මෙම යන්ත්‍රය සඳහා අවශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සැපයීමට හෝ එසේ සැපයීමට නොහැකි

NAOSL
ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வாளர் தலைமையகம்
NATIONAL AUDIT OFFICE

			නම් යන්ත්‍රය අවශ්‍ය වෙනත් රෝහලක් වෙත භාරදීමට හෝ අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයට දන්වා ඇති බව.
(ය)	නාවලපිටිය දිස්ත්‍රික් රෝහලේ කොවිඩ් රෝගීන්ගේ ස්වසන අපහසුතා සඳහා ප්‍රතිකාර කිරීමට 2021 වර්ෂයේ විවිධ ආයතන හා පුද්ගලයන් විසින් පරිත්‍යාග කරන ලද හා වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයෙන් ලද වටිනාකම ආසන්න වශයෙන් රු. 1,547,000 ක් Oxygen Concentrators යන්ත්‍ර 13 ක්ද, වටිනාකම ආසන්න වශයෙන් රු. 1,260,000 ක් වූ C-PAP Devices 7 ක් සහ 2023 මාර්තු මස ලද රු. 700,000 ක් ICU Ventilator යන්ත්‍රයක් රෝහලේ ජීව වෛද්‍ය උපකරණ ගබඩාවේ 2023 දෙසැම්බර් 31 දින වන විටද ඌන උපයෝජිතව පැවතුණි.	මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර මෙම උපකරණ ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, **Oxygen Concentrator** 13 න් 2 ක් අවශ්‍යතාව අනුව මේ වන විට වාට්ටු අංක 4 ට හා හදිසි ප්‍රතිකාර ඒකකයට නිකුත් කර ඇති බව, තවද 2024.05.03 දිනැති ලිපිය මගින් ඌන උපයෝජිත උපකරණ පිළිබඳව ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය කොළඹ, මහනුවර, වටපුළුව සහ වෛද්‍ය සැපයුම් අංශය කොළඹ දැනුවත් කරන ලද බව, අදාළ සමාගමෙන් පැමිණ **Ventilator** යන්ත්‍රය දැඩි සත්කාර ඒකකයේ ස්ථාපිත කළ අතර සමාගම විසින් ලබාදුන් සහතිකයට අදාළව කොළඹ ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය වෙත දැනුම් දෙන ලද බව.
(ඛ)	2019 මැයි 31 දින රාගම ශික්ෂණ රෝහල විසින් Binocular Microscope යන්ත්‍රයක් නාලවපිටිය දිස්ත්‍රික් රෝහලට ලබා දී තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විට අවූ 04 මාස 06 ක කාලයක සිට භාවිතයට නොගෙන ඌන උපයෝජිතව පැවතුණි.	අවශ්‍යතාවය අනුව පමණක් උපකරණ සපයා ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම යන්ත්‍රය අංක **A/**32 321678 හා 2024.02.09 දිනැති නිකුත් කිරීමේ නියෝගය මගින් පල්ලේකැලේ බන්ධනාගාර රෝහල වෙත නිකුත් කරන ලද බව.
(ත)	චීන ආධාර යටතේ රෝහල් වල සෞඛ්‍ය පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් නාවලපිටිය දිස්ත්‍රික් රෝහලට 2022 මාර්තු 29 දින ලබා	වර්ෂ දෙකකට වැඩි කාලයක් නිෂ්ක්‍රියව පවතින ආකාරයට	මෙම යන්ත්‍රය 2022.03.29 දින මෙම රෝහල ලැබුණු බව, මෙම යන්ත්‍රය

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	දෙන ලද වටිනාකම රු.20,940,561.08 (USD73,734.37*284) ක GE Health Care/ Model/Optima XR 646 දරන Digital Static X – Ray යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා නාවලපිටිය රෝහල විසින් පරිශ්‍රය සකස් කිරීම, වයරින් කිරීම, තෙකලා විදුලි බල සැපයුම ලබා ගැනීම සහ විදුලි රැහැන් ඇදීම සඳහා රු. 19,970, 008 ක පිරිවැයක් දරා තිබුණද යන්ත්‍රය රෝගී සත්කාර සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විටද භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.	උපකරණ ලබා දීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් සිදුකළ යුතුය.	රෝහලේ ස්ථාපිත කිරීම සඳහා පරිශ්‍රය සකස් කිරීම, විදුලිය ලබා ගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම, තෙකලා විදුලිබල සැපයුම සඳහා ට්‍රාන්ස්ෆෝමරය **update** කිරීම සඳහා විදුලි රැහැන් ඇද විදුලි බලය **x** කිරණ අංශයට සැපයීම ආදිය අදියර වශයෙන් අවසන් කර ඇති බව, තවදුරටත් සිදු කළ යුතුව ඇත්තේ අදාළ ආයතනය පැමිණ යන්ත්‍රය සවිකර දීම බව, මේ සඳහා අදාළ ආයතනය දැනුවත් කර ඇති අතර දැනට **UPS** යන්ත්‍රය පමණක් 2024.05.03 දින සවිකර දී ඇති බව.
(ඵ)	පේරාදෙණිය දන්ත වෛද්‍ය ඒකකයට රෝගීන්ගේ ලවණ ග්‍රන්ථී සංරක්ෂණය කිරීම, ස්නායු වලට වන හානිය අවම කරමින් තුවාල සහ කැලැල් හෝ කැපීම් ඇති නොවන පරිදි ලවන ග්‍රන්ථී සහ නාලවල ඇති ගැටළු පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණයේ ලවණ ග්‍රන්ථී ගල් ඉවත් කිරීම සහ කේට ග්‍රන්ථී තදවීම සඳහා ප්‍රතිකාර කිරීමට යොදාගනු ලබන ඉහළ තාක්ෂණයෙන් යුතු Re – Karl Storz Silaendoscopy and visual System යන්ත්‍රයක් 2020 මැයි 04 දින රු. 9,779,724 ක පිරිවැයට මිලදී ගෙන 2022 වර්ෂයේ රෝගීන් 05 දෙනෙකුගේ ප්‍රතිකාර කටයුතු සිදුකර තිබුණු අතර 2022 අප්‍රේල් 25 දින වන විට යන්ත්‍රය ක්‍රියාවිරහිත වී තිබුණි. යන්ත්‍රයට භෞතික හානියක් සිදුව ඇති බවත් එය සමාගමේ වගකීමට යටත් නොවන බවත් එම නිසා නොමිලේ අදාළ උපකරණය අළුත්වැඩියා කිරීම සිදු කළ නොහැකි බව දන්වා තිබුණි. 2023 ජනවාරි 22 දින නව Telescope එකක් සැපයීම සඳහා අවුරුදු 1 ක වගකීම් කාලයක් සහිතව රු.2,255,896 කට මිල ගණන්	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකීම් විරහිතව කටයුතු කර තිබෙද යන්න හඳුනා ගත යුතු අතර යන්ත්‍රය කඩිනමින් ඵලදායිව උපයෝජනය සඳහා පියවර ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මෙම යන්ත්‍රය රෝගීන්ගේ බෙයි ග්‍රන්ථීවල ගල් ඉවත් කිරීම හා බෙයි ග්‍රන්ථී තදවීම වැළැක්වීම ඇතුළු කටයුතු වෙනුවෙන් යොදා ගනු ලබන ඉහළ තාක්ෂණයකින් යුතු සියුම් යන්ත්‍රයක් වන අතර එය 2020.05.04 දින මිලදී ගෙන 2021.11.17 දින ස්ථාපිත කර ඇති බව, එම යන්ත්‍රය ක්‍රියා විරහිත වූ 2022.04.25 දින දක්වා රෝගීන් 05 දෙනෙකුට ප්‍රතිකාර සිදු කර තිබුණි. එවකට පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ මුඛ විවෘත කර සිදු කරනු ලබන ශල්‍යකර්ම සියල්ලම තාවකාලිකව නතර කිරීමට සිදුවීමත් රෝගීන්ගේ පැමිණීම ඉතාමත් පහළ මට්ටමක පැවතීමත් නිසා එසේ අඩු

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ඉදිරිපත් කර තිබුණද . අදාළ උපකරණය අළුත්වැඩියා කිරීමට 2023 දෙසැම්බර් 31 දින වන විටද කටයුතු කර නොතිබුණි.		රෝගීන් සංඛ්‍යාවකට ප්‍රතිකාර කිරීමට හේතු වූ බව, එම කාලයේ සිදු කර ඇත්තේ ඉතා අත්‍යවශ්‍ය රෝගී සත්කාර කටයුතු පමණක් බව, මෙම යන්ත්‍රය නිර්මාණය කර ඇත්තේ සැලසුම් සහගත විශේෂිත ශල්‍යකර්ම සඳහා බවත් හදිසි ප්‍රතිකර්ම සඳහා නොවන බව, යන්ත්‍රය අක්‍රීය වීමෙන් පසුව එය අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කිරීමේ ක්‍රියාවලියේදී 2023 ජනවාරි 22 දින නව **Telescope** යන්ත්‍රයක් සැපයීම වෙනුවෙන් රු:2,255,896/- ක ඇස්තමේන්තුවක් නියෝජිත ආයතනය මගින් ඉදිරිපත් කර තිබුණු බව, එසේම යන්ත්‍රයට භෞතික හානියක් සිදුවී ඇති බැවින් එයට වගකිව යුතු පුද්ගලයෙකු හඳුනා ගැනීම සඳහා විමර්ශණයක් සිදුකරන ලද බව, එය රෝගියෙකුගේ හැසිරීම මත සිදුවූවක් බවට නිරීක්ෂණය වූ බැවින් රෝහලේ වියදමින් අළුත්වැඩියා කරවා ගැනීමට තීරණය වූ බව, නියෝජිත ආයතනයෙන් ඉදිරිපත් කර තිබූ ඉහත මිල ගණන් ඉතා ඉහළ අගයක් වූ බැවින් මේ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු කිහිපයකදී හා ප්‍රසම්පාදන කමිටු කිහිපයකදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද බව, එසේම අදාළ විශේෂඥ වෛද්‍යවරුන්ද ගෙන්වා සාකච්ඡා කිරීමේදී මෙම යන්ත්‍රය එතරම් කාලයක් භාවිතා කර නොමැති නිසාත්, නව යන්ත්‍රයක මිල මේ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

වන විට ඉතා විශාල ලෙස ඉහළ ගොස් ඇති නිසාත් අළුත්වැඩියා කර භාවිතයට ගැනීම වඩාත් ඵලදායී බව ඔවුන්ගේද අදහස වූ බැවින් නියෝජිත ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස නැවත 2024.04.03 දින සාක්ෂිඤ්ඤ ඇගයීම් කමිටුවක් පත්කර එම කමිටුව වෙත භාරදීමට කටයුතු කරන ලද බව, ඒ අනුව ඉහත ඇස්තමේන්තු මිල ගණන් යටතේ අළුත්වැඩියා කටයුත්ත නියෝජිත ආයතනය මගින් සිදු කරවා ගැනීමට සුදුසු බවට සාක්ෂිඤ්ඤ ඇගයීම් කමිටුව විසින් 2024.04.10 දින නිර්දේශය ලබා දී ඇති බව, සාක්ෂිඤ්ඤ ඇගයීම් කමිටුවේ නිර්දේශය මත පදනම්ව ඉහත මිල ගණන් යටතේ නියෝජිත ආයතන මගින් අළුත්වැඩියා කටයුත්ත සිදු කරවා ගැනීම සුදුසු බවට 2024.04.18 දින සම්පාදනා කමිටුව විසින් තීරණය කරන ලද බව, ඒ අනුව ඇස්තමේන්තු මිල ගණන් අනුමත කිරීම් ලිපිය 2024.04.20 දින නියෝජිත ආයතනය වෙත යොමු කරන ලද බව, කෙසේ වෙතත් ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් වලක්වා ගැනීම් සඳහා යාන්ත්‍රණයක් කිුයා විරහිත වූ වහාම වාර්තා වීම සඳහා පරිගණකගත වැඩසටහනක් මෙවන විට භඳුන්වා දී ඇති බව, සියළුම ද්‍රව්‍ය වාර්ථාකරණය හා අළුත්වැඩියා කටයුතු එම

			වැඩසටහන හරහා සිදු කිරීමට නියමිත බව, තවද යන්ත්‍රය පරීක්ෂාකාරීව භාවිතා කරන ලෙසට අදාළ සියළු නිලධාරීන් දැනුවත් කිරීමටත්, ඒ සඳහා උපදෙස් හා පුහුණුවක් ලබා දීමටත් ඉදිරියේදී කටයුතු කරන බව.
(ද)	පේරාදෙණිය දන්ත රෝහල සඳහා රු.6,250,000 ක් වටිනා Digital Dental Panoramic X – Ray Machine With Cephalostat යන්ත්‍රය 2018 වර්ෂයේ මිලදී ගෙන තිබුණු අතර මෙම යන්ත්‍රය මගින් සම්පූර්ණ මුඛයම ආවරණය වන පරිදි X කිරණ ඡායා රූපයක් ලබා ගැනීමේ හැකියාව පැවති අතර මාසිකව රෝගීන් 500 කට පමණ මෙමගින් ප්‍රතිකාර කර තිබුණි. මෙම යන්ත්‍රයට අදාළ 2021 දෙසැම්බර් 09 දිනෙන් එළඹී 04 වන වර්ෂයේ සේවා හා නඩත්තු ගිවිසුම් අළුත් කිරීමට වගකිව යුතු නිළධාරීන් ක්‍රියාකර නොතිබුණි. 2023 අගෝස්තු මස 09 වන දින මෙම යන්ත්‍රය ක්‍රියාවිරහිත වූ අතර 2023 දෙසැම්බර් 31 දින වන විටද අළුත්වැඩියා කර නොතිබුණි.	-එම-	මෙම යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා වියදම් ඇස්තමේන්තුවක් ලබා දෙන ලෙසට නියෝජිත ආයතනය වේත 2023.12.13 දිනැතිව දන්වා ඇති අතර 2024.01.06 දින සිහිකැඳවීමක්ද යොමු කර ඇති බව, එම නියෝජිත ආයතනයෙන් 2021.01.08 දිනැති ලිපිය මගින් තව දුරටත් එම යන්ත්‍රයේ දේශීය නියෝජිත ආයතනය නොවන බවටත් එම ආයතනයේ ඉදිරි කටයුතු වෙනත් ආයතනයක් වෙත මාරු වූ බවත් දන්වා තිබුණු බව, ඒ අනුව එම යන්ත්‍රයේ අළුත් වැඩියාව සඳහා වියදම් ඇස්තමේන්තුවක් ලබා දෙන ලෙසට 2024.01.08 දින නව නියෝජිත ආයතනය වෙත දන්වා ඇති අතර 2024.04.04 දිනැති සිහිකැඳවීමක් ද යොමු කර ඇති බව.
(ධ)	සම සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් පේරාදෙණිය ශික්ෂණ රෝහල වෙත ලබා දී තිබූ C- Arm X-Ray යන්ත්‍රය 2019 අප්‍රේල් 1 දින සිට ප්‍රධාන ශල්‍යාගාරයේ විකලාංග ශල්‍ය ඒකකයේ ශල්‍යකර්ම සිදුකිරීම සඳහා යොමුකර තිබුණු අතර එම යන්ත්‍රය 2022 ඔක්තොබර් 10 දින ක්‍රියාවිරහිත වී තිබුණි. මේ සම්බන්ධයෙන් රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂක විසින් 2022 ඔක්තොබර් 14 දින අදාළ සැපයුම්කාර ආයතනය දැනුවත් කර	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	තිබුණු අතර ඒ අනුව 2022 නොවැම්බර් 24 දින අදාළ සමාගම විසින් යන්ත්‍රය පරීක්ෂා කර තිබුණි. එය තවදුරටත් පරීක්ෂාකිරීම සඳහා උපකරණය රැගෙන යායුතු බව දන්වා තිබුණි. කෙසේ වූවද 2023 දෙසැම්බර් 31 දින දක්වාම යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු නිමකර නොතිබුණි.		
(න)	මහනුවර ජාතික රෝහලේ ක්ෂුද්‍ර ජීව විද්‍යා රසායනාගාරයේ රසායනාගාර පරීක්ෂණ සිදු කිරීමේදී බැක්ටීරියා මාධ්‍ය නිපදවා ගැනීම සඳහා යොදාගනු ලබන වටිනාකම රු.9,690,248 ක් වූ Media Preparation & pouring System යන්ත්‍රය 2018 සැප්තැම්බර් 26 දින ක්ෂුද්‍රජීවවිද්‍යා රසායනාගාරය වෙත ලැබී තිබුණු අතර එහි Preventive Consumable Maintenance kit නොමැති වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දින දක්වා භාවිතයට ගෙන නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මහනුවර ජාතික රෝහලේ ක්ෂුද්‍ර ජීව විද්‍යා රසායනාගාරයේ රසායනාගාර පරීක්ෂණ සිදු කිරීමේදී බැක්ටීරියා මාධ්‍ය නිපදවා ගැනීම සඳහා යොදාගනු ලබන **Media Preparation & pouring System** යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට ප්‍රමාදවී ඇත්තේ පසුගිය කාලය තුළ රජය විසින් පනවා තිබූ ආනයන සීමාවන් හේතුවෙන් අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය උපාංග ගෙන්වා ගැනීමට නොහැකි වීම මත උපකරණ අලුත්වැඩිය සඳහා මිල ගණන් ඇස්මේන්තු ලබා දීම ප්‍රමාද වන බව අදාළ දේශීය නියෝජිත විසින් දන්වා ඇති බැවින් බව, කෙසේ වූවද, මේ වන විට මිල ගණන් ඇස්මේන්තු ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු) අංශය වෙතින් අනුමැතිය ඉල්ලා යවා ඇති අතර අනුමැතිය හා ප්‍රතිපාදන ලද වහාම ප්‍රසම්පාදන කමිටු තීරණ ලබා ගෙන අළුත්වැඩියා ඇණවුම ලබා දීමට කටයුතු කරන බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ප)	මහනුවර ජාතික රෝහලේ පටකවේද රසායනාගාරයේ Biopsy සාම්පල් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා වටිනාකම රු. 6,700,000 ක් වූ Automation Slide Strainer යන්ත්‍රයක් 2018 අප්‍රේල් 27 දින පටකවේද රසායනාගාරයට ලැබී තිබුණි. එම යන්ත්‍රයේ Touch Display 2020 ජූලි 16 වන දින ක්‍රියාවිරහිත වී ඇති අතර, එය අළුත්වැඩියා කිරීමට අදාළව ඉල්ලීම් ලිපියක් 2020 ජූලි 16 දින අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර තිබුණද 2023 දෙසැම්බර් මස 01 දින වන විටත් අළුත්වැඩියා කටයුතු සිදු කර නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මහනුවර ජාතික රෝහලේ පටකවේද රසායනාගාරයේ **Biopsy** සාම්පල් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා මෙම යන්ත්‍ර අළුත්වැඩියා කිරීම ද ඉහත පරිදි අමතර කොටස් ආනයන සීමා කිරීම හේතුවෙන් මිල ගණන් ලබා නොදීම මත ප්‍රමාද වී ඇති අතර මේ වන විට අළුත්වැඩියා ඇස්තමේන්තු ලබා දී ප්‍රසම්පාදන කමිටු තීරණ ලබාගෙන අළුත්වැඩියා ඇණවුම් භාරදී අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතින බව.
(එ)	මහනුවර ජාතික රෝහලේ පටකවේද රසායනාගාරයේ Biopsy සාම්පල් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය සඳහා භාවිතා කරන ලද වටිනාකම රු. 5,995,500 ක් වූ Tissue Processor යන්ත්‍රයක් 2017 දෙසැම්බර් 04 දින පටකවේද රසායනාගාරය වෙත ලබා දී තිබුණු අතර එහි සංවේදක පද්ධතියේ (Sensor Error) දෝෂයක් හේතුවෙන් 2023 අගෝස්තු 23 දින සිට ක්‍රියාවිරහිත වී පැවති අතර, 2023 දෙසැම්බර් 01 දින වන විටත් අළුත්වැඩියා කර භාවිතයට ගෙන නොතිබුණි.	උපකරණ ක්‍රියාවිරහිත වූ විට එම උපකරණ කඩිනමින් අළුත්වැඩියා කිරීම සඳහා පියවර ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මහනුවර ජාතික රෝහලේ පටකවේද රසායනාගාරයේ **Biopsy** සාම්පල් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය සඳහා භාවිතා කරන මෙම යන්ත්‍රය අළුත්වැඩියා කර භාරදී ඇති අතර සාම්පල් පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා භාවිතා කරන බව.
(ඓ)	මහනුවර ජාතික රෝහලේ ජීව රසායනවිද්‍යා රසායනාගාරය වෙත 2011 ඔක්තෝබර් 03 දින ලද රු.4,455,357 ක් වටිනා Konelab Analyzer යන්ත්‍රය අවසන් වරට 2016 වර්ෂයේ පාවිච්චි කර තිබූ අතර එය නැවත අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු නොකර 2016 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 01 දින දක්වා වර්ෂ 07 ක් පමණ කාලයක් රසායනාගාරයේ නිෂ්කාර්යව තිබුණි.	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකීම් විරහිතව කටයුතු කර තිබේද යන්න හඳුනා ගත යුතු අතර යන්ත්‍රය කඩිනමින් ඵලදායිව උපයෝජනය සඳහා පියවර ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මහනුවර ජාතික රෝහලේ ජීව රසායනවිද්‍යා රසායනාගාරයේ පරීක්ෂණ කටයුතු සඳහා භාවිත කරනු ලැබූ මෙම යන්ත්‍රය ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය විසින් අපහරණ කටයුතු සඳහා නිර්දේශ කර ඇති බැවින් ඊට අදාළ ලියවිලි සමඟ අපහරණ කමිටුවට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගැනීමට ප්‍රධාන

			ඖෂධවේදී වෙත භාර දී ඇති බව, ඒ අනුව, අපහරණ කටයුතු සිදු කර පොතෙන් කපා හැරීමේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන බව.
(හ)	මහනුවර ජාතික රෝහලේ ජීව රසායනවිද්‍යා රසායනාගාරයේ රුධිර පරීක්ෂණ (Routine Test) සිදු කිරීම සඳහා යොදාගනු ලබන පිරිවැය රු. 1,200,000 ක් වටිනා Point Of Care Analyzer යන්ත්‍රය 2020 අප්‍රේල් 20 දින ලැබී තිබුණු අතර අවසන් වරට ප්‍රයෝජනයට ගෙන ඇත්තේ 2021 වර්ෂයේදීය. 2023 දෙසැම්බර් වන විට මෙම විශ්ලේෂණ යන්ත්‍රය ක්‍රියාත්මක තත්ත්වයේ පවතින නමුත් පරීක්ෂණවල නිරවද්‍යතාවය අඩුවීම මත ඒ සඳහා ප්‍රතික්‍රියක (Regent) ඇණවුම් නොකරන බවත් 2023 දෙසැම්බර් 01 දින වන විටත් එය යථා තත්ත්වයට පත්කරගැනීමට කටයුතු කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, මහනුවර ජාතික රෝහලේ ජීව රසායනවිද්‍යා රසායනාගාරයේ රුධිර පරීක්ෂණ සිදු කිරීම සඳහා යොදාගනු ලබන මෙම යන්ත්‍රය **Covid** – 19 වසංගත තත්ත්වය තුළ එකවර විශාල පරීක්ෂණ සංඛ්‍යාවක් කිරීමට යොදාගත් අතර එම කාල පරිච්ඡේදය තුළ ඉතා විශාල සේවාවක් මෙම යන්ත්‍රය මගින් ඉටු කර ගන්නා ලද බව, පරීක්ෂණ අඩු සංඛ්‍යාවක් සිදු කිරීමේදී පරීක්ෂණවල නිවැරදිතාවය සම්බන්ධයෙන් ගැටළු පැන නැගීම සහ **Covid** – 19 වසංගත කාලයේදී ලබාගත් තවත් යන්ත්‍ර කිහිපයක් පැවතීම හා සිදු කරන පරීක්ෂණ ප්‍රමාණය අඩුවීම යන කරුණු මත මෙම යන්ත්‍රය භාවිතා කිරීම මේ වන නතර කර ඇති බව.
(ම)	ගම්පොළ ශික්ෂණ රෝහලේ රසායනාගාරය වෙත 2018 අගෝස්තු 01 දින ලද රු.1,000,000 ක් වටිනා Thermo Fisher Centrifuge යන්ත්‍රය 2022 ජූලි 27 දින සිට ක්‍රියාවිරහිතව පවතින අතර 2024 ජනවාරි 22 දින වන විටද අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.	උපකරණ ක්‍රියාවිරහිත වූ විට එම උපකරණ කඩිනමින් අළුත්වැඩියා කිරීම සඳහා පියවර ගත යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, 2022.11.30 දින යන්ත්‍රය අළුත්වැඩියා කළ යුතු බව ප්‍රධාන රාසයනාගාර කාර්මික විද්‍යාඥ විසින් දන්වා ඇති බව, 2022.12.14 දින ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයෙන් නියෝජිත ආයතනය වෙතින් ඇස්තමේන්තු

පිටුව 210 | 305

ලබා ගන්නා ලෙස නිර්දේශ කර ඇති බව, ඒ අනුව 2022.12.16 දින ආයතනය වෙත දැනුම් දුන් පසු පැමිණිෂ කර බලන ලද බව, පසුව ආයතනය වෙත වරින් වර දුරකථන ඇමතුම් ලබා දෙමින් ඇස්තමේන්තුව ගෙන්වා ගැනීමට උත්සහ කළ නමුත් ඇස්තමේන්තු රෝහල වෙත නොලැබුණු බව, රෝහ පැවසූ අර්බුදය සමඟ රුපියලේ අගය උවමාවනය වීම නිසා හා බොලර් සංචිත වල පැවති හිඟතාවය නිසා අදාළ අමතර කොටස් ආනයනය කිරීමේ ගැටළු පවතින බැවින් ඇස්තමේන්තු ලබා දීමට නොහැකි බව පවසා ලද බව, මෙම ගැටළු අවම කිරීම සඳහා දුරකථන ඇමතුම් මඟින් ඇස්තමේන්තුව සිළුබඳ විමසූ විට යන්ත්‍රය වර්තමාන තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ආයතනය වෙත රැගෙන යා යුතු බව දැන් දැ බැවින් 2024.03.07 දින යන්ත්‍රය ආයතනය වෙත රැගෙන යන ලද බව, 2024.04.28 දින ඇස්තමේන්තුව අප වෙත ලැබුණු අතර එය තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබා ගැනීම සඳහා යොමු කර ඇති බව, පැවති ආර්ථික තත්ත්වය මත ඉහත කාර්ය සඳහා අවශ්‍ය අමතර කොටස් ගෙන්වා ගැනීම අපගේ පාලනයෙන් තොර කටයුත්තක් බැවින් එම අලුත් වැඩියාව සිදු කර ගැනීමට කල් ගතවී ඇති බව.

(ය)	ගම්පොළ ශික්ෂණ රෝහලේ රසායනාගාරය වෙත 2018 අගෝස්තු 22 දින මිලදී ගන්නා ලද රු.1,428,645 ක් වටිනා Tri modular Tissue Embedding Centre යන්ත්‍රය 2022 දෙසැම්බර් 30 දින සිට ක්‍රියා විරහිතව පැවති අතර 2024 ජනවාරි 22 දින වන විටත් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, 2022.12.16 දින නියෝජිත ආයතනය වෙත යන්ත්‍රය අළුත්වැඩියා කර ගැනීම සඳහා ඉල්ලීම් ලිපියක් යොමු කර ඇති බව, ඒ අනුව යන්ත්‍රය ආයතනය වෙත රැගෙන ගොස් පරීක්ෂා කළ යුතු බව දන්වා ඇති බැවින් ඒ සඳහා ලිපියක් සකස් කලද යන්ත්‍රය රැගෙන යාමට ආයතනය ක්‍රියා නොකරන ලද බව, ඒ පිළිබඳ දුරකථන ඇමතුම් මගින් විමසූ විට රටේ පවතින ආර්ථික අර්බුදය සමඟ රුපියලේ අගය උච්චාවචනය වීම නිසා හා ඩොලර් සංචිතවල පැවති හිඟතාවය නිසා අදාළ අමතර කොටස් ආනයනය කිරීමේ ගැටළු පවතින බැවින් ඇස්තමේන්තු ලබා දීමට නොහැකි බව පවසන ලද බව, පසුව 2024.02.16 යන්ත්‍රය රැගෙන ගොස් 2024.03.06 දින ඇස්තමේන්තුවක් ලබා දී ඇති බව, එය තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබා ගැනීම සඳහා යොමු කරන ලද බව, පැවති ආර්ථික තත්ත්වය මත ඉහත කාර්ය සඳහා අවශ්‍ය අමතර කොටස් ගෙන්වා ගැනීම අපගේ පාලනයෙන් තොර කටයුත්තක් බැවින් එම අලුත් වැඩියාව සිදු කර ගැනීමට කල් ගතවී ඇති බව.
(ර)	ගම්පොළ ශික්ෂණ රෝහලේ පටකවේද අංශය වෙත Cytological Samples Performing කාර්යය සඳහා යොදාගන්නා රු.1,300,000 ක්	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	වටිනා Sakura Cyto centrifuge (Model cyto tec 2500) යන්ත්‍රය 2017 මාර්තු 31 දින මිලදීගෙන තිබුණු අතර 2022 වර්ෂයේ සිට තාක්ෂණික දෝෂයක් නිසා ක්‍රියාවිරහිතව පැවති අතර 2024 ජනවාරි 22 දින වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි.		
(ල)	ගම්පොළ රෝහලේ ශල්‍යාගාරයේ භාවිතා කරන ලද රු.1,000,000 ක වටිනාකමකින් යුත් Shinva/ Most – T මාදිලියේ Mini – Auto Clave යන්ත්‍රයක් 2023 නොවැම්බර් 28 දින සිටද, රෝහලේ වාට්ටු අංක 07 හි භාවිතා කරන ලද රු.1,600,000 ක වටිනාකමකින් යුක්ත Zoncare multipara monitor යන්ත්‍රයෙහි Blood Pressure Monitor අක්‍රිය වීම හේතුවෙන් 2022 අගෝස්තු 03 දින සිටද, රෝහලේ වාට්ටු අංක 04 හි භාවිතා කරන ලද ආසන්න වශයෙන් රු.1,600,000 ක් වටිනාකමින් යුත් Patient Care Monitor යන්ත්‍රයක් 2023 ඔක්තෝබර් 02 දින සිටද ක්‍රියාවිරහිත වී තිබුණු අතර 2024 ජනවාරි 22 දින වන විටත් මෙම යන්ත්‍ර අළුත්වැඩියා කර නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, 2022.08.07 හා 2022.12.18 දිනැති ලිපි මඟින් මෙම යන්ත්‍රය අළුත් වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු කැඳවන ලද බව, නමුත් ඇස්තමේන්තු නොලැබුණු බැවින් වරින් වර දුරකථන ඇමතුම් ලබා දුන් පසු රටේ පවතින ආර්ථික අර්බුදය සමඟ රුපියලේ අගය උච්චාවචනය වීම නිසා හා ඩොලර් සංචිතවල පැවති හිඟතාවය නිසා අදාළ අමතර කොටස් ආනයනය කිරීමේ ගැටළු පවතින බැවින් ඇස්තමේන්තු ලබා දීමට නොහැකි බව පවසන ලද බව, 2023.07.21 ඇස්තමේන්තුවක් එවා තිබූ අතර ඒ සඳහා 2023.09.30 ඇස්තමේන්තුව අනුමත කර යවා ඇතත් අළුත්වැඩියා කිරීම ප්‍රමාද වන බැවින් 2024.02.29 දින ආයතනය වෙත නැවත සිහිඳුවීමක් යවා ඇති අතර දුරකථන ඇමතුම් මඟින්ද විමසීම් කරන බව.
(ව)	සායනික අපද්‍රව්‍ය පිලිස්සීම සඳහා මාතලේ දිස්ත්‍රික් මහ රෝහල තුළ භාවිතා කරමින් තිබී ඇති කසළ දහන යන්ත්‍රය 2020 ජූලි 10 දින හදිසි ගිනි ගැනීමකට ලක්ව අක්‍රිය වී ඇති අතර මු.රෙ. 104(3) පරීක්ෂණ වාර්තාව අනුව වටිනාකම රු.1,663,200 ක් ලෙස දක්වා තිබුණු හානිය/ පාඩුව	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, සායනික අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ ස්ථාපිත කර තිබූ කසළ දහන යන්ත්‍රයට සිදුවූ හදිසි ගිනි ගැනීමෙන් සිදුවූ

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	සම්බන්ධව මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණය පවත්වා පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට අලාභ හානිය සිදු වී වර්ෂ 02 ක් ඉක්ම යන තුරුත් කටයුතු කර නොතිබුණි. පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 110 හි විධිවිධාන ප්‍රකාර ලේඛන ගත වීමක් සිදු වී නොතිබීම මත හා කසළ දාහකය එහි සැපයුම් ආයතන මගින් රු.1,540,000 ක (වැට් රහිත) පිරිවැයක් දරා අළුත්වැඩියා කර ගැනීමටත්, මධ්‍යම පළාත් ඉංජිනේරුසේවා දෙපාර්තමේන්තුවෙන් නිර්දේශිත ඇස්තමේන්තුවක් යටතේ එහි වහලය රු.615,000 ක් වැයකර අළුත්වැඩියා කර ගැනීමටත් නියමිතව තිබී ඇති නමුත් ඒ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග නොගෙන අත්හැර දමා තිබීම මත රජයේ වත්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 128(1) ඉ හි විධිවිධාන ප්‍රකාරව අදාළ බලධාරීන් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.		හානිය සම්බන්ධයෙන් මු.රෙ.104(4) පරීක්ෂණයක් පැවැත්වීම සඳහා මධ්‍යම පළාත් සෞඛ්‍ය ලේකම් විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණ බව, එයට අදාළ පරීක්ෂණ වාර්තාව සහ ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධ උපදෙස් මෙම රෝහල වෙත නොලැබීම හේතුවෙන් එම දාහකය අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග නොගෙන පවතින බව..
(ශ)	මඩකළපුව ශික්ෂණ රෝහලේ ප්‍රසව හා නාරීවේද විශේෂඥ වෛද්‍යවරයාගේ ඉල්ලීම මත 2019 දෙසැම්බර් මාසයේදී රු.63,855,000 ක වියදමින් ද්විත්ව 200W ඩයෝඩ ලේසර් යන්ත්‍රයක් (200W Dual Diode Laser Machine) මිලදී ගෙන තිබුණු අතර මේ සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ කොන්ත්‍රාත් ඉටුකිරීම සම්බන්ධයෙන් නොගැලපීම් කිහිපයක් නිරීක්ෂණය විය. එනම්_වගකීම් ආවරණය සහ අමතර කොටස් ලබා ගැනීමේ ටෙන්ඩර් කොන්දේසි තිබියදීත්, යන්ත්‍රයේ වගකීම් කාලය එය භාවිතා කිරීමට පෙර කල් ඉකුත් වී ඇති අතර අමතර කොටස් ලබා ගැනීමේ සහතිකයක් ලබා දී නොතිබුණි. මීට අමතරව, යන්ත්‍රය ස්ථාපනය නොකර රෝහල් කාර්ය මණ්ඩලය සඳහා අදාළ විස්තීරණ පුහුණුවක්ද ලබා දී නොමැතිව තිබියදී ටෙන්ඩර් කොන්දේසිවලට පටහැනිව සම්පූර්ණ ගෙවීම සිදු කර තිබුණි. ඒ අනුව විවිධ වෛද්‍ය තත්වයන්ට ප්‍රතිකාර කිරීමේ හැකියාව ඇති සැලකිය යුතු ආයෝජනයක් සහිත මෙම යන්ත්‍රය මිලදී ගැනීමෙන් පසු වසර හතරක් එනම් 2024 මාර්තු වන විටත් වෛද්‍යවරයා විසින් නියම කරන ලද	මේ සම්බන්ධයෙන් පූර්ණ ස්වාධීන විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	එකඟ නොවන බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ප්‍රතිකාර ක්‍රම සඳහා භාවිතයට නොගෙන පැවතීම හේතුවෙන් ශික්ෂණ රෝහල එහි වෛද්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වී තිබුණි.		
(ෂ)	කළුතර ශික්ෂණ රෝහලේ අනතුරු සහ හදිසි ප්‍රතිකාර ගොඩනැගිල්ලේ පළමු මහලේ ස්ථාපිත කර ඇති ශල්‍යාගාර තුළ ශල්‍යාගාරයකට අවශ්‍ය සියලුම තාක්ෂණික මෙවලම් මෙන්ම වෛද්‍යවරුන්ගේ, හෙද නිලධාරීන්ගේ කාමර ඇතුළු ශල්‍යාගාරයකට අවශ්‍ය සියලු අංගයන් ස්ථාපිත කර තිබුනද 2018 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් මස විගණන අවස්ථාව දක්වාම කිසිදු ප්‍රයෝජනයට නොගෙන එම ශල්‍යාගාරය වසා දමා තිබුණි.	අවශ්‍ය භෞතික හා මානව සම්පත් සම්පූර්ණ කර මෙම ශල්‍යාගාරය ප්‍රශස්ථ ලෙස භාවිතයට ගත යුතුය.	2018 වර්ෂයේ සිට පැවති නිර්වින්දන වෛද්‍ය වරුන්ගේ හා කනිෂ්ඨ කාර්ය මණ්ඩල හිඟතාවය මත මෙන්ම ශල්‍ය උපකරණ හිඟතාවය හේතුවෙන් **A & E** ගොඩනැගිල්ලේ ස්ථාපිත ශල්‍යාගාර ක්‍රියාත්මක නොවූණු බව, එහෙත් මේ වනවිට එම අඩුපාඩු යම්තාක් දුරට සපුරා ගනිමින් 2023.11.27 දින එම ශල්‍යාගාර තුළ **Endoscopy** පරීක්ෂණ සිදුකිරීම ආරම්භ කළ බව.
(ස)	රුපියල් මිලියන 102 ක පිරිවැයක් දරා කළුබෝවිල ශික්ෂණ රෝහලේ ස්ථානගත කිරීම සඳහා 2020/02/18 දින ප්‍රසම්පාදනය කර තිබූ Digital Fluoroscopy X Ray Machine නම් වූ වෛද්‍ය උපකරණය 2024/03/31 දින වන විටත් ස්ථානගත කිරීමේ ගොඩනැඟිල්ල සාදා නිම නොකිරීම හේතුවෙන් වගකීම් කාලයද ඉකුත් වී, රෝගී සත්කාර සඳහා භාවිතාවෙන් තොරව ජීව වෛද්‍ය ඉංජිනේරු ගබඩා ලේඛන වලද සඳහන් කිරීමකින් තොරව ගබඩා පරිශ්‍රයේ (වෙනත් රෝහල් වලින් කරනු ලබන ඉල්ලීමද නොසලකා) නිෂ්කාර්යව පැවතුණි.	මෙම යන්ත්‍රය කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	යන්ත්‍රය ජීව වෛද්‍ය ඉංජිනේරු ආයතනයේ ගබඩාවට ලැබුණු පසු රෝහල වෙත ගෙන යන ලෙස දැනුම් දුන්නද රෝහලින් යන්ත්‍රය රැගෙන ගොස් නොතිබුණු බව, මේ සම්බන්ධයෙන් අදාළ යන්ත්‍රය නිසි පරිදි උපයෝජනයට ගත හැකි වන පරිදි කටයුතු කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති බව.
(හ)	වටිනාකම රුපියල් මිලියන 88.2 ක් වූ Fluoroscopy යන්ත්‍රය 2021 පෙබරවාරි 12 දින ප්‍රසම්පාදනය කර මහරගම අපේක්ෂා රෝහලට ලබා	-එම-	2020.01.20 වන දින විකිරණවේදී විශේෂඥ වෛද්‍යවරයා විසින් මෙම යන්ත්‍රය සඳහා

	දී වර්ෂ 2 කට ආසන්න කාලයක් ගතවී තිබුණද විදුලි බලය නොමැතිව ස්ථානගත සවි කිරීමෙන් පසු පරීක්ෂාව සිදු කිරීමට නොහැකිව තිබුණි. ස්ථානගත සවිකිරීමේ සහතිකය 2023 දෙසැම්බර් 18 දින ලබා ගෙන, පරමාණු බලශක්ති අධිකාරියේ බලපත්‍ර ලබා ගැනීම සඳහා 2024 මාර්තු 06 දින අයදුම් කර තිබුණි. මෙම යන්ත්‍රය රෝගී සත්කාර සඳහා වර්ෂ 03කට වඩා කාලයක් භාවිතා කිරීමට නොහැකි වී තිබූ අතර වෛද්‍ය උපකරණ කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා වූ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට රෝහල් භාර නිලධාරීන්ගේ අවධානය යොමු විය යුතු බව නිරීක්ෂණය කෙරේ.		විකිරණ අංශයට යාබද ගොඩනැඟිල්ලක් සපයා දෙන ලෙස ලිපියක් එවකට අධ්‍යක්ෂක වෙත යොමුකර ඇති බව, මෙම යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා ගොඩනැඟිල්ලක් දැනට නොමැති බව දැනුම් දී ඇති බව, **Hayleys** ආයතනයෙන්ද 2020.02.04 දින අධ්‍යක්ෂක වෙත ලිපියක් එවා ඇති බව, 2021 මාර්තු 11 වන දින ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය **(CECB)** විසින් **PET CT SCAN** ගොඩනැඟිල්ලට යාබදව ඉහලින් ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට අවශ්‍ය සැලසුම් ක්‍රියාත්මක කරන ලෙස දන්වා ලිපියක් අධ්‍යක්ෂක වෙත යොමුකර ඇති බව, පරිත්‍යාගශීලීන් විසින් ගොඩනැඟිල්ල ඉදිකෙරුණද ඒ සඳහා විදුලි බලය සපයා නොතිබිණු බව, මෙම ව්‍යාපෘතියට තාවකාලිකව විදුලි සැපයුමක් හෝ ලබා දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් රෝහල් විදුලි නඩත්තු හා සේවා ආයතනය වෙතින් විමසන ලද අතර පවතින තත්ත්වය යටතේ තාවකාලික විදුලි සැපයුමක් ලබා දීමට නොහැකි බව එම ආයතනයෙන් 2022.10.20 දින දැනුම් දී ඇති බව, විකිරණ ශිල්පීන් හට මේ පිළිබඳව කරුපිටිය රෝහලෙන් පුහුණුවීම් කටයුතු සිදුකර ඇති අතර තව දුරටත් එම පුහුණුවීම් කටයුතු

			සිදුකිරීමට නියමිත බව, මෙහි රෝගී සත්කාර දැනට ආරම්භකර ඇති බව.
(ළ)	වෛද්‍ය සැපයීම් අංශය සතු වාහනවලට අදාළව සිදුකළ යුතුවන අළුත්වැඩියාවන් සිදුකිරීම ප්‍රමාද කිරීම නිසා පහතින් දැක්වෙන පරිදි දීර්ඝ කාලයක් නිෂ්කාර්යව පැවතුණි.		
	i. 41-9608 (ISUZU NPR) ලොරි රථය අළුත්වැඩියාවක් සඳහා 2021 නොවැම්බර් 20 දින සතොස මෝටර්ස් වෙත ගෙන ගොස් තිබුණද මෙම ලොරි රථය විගණන දිනය වූ 2023 ජුනි 20 දින වන විටත් වසර 1 මාස 07කට වැඩි කාලයක් නිෂ්කාර්යව ඉහත ගරාජය තුළ ගාල් කර තිබුණි. එහිදී මෙම ලොරි රථය ගරාජය වෙත භාර දී වසරකට පසුව රු.1,196,835 ක්වූ මුලික ඇස්තමේන්තුව රු.2,375,968 ක් ලෙස සංශෝධනය කර තිබුණි. මෙලෙස අළුත්වැඩියා කරන එංජීම සඳහා කිලෝමීටර් 100,000 ක වගකීම් කාලයක් ලිඛිතව ලබාගැනීමට යටත්ව අළුත්වැඩියාව සිදුකිරීමට 2023 පෙබරවාරි 24 දිනැති ප්‍රසම්පාදන කමිටු වාර්තාව මගින් අනුමැතිය ලබා දී තිබුණ ද, 2023 ජුනි 20 දින වන විටත් සතොස මෝටර්ස් වෙතින් ඒ සඳහා වූ එකඟතාවය ලිඛිතව ලබා ගෙන නොතිබුණි.	වාහන අළුත්වැඩියා කිරීමේදී පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතුය.	නිරීක්ෂණ හා එකඟ වන බව, අදාළ විගණනය ආරම්භ වන කාලය වන විට අළුත්වැඩියාව සඳහා වාහන යොමු කිරීමේදී ඒ සමඟ අදාළ අවශ්‍යතාවය හෝ අනුමැතිය දන්වා ලිපියක් පමණක් යොමු කරන ලද අතර මේ වන විට රථ ආයතනය වෙත ලිඛිතව භාරදීම සිදු කරනු ලබන බව, එම ලොරි රථයේ Engine Block කොටස පුපුරා ගොස් ඇති බව හඳුනා ගනු ලැබුවේ එංජීම ගලවා බැලීමෙන් පසුව පමණක් නිරීකෂණය වන්නක් බැවින් රු:2,375,968 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුව එය ගලවා බැලීමෙන් පසුව ඉදිරිපත් කර ඇති බව, එම අළුත්වැඩියාව සම්බන්ධයෙන් ඇති වූ තාක්ෂණික ගැටළු නිරාකරණය කර ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි උපදෙස් හා යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ, ප්‍රවාහන නිලධාරිගේ නිර්දේශ ලබා ගැනීම ඒ පිළිබඳව එම නිලධාරීන් හා සතොස ආයතනයේ නිලධාරීන් අතර අවස්ථා කිහිපයකදී

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			සාකච්ජා කිරීමට සිදු වූ බව, ඉන් පසු ඉහත කී සංශෝධන ඇස්තමේන්තුව ලබා ගැනීමට කටයුතු සිදු කළ අතර මෙම කරුණ ප්‍රමාදයට හේතු වූ බව, අදාළ නියෝජිත ආයතනය වෙතින් ප්‍රතිපත්තියක් ලෙස අළුත්වැඩියා කටයුතු සඳහා උපරිමය 10,000 km ක කාලයක් පමණක් ලබා දෙන අතර අප විසින් එය 100,000 km ප්‍රමාණයට දක්වා වැඩි කර ඉල්ලා තිබූ බැවින් ඒ පිළිබඳ එම ආයතන ප්‍රධානීන් දීර්ඝ ලෙස සාකාච්ජා කර 20,000 km වගකීම් කාලයක් පමණක් ලබා දීම එකඟ වී ඇති බව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව රු: 500,000 ඉක්මවා අළුත්වැඩියාවන් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීම මෙතෙක් සිදු කර නොමැති අතර දැනට ඒ අනුව කටයුතු කිරීම සඳහා උපදෙස් ලබා දී ඇති බව, මෙම ලොරි රථය අවූරුදු 38 ක් පමණ පැරණි බැවින් අවශ්‍ය අමතර කොටස් සොයා ගැනීම ද ඉතාමත් අසීරු කාර්යයක් වූ බැවින් ඒ සඳහා දීර්ඝ කාලයක් වැය වී ඇති බව, මේ වන විට අදාළ අළුත්වැඩියාව සම්පූර්ණ කර ඇති බව.
	ii. දෛනික ධාවන සටහන අනුව 41 – 4702 (ISUZU FTR) ලොරි රථය අවසන් වරට 2020 අප්‍රේල් 18 දින ධාවනය කර තිබුණු අතර එම රථයේ එංජින් පද්ධතියේ පවතින අඩුපාඩු හේතුවෙන් අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් යොමුකර තිබුණද විගණිත දිනය වූ	-එම-	ඉහත ලොරි රථය අළුත්වැඩියාව සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසු අදාළ ලොරි රථය අළුත්වැඩියාව සඳහා යොමු කර ඇත්තේ මාස 08 ක කාලයකට පසුව බව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	2023 ජුනි 20 දින වන විටත් එහි අළුත්වැඩියා කටයුතු සම්පූර්ණ කරවා ගැනීමට වෛද්‍ය සැපයීම් අංශය අපොහොසත් වී තිබුණි. ඒ අනුව මෙම ලොරි රථය වසර 3කට වඩා වැඩි කාලයක් ගරාජ තුළ නිෂ්කාර්යව ගාල් කර තිබුණි. එහිදී, ජයලත් ඉංජිනියරින් වර්ක්ස් වෙතින් රු.389,700 ක මිලකට අළුත්වැඩියාව සිදු කිරීමට 2020 ඔක්තෝබර් 20 දින ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා දී තිබුණ ද ලොරි රථය මාස 08ක් ප්‍රමාද කර ගරාජය වෙත 2021 ජුනි 23 දින යොමුකර තිබුණි. නමුත් ඉහත සඳහන් මිලට අළුත්වැඩියාව සිදු කිරීමට ගරාජ හිමිකරු එකඟ නොවීම නිසා නැවත වරක් මෙම අළුත්වැඩියාව රු. 573,550 ක මිලකට ලියනගේ මෝටර්ස් වෙත 2022 පෙබරවාරි 11 දින පවරා තිබුණි. ඒ අනුව ලොරි රථය ගරාජය වෙත භාරදීම ප්‍රමාද කිරීම නිසා මෙම අළුත්වැඩියාව සඳහා රු. 183,850 ක අතිරේක පිරිවැයක් දැරීමට රජයට සිදු විය හැකි බැවින් මේ සම්බන්ධයෙන් විමර්ෂණය කර ඊට වගකිවයුතු පාර්ශවයන්ගෙන් දැරීමට සිදුවිය හැකි අතිරේක පිරිවැය අයකර ගැනීමට කටයුතු කළ යුතු බවට නිරීක්ෂණය කෙරේ.		පිලිගන්නා බව, එම කාලය Covid – 19 වසංගත තත්ත්වය හේතුවෙන් විශේෂයෙන් එම ආයතනය වරින් වර වසා තිබීමත් ඒ කාල සීමාව තුළ රටෙහි ඇති වූ ව්‍යාකූල තත්ත්වයත් මෙවැනි කාර්යයන් ඇති වීමට හේතු වූ බව, මෙතෙක් වාහනයක් අළුත්වැඩියාව සඳහා ගරාජය වෙත භාරදීමේදී වාහනය හා උපාංග එසේ ලිඛිතව භාර දීමක් සිදු කර නොමැති අතර මේ වන විට එම අඩුපාඩුව නිවැරදි කර ඇති බව, මෙම කාලය තුළ රට තුළ පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් අමතර කොටස්වල මිල ඉතා සීඝ්‍රයෙන් ඉහල යාමක් සිදු වූ බව, අදාළ අළුත්වැඩියාවන් සඳහා මිල ගණන් කැඳවීමේ දී එම මිල ගණන් සඳහා වලංගු කාල සීමාවක් ඉල්ලා නොසිටින අතර මිල ගණන් ඉදිරිපත් කිරීමේදී සමහර ආයතන වෙතින් එම කාල සීමාවන් ඉදිරිපත් කරනු ලබන බව, මේ සම්බන්ධයෙන් ඇති විය හැකි වාසි/අවාසි සහගත තත්ත්වය සලකා ඉදිරියේදී මේ සම්බන්ධයෙන් මීට වඩා වගකීමෙන් කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව, දෙවන අවස්ථාවේදී අළුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවීමේදී ප්‍රථම අවස්ථාවේ මිල ගණන්වලට වඩා රු:183,850 ක වැඩි වීම දක්නට ඇති බව පිලිගන්නා බව, එම තත්ත්වයට එම කාලයේ රුපියල අව ප්‍රමාණ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			වීම ද හේතු වූ අතර වෛද්‍ය සැපයීම් අංශයේ ප්‍රමාදය ද මෙම තත්වයට හේතු වී ඇති බව,
	iii. දෛනික ධාවන සටහන අනුව අංක 58 – 5579 කැබ් රථය 2022 අප්‍රේල් 04 දිනෙන් පසුව ධාවනය කර නොතිබුණු අතර ඉන් මාස 04 කට පසුව කැබ් රථය අළුත්වැඩියා කළ යුතු බවට වෛද්‍ය සැපයීම් අංශයේ පරිපාලන නිලධාරි වෙත ලිඛිතව දන්වා තිබුණි. ඒ අනුව රු.483,350 ක මිලකට අළුත්වැඩියාව සිදුකරවා ගැනීම සඳහා විමල් මෝටර්ස් වෙත කැබ් රථය 2023 පෙබරවාරි 02 දින යොමුකර තිබුණ ද විගණන දිනය වූ 2023 ජූලි 13 දින වන විටත් අළුත්වැඩියාව සම්පූර්ණ කරවා ගැනීමට වෛද්‍ය සැපයීම් අංශය අපොහොසත් වීම නිසා වසරක වැඩි කාලයක් කැබ් රථය නිෂ්කාර්යව පැවතුණි.	-එම-	ධාවනයෙන් ඉවත් කර තිබූ මෙම කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා අදාළ රියදුරු මහතාගෙන් ආපදා තත්ත්වය පිළිබඳව ලිපියක් ඉල්ලා සිටියද ඔහු විසින් එය ලබා දීම පැහැර හරින ලද බව, ඒ බව ප්‍රවාහන අංශයේ විෂය නිලධාරී විසින් 2022.08.10 දින පරිපාලන නිලධාරි වෙත වාර්තා කිරීමෙන් පසු 2022.10.10 දින ප්‍රවාහන නිලධාරිගේ නිර්දේශ මත අළුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවන ලද බව, මෙම කරුණු ප්‍රමාදයට හේතු වූ බව, මෙම කැබ් රථය අළුත්වැඩියාව සඳහා අනුමැතිය ලැබී ආසන්න ලෙස මෙම රථය එම ආයතනය වෙත යොමු කිරීමට මාසයක පමණ කාලයක් ගත වී ඇති බව, එම රථය එම ආයතනය වෙත රැගෙන යාමට පෙර දුරකථනය මගින් විමසීම් සිදු කරනු ලබන අතර ඒ අනුව එම ආයතනයේ කාර්ය බහුලත්වය මත වාහනය යොමු කිරීම ප්‍රමාද වූ බව. වාහන අළුත්වැඩියාව සඳහා ඉදිරියේදී අදාළ ආයතනයන් වෙත භාර දෙන විට ඕසල්, උපාංග සහ වාහනය නිසි පරිදි භාරදීමේ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාවට නැංවීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	iv. දෛනික ධාවන සටහන අනුව 41- 4704 ලොරි රථය 2022 අගෝස්තු 23 දිනෙන් පසුව ධාවනය කර නොතිබුණු අතර ලොරි රථයට අළුතින් මුහුණක් තැබීම හා අනෙකුත් අළුත්වැඩියා කටයුතු සඳහා 2022 නොවැම්බර් 30 දින මිල ගණන් කැඳවීම සිදුකර තිබුණ ද, අවම මිල ඉදිරිපත් කළ ආයතන දෙකෙහි ලොරි රථවල මුහුණු පරීක්ෂා කර බලා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය විගණිත දිනය වූ 2023 ජුනි 20 දිනවන විටත් ලැබී නොතිබුණි. ප්‍රසම්පාදන කටයුතුවල මෙම ප්‍රමාදය නිසා මාස 10 ක පමණ කාලයක් මෙම ලොරි රථය නිශ්කාර්යව පැවතුණි.	-එම-	ලොරි රථයෙහි ඉදිරි මුහුණත තැබීම සඳහා අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතන දෙකෙහි මුහුණත් පරීක්ෂා කර බලා තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය ලබා ගැනීමට 2023.03.29 දින තීරණය කළ අතර ඒ සඳහා අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) ගේ අනුමැතිය 2023.04.10 දින ලැබී ඇති බව. ඒ අනුව 2023.05.02 දින තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බව, අදාළ වාර්තාව 2023.08.04 දින ලබා දී ඒ අනුව එම නිර්දේශ සලකා බැලූ ප්‍රසම්පාදන කමිටුව 2023.08.31 දින තරඟකාරී ලංසු ක්‍රමය යටතේ නැවත මිල ගණන් කැඳවීමට තීරණය ලබා දී ඇති බව, මෙම ලොරි රථය කරාපිටිය ශික්ෂණ රෝහලෙහි ලොරි රථවල ඇති දැඩි අවශ්‍යතාවය සහ ගැටළු දන්වමින් අධ්‍යක්ෂ කරාපිටිය ශික්ෂණ රෝහල මගින් කළ ඉල්ලීම සලකා බලා මීට ඉහතදී අමාත්‍යාංශය ගත් තීරණයකට අනුව වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ විසින් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව.
	v. දෛනික ධාවන සටහන අනුව GI – 9890 ලොරි රථය 2020 ජූලි 10 දිනෙන් පසුව ධාවනය කර නොතිබුණු අතර මෙම ලොරි රථයේ සිදු කළ යුතු අළුත්වැඩියාවන් වොල්ගා මෝටර්ස් වෙත රු.384,000 ක මිලකට පැවරීම සඳහා 2021 පෙබරවාරි 24 දින ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබී තිබුණ ද විගණන දිනය වූ 2023 ජූලි 17 දින වන	-එම-	ලොරි රථයේ අළුත්වැඩියාව ඉටු කර ගැනීම සඳහා යොමු කිරීම සඳහා 2021.03.17 දාතමින් ලිපියක් නිකුත් කර ඇති බව, එහෙත් එම ලොරි රථය ධාවනය කර රැගෙන යාමට නොහැකි වීම, Covid – 19 වසංගත

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	විටත් ගරාජය වෙත ලොරි රථය යොමු කිරීමට කටයුතු නොකිරීම නිසා වසර 3 කට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.		තත්ත්වය යන හේතු කාරණා සහ පෙර අවස්ථාවේ දී 41 – 9606 ලොරි රථය අළුත්වැඩියාව එම ආයතනය වෙතින් ඉවත් කිරීමට අනුමැතිය ලබා තිබුණත් එය ප්‍රතික්ෂේප කර නැවත භරවා එවීම සහ පසු කාලීනව GI – 9654 ලොරි රථය අළුත්වැඩියාවේදී ඇති වූ ගැටුම්කාරී තත්ත්වය සහ ඉන්ධන සම්පූර්ණයෙන් ඉවත් කර ගෙන තිබීම මෙම ලොරි රථය එම ආයතනය වෙත අළුත්වැඩියාව සඳහා යොමු කිරීමට නොහැකි වීම ප්‍රධාන වශයෙන් හේතු වූ බව, ගොනු කටයුතු ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම ප්‍රධාන වශයෙන් බලපා ඇති අතර මේ වන විට (සති දෙකකට පමණ පෙර සිට) තවත් ලිපිකරු මහතෙකුගේ සේවය ලබා ඇති බැවින් මෙම ලොරි රථයේ ඉදිරි කටයුතු ඉටු කිරීමට කඩිනමින් පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ඇති බව.
	vi. LK 6834 ලොරි රථයේ පිටුපස බොඩිය ඉතාමත් අබලන් තත්ත්වයකට පත්වී ඇති බැවින් එම පිටුපස බොඩිය අළුත්වැඩියා කර හෝ නව ශීතදාම බොඩියක් සපයා සවිකර දෙන ලෙස වාහනයේ රියදුරු විසින් 2020 ජුනි 03 දින ඉල්ලීමක් කර තිබුණු අතර ඒ සඳහා වරින් වර අවස්ථා 04 කදී මිල ගණන් කැඳවීම් සිදු කර තිබුණ ද, විගණන දිනය වූ 2023 ජුනි 20 දින වන විට වසර 3 කට වඩා වැඩි කාලයක් ගතවී ඇතත් මෙම අළුත්වැඩියාව සිදුකරවා ගෙන නොතිබුණි.	-එම-	ලොරි රථය සඳහා ශීතදාම සහිත ලොරි බොඩියක් සපයා සවි කිරීමට 2020 ඔක්තෝබර් 27 දින ප්‍රවාහන නිලධාරී නිර්දේශ කර මාස 3 ½ කට පසු මිල කැඳවීම සිදු කර ඇත්තේ එය ධාවන තත්ත්වයේ ලොරි රථයක් බැවින් සහ ධාවනය කළ නොහැකි ලොරි රථ සඳහා ප්‍රමුඛතාවය ලබා දුන් නිසා බව, අදාළ අළුත්වැඩියාව සඳහා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			අවස්ථා 04 කදී මිල ගණන් කැඳවූ නමුත් නොයෙක් හේතු මත නැවත නැවතත් මිල ගණන් කැඳවීමට සිදු වූ බව, ඒ අනුව මේ වන විට පස්වන වතාවටත් එම අළුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවා මිල ගණන් ලබා ගෙන ඇති බව, එම ලැබී ඇති මිල ගණන් පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සමඟ ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා ගැනීම සඳහා ගොනුව යොමු කර ඇති බව.
	vii. KB – 3755 ජීප් රථයේ සිදුකළ යුතුව තිබුණු අළුත්වැඩියාවක් නිසා 2021 ඔක්තෝබර් මාසයේ සිට මෙම ජීප් රථය ධාවනයෙන් ඉවත් කර තිබුණු නමුත් විගණන දිනය වූ 2023 ජූලි 17 දින වන විටත් මෙම අළුත්වැඩියාව සිදුකරවා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි. ඒ අනුව මෙම ජීප් රථය වසර 1 මාස 9 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි.	-එම-	මෙම ජීප් රථය අළුත්වැඩියාව සඳහා අවස්ථා දෙකකදී නියෝජිත ආයතනය වෙතින් මිල ගණන් ඉල්ලා සිටියද ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් නොකරන ලද බව, මෙම ජීප් රථය 2021 ඔක්තෝබර් සිට අවස්ථා දෙකකදී අළුත්වැඩියා සඳහා මිල ගණන් ලබා ගැනීමට උත්සාහ කල ද එය ද ව්‍යාවර්ථ වූ බව. නමුත් නිලධාරී ප්‍රවාහන රථවල ඇති දැඩි අවශ්‍යතාවය සලකා බලා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සැපයීම්) විසින් මෙම ජීප් රථය අළුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු කැඳවීමට 2024.04.04 දින නියෝග නිකුත් කර ඇති බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

3.7 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය		නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	රෝහල් හා ආයතන 19 ක් විසින් පිළියෙල කර තිබුණු ප්‍රකාශයන්හි (ඇමුණුම (i)) ඇතුළත් එකතුව රු. 118,369,992 ක් වූ අවස්ථා 143 කට අදාළ අගයන් අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.	රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන දත්ත හා අමාත්‍යාංශය විසින් එකී ආයතනවලට අදාළව ඉදිරිපත් කරනු ලබන දත්ත එකිනෙකට සමාන විය යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, රෝහල් හා ආයතන විසින් ඉදිරිපත් කරන ලද පිටපත් අංක (1) හා (2) න් ඉදිරිපත් කරන ලද සියලු තොරතුරු අමාත්‍යාංශ අවසන් ගිණුම් සටහන් අංක (1) හා (2) ඇතුළත්ව නැති බව, එයට හේතුව අමාත්‍යාංශ සටහන් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව ඉල්ලා ඇති තොරතුරු පමණක් ඇතුළත් කර පිළියෙල කර ඇති බැවිනි. ඒ අනුව තවදුරටත් කටයුතු කළ යුතු හානි හා පාඩු වෙන වෙනම ලේඛනයකින් ඉදිරිපත් කර ඇති බව.
(ආ)	රෝහල් හා ආයතන විසින් ඉදිරිපත් කරන ලද ඇමුණුම (i) පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
	i. මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන්ද ඇතුළුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ වටිනාකම රු.32,197,358 ක් වූවත් රෝහල් හා ආයතන විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයන්වලට අනුව එම වටිනාකම	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	රු.150,535,850 ක් විය. ඒ අනුව රු.118,338,492 ක වෙනසක් නිරීක්ෂණය විය.		
	ii. 2023 දෙසැම්බර් 31 දිනට රෝහල් හා ආයතනවල තවදුරටත් අයකරගැනීමට හෝ අත්හැරීමට ඇති පාඩු ප්‍රකාශයේ මුළු වටිනාකම (මෙහෙයුම්) රු.150,535,850 ක් විය. ඉන් රු.28,771,799 ක් වර්ෂ 05 ට වඩා වැඩි වටිනාකම් වූ අතර එය මුළු වටිනාකමින් සියයට 19 ක් විය. එමෙන්ම කාල විශ්ලේෂණය ඉදිරිපත් නොකළ වටිනාකම රු.10,636,981 ක් විය.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු අතර මෙම පාඩු වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ කඩිනමින් කටයුතු කළ යුතුය.	-එම-
	iii. ශ්‍රී ලංකා ජාතික රෝහලේ රු.17,000 ක් වූ වෛද්‍ය සහතික 34 ක් නැතිවීම සහ රු.14,500 ක් වූ වෛද්‍ය සහතික 28 ක් අස්ථානගත වීම පිළිබඳව රෝහල විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රකාශයේ සඳහන් නොවූවද අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයේ එම වටිනාකම් ඇතුළත් කර තිබුණි.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, අදාළ කරුණු සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා ශ්‍රී ලංකා ජාතික රෝහල වෙත ලිපි යොමු කර ඇති බැවින් අදාළ නිවැරදි තොරතුරු ලද වහාම ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.
(ඇ)	අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද වර්ෂය තුළ සිදු වූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය(ඇමුණුම (ii))අනුව මු.රෙ.109 යටතේ සිදු වූ පාඩු හා අත්හැරීම් අගය රු.4,764,754 ක් වූ අතර වර්ෂය තුළ පොතෙන් කපා හරින ලද අගය රු.4,762,128 ක් විය. ඒ අනුව වර්ෂය තුළ සිදුවූ පාඩු හා අත්හැරීම් අගය වර්ෂය තුළ පොතෙන් කපාහරින ලද අගයට ආසන්න අගයකින් සමාන වීමට ඇති අවස්ථා අවම වන බැවින් මෙම ප්‍රකාශයේ නිරවද්‍යතාවය පිළිබඳව ගැටළු සහගත විය.	මෙම සංඛ්‍යාවල නිවැරදිතාවය විගණනයට තහවුරු කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ඇමුණුම් අංක **(ii)** හි ඇතුළත් කර ඇත්තේ සටහන් අංක 1 හි ඇතුළත් පාඩු හා අත්හැරීම් හැර මු.රෙ 109 යටතේ වන පාඩු හා අත්හැරීම් බව, ඒ අනුව මෙම සටහනෙන් ඉල්ලා ඇත්තේ වර්ෂය තුළ සිදු වූ පාඩු හා අත්හැරීම් අගය එම අගය සමාන වන බවක් අදහස් නොවන බව.
(ඈ)	වර්ෂය තුළ මු.රෙ.109 යටතේ වන පොතෙන් කපාහැරීම් හා අයකර ගැනීම පිළිබඳ ප්‍රකාශය අනුව රෝහල් හා ආයතන 10 කට අදාළව සමාලෝචිත වර්ෂයේ රු.9,896,376 ක් වූ අලාභයන්ගෙන්		

	රු.6,227,356 ක් අයකරගෙන තිබුණු අතර රු.2,111,286 වටිනාකමක් පොතෙන් කපාහැර තිබුණි. කෙසේ නමුත් අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ප්‍රකාශය තුළ එම වටිනාකම් ඇතුළත් කර නොතිබුණි. එසේම අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයේ රෝහල් හා ආයතන 05 කට අදාළව ඇතුළත් කර තිබුණු රු.4,174,755 ක් වූ අලාභයන්ගෙන් රු.304,679 ක් අයකරගෙන තිබුණු අතර රු.4,172,129 ක වටිනාකමක් පොතෙන් කපාහැර තිබුණි. ඒ සම්බන්ධයෙන් තවදුරටත් පහත කරුණු නිරීක්ෂණය විය.		
	i. රිජ්වේ ආර්යා ළමා රෝහලේ රු.262,391 ක් වූ සිද්ධි 3 කට අදාළව පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳව රෝහල විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රකාශයේ සඳහන් නොවූවද අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයේ එම වටිනාකම් ඇතුළත් කර තිබුණි.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ඒ අනුව මෙම රෝහල් වලට අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් අදාළ පොතෙන් කපා හැරීම් හා අයකිරීම් සිදු කර ඇති බැවින් අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම් ඇතුළත් කර ඇතත් අදාළ රෝහල් හා ආයතන වලින් එවන ලද සටහන්වල සඳහන් කර නොමැති බව, ඒ අනුව ඒ පිළිබඳව එම ආයතන වලින් විමසා ඇති අතර පිළිතුරු ලද වහාම විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.
	ii. කරාපිටිය ශික්ෂණ රෝහලේ LW-0217 ගිලන් රථ අනතුරෙහි අලාභය වූ රු. 26,500ක් වූ පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳව රෝහල විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රකාශයේ සඳහන් නොවූවද අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයේ එම වටිනාකම් ඇතුළත් කර තිබුණි. එමෙන්ම අංක GK-9639 සහ අංක NC-6484 දරණ ගිලන් රථ අනතුරු සම්බන්ධව වූ අලාභයන්හි අගය රු.185,657 ක් ලෙස අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ප්‍රකාශයේ සඳහන් කර තිබුණද රෝහල විසින් පිළියෙල කළ ප්‍රකාශනයේ එය රු.467,946 ක් ලෙස පෙන්නුම් කර තිබුණි.		
	iii. ශ්‍රී ලංකා ජාතික රෝහලේ රු.532,143 ක් වූ NC-6485 දරණ වැන්රථ අනතුරෙහි පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳව රෝහල විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රකාශයේ සඳහන් නොවූවද අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයේ එම වටිනාකම් ඇතුළත් කර තිබුණි.	-එම-	-එම-
	iv. අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයේ සඳහන් කර තිබුණු සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ රු.578,000 ක කැමරාවක් අස්ථානගත වීම හා මහරගම මුඛ සෞඛ්‍ය ආයතනයේ රු.12,000 ක වාහන අනතුරට අදාළව පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳව අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයේ සඳහන් වූවද එය සනාථ කර ගැනීමට අදාළ ආයතන දෙකෙහි හානි හා පාඩු පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	-එම-	-එම-
(ඉ)	රෝහල් හා ආයතන 19 ක් ඇමුණුම (i) ආකෘතිය හිස් වාර්තාවක් ලෙසද, රෝහල් හා ආයතන 29 ක් ඇමුණුම (ii) ආකෘතිය හිස් වාර්තාවක් ලෙසද ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව එම රෝහල් හා ආයතනවල සමාලෝචිත වර්ෂය තුළ කිසිදු පාඩුවක් හා හානියක් (වාහන අනතුරුද ඇතුළුව) සිදු නොවීය යන්න විගණනයේදී ගැටළු සහගත ලෙස නිරීක්ෂණය කරමි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියළු ආයතනවල දත්ත වගකිව යුතු නිලධාරියෙකුගේ අත්සන සහිතව ලබාගෙන ගිණුම් පිළියෙල කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, ඒ පිළිබඳව අදාළ රෝහල් හා ආයතනවල සමාලෝචිත වර්ෂය තුළ කිසිදු පාඩුවක් හා හානියක් (වාහන අනතුරු ද අතුළුව) සිදු වී නොමැති ද යන්න පිළිබඳව විමසා ඇති බැවින් පිළිතුරු ලද වහාම නිවැරදිව තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.
(ඊ)	අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයද ඇතුළුව රෝහල් හා ආයතන 25 ක් විසින් ඇමුණුම (i) හා රෝහල් හා ආයතන 24 ක් විසින් ඇමුණුම (ii) ආකෘතින් ඉදිරිපත් කර නොතිබීම සහ ඉදිරිපත් කර	-එම-	පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ඇති ආකෘතින් පදනම් කර ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බැවින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය පිළිබඳ ගැටළු සහගත විය.		
(උ)	වෛද්‍ය සැපයීම් අංශයට අයත් ඖෂධ ගබඩාවල 2009 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ සිදුවී ඇති බවට හඳුනාගෙන තිබුණු ඖෂධ හානි හා පාඩු සිද්ධීන් 283කට අදාළව තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට ඇති රු. 440,225,100 ක් වූ පාඩු මූල්‍ය ප්‍රකාශවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.
(ඌ)	මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වූවත් රු. 22,914,374 ක ඖෂධ ඌණතා ද, රු.218,045,669 ක ඖෂධ කල් ඉකුත් වීම්ද, රු.199,265,056 ක ඖෂධ හානිවීම්ද සම්බන්ධයෙන් වසර 3 සිට වසර 14 ක අතර කාලයක් ගතවී ඇතත් විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ හා එකඟ වන බව, මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්ය මණ්ඩල නොමැති වීම හා අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් පැහැදිලි කිරීම් ලබා ගැනීමේ දී පවතින ගැටළුකාරී තත්වයන් නිසා මුදල් රෙගුලාසි ප්‍රකාරව මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම ප්‍රමාද වූ බව, කෙසේ වූවත් මේ තත්වයන් හඳුනා ගෙන ඉදිරි කාලය තුළ අදාළ පාර්ශවයන්ගෙන් පැහැදිලි කිරීම් ලබා ගෙන අවශ්‍ය කටයුතු සිදු කර ප්‍රගතිය ඉක්මණින් දන්වන බව.
(එ)	වෛද්‍ය සැපයීම් අංශය විසින් මුදල් රෙගුලාසි 110 (1) ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.	-එම-	නිරීක්ෂණ හා එකඟ වන බව, මේ සම්බන්ධයෙන් ද අවශ්‍ය කටයුතු මේ වසර තුළ සිදු කරන බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඒ)	2021, 2022 හා 2023 වර්ෂවල සිදු වී ඇති ඖෂධ කල් ඉකුත්වීම්, තත්ත්වයෙන් අසමත්වීම් හා ඖෂධ ඌණතාවයන් හඳුනාගෙන මුදල් රෙගුලාසි 110 (2) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය.	නිරීක්ෂණ හා එකඟ වන බව, මේ සම්බන්ධයෙන් ද අවශ්‍ය කටයුතු මේ වසර තුළ සිදු කරන බව.
(ඔ)	වෛද්‍ය සැපයීම් අංශයට අයත්ව තිබුණු කොටිකාවත්ත අංක 53 ගබඩාව 2016 මැයි 18 දින ගංවතුරට යටවීමෙන් පසු සිදු වී ඇති හානිය රු.405,576,870 ක් ලෙස ගණනය කර තිබුණු අතර ඉන් රු.206,311,814 ක් පමණක් අදාළ රක්ෂණ ආයතනය වෙතින් 2017 ජනවාරි 30 සහ 2017 සැප්තැම්බර් 21 යන දෙදින තුළදී ලබා දී තිබුණි. ඒ අනුව තවදුරටත් අයකර ගත යුතු මුදල රු.199,265,056 ක් වූ අතර වසර 07කට වැඩි කාලයක් ගතවී ඇතත් මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 101 සිට 113 ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.	මේ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගත යුතුය.	මේ පිලිබඳව පරීක්ෂා කර සොයා බැලීමේදී මේ සම්බන්ධයෙන් පවත්වා ගෙන යන ලද මුල් ගොනුව සොයා ගැනීමට නොහැකි වූ බව, එසේම මෙම සිද්ධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා වෛද්‍ය පර්යේෂණ ආයතනය (MRI) සමඟ ද සකච්ඡාව කර අදාළ තොරතුරු එම ස්ථානවල පවතින ගොනු වලින් ලබා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතින බව, එ අනුව රක්ෂණ සංස්ථාවෙන් යම් ප්‍රමාණයක් හෝ අයකර ගැනීමට කටයුතු කිරීම හෝ එසේ කළ නොහැකි නම් නැවතත් මහ භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් මුදල් රෙගුලාසි 103 -113 ප්‍රකාරව හානි පාඩු සම්බන්ධයෙන් කටයුතු කර කපා හැරීමට අවශ්‍ය කටයුතු නැවත සිදු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා බව.

3.8 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

----------		----------	----------
(අ)	2021 පෙබරවාරි 04 දින සිට 2023 පෙබරවාරි 03 දින දක්වා වර්ෂ දෙකක වැටුප් සහිත විදේශ නිවාඩු අනුමත කර තිබුණු වෛද්‍යවරයෙකු 2021 පෙබරවාරි 04 දින විදේශ ගතවී නැවත 2021 ජූලි 07 දින ශ්‍රී ලංකාවට පැමිණ තිබුණු බව ඔහුගේ විදේශ ගමන් පිළිබඳව ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව තහවුරු විය. නමුත් ඔහු ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව අමාත්‍යාංශයට ඒ බව දැනුම්දී නොතිබුණු අතර අදාළ පුහුණු දීමනාව හා මාසික වැටුප් ලබාගෙන තිබුණි. මේ ආකාරයට 2021 ජූලි 08 දින සිට 2021 සැප්තැම්බර් 02 දින දක්වා නියමිත පරිදි සේවයට වාර්තා නොකර වැටුප් හා විදේශීය පුහුණු දීමනාව ලබාගෙන තිබුණි. 2021 සැප්තැම්බර් 03 දින වෛද්‍යවරයා යාපනය ශික්ෂණ රෝහලේ රාජකාරි භාරගෙන තිබුණි. මෙම කාලපරිච්ඡේදයට අදාළ පුහුණු දීමනාව පසුව ප්‍රතිපූර්ණය කර තිබුණද විධිමත් අධිකාරි බලයක් රහිතව ගෙවන ලද වැටුප් හා දීමනා නැවත අයකරගෙන නොතිබුණි.	මෙම කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද සියළුම විගණන විමසුම්වල දැක්වෙන නිරීක්ෂණයන් ආවරණය වන පරිදි පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර නිලධාරිනිය සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	වෛද්‍යවරිය සම්බන්ධයෙන් සිදු කරන ලද මූලික විමර්ශනය අනුව එම මහත්මියට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීම සුදුසු බව නිර්දේශ කර ඇති බව, ඒ අනුව සකස් කරන ලද අංක **CF/DPO/**2023/50 හා 2023.12.28 දිනැති චෝදනා පත්‍ර කෙටුම්පත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව වෙත යොමුකර ඇති බව.
(ආ)	වෛද්‍ය නිලධාරියෙකු තම විදේශීය පුහුණු කාලය තුළ 2020 පෙබරවාරි 11 දින නැවත ශ්‍රී ලංකාවට පැමිණ ඇති බව ඔහුගේ විදේශ ගමන් පිළිබඳව ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව තහවුරු විය. නමුත් ඔබ විසින් එම වෛද්‍යවරයා නැවත ශ්‍රී ලංකාවට පැමිණි දිනය 2020 මාර්තු 30 බව දන්වා ඇත. මේ අනුව වෛද්‍යවරයා 2020 පෙබරවාරි 11 සිට 2020 මැයි 15 දින දක්වා සේවයට වාර්තා නොකිරීමට හේතුව විගණනයට තහවුරු නොවීය. එසේම මෙම කාලපරිච්ඡේදයට අදාළව ගෙවන ලද වැටුප් හා දීමනා පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර වැටුප් හා දීමනා ගෙවීමේ පදනම හා ලබාගත් අනුමැතිය කුමක්ද යන්නත් විගණනයට තහවුරු නොකෙරුණි. එසේම 2020 මාර්තු 30 දින සිට 2021 නොවැම්බර් 27 දින දක්වා වෛද්‍යවරයා	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	රාජකාරි කළ බව දක්වා තිබුණද 2020 මාර්තු 30 දින සිට 2020 මැයි 15 දින දක්වා රාජකාරි කලේ කුමන ආයතනයකද යන්න හා ඉටුකරන ලද රාජකාරීන් මොනවාද යන්න තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.		
(ඇ)	කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාඨමාලාවේ 2017-2019 කණ්ඩායම සඳහා අවිධිමත් ලෙස තැනැත්තියක් බඳවා ගැනීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාඨමාලාවේ 2017-2019 සඳහා සිසුන් බඳවා ගැනීමට අදාළව 2017 අප්‍රේල් 21 දින අංක TA/REC/PSM/17/2016 දරන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන III) ගේ ලිපිය සමඟ යොමුකළ නාම ලේඛනයේ නම ඇතුළත් කර නොතිබුණු තැනැත්තියක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම, ඉදිරිපත් කරන ලද ව්‍යාජ උසස් පෙළ විභාග සහතිකය හොඳින් පරීක්ෂා නොකිරීම, මැයගේ බැඳුම්කරයට හාරකරු ලෙස කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ විදුහල්පතිවරයා අත්සන් කිරීම, එම ඇපකරයේ සාක්ෂිකරු ලෙස එම ආයතනයේ නිලධාරියෙකු අත්සන් කිරීම යන කරුණු අනුව මෙම තැනැත්තිය දැනුවත්වම වංචනික ලෙස පුහුණුව සඳහා බඳවාගෙන තිබුණු බව තහවුරු විය.	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත යුතුය.	මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් ආරම්භ කර ඇති අතර එම මූලික විමර්ශන වාර්තා සඳහා අනුමැතිය ලැබීමෙන් පසු විනය කටයුතු සිදු කිරීම සඳහා යොමු කර ඇති බව.
	ii. වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ඩිප්ලෝමා පුහුණු පාඨමාලාවේ 2017-2019 කණ්ඩායමට ඇතුළත් වීම සඳහා වූ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කර තිබුණු අ. පො. ස. උසස්පෙළ ප්‍රතිඵල සහතිකයේ Z අගය 1.4034 ක් ලෙස වෙනස් කර තිබුණුද එම Z අගය අකුරෙන් Minus Zero Point Four Zero Three Four ලෙස පැහැදිළිව සටහන් කර ඇතත් ඒ බව	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	හඳුනාගෙන නොතිබීම ගැටළුකාරී විය. එසේම අවශ්‍ය මූලික සුදුසුකම් පුහුණු පාඨමාලාවට ඇතුළත් වන අවස්ථාවේ සම්පූර්ණ කර නොමැති බවට කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂ විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පුහුණු හා පර්යේෂණ) වෙත දැනුම් දී තිබුණේ පාඨමාලාව අවසන් වී වර්ෂ 3 ½ ක් ගත වූ පසුව එනම් 2023 පෙබරවාරි 08 දින විය.		
	iii. එසේම උක්ත නිලධාරිනියට වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සඳහා බඳවා ගැනීමට දැනුම් දී ඇතැයි ඇය විසින් ඉදිරිපත් කර තිබුණු ලිපියෙහි MATARA 176 ලෙස සඳහන්ව තිබුණද එම අංකයට වෙනත් නිලධාරියෙකු නම් කර තිබුණු අතර එම ලිපිය ද සම්මුඛ පරීක්ෂණ උපලේඛන සමඟ සසඳා නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.	-එම-	-එම-
	iv. නිලධාරිනියගේ පත්වීම් ලිපියේ වගන්ති අංක 18 ප්‍රකාරව පත්වීම භාරගත් දිනයේම අදාළ ලිපිලේඛන ආයතන ප්‍රධානියා වෙත භාරදීමට කටයුතු කළයුතු වූවත්, අදාළ විභාග සහතික ඉදිරිපත් කිරීම නිලධාරියා විසින් පැහැර හැර තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳව වගකිවයුත්තන්ගේ අවධානය ද යොමු වී නොතිබුණි.	-එම-	-එම-
	v. අතිරේක ලේකම් (පාලන) II විසින් 2023 මැයි 08 දිනැති අංක MH/TA/04/MLT/PF/34/2020 දරන ලිපිය මගින් උක්ත නිලධාරිනියගේ පත්වීම අවසන් කිරීමට කටයුතු කර තිබුණු නමුත් ලිපියේ පරිදි නිලධාරිනිය භාරයේ පැවති රජයේ සියළුම දේපල, ලිපිලේඛන, යතුරු, පරිගණක මුරපද හා රාජකාරී හැඳුනුම්පත ආදිය විධිමත් පරිදි භාරදුන් බවට තොරතුරු 2023 මැයි 26 වන විටත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	vi. මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීමට කටයුතු කරන ලෙස අතිරේක ලේකම් (පාලන) II විසින් 2023 අප්‍රේල් 11 දිනැති අංක MH/TA/04/MLT/PF/34/2020 දරන අභ්‍යන්තර සටහන මගින් හදිසි වැටලීම් අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වෙත දන්වා යවා තිබුණු අතර එහි ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	-එම-	-එම-
	vii. උක්ත නිලධාරිනිය පුහුණු පාඨමාලාවට බඳවා ගැනීමේ දින සිට පත්වීම අවසන් කරන තෙක් රජය විසින් ඇය වෙත ගෙවා තිබුණු පුහුණු දීමනා, පුහුණුව සඳහා රජය වැයකළ මුදල්, වැටුප් හා දීමනා, අනෙකුත් දීමනා ඇතුළු සියළු ගෙවීම් ගණනය කර අයවිය යුතු සම්පූර්ණ මුදල වංචනිකව හෝ නොසැලකිලිමත්ව කටයුතු කළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	-එම-	-එම-
(ඇ)	විගණනය විසින් කරාපිටිය ශික්ෂණ රෝහලට අදාළව ලබාගත් හදිසි ඇමතුම් රසායනාගාර පරිගණකයෙහි නිදර්ශක පරීක්ෂණ වාර්තාවලට අනුව රෝහලේ වෛද්‍ය නිලධාරියෙකුගේ නිර්දේශ නොමැති හා රසායනාගාර පරීක්ෂණ තුන්ඩු නිකුත් නොවූණු රුධිර සාම්පල් විශාල ප්‍රමාණයක රසායනාගාර පරීක්ෂණ ඇමතුම් කාල පරිච්ඡේදය තුළදී සිදුකර එම දත්ත හා තොරතුරු, අදාළ රසායනාගාර පරිගණකවලින් මකා දමා (Delete) තිබුණි. ඒ අනුව එසේ මකා දමන ලද රෝහලෙන් පරිබාහිර පරීක්ෂණ 2,884 ක් විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, ඒ වෙනුවෙන් රෝහල විසින් මිලදී ගෙන තිබුණු රු. 647,214 ක් වටිනා ප්‍රතික්‍රියක (Reagent) භාවිතා කිරීම නිසා එම පරීක්ෂණ සිදුකරන ලද හා අදාළ දිනවල සේවයේ නියුතු එක් එක් රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරීන් විසින් රජයේ සම්පත් හා දේපළ සාවද්‍ය පරිහරණයට යොදාගෙන තිබුණු බවට නිරීක්ෂණය විය.	-එම-	කරාපිටිය රෝහල විසින් මූලික පරීක්ෂණයක් පවත්වන ලද අතර එම වර්තාවේ නිර්දේශ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩිදුර පරීක්ෂණයක් පවත්වන ලෙස නිර්දේශ කර ඇති බව, ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විධිමත් විමර්ශනයක් මේ දිනවල සිදු කරනු ලබන බව, එම විමර්ශනයේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඉ)	මාතලේ දිස්ත්‍රික් මහ රෝහල මගින් විදුලි ජනක යන්ත්‍ර දෙකක් සඳහා 2021 මාර්තු 13 සිට 2022 ජුනි 15 දින දක්වා මාස 15 ක කාලය තුළ රු.1,562,900 ක් වූ ඉන්ධන ලීටර 11,350 ක් මිලදී ගෙන තිබුණද යන්ත්‍ර සඳහා ඉන්ධන යෙදීම සම්බන්ධ විධිමත් ලේඛන පවත්වා නොතිබුණි. යන්ත්‍ර දෙක සඳහා ඉන්ධන යෙදීම පිළිබඳ වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි ලේඛන පවත්වා තිබුණු 2022 ජුනි 15 සිට 2023 මාර්තු 28 දක්වා මාස 09 ක කාලය තුළ ඉන්ධන භාවිතය, ධාවන පැය ගණන හා විදුලි ජනක යන්ත්‍රවල අභ්‍යන්තර හා බාහිර ඉන්ධන ගබඩා ටැංකිවල ධාරිතාවය යන දත්ත අනුව 150 kVA Volvo (TWD 610 G) සහ 638 kVA cummins (AS 703 C) යන යන්ත්‍ර දෙකෙහි පැයක සාමාන්‍ය ඉන්ධන දහනය පිළිවෙලින් ලීටර් 14 ක් හා ලීටර් 31 ක් බව නිරීක්ෂණය වූ බැවින් විධිමත් ලේඛන නොපැවති මාස 15 ක කාලය තුළ භාවිතා වී තිබිය යුතු ඉන්ධන ප්‍රමාණය ලීටර් 6,736 ක් වූවද, ඉන්ධන ලීටර් 9,454 ක් එනම්, විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාත්මකව තිබූ පැය ගණන අනුව අවශ්‍ය විය හැකි ඉන්ධන ප්‍රමාණයට වඩා රු.374,268 ක් (කාල පරිච්ඡේදයට අදාළ ඉන්ධන මිලෙහි සාමාන්‍ය 137.70 ක් ලෙස ගත් විට) වූ ඉන්ධන ලීටර් 2,718 ක් අවභාවිතා වී තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, රෝහල විසින් අදාළ ලේඛන අනුව 2023 ජූලි මස සිට 2023 දෙසැම්බර් මස දක්වා යන්ත්‍රවලට යොදා ඇති ඉන්ධන ප්‍රමාණය සහ යන්ත්‍ර ක්‍රියාත්මක වී ඇති පැය ගනන අනුව ගනනය කිරීමේදී **CUMMINS** විදුලි ජනක යන්ත්‍රය සඳහා පැයක සාමාන්‍ය ඉන්ධන දහනය ලීටර් 42 ක් හා **VOLVO** විදුලි ජනක යන්ත්‍රය සඳහා ලීටර් 13 ක් වැයවන බවත් නිරීක්ෂණය වූ බව, මේ සම්බන්ධයෙන් රෝහල මට්ටමෙන් පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී අවස්ථා දෙකකදී සහ පළාත් විගණන විගණන කමිටු රැස්වීමේදී සාකච්ඡා වූ අතර එහිදී මෙය ඉතා සංකීර්ණ ගැටළුවක් වන හෙයින් එය රෝහල මට්ටමෙන් විසඳාගත නොහැකි බවත් ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මට්ටමින් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවටත් විගණනය විසින් අවධාරණය කරන ලද බව, ඒ අනුව මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදු කරන ලද මු.රෙ.104(4) පරීක්ෂණ වාර්තාව ගෙන්වා ගැනීමට කටයුතු කරන බව.
(ඊ)	මාතලේ දිස්ත්‍රික් මහ රෝහල භාවිතා කරන 150 kVA Volvo (TWD 610 G) හා 638 kVA cummins (AS 703 C) විදුලි ජනක යන්ත්‍ර සේවා කිරීම	-එම-	නිරීක්ෂණ සමඟ එකඟ වන බව, විධිමත් සේවා නඩත්තුවක් සිදුව නොතිබූ බැවින් එම

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ ඇති කර ගෙන තිබුණු සේවා ගිවිසුම් අනුව මාස 06 කට වරක් හෝ ධාවන පැය 250 කට පසු යන දෙකෙන් පළමුව පැමිණෙන අවස්ථාවේ සේවා කළ යුතු වූවත් එපරිදි සේවා කිරීම් සිදු කර නොතිබුණු අතර, එක් සේවා වාරයක් සිදු කර මාස 10ක් මාස 12 ක් හා මාස 22 ක් ගතවූ පසු ඊළඟ සේවා කිරීම සිදු කර තිබුණි. 638 kVA cummins විදුලි ජනක යන්ත්‍රයේ සේවා කිරීම් පරීක්ෂා කිරීමේ දී 2021 ඔක්තෝබර් 02 දින සේවා කර වර්ෂයක කාලයක් ගතවූ පසුව 2022 ඔක්තෝබර් 04 දින රෝහලේ දැනුම්දීම මත සේවා සැපයුම් ආයතනය පැමිණ තිබුණු අතර එහිදීද අවධිමත් ලෙස සම්පූර්ණ ලිහිසි තෙල් ප්‍රමාණයම යෙදීම වෙනුවට රු.140,800 ක් ඉන්වොයිස් කර (ප්‍රවාහන ගාස්තුව රු.20,800 ක් ද ඇතුළුව) ලීටර් 50 ක් පමණක් යොදා නැවත දින 08 කට පසු එම ආයතනයෙන්ම යන්ත්‍රයේ පවතින ලිහිසි තෙල් නුසුදුසු බව (Contaminated) පවසමින් සම්පූර්ණ ලිහිසි තෙල් ප්‍රමාණයම යෙදා තිබුණු බැවින් ලිහිසි තෙල් ලීටර් 50 ක් වෙනුවෙන් රු.120,000 ක අනාවර්තික වියදමක් දැරීමට සිදුව ඇති බව නිරීක්ෂණය විය.		ලිහිසි තෙල් කාන්දුව සිදුවූ අවස්ථාවේ යොදන ලද තෙල් සඳහා අදාළ ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ රු 120,000 ක බිල්පත සඳහා රෝහල විසින් කිසිදු ගෙවීමක් සිදු නොකළ බව.
(ඇ)	2009 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කොළඹ ජාතික රෝහලේ වික්‍රිරණවේදී විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් සිදුකර තිබුණු විදේශ ගමන් 29 ක් සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහතින් දැක්වෙන කරුණු නිරීක්ෂණය විය		
	i. මෙම නිලධාරියා සඳහා වික්‍රිරණවේදී පුහුණුවක් වෙනුවෙන් 2018 මාර්තු 01 සිට 2018 අගෝස්තු 31 දක්වා මාස 6 ක වැටුප් සහිත විදේශ නිවාඩුවක් 2018 පෙබරවාරි 12 දින සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අනුමත කර තිබුණි. එහිදී මෙම පුහුණුව 2018 මාර්තු 01 සිට 2018 මැයි 31 දක්වා මාස 03 ක කාලයක් ඇමරිකා එක්සත් ජනපදයේ ජෝන් හොප්කින්ස් විශ්වවිද්‍යාලයෙන් ද, 2018 ජුනි 01 සිට 2018 අගෝස්තු 31 දක්වා මාස 03 කාලයක් ඉන්දියාවේ Medanta neuro,	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	vascular Center හිදී ද සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ නමුත් අමාත්‍යවරයා විසින් අනුමත කර තිබුණු කාලය තුළ විදේශ පුහුණුවට සහභාගිවී නොතිබුණු අතර ඒ වෙනුවට ඉහත පුහුණුව ඇමරිකා එක්සත් ජනපදයේ ජෝන් හොප්කින්ස් විශ්වවිද්‍යාලයෙන් ලබා ගැනීම වෙනුවෙන් 2018 අප්‍රේල් 10 සිට 2018 ජූලි 09 දක්වා මාස 03ක කාලයක් සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) විසින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ සඳහා රු.289,400 ක ගුවන් ටිකට්පත් ගාස්තුවක් සහ මාස 03 හි ජීවන වියදම් දීමනා ලෙස එක්සත් ජනපද ඩොලර් 5,781 (රුපියල් වටිනාකම 1,849,920) ක් හා උණුසුම් ඇඳුම් දීමනා ලෙස බ්‍රිතාන්‍ය ස්ටර්ලින් පවුම් 75 (රුපියල් වටිනාකම 30,525) ක මුදලක් එම නිලධාරියා වෙත ගෙවා තිබුණු අතර මාස 03ක කාලය වෙනුවෙන් ඔහුට හිමි වැටුප ද ගෙවා තිබුණි. නමුත් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු ප්‍රකාරව, මෙම නිලධාරියා 2018 ජුනි 30 දින විදේශ ගතව 2018 ජූලි 31 දින නැවත දිවයිනට පැමිණ ඇති බවත්, ඒ අනුව දින 32 ක් පමණක් විදේශ ගතවී සිටි බවත්, අනුමත වැටුප් සහිත විදේශ නිවාඩු 2018 ජූලි 09 දින අවසන්ව පැවතීම හේතුවෙන් 2018 ජූලි 10 වන දින සිට නැවත ලංකාවට පැමිණි 2018 ජූලි 31 දින දක්වා දින 22ක කාලයක් අනුමත විදේශ නිවාඩු දීර්ඝ කර ගැනීමකින් තොරව විදේශගතව සිට ඇති බවත් නිරීක්ෂණය විය.	-	-
	ii. එසේම ඉහත මාස 06 ක පුහුණු කාලයෙන් ඉන්දියාවේ Medanta neuro, vascular Center ආයතනයේදී ලබා ගැනීමට නියමිතව තිබුණු මාස 03 ක පුහුණුව සඳහා 2019 ඔක්තෝබර් 21 දින සිට 2020 ජනවාරි 20 දින දක්වා වැටුප් සහිත විදේශ නිවාඩු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) විසින් අනුමත කර තිබුණු අතර ඒ සඳහා ගුවන් ගමන්	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ටිකට්පත් ගාස්තුව ලෙස රු.119,200 ක් හා ජීවන වියදම් දීමනා ලෙස ඉන්දියානු රු.211,143 (ශ්‍රී ලංකා රුපියල් වටිනාකම 812,900) සහ මාස 03ක කාලය වෙනුවෙන් ඔහුට හිමි වැටුප ද ගෙවා තිබුණි. නමුත් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු ප්‍රකාරව, මෙම නිලධාරියා 2019 ඔක්තෝබර් 30 දින විදේශ ගතව සිට 2019 නොවැම්බර් 04 දින නැවත ලංකාවට පැමිණ තිබුණු බවත්, ඒ අනුව දින 06 ක් පමණක් විදේශ ගතවී සිටි බවත් නිරීක්ෂණය විය.		
	iii. ඉහත පුහුණුව ලබා ගත් බවට ඇමරිකා එක්සත් ජනපදයේ ජෝන් හොප්කින්ස් විශ්වවිද්‍යාලය සහ ඉන්දියාවේ Medanta neuro, vascular Center ආයතනය විසින් තහවුරු කෙරෙන සහතික පෞද්ගලික ලිපි ගොනුව සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර අවස්ථා දෙකේදීම ලංකාවට නැවත පැමිණීමෙන් පසු සේවයට වාර්තා කළ බවට ලිඛිතව තහවුරු නොවීය.	-එම-	-එම-
	iv. මෙලෙස විදේශ පුහුණුවක් සඳහා අධ්‍යන නිවාඩු අනුමත කර අදාළ දීමනා ගෙවීමට පෙර අදාළ විදේශීය පුහුණු ආයතනය විසින් එම නිලධාරියාව පුහුණුව සඳහා තෝරා ගෙන තිබෙන බවටත්, ඊට අදාළ පුහුණු කොන්දේසි මොනවාද යන්නත්, පුහුණුවට අදාළව විදේශීය ආයතනය විසින් නියම කර තිබෙන කොන්දේසි සමඟ සලකා බැලීමේදී අදාළ දීමනා එම නිලධාරයාට හිමි බවටත් තහවුරු කර ගැනීමෙන් පසුව අදාළවන දීමනාවන් ගෙවිය යුතු වූවත් ඉහත "(i)" සහ "(ii)" යන නිරීක්ෂණවල සඳහන් දීමනාව එම නිලධාරියාට ගෙවීමේදී එවන් තහවුරු කර ගැනීමක් සිදුකර නොතිබුණු බවටත්, ඉහත අවස්ථා දෙකෙදී ජීවන වියදම් දීමනාව (Living Allowance) ලෙස හඳුන්වමින් මාස 03 සඳහා එකවර මෙම දීමනාව ගෙවා තිබුණු අතර එය පශ්චාත් උපාධි පුහුණුව ලබන වෛද්‍ය නිලධාරීන්ට ගෙවන ශිෂ්‍යත්ව දීමනාව පදනම්කර ගෙන ගණනය කර තිබුණු බවත්	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	නිරීක්ෂණය විය. ඒ අනුව නිලධාරියාට ගෙවන ලද මෙම දීමනාව කුමක්ද යන්න විගණනයේ දී අපැහැදිලි විය.		
	v. ඉහත අවස්ථා දෙකේදීම ගුවන් ගමන් ටිකට් පත් ගාස්තුව රජය විසින් ගෙවා තිබුණ ද, ගුවන් ගමන් ටිකට් නිකුත්කරන ආයතනය විසින් (Air ticket issuing Agency) නිකුත්කරන ලදුපත (Receipt) මගින් පමණක් ගෙවීම තහවුරු කර තිබුණු නමුත් ගුවන් ගමනේ විස්තර තහවුරු කෙරෙන ලේඛන (Itinerary) ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව රජය විසින් වියදම් දරන ගුවන් ගමන ඒ ආකාරයෙන්ම සිදුකර තිබුණේද යන්න තහවුරුවක් නොතිබුණු අතර එම ගුවන් ගමන් විදේශ නිවාඩු ආරම්භවන දින හෝ ඊට ආසන්න දිනයක සිදු වී නොමැති බවට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු මගින් නිරීක්ෂණය විය.	-එම-	-එම-
	vi. ඒ අනුව මෙම නිලධාරියා සඳහා මාස 06 ක වැටුප් සහිත විදේශීය පුහුණු කාලයක් අනුමත කර එම කාලයට අදාළව දීමනා සහ ගුවන් ගමන් ටිකට් පත් ගාස්තු ගෙවා තිබියදී, අනුමත කාලය තුළ දිවයිනෙන් බැහැරව සිටි කාලය දින 16 ක් පමණක් බවත්, දිවයිනෙන් බැහැරව සිටි එහෙත් නිවාඩු අනුමත කර ගෙන නොතිබුණු කාලය දින 22 ක් බවත්, අනුමත මාස 06 ක කාලයෙන් දින 16 හැරුණු විටෙක ඉතිරි කාලය ශ්‍රී ලංකාව තුළ රැඳී සිට ඇති බවත්, ශ්‍රී ලංකාව තුළ රැඳී සිට ඇති කාලය තුළ සේවයට වාර්තා කර තිබුණු බවට ලිඛිතව තහවුරු නොවූණු බවටත්, අදාළ පුහුණුව සම්පූර්ණ කළ බවට තහවුරු කෙරෙන සහතික ඉදිරිපත් කර නොමැති බවටත්, එබැවින් රජයේ මුදල් සාවද්‍ය පරිහරණයකට ලක් කර තිබෙන බවටත් විගණනයේදී නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් අවශ්‍ය වන විනය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය සහ රජයට සිදුකර	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	තිබෙන අලාභයන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමි.		
	vii. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු ප්‍රකාරව, මෙම නිලධාරියා 2009 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අවස්ථා 29 කදී විදේශ ගත වී තිබුණු අතර ඉන් විදේශ ගත වීම් අවස්ථාවන් 20 කට අදාළව නිලධාරියා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 23:1 ප්‍රකාරව විධිමත් පරිදි විදේශ නිවාඩු ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර විදේශ නිවාඩු අනුමත කරවා ගෙන නොතිබුණි. ඒ අනුව ආයතන සංග්‍රහයට පටහැනිව රාජ්‍ය සේවයේ සිටිය දී, විදේශ නිවාඩු අනුමත කරවා ගැනීමකින් තොරව විදේශ ගත වීම සම්බන්ධයෙන් මෙම නිලධාරියාට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවයත්, එලෙස විදේශ ගතව සිටි කාලය සඳහා ගෙවන ලද වැටුප් හා දීමනා ගණනය කර ආපසු අයකර ගැනීමේ අවශ්‍යතාවයත් විගණනයේ දී නිරීක්ෂණය කෙරේ.	-එම-	එකඟ වන බව, මාස 03කට පෙර විදේශ ගමන් අයදුම් පත්‍ර හා නිවාඩු ඉල්ලුම්පත්‍ර භාර දීමට කටයුතු කරන ලෙස සියලුම වෛද්‍යවරුන්ට හා විශේෂඥ වෛද්‍යවරුන් හට උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති බව.
	viii. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ පවත්වා ගෙන යනු ලබන සෞඛ්‍ය අංශ නිලධාරීන් විදේශයන්ට පිටවීම හා නැවත ශ්‍රී ලංකාවට පැමිණීම සටහන් කරන ලේඛනයේ විදේශ ගතවන නිලධාරීන් සටහන් තැබිය යුතු වුවද මෙම නිලධාරියා විසින් තම විදේශ ගතවීම් සහ නැවත පැමිණීම ඉහත ලේඛනයේ සටහන් කර නොතිබුණු බව එම නිලධාරියාගේ විදේශ ගතවීම් අවස්ථා 05 ක් නියැදියක් ලෙස තෝරා ගෙන පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.	-එම-	පිළිතුරු ලබා දී නොතිබුණි
	ix. 2010 ජූනි මාසයේ සිට මෙම නිලධාරියා කොළඹ ජාතික රෝහලේ සේවය කරන අතර 2023 වසර තෙක් අවස්ථා 26 කදී නිලධාරියා	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	විදේශගතව තිබුණු අතර ඉන් අවස්ථා 12 කදී පමණක් කොළඹ ජාතික රෝහලේ අධ්‍යක්ෂ කාර්යාලයේ පවත්වා ගෙන යනු ලබන සෞඛ්‍ය නිලධාරීන් විදේශයන්ට පිටවීම සහ නැවත පැමිණීම සටහන් තබන ලේඛනයේ සටහන් තබා තිබුණු අතර එම සටහන් ද නිලධාරියා සත්‍ය වශයෙන් විදේශගතව තිබුණු දිනයන් හා නැවත පැමිණි දිනයන් සමඟ සැසඳීමේදී වෙනස්කම් නිරීක්ෂණය විය.		
	x. ඉහත නිරීක්ෂණයන් අනුව නිලධාරීන්ගේ විදේශ ගතවීම් සම්බන්ධයෙන් පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය ඉතාමත් දුර්වල මට්ටමක පවතින බවත්, එම අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවයත් පෙන්වා දෙමි. මෙම තත්ත්වය අංක HSM/E/MH/01/2021/02 දරන 2021 සැප්තැම්බර් 23 දිනැති විගණන විමසුම මඟින්ද පෙන්වා දී ඇත.	-එම-	-එම-
(ඌ)	මහරගම අපේක්ෂා රෝහලේ සේවය කරන ලද වෛද්‍යවරයෙකු සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කිරීම සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. වෛද්‍ය නිලධාරියෙකු විසින් සේවයට පැමිණීම හා පිටවීම සහ ඉටුකළ කාර්යයන් පිළිබඳව සෞඛ්‍ය 99 ආකෘතියේ දින පොතක සටහන් කර බලය පවරන ලද ඉහළ නිලධාරියෙකුගේ අනුමැතිය සහිතව මාසිකව ලබා දිය යුතු වුවත් මෙම වෛද්‍යවරයා විසින් අදාළ දින පොත් නියමිත පරිදි භාරදී නොමැති බව නිරීක්ෂණය විය. නියැදියක් ලෙස 2020 ජනවාරි සිට මෙම වෛද්‍යවරයා සේවය අතහැර ගියා ලෙස සලකා කටයුතු කරන ලද 2022 දෙසැම්බර් 14 දින දක්වා කාලපරිච්ඡේදය පරීක්ෂා කිරීමේදී මොහු 2020 ජනවාරි සිට 2022 මාර්තු දක්වා දින පොත් කාර්යාලයට භාරදී නොතිබුණි. නමුත් වගකිව යුතු නිලධාරීන් විසින් මේ සම්බන්ධයෙන් කිසිදු	-එම-	දින පොත් භාර නොදීම සම්බන්ධව කිහිපවරක් එම වෛද්‍ය නිලධාරියා වෙත වාචිකව දැනුවත් කිරීම් සිදුකර ඇති අතර ,ඔහු දිනපොත පෞද්ගලිකව එවකට සිටි අධ්‍යක්ෂවරයාවෙත ඉදිරිපත් කරන බව වාචිකව දැනුම්දී ඇති බවද,එම කරුණ අධ්‍යක්ෂ වෙත වාචිකව දැනුවත් කළද එවකට සිටි අධ්‍යක්ෂ ඒ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිවැඩු විෂයභාර නිලධාරිණියට උපදෙස් ලබා නුදුන් බව විෂය

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර දිගින් දිගටම මොහුට වැටුප් හා දීමනා ගෙවා තිබුණි.		භාර නිලධාරිණිය දන්වා සිටින බව, මේ පිළිබඳ ලිඛිත සටහන් කිසිවක් නැති බව, රාජකාරි දින පොත් නිසිපරිදි මාසිකව භාර නොදුන් විට වැටුප් අත්හිටුවීමට සිදුවන බව වෛද්‍ය නිලධාරින් දැනුවත් කර ඇති බව, වෛද්‍යවරයා පෞද්ගලිකව රාජකාරී දිනපොත අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන බව වාචිකව පවසා සිටි බැවින් අනුමත කර නොගන්නා නිවාඩු වෙනුවෙන් ටෙලිමේල්පතක් පමණක් එවන බව නිවාඩු ලිපිකාරිණිය විසින් අධ්‍යක්ෂව වාචිකව දැනුවත් කළ බවද, මේ සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීමක් කළයුතු බවට උපදෙස් ලබා නුදුන් බවද විෂය ලිපිකාරිණිය දන්වා සිටින බව, ඊට අදාළ ලිඛිත සටහන් නොමැති බව, දිගින් දිගටම රාජකාරී දිනපොත් කාර්යාලයට ඉදිරිපත් කර නොමැති බැවින් නිවාඩු විෂය ලිපිකාරිණිය වැඩ බලන අධ්‍යක්ෂ (නියෝජ්‍ය අධ්‍යක්ෂ) වෙත ඒ පිළිබඳව දන්වා සටහනක් ඉදිරිපත් කර ඇති බව, එම සටහනට ලද උපදෙස් මත 2022.06.13 දින වහාම සේවයට වාර්තා කරන ලෙස දන්වා ටෙලිමේල් පතක් නිකුත් කර ඇති අතර එතැන් සිට වැටුප් නතර කිරීමට කටයුතු කර ඇති බව, නව අධ්‍යක්ෂ වැඩ භාර ගත් පසු මෙම වෛද්‍යවරයා විසින් නිසි පරිදි සේවයට පැමිණ අධ්‍යක්ෂ කාර්යාලයේ තබා ඇති රාජකාරි දිනපොතේ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අත්සන් කබන බවටත්, තිසි පරිදි දිනපොත් නඩත්තු කර සේවයට වාර්තා කරන බවටත් පොරොන්දු වී අභියාචනයක් ඉදිරිපත් කළ බැවින් 2022.08.03 දිනැති ලිපිය මඟින් රාජකාරී දිනපොත අධ්‍යක්ෂ කාර්යාලයේ කබා අධ්‍යක්ෂ ඉදිරියේ අත්සන් කිරීමට උපදෙස් ලබාදෙන ලද බව, 2022.09.23 දින වෛද්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය සලකා බලා ඉහත නොන්දේසි ඔස 2022.09.30 දින සිට නැවත වැටුප් ගෙවීමට කටයුතු කරන ලද බව, එහිදී 2022 ජූනි මස සිට 2022 සැප්තැම්බර් මස දක්වා කාර කරන ලද වැටුප් නැවත ගෙවීමක් සිදු නොකරන ලද බව, නැවත මෙම වෛද්‍යවරයා තිසි පරිදි සේවයට පැමිණ අධ්‍යක්ෂ කාර්යාලයේ කබා ඇති දිනපොත් අත්සන් නොකබන බැවින් වහාම සේවයට බාර්තා කරන ලෙස ටෙලිමේල් පනක් මඟින් 2023.01.20 දින දන්වා ඇති බව, සේවය හැරයාමේ නියෝග සකස් කිරීම සඳහා විෂය ලිපිකාරිණිය වෙත භාරදෙන ලද අධ්‍යක්ෂ කාර්යාලයේ කබා ඇති මෙම වෛද්‍යවරයාගේ රාජකාරී දිනපොත වෛද්‍යවරයා විසින් බලහත්කාරයෙන් රැගෙන ගොස් එහි අධ්‍යක්ෂ විසින් නොපැමිණි බවට සටහන් කරන ලද දිනවල පවා පැමිණි බවට ලියා ඇති බව, කබදෑ, කාර්යාලයෙන් අමතර දිනපොතක් රැගෙන

			ගොස් එම දින පොතේ ව්‍යාජ සටහන් සිදු කර කාර්යාලය වෙත භාර දී ඇති බව, මෙම දිනපොත් අධ්‍යක්ෂ විසින් අනුමත කර නැති බව, තම රාජකාරි දින පොත අස්ථාන ගතවීමකදී හෝ වෙතන් හේතුවක් මත නව දින පොතක් ලබා ගැනීමේ දී ඒ පිළිබඳව ලිපියක් ඉදිරිපත් කර අධ්‍යක්ෂ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව නව දින පොතක් ලබා ගැනීමට හැකි බව වෛද්‍ය නිලධාරින් දැනුවත් කර ඇති බව, සෞඛ්‍ය අධ්‍යාපන අංශයේ ප්‍රධාන හෙද නිලධාරිණිය විසින් වෛද්‍යවරයා සේවයට වාර්තා කර ඇති බවට ලබා දී ඇති ලිපිය රාජකාරි වගකීම් අභිබවා කරන ලද කාර්යයක් බැවින් ඒ සඳහා විමසීමක් කරන ලද බව, ඊට පිළිතුරු වශයෙන් අදාළ නිලධාරිණිය ලබා දී ඇති ලිපියට අනුව විනය ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ලිපියක් ඉදිරිපත් කර ඇති බව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ **ECD/PF/**9817 හා 2023.07.14 දිනැති ලිපිය මගින් උක්ත නම සඳහන් වෛද්‍ය නිලධාරියා විසින් යොමු කළ අභියාචනය පරිදි වැඩ සහ හැසිරීම පිළිබඳ වාර්තාවක් ඉල්ලා තිබුණද එම අභියාචනයේ පිටපතක් ලබා දුන්නේ 2024.02.08 දින බව, තවද, මෙම වෛද්‍ය වරයාගේ විනය විරෝධී හැසිරීම සම්බන්ධව අධ්‍යක්ෂ විසින් කරන ලද පැමිණිල්ලකට අනුව මෙම අමාත්‍යාංශයේ විමර්ශන අංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			විසින් විමර්ශනයක් ආරම්භ කර තිබුණු බැවින් විමර්ශන කටයුතු අවසන් කර නොමැති වීම හේතුවෙන් එම වාර්තාව ලබා දීම ප්‍රමාද වූ බව, 2024.02.08 දින වෛද්‍යවරයාගේ අභියාචනයේ පිටතක් ලැබීමෙන් අනතුරුව 2024.02.20 දින අදාළ වාර්තාව ඉදිරිපත් කරන ලද බව, 2019.02.25 දින සිට 2019.02.28 දින දන්වා විදේශ නිවාඩු ඉල්ලුම් කර උක්ත නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව.
	ii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 1.2 හා 1.3 වගන්ති අනුව නිලධාරියෙකුගේ සියළුම දේශීය නිවාඩු 125 පොදු ආකෘතියේ නිවාඩු ඉල්ලුම් පත්‍රයක් මගින් ඉල්ලුම් කර පූර්ව අනුමැතිය ලබාගත යුතු වූවත් මෙම වෛද්‍යවරයාගේ 2020 ජනවාරි සිට 2022 දෙසැම්බර් 14 දින දක්වා කිසිඳු දේශීය නිවාඩුවක්, නිවාඩු ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර අනුමත කරවාගෙන නොතිබුණි. නිවාඩු විෂය ලිපිකරු විසින් වෛද්‍යවරයා යොමු කරන ලද ටෙලිමේල් අනුව නිවාඩු දිනයන් නිවාඩු ලේඛනයේ ඇතුළත් කර ඇතත් එම කිසිඳු නිවාඩුවක් විධිමත් පරිදි අනුමත කර නොතිබුණි. මේ අනුව මෙම සියළු නිවාඩු වැටුප් රහිත නිවාඩු ලෙස සලකා කටයුතු කළ යුතු වූවත් වගකිව යුතු නිලධාරීන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	-එම-	-එම-
	iii. 2022 අප්‍රේල්, මැයි, ජූනි, හා 2022 දෙසැම්බර් මාස වලට අදාළ දිනපොත් ඉදිරිපත් කර තිබුණද එම දිනපොත් වගකිව යුතු නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබුණි. එසේම රෝහල් අධ්‍යක්ෂවරයා විසින් ඇතැම් දිනවලදී නිලධාරියාගේ සේවයට	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	නොපැමිණීම දිනපොතේ සටහන් කිරීමෙන් පසුව නැවත එම දිනයන් සඳහා දිනපොත ලියා තිබුණු අවස්ථා කිහිපයක් නිරීක්ෂණය විය. 2022 ජූලි සිට 2022 නොවැම්බර් දක්වා දිනපොත් ඉදිරිපත් කර නොතිබුණි.		
	iv. 2022 අප්‍රේල්, මැයි, ජුනි, හා 2022 දෙසැම්බර් මාස වලට අදාළව ඉදිරිපත් කරන ලද දිනපොත් අනුව වෛද්‍යවරයා නිවාඩු ලෙස දක්වා ඇති දිනයන් හා නිවාඩු විෂය ලිපිකරු විසින් ටෙලිමේල් අනුව නිවාඩු ලේඛනයේ සටහන් කරන ලද නිවාඩු දිනයන් එකිනෙකට වෙනස් බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
	v. මෙම වෛද්‍යවරයාගේ 2023 මාර්තු 07 දිනැති සේවය අතහැර යාමේ නිවේදනය 2023 මාර්තු 10 දින රෝහල විසින් ලියාපදිංචි තැපෑලෙන් නිලධාරියාට යැවීම සඳහා සුදනපුර උපතැපැල් කාර්යාලයට භාරදී තිබුණද එම ලිපිය 2023 මාර්තු 31 දින දක්වා එම උපතැපැල් කාර්යාලයේ රඳවාගෙන ඇති බව විගණනයේදී තහවුරු විය. නමුත් මෙම වෛද්‍ය නිලධාරියා විසින්, අදාළ ලිපිය ප්‍රමාද වීම සම්බන්ධයෙන් දෙහිවල ප්‍රධාන තැපැල් කාර්යාලයෙන් විමසා තිබුණු අතර අදාළ ලිපිය තැපැල් දෙපාර්තමේන්තුවට භාරදුන් දිනය හා අදාළ ප්‍රමාදය ගැන සොයා බැලීමකින් තොරව මෙම ලිපිය 2023 අප්‍රේල් 02 දින දින ලද බවත් අප්‍රේල් 03 දින අදාළ වෛද්‍යවරයාට භාරදුන් බවත් දන්වා ඇත. මේ අනුව මෙම ලිපිය ප්‍රමාද කිරීම හා ලිපිය බෙදාදීමේ දිනයන් සම්බන්ධයෙන් නිසි සොයා බැලීමකින් තොරව වෛද්‍යවරයාට තහවුරුවක් ලබා දීම සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමි.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	vi. වෛද්‍ය නිලධාරියෙකුගේ සේවයට පැමිණීම තහවුරු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර තිබියදී මෙම වෛද්‍යවරයා 2023 ජනවාරි සිට මාර්තු දක්වා නියමිත පරිදි සේවයට වාර්තා කළ බවට තහවුරු ලිපියක් මහරගම අපේක්ෂා රෝහලේ සෞඛ්‍ය අධ්‍යාපන අංශයේ ප්‍රධාන හෙද නිලධාරි විසින් ලබා දී තිබුණි. මෙය අදාළ නිලධාරියා තම රාජකාරී වගකීම අභිබවා කටයුතු කිරීමක් ලෙස විගණනයේ දී නිරීක්ෂණය විය.	-එම-	-එම-
	vii. වෛද්‍යවරයා 2022 දෙසැම්බර් 14 දින සිට සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කිරීම සම්බන්ධයෙන් මෙම වෛද්‍යවරයා 2023 ජුනි 22 දින සෞඛ්‍ය ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි. මේ අනුව මෙම අභියාචනය සම්බන්ධයෙන් වාර්තාවක් ලබාදෙන ලෙස මහරගම අපේක්ෂා රෝහලේ අධ්‍යක්ෂවරයාගෙන් 2023 ජූලි 14 දින ඉල්ලා තිබුණද එම වාර්තාව 2024 පෙබරවාරි 07 දින විගණන අවස්ථාව දක්වා ලබා දී නොතිබුණි.	-එම-	-එම-
	viii. නිලධාරියාගේ විදේශගත වීම් සම්බන්ධයෙන් ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තහවුරු කිරීම් අනුව මොහු 2019 පෙබරවාරි 25 සිට 2019 මාර්තු 01 දින දක්වා විදේශගත වී ඇති බව තහවුරු විය. නමුත් නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුවේ එම විදේශ නිවාඩුව අනුමත කළ බවට සාක්ෂි ඇතුළත් නොවීය.	-එම-	-එම-
	ix. ඉහත දැක්වෙන නිරීක්ෂණයන් අනුව මෙම වෛද්‍යවරයා වර්ෂ ගණනාවක සිට පවතින නීති රීති රෙගුලාසිවලට අනුගත නොවෙමින් කටයුතු කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් විසින් නියමිත පරිදි ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය. නිලධාරියාට වර්ෂ ගණනාවක සිට වැටුප් ගෙවීම නිත්‍යානුකූල	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	නොවන තත්ත්වයක් නිරීක්ෂණය වන බැවින් මේ සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් සිදුකිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමි.		
(එ)	කළුතර ශික්ෂණ රෝහලේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් රෝගී සත්කාර ක්‍රියාවලියේ ප්‍රවන්ඩත්වය කළමනාකරණය කිරීම පිළිබඳ සේවාස්ථ පුහුණු වැඩ මුළු 02 ක් වෙනුවෙන් රු.86,200 ක ප්‍රතිපාදන, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන පුහුණු හා පර්යේෂණ ඒකකය විසින් 2023 ජනවාරි 31 දින අනුමත කර තිබුණි. ඒ අනුව මෙම සේවාස්ථ පුහුණු වැඩ සටහන් 02 පිළිවෙලින් 2023පෙබරවාරි 27 දින සහ 2023 මාර්තු 30 යන දිනවල පවත්වා තිබූ අතර මෙම වැඩමුළු 02 ම පෙරවරු 8.00 සිට පස්වරු 1.00 දක්වා පමණක් පවත්වා තිබූ බව වවුචර්පත් වලට අමුණා තිබූ පැමිණීමේ ලේඛන මගින් මෙන්ම දේශනවලට සහභාගී වී තිබූ සම්පත්දායකයන් වෙත ලබා දී තිබූ විධිමත් පැමිණීමේ සහතික අනුව අනාවරණය විය. එසේම සේවාස්ථ පුහුණු කාලය පෙරවරු 8.00 සිට 1.00 දක්වා බවටත් දිවා ආහාරය නොලැබුන බවටත් එම පුහුණු වැඩසටහනට සහභාගී වී තිබූ කාර්ය මණ්ඩල සාමාජිකයන් විගණනයට ලබා දී තිබූ ප්‍රකාශ අනුව තහවුරු විය. ඒ අනුව වැඩමුළුවලට සහභාගී වී තිබූ කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙනුවෙන් දිවා ආහාරය සැපයූ බවට වවුචර්පත් වලට අමුණා තිබූ පිළිවෙලින් රු.17,500 ක් හා රු. 22,000 වූ බිල්පත් සහ සවස තේ පැන් සංග්‍රහය ලබාදුන් බවට ඉදිරිපත් කර තිබූ රු.5,500 ක හා 1,650ක් වූ බිල්පත් සාවද්‍ය බිල්පත් බව තහවුරු විය.	-එම-	අදාළ පුහුණු වැඩසටහනේ දේශන දහවල් 1 පමණ වන විට දිවා ආහාරය සඳහා නවතන ලද අතර නැවත ප.ව. 2 සිට කණ්ඩායම් ක්‍රියාකාරකම් සවස 5 පමණ වන තුරු සිදු කරන ලදී. එහෙත් මේ පිළිබඳ සිදු කළ විගණනය පූර්ව නිගමන මත පිහිටා සිදු කරන ලද්දක් බව කාරුණිකව දන්වා සිටිමි.
(ඒ)	ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය (මේ වන විට අහෝසි කර ඇති) පවත්වාගෙන ගිය HQ Colombo ගොඩනැගිල්ලේ පළමු මහලෙහි Rare wing කොටස සහ පස්වන මහල බදු කුලී පදනම මත ලබාගැනීමේ දී ආරක්ෂිත තැන්පතු හා විදුලිය තැන්පතු ලෙස ලංකා රියලිටි ඩිවලොප්මන්ට්ස් පුද්ගලික සමාගම වෙත ගෙවා ඇති රු.7,570,493 ක මුදල ගිවිසුම අවසන් වීමට පෙර මාසික කුලී සඳහා හිලව් කිරීමට කටයුතු	-එම-	HQ ගොඩනැගිල්ලේ 01 වන මහලෙහි Rare wring කොටස සහ 05 වන මහල සඳහා නැවත ගෙවීමේ පදනම මත ලබා දී ඇති ආරක්ෂක තැන්පතු මුදල් සහ විදුලිය සඳහා තැන්පතු මුදල් ගිවිසුම් ප්‍රකාරව ලබා දීමට කටයුතු කරන මෙන් ලිඛිතව HQ

	කර නොතිබුණු අතර 2024 අප්‍රේල් 01 දිනට ගිවිසුම්ගත කාලය අවසන් වී වසර 01 මාස 05ක කාලයක් ගත වී ඇතත් එම තැන්පත් මුදල් අයකරගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව විගණනයට දන්වා 2024 අප්‍රේල් 01 දිනට මාස 09 ක කාලයක් ගතවී ඇතත් ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ගිවිසුම අවසන් වීමට පෙර මෙම තැන්පතු මුදල් මාසික කුලී සඳහා හිලව් නොකිරීම සම්බන්ධයෙන් විමර්ශණයක් සිදුකර ඊට වගකිවයුතු පාර්ශවයන්ගෙන් හෝ අයකළ යුතු බවට නිරීක්ෂණය කෙරේ. එසේම 2016 අගෝස්තු 03 දිනැති රාජ්‍ය ගිණුම් වක්‍රලේඛ අංක 250/2016 (i) ප්‍රකාරව මෙම රු.7,570,493 ක තැන්පත් මුදල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.		ගොඩනැගිල්ලේ කළමනාකාරිත්වය වෙත දැනුවත් කර ඇති බව, කොතරම් දැනුම් දීම් සිදු කළද එම ආයතනය විසින් ගෙවීම් කිරීම පැහැර හැර ඇති බව, මේ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන නීති නිලධාරීව දැනුවත් කරමින් ලිපි යොමු කිරීමට කටයුතු කරන ලද බව, ඒ අනුව නීති අංශය මගින් එම තැන්පතු මුදල් අයකරගැනීමට අවශ්‍ය නීතිමය උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලීමක් 2023.08.29 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව, එමෙන්ම මෙම නීති ගැටලුව සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේදි නීති සාකච්ඡාවක් පවත්වන ලද බව.

3.9 **අනාර්ථික ගනුදෙනු**

විගණන නිරීක්ෂණය ----------	නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
Extra-Corporeal Membrane Oxygenation (ECMO) යන්ත්‍රය රෝගීන්ගේ පෙනහළු හා හෘදය තාවකාලිකව සහ දරුණු ලෙස අකර්මන්‍ය වූ අවස්ථාවන්හිදී රෝගියාට සම්බන්ධ කර භාවිතා කරනු ලබන යන්ත්‍රයක් විය. මෙවැනි **ECMO** යන්ත්‍ර දෙකක් රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද හා උරස් ඒකකයට **(Cardiothoracic unit)** මිලදී ගැනීම සඳහා හදිසි අවශ්‍යතා සහිත **(urgently Needed)** උපකරණ හා මෙවලම් ලැයිස්තුවකට ඇතුළත් කර		

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

රෝහලේ ක්‍රියාත්මක වූ **Urgent Development Plan** 2014 වැඩ සටහන යටතේ දේශීය අරමුදල් භාවිතා කර ඉන් එක් **ECMO** යන්ත්‍රයක් පමණක් රු.13,500,000 කට 2015 පෙබරවාරි මස 05 වන දින රිජ්වේ ආර්යා ළමා රෝහල විසින් මිලදී ගෙන තිබුණි. මෙම යන්ත්‍රයේ උපයෝජනය සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහතින් සඳහන් කරුණු නිරීක්ෂණය විය.		
(අ)	රිජ්වේ ආර්යා ළමා රෝහල විසින් මෙම **ECMO** යන්ත්‍රය, හදිසි අවශ්‍යතා සහිත යන්ත්‍රයක් ලෙස හඳුනාගැනීමට හේතු වූ කරුණු (එනම් මෙම යන්ත්‍රය අවශ්‍ය කෙරෙන දෛනිකව, මාසිකව හෝ වාර්ෂිකව රෝගීන්ගේ වාර්තාවීම් ප්‍රමාණය, මෙම යන්ත්‍රයේ අවශ්‍යතාවය රෝහලේ පවතින අනෙකුත් උපකරණ මගින් කොතෙක් දුරට සපුරාගත හැකිද යනාදී තොරතුරු) පිළිබඳ ලිඛිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	මෙම තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.	නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව, **ECMO** යන්ත්‍රය රෝගීන්ගේ පෙනහළු ක්‍රියාකාරීත්වය අකර්මන්‍ය වූ අවස්ථාවකදී එම පෙනහළුවල කාර්ය බාහිරව මෙම යන්ත්‍රය මගින් ලබා දෙනු ලබන බව, රෝගියෙකුට සඵකර ප්‍රතිකාර ලබා දීම සඳහා විශේෂිත වූ පුහුණුවක් හා අත්දැකීම් ඇති වෛද්‍යවරු මගින් සිදු කළ යුතු බව, මේ සඳහා පුහුණුව ඇති වෛද්‍යවරුන් දිවයින පුරා ඉතා සීමිත ප්‍රමාණයක් ඇති බව, එමෙන්ම මෙම යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පෙනහළු දෙකම අක්‍රිය වූ රෝගියෙකුගේ ජීවිතය ආරක්ෂා කර ගැනීමට ඉතා ඉවහල් වන යන්ත්‍රයක් බව, මෙම යන්ත්‍රය අවශ්‍යතාවය රෝහලේ පවතින වෙනත් උපකරණයක් මගින් ලබා දීමට හැකියාවක් නොමැති බව, 2014 වර්ෂයේ **Urgent Development Plan** යටතේ එවකට සිටි වි.වෛද්‍යවරුන්ගේ ඉල්ලීම මත 2015 වර්ෂයේ දී මෙම යන්ත්‍රය අප රෝහලට ලබා ගත්තද පසුව වෙනත් ආයතනයන්ගේ අවශ්‍යතාවයන් සඳහා වරින් වර පරිහරණය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			සඳහා හුවමාරු කර ඇති බව, ඒ සමඟ වෛද්‍ය නිළධාරීන්ගේ හා පශ්චාත් උපාධි වෛද්‍ය පුහුණු කටයුතු සඳහාද මෙම යන්ත්‍රය භාවිතා කර ඇති බව, කෙසේ වෙතත් මෙම යන්ත්‍රය රෝගියෙකුට සවිකිරීම සඳහා විශේෂිත පුහුණුවක් හා අක්දැකීම් ඇති වෛද්‍යවරුන් කණ්ඩායමක් විසින් භාවිතා කළ යුතු බැවින් සෑම විටම සෑම මසකම භාවිතා කිරීමට නොහැකි වී ඇති බව.
(ආ)	2015 පෙබරවාරි මස 05 වන දින මිලදී ගෙන තිබුණු මෙම ECMO යන්ත්‍රය එදින සිට 2023 මැයි 31 දක්වා රෝහල් 05ක් අතර හුවමාරු කරගෙන තිබුණ ද මහනුවර ජාතික රෝහල විසින් රෝගීන් 3 දෙනෙකු වෙනුවෙන් ද, කාසල් වීදියේ කාන්තා රෝහල (ශික්ෂණ) විසින් එක් රෝගියකු වෙනුවෙන් ද වශයෙන් රෝගීන් 4 දෙනෙකු සඳහා පමණක් මෙම ECMO යන්ත්‍රය භාවිතා කර තිබුණු නමුත් යන්ත්‍රය මිලදී ගෙන තිබුණු රිජ්වේ ආර්යා ළමා රෝහල සහ 2021 සැප්තැම්බර් 28 දින මෙම යන්ත්‍රය පවරා තිබුණු කොළඹ ජාතික රෝහල විසින් කිසිදු රෝගියකු වෙනුවෙන් මෙම යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. එබැවින් මෙම ECMO යන්ත්‍රය ඌන උපයෝජිතව පවතින බවට නිරීක්ෂණය කෙරේ.	මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර යන්ත්‍රය ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුය.	එකඟ නොවන බව, මෙම යන්ත්‍රය සඳහාම විශේෂිත වූ පුහුණු වූ වි.වෛද්‍ය ඌනතාවයත් සුවවූ දරුවන් ප්‍රමාණය අඩුවී මියගිය ප්‍රමාණය වැඩිවීමේ සම්භාවිතයක් සිදු වූ බව, එබැවින් මෙම යන්ත්‍රය උපරිම ප්‍රයෝජනයක් ගැනීම උදෙසා වෙනත් ආයතන සමඟද හුවමාරු කරමින් භාවිතා කිරීමට කටයුතු කර ඇති බව.
(ඇ)	කොළඹ ජාතික රෝහල විසින් කිසිදු රෝගියකු වෙනුවෙන් මෙම යන්ත්‍රය භාවිතා කර නොතිබුණු නමුත් රෝහලේ ප්‍රධාන ශල්‍ය ගබඩාවේ විශේෂ ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය දේශීය මිලදී ගැනීම් යටතේ 2022 වර්ෂයේදී ECMO යන්ත්‍රය සඳහා පිළිවෙලින් රු.13,304,440 ක පිරිවැය සහිත පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ඒකක 61ක් ද, රු.12,222,000 ක පිරිවැය සහිත අමතර උපාංග ඒකක 8 ක් ද රෝහල විසින් මිලදී ගෙන තිබුණි. මෙම උපාංග/පාරිභෝජ්‍ය ද්‍රව්‍ය අතරින් භාවිතා කළ හැකි කාලය දින 30 සහිත	-එම-	පෙනහළු බද්ධ කිරීමේ ශල්‍යකර්මය සිදු කිරීමෙන් පසු රෝගියාගේ හෘදය හා පෙනහළු අකර්මන්‍ය වූ හදිසි අවස්ථාවන්හිදී රෝගියා සඳහා මෙම යන්ත්‍රය භාවිත කරනු ලබන බව, ශ්‍රී ලංකාවේ ප්‍රථම පෙනහළු බද්ධ කිරීමේ ශල්‍යකර්මය සිදු කිරීම සඳහා වෛද්‍යවරුන්, නිර්වින්දන වෛද්‍යවරුන්

	අයිතම දෙකකින් පිළිවෙලින් රු.9,892,000 ක හා 1,052,000 ක පිරිවැය සහිත ඒකක 4ක් හා 8ක් ද, භාවිතා කළ හැකි කාලය දින 14 වන අයිතමයකින් රු.200,000 ක පිරිවැය සහිත ඒකක 4ක්ද විය. මෙම උපාංග/පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ද 2023 මැයි 31 වන විටත් නිෂ්කාර්යව පැවතුණි.		සහ හෙද නිලධාරීන්ගෙන් සමන්විත ඉන්දියානු සෞඛ්‍ය නිලධාරීන් කණ්ඩායමක් හා ශල්‍ය වෛද්‍යවරයෙක් සහ නිර්වින්දන වෛද්‍යවරයෙක්ගේ ප්‍රමුඛත්වයෙන් යුත් ශ්‍රී ලංකා ජාතික රෝහලේ කණ්ඩායමක් සමඟ එක්ව මෙම ශල්‍යකර්මය සිදු කිරීම සම්බන්ධයෙන් සැලසුම් කරන ලද බව, එහිදී ඉන්දීය කණ්ඩායම සමඟ **Zoom** තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වෙමින් සිදු කරන ලද සාකච්ඡාවලදී **ECMO** යන්ත්‍රය අත්‍යවශ්‍ය බව ඉන්දියානු කණ්ඩායම විසින් පවසන ලද බව, ඒ අනුව, රිජ්වේ ආර්යා ළමා රෝහලේ භාවිතා කරන ලද මෙම **ECMO** යන්ත්‍රය 2021.09.28 දින ශ්‍රී ලංකා ජාතික රෝහලේ ශල්‍ය ගබඩාව හරහා **Cardiothoracic** අංශයේ **HDU** වෙත භාරදෙන ලද බව, පසුව මෙම යන්ත්‍රයට අවශ්‍ය යන්ත්‍රානුබද්ධ අයිතමයන් හා ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන ශල්‍ය පාරිභෝජ්‍ය ගබඩාව හරහා **HDU** වෙත භාරදෙන ලද බව, අදාළ රෝගියාට පෙනහළු බද්ධ කිරීම සඳහා විවිධ පරීක්ෂණවලට ලක් කරමින් පරිත්‍යාගශීලීන් සෙවීම සිදු කළ අතර ඒ අතරින් විවිධ හේතූන් මත බොහෝ දෙනෙකු ප්‍රතික්ෂේප වීම සිදුවූ බව, . 2023 මාර්තු මස දක්වාම සුදුසු පරිත්‍යාගශීලියෙකු සොයගත නොහැකි වීම හේතුවෙන් ශල්‍යකර්මය සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් **ECMO** යන්ත්‍රය

			භාවිතයට ගැනීමට නොහැකි වූ බව, කෙසේ වෙතත් 2023.03.21 දින පරිත්‍යාගශීලියෙකු සොයාගත් අතර 2023.03.23 දින ශල්‍යකර්මය සිදු කරන ලද බව, රෝගියාගේ හදවත සහ පෙනහළු ක්‍රමවත්ව ක්‍රියා කළ හෙයින් යන්ත්‍රය භාවිත කිරීමේ අවශ්‍යතාවයක් නොවූන බව, 2023.04.28 වන දින අදාළ රෝගියා මියගිය අතර 2021.09.28 දින සිට මෙම ශල්‍යකර්මය දක්වාම වාට්ටුවකින් හෝ රෝහලකින් **ECMO** යන්ත්‍රය භාවිත කිරීම සඳහා ඉල්ලීමක් සිදු නොකළ හෙයින් යන්ත්‍රය ශ්‍රී ලංකා ජාතික රෝහල තුළ තබා ගන්නා ලද බව, පසු කලෙක කරාපිටිය ශික්ෂණ රෝහලේ ඉල්ලීම මත 2023.05.22 දින **ECMO** යන්ත්‍රය භාර දෙන ලද බව, ඒ සමඟ යන්ත්‍රයට අදාළ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා යන්ත්‍රානුබද්ධ අයිතම සියල්ල කරාපිටිය ශික්ෂණ රෝහල වෙත භාර දෙන ලද බව, ඒ අනුව, මෙම යන්ත්‍රය පෙනහළු බද්ධ කිරීමේ ශල්‍යකර්මය කිරීමේ අවශ්‍යතාවය මත ලබා ගත් අතර ඒ සඳහා අවශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා යන්ත්‍රානුබද්ධ අයිතම ශල්‍යකර්මය සිදු කිරීමේ අරමුණින් මිලදී ගැනීම සිදු කර ඇති බව, තවද, අදාළ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා යන්ත්‍රානුබද්ධ අයිතම කල් ඉකුත් වී නොමැති අතර කල් ඉකුත් වීමට පෙර	

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			කරාපිටිය ශික්ෂණ රෝහල වෙත භාර දී ඇති බව.
(ඇ)	2014 දෙසැම්බර් 17 දිනැති අංක SAS/TB/05/152/14 දරන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු "D" තීරණය ප්‍රකාරව මෙම ECMO යන්ත්‍රය සඳහා වසර දෙකක සම්පූර්ණ වගකීම් කාලයක් සහ වසර තුනක සේවා වගකීම් කාලයක් පවතින බවත්, වසර තුනක සේවා වගකීම් කාලය අවසානයේ දී වසරකට රු.885,000 (අමතර උපාංග සඳහා රු. 500,000 සහ ශ්‍රමය සඳහා රු. 385,000) බැගින් ඉදිරි වසර 5 ක කාලය සඳහා නඩත්තු සහ සේවා ගිවිසුමකට එළඹිය යුතු බවට නිර්දේශ කර අනුමත කර තිබුණු අතර 2014 දෙසැම්බර් 30 දිනැති අංක LRH/D/LP/EQU-24/181/14 දරන ගැනුම් ඇණවුම මගින් ඉහත නඩත්තු සහ සේවා ගාස්තුවට සියලුම අමතර කොටස් සහ ශ්‍රමය ඇතුළත් බව දක්වා තිබුණු නමුත් රිජ්වේ ආර්යා ළමා රෝහල විසින් සැපයුම්කරු සමඟ නඩත්තු සහ සේවා ගිවිසුමකට එළඹී නොතිබුණි. ඒ අනුව මෙවැනි යන්ත්‍රයක අඛණ්ඩ ක්‍රියාකාරත්වයක් පවත්වා ගත හැකිවන පරිදි යන්ත්‍රය සේවා කිරීමක් වර්තමානයේදී සිදු නොකරන අතර නඩත්තු සහ සේවා ගිවිසුමක් යටතේ ලබා ගත හැකිව තිබුණු අමතර උපාංග ඉහත "ඇ" නිරීක්ෂණයේ සඳහන් පරිදි රු.12,222,000 වැනි අධික පිරිවැයකට මිලදී ගැනීමට සිදුවන පරිසරයක් රෝහල විසින් නිර්මාණය කර දී තිබුණි.	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත යුතුය.	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ ප්‍රකාරව කොන්ත්‍රාත් ප්‍රදානයෙන් පසු සැපයුම්කරු සමඟ නියමිත පරිදි සේවා හා නඩත්තු ගිවිසුමකට එළඹීම, කොන්ත්‍රාත් පරිපාලනය හා අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබන අදාළ රෝහල විසින් සිදු කරන ලෙස දන්වා ඇති බව.
(ඉ)	ECMO යන්ත්‍රයට අදාළව සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු ලේඛන ප්‍රකාරව පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා අමතර උපාංග/කොටස් වෙනුවෙන් පිළිවෙලින් වසර 3ක් හා වසර 05ක් සඳහා ස්ථාවර මිල ගණන් සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු වූවද එසේ මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණු අතර තාක්ෂණික පිරිවිතර මගින් ඉල්ලා තිබුණු එක් එක් පරිපථය (Neonatal Circuit, Pediatric Circuit, Adult Circuit) සඳහා	-එම-	ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද උපාංග/පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිල ගණන් කොපමණ කාලයක් වලංගු විය යුතුද යන්න තහවුරු කර ගැනීම සඳහා අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිදු කළ යුතුව තිබුණු බව, එසේ නිශ්චිත වලංගු කාලයක් ඉදිරිපත්

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	Oxygenator, Pump Head සහ Tubing Pack යන උපාංග/පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ඒකකයක් වෙනුවෙන් රු.350,000 ක මිලක් ඉදිරිපත් කර තිබුණද එම මිල ගණන් කොපමණ කාලයක් වෙනුවෙන් වලංගු වන්නේද යන්න අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් තහවුරු කර ගෙන නොතිබුණි.		කර නොමැති අවස්ථාවක ලංසු ලියවිලිවල සඳහන් කාලය පුරාවටම එම මිල ගණන් වලංගුව පවතින බව.
(ඊ)	ඉහතින් දැක්වූ පරිදි මෙවැනි යන්ත්‍රයක ක්‍රියාකාරිත්වය සමඟ සෘජු සම්බන්ධතාවයක් පවතින Oxygenator, Pump Head, Tubing Pack, Cannula, Perfusion Set යනාදී උපාංග /පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සම්බන්ධයෙන් විධිමත් ඇගයීමක් සිදු නොකිරීම නිසා ඒකකයක් රු. 350,000 ක් හෝ ඊට ආසන්න පිරිවැයකට සපයාගත හැකිව තිබුණු Pump Head රු.2,473,000 ක් වැනි අධික පිරිවැයකට මිල දී ගැනීමට සිදුවන පරිසරයක් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්මාණය කර දී තිබුණි. එසේම උපාංග /පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සඳහා මෙවැනි අධික පිරිවැයක් රෝහල් පද්ධතිය විසින් කෙසේ දරා ගත යුතුද යන්න පිළිබඳව ඇගයීමක් සිදුකර නොතිබීම නිසා මෙම අධික පිරිවැය තත්ත්වය ECMO යන්ත්‍රය රෝගී සත්කාර සේවා සඳහා යොදා ගැනීමේදී ඇතිකරන අහිතකර බලපෑමේ අවදානම විගණනයේ දී බැහැර කළ නොහැකි විය.	-එම-	මේ පිළිබඳව පත්කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටුව අදාළ උපකරණයේ විෂයය පථය සම්බන්ධයෙන් වන විශේෂඥයන් 04 දෙනෙකුගේ සහ මූල්‍ය විශේෂඥයෙකුගෙන් සමන්විත බව, ඒ අනුව, උපකරණයේ උපාංග, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, අමතර කොටස්, නඩත්තු හා සේවා ඇතුළත් භාවිතය පිළිබඳව වන ජීවන චක්‍ර පිරිවැය **(Life Cycle Cost)** අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් ඇගයිය යුතුව තිබුණු බව, කෙසේ වූවද, 2014.11.17 දිනැතිව රැස්වූ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් 2014.10.04 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව හා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු තීරණය සලකා බලමින් නැවත ලංසු ඇගයීම පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස රිජ්වේ ආර්යා ළමා රෝහල වෙත දැනුම්දී ඇති බව, ඒ අනුව, 2014.11.24 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත පදනම්ව 2014.12.17 දිනැතිව රැස්වූ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශිත කොන්ත්‍රාත්කරු පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හ අමතර උපාංග/කොටස් සඳහා ඉදිරිපත් කර ඇති අවූරුදු 03ක සේවා

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

			වගකීම් කාලයෙන් පසු අවුරුදු 05ක් සඳහා ඉදිරිපත් කරන ලද සේවා හා නඩත්තු ගාස්තුද ඇතුළත් කරමින් මේ සම්බන්ධයෙන් වෙනම සේවා හා නඩත්තු ගිවිසුමකට එළඹීම අනුමත කර ඇති බව, එබැවින්, එවැනි ගිවිසුම් ගතවීමකට එළඹීමට අදාළ රෝහල් කටයුතු කළේ නම් අධික පිරිවැයකට අමතර උපාංග/පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට සිදුවීමේ වාතාවරණයක් ඇති නොවීමට ඉඩකඩ තිබුණු බව.
(ඇ)	ECMO යන්ත්‍රය ස්ථාපනය කිරීම සඳහා කොළඹ ජාතික රෝහලේ හෘද හා උරස් ඒකකයේ (Cardiothoracic Unit) නව ශල්‍ය දැඩි නිරීක්ෂණ අංශය (New HDU අංශය) තුළ ECMO ඒකකයක් 2022 වර්ෂයේදී ඉදිකර තිබුණි. මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් වූයේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සකස්කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුව පමණි. ඒ අනුව එහි ඇස්තමේන්තු පිරිවැය රු. 5,452,041.47 ක් විය. මෙම සම්පූර්ණ ඉදිකිරීම පෞද්ගලික පරිත්‍යාගයක් ලෙස රෝහල විසින් ප්‍රකාශ කර සිටියද ඒ බව ලිඛිතව විගණනයට තහවුරු නොකෙරුණු අතර මෙම ඉදිකිරීම වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු වාර්තාවක් විගණනයට ඉදිරිපත් කළ යුතුය.	ශ්‍රී ලංකා ජාතික රෝහලේ හෘද හා උරස් ඒකකයේ **(Cardiothoracic Unit)** තිබූ **Isolation** කාමරය නව ශල්‍ය දැඩි නිරීක්ෂණ අංශයක් **(HDU)** ලෙස නවීකරණය කිරීම සඳහා අදාළ අංශයෙන් ඉල්ලීම් සිදු කර ඇති බව, අදාළ කාර්යය සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පැවතියද ඒ වන විට රටේ පැවති අයහපත් තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත් කාර්යයන් ඉටුකිරීම සීමා කර තිබූ බැවින් ඒ අතරතුර මේ වෙනුවෙන් ලැබුණු පෞද්ගලික පරිත්‍යාගයකින් නවීකරණ කටයුතු සිදු කල බැවින් අදාළ ප්‍රසම්පාදන කටයුතු අත්හිටුවීමට කටයුතු කර ඇති බව, එහෙයින්, රෝහල විසින් මේ සඳහා කිසිදු මුදලක් වැයකර නොමැති බව, මෙහිදී අළුත්වැඩියාවක් සිදු කර ඇති අතර අළුතින්

			ඉදිකිරීමක් සිදු කර නොමැති බව, සාමාන්‍යයෙන් අළුත්වැඩියාවක් වත්කම් ලෙස ගිණුම්ගත කිරීමක් සිදු නොවන අතර එය අයභාර වියදමක් ලෙස ඇතුළත් කරන බව.
(ඌ)	විගණනය විසින් ටීඑච්ඕ/බී/එන්එච්එස්එල්/තොරතුරු/ 2023/08 සහ 2023 මාර්තු 15 දිනැති ලිපිය මගින් මෙම යන්ත්‍රයට අදාළව මිලදී ගෙන තිබුණු පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, නඩත්තු හා සේවා පිළිබඳ තොරතුරු ද ECMO යන්ත්‍රය රිජ්වේ ආර්යා ළමා රෝහල වෙතින් තාවකාලික පදනම ලබා ගෙන තිබෙනම් ඒ පිළිබඳ තොරතුරුද ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද, කොළඹ ජාතික රෝහල විසින් අංක එස්ඩී/ඒඅයි/03/2023 දරන 2023 මැයි 10 දිනැති ලිපිය මගින් තොරතුරු කැඳවා තිබුණු සියලුම කරුණු සඳහා “නැත” යනුවෙන් පිළිතුරු ලබා දී තිබුණි. කෙසේ නමුත් ඉහත "ඇ" නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සහ අමතර උපාංග කොළඹ ජාතික රෝහල විසින් මිල දී ගෙන තිබුණු බවත්, රිජ්වේ ආර්යා ළමා රෝහල විසින් ලබා දී තිබුණු තොරතුරු අනුව අවස්ථා දෙකකදී (එනම් 2019 මැයි 06 දින සහ 2020 මාර්තු 04 දින) තාවකාලික පදනම මත කොළඹ ජාතික රෝහල වෙත ECMO යන්ත්‍රය ලබා දී තිබුණු බවත් නිරීක්ෂණය වීමෙන් විගණනය විසින් ඉල්ලා සිටින ලද ඉහත තොරතුරු සඳහා සාවද්‍ය කරුණු දැක්වීමක් කොළඹ ජාතික රෝහල විසින් සිදුකර තිබුණි. එසේම ඉහත ලිපිය මගින් කොළඹ ජාතික රෝහල විසින් ECMO යන්ත්‍රය භාවිතා නොකිරීමට හේතු වූ කරුණු පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියද, එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.	-එම-	මෙහිදී ඉදිරිපත් කර ඇති විගණන කරුණු සමඟ එකඟ වන බව, අදාළ නිලධාරීන් විසින් තොරතුරු ඉදිරිපත් කිරීමේදී යම් අතපසුවීමකින් අවශ්‍ය තොරතුරු ලබා දීම අපොහසත් වී ඇති බව, ඒ සම්බන්ධයෙන් කණගාටුව පළ කරන අතර මෙවැනි සිදුවීම් ඉදිරියේදී නැවත සිදු නොවීමට කටයුතු කරනු ඇති බව, ඒ අනුව, නැවත විගණනය වෙත තොරතුරු ඉදිරිපත් කිරීමේදී අදාළ නිලධාරීන් වෙත නිවැරදි හා සම්පූර්ණ තොරතුරු ලබා දෙන ලෙසට උපදෙස් ලබා දී ඇති බව.
(එ)	වර්තමානය වන විට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වූ රෝහල් පද්ධතිය තුළ රිජ්වේ ආර්යා ළමා රෝහල විසින් මිලදී ගෙන තිබුණු මෙම **ECMO**	-එම-	විගණන ඡේදයෙහි සඳහන් කරුණු සඳහා ඉදිරි කටයුතු සිදු කිරීමට කමිටුවක් පත්කර

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	යන්ත්‍රයද ඇතුළුව **ECMO** යන්ත්‍ර දෙකක් පවතින අතර අනෙක් යන්ත්‍රය කරාපිටිය ශික්ෂණ රෝහලේ ස්ථාපිත කර තිබුණි. මෙම යන්ත්‍රය 2014 වර්ෂයේ එම රෝහලට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණ අතර එය විදේශ රටක භාවිතා කරන ලද යන්ත්‍රයක් බව නිරීක්ෂණය විය. එසේම කරාපිටිය ශික්ෂණ රෝහල විසින් අංක **THKA/CC/06** දරන ලිපිය මගින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2022 වර්ෂය අවසානය වන විට ආසන්න වශයෙන් වසර 8 ක කාලපරිච්ඡේදය තුළ එම රෝහලේ **ECMO** යන්ත්‍රය රෝගීන් 49 ක් සඳහා භාවිතාකර තිබුණි. කෙසේ නමුත් වාර්ෂිකව විශාල රෝගීන් ප්‍රමාණයකට ප්‍රතිකාර සේවා සපයනු ලබන රිජ්වේ ආර්යා ළමා රෝහල සහ කොළඹ ජාතික රෝහල විසින් කිසිදු රෝගියකු සඳහා **ECMO** යන්ත්‍රය භාවිතා කර නොතිබීම විගණනයේදී ගැටළු සහගත විය.		ඇති අතර අදාළ කටයුතු අවසන් කර කමිටු වාර්තාව ලබාදුන් පසුව විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.

3.10 **කළමනාකරණ දුර්වලතා**

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
(අ)	විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය සතුව පවතින වාහන සංඛ්‍යාව 268 ක් වූ අතර එම වාහන උපයෝජනය හා රියදුරු මහතුන් සේවයේ යෙදවීම පිළිබඳව ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන ක්‍රමයන් පිළිබඳව සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි 1645 ප්‍රකාරව දෙපාර්තමේන්තුවක වාහන සම්බන්ධව දෛනික ධාවන සටහන් මාණ්ඩලික නිලධාරියකු හෝ වගකිව යුතු වෙන යම් නිලධාරියෙකු හෝ භාරයේ තැබිය යුතු අතර වාහන භාර	අමාත්‍යාංශ වාහන කළමනාකරණය සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය	පිළිතුරු ලබා දී නොතිබුණි

	නිලධාරියා විසින් එක් එක් වාහනයේ රියදුරා ලවා 268 වැනි පොදු ආකෘති පත්‍රයේ ප්‍රකාර දෛනික ධාවන සටහනක් තබා ගැනීමට සලස්වා පරිපාලන නිලධාරීන් ලවා එය නිතිපතා පරීක්ෂා කරවීමටද, එක් එක් ගමන නිම කළ වහාම, දෛනික ධාවන සටහනේ කළ යුතු සියළුම සටහන් කරන ලෙස සහ පුස්තකාවෙහි ඇතුළත් නියමයන් පිළිපදින ලෙස වාහනයේ රියදුරාට නියම කිරීමටද වගබලා ගත යුතු වූවත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ සංචිත වාහන වලට අදාළ දෛනික ධාවන සටහන් නඩත්තු කිරීම පිළිබඳ පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.	පිළිබඳව අධ්‍යයනය කර පවතින දුර්වල පාලන ක්ෂේත්‍රයන් ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතු අතර අමාත්‍යාංශ ප්‍රවාහන අංශයේ කටයුතු විධිමත් කළ යුතුය.	
	➢ සංචිත වාහන 07 කට අදාළව පමණක් 2022 වර්ෂයේ මාස 12 ටම අදාළ ධාවන සටහන් ප්‍රවාහන අංශයට ඉදිරිපත් කර තිබුණි. ඉතිරි වාහන වලින් වාහන 19 ක් 2022 වර්ෂයේ අළුත්වැඩියාවට යොමුකර ඇති බව නිරීක්ෂණය වූ අතර, වාහන 72 කට අදාළව 2022 වර්ෂයට අදාළ කිසිදු ධාවන සටහනක් 2023 පෙබරවාරි 10 දින වන විටත් ප්‍රවාහන අංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	-එම-	-එම-
	➢ වාහන 48 කට අදාළව 2022 වර්ෂයේ මාස 66 ක් සඳහා සම්පූර්ණ මාසයටම (මාසයේ දින කිහිපයකට අදාළව පමණක් ධාවන සටහන් ඉදිරිපත් කර ඇත) අදාළව ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණු අතර සංචිත වාහන වලින් වාහන 110 කට අදාළව එකතුව මාස 663 ක ධාවන සටහන් 2023 පෙබරවාරි 10 දින වන විටත් ප්‍රවාහන අංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	-එම-	-එම-
	➢ නිල වාහන වෙන් කර ඇති නිලධාරීන් ඔවුන් සඳහා වෙන්කර ඇති වාහන වෙනුවෙන් 2008 ජුනි 26 දිනැති රාජ්‍ය පරිපාලන	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	චක්‍රලේඛ අංක 13/2008 හි ඇමුණුම 01 අනුව මාසයට අදාළව දෛනික සටහනක් පවත්වාගෙන යා යුතු අතර රියදුරන්ගේ අතිකාල හා දීමනා සඳහා එය භාවිතා කළයුතු බව දන්වා ඇත. 2022 වර්ෂයේ වාහන 24 කට අදාළව එකතුව මාස 222 කට අදාළ දෛනික සටහන් ප්‍රවාහන අංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි.		
	➢ මෙම වෙන්කළ වාහන සම්බන්ධයෙන් 2021 හා 2022 වර්ෂයට අදාළව මගේ අංක MED/A/MH/01/INFO/2021/33 දරන 2021 ඔක්තෝබර් 08 හා 2023 ජනවාරි 24 දිනැති හා මගේ අංක MED/B/MH/01/INFO/2022/58 දරන 2023 පෙබරවාරි 15 දිනැති තොරතුරු කැඳවීමේ ලිපිවල ඇමුණුම් අංක 3 මගින් ඉල්ලුම් කරන ලද තොරතුරු 2024 මාර්තු 15 දින දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	-එම-	-එම-
	ii. 2021 නොවැම්බර් මස දින රහිත අධ්‍යක්ෂ (ප්‍රවාහන) විසින් සියළුම රියදුරු මහතුන් වෙත නිකුත් කරන ලද අභ්‍යන්තර සටහනට අනුව සියළුම සංචිත වාහන අමාත්‍යාංශ භූමියෙන් පිටතට යාම සඳහා ගේට්ටු අවසර පත්‍රයක් භාවිතා කළ යුතු බවත්, නැවත පැමිණීමෙන් පසු නිසි පරිදි සම්පූර්ණ කරන ලද ගේට්ටු අවසර පත්‍රය විෂය නිලධාරී වෙත ආපසු භාරදිය යුතු බවත් දක්වා ඇති අතර අංශ වෙත අනුයුක්ත කර ඇති වාහන සඳහා ගේට්ටු අවසර පත්‍ර අදාළ අංශ මගින් පවත්වා ගත යුතු බවත්, නැවත පැමිණීමෙන් පසුව එම අංශය වෙත භාරදිය යුතු බවත්, දන්වා තිබුණි. නමුත් අංශ වෙත වෙන් කළ සංචිත වාහන සඳහා වූ නියැදියක් තෝරාගෙන පරීක්ෂා කිරීමේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	➢ අමාත්‍යාංශ පරිශ්‍රයේ පිහිටි සෞඛ්‍ය ලේකම් කාර්යාලය, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය ඇතුළු අංශ කිහිපයක් විසින් ගේට්ටු අවසර පත් භාවිතා නොකරන අතර, මෙඩිහවුස් ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන අංශ වෙනුවෙන් වෙන්කර ඇති වාහන සඳහා ද ගේට්ටු අවසරපත් භාවිතා නොකරන බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
	➢ එමෙන්ම අමාත්‍යාංශය තුළ ගේට්ටු අවසර පත් නිසියාකාරව අංශය තුළම පවත්වාගෙන යන අංශ 04 ක් පමණක් නිරීක්ෂණය විය.ගේට්ටු අවසරපත් භාවිතා කළද ඒවා නිසියාකාරව අංශ තුළ නඩත්තු නොකරන අවස්ථා නිරීක්ෂණය වූ අතර බොහෝ අවස්ථාවල රියදුරු මහතා සතු බව හා ඒවා නිසියාකාරව ගොනුගත කර නොමැති බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
	➢ අංශයන්ට අදාළ වාහන 32 ට අදාළ ගේට්ටු අවසරපත් පිළිබඳ තොරතුරු විගණනයට හඳුනා ගැනීමට නොහැකි විය.	-එම-	-එම-
	iii. අමාත්‍යාංශයේ සංචිත වාහන සඳහා ඉන්ධන ලබා දීමේදී රියදුරු විසින් පවතින ඉන්ධන ධාරිතාව සඳහන් කර ටැංකියේ පරිමාවට අදාළව අවශ්‍ය ඉතිරි ඉන්ධන ප්‍රමාණය සඳහන් කර ඉන්ධන අවශ්‍යතාවය ඉල්ලුම් කරනු ලබන අතර ඒ මත පදනම්ව ඇණවුම සකස් කර ප්‍රවාහන අංශයේ නිලධාරියෙකු විසින් නිවැරදිතාවය පරීක්ෂා කර ප්‍රවාහන අධ්‍යක්ෂකගේ අනුමැතියට යොමු කරනු ලබයි. මේ සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී පහත පරිදි දුර්වලතාවයන් නිරීක්ෂණය විය.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	➢ ඉන්ධන ඉල්ලුම් පත්‍රයේ ඇණවුම් අංකය වැරදියට සටහන් කළ අවස්ථාවන් පැවතීම.	-එම-	-එම-
	➢ ඉන්ධන ඉල්ලුම් පත්‍රයේ දැක්වෙන ඉන්ධන ටැංකියේ ධාරිතාවය සහ ඉල්ලුම් කරන ධාරිතාවය එකතු කළ විට ටැංකියේ ධාරිතාවය ඉක්මවන අවස්ථා පැවතීම.	-එම-	-එම-
	➢ ඉන්ධන ඇණවුම ලබාගැනීමේදී රියදුරු අදාළ ලේඛනයේ අත්සන් නොකළ අවස්ථා රාශියක් පැවතීම.	-එම-	-එම-
	➢ ඉන්ධන නිකුත් කිරීම මාණ්ඩලික නිලධාරියෙකු විසින් අනුමත නොකළ අවස්ථා පැවතීම.	-එම-	-එම-
	➢ වාහන වලට ඉන්ධන ලබාගැනීම සඳහා ඉන්ධන ඇණවුම් නිකුත් කිරීම වෙනුවෙන් සියළුම වාහන වෙනුවෙන් එක් ඉන්ධන ඇණවුම් ලේඛනයක් පවත්වාගෙන යන අතර මෙමගින් එක් එක් වාහනය වෙනුවෙන් නිකුත් කළ ඉන්ධන ප්‍රමාණය, මීට පෙර ලබාගත් ඉන්ධන ප්‍රමාණයෙන් ධාවනය කළ දුර ප්‍රමාණය, මීට පෙර ඉන්ධන ලබාදුන් දිනය හා මයිලෝමීටරයේ අගය නිවැරදිව හා අඛණ්ඩව සටහන් කරන බව ආදී කරුණු පැහැදිලිව නිරීක්ෂණය කිරීමට අපහසු බව නිරීක්ෂණය විය. එක් එක් වාහනයට අදාළව ඉන්ධන නිකුත් කිරීම් වෙන වෙනම හඳුනා ගත හැකි පරිදි ඉන්ධන ලේඛනය පවත්වාගෙන යා යුතු වුවත් ඉහත ආකාරයට සියළුම වාහන වෙනුවෙන් ඉන්ධන නිකුත් කිරීම වෙනුවෙන් එක් ලේඛනයක් පවත්වාගෙන යාම මගින් විවිධ අක්‍රමිකතා සිදුකිරීම සඳහා අවස්ථාවක් සලසා දී ඇති බව නිරීක්ෂණය විය. ප්‍රවාහන අංශයේ නිලධාරියෙකු විසින් ඉහත ඉන්ධන ඇණවුම් ලේඛනයට අමතරව එක් එක් වාහනය	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	වෙනුවෙන් ඉන්ධන ඇණවුම් ලේඛනයක් පවත්වාගෙන ගියද එම ලේඛනය විධිමත් ලේඛනයක් නොවන බවත්, නිලධාරියෙකුගේ කාලය නාස්ති කිරීමක් පමණක් බවත්, එහි දිනය, රියදුරුගේ නම, ඉන්ධන ප්‍රමාණය හා නිලධාරියාගේ අත්සන පමණක් ඇතුළත් කරන බවත් නිරීක්ෂණය විය.		
	iv. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව ප්‍රවාහන අංශයේ පාලනය යටතේ පවතින සංචිත වාහන වලට අනුයුක්ත රියදුරන් 38 ක් සිටින බවත්, ඔවුන්ගේ දිනපතා පැමිණීම සහ පිටවීම සටහන් කිරීම වෙනුවෙන් ප්‍රවාහන අංශයේ පැමිණීමේ පිටවීමේ ලේඛනයක් පවත්වාගෙන යන බවත්, නිලධාරින්ට වෙන්කළ සංචිත නොවන වාහන වලට හා විවිධ අංශ වලට වෙන්කළ සංචිත වාහන වලට අනුයුක්ත රියදුරන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා විධිමත් නිශ්චිත ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොමැති බවත් නිරීක්ෂණය විය. අමාත්‍යාංශයේ පවතින වාහන වලට අනුයුක්ත රියදුරන් සංඛ්‍යාව පිළිබඳ නිශ්චිත තොරතුරු ප්‍රවාහන අංශය සතුව නොමැති බවත් ප්‍රවාහන අංශයේ පාලනය යටතේ පවතින සංචිත වාහන හැර වෙනත් වාහනවලට අනුයුක්ත රියදුරන් පිරිසක් පැමිණීම හා පිටවීම සටහන් කරනු ලබන ලේඛනයක් ප්‍රවාහන අංශයේ පැවතියද එම ලේඛනය ක්‍රමවත් ලේඛනයක් නොවන බවත් නිරීක්ෂණය විය. මෙම තත්ත්වය අභ්‍යන්තර පාලන දුර්වලතාවයක් ලෙස විගණනයට නිරීක්ෂණය වූ අතර අමාත්‍යාංශයට අනුයුක්ත සියළුම රියදුරන් වෙනුවෙන් පැමිණීම පිටවීම සටහන් කිරීම සඳහා ප්‍රවාහන අංශයේ එක් ලේඛනයක් පවත්වාගෙන යා යුතු බවත් ඒ අනුව නිවාඩු ලේඛනය හා බැහැර යාමේ ලේඛනය පවත්වාගෙන යා යුතු බවත් නිරීක්ෂණය විය.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ)	සායනික අපද්‍රව්‍ය පුරවන ලද අඩි 40 කන්ටේනර් 03 ක් හා අඩි 20 කන්ටේනර් එකක් මුල්ලේරියාව ඉන්ධන පිරවුම්හල පිහිටි භූමියේ දිරාපත් වෙමින් පැවතුණි. මෙම සායනික අපද්‍රව්‍ය සහිත කන්ටේනර්වල දොරවල් දිරාපත්වී අපද්‍රව්‍ය පරිසරයට නිරාවරණය වී පැවතුණි. මෙම ස්ථානයේ පවත්වාගෙන යන ලද සායනික අපද්‍රව්‍ය අපහරණය කිරීමේ දාහකය මෙම ස්ථානයෙන් ඉවත්කර මුතුරාජවෙල ප්‍රදේශයට රැගෙන යාමේදී මෙම සායනික අපද්‍රව්‍ය සහිත කන්ටේනර් ඉවත්කර නොගැනීම හේතුවෙන් මේ ආකාරයට මෙම ස්ථානයේ දිරාපත් වෙමින් හා සායනික අපද්‍රව්‍ය අනාරක්ෂිත ආකාරයට පරිසරයට නිරාවරණය වෙමින් පැවතීම ඉතාමත් අහිතකර තත්ත්වයක් බව නිරීක්ෂණය විය. සායනික අපද්‍රව්‍ය අදාළ රෝහල් හා ආයතනවලින් බැහැර කිරීමත් සමඟ ඊට අදාළ මුදල් ගෙවන බැවින් රජය විසින් මෙම සායනික අපද්‍රව්‍ය අපහරණය සඳහා වැය බරක් දරා තිබීයදී වගකිව යුතු නිලධාරීන්ගේ නොසැළකිල්ල මත මේ ආකාරයට මෙම ස්ථානයේ තබා ඇති බව නිරීක්ෂණය විය.	මෙම අපද්‍රව්‍ය කඩිනමින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.	මුල්ලේරියාව ඉන්ධන පිරවුම්හලේ ඇති කන්ටේනර් හැකි ඉක්මනින් එම පරිශ්‍රයෙන් ඉවත්කර ගන්නා ලෙස 2024.01.07 දින අදාළ සමාගම වෙත යවා ඇති බව, එමෙන්ම නැවතත් 2024.02.18 දින ඉවත් කර ගැනීමේ ගැටළු පවතී නම් දන්වන ලෙස දැනුවත් කර ඇති බව, එමෙන්ම ආයතනය එක් කන්ටේනරයක තිබූ කසල ප්‍රමාණය ඉවත් කර ගෙන ඇති බව දන්වා ඇති බව, තවද ඉතිරි කන්ටේනර් වෙත වාහන ලගා කර ගැනීමට දැනට එම පරිශ්‍රයේ ගාල් කර ඇති අබලි වාහන බාධාවක් වී ඇති බැවින් ඒ පිළිබඳව මුල්ලේරියාව රෝහල් අධ්‍යක්ෂ වෙත දැනුවත් කර ඇති බව.
(ඇ)	වෛද්‍ය නිලධාරිනියක් 2022 අප්‍රේල් 22 දින සිට සිය තනතුරෙන් ඉල්ලා අස්වීම සඳහා ලිඛිත ඉල්ලීමක් 2022 මාර්තු 23 දින තෙල්දෙණිය මූලික රෝහලේ වෛද්‍ය අධිකාරි මගින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණි. එම ඉල්ලීම තෙල්දෙණිය මූලික රෝහලේ වෛද්‍ය අධිකාරිගේ අංක CPC/DBH/TD/A1/SPMO/2022 දරන 2022 මාර්තු 31 දිනැති ලිපිය මගින් ප්‍රාදේශීය හා මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් මගින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණේ මාස 02 කට ආසන්න ප්‍රමාද කාලයක් සහිතව බව නිරීක්ෂණය විය. තෙල්දෙණිය මූලික රෝහලේ වෛද්‍ය අධිකාරිගේ අංක CPC/DBH/TD/AI/SPMO/2022 දරන 2022 සැප්තැම්බර් 25 දිනැති	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මාලාවේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.	මෙම වෛද්‍ය නිලධාරිනිය විසින් 2022.04.22 දින සිට රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම සඳහා කර ඇති ඉල්ලීම **CPS/PDHS/A/**8/14/2022 හා 2022.05.26 ලිපියෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය 2022.06.09 දින පාලන (වෛද්‍ය සේවා) **II** ශාඛාව වෙත ලැබී ඇති බව, ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා නිලධාරිනිය දැනුවත් කිරීමට උත්සාහ කර ඇතත් නිලධාරිනිය සම්බන්ධ කර ගැනීමට නොහැකි වී ඇති බව, කෙසේ වෙතත් ඉදිරියේදී මෙවැනි ප්‍රමාද

	ලිපිය මගින් නැවතත් උක්ත වෛද්‍ය නිලධාරිනියගේ ඉල්ලා අස්වීම පිළිබඳ පිළිතුරක් එවා නොමැති බැවින් ඇය සේවය අතහැර ගියා සේ සලකා ඉදිරි කටයුතු කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර තිබුණි. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මාලාවේ VI පරිච්ඡේදයේ 56 වගන්තිය ප්‍රකාරව රජයේ නිලධාරියෙකු ඉල්ලා අස්වීම සඳහා ඉල්ලීමක් කළ විට ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මාලාවේ XIV පරිච්ඡේදයේ 201 සිට 209 දක්වා වූ වගන්ති අනුව කටයුතු කළ යුතු වූවත් ඒ අනුව කටයුතු කිරීමකින් තොරව නිලධාරිනිය සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කර තිබුණි.		වීම් ඇති නොවන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව, තෙල්දෙණිය මූලික රෝහලේ වෛද්‍ය අධිකාරිගේ අංක **CPS/DBH/TD/A**1/**SPMO/**2022 හා 2022.09.25 දිනැති ලිපියෙන් නිලධාරිනිය හට 2022.04.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවය හැර ගියා සේ සලකා ඉදිරි කටයුතු සිදු කිරීම නිර්දේශ කර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර ඇති ලිපිය අනුව නිලධාරිනිය හට සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග සිදුකර 2022.04.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවය හැර යාමේ නිවේදනය නිකුත් කර ඇති බව.
(ඈ)	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක CFO I/FR/135/2023 දරන 2022 දෙසැම්බර් 31 දිනැති මුදල් පාලන බලතල පිළිබඳ චක්‍රලේඛයේ 24.2.10 ඡේදය හා සෑම වර්ෂයකම නිකුත් කරනු ලබන මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීමේ චක්‍රලේඛ ප්‍රකාරව රෝහල්වලින් බැහැර කෙරෙන අනෙකුත් අපද්‍රව්‍යවලින් ආර්ථික වටිනාකමක් ඇති සේලයින් බෝතල්, ප්ලාස්ටික්, වීදුරු බෝතල්, X-ray card, කාඩ්බෝඩ්, වතුර බෝතල් හා අනෙකුත් දෑ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/FA/2005/2/26 දරන හා 2007 නොවැම්බර් 28 දිනැති නියෝගයට අනුව රජයට උපරිම ලාභයක් ලැබෙන පරිදි ටෙන්ඩර් කැඳවා විකිණිය යුතු විය. මේ සම්බන්ධයෙන් කරාපිටිය ශික්ෂණ රෝහලට අදාළව සිදුකරන ලද විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය කෙරේ.		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	i. 2021,2022 හා 2023 වර්ෂයේ මැයි 15 විගණිත දින දක්වා කාලය තුළදී රෝහල විසින් පාවිච්චි කර බැහැර කර තිබුණු ආර්ථික වටිනාකමක් ඇති සියළුම භාණ්ඩ හා ද්‍රව්‍ය ප්‍රමාණය විකුණා නොතිබුණු අතර, එසේ විකුණා නොතිබුණු ආර්ථික වටිනාකමක් ඇති සේලයින් බෝතල්, ප්ලාස්ටික්, වීදුරු බෝතල්, X-ray card, කාඩ්බෝඩ්, වතුර බෝතල් හා අනෙකුත් දෑ රෝහල තුළ නොපැවතුණි. ඒ අනුව ඒවා විකිණීමෙන් උපයාගත හැකිව තිබුණු එකතුව රු. 2,438,900 ක්වූ රජයේ ආදායම් අහිමි කර තිබුණු බව විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	රෝහල්වල ජනනය වන මුල්‍යමය වටිනාකමක් සහිත ද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.	එකග නොවන බව, සේලයින් බෝතල් සියල්ල අපද්‍රව්‍ය ලෙස ඉවත් කිරීම සිදු නොවන බව, ඉන් සැලකිය යුතු ප්‍රමාණයක් සායනික අපද්‍රව්‍ය සමග මිශ්‍ර වන බවත්, ඒවා සායනික අපද්‍රව්‍ය ලෙස බැහැර කරනු ලබන බව, ඒවා වෙන්කර ගැනීමට කටයුතු කලහොත් ඉන් ලබන ආදායමට වඩා සමාජ ආර්ථික සහ සෞඛ්‍ය පිරිවැය ඉහල යනු ඇති බව,
	ii. අදාළ චක්‍රලේඛ ප්‍රකාරව රජයට උපරිම ලාභයක් ලැබෙන පරිදි ටෙන්ඩර් කැඳවා සේලයින් බෝතල්, ප්ලාස්ටික්, වීදුරු බෝතල්, X-ray card, කාඩ්බෝඩ්, වතුර බෝතල් හා අනෙකුත් හිස් බෝතල් විකිණිය යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඒ අනුව අදාළ ද්‍රව්‍ය පිළිබඳ කොළඹ ජාතික රෝහලේ විකුණුම් මිල හා සැසඳීමේදී කරාපිටිය රෝහල විසින් සාමාන්‍ය විකුණුම් මිල ගණන්වලට වඩා අඩු මිල ගණන්වලට ට ඒවා විකිණීම හේතුවෙන් 2021,2022 හා 2023 වර්ෂයේ විගණිත දිනය දක්වා එකතුව රු.4,932,097 ක්වූ විකුණුම් ආදායමක් රජයට අහිමි කර තිබුණි.	-එම-	එකග නොවන බව, වර්ථමානයේ ජාතික තරගකාරී ලංසු කැඳවීම තුළ ලද මිලද පෙර ලැබුණු මිලට ආසන්න මිලක් බව.
	iii. රෝහලේ අබලි ද්‍රව්‍ය ගබඩාව පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවට අනුව කාමරයක් පුරවා හිස් වීදුරු කුප්පි අපිළිවෙලට ගොඩගසා තිබුණු බවට නිරීක්ෂණය වූ අතර, ඉහත චක්‍රලේඛය ප්‍රකාරව ඒවා විකුණා රජයට ආදායම් උපයා ගැනීම කෙරෙහි රෝහල් බලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. එසේම ගබඩා කාමරයෙන් පිටත එනම් රෝහල් සේවකයින්, රෝගීන් හා බාහිර පුද්ගලයින් ගමන්ගන්නා මාර්ගයේද වීදුරු කුප්පි බිඳී වීදුරු	-එම-	එකඟ වන බව, මේ සඳහා විධිමත් ස්ථානයක් අනාගතයේ ස්ථාපිත කරනු ඇති බව, එම ස්ථාන ගතකිරීම කරාපිටිය **MASTER PLAN** තුළ නිශ්චිත ස්ථානයක් හඳුනාගෙන ඉදි කරනු ඇති බව, වර්තමානයේ සුදුසු අපද්‍රව්‍ය කලමණාකරණය අදාළ ගොඩනැගිල්ලක් ඉදි කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන මෙම අවස්ථාවේ නොමැති බව, වීදුරු

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	කැබලි තැනින් තැන විසිර තිබීමෙන් රෝහල් භූමිය අනාරක්ෂිත තත්ත්වයට හා මිනිසුන්ගේ සෞඛ්‍යට අහිතකර බලපෑම් ඇති කරන තත්ත්වයට පත්කර තිබුණු බවට නිරීක්ෂණය විය.		කුප්පි මිල දි ගැනීමට ජාතික තරගකාරී ලංසු කැඳවීමේ දි ද ලංසුකරුවන් ඉදිරිපත් නොවන බව, එම නිසා ඉවත් කර ගන්නා ඕනෑම පාර්ශවයක් වෙත නොමිලයේ හෝ ලබාදි රෝහල් කටයුතු පවත්වාගෙන යාමට ප්‍රසම්පාදන තීරණයක් ගෙන ඇති බව.
(ඉ)	කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකයේ තයිරොයිඩ් ග්‍රන්ථි පිළිකා රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා භාවිතා කරනු ලබන අයඩින් ඖෂධ බහාලුම් තුළ ඇති ඊයම් ලෝහය, බාහිර පාර්ශවයන් වෙත විකිණීමේ ක්‍රමවේදයේ පවතින අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල මට්ටමක පැවතීම නිසා ඒවා විකිණීමෙන් රජයට උපයාගැනීමට හැකිව තිබුණු විශාල ආදායමක් අහිමි වී ගොස් තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. 2021 ඔක්තෝබර් 01 දින සිට 2023 මැයි 10 විගණිත දින දක්වා වූ කාලය තුළ එලෙස රජයට අහිමි කර තිබුණු ආදායම රු.182,560 ක් බව විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	-එම-	නිරීක්ෂණ සමග එකග නොවන බව, ඊයම් බාහාලු තුළ ඇත්තේ විකිරණශීලි අයඩීන් බැවින් සියලු බහාලුවෙන් වෙන්ව බර කිරීම සිදු නොවන බව, බහාලුවක බර මැන එම බර මත සියලු බහාලුවල බර ගණනය කර විකිණීම සිදු කරන බව, වර්තමානයේ ජාතික තරහකාරී ලංසු මිල මත විකිණීම සිදු කරනු ලබන බව.
(ඊ)	කරාපිටිය ශික්ෂණ රෝහලේ ක්ෂය රෝගය හඳුනාගැනීමට අදාළව රෝගී සෙම්පටල සාම්පල් පිළිබඳ පරීක්ෂාවන් කරනු ලබන ක්ෂය රෝග රසායනාගාර (TB Lab) සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.	-	-
	i. රසායනාගාරය සතු පරීක්ෂණ යන්ත්‍රය 2021 වර්ෂයේ සිට 2023 ජුනි 02 විගණිත දින වන විටත් සම්පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවන බවත්, එහි ඇති සාම්පල් පරීක්ෂණ කුටීර 04 න් 02 ක්ම අක්‍රීයව පවතින බවත් නිරීක්ෂණය විය. අදාළ පරීක්ෂණ යන්ත්‍රය සම්පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කිරීමට හා	මෙම යන්ත්‍රය ප්‍රශස්ථ ධාරිතාවයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	මොඩියුල 4 කින් සමන්විත මෙම යන්ත්‍රය දැනට මොඩියුල 3ක් අලුත්වැඩියාවෙන් පසු සේවා සැපයීමට එක් කර ඇති බව, ඉතිරි මොඩියුලය සකස් කිරීම සඳහා ඇස්තමේන්තු කැඳවා ඇති බව, **The Global Fund to Fight AIDS,**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	යන්ත්‍රයේ අක්‍රීය තත්ත්වයේ තිබෙන කුටීර 02, අළුත්වැඩියා කර ගැනීමට කටයුතු නොකිරීම නිසා දෛනිකව රසායනාගාර වෙත ලැබෙන සෙම්පටල සාම්පල් සියල්ලම පරීක්ෂා කිරීමට නොහැකිවීමෙන් ඒවා වෙනත් බාහිර රසායනාගාර වෙත යොමුකර පරීක්ෂා කිරීමට සිදුවී තිබීමෙන් රජයේ මුදල් නිෂ්කාර්ය වියදම් වී තිබුණි.		**Tuberculosis and Malaria** මඟින් මෙම යන්ත්‍රය නඩත්තුව සහ යාවත්කාලීන කිරීම් සිදු කරන බව.
	ii. රසායනාගාරය තුළින් විගණිත දින වන විටත් TB PCR,TB Culture පරීක්ෂණ හා AFB පරීක්ෂණ වලින් ඉතා සුළු කොටසක් පමණක් සිදු කළද, ක්ෂය රෝගයට අදාළ සෙම්පටල පරීක්ෂාවන් සිදු නොකරන බවත්, ක්ෂය රෝගයට අදාළ සෙම්පටල පරීක්ෂාවන් සිදුකිරීම සඳහා ගාල්ල ළය රෝහල හෝ බද්දේගම රෝහල වෙත දෛනිකව සෙම්පටල සාම්පල් යොමුකරන බවත් නිරීක්ෂණය විය. ඒ අනුව දෛනිකව සෙම්පටල සාම්පල් පරීක්ෂාවට වෙනත් රෝහල් වෙත යැවීම වෙනුවෙන් නිෂ්කාර්ය කාලයක් හා වියදමක් රජයට දැරීමට සිදුවන බවත් ඒ තුළින් රෝගී සුඛසාධනය පහළ ගොස් ඇති බවත් නිරීක්ෂණය විය. 2023 ජනවාරි මස සිට මැයි මස දක්වා වූ විගණන නියැදි පරීක්ෂා කාලය තුළදී කරාපිටිය රෝහලෙන් බාහිර රෝහල් වෙත යොමුකළ පරීක්ෂණ සංඛ්‍යාව 2,434 ක් විය.	-එම-	සෙම පටල පරීක්ෂාව **(AFB)** සඳහා අවශ්‍ය පරීක්ෂණ සඳහා ස්ථානයක් සකස් කර අවශ්‍ය පරීක්ෂණ රෝහල තුළම සිදු කරන බව, සියලු **TB culture** රෝහල තුළ සිදු කරන අතර ධනාත්මක සාම්පල් පමණක් ඖෂධ පරීක්ෂාව **(DST)** සඳහා වැලිසර වෙත යොමු කරන බව, ගාල්ල සහ මාතර දිස්ත්‍රික් සඳහා වන සියලු පරීක්ෂණ අවශ්‍යතාවය අනුව සිදු කරන බව.
(උ)	කරාපිටිය ශික්ෂණ රෝහලේ ශල්‍ය වෛද්‍ය කටයුතු සඳහා භාවිතා කරන උපකරණ හා වෛද්‍යවරුන් ඇතුළු වෛද්‍ය කාර්ය මණ්ඩලය විසින් ශල්‍ය වෛද්‍ය කටයුතු සඳහා භාවිතා කරන විශේෂිත ඇඳුම් පැළඳුම් විෂබීජහරණය කිරීම හා ශල්‍ය වෛද්‍ය කටයුතු සඳහා භාවිතා කරන ජලය වන්ධ්‍යකෘත කිරීම සිදුකරනු ලබන මධ්‍යම වන්ධ්‍යකෘත ඒකකයේ විෂබීජහරණ යන්ත්‍ර 06 ක් හා ජල වන්ධ්‍යකෘත යන්ත්‍ර 02 ක් පැවතුණු අතර ඉන් යන්ත්‍ර 04 ක් විගණිත දින වන විටත් මාස 01 සිට	මෙම යන්ත්‍ර ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	එකඟ නොවන බව, **vertical auto clave** (නිෂ්පාදිත වර්ෂය 2011) හා. **Getinge Hs** 672 **High Pressure** (නිෂ්පාදිත වර්ෂය 2004)යන්ත්‍ර වන්ධ්‍යකෘත ඒකකයට 2012 හා 2015 වර්ෂවලදී රෝහලේ රසායනාගාරයෙහි තිබී ලබා දී ඇති බව, මෙම යන්ත්‍ර පැරණි වීම නිසා නිසි ආකාරව දොරවල් නොවැසෙන අතර කිහිපවරක් දේශීය

	මාස 05 අතර කාලයක සිට අක්‍රියව පැවතුණු නිසා රෝහලේ දෛනික වන්ධිකෘත කටයුතු අඩාල වී තිබුණද, ඒවා අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට රෝහලේ වගකිව යුතු නිලධාරීන් සමත් වී නොතිබුණි.		නියෝජිත ආයතනය ලවා පරීක්ෂා කළ අතර උපාංග නොමැතිවීම නිසා වර්තමානයේ අක්‍රියව පවතින බව, **shinva** 91 **High pressure sterilizer** හා **Matachana High pressure** යන්ත්‍ර වර්ථමානයේ ක්‍රියකාරීව ඇති බව, පැරණි අක්‍රිය යන්ත්‍ර අපහරණ ක්‍රියාවලියට යොමු කර තිරණයක් ගන්නා බව, දැනට යන්ත්‍ර 02 ක් පවතින අතර ඉන් එක් යන්ත්‍රයක් ක්‍රියාත්මක තත්වයේ පවතින බව, අනෙක් යන්ත්‍රය වසර 17 ක් පමණ පැරණි වන අතර එම යන්ත්‍රය වෙනුවට **JICA** අරමුදල් යටතේ නව **Cath Lab** යන්ත්‍රයක් ලබා දීමට නියමිත බව, දැනට පවතින පැරණි යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඉදිරියේදී අළුත්වැඩියාවෙන් පසු සේවා හා නඩත්තු ගිවිසුම් වලට එළඹීමට කටයුතු සැලසුම් කර ඇති බව.
(ඌ)	මහනුවර ජාතික රෝහලේ හෘද රෝග අංශය තුළ භාවිතයට ගන්නා හෘද කැතීටකරන යන්ත්‍ර 02 ක් මගින් දෛනිකව රෝගීන් 30 දෙනෙකුට ආසන්න ප්‍රමාණයකගේ හෘද රෝග පරීක්ෂණ හා ප්‍රතිකාර සිදුකර තිබුණු අතර වසර 17 වඩා පැරණි Siemens Axiom Artis DFC Cath Lab (Machine – SN3542602626) යන්ත්‍රය 2023 මැයි 01 දින සිට අක්‍රිය තත්ත්වයට පත් වී තිබුණි. එය අළුත්වැඩියා කිරීම ඵලදායී නොවීම හේතුවෙන් ඒ වෙනුවට නව යන්ත්‍රයක් ස්ථාපිත නොකිරීම මත දෛනික හෘද රෝග පරීක්ෂණ සියයට 50 කින් පමණ අඩු වී තිබුණි. 2019 වර්ෂයේ සිට 2023 මැයි 29 දින දක්වා ප්‍රතිකාර සඳහා රෝගීන් 8024 ක් ලියාපදිංචි වී පොරොත්තු ලේඛනය තුළ රැඳී	-එම- -	නව යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමේ ගැටලුව හේතුවෙන් -දැනට ක්‍රියාවිරහිතව ඇති වසර 17 වඩා පැරණි **Siemens Axiom Artis DFC Cath Lab** යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය වෙත දන්වා ඇති අතර එම අංශය විසින් 2024.04.08 දිනැතිව ඩිමෝ පුද්ගලික ආයතනය වෙත ඇණවුම් ලබා දී ඇති බව, ඒ අනුව අදාළ උපාංග ආනයනය කිරීම සඳහා අවශ්‍ය බලපත්‍ර ලබා දෙන ලෙස 2024.04.22 දිනැති ලිපියෙන් කටයුතු කර ඇති අතර අදාළ අළුත්වැඩියා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	සිටින අතර යන්ත්‍රය අක්‍රීය වීම හේතුවෙන් පොරොත්තු ලේඛනය තවදුරටත් දීර්ඝ වන බව නිරීක්ෂණය විය.		කිරීමෙන් පසු රෝගී පරීක්ෂණ කටයුතු සඳහා භාවිතා කළ හැකි බව.
(එ)	සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලේ සහ නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ රාජකාරි කරමින් සිට විදෙස් නිවාඩු ලබාගෙන සේවයට වාර්තා නොකළ සහ සේවය හැරගිය නිලධාරීන් සහ සෞඛ්‍ය කාර්ය සහයක සේවකයින් පිළිවෙලින් 24 ක් සහ 09 දෙනෙකු ගිවිසුම් කඩකිරීම සහ නියමිත කාලය තුළ රාජකාරි ඉටු නොකිරීම මත පිළිවෙලින් රු.12,607,961 ක් සහ රු.4,137,720 ක් වශයෙන් එකතුව රු.16,745,681 ක මුදලක් රජයට ගෙවිය යුතු වූවද එම මුදල අයකරගෙන නොතිබුණි. තවද සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලේ වෛද්‍යවරුන් තිදෙනෙකුට අදාළව සහ නාවලපිටිය දිස්ත්‍රික් රෝහලේ වෛද්‍යවරුන් හෙද නිලධාරීන් සහ සේවකයින් 09 දෙනෙකුට අදාළව අයකර ගත යුතු දණ්ඩන මුදල ගණනය කර නොතිබුණි.	මේ පිළිබඳව පරීක්ෂා කර රජයට අයවිය යුතු සියළු මුදල් අයකර ගැනීමටත් වගකීම් පැහැර හරින ලද නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය.	නිරීක්ෂණ සමග එකග නොවන බව, වෛද්‍යවරුන් වැටුප් රහිත විදේශ නිවාඩු අනුමත කිරීම හා ගිවිසුම් වලට එළඹීම සිදු කරනුයේ සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් බව, අදාළ නිලධාරීන් නියමිත දිනට සේවයට වාර්තා නොකරන ලද බව අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇති බව, තනතුර අතහැර යාමේ නිවේදන නිකුත් කර ඇති බව, වෛද්‍ය නිලධාරි **F.N.A.** සුබයිඩීන් මිය විසින්, ඇය සේවය හැරයාම මත රජයට ගෙවිය යුතු මුදල වන රු. 800,961.00 මේවන විටත් ගෙවා ඇති බව, නමුත් ඉතිරි වෛද්‍ය නිලධාරීන් විසින් මුදල් ගෙවූ බවට අදාළ නිලධාරීන් විසින් දැන්වීම් සිදු කර නොමැති බව.
(ඒ)	සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලේ සේවය කරමින් සිටි හෙද නිලධාරීන් හත් දෙනෙකු සඳහා අනිවාර්ය සේවා කාලය සේවය නොකිරීම හේතුවෙන් එම නිලධාරීන්ට පුහුණු කාලසීමාවේදී ගෙවන ලද දීමනා රු.5,254,709 ක්ද ගෙවන ලද වැටුප් හා දීමනා රු.57,746 ක්ද අත්තිකාරම් බී ගිණුමට අයවිය යුතු රු.79,898 ක් ද වශයෙන් එකතුව රු.5,392,353 ක් සහ ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු දණ්ඩන මුදල අයකර ගෙන නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමග එකග නොවන බව, හෙද නිලධාරීන් සේවය හැර යාම පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇතත් අයකරගත යුතු මුදල් පිළිබඳව හා ඒ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ගය පිළිබඳව අමාත්‍යාංශය විසින් මෙතෙක් දන්වා එවා නොමැති බව, තවද පුහුණුව ලැබූ හෙද විදුහල් වලින් අදාළ තොරතුරු විමසා ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඔ)	සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහලේ සේවය කළ විකිරණ ශිල්පිනියක් ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන උපාධි පාඨමාලාවක් සඳහා 2014 නොවැම්බර් 24 සිට 2017 දෙසැම්බර් 31 දක්වා වසර තුනක් සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබුණි. ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4.12 අනුව 15 වැනි පරිශිෂ්ටය පරිදි මෙම නිලධාරිනිය විසින් සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබන නිලධාරීන් අත්සන් කළයුතු බැඳුම්කරයද 08 වැනි පරිශිෂ්ටය අනුව ගිවිසුමද අත්සන් කර තිබුණි. ගිවිසුමට අනුව අධ්‍යයන කටයුතු අවසන් වීමෙන් පසු අවුරුදු 10 කට නොඅඩු කාලයක් සේවය කළ යුතු වූවද සේවා කාලය සම්පූර්ණ නොකර සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් අධ්‍යයන නිවාඩු කාලය තුල නිලධාරියා වෙනුවෙන් ගෙවන ලද රු. 1,641,282 ක වැටුප් සහ 15 වැනි පරිශිෂ්ටයේ සඳහන් ඇප මුදල වන රු.600,000 ක්ද එම ශිෂ්‍යත්වය සඳහා දරන ලද අනෙකුත් වියදම්ද ඇතුළුව රජයට අයකරගත යුතු මුදල 2023 දෙසැම්බර් 31 දින වන විටද අයකරගෙන නොතිබුණි.	-එම-	නිරීක්ෂණ සමග එකඟ නොවන බව, විකිරණ ශිල්පිනිය අයකිරීමට ඇති මුදල් පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත දන්වා ඇති බව. අයකිරීම් කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කරන බව.
(ඕ)	නාවලපිටිය දිස්ත්‍රික් රෝහලේ 2016 සිට 2024 ජනවාරි දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නිලධාරීන් 8 දෙනෙකුගෙන් නිවාස කුලී රු. 304, 576 ක මුදලක් අඩුවෙන් සහ 2021 සහ 2024 ජනවාරි දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නිලධාරීන් 6 දෙනෙකුගෙන් නිවාස කුලී රු.219,940 ක් වැඩිපුර අයකරගෙන තිබුණද එය නිරවුල් කර නොතිබුණි.	අඩුවෙන් අයකළ මුදල් කඩිනමින් අයකර ගැනීමටත් වැඩිපුර අයකළ මුදල් අදාළ නිලධාරීන් වෙත නැවත ගෙවීමටත් කටයුතු කළ යුතුය.	සඳහන් කර ඇති නිලධාරීන් අට දෙනාගේ හිඟ මුදල් 2024 ජනවාරි මාසයේ සිට අඩු කිරීමට කටයුතු කර ඇති බව, වැඩිපුර අය කර ඇති නිවාස කුලිය ආදායමෙන් ආපසුගෙන අදාළ නිලධාරීන් වෙත ගෙවීමට කටයුතු කරන බව.
(ක)	2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, සියළුම රජයේ ආයතන වල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මගින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධ වාර්තා තබා ගැනීමටත්, ඊට අනුකූල	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතකළ යුතු බවට උපදෙස් ලබා දෙමින් අභ්‍යන්තර චක්‍රලේඛයක් හා පොදු ලිපියක් නිකුත් කර ඇති නමුත් පැවති වෘත්තීය

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	ගැනීමට පියවර ගත යුතු අතර 2017 මැයි 12 දිනැති අංක DMS/0016 දරන භාණ්ඩාගාර ලේකම්වරයා විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිකුත් කර තිබුණු ලිපිය ප්‍රකාරව,සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කළ හැකි පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක නොකරන්නේ නම් වර්තමාන වැටුපට අනුව අතිකාල දීමනා නොගෙවීමට වග බලා ගත යුතු විය.නමුත් අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශයට, එයට අයත් රෝහල් හා ආයතන සඳහා රු.මිලියන 31.08 ක් වැය කර ස්ථාපිත කර තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 213 ක් භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවති අතර වර්තමාන වැටුප පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේදීද වැටුප් සඳහා රු.මිලියන 44,590.70 ක් ද අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා රු.මිලියන 38,236.83 ක්ද වශයෙන් මුළු මුදල රු.මිලියන 82,827.53 ක් ගෙවා තිබුණි.එසේම අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් වැය කර තිබුණු මුළු මුදල වැටුප් පිරිවැයෙන් සියයට 72 ක් පමණ වී තිබුණි.	වන පරිදි නිලධාරීන්ගේ අතර රාජකාරී දීමනා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වා ගෙන යාමටත් කටයුතු කළ යුතුය.	සමිති විරෝධතා හේතුවෙන් මෙතෙක් එය ක්‍රියාත්මක කිරීමට නොහැකිවී ඇති බව, නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම රාජකාරී වේලාව ඇතුළත බැහැර යාම පිළිබඳ ක්‍රියාත්මක අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් සියළුම අංශ ප්‍රධානීන්ට උපදෙස් ලබා දී ඇති බව, එසේම අභ්‍යන්තර පාලනය ශක්තිමත් වන අයුරින් නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම හා රාජකාරී වේලාව තුළ බැහැර යාම ආදිය අධීක්ෂණය අඛණ්ඩව සිදු කරන ලෙසද ආයතන ප්‍රධානීන්ට උපදෙස් ලබා දී ඇති බව.
(ග)	2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 18 (5) සහ 25 (1) වගන්ති යටතේ මණ්ඩලය විසින් අරමුදලින් මුදල් ගෙවීම සම්බන්ධයෙන් සහ රීති සැදිය හැකි ප්‍රධාන කරුණු 05 කින් කිසිදු කරුණක් සම්බන්ධයෙන් රීති සකස් කර නොතිබුණි.	පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය	පිළිතුරු ලබාදී නොතිබුණි.
(ච)	2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 10(ඇ) වගන්තිය අනුව ඒ ඒ පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සලසනු ලබන පහසුකම් වලට අනුව ඒවා වර්ග කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ දක්වා ඇත. නමුත් 2023දෙසැම්බර් 31 දින වන විටත් පෞද්ගලික වෛද්‍ය ආයතන ශ්‍රේණිගත කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණු අතර මේ හේතුවෙන් ගාස්තු නියාමනය කිරීමේ කටයුතුද සිදුකර නොතිබුණි.	-එම-	එකඟ වන බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
இதசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඡ)	2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 13(1) වන වගන්තිය අනුව සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතිතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාවේ යොදනු ලැබිය යුතු බවත්, ප්‍රතිතනය සඳහා වූ නිර්ණායක, සංයුක්ත වන පහසුකම්, සේවා සහ වෙනත් යම් සාධක නිශ්චිතව දැක්වෙන සියලු විස්තර ඒ නියමයෙහි ඇතුළත් විය යුතු බවත් දක්වා තිබුණද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ප්‍රතිතන කටයුතු සම්බන්ධව නියෝග සකස් කර නීතියක් බවට පත් කර නොතිබුණි.	-එම-	-එම-
(ජ)	2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 18(2)(උ) හා 18(2)(1) වගන්තිය අනුව "සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තකුට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන යම් පැමිණිල්ලක් හාරගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හෝ පරිචය" සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි වූවත්, අමාත්‍යවරයා විසින් මෙම කරුණ සම්බන්ධයෙන් නියෝග සකස් කර නොතිබුණ අතර පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව විසින් **PHSRC Guideline** 05-**Complain Handling Procedure** නමින් 2021 මාර්තු 19 දින පිටු 02 කින් යුක්ත වූ (කරුණු 12 ක් ඇතුළත් වූ) පැමිණිලි සම්බන්ධව මාර්ගෝපදේශයක් පමණක් පිළියෙල කර තිබුණි.	-එම-	-එම-
(ට)	2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 18(1),18(2),18(3),18(4) වගන්ති අනුව නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සැදිය යුතු යයි මේ පනතින් බලය	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	දී ඇති සියළු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි බව දක්වා ඇති අතර පවරන ලද බලතල වලට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් සභාවේ උපදෙස් මත පනතේ සඳහන් කාරණා 09 හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි බවත් දක්වා ඇති අතර අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු බවත්, පනතේ වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු බවත් දක්වා ඇත. මේ අනුව නියෝග පිළියෙල කළ යුතු වගන්ති 09 කින් ගැසට් පත්‍රයේ පළකර තිබුණේ නියෝග 02 ක් පමණක් වූ අතර ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.		
(ඨ)	2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 19(1) හා 19(2) වගන්ති අනුව පනතේ දක්වා ඇති කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි බව දක්වා ඇති අතර සභාව විසින් සාදනු ලබන කිසිදු රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවන බව දක්වා ඇත. ඒ අනුව පනතේ දක්වා ඇති රීති සැදිය හැකි කරුණු 14 කින් කිසිදු කරුණක් සම්බන්ධයෙන් රීති සකස් කර නොතිබුණු අතර මාර්ගෝපදේශ 11 ක් පමණක් පිළියෙල කර තිබුණි. මෙම මාර්ගෝපදේශය සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබුණු බව තහවුරු නොවුණු අතර මෙම මාර්ගෝපදේශ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඩ)	ගොඩගම-මාලඹේ ප්‍රධාන මාර්ගයට හා වල්ගම-අතුරුගිරිය මාර්ගයට මායිමව පිහිටි අක්කර 02 යි රූඩ් 02යි පර්චස් 29.70 ක වපසරියකින් යුක්ත වූ (අක්කර 2½ ක පමණ) ඉඩම, 1998 අප්‍රේල් 01 දිනැති අංක 4205 දරන අන්තිම කැමති පත්‍රය මගින් වෛද්‍ය පර්යේෂණ ආයතනයට පරිත්‍යාග කර තිබුණු අතර එහි වටිනාකම ආසන්න වශයෙන් රු. මිලියන 1,074 ක් විය. මෙම ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු 2022 පෙබරවාරි 17 වන දින මරණයට පත් වී තිබුණු අතර ඒ බව 2022 පෙබරවාරි 21 වන දින ලිඛිතව වෛද්‍ය පර්යේෂණ ආයතනයට දැනුම් දී තිබුණි. මෙම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහතින් දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 516 වන වගන්තිය ප්‍රකාරව අන්තිම කැමති පත්‍රකරු මියගිය ස්ථානයට අදාළ දිසා අධිකරණය වෙත මාස තුනක් (03) ඇතුළත එකී අන්තිම කැමති පත්‍රයේ මුල් පිටපත ඉදිරිපත් කොට එය මියගිය තැනැත්තාගේ අවසාන අන්තිම කැමති පත්‍රය ලෙසට සිවිල් නඩු විධාන සංග්‍රහයේ 524 වන වගන්තිය ප්‍රකාරව විරෝධතාවකින් තොරව ඔප්පුකරවා ගත යුතු වූවත් ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු 2022 පෙබරවාරි 17 වන දින මිය යාමෙන් අනතුරුව 2024 මාර්තු 31 දින දිනට මාස 25 ක කාලයක් ඉක්ම ගොස් තිබුණද අංක 4205 දරන අන්තිම කැමති පත්‍රය මියගිය තැනැත්තාගේ අවසාන අන්තිම කැමති පත්‍රය ලෙසට විරෝධතාවකින් තොරව ඔප්පු කරවාගෙන නොතිබුණි.	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් විමර්ශනයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය.	මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන බව.
	ii. මෙලෙස අවසාන අන්තිම කැමති පත්‍රය විරෝධතාවකින් තොරව ඔප්පු කරවාගැනීම ප්‍රමාද වීම සඳහා අංක 4205 දරන අන්තිම කැමති පත්‍රයේ මුල් පිටපත වෛද්‍ය පර්යේෂණ ආයතනය හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ පොල්මඃකරු සතුව නොතිබීම, අංක	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	4205 දරන අන්තිම කැමති පත්‍රයේ මුල් පිටපත ඉහත කී පාර්ශවයන් සතුව නොමැති බව හඳුනාගැනීමට ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු මිය ගොස් මාස 06 කට වඩා වැඩි කාලයක් ප්‍රමාද වීම සහ පහතින් දැක්වෙන පරිදි අදාළ නිලධාරීන්ගේ ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රමාදයන් හේතුවී තිබුණි.		
	➢ ඉඩමේ නීත්‍යානුකූල හිමිකරුගේ මිය යාම වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් **2022** පෙබරවාරි **25** වන දින සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කර තිබුණ ද අංක **4205** දරන අන්තිම කැමති පත්‍රය මියගිය තැනැත්තාගේ අවසාන අන්තිම කැමති පත්‍රය ලෙසට විරෝධතාවකින් තොරව ඔප්පුකරවා ගැනීම සඳහා අවශ්‍ය කෙරෙන නීතිමය උපදෙස් වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙත ලබා දීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති ඒකකය විසින් **2022** අගෝස්තු **31** දින දක්වා දින **188** කින් ප්‍රමාද කර තිබුණි. ඉඩමේ නීත්‍යානුකූල හිමිකරුගේ මිය යාම පිළිබඳව **2022** පෙබරවාරි **25** වන දින සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් වූවද ඉඩමේ නීත්‍යානුකූල හිමිකාරිත්වය පවරා ගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම **2022** අප්‍රේල් **04** දක්වා දින **39**ක කාලයක් ප්‍රමාද කර තිබුණි.	-එම-	-එම-
	➢ ඉහත ලිපියට පිළිතුරු ලෙස නීතිපති දෙපාර්තමේන්තුවේ අංක **E/113/2022** දරන **2022** මැයි **20** දිනැති ලිපිය මගින් අන්තිම කැමති පත්‍රය ඔප්පු කිරීම සහ මියගිය ඉඩමේ නීත්‍යානුකූල හිමිකරුගේ අනෙකුත් දේපල සම්බන්ධව කොළඹ දිසා අධිකරණයේ නෙස්තමේන්තු නඩුවක් පවතින්නේද යන්න සොයා බලා දැනුවත් කරන ලෙසත් මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ නිලධාරීන් මීට පෙර දැනුවත්	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	කළ බවත් දක්වා තිබුණද, මෙම ලිපියට පිළිතුරු අමාත්‍යාංශ විසින් සපයා තිබුණු බවට ලිඛිතව තහවුරු නොවීය.		
	iii. මෙම ඉඩම සම්බන්ධයෙන් එම ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු මියයාමට පෙර සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නඩත්තුකර තිබුණු අංක **LO/**192/2015 දරන ලිපිගොනුව සහ ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු මිය යාමෙන් පසුව විවෘත කර තිබුණු අංක **LO/**113/22 දරන ලිපි ගොනුව අස්ථාන ගත වී තිබුණු බැවින් විගණනයට ඉදිරිපත් නොවීය.	-එම-	-එම-
	iv. 2015 වර්ෂයේදී මෙම ඉඩමේ සංවර්ධන කටයුතු වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් සිදුකර තිබුණු අතර ඒ වෙනුවෙන් ඉඩමේ නීත්‍යානුකූල තත්ත්වය තහවුරු කර ගැනීම සඳහා ආයතනයේ එවකට පරිපාලන නිලධාරි ලෙස කටයුතු කරන ලද නිලධාරියා විසින් අංක 4205 දරන අන්තිම කැමති පත්‍රයේ මුල් පිටපත සහ අංක 2050 දරන ඔප්පුවේ මුල් පිටපත ආයතනයේ ගිණුම් අංශයේ සේප්පුවේ ඇති බවත්, එම ලේඛන ඔහු වෙත ලබා දෙන ලෙසත් ඉල්ලමින් ආයතනයේ ගණකාධිකාරී වෙත අංක **MRI/EI/BL.MAI/** 2014/14 දරන 2015 අප්‍රේල් දින රහිත ලිපිය ගිණුම් අංශයේ ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර වෙත පිටපතක් ද සහිතව යොමුකර තිබුණද එම ලිපියට අදාළව ආයතනයේ ගිණුම් අංශය විසින් කටයුතු කර නොතිබුණු අතර එම අවස්ථාවේදී ඉහත සඳහන් ලේඛනවල මුල් පිටපත් වෛද්‍ය පර්යේෂණ ආයතනය සතු නොවූයේ නම් ඒවා ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු ජීවත්ව සිටියදී ලබා ගැනීමට හෝ භාරයේ තබා සිටින තැනැත්තා පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. එසේම අංක 4205 දරන අන්තිම කැමති පත්‍රයේ මුල් පිටපත සහ අංක 2050 දරන ඔප්පුවේ මුල් පිටපත	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ගිණුම් අංශයේ වූ සේප්පුවේ නොමැති බව එම සේප්පුවේ යතුරු භාරයේ තබා ගෙන තිබුණු ගිණුම් අංශයේ රාජකාරී කටයුතුවල නිරත වන රාජ්‍ය කළමනාකරණ සහකාර - මුදල් සහ සංවර්ධන නිලධාරීවරියක් 2023 ජූලි 05 දින ප්‍රකාශ කරන ලදි. ඒ අනුව අංක 4205 දරන අන්තිම කැමති පත්‍රයේ මුල් පිටපත සහ අංක 2050 දරන ඔප්පුවේ මුල් පිටපත වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙත ලැබී අස්ථාන ගත වී තිබුණු බවට වූ සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය.		
	v. 2015 වර්ෂය වන විට වෛද්‍ය පර්යේෂණ ආයතනයට නීත්‍යානුකූල හිමිකමක් නොතිබුණු මෙම ඉඩම වටා කොන්ක්‍රීට් කණු යෙදූ කම්බි වැටක් රු.176,369 ක රජයේ මුදල් සහ රාජ්‍ය නිලධාරීන්/සේවකයින් 16 දෙනෙකු දින 09 ක කාලයක් තුළ යොදවා වෛද්‍ය පර්යේෂණ ආයතන විසින් 2015 අප්‍රේල් මස ඉදිකර තිබුණි. එබැවින් රජයේ සම්පත් වැය කරමින් සිදුකර තිබුණු ඉහත ගණුදෙනුව නීත්‍යානුකූල නොවන ගණුදෙනුවක් ලෙස නිරීක්ෂණය කෙරේ.	-එම-	-එම-
	vi. ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු විසින් 2015 ඔක්තෝබර් 11 දිනැති ලිපිය මගින් මෙම ඉඩම තැගි ඔප්පුවකින් පවරා දීමට එකඟ බව දන්වා තිබුණු අතර වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් රු.35,000 ක් වැය කර මෙම ඉඩම මිනුම් කර පිඹුරු පතක් පිළියෙල කර තිබුණි. එසේම ඉඩමේ නීත්‍යානුකූල හිමිකරුගේ 2016 මැයි 06 දිනැති ලිපිය මගින් වල්ගම - අතුරුගිරිය මාර්ගයේ අතුරුගිරිය අන්තය සංවර්ධනය කිරීම සඳහා මෙම ඉඩමේ කොටසක් අත්පත් කර ගැනීමේ ගැටළුව නිරාකරණය කර ගන්නා තෙක් තැගි ඔප්පුවකින් ඉඩම පවරා දීමට අදාළ කටයුතු තාවකාලිකව නතර කරන ලෙස ඉල්ලා සිටීමෙන් අනතුරුව	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	2016 නොවැම්බර් 16 වන දින දක්වා ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු සහ වෛද්‍ය පර්යේෂණ ආයතනය අතර ලිපි හුවමාරු වී තිබුණු නමුත් ඉන් පසුව ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු මිය යන තෙක්ම වසර 05කට අධික කාලයක් ලිපි හුවමාරුවක් සිදුකර තිබුණු බවට ලිඛිතව තහවුරු නොවීය. මෙලෙස තෑගි ඔප්පුවකින් ඉඩම පවරා දීමට එකඟව තිබියදී වසර 05කට අධික කාලයක් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් හිතාමතා හෝ නොසැලකිලිමත්භාවයෙන් ඒ පිළිබඳව පසු විපරම් කර නොතිබුණි.		
	vii. විගණනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන, රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු අංක **HSM/E/MH/**01/**INFO/**2021/17 දරන 2021 සැප්තැම්බර් 29 දිනැති ලිපිය මගින් කැඳවා තිබුණු අතර එම ලිපියේ (ආ) ඡේදය යටතේ පරිත්‍යාග ලෙස ඉඩම් හා ගොඩනැගිලි ලැබීම් පිළිබඳව තොරතුරු එම ලිපියට වූ ඇමුණුම් අංක 02 ප්‍රකාරව ඉල්ලා තිබුණු නමුත් වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් 2023 මැයි 23 දිනැතිව සපයා තිබුණු තොරතුරු මගින් අන්තිම කැමති පත්‍රයක් මගින් වෛද්‍ය පර්යේෂණ ආයතනයට පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු මෙම ඉඩම සම්බන්ධයෙන් වූ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් විගණනයට වෛද්‍ය පර්යේෂණ ආයතනයේ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමක් ලෙස නිරීක්ෂණය කෙරේ. මේ සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 7(1) හා 42 වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බවට පෙන්වා දෙමි.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	viii. ඉහතින් පෙන්වා දී තිබෙන නිරීක්ෂණ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවයත්, අංක 4205 දරන අන්තිම කැමති පත්‍රය මියගිය තැනැත්තාගේ අවසාන අන්තිම කැමති පත්‍රය ලෙසට විරෝධතාවකින් තොරව ඔප්පුකරවා ගෙන ඉඩමේ නීත්‍යානුකූල අයිතිය වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙත පවරා ගැනීම තවදුරටත් ප්‍රමාදයකින් තොරව කඩිනම් කළයුතු වීමේ අවශ්‍යතාවයත් පෙන්වා දෙමි.	-එම-	-එම-
(ණ)	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක **CFO I/FR/**135/2023 දරන 2022 දෙසැම්බර් 31 දිනැති මුදල් පාලන බලතල පිළිබඳ චක්‍රලේඛයේ 24.2.10 ඡේදය හා සෑම වර්ෂයකම නිකුත් කරනු ලබන මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීමේ චක්‍රලේඛ ප්‍රකාරව රෝහල්වලින් බැහැර කෙරෙන අනෙකුත් අපද්‍රව්‍යවලින් ආර්ථික වටිනාකමක් ඇති සේලයින් බෝතල්, ප්ලාස්ටික්, වීදුරු බෝතල්, **X-ray card,** කාඩ්බෝඩ්, වතුර හා අනෙකුත් දෑ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක **SA/FA/**2005/2/26 දරන හා 2007 නොවැම්බර් 28 දිනැති නියෝගයට අනුව රජයට උපරිම ලාභයක් ලැබෙන පරිදි ටෙන්ඩර් කැඳවා විකිණිය යුතු වූවත්, මාතර මහ රෝහල විසින් ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් 2021,2022 හා 2023 දෙසැම්බර් මස විගණිත දින දක්වා කාලය තුළදී ආර්ථික වටිනාකමක් ඇති අයිතම 3 ක් (හිස් සේලයින් බෝතල්, රුධිර කාන්දු පෙරණ දියර කෑන් 5L,10L) විකිණීමේදී රජයට උපයා ගැනීමට හැකිව තිබුණු එකතුව රු.2,638,172 වූ ආදායම් අහිමි කර තිබුණු බව විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	රෝහල්වල ජනනය වන මුල්‍යමය වටිනාකමක් සහිත ද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.	සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනාරාල්ගේ **SA/FA/**2005/02/26 දරන 2007 නොවැම්බර් 28 දිනැති නියෝගයට අනුව රජයට උපරිම වාසියක් ලැබෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු කර රෝහලේ භාවිතයෙන් ඉවත් වන ද්‍රව්‍ය හා භාජන විකුණුම් කටයුතු සිදු කරන ලද බව, එම කටයුතු ප්‍රසම්පාදන අංක 2020/212, 2021/261 හා 2022/222 යටතේ ලබා දී ඇති අනුමැතිය පරිදි විකිණීම් කටයුතු සිදු කර ඇති බව, කෙසේ වෙතත් මෙම කරුණ සමස්ත රෝහල් පද්ධතියටම බලපාන කරුණක් වන බැවින් රෝහල්වල හිස්භාජන විකුණුම් ආදායම් නිවැරදිව අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සැකසීම සම්බන්ධයෙන් ප්‍රධාන මුල්‍ය නිලධාරී 1 විසින් කටයුතු කරනු ලබන බව.
(ත)	විගණිත දිනය වූ 2023 ඔක්තෝබර් 31 දින වන විට මාතර මහ රෝහලේ ශල්‍ය ගබඩාවේ, එකතුව රු.1,934,201 ක් වූ වර්ග 37	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකිව යුතු	මෙම ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය කල් ඉකුත් වීමට පෙර භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග එම

	කට අදාළ කල් ඉකුත් වූ ශල්‍ය අයිතම 2754 ක් පැවතුණි. අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා තොග රැස්කර තබා ගැනීමත් කල් ඉකුත්වීමට පෙර අතිරික්ත තොග, වෙනත් රෝහල් වෙත බෙදාහැරීමට කටයුතු නොකිරීමත් මගින් මෙසේ ශල්‍ය තොග විනාශ වීමට ඉඩහැර තිබුණු බවත් රෝහල තුළ මනා තොග පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක වී නොතිබුණු බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.	නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය.	අංශ භාර ඖෂධවේදී නිලධාරී මහතා විසින් ගෙන ඇති බව.
(ඵ)	මාතර මහ රෝහලේ සිට කඹුරුගමුව නව රෝහල දක්වා කාර්යමණ්ඩලය ප්‍රවාහනය කිරීමේ ගමන් වාරයක් (පැමිණීම හා පිටවීම) සඳහා කිලෝමීටර් 20 ක් දුර ධාවනය වන බවත්, දිනකට ගමන් වාර 8 කට ආසන්න ප්‍රමාණයක් අංක **NE** 1037 හා **NF** 1038 දරන බස්රථ යොදාගෙන ධාවනය කර තිබුණි. විගණන නියැදි පරීක්ෂාවට ලක්වුණු 2023 පෙබරවාරි මස සිට ඔක්තෝබර් මස දක්වා වූ මාස 9 තුළදී අංක **NE** 1037 දරන බස් රථය ගමන් වාර 1387 ක් සහ අංක **NF** 1038 දරන බස්රථ ගමන් වාර 1093 ක් ධාවනය කර තිබුණි. ඒ අනුව සේවා ස්ථාන අතර ගමන් සඳහා රජයේ වාහන භාවිතා කර එකතුව රු.4,151,031 ක්වූ ඉන්ධන වියදම් දැරීමට බලපෑ සාධාරණ හේතූන් විගණනයට අනාවරණය නොවූයෙන් අදාළ වියදම් නිශ්කාර්ය වියදම වන බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.	විධිමත් අනුමැතීන් යටතේ පමණක් මෙවැනි කටයුතු සිදුකළ යුතුය.	මාතර රෝහලට අනුබද්ධිතව වසර 2013 දී වැඩ අවසන් කළ කඹුරුගමුව නව රෝහල මාතෘ හා නව ජන්ම රෝහලක් වශයෙන් **KOICA** ආධාර යටතේ ඉදිකරන ලද අතර එය 2023 ජනවාරි මාසය වන තෙක් එහි මූලික අරමුණු වූ මාතෘ හා නව ජන්ම සෞඛ්‍ය සේවාවන් සපයන රෝහලක් වශයෙන් ආරම්භ කිරීමට නොහැකි වූයේ ප්‍රධාන වශයෙන්ම එම රෝහල මාතර නගරයෙන් කිලෝමීටර 12 ක් පමණ දුර බැහැර ප්‍රවාහන පහසුකම් ඉතා අවම පරිසරයක පිහිටා තිබීම හේතුවෙන් බව, පැය 24 පුරාවට සේවාව සපයන සෞඛ්‍ය සේවකයින් විවිධ කාලපරාසයන් තුළ සේවාමුර සඳහා මෙහි සේවයේ යෙදෙන මාතර සිට ගාලු පාරේ තංගල්ල දක්වාද, මාතර දෙනියාය, මාතර හක්මණ, මාතර ඌරුබොක්ක වැනි ප්‍රධාන මාර්ග වලින් මාතර නගරයට පැමිණෙන සේවකයින්ට නව රෝහල් පරිශ්‍රයට යාමට සහ ඒමට නොහැකි වීම නිසා කඹුරුගමුව නව රෝහලේ ප්‍රධාන සේවාවන් ආරම්භ කිරීමට නොහැකි වූ බව, මේ පිළිබඳ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු සෞඛ්‍ය අමාත්‍යාංශ

බලධාරීන් රෝහල් කාර්යමණ්ඩලය සමඟ කරන ලද සාකච්ඡාවේදී නගර අතර ප්‍රවාහන පහසුකම් ස්ථාපිත වන තෙක් රෝහල වෙත ව්‍යාපාතිය මඟින් ලබා දී ඇති බස් රථ දෙක යොදවා අනාවශ්‍ය කාර්යමණ්ඩලය ප්‍රධාන නගරය හා කඹුරුගමුව රෝහල අතර ප්‍රවාහනය කිරීමට එකඟ වූ අතර එකඟතාවයකට එළඹී බව, කරුණු සියල්ල සලකා බලා ප්‍රවාහන සේවා නිසිපරිදි ක්‍රියාත්මක නොවන අවස්ථාවන් වලදී සේවා අවශ්‍යතාවය අනුව කඹුරුගමුව හන්දිය සහ නව රෝහල අතර ධාවන බස්රථ යොදාගනිමින් කාර්යමණ්ඩල ප්‍රවාහනය කිරීමට යටත්ව 2024.03.01 වන දින සිට මෙම NE 1037 හා NF 1038 අංක දරන බස්රථ යොදාගනිමින් මාතර නගරය සහ කඹුරුගමුව රෝහල අතර කාර්යය මණ්ඩල ප්‍රවාහනය කිරීම අත්හිටුවීමට තීරණය කරන ලද බව, 2024.03.10 දින සිට 2024.05.07 දක්වා කාලය තුළ මෙම බස්රථ ධාවනය අත්හිටවූ අතර 2024.05.04 දින ගරු සෞඛ්‍ය අමාත්‍ය රමේෂ් පතිරණ මහතාගේ නිරීක්ෂණ වාරිකාවේදී රෝහලේ කාර්යමණ්ඩලයේ ඉල්ලීම් සලකා බලා ඉක්මන් අවශ්‍යතා අවස්ථාවන් ආවරණය වන පරිදි දිනකට ගමන් වාර 04 ලෙස 2024.07.07 දින දක්වා පමණක් ධාවනයේ යෙදවීමට තීරණය වූ බව.

(ද)	2023 පළමු අර්ධ වර්ෂය තුළ අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙන් ලැබුණ වටිනාකම රු.26,065,432 ක් වූ ත්‍රිපෝෂ සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.		
	i. ත්‍රිපෝෂ බෙදා හැරීමේ වැඩපිළිවෙල සම්බන්ධයෙන් ඉහළ කළමනාකරණයේ අධීක්ෂණයක් නොතිබීම,ලේඛන විධිමත්ව නඩත්තු කර නොතිබීම, ත්‍රිපෝෂ බෙදා හැරීමේදී කූඨ ලේඛන භාවිතය, දුම්රියෙන් ප්‍රවාහනය කරන ත්‍රිපෝෂ තොග වහාම බෙදා හැරීමට වැඩ පිළිවෙලක් නොතිබීම, වැනි ත්‍රිපෝෂ බෙදාහැරීමේ ක්‍රියාවලියේ පැවති දුර්වලතා මත එකතු වටිනාකම රු.1,094,657 ක් ත්‍රිපෝෂ පැකට් 30 බැගින් අඩංගු මළු 77 ක් අස්ථානගත කර හෝ වංචා කර තිබීම සහ රු.23,497,597 ක් වූ ත්‍රිපෝෂ පැකට් 30 ක් අඩංගු මළු 1750 ක් මාස 02 කට වැඩි කාලයක් නිදහස්කර ගැනීමකින් තොරව අනුරාධපුර දුම්රියපළේ වැගනයක් තුළ රඳවා තැබීමට ඉඩ හැර තිබුණි.	රට පුරා ත්‍රිපෝෂ බෙදාහැරීමේ කටයුතු විධිමත් කළ යුතුය.	ත්‍රිපෝෂ බෙදාහැරීමට අදාළව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් නොපැවතීමත්, අදාළ විෂයභාර නිලධාරිනිය විසින් අදාළ කාර්ය නිසි පරිදි ඉටු නොකිරීමක් සිදු වූ අතර මේ වන විට මනා අවබෝධයක් ඇති කළමනාකරණ සේවා නිලධාරියෙකු වෙත මෙම කාර්ය විධිමත්ව පවරා ඇති බව, කූඨ ලේඛන සම්බන්ධයෙන් විමර්ශනයක් මේ වනවිට පවතින අතර එය සම්පූර්ණ කර වාර්තාව ලබා දීමෙන් පසු විගණනයට ඉදිරිපත් කරන බව, කාලයක් තිස්සේ ත්‍රිපෝෂ බෙදා හැරීමේ කටයුතු සාර්ථකව සිදු වී නොමැති බවට විගණනය විසින් ලබා දුන් නිරීක්ෂණ වලට ස්තුතිවන්ත වන අතර ත්‍රිපෝෂ බෙදා හැරීම විධිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විටත් ක්‍රියාවට නංවා ඇති බව, කෙසේ වෙතත් විගණනයෙන් පෙන්වා දී ඇති තත්ත්වයන් ඉදිරියට ඇති නොවීම සඳහා ත්‍රිපෝෂ බෙදාහැරීමේ කටයුතු විධිමත් කරවීම සඳහා අදාළ පාර්ශවයන් වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ii. දුම්රිය මැදිරි තුළ ත්‍රිපෝෂ පැවති කාලය තුළ පැවති සෙල්සියස් අංශක 45 ක උෂ්ණත්වය තුළ ත්‍රිපෝෂවල ගුණාත්මකභාවය අඩුවීමේ අවධානමක් පැවති බවත්, නියමිත කාලය තුළ දුම්රිය වැගනයෙන් ත්‍රිපෝෂ තොග ඉවත් නොකිරීම නිසා ප්‍රමාද ගාස්තු ලෙස රු.1,080,000 ක මුදලක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදු වී තිබූ බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
	iii. වටිනාකම රු.මි.26 ක් වූ ත්‍රිපෝෂ තොගය ප්‍රතිලාභීන් වෙත ලැබෙන විට කල් ඉකුත්වීමට ආසන්නව පැවතුණි. ඒ අනුව එකී ත්‍රිපෝෂ තොගය අධික උෂ්ණත්වයක් තුළ පැවතීම මෙන්ම කල් ඉකුත්වීමට ආසන්නව පැවතීම මත අපේක්ෂිත ගුණත්වයෙන් යුත් ත්‍රිපෝෂ ප්‍රතිලාභීන් වෙත ලැබී තිබෙන බවට තහවුරු නොවන බවත්, ඉකුත් කාලය තුළ ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩපිළිවෙල අදාළ වගකිවයුතු පාර්ශව සහ අංශ වෙතින් අධීක්ෂණය නොවීමත් යන හේතු මත අනුරාධපුර දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 22 කට අදාළ වයස අවුරුදු 05 ට අඩු ළමුන්ගේ පෝෂණ තත්ත්වය පරීක්ෂාවේදී 2023 ජුනි 30 දිනට මන්දපෝෂණයෙන් පෙළෙන ළමුන් සංඛ්‍යාව 13326 ක් ලෙස වාර්තා වී තිබුණි.	-එම-	-එම-
(ධ)	සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් වෛද්‍ය සැපයුම් ඒකකය විසින් කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ සිට අනුරාධපුර දුම්රිය ස්ථානය වෙත 2023 පෙබරවාරි සිට ජුනි දක්වා වූ කාලය තුළ විවිධ අවස්ථා වලදී රෝහල් වෙත බෙදා හැරීම සඳහා එවනු ලැබූ ඖෂධ තොග අනුරාධපුර දුම්රිය ස්ථානයෙන් දුම්රිය ගාස්තු ගෙවීම් නිදහස් කාලය තුළ අදාළ වගකිව යුතු සෞඛ්‍ය ආයතන විසින් ඉවත් කර නොගැනීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු ප්‍රමාද ගාස්තුවල එකතු වටිනාකම රු.4,603,900 ක් විය. එමෙන්ම මෙම ඖෂධ තොග මාස 02 කට අධික	රට පුරා වෛද්‍ය සැපයීම් බෙදාහැරීමේ කටයුතු විධිමත් කළ යුතුය.	දුම්රිය ගැල් මගින් වෛද්‍ය සැපයීම් ශල්‍ය තොග බෙදා හැරීම වඩා ප්‍රයෝගික නොවන බව පෙනී ගියද, රජයට වඩාත් වාසිදායක හා පහසුම ක්‍රමය මෙය වන අතර, අදාළ තොග බෙදාහැරීම සඳහා වෛද්‍ය සැපයීම් අංශයේ ලොරි රථ ප්‍රමාණවත්ව නොමැතිවීමේ හා අදාළ ආයතනවල වාර්ෂික ඇස්තමේන්තුවට අදාළ තොග රැගෙන නොයාම හේතුවෙන් ගබඩා අංශවල විශාල තොග එකතු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	කාලයක් සෙල්සියස් අංශක 45 ක අධික උෂ්ණත්වය තුළ දුම්රිය වැගන්වල ඉවත් නොකර රඳවා තිබීම නිසා මෙම ඖෂධවල ගුණාත්මකභාවය අඩුවීමේ අවධානමක් පැවතිය හැකි බැව් නිරීක්ෂණය විය.		වීමෙන්, ලැබෙන තොග ගබඩා ගත කිරීමට ඉඩ ප්‍රමාණවත් නොමැති වීමෙන් තොග දුම්රිය ගැල් මගින් අදාළ ආයතන වෙත යොමු කරන බව, කෙසේ වෙතත් පවතින ගැටළු මගහරවා ගෙන කටයුතු කිරීම සම්බන්ධයෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය සැපයීම් හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති බව.
(න)	ජීවවෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ වෛද්‍ය උපකරණ සඳහා විධිමත් ජීව දත්ත සමඟ සේවා ගිවිසුම් පවත්වා ගෙන ගොස් නොතිබුණි. වෛද්‍ය උපකරණ මිලදී ගැනීමෙන් පසුව සැපයුම්කරු ලබා දී ඇති වගකීම් කාලය ඉකුත් වීමෙන් අනතුරුව නඩත්තු හා සේවා ගිවිසුම් ආරම්භ කිරීමට අදාළ වෛද්‍ය උපකරණ ලේඛන ගත දත්ත නොමැති වීම නිසා සියළුම වෛද්‍ය උපකරණ සඳහා නඩත්තු හා සේවා ගිවිසුම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අදාළව පරිගණක ගත දත්ත පද්ධතියක අවශ්‍යතාවය හඳුනා ගෙන ආරම්භ කිරීමට අදාළ පියවරයන් කඩිනමින් ක්‍රියාත්මක කර යුතු අතර ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය රෝහල් 42 ක් සඳහා 2023 වර්ෂයේ අළුත්වැඩියා කටයුතුද ඇතුළුව නඩත්තු හා සේවා ගිවිසුම් වෙත එළඹීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන රු.මි.1,647.3 ලබා දී ඇතත් එම ප්‍රතිපාදන මත එළඹුණු නඩත්තු හා සේවා ගිවිසුම් පිළිබඳ තොරතුරු ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය සතුව නොතිබුණි. ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් සකස් කර තිබූ 2023 වර්ෂය සඳහා නඩත්තු හා සේවා ගිවිසුම් **Excel sheet** දත්ත අනුව සේවා ගිවිසුම් 548 කින් සේවා ගිවිසුම් වලට එළඹ නොතිබූ වෛද්‍ය උපකරණ සංඛ්‍යාව 234ක් හෙවත් මුළු සංඛ්‍යාවෙන් සියයට 43 ක් වී තිබුණි.	සියළුම සෞඛ්‍ය ආයතන සඳහා සියළුම ප්‍රභවයන් මගින් මිලදි ගන්නා හා පරිත්‍යාග ලෙස ලැබෙන වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් සියළු තොරතුරු ඇතුළත් විධිමත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.	වෛද්‍ය උපකරණ මිලදී ගැනීම ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය මගින් මෙන්ම රෝහල් මඟින්ද සිදු කරන අතර එම වෛද්‍ය උපකරණ වලට අදාළව මිලදී ගන්නා අවස්ථාවේදී අදාළ ලංසු ලේඛනවල සේවා හා නඩත්තු මිල ගණන් ඇතුළත් කර එම මිල ගණන් මත ඉදිරි වර්ෂ වල සේවා හා නඩත්තු කටයුතු සිදු කරගෙන යනු ලබන බව, ඊට අමතරව දේශීය හා විදේශීය ආධාර වශයෙන් ද වෛද්‍ය උපකරණ රෝහල් වලට ප්‍රදානය කරනු ලබන බව, එම ආධාර වශයෙන් ලැබෙන වෛද්‍ය උපකරණ සඳහා එලෙස සේවා හා නඩත්තු මිල ගණන් නොමැති බැවින් ඉදිරි සේවා හා නඩත්තු ඇති කර ගැනීමේදී ගැටළුවක් පැන නැඟී ඇති බව, එනමුදු පවතින තොරතුරු මත පදනම්ව සේවා හා නඩත්තු ගිවිසුම් රෝහල් මට්ටමින් හා අප අංශය මගින් විධිමත් පරිදි පවත්වාගෙන යනු ලබන අතර ඉදිරියේදී තොරතුරු දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති බැවින්

			සියළුම තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යා හැකි බව.
(ප)	2022 වර්ෂයේදී මහමෝදර ශික්ෂණ රෝහල විසින් ඖෂධ හා ශල්‍ය පාරිභෝජ්‍යය ද්‍රව්‍ය මිලදී ගැනීමට වෛද්‍ය සැපයුම් අංශය වෙත අනුමැතිය සඳහා යොමු කරන ලද අවස්ථා 26 කදී එකතුව රු.1,496,937 ක් වූ ඒකක 6,228 ක් සඳහා Pronto පරිගණක පද්ධතිය මගින් අනුමැතිය ලබා දීමට දින 02 සිට දින 20 ක් දක්වා වූ ප්‍රමාද කාලයක් ගෙන තිබුණු අතර අවස්ථා 08 කදී ඒකක 695 ක් රෝහල වෙත මිලදී ගැනීම වෙනුවෙන් එකතු වටිනාකම රු.923,555 ක් වූ ඇණවුම් සැපයුම්කරුවන් වෙත ලබා දී රෝහල වෙත සැපයීමට දින 02 සිට දින 73 ක් දක්වා වූ ප්‍රමාද කාලයක් සැපයුම්කරුවන් විසින් ගෙන තිබුණි.	මෙම ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.	2022 වර්ෂය තුළදී මහමෝදර ශික්ෂණ රෝහල වෙතින් ශල්‍ය පාරිභෝජන අයිතම 6 ක් හා ඖෂධ වර්ග 17 ක් මිලදී ගෙන ඇති අතර, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය වෛද්‍ය සැපයුම් අංශය වෙතින් Pronto පරිගණක පද්ධතිය හා MSMIS පද්ධතිය හරහා ලබා ගන්නා ලද බව, එම වර්ෂය සඳහා ඖෂධ වර්ග 17 ක් ප්‍රාදේශීයව මිලදි ගැනීම සිදු කර ඇති බව.
(එ)	2023 වර්ෂයේදී මහමෝදර ශික්ෂණ රෝහල විසින් ඖෂධ හා ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීමට වෛද්‍ය සැපයුම් අංශය වෙත අනුමැතිය සඳහා යොමු කරන ලද අවස්ථා 40 කදී එකතුව රු.2,437,930 ක් වූ ඒකක 1,485 ක් සඳහා Pronto පරිගණක පද්ධතිය මගින් අනුමැතිය ලබා දීමට දින 02 සිට දින 25 ක් දක්වා වූ ප්‍රමාද කාලයක් ගෙන තිබුණු අතර අවස්ථා 18 කදී ඒකක 627 ක් රෝහල වෙත මිලදී ගැනීම වෙනුවෙන් එකතු වටිනාකම රු.1,070,300 ක් වූ ඇණවුම් සැපයුම්කරුවන් වෙත ලබා දී රෝහල වෙත සැපයීමට දින 02 සිට දින 30 ක් දක්වා වූ ප්‍රමාද කාලයක් සැපයුම්කරුවන් විසින් ගෙන තිබුණි.	-එම-	2023 වර්ෂය තුළදී මහමෝදර ශික්ෂණ රෝහල වෙතින් ශල්‍ය පාරිභෝජන අයිතම 4ක් හා ඖෂධ වර්ග 28 ක් මිලදී ගෙන ඇති අතර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය වෛද්‍ය සැපයුම් අංශය වෙතින් Pronto පරිගණක පද්ධතිය හා MSMIS පද්ධතිය හරහා ලබා ගන්නා ලදි. අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ප්‍රාදේශීයව මිලදි ගැනිම් සිදු කර ඇති බව.

NAOSL
ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(බ)	මහරගම අපේක්ෂා රෝහලට අයත් ඉඩම් පිළිබඳව සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහතින් දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. 2020 වර්ෂයේ ජනවාරි මාසයේ පිළියෙල කර තිබුණු මිනුම් සැලැස්මට (Survey Plan) අනුව අපේක්ෂා රෝහල් ගොඩනැඟිලි පිහිටා තිබෙන ඉඩම අක්කර 14 රූඩ් 03 පර්චස් 2.70 ක වපසරියකින් යුක්ත විය. කෙසේ නමුත් මෙම මිනුම් සැලැස්ම පිළියෙල කරන විටත් මෙම ඉඩමට අදාළ ඔප්පුව රෝහල සතුව නොතිබුණු බැවින් මිනුම් සැලැස්ම මගින් හඳුනාගෙන තිබුණු ඉඩමේ වපසරිය නිවැරදි ද යන්න තහවුරුවක් නොතිබුණි. එසේම රෝහලට නැඟි ඔප්පුවකින් ලැබී තිබුණු රූඩ් 02 ක් පමණ වූ පෙළෙන්ගහකුඹුර නැමැති ඉඩමට අදාළ ඔප්පුව ද අස්ථානගත වී තිබුණු අතර එම ඉඩමේ මායිම් ද නිරවුල් කර ගැනීමකින් තොරව අතහැර දමා තිබුණි.	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු අතර මෙම ඉඩම් කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම රෝහලේ ඔප්පුව මේ වන විට අස්ථානගත වී ඇති බැවින් ඔප්පුවේ පිටපතක් ලබා ගැනීම සඳහා රෝහල් සංවර්ධන කමිටුවේ නිතීඥ මහතා වෙත අවශ්‍ය තොරතුරු ලබා දී, ඉදිරි අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා මහරගම ප්‍රාදේශීය ලේකම් වෙත ලිපි යොමු කර ඇති බව, මීට අමතරව රෝහල වෙත පරිත්‍යාගයක් මගින් ලබා දී ඇති ඉඩම් කැබැල්ලෙහි අයිතිය හා එහි මායිම් නිරවුල් කර ගැනීම සඳහා නීතීඥවරියක් වෙත තොරතුරු ලබාදී ඇති බව, එබැවින් රෝහලේ ප්‍රධාන ඔප්පුව සැකසීමේ කාර්ය සහ රෝහල වෙත පරිත්‍යාගයක් මගින් ලබා දී ඇති පෙළෙන්ගහකුඹුර නැමැති ඉඩමට අදාළ ඔප්පු පිටපත් ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව.
	ii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 315 වගන්තිය ප්‍රකාරව භාරකාරත්වය ආණ්ඩුවට අයත් ඕනෑම වටිනා දෙයක් සුරක්ෂිතව තබා ගැනීමත් රැක බලා ගැනීමත් සඳහා ප්‍රමාණවත් විධිවිධාන සැලසීම ගණන්දීමේ නිලධාරී වශයෙන් රෝහල් ප්‍රධානියාගේ වගකීම වන අතර එම ද්‍රව්‍ය රෝහලේ ආරක්ෂිත සේප්පුවක සුරක්ෂිතව තැන්පත් කර මු.රෙ 316 ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත් රෝහල් ඉඩමේ ඔප්පු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. එබැවින් ඉහත ඉඩම් ඔප්පු අස්ථානගත වීම සම්බන්ධයෙන් විමර්ශනය කර	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන එම නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම සහ රෝහල සතු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරුකර ගැනීම කඩිනම් කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමි.		
(හ)	2024 පෙබරවාරි 14 දින දහවල් 12.30ට පමණ මහරගම අපේක්ෂා රෝහලේ පැරණි බාහිර රෝගී අංශ ගොඩනැගිල්ලේ වූ RG 07 ශීත ඖෂධ කාමරයේ සිදුකළ භෞතික පරීක්ෂාවේදී එහි උෂ්ණත්වය සෙල්සියස් අංශක 14.2 ක් ලෙස රෝහලේ භෞතික විද්‍යාඥ අංශය විසින් සපයන ලද උෂ්ණත්ව මාපාංකයේ දැක්වුණු අතර ශීත කාමරයේ පිටතින් ස්ථාපනය කර තිබුණු උෂ්ණත්ව මීටරයේ එය සෙල්සියස් අංශක 12.2 ලෙස සටහන් විය. මේ සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.		
	i. 2008 ඖෂධ කළමනාකරණය පිළිබඳ අත්පොතේ දෙවෙනි සංශෝධනයේ 9 වෙනි පරිච්ඡේදයේ 6 වෙනි ඡේදය ප්‍රකාරව නිෂ්පාදකයා සඳහන් කරන ආකාරයට එන්නත්, සීරා (sera) හා තාපගතික ඖෂධ ශීත කාමර හෝ ශීතකරණ තුළ අදාළ උෂ්ණත්වය යටතේ (සාමාන්‍යයෙන් සෙල්සියස් අංශක 2 ත් සෙල්සියස් අංශක 8 අතර) ගබඩාකර තැබිය යුතු වූවද, සෙල්සියස් අංශක 2 ත් සෙල්සියස් අංශක 8 අතර ගබඩාකර තැබිය යුතු වූ එන්නත් වර්ග 06 කට අදාළව ඒකක 13,990 ක ප්‍රමාණයක් ඉහත අවස්ථාව වන විට මෙම ශීත ඖෂධ කාමරයේ ගබඩා කර තිබුණි.	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු අතර මෙවැනි තත්ත්වයන් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය.	අදාළ ඖෂධ ඒකක 13990 ප්‍රමාණයක් මේ අවස්ථාවේදී RG - 07 ශීත ගබඩාවේ තිබුණ අතර සාමාන්‍යයෙන් ඕනෑම ශීත ඖෂධයක් පැය 24ක කාලයක කාමර උෂ්ණත්වයේ තබා තිබුණද එම ඖෂධයේ ගුණාත්මකභාවයට හානියක් සිදු නොවන බව.
	ii. එසේම 2008 ඖෂධ කළමනාකරණය පිළිබඳ අත්පොතේ දෙවෙනි සංශෝධනයේ 9 වෙනි පරිච්ඡේදයේ 6 vi ප්‍රකාරව සෑම ශීතකරණයකට/ශීතාගාරයකට අදාළව දිනපතා උදේ 9.30 හා	-එම-	මේ සම්බන්ධව ලිඛිත තහවුරුවක් නොවුණත් සෑම දිනකම උදේ සහ සවස මෙහි උෂ්ණත්වය මැනීම සිදු කරන ලද බව, ඒ සඳහා මා විසින්

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	සවස 3.30 ට පැවති උෂ්ණත්වය පිළිබඳව සටහන් පවත්වා ගතයුතු වූවත් RG 07 ශීත ඖෂධ කාමරය ඇතුළුව රෝහලේ වූ අනෙකුත් ශීතාගාර සම්බන්ධයෙන් එවැනි උෂ්ණත්වය පිළිබඳව සටහන් පවත්වාගෙන ගොස් නොතිබුණි. මේ හේතුවෙන් ගබඩා කර තිබෙන ඖෂධවලට අවශ්‍ය වන පරිදි ශීතාගාරවල උෂ්ණත්වය පවත්වා ගෙන යන්නේදැයි යන්න ලිඛිත තහවුරුවක් නොවීය.		පෞද්ගලිකව සපයා ගත් උෂ්ණත්වමානයක් සහ ශීතාගාරය පිටුපස ස්ථාපනය කර තිබුණු උෂ්ණත්ව මීටරය උපයෝගී කරගන්නා ලද බව, මේ සිද්ධියෙන් පසු මේ සඳහා ලිඛිත ලේඛන පවත්වා ගැනීම පටන් ගත් අතර ශීතාගාරය පිටුපස "digital reading" ලබාගත හැකි උෂ්ණත්වමානයක් සවිකර ගන්නා ලද බව.
	iii. එසේම ශීතාගාර නියමිත උෂ්ණත්ව තත්ත්වයේ නොපවතින අවස්ථාවලදී, ඒ පිළිබඳව රෝහල් කළමණාකරණය වෙත වාර්තා කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණු අතර ශීතාගාර නියමිත උෂ්ණත්ව තත්ත්වයේ නොපවතින අවස්ථාවලදී එහි ගබඩාකර තිබෙන ඖෂධ රෝගීන් සඳහා භාවිතා කිරීමේ සුදුසු/නුසුදුසුභාවය තීරණය කිරීමේ ක්‍රමවේදයක් ද රෝහල තුළ නොතිබුණි. මෙවන් තත්ත්වයක් යටතේ ඉහතින් සඳහන් කළ සෙල්සියස් අංශක 14.2 ක උෂ්ණත්වයක් යටතේ ගබඩා කර තිබුණු සෙල්සියස් අංශක 2 ත් සෙල්සියස් අංශක 8 ත් අතර ගබඩාකර තැබිය යුතු වූ එන්නත් රෝගීන් සඳහා නිකුත් කර තිබුණු බවට නිරීක්ෂණය විය.	-එම-	සාමාන්‍යයෙන් රෝහල් කළමනාකරණයට දැනුම් දෙනු ලබන්නේ පැමිණිලි පොත (Complain Book) හරහා බව, එම ශීතාගාරය භාරගෙන පළමු වරට ගැටලුවකට මුහුණ පෑමට සිදුවූයේ 2021/11/16 දින වන අතර එදින රෝහල් කළමනාකරණයට දැනුම් දුන් විට ඔවුන් ඒ සඳහා විදුලි බල මණ්ඩලයේ දුරකථන අංකයක් ලබා දෙන ලද බව, එම නිසා ඊට පසු ගැටලු ඇති වූ අවස්ථා වලදී එම දුරකථන අංකයට කතා කළ අතර ලංකා විදුලිබල මණ්ඩලය මගින් හැකි ඉක්මනින් තත්ත්වය යථා තත්ත්වයට පත් කරන ලද බව, පසුගිය කාලවලදී ශීතකාමරය කීපවරක් උෂ්ණත්වය ඉහළ යෑම වලට ලක් වූ අතර ඒ නිසා ඒ පිළිබඳවද දැනුවත් කරන ලද බව, පිළිකානාශක ඖෂධ පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් දැනට ශ්‍රී ලංකාවේ නොපවතින අතර, අප රට සතුව එවැනි පරීක්ෂණාගාර නොපවතින බව, මෙම ඖෂධ තොගය මාසයක්, මාස එකහමාරක් වැනි කාලයක් තුළ රෝහල තුළ භාවිතා කරන ලද අතර එම ඖෂධ භාවිතයේදී රෝගීන්ට සිදුවූ අපහසුතාවයන්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

			රෝහල තුළින් වාර්තා නොවුන බව, එසේම බොහෝ ශීත ඖෂධ පැය 24 පමණ කාලයක් කාමර උෂ්ණත්වය තුළ තබා ගත හැකි බව.
	iv. මෙලෙස නියමිත උෂ්ණත්ව තත්ත්වයෙන් බැහැර ගබඩා කර තිබුණු ඖෂධ රෝගීන් සඳහා භාවිතා කිරීම සුදුසුද නැද්ද යන්න පරීක්ෂාවකින් තොරව රෝගීන් වෙත නිකුත් කර තිබීමෙන් ඖෂධය අපේක්ෂිත ගුණත්වයෙන් තොරව රෝගීන් වෙත ලැබීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.	-එම-	ඊට පෙර දිනද එදිනම උදේද උෂ්ණත්වය පරීක්ෂා කරන ලද අතර පැය කිහිපයකට සිදුවූ මෙම වෙනසින් ඖෂධවල ගුණාත්මකභාවයට කිසිදු බලපෑමක් ඇති නොවන බව.
	v. 2008 ඖෂධ කළමනාකරණය පිළිබඳ අත්පොතේ දෙවෙනි සංශෝධනයේ 9 වෙනි පරිච්ඡේදයේ 6 vii ප්‍රකාරව ශීතාගාරවල උෂ්ණත්ව මීටරයේ නිවැරදිතාවය කාලීනව පරීක්ෂා කළ යුතු වුවත් එවැනි පරීක්ෂාවක් සිදුකළ බවට ලිඛිතව තහවුරු නොවීය. ඒ අනුව විගණනය විසින් සිදුකළ භෞතික පරීක්ෂාවේදී එහි උෂ්ණත්වය සෙල්සියස් අංශක 14.2 ක් ලෙස රෝහලේ භෞතික විද්‍යාඥ අංශය විසින් සපයන ලද උෂ්ණත්ව මාපාංකයේ සටහන් වීමත් ශීත කාමරයේ පිටතින් ස්ථාපනය කර තිබුණු උෂ්ණත්ව මීටරයේ එය සෙල්සියස් අංශක 12.2 ලෙස සටහන් වීමත් නිසා ශීත කාමරයේ පිටතින් ස්ථාපනය කර තිබුණු උෂ්ණත්ව මීටරයේ නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී ගැටළු සහගත විය.	-එම-	සාමාන්‍යයෙන් පැමිණිලි කරන අවස්ථාවන්ට අමතරව විදුලි බල මණ්ඩලය මගින් මාසයකට වරක් ඒ පරීක්ෂා කරනු ලබන බව, එවැනි අවස්ථාවලදී ඔවුන් වෙනත් උෂ්ණත්වමානයකින් උෂ්ණත්වය මැන බලන අතර පෞද්ගලිකව භාවිතා කරන උෂ්ණත්වමානයේන්ද විටින් විට එහි උෂ්ණත්වය මැන බලන බව, එසේම මෙම ශීතාගාරයේ දොර ඇරුණු විගස එය විවෘත වන්නේ පරිසර උෂ්ණත්වයට වන අතර එවිට උෂ්ණත්වය ක්ෂණිකව වැඩි වන අතර, පිටතින් පරීක්ෂා කිරීමේදී ශීතාගාර දොර විවෘත නොකරන අතර එහිදී මෙහි නියම අගය ලබාගත හැකි වීමද මෙයට හේතු විය හැකි බව.
	vi. මෙම ශීත ඖෂධ කාමරයේ ශීත කිරීමේ පද්ධතිය නඩත්තු කිරීම සහ සේවා කිරීම ලංකා විදුලිබල මණ්ඩලය මගින් සිදුකර තිබුණු නමුත් ශීත ඖෂධ කාමරයේ ශීත කිරීමේ පද්ධතිය ආශ්‍රිතව මිදී තිබුණු අයිස් වලින් ජලය ගබඩාව තුළට කාන්දු වීම හා ශීතාගාර	-එම-	ශීත ඖෂධ ගබඩා කරන කාමරයේ තිබූ අයිස් වලින් ජලය කාන්දු වීමක් සිදු වූ අතර එයට හේතුව ලෙස ඔවුන් පවසා සිටියේ ගෑස් කාන්දු වීමක් බව, ඊට පසුව අදාළ කාර්මික නිලධාරීන් පැමිණ එය

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	දොරෙහි රබර් බීඩිම මගින් නියමිත පරිදි දොර සීල් නොවීම නිවැරදිකර ගැනීමට රෝහල අපොහොසත් වී තිබුණි.		යථා තත්ත්වයට පත් කරන ලද බව, එය බොහෝ අබලන් තත්ත්වයට පැමිණ ඇති බැවින් නව බීඩිමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර එය ඉතා ඉක්මනින් සකසා දෙන බව ඔවුන් පවසන ලද බව.
(ම)	මහරගම අපේක්ෂා රෝහල විසින් ඖෂධ ගබඩා කිරීම සඳහා ශීත කන්ටේනරයක් රු.5,439,108 පිරිවැයක් දරා 2018 අගෝස්තු 30 වන දින රෝහල් භූමිය තුළ ස්ථාපිත කර තිබුණි. නමුත් මෙම ශීත කන්ටේනරය රෝහලේ අවශ්‍යතාවයට අනුකූලව පිළියෙල කර නොමැති බව සඳහන් කරමින් ඖෂධවේදීන් විසින් දිගින් දිගටම එහි ඖෂධ ගබඩා කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව ඖෂධවේදීන්ගේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් තවදුරටත් රු.2,679,794 ක පිරිවැයක් දරා එහි නවීකරණ කටයුතු 2022 නොවැම්බර් 28 දින අවසන් කර තිබුණ ද ඒ සම්බන්ධයෙන් තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීම මාස 16 ක පමණ කාලයක් ප්‍රමාද කර 2024 මාර්තු 25 දින ලබා ගෙන තිබුණි. නමුත් 2024 අප්‍රේල් 30 දින වන විටත් රෝහල විසින් එය ඖෂධ ගබඩා කිරීම සඳහා භාවිතා කර නොතිබුණි. එබැවින් රු.8,118,902 ක් පිරිවැයක් දරා ස්ථාපනය කර තිබුණු මෙම ශීත කන්ටේනරය වසර 5 කට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි. එසේම 2020 පෙබරවාරි 17 වන දින යොමුකරන ලද අංක එච්එස්එම්/එෆ්/එම්ඒඑච්/2019/ඒකිව්-03 දරන විගණන විමසුම මගින් ද මෙම ශීත කන්ටේනරය නිෂ්කාර්යව පවතින බවත්, අඩුපාඩු නිවැරදි කර ඖෂධ ගබඩා කිරීම සඳහා යොදා ගැනීම කඩිනම් කළ යුතු බවත් පෙන්වා දී තිබුණ ද, මෙම විමසුමේ දිනය වන විටත් එය භාවිතය සඳහා යොදා ගෙන නොතිබුණි. ඒ අනුව විශාල පිරිවැයක් දරා තිබෙන මෙම ශීත කන්ටේනරය තවදුරටත් ප්‍රමාදයකින් තොරව නියමිත තත්ත්වයන් යටතේ ඖෂධ ගබඩා කිරීමට යොදා ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමි.	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු අතර මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.	අදාළ ශීත කන්ටේනරය මුලින් ස්ථාපිත කිරීමේ දී ඖෂධ ගබඩා කිරීමට තවත් වෙනස් කිරීම් කීපයක් සිදු කළ යුතු බව ඖෂධවේදීන් දන්වන ලද බව, ඒ කටයුතු ටෙන්ඩර් කැඳවා සිදුකිරීමට මාස 15 ක කාලයක් ගතවී ඇති බව, ඒ අනුව සේවා නඩත්තු ගිවිසුමත් ප්‍රධාන අධි ශීතකරණ යන්ත්‍ර සහ අමතර අධි ශීතකරණ යන්ත්‍ර භූවමාරු කිරීම යන කරුණු සම්පූර්ණ කිරීමෙන් පසු මෙම ශීත කන්ටේනරය බාර ගැනීමට ඖෂධවේදීන් කැමැත්ත පල කර ඇති බව, අඩු පාඩු නිවැරදි කිරීමෙන් අනතුරුව මෙම ශීත කන්ටේනරය ඖෂධ ගබඩා කර තැබීම සඳහා ඖෂධවේදීන් වෙත බාර දීමට කඩිනමින් කටයුතු කරන බව.

ජාතික විගණන කාර්යාලය
இலங்கை கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ය)	කළුතර ශික්ෂණ රෝහල ආශ්‍රිතව ස්ථාපිත කර තිබුණු ළිංවලට සවිකර ඇති ජල මෝටර් ක්‍රියාත්මක නොකර ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ ජලසැපයුම හරහා ජලය සපයා ගැනීමට රෝහල් අධ්‍යක්ෂකවරිය ගෙන තිබූ තීරණය හේතුවෙන් 2023 ජනවාරි මස සිට 2023 අප්‍රේල් මස අවසානය දක්වා කාලපරිච්ඡේදයට අදාළව මාසික ජල බිල්පත් රු ලක්ෂ 4 සිට ලක්ෂ 10 දක්වා පරාසයකින් වැඩි වී තිබුණි. මේ හේතුවෙන් මෙම කාලපරිච්ඡේදයට අදාළව රජයට රු. ලක්ෂ 30 ක පමණ අලාභයක් සිදුවී තිබුණි.	මෙම තීරණය ගැනීමට පදනම් වූ කරුණු තහවුරු කෙරෙන ලිඛිත තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.	2023 පෙබරවාරි සිට මැයි දක්වා කාලය තුළ ජල බිල්පත් වැඩිවීමට බලපාන ලද ප්‍රධානම කරුණ වනුයේ මෙම කාලය වර්ෂාව අඩු පැවිලි සහිත කාලයක් වූ බැවින් ළිං ජලය අඩු වී මඩ මිශ්‍රව තිබීම බව, මේ හේතුවෙන් 2023/03/03 දින ජලය පරීක්ෂා කරන ලද බව, එම ජලය බීමට නුසුදුසු තත්වයේ පවතින බව වාර්තා වූ බව, නැවත 2023 මැයි මස සිදුකළ පරීක්ෂාවේදී එම ජලය භාවිතා කිරීම සුදුසු බව වාර්තා වී ඇති බව, එබැවින් 2023 ජනවාරි සිට අප්‍රේල් මස අවසානය දක්වා කාලය තුළ ළිං ජලය භාවිතා කිරීම නතර කර නළ ජලය භාවිතයට ගන්නා ලද බව, මෙම කාලය තුළ ඝන මීටර 300 ධාරිතාවයෙන් යුත් නව ජල ටැංකිය සඳහා ජලය පිරවීමට සිදු වූ බැවින් ජල බිල්පත් ඉහළ යාමට මෙයද හේතු වූ බව, ජල බිල්පත් ඉහළ යාමත් සමඟ ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් පැමිණ භූගත නළ පද්ධති පරීක්ෂා කිරීමේදී භූගත ජල කාන්දු වන ස්ථාන කිහිපයක්ම හඳුනා ගෙන පිළිසකර කරන ලද බව, මෙයද ජල බිල්පත් ඉහළ යාමට බලපා ඇති බව, මෙම කාලයේ වර්ෂාව අඩු වූ බැවින් රෝහල් භූමියේ ඇති මල්පැළ සඳහා ද ජලය යෙදීමට සිදු වූ බව, මෙයද ජල පරිභෝජනය ඉහළ යාමට හේතු වූ බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

විගණන නිරීක්ෂණය ----------		නිර්දේශය ----------	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම ----------
සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළව තිරසර සංවර්ධන දර්ශක 31 ක් හඳුනාගෙන තිබුණු අතර ඉන් දර්ශක 16 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.ප්‍රගතිය වාර්තා කරන ලද පහත සඳහන් දර්ශක අවශ්‍ය කාර්යසාධන මට්ටම කරා ළඟා වී නොතිබුණි.			
(අ)	දර්ශක අංක 3.2.1 අනුව වයස අවුරුදු 5 ට අඩු දරුවන්ගේ මරණ සංඛ්‍යාව 2030 වර්ෂය වනවිට සජීවී උපත් 1000 ට 7 ක් වැනි අගයකට පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වනවිට 10.5 ක්ව පැවති එම අගය 2023 දෙසැම්බර් 31 දින වන විට 12.3 වැනි අගයක් දක්වා අහිතකර ලෙස වර්ධනය වී තිබුණි.	2030 වන විට අපේක්ෂිත ඉලක්ක ලබා කර ගැනීම සඳහා වාර්ෂිකව පසුවිපරම් කරමින් අවශ්‍ය ප්‍රගතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	තිරසර සංවර්ධන ඉලක්කවල සමහර අගයන් ස්ථාවර අගයන්හි පවතින අතර මේ සඳහා සමාලෝචිත රැස්වීම් වාර කිහිපයක් අදාළ වගකිව යුතු නිලධාරීන් සමඟ පවත්වන ලද බව, එහිදී හේතු වූ කරුණු ඇතැම් තිරසර සංවර්ධන ඉලක්ක ලබා ගැනීම සඳහා අනෙකුත් ඉලක්ක සපුරන ආයතන (සෞඛ්‍ය අමාත්‍යාංශය නොවන) හා මේ හා සම්බන්ධ ඉදිරියට ගතයුතු ක්‍රියාමාර්ගද සාකච්ඡා කළ බව, මේ සඳහා උපදෙස් ලබා දී ඇති බව, එමෙන්ම වැඩසටහන් නියාමනය සඳහා අභියෝගයක් ලෙස මානව සම්පත් ඌනතාවය දක්නට ලැබෙන බව, එමෙන්ම **Covid** 19 හා රටේ ආර්ථික තත්ත්වයද බලපා ඇති බව.
(ආ)	දර්ශක අංක 3.2.2 අනුව නවජ මරණ අනුපාතය 2030 වනවිට සජීවී උපත් 1000 ට 4 ක් වැනි අගයකට පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද, 2021 දෙසැම්බර් 31 දින වන විට 6.5 ක් ව පැවති එම අගය 2023 දෙසැම්බර් 31 වනවිට 7 ක් දක්වා අහිතකර ලෙස වර්ධනය වී තිබුණි.	-එම-	-එම-

(ඇ)	දර්ශක අංක 3.3.2 අනුව ක්ෂයරෝගය පැතිරීමේ අනුපාතය 2030 වන විට 100,000 කට 13 ක් වැනි අගයකට පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද, 2021 දෙසැම්බර් 31 දින වන විට 29.7 ක් ව පැවති එම අගය 2023 දෙසැම්බර් 31 වනවිට 41.6 ක් දක්වා අහිතකර ලෙස වර්ධනය වී තිබුණි.	-එම-	-එම-
(ඈ)	දර්ශක අංක 3.3.5.1 අනුව ඩෙංගු රෝගය පැතිරීමේ සිද්ධීන් 2030 වන විට 21,000 ක් වැනි අගයකට පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද, 2021 දෙසැම්බර් 31 දින වන විට 35,924 ක් ව පැවති එම අගය 2023 දෙසැම්බර් 31 වනවිට 89,799 ක් වැනි ඉහළ අගයක් දක්වා අහිතකර ලෙස වර්ධනය වී තිබුණි.	-එම-	-එම-
(ඉ)	දර්ශක අංක 3.3.5.2 අනුව මානව ජලභීතිකා මරණ සංඛ්‍යාව 2030 වන විට ශූන්‍ය අගයක පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද, 2023 වර්ෂයේදී 16 ක් වැනි අගයක පැවතුණි.	-එම-	-එම-
(ඊ)	දර්ශක අංක 3.3.5.3 අනුව 2030 වන විට බරවා රෝගයට අදාළ නව වසා ගැටිති ප්‍රදාහ අවස්ථා ශූන්‍ය අගයක පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද, 2021 වර්ෂයේදී 322 ක්ව පැවති සංඛ්‍යාව 2023 වර්ෂයේදී 908 ක් දක්වා අහිතකර ලෙස වර්ධනය වී තිබුණි.	-එම-	-එම-
(උ)	දර්ශක අංක 3.3.5.4 අනුව ලාදුරු රෝගීන් ප්‍රතිකාර සඳහා පැමිණීම 2030 වන විට 1,000 ක් වැනි අගයක පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද, 2021 වර්ෂයේදී 993 ක් වැනි යහපත් අගයක පැවති එම ඉලක්කය 2022 වර්ෂයේදී 1,580 ක් වැනි ඉහළ අගයක් දක්වා අහිතකර ලෙස වර්ධනය වී තිබුණි.	-එම-	-එම-
(ඌ)	දර්ශක අංක 3.3.5.5 අනුව සමේ රෝගයක් වන Leishmaniasis වාර්තා වන අගය 2030 වන විට100,000 කට 1 කට අඩු අගයක	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද 2021 වර්ෂයේදී 2637 ක්ව පැවති සංඛ්‍යාව 2023 වර්ෂයේදී 4277 ක් දක්වා අභිතකර ලෙස වර්ධනය වී තිබුණි.		
(එ)	දර්ශක අංක 3.8.1.9 අනුව ප්‍රතිකාර තත්ත්වය කුමක් උවත් වයස අවුරුදු 18 ට වැඩි වැඩිහිටියන් අතර වැඩි නොවන රුධිර පීඩනයේ වයස් ප්‍රමිතිගත ව්‍යාප්තිය (Age –Standardized Prevalence of Non-raised blood pressure) හි අගය 2030 වන විට සියයට 80 ක් වැනි අගයක පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසනයට එය සියයට 65.2 ක පැවතුණි.	-එම-	-එම-
(ඒ)	දර්ශක අංක 3.8.1.10 අනුව වයස අවුරුදු 18-69 දක්වා වැඩිහිටියන්ගේ නිරාහාර ප්ලාස්මා ග්ලූකෝස් (Age –Standardized mean fasting plasma glucose (mg/dl) හි ප්‍රමිතිගත මධ්‍යනය 2030 වන විට සියයට 80 mg/dl ක් වැනි අගයක පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් දිනට එය සියයට 104 mg/dl ක අගයක පැවතුණි.	-එම-	-එම-
(ඔ)	දර්ශක අංක 3.8.1.11 අනුව වයස අවුරුදු 15 ට වැඩි අයගේ පසුගිය දින 30 තුළ දුම්නොබොන අයගේ අගය 2030 වන විට සියයට 90 ක් වැනි අගයක පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් දිනට එය සියයට 73.8 ක අගයක පැවතුණි.	-එම-	-එම-
(ඕ)	දර්ශක අංක 3.a.1 අනුව වයස අවුරුදු 18-69 අතර පුද්ගලයන් අතර වත්මන් දුම්කොළ භාවිතයේ වයස් ප්‍රමිතිගත ව්‍යාප්තිය හි අගය 2030 වන විට සියයට 10 ක් වැනි අගයක පවත්වාගැනීමට ඉලක්ක කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් දිනට එය සියයට 26.2 ක් වැනි අගයක පැවතුණි.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

5 මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය		නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින සියළුම රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන සහ පළාත් සෞඛ්‍ය සේවයට අයත් රෝහල් හා සියළුම අනෙකුත් සෞඛ්‍ය ආයතනවලට අදාළව 2023 ජුනි 30 දිනට කාර්ය මණ්ඩලය පිළිබඳව සැලසුම් අංශය විසින් 2023 නොවැම්බර් 24 හා 27 දින ඊමේල් මඟින් විගණනයට යොමුකරන ලද තොරතුරු සම්බන්ධයෙන් සිදුකරන විගණනයේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින රෝහල්, ආයතන හා අංශවලට අදාළ 2023 ජුනි 30 දිනට කාර්යමණ්ඩල තොරතුරු සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	➢ වැටුප්තල අනුව අනුමත සමස්ත කාර්යමණ්ඩලය 95,948 ක් හා එදිනට තත්‍ය කාර්යමණ්ඩලය 81,915 ක් විය. ඒ අනුව සමස්ත කාර්යමණ්ඩලයේ 14,033 ක ඌනතාවයක් පැවතුණි. නමුත් රෝහල්, ආයතන හා අංශ අනුව ඉදිරිපත් කරන ලද කාර්යමණ්ඩල තොරතුරු අනුව අනුමත කාර්යමණ්ඩලය 95,950 ක් හා තත්‍ය කාර්යමණ්ඩලය 81,904 වූ අතර ඌනතාවය 14,046 ක් විය.	කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර ඒ ඒ රෝහල් හා ආයතනවලට අනුමත කාර්යමණ්ඩලය නොඉක්මවා නිලධාරීන් හා	එක් එක් ආයතනයන්හි පවතින පුරප්පාඩු හා අතිරික්තයන් පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කරන අදාල අංශ ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

		සේවකයින් අනුයුක්ත කළ යුතුය.	
	➢ ඩෙංගු මර්දන කටයුතු වෙනුවෙන් 2017 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම යටතේ අවිධිමත් ලෙස බඳවාගෙන තිබුණු ක්ෂේත්‍ර මදුරු මර්දන සහායකයින් 1,103 දෙනෙක් පමණ සේවයේ යොදවා තිබුණද කාර්යමණ්ඩල තොරතුරු වලට ඇතුළත් කර තිබුණේ තනතුරු 5 ක් පමණක් විය. මාසිකව රු.27,000 ක පමණ දීමනාවක් යටතේ සේවයේ යොදවා ඇති මෙම තනතුරු සංඛ්‍යාව සඳහා විධිමත් අනුමැතියක් 2024 මාර්තු දක්වා ලැබී නොතිබුණි.	-එම-	-එම-
	ii. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව තනතුරු 49 කට අදාළව නිලධාරීන් 14,307 ක ඌනතාවයන් පැවතියදී නිලධාරීන් 2,942 ක් අතිරික්තව සේවයේ යොදවා තිබුණි. මෙම අතිරික්තතා හා ඌනතාවයන් තුලනය නොකර මෙසේ සේවයේ යෙදවීම කළමනාකරණයේ දුර්වලතාවයක් බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
	iii. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඉහත අතිරික්ත හා ඌනතාවයන් පැවති තනතුරුවලට අමතරව තවත් තනතුරු 201 කට අදාළව නිලධාරීන් 2,932 ක කාර්යමණ්ඩල ඌනතාවයන් පැවතුණි. මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර අදාළ තනතුරු තවදුරටත් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය නම් එම තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අත්‍යවශ්‍ය නොවන තනතුරු යටපත් කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	iv. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඉහත අතිරික්ත හා ඌනතාවයන් පැවති තනතුරුවලට අමතරව තවත් තනතුරු 26 කට අදාළව නිලධාරීන් 283 ක කාර්යමණ්ඩල අතිරික්තයක් පැවතුණි. මෙසේ අනුමැතියක් රහිත තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීමට හා වැටුප් හා දීමනා ගෙවීමට ලැබී ඇති අධිකාරි බලය විගණනයේදී ගැටළුකාරී වූ අතර මෙහි දැක්වෙන අතිරේක ලේකම් (ඉංජිනේරු සේවා) තනතුර අනුමත නොවූ තනතුරක් ලෙස දැක්වීම ගැටළුකාරී විය. මෙම තනතුර විධිමත් පරිදි අනුමත කරන ලද තනතුරක් බව විගණනයේදී නිරීක්ෂණය විය.	-එම-	-එම-
	v. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් 07 දින අමාත්‍යාංශයට අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) නමින් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ එක් තනතුරක් සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එහෙත් එම තනතුර මෙම විගණන විමසුමේ දින වන විටත් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.	-එම-	-එම-
(ආ)	විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මධ්‍යම රජය හා පළාත් සභා වෙනුවෙන් අනුමත කාර්යමණ්ඩලයේ තනතුරු කිහිපයක සේවක ඌනතාවයන් පවතින බව නිරීක්ෂණය විය. මෙම ඌනතාවයන් පවතින තනතුරු අතුරින් තනතුරු 22 කට අදාළව 13,868 ක කාර්යමණ්ඩල ඌනතාවයක් පැවතුණි. සෞඛ්‍ය සේවාවේ ගුණාත්මක භාවය ආරක්ෂා කර ගනිමින් මහජනතාවට වඩාත් හොඳ සේවාවක් සැපයීම තහවුරු කිරීම පිණිස මෙම තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය විය.	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
இதசீரிய கணக்காய்வுத் அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඇ)	සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව ප්‍රතිසංශෝධනය කිරීම (යෝජිත සේවක සංඛ්‍යාව 2015 දක්වා) මැයෙන් සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් 2009 අගෝස්තු 21 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට 2010 පෙබරවාරි 10 දින පවත්වන අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණි. මේ අනුව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ 2010 ජනවාරි 25 දිනැති අංක NSCC/03/04/Cabinet Decision දරන අමාත්‍ය මණ්ඩල ලේකම් අමතන ලද ලිපියේ දැක්වෙන පහත දැක්වෙන නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි.		
	i. විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 2837 ක් දක්වා පුළුල් කිරීම දස අවුරුදු සැලැස්මක් යටතේ අනුමත කිරීම හා ඊට අනුශාංගික වූ යටිතල පහසුකම් සහ සහාය සේවා සමගාමීව සැලසුම් කිරීමත්,	අමාත්‍යමණ්ඩල තීරණය පරිදි කටයුතු කළ යුතු අතර අනාගත අවශ්‍යතාවයට ගැලපෙන පරිදි විශේෂඥ වෛද්‍යවරුන් පුහුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	**CA/AQ/FCC**05/**INFO/**2023/42 හා 2024.01.03 දිනැතිව පිළිතුරු ඉදිරිපත්කර ඇති බව.
	ii. අදාළ ඇමුණුමෙහි දක්වා ඇති පරිදි නව වෛද්‍ය විශේෂඥතා ඇති කිරීමත්,	-එම-	-එම-
	iii. විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව ඉහත දක්වා ඇති පරිදි අවස්ථාවෝචිතව වර්ෂ 2020 දක්වා කාලය තුළ පිරවීමට සැලසුම් කිරීමත්,	-එම-	-එම-
	vi. විශේෂඥ වෛද්‍ය අවශ්‍යතා අනුව වෛද්‍යවරුන්ට පශ්චාත් වෛද්‍ය පුහුණුව ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී මට්ටමින් ලබා දීම ප්‍රතිපත්තියක් ලෙස අනුමත කිරීමත්,	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	මෙම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව සැලසුම් කළ ආකාරයට රට තුළ විශේෂඥ වෛද්‍යවරුන් පුහුණු කිරීම, සේවයේ යෙදවීම හා 2020 වර්ෂයෙන් පසුව නව තත්ත්වයන්ට ගැලපෙන ආකාරයට අවශ්‍ය සංශෝධනයන් සඳහා අනුමැතිය ලබාගැනීම සිදුකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.		
(ඇ)	සමස්ථ සෞඛ්‍ය සේවාව වෙනුවෙන් අනුමත හා සේවයේ යොදවා ඇති විශේෂඥ වෛද්‍යවරුන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම මැයෙන් ඔබ වෙත යොමුකරන ලද මගේ අංක MED/B/MH/01/INFO/2023/33 දරන 2023 ජූලි 28 දිනැති තොරතුරු කැඳවීමේ ලිපියට මෙම විගණන විමසුමේ දිනය දක්වා පිළිතුරු ලබා දී නොමැති අතර අධ්‍යක්ෂ තෘතීයික සත්කාර අංශය විසින් ඊමේල් මඟින් මා වෙත යොමුකරන ලද තොරතුරු සමඟ සිදුකරන ලද පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	i. අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව විශේෂඥ ක්ෂේත්‍ර 58 කට අදාළව අනුමත විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 2837 ක් වූවත් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව විශේෂඥ ක්ෂේත්‍ර 50 කට අදාළව එම සංඛ්‍යාව 2740 ක් විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.	-එම-	-එම-
	ii. විශේෂඥ වෛද්‍ය ක්ෂේත්‍රයන් 08 කට අදාළව අනුමත තනතුරු 66 සඳහා කිසිදු වෛද්‍යවරයෙකු පත්කර නොමැති බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
	iii. විශේෂඥ ක්ෂේත්‍ර දෙකට අදාළ අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලද තනතුරු සංඛ්‍යාව හා ලබාදුන් තොරතුරු අනුව අනුමත	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	තනතුරු සංඛ්‍යාව අතර තනතුරු 31 ක වෙනසක් නිරීක්ෂණය විය.		
	iv. අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලද තනතුරු සංඛ්‍යාව හා සැසඳීමේදී 2023 වර්ෂයේ නොවැම්බර් වන විට විශේෂඥ ක්ෂේත්‍ර 35 කට අදාළව විශේෂඥ වෛද්‍යවරුන් 972 ක ඌනතාවයක් පවතින බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය රට තුළ ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යාමට අහිතකර තත්ත්වයක් බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
	v. ඉහත දක්වා ඇති පරිදි විශේෂඥ ක්ෂේත්‍ර 35 විශේෂඥ වෛද්‍යවරුන් 972 ක ඌනතාවයක් පැවතියදී විශේෂඥ ක්ෂේත්‍ර 12 ක් සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමත තනතුරු සංඛ්‍යාවට වඩා විශේෂඥ වෛද්‍යවරුන් 113 ක් අතිරික්තව සේවයේ යොදවා ඇති බව නිරීක්ෂණය විය. මෙසේ අනුමැතියක් රහිතව විශේෂඥ වෛද්‍යවරුන් සේවයේ යෙදවීම හා ඔවුන් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීම සඳහා ලැබී ඇති අනුමැතිය කුමක්ද යන්න පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් කෙරුණි.	-එම-	-එම-
	vi. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද අවස්ථාවේදී හඳුනාගෙන නොතිබුණු හා පසුව එම විශේෂඥ ක්ෂේත්‍ර වෙනුවෙන් විශේෂඥ වෛද්‍යවරුන් සේවයේ යෙදවීම සඳහා විධිමත් අනුමැතියක් හෝ ලබානොගත් විශේෂඥ ක්ෂේත්‍ර 12 ක් තුළ විශේෂඥ වෛද්‍යවරුන් 141 ක් සේවයේ යොදවා තිබුණි. මෙසේ අනුමැතියක් රහිත විශේෂඥ ක්ෂේත්‍ර සඳහා විශේෂඥ වෛද්‍යවරුන් සේවයේ යෙදවීමට හා ඔවුන්ට වැටුප් හා දීමනා ගෙවීමට ලැබී ඇති අධිකාරී බලය කුමක්ද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	vii. අමාත්‍යාංශයේ සැලසුම් අංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද 2023 ජුනි 30 දිනට කාර්යමණ්ඩල තොරතුරු අනුව මධ්‍යම රජයේ රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන යටතේ 2023 ජුනි 30 දිනට අනුමත විශේෂඥ වෛද්‍යවරුන් ගණන 2018 ක් බවත් තත්‍ය සංඛ්‍යාව 1915 ක් බවත් දන්වා තිබුණි. නමුත් තෘතීයික සත්කාර අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2023 නොවැම්බර් වන විට මධ්‍යම රජයේ රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතනවල සේවයේ නියුතු විශේෂඥ වෛද්‍යවරුන් ගණන 1618 ක් බව දක්වා තිබුණි. මාස 5 ක පමණ කාලයක් තුළ විශේෂඥ වෛද්‍යවරුන් 297 කින් වෙනස් වීම පිළිගත නොහැකි බව නිරීක්ෂණය විය. මේ අනුව අංශ දෙක විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු පරස්පර බවත් මේ අනුව මෙම තොරතුරුවල නිවැරදිතාවය ගැටළුකාරී බවත් නිරීක්ෂණය විය.	-එම-	-එම-
	viii. සැලසුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2023 ජුනි 30 දිනට රෝහල්/ ආයතන 50 ක විශේෂඥ වෛද්‍යවරුන් 226 ක ඌනතාවයක් පැවතුණි. මෙසේ විශේෂඥ වෛද්‍යවරුන් 226 ක ඌනතාවයන් පැවතියදී රෝහල්/ ආයතන 23 ක විශේෂඥ වෛද්‍යවරුන් 123 ක අතිරික්තයක් පැවතුණි.	-එම-	-එම-
	ix. 2009 අගෝස්තු 21 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව එදිනට අනුමත 971 ක් වූ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව 2837 ක් දක්වා 2015 වර්ෂය වන විට වැඩිකිරීමට අනුමැතිය ඉල්ලා තිබුණු අතර මෙම විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව විශේෂඥ ක්ෂේත්‍රයන් අනුව හා රෝහල් අනුව සකස්කර ඇමුණුමක් ලෙස අමාත්‍යමණ්ඩල සංදේශයට ඇතුළත් කර තිබුණි. නමුත් අමාත්‍යාංශය විසින් මෙම 2837 ක් වූ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව පොදුවේ අනුමත කරන ලද	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	සංඛ්‍යාවක් ලෙස සලකා විශේෂඥ ක්ෂේත්‍රය නොසලකා සේවයේ යොදවනු ලබන බවක් නිරීක්ෂණය විය. මේ අනුව සැලසුම් අංශය විසින් කාර්යමණ්ඩල තොරතුරු සකස් කිරීමේදී Consultant Dental Surgeon හා Medical Consultant ලෙස වර්ග දෙකක් යටතේ පමණක් තොරතුරු ඉදිරිපත් කර තිබුණි. මෙය නිවැරදි නොවන අතර අමාත්‍යමණ්ඩලය අනුමත කරන ලද විශේෂඥ ක්ෂේත්‍රයන් යටතේ කාර්යමණ්ඩල තොරතුරු සකස් කළ යුතුව ඇත. එසේම විශේෂඥ වෛද්‍යවරුන් සේවයේ යෙදවීමේදී අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා දී ඇති සේවක සංඛ්‍යාවන්ට ගැලපෙන ආකාරයට සේවයේ යෙදවිය යුතුව ඇත. කිසියම් සංශෝධයක් කිරීමේ අවශ්‍යතාවට පවතී නම් එය විධිමත් ක්‍රමවේදයන් තුළ අනුමත කරවා ගැනීමෙන් පසුව සිදුකළ යුතුව ඇත.		
	x. අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබාගැනීමේ මූලික අරමුණක් ලෙස වෛද්‍යවරුන්ගේ කැමැත්ත අනුව නොව අවශ්‍යතාවය මත විශේෂඥ ක්ෂේත්‍රයන් තෝරගැනීම තීරණය කිරීම දක්වා තිබුණද අමාත්‍යාංශය විසින් ඊට අනුගත නොවී වෛද්‍යවරුන්ගේ අභිමතය පරිදි විශේෂඥ ක්ෂේත්‍රය තෝරාගැනීමට ඉඩ සලසා දී ඇති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය තුළ සමහර විශේෂඥ ක්ෂේත්‍රවල ඌනතාවයන් පැවතියේදී ඇතැම් විශේෂඥ ක්ෂේත්‍රවල අතිරික්තයන් පැවතුණි.	-එම-	-එම-
	xi. ඉහත දැක්වෙන නිරීක්ෂණයන් අනුව රට තුළ සෞඛ්‍ය සේවාව ගුණාත්මක තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා පහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.	-එම-	-එම-

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

	➢ සෞඛ්‍ය සේවාව තුළ සිටින විශේෂඥ වෛද්‍යවරුන් සම්බන්ධයෙන් විධිමත් දත්ත පද්ධතියක් නිර්මාණය කර යාවත්කාලීනව නඩත්තු කිරීම.	-එම-	-එම-
	➢ වර්තමානයට ගැළපෙන අකාරයට විශේෂඥ වෛද්‍යවරුන්ගේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය විධිමත් අනුමැතීන් ලබාගැනීමට කටයුතු කිරීම.	-එම-	-එම-
	➢ වර්ෂ 10 කට වත් අවශ්‍ය විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව පුරෝකථනය කර ඒ සඳහා අවශ්‍ය විධිමත් අනුමැතීන් ලබාගෙන අදාළ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව බිහිකිරීම සඳහා විධිමත් සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කිරීම හා එම සැලැස්ම අඛණ්ඩව ඉදිරියට රැගෙන යාම.	-එම-	-එම-
	➢ තම අභිමතය අනුව විශේෂඥ වෛද්‍ය ක්ෂේත්‍ර තෝරාගෙන පශ්චාත් උපාධි සම්පූර්ණ කිරීමට ඉඩ සලසනවා වෙනුවට අනාගත අවශ්‍යතාවයන් (දේශීය හා විදේශීය රැකියා වෙළඳපොල අවශ්‍යතාවයන්ට) ගැලපෙන අකාරයට සෞඛ්‍යය සේවාවට අවශ්‍ය විශේෂඥ වෛද්‍යවරුන් බිහි කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම හා තම අභිමතය අනුව විශේෂඥතාවය ලබාගන්නා විශේෂඥ වෛද්‍යවරුන් අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා බඳවා ගැනීමෙන් වැලකීම. එසේ දේශීය අවශ්‍යතාවය ඉක්මවා විශේෂඥ වෛද්‍යවරුන් පුහුණුව සඳහා යොමුකරන්නේ නම් අදාළ අනෙකුත් ආයතන හා සම්බන්ධීකරණයෙන් ඔවුන්ට විදේශ රැකියා අවස්ථාවන් සොයාගැනීමේ වැඩපිළිවෙලක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.	-එම-	-එම-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	➢ වැඩිපුර විදේශිය රැකියා පවතින හා වැඩි සේවක පිරිවැටුමක් සහිත විශේෂඥ ක්ෂේත්‍රයන් හඳුනාගෙන එම ක්ෂේත්‍රවලට අදාළව වැඩි විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාවක් බිහිකිරීමට සැලසුමකට අනුව කටයුතු කිරීම.	-එම-	-එම-
	➢ විධිමත් සැලසුමකට අනුව සිටින විශේෂඥ වෛද්‍යවරුන් සේවයේ යෙදවීමට කටයුතු කිරීම. මෙහිදී අතිරික්තව සේවයේ යොදවා සිටින විශේෂඥ වෛද්‍යවරුන් ඌනතාවයන් පවතින රෝහල්/ ආයතනවල සේවයේ යෙදවීමට කටයුතු කිරීම. මේ සඳහා සාධාරණ හා විනිවිද ස්ථානමාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.	-එම-	-එම-
